ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය

2017
වාර්ෂික වාර්තාව

නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය

දැක්ම :

තාක්ෂණ හා සේවා විශිෂ්ඨත්වය තුලින් ශ්‍රී ලංකාවේ අභිමානවත්ම උපයෝගීතා සැපයීමේ ආයතනය බවට පත්වීම.

මෙහෙවර:

පාරිභෝගික තෘප්තිමත්භාවය සහතික කෙරෙන තිරසාර විසඳුම් තුලින් ජල සම්පාදන හා සනීපාරක්ෂක පහසුකම් සැලසීමෙන් ජාතියට සේවය කිරීම.

ඉලක්ක:

- ජල සම්පාදන හා සනීපාරක්ෂණ ආවරණය වර්ධනය කිරීම.
- ව්‍යාපාරික කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම.
- වැඩි වගවීමක් හා පාරදෘෂ්‍ය භාවයක් සහතික කිරීම.
- ග්‍රාමීය හා ඌණසේවිත ප්‍රජාවන් වෙත ආරක්ෂිත පානීය ජල සම්පාදනය හා සනීපාරක්ෂණ පහසුකම් සැලැස්වීම.

අන්තර්ගතය

නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ ලේකම් තුමාගේ පණිවුඩය iv
වාර්තාව පිළිබඳ දැනුම් දීම 01
සභාපති වරයාගේ ප්‍රකාශය 02

සංස්ථානික පාලනය හා සංඛ්‍යා ලේඛනාත්මක සමාලෝචනය

ප්‍රධාන භූමිකාධාරීන් 06
පවත්නා ජල සම්පාදන යෝජනා ක්‍රම 09
සාමුහික සැලසුම් 10
ජල සම්පාදනයේ ප්‍රධාන කාර්ය සාධනය 13
මලාපවහනයේ ප්‍රධාන කාර්ය සාධනය 15
මෙහෙයුම් සාරාංශය 16
ආයෝජන සාරාංශය 20
සේවක කාර්ය මණ්ඩලය 23

තිරසාර භාවය පිළිබඳ වාර්තාව

සේවාවේ උත්කෘෂ්ඨභාවය හා මෙහෙයුම් කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම සඳහා තොරතුරු තාක්ෂණික විසඳුම් 28
වාණිජ ක්‍රියාකාරකම් 29
ග්‍රාමීය ජල සම්පාදනය හා සනීපාරක්ෂණය 31
ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන 31
භූගත ජලය 32
බලශක්ති කළමනාකරණය 33
සමාජ විද්‍යාත්මක ක්‍රියාකාරකම් 33
අදායම් නොලැබෙන ජලය අඩු කිරීම 34
සැපයුම් හා ද්‍රව්‍ය කළමනාකරණය 37
පර්යේෂණ හා සංවර්ධන අංශය 38
හඳුනා නොගත් හේතූන් නිසා ඇති වන නිදන්ගත වකුගඩු රෝගය පිළිබඳ වැඩ සටහන 40
ජල සුරක්ෂිතතා සැලැසුම් 41

යටිතල පහසුකම් සංවර්ධනය

කලාපීය සහාය සේවා මධ්‍යස්ථාන 44

ජල සම්පාදනය

දැනට ක්‍රියාත්මක කෙරෙමින් පවතින විදේශීය/ දේශීය බැංකු විසින් අරමුදල් සපයනු ලබන ජල සම්පාදන ව්‍යාපෘතීන් 61
ශ්‍රී ලංකා රජයේ මූල්‍යාධාරයෙන් සිදු කෙරෙමින් පවතින සුළු හා මධ්‍ය පරිමාන ජල සම්පාදන ව්‍යාපෘතීන් 78
ක්‍රියාත්මක කිරීම සඳහා පෙළ ගස්වනු ලැබ ඇති ව්‍යාපෘතීන් (ජල සම්පාදන ව්‍යාපෘතීන්) 81
ක්‍රම සම්පාදනය හා සැලැසුම්කරණය (ජල සම්පාදන ව්‍යාපෘතීන්) 83

මලාපවහනය

ක්‍රියාත්මක මලාපවහන යෝජනා ක්‍රම 87
මලාපවහන ක්‍රියාකාරකම් 88
ක්‍රියාත්මක කෙරෙමින් පවතින මලාපවහන ව්‍යාපෘති 89
විදේශීය අරමුදල් යටතේ වූ මලාපවහන ව්‍යාපෘති 90
ශ්‍රී ලංකා රජයේ මූල්‍යාධාරයෙන් සිදු කෙරෙමින් පවතින සුළු හා මධ්‍ය පරිමාණ මල අපවහන ව්‍යාපෘතීන් 94
ක්‍රියාත්මක කිරීම සඳහා පෙළ ගස්වනු ලැබ ඇති ව්‍යාපෘතීන් (මලාපවහන ව්‍යාපෘතීන්) 94
ක්‍රම සම්පාදනය හා සැලැසුම්කරණය (මලාපවහනය) 98

මූල්‍ය හා විගණන වාර්තා

විගණන හා කළමනාකරණ කමිටුවේ වාර්තාව 100
මූල්‍ය ප්‍රකාශන 102
2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ විගණකාධිපති වාර්තාව 133
කෙටි යෙදුම් 169
සංස්ථානික තොරතුරු - පසු කවරය ඇතුල් පැත්තේ 171

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති තැන්පත්
අතිගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා



නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය
ගරු රවුෆ් හකීම් මැතිතුමා

නගර සැලසුම් හා ජල සම්පාදන රාජ්‍ය අමාත්‍ය
ගරු සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මැතිනිය.

නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ ලේකම් වරයාගේ පණිවුඩය.

2017 වර්ෂය තුළදී නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය විසින් ආරක්ෂිත පානීය ජලය සම්පාදනය කර දීම හා අපජලය බැහැර කිරීමේ පහසුකම් සපයා දීම මගින් ජාතිය වෙත සේවය කිරීම සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය සමග අඛණ්ඩ ලෙස එක්ව කටයුතු කිරීමෙහි යෙදී සිටින ලදි. 2017 වර්ෂයේ අවසානය වන විට රටේ මුළු ජන ගහණයෙන් 38.7% ක ප්‍රතිශතයක් ආවරණය කරමින් නල මාර්ග හරහා ජලය සම්පාදනය කිරීමේ සේවා සම්බන්ධතාවයන් 2,219,172 ක් සපයා දීමට ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට හැකියාව ලැබුණ අතර ඒ මගින් රටේ සමස්ත ජනගහණය අතුරින් නල ජල සම්පාදන සේවාවන් මගින් ආවරණය කරනු ලබන ප්‍රතිශතය 49.2% ක මට්ටමට රැගෙන ඒමට ද ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් සිය දායකත්වය දෙනු ලැබ ඇත. ප්‍රස්තුත වර්ෂය තුළදී විදේශීය අරමුදල් සම්පාදනය සහිතව දියත් කරන ලද දැනට ඉදිරියට කරගෙන යමින් පවතින විශාල පරිමාණ ජල සම්පාදන ව්‍යාපෘතීන් 17 ක් ක්‍රියාත්මක කරනු පිණිස නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය විසින් සිය සහාය ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත ලබා දෙන ලදි.

නල ජලය සම්පාදනය කර දීමට අමතර වශයෙන් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් රට තුළ නල මාර්ග මලාපවහන සේවා වැඩි දියුණු කිරීම සඳහා දරන ලද ප්‍රයත්නය දීර්ඝ කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මගින් ප්‍රස්තුත වර්ෂය තුළදී විදේශීය අරමුදල් සම්පාදනය යටතේ වූ මහා පරිමාණ මලාපවහන ව්‍යාපෘතීන් 7 ක් ක්‍රියාත්මක කරනු ලබන අතර නව නල මලාපවහන සේවා සම්බන්ධතාවයන් 2,500 කට අධික සංඛ්‍යාවක් සපයා දෙනු ලැබ ඇත.

මීට අමතර ලෙස, නොදන්නා හේතූන් නිසා ඇති වන නිදන්ගත වකුගඩු රෝගයේ තර්ජනයට ගොදුරු වී ඇති ප්‍රදේශයන් වෙත ආරක්ෂිත පානීය ජල පහසුකම් සම්පාදනය කර දීම ඇතුළුව නැගී එන කුඩා නගර (කුඩා හා මධ්‍ය පරිමාණ) ජල සම්පාදන ව්‍යාපෘති හා ජල අංශ ප්‍රජාව පහසුකරණය යන වැය ශීර්ෂයන් යටතේ රුපියල් මිලියන 1,134.76 ක මුදල් ප්‍රමාණයක් ආයෝජනය කිරීම මගින් ප්‍රස්තුත වර්ෂය මුළුල්ලේම අමාත්‍යාංශය විසින් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය සමග එක් වී දිගින් දිගටම වැඩ කටයුතු කරගෙන යන ලදි.

2017 වර්ෂය තුළදී අප වෙත ලබා දෙන ලද සහාය සම්බන්ධයෙන් ප්‍රධාන වශයෙන් ශ්‍රී ලංකා ජන රජය, ආසියානු සංවර්ධන බැංකුව, ජපන් ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සිය, ස්වීඩන් ජාත්‍යන්තර සංවර්ධන ඒජන්සිය, එක්සත් ජාතීන්ගේ ජාත්‍යන්තර ළමා අධ්‍යාපන අරමුදල, ලෝක බැංකුව හා ඕස්ට්‍රේලියාව, ඕස්ට්‍රියාව, බෙල්ජියම, චීනය, ප්‍රංශය, හන්ගේරියාව, ඉන්දියාව, නෙදර්ලන්තය, දකුණු කොරියාව, ස්පාඤ්ඤය යනාදී රටවල රාජ්‍යයන් වෙත සහ එක්සත් ජනපද අපනයන ආනයන බැංකුව ඇතුළු අපගේ බොහෝ අරමුදල් සම්පාදන හවුල් කරුවන් වෙත අමාත්‍යාංශය සිය කෘතඥතාවය පළ කර සිටියි.

වර්ෂ 2020 වන විට ජනගහණයෙන් 60% කට නල ජලය හා 3.3% කට නල මලාපවහන සම්බන්ධතා සම්පාදනය කර දීම සඳහා දැනටමත් ස්ථාපිත කරනු ලැබ ඇති ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා අමාත්‍යාංශය විසින් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය සමග එක් වී ඉදිරි වර්ෂයන් තුළදී ද වැඩ කටයුතු කරනු ලබනවා ඇත.

නගර සැලසුම්කරණය හා ජල සම්පාදනය සම්බන්ධයෙන් වූ රජයේ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමෙහි ලා අප වෙත දෙනු ලැබුවාවූ නායකත්වය හා මග පෙන්වීම් වෙනුවෙන් නගර සැලසුම් හා ජල සම්පාදන කටයුතු පිළිබඳ ගරු අමාත්‍ය තැන්පත් ගරු රවුෆ් හකීම් මැතිතුමා වෙත හා අප සියළු දෙනා වෙත දෙන ලද සහයෝගය වෙනුවෙන් නගර සැලසුම් හා ජල සම්පාදන කටයුතු පිළිබඳ ගරු රාජ්‍ය අමාත්‍ය තැන්පත් ගරු සුදර්ශනී ප්‍රනාන්දුපුල්ලේ මැතිනිය වෙත ද මාගේ කෘතඥතාවය පිරිනැමීමට මම මෙය අවස්ථාවක් කර ගනිමි.

මහ ජනතාව වෙත ඉහළ ගුණාත්මයේ ජල සම්පාදන සේවාවක් හා මලාපවහන සේවාවක් සම්පාදනය කර දීම සඳහා සහ සිය ජල සම්පාදන හා සනීපාරක්ෂණ ඉලක්කයන් සපුරා ගැනීම සඳහා 2018 වර්ෂය වෙනුවෙන් හා ඉන් ඔබ්බට පෙළ ගස්වනු ලැබ ඇති විවිධ සංවර්ධන වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම සඳහා ද ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් දරනු ලබන ප්‍රයත්නයන් සර්ව ප්‍රකාරයෙන්ම සාර්ථක වේවා යැයි මම ප්‍රාර්ථනය කරමි.

ඩී.පී.එම්.වී. හපුආරච්චි
ලේකම්
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය.

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය

පානීය ජලය සැපයීමේ වගකීම මුලින්ම පැවරී තිබුනේ මහජන වැඩ දෙපාර්තමේන්තුවට වන අතර පසුව එය 1965 දී ජල සම්පාදන දෙපාර්තමේන්තුව බවට පත් කරන ලදි. ඉන් පසුව 1975 දී පාර්ලිමේන්තු පණතක් මගින් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය පිහිටුවන ලදි.

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය දැනට ක්‍රියාත්මක වන්නේ ජල සම්පාදනය, මලාපවහනය හා නගර සැලසුම්කරණය යන විෂයයන් වෙන වෙනම ආවරණය කිරීම සඳහා 2015 වර්ෂයේදී ස්ථාපිත කරන ලද නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය යටතේය.

ජනගහණයෙන් 89.3% කට පමණ ආරක්ෂිත පානීය ජලය ලබාගැනීමේ හැකියාව තිබෙන අතර 49.2% ක ජනතාවක් රට පුරා ක්‍රියාත්මක වන නල ජල සැපයුම් පද්ධතීන් තුළින් පානීය ජල පහසුකම් සපයා ගනිති.

වාර්තාව පිළිබඳ දැනුම් දීම.

නගර සැලසුම් හා ජල සම්පාදනය පිළිබඳ ගරු ඇමතිතුමා
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය
ලක්දිය මැදුර
අංක 35, සුනිල් මාවත
පැලවත්ත - බත්තරමුල්ල.

ප්‍රිය මහත්මයාණෙනි,

වාර්ෂික වාර්තාව හා මූල්‍ය ප්‍රකාශන - 2017
ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය.

1971 අංක 38 දරණ මූල්‍ය පණතේ 14 (2) වගන්තිය අනුව 2017 දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා වූ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව හා මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඔබතුමන් වෙත මෙයින් ගෞරවයෙන් ඉදිරිපත් කර සිටිනු ලැබේ.

මෙයට,
ඔබේ විශ්වාසී

ඉංජිනේරු කේ.ඒ.අන්සාර්
සභාපති,
ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය.

සභාපතිවරයාගේ ප්‍රකාශය.

> “2016 වර්ෂය හා සසඳා බලන විට 2017 වර්ෂය තුළදී රට පුරා ක්‍රියාත්මක කරන ලද ජල සම්පාදන යෝජනා ක්‍රමයන් 343 ක් හරහා ජලය ඝණ මීටර මිලියන 686 ක් නිෂ්පාදනය කිරීම මගින් මුළු පානීය ජල නිෂ්පාදනය 5.7% කින් වර්ධනය වී ඇත.”

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් 2017 වර්ෂය මුළුල්ලේම මහ ජනතාව වෙත සුරක්ෂිත පානීය ජලය හා මලාපවහන පහසුකම් සම්පාදනය කර දීම තුළින් ජාතිය වෙත මිල කළ නොහැකි සේවාවක් ලබා දීමෙහි යෙදෙන ලදි. රටේ නල ජල සම්පාදන කටයුතු වර්ධනය කිරීමේ ප්‍රයත්නය වෙත සිය දායකත්වය ලබා දෙමින් මොනරාගල - බුත්තල ඒකාබද්ධ ජල සම්පාදන යෝජනා ක්‍රමය, ලබුගම - කලටුවාව ජල සම්පාදන යෝජනා ක්‍රමය පුනරුත්ථාපනය කිරීම හා වර්ධනය කිරීම, නැගෙනහිර පලාතේ ජල සම්පාදන සංවර්ධන ව්‍යාපෘතිය හා කිලිනොච්චි පුනරුත්ථාපන ජල සම්පාදන ව්‍යාපෘතිය නම් විදේශ අරමුදල් සම්පාදනය යටතේ ක්‍රියාත්මක වූ මහා පරිමාණ ජල සම්පාදන ව්‍යාපෘතීන් හතරක සංඛ්‍යාවක් ප්‍රස්තුත වර්ෂය තුළදී සම්පූර්ණයෙන් නිම කරන ලදි. ඒ අනුව, රටේ විවිධ පලාත් ආවරණය කරමින් දැනට ක්‍රියාත්මක වෙමින් පවතින ඇතැම් ජල සම්පාදන සේවාවන්ගේ සේවා මට්ටම වැඩි දියුණු කරන අතර 2017 වර්ෂය තුළදී නව ජල සම්පාදන සේවා සම්බන්ධතාවයන් 126,701 ක් ලබා දීමට ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට හැකියාව ලැබිණි.

2016 වර්ෂය හා සසඳා බලන විට 2017 වර්ෂය තුළදී රට පුරා ක්‍රියාත්මක කරන ලද ජල සම්පාදන යෝජනා ක්‍රමයන් 343 ක් හරහා ජලය ඝණ මීටර මිලියන 686 ක් නිෂ්පාදනය කිරීම මගින් මුළු පානීය ජල නිෂ්පාදනය 5.7% කින් වර්ධනය වී ඇත. මෙම සුරක්ෂිත පානීය ජලය පාරිභෝගිකයින් වෙත සම්පාදනය කර දෙන ලද්දේ සේවා සම්බන්ධතාවයන් 2,219,172 ක් මගින් වන අතර 2017 වර්ෂයේ අවසානය වන විට නල පානීය ජල සම්පාදනය ලබමින් සිටින ජන සංඛ්‍යාව ජන ගහණයෙන් 49.2% ක මට්ටමට ගෙන ඒමට මේ අනුව හැකි විය. මෙම අඛන්ඩව වර්ධනය වෙමින් පවතින නල ජල සම්පාදන ආවරණය 2020 වර්ෂය වන විට නල ජල සම්පාදන ආවරණය 60%ක් දක්වා වර්ධනය කිරීමේ ඉලක්කය කරා ළඟා වීම හා සමඟ සමාන්තර ලෙස ගමන් කරයි.

2017 වර්ෂය තුළ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් නඩත්තු කරනු ලබන මලාපවහන සේවා සම්බන්ධතාවයන් මුළු සංඛ්‍යාව 21,719 ක් බවට පත් කරමින් නව මලාපවහන සේවා සම්බන්ධතාවයන් 2,500 ක් දෙන ලද අතර, 2016 වර්ෂය හා සසඳා බලන විට එය 12% ක වර්ධනය වීමකි. කොළඹ මහ නගර සභාව විසින් නඩත්තු කරනු ලබන පල්දෝරු කාණු පද්ධතිය ඇතුළුව 2017 වර්ෂයේ අවසානය වන විට රට තුළ ක්‍රියාත්මක වන සමස්ත නල මලාපවහන ආවරණය 2.07% ක් විය.

මෙම වර්ෂය 2016 - 2020 සංයුක්ත සැලසුම ක්‍රියාත්මක කිරීමේ 2 වැනි වර්ෂය වූ අතර, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ කාර්ය මණ්ඩල සාමාජිකයින් එකී සංයුක්ත සැලැසුම මගින් ස්ථාපිත කරනු ලැබ ඇති ඉලක්කයන් හා අරමුණු සාක්ෂාත් කර ගැනීමේ අධිෂ්ඨානයෙන් යුතුව අඛන්ඩ ලෙස වැඩ කටයුතු කරමින් සිටියහ.

ප්‍රාග්ධන ක්‍රියාකාරකම් වෙනුවෙන් ජල සම්පාදන හා සනීපාරක්ෂණ ආවරණය සඳහා ප්‍රස්තුත වර්ෂය තුළදී රුපියල් බිලියන 30.18 ක මුදලක් ආයෝජනය කිරීමට ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත හැකියාව ලැබුණි. මෙම ආයෝජනයන් ප්‍රධාන වශයෙන්ම කරන ලද්දේ විදේශ අරමුදල් සම්පාදනය යටතේ ක්‍රියාත්මක වන මහා පරිමාණ ජල සම්පාදන ව්‍යාපෘතීන් 17 ක් හා විදේශ අරමුදල් සම්පාදනය යටතේ ක්‍රියාත්මක වන මහා පරිමාණ මලාපවහන ව්‍යාපෘතීන් 7 ක් වෙනුවෙන් වන අතර, එම ව්‍යාපෘතීන් වර්ෂය තුළ ක්‍රියාත්මක කරනු ලබමින් පැවැතිනි. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් 2017 වර්ෂය තුළදී රුපියල් මිලියන 945.74 ක තමන්ගේම මූල්‍ය ප්‍රභවයන් භාවිතා කරමින් දැනට ක්‍රියාත්මක වෙමින් පවත්නා ජල සම්පාදන හා මලාපවහන යෝජනා ක්‍රමයන් පුනරුත්ථාපනය කිරීමේ හා වැඩි දියුණු කිරීමේ යෙදී සිටින ලද්දේය. ඊට වැඩිමනත් ලෙස, දේශීය බැංකු වෙතින් ලබා ගන්නා ලද රුපියල් මිලියන 6,914 ක් වූ ණය පහසුකම් භාවිතා කරමින් දේශීය බැංකු අරමුදල් සම්පාදනය යටතේ වූ ජල සම්පාදන ව්‍යාපෘතීන් 15 ක සංඛ්‍යාවක් ද 2017 වර්ෂය තුළදී ක්‍රියාත්මක කරන ලදි.

පෙර වර්ෂයන් තුළදී මෙන්ම 2017 වර්ෂය තුළදී ද කෙටි කාලීන මෙන්ම දිගු කාලීන පියවර ගනිමින් ආදායම් රහිත ජල පරිමාව අඩු කිරීම සඳහා වූ විශේෂ ප්‍රයත්නය කලාපීය සහාය සේවා මධ්‍යස්ථාන මට්ටමේදී මෙන්ම විදේශ අරමුදල් සම්පාදනය යටතේ වූ මහා පරිමාණ ව්‍යාපෘති මට්ටමේදී ද ක්‍රියාත්මක කරන ලද අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් කොළඹ මහ නගර සභා ප්‍රදේශය තුළ ආදායම් රහිත ජල පරිමාව 2.14% ක ප්‍රතිශතයකින් ද, බටහිර මධ්‍යම කලාපීය සහාය සේවා මධ්‍යස්ථාන ප්‍රදේශය තුළ 1.64% ක ප්‍රතිශතයකින් ද අඩු කර ගැනීම සාක්ෂාත් කර ගනු ලැබූ අතර දිවයින පුරා ආදායම් රහිත ජල පරිමාව 1.07% ක ප්‍රතිශතයකින් අඩු වී ඇති බව ද වාර්තාගත වී තිබේ.

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් 2017 වර්ෂයේ හඳුනා නොගත් හේතූන් නිසා ඇති වන නිදන්ගත වකුගඩු රෝග සහන වැඩ කටයුතු සඳහා නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය විසින් වෙන් කර දෙන ලද ප්‍රාග්ධන වැය වෙන් කිරීමෙන් රුපියල් මිලියන 386.2 ක පිරිවැයක් දරමින් හඳුනා නොගත් හේතූන් නිසා ඇති වන නිදන්ගත වකුගඩු රෝගයේ බල පෑමට ගොදුරු වී ඇති ප්‍රදේශයන් තුළ ජීවත් වන ජනතාව වෙනුවෙන් සුරක්ෂිත පානීය ජලය සම්පාදනය කර දීම අරමුණු කොට ගත් බොහෝ ක්‍රියාකාරකම් ද වර්ෂය තුළදී ක්‍රියාත්මක කරන ලදි.

පාරිභෝගික ජනතාව වෙත සම්පාදනය කර දෙනු ලබන ජලයේ ගුණාත්මය සහතික කිරීම කෙරෙහි ප්‍රස්තුත වර්ෂය තුළදී විශේෂ අවධානය යොමු කරමින් කටයුතු කරන ලද්දේය. ලෝක සෞඛ්‍ය සංවිධානයෙන් ලද උපදේශකත්වය හා ක්‍රියාත්මක කිරීමේ සහාය උපයෝගී කර ගනිමින් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ජල සුරක්ෂිතතා සැලසුම ක්‍රියාත්මක කිරීම 2017 වර්ෂය තුළදී දිගින් දිගටම කරගෙන යනු ලැබිණි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් 2017 වර්ෂයේ අවසානය වන විට මහනුවර ස්ථාපිත කරනු ලැබ ඇති ජල සුරක්ෂිතතා සැලසුම් උපදේශක ඒකකයේ සහාය ලබා ගනිමින් කලාපීය සහාය සේවා මධ්‍යස්ථානයන් හාරව කටයුතු කරන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරුන් විසින් නාගරික ජල සුරක්ෂිතතා සැලසුම් 116 ක සංඛ්‍යාවක් විවිධ අදියරයන් යටතේ ක්‍රියාත්මක කරනු ලබමින් පැවැතිනි. මීට අමතර වශයෙන් සම්පාදනය කර දෙනු ලබන ජලයේ ගුණාත්මය සහතික කිරීමේ අරමුණින් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ මධ්‍යම රසායනාගාරය විසින් ද කලාපීය රසායනාගාරයන් හා සමග එක්ව වැඩ කටයුතු සිදු කරගෙන යන ලදි. සුරක්ෂිත පානීය ජලය සම්පාදනය කර දීම සහතික කරමින් අදාල ප්‍රමිතීන්ට අනුව යෝජනා ක්‍රමයන්ගේ ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයන්ට අනුබද්ධ ජල ප්‍රභවයන්ගේ ජලයේ ගුණාත්මකභාවය මසකට දෙවරක් පරීක්ෂණයට භාජනය කරන ලද අතර ප්‍රතිකාරක ක්‍රියාවලියේ ජලයේ ගුණාත්මකභාවය සති පතා විශ්ලේෂණයට භාජනය කරන ලදි.

නූතන සන්දර්භය තුළ සංවිධානයේ වර්ධනය හා තිරසාර භාවය ඇති කිරීම සඳහා තීරණාත්මක වශයෙන් වැදගත් වන නව්‍යකරණය ප්‍රවර්ධනය කිරීම පිණිස ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් වර්ෂය මුළුල්ලේම තොරතුරු තාක්ෂණ සංවර්ධනය කෙරෙහි සිය අවධානය යොමු කරමින් කටයුතු කරන ලද්දේය.

සිය පද්ධතීන් ගුණාත්මක වශයෙන් හා ප්‍රමාණාත්මක වශයෙන් ඉහළ ශ්‍රේණිගත කිරීම සමගින් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලීය බල ශක්ති කළමනාකරණ වැඩ සටහන විසින් සෑහෙන ප්‍රගතියක් සාක්ෂාත් කරගනු ලැබ ඇත. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලීය යාන්ත්‍රික හා විද්‍යුත් අංශය බල ශක්ති කළමනාකරන වැඩ කටයුතු සඳහා අවශ්‍ය සෑම වර්ගයකම බල ශක්ති විගණනයන් ක්‍රියාත්මක කිරීම පිණිස ඕනෑ කරන බල ශක්ති මිනුම් උපකරණයන්ගෙන් පූර්ණ ලෙස සජ්ජිත වී ඇත.

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සාර්ථක මෙහෙයුම් හා සංවර්ධන ආරම්භක ක්‍රියාවන් සාක්ෂාත් කර ගැනීමෙහි ලා සෑම වර්ගයකටම අයත් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලීය කාර්ය මණ්ඩල සාමාජිකයින් විසින් දෙන ලද දායකත්වය ඉතා සුවිශේෂී තත්ත්වයක විය. එම මෙහෙයුම් වලට හා ආරම්භක ක්‍රියාවන්ට ක්‍රම සම්පාදනය, සැලැසුම් සකස් කිරීම, විමර්ෂණ පැවැත්වීම, සාධ්‍යතා අධ්‍යයන පැවැත්වීම, ඉදි කිරීම්, මෙහෙයුම් හා නඩත්තු කටයුතු, ක්‍රියාවලී පාලනය හා ප්‍රශස්තිකරණය සහ ගෝලීය පාරිසරික බැඳීම් වලට අනුකූල ලෙස ආර්ථික මෙහෙයුම් සාක්ෂාත් කර ගැනීමේ අරමුණින් සුපරීක්ෂාකාරී ලෙස සැලැකිලිමත් වෙමින් බල ශක්ති සංරක්ෂණය කිරීම ද ඇතුලත් විය.

ප්‍රස්තුත වර්ෂය තුළදී ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ක්‍රියාකාරකම් සාර්ථක ලෙස නිම කිරීමෙහි ලා නගර සැලසුම් හා ජල සම්පාදන කටයුතු පිළිබඳ ගරු අමාත්‍යතුමන් වෙතින් ලැබුණ සහයෝගය පිළිබඳව අපි විතුමන් වෙත අපගේ කෘතඥතාවය පුද කර සිටින්නෙමු. ජල සම්පාදනය හා මලාපවහන පහසුකම් භාර අමාත්‍යතුමන් වශයෙන් විතුමන් වෙතින් අප වෙත ලැබුණ උපදේශයන් හා මග පෙන්වීම් මිල කළ නොහැකි වේ. වර්ෂය මුළුල්ලේම අප වෙත දිගු කරන ලද සිය මග පෙන්වීම් හා සහාය සම්බන්ධයෙන් අපගේ අවංක කෘතඥතාවය නගර සැලසුම් හා ජල සම්පාදන කටයුතු පිළිබඳ ගරු රාජ්‍ය අමාත්‍ය තුමියට ද හිමි වේ. ඒ අතර අවශ්‍ය සෑම අවස්ථාවකදීම අප වෙනුවෙන් සිදු කරන ලද සමායෝජනය, දෙන ලද උදව් උපකාර හා සහාය වෙනුවෙන් නගර සැලසුම් හා ජල සම්පාදන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම් තුමන් වෙත හා සමස්ත කාර්ය මණ්ඩලය වෙත අපගේ කෘතඥතාවය පුද කර සිටීමට ද අපි මෙය අවස්ථාවක් කර ගනිමු.

අපගේ සෑම ක්‍රියාකාරකමකදීම ප්‍රගතිය සාක්ෂාත් කර ගැනීම සඳහා අප වෙත අඛණ්ඩ ලෙස කරන ලද උදව් උපකාර සම්බන්ධයෙන් මුදල් අමාත්‍යාංශයේ ලේකම් තුමන් වෙත හා මහා භාණ්ඩාගාරයේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත ද අපගේ කෘතඥතාවය පිරිනැමීමට අපි මෙය අවස්ථාවක් කර ගනිමු.

මුළු රට පුරාම අප විසින් ජල සම්පාදන හා සනීපාරක්ෂණ සේවා අංශය තුළ සිදු කරන ලද සංවර්ධන වැඩ කටයුතු සාර්ථක කර ගැනීම සඳහා අප වෙත අත හිත දුන් බහු ජාතික අනුග්‍රාහකයින් වෙත හා ද්විපාර්ශ්වික අරමුදල් සම්පාදකයින් වෙතද අපගේ කෘතඥතාවය පිරිනමා සිටින්නෙමු. මෙම අංශයේ සංවර්ධන වැඩ කටයුතු සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය සමග එක්ව සහභාගි වීමට ඔවුන් විසින් දක්වන ලද උනන්දුව සම්බන්ධයෙන් අපි ඔවුන් වෙත ස්තුතිවන්ත වන්නෙමු.

ප්‍රස්තුත වර්ෂය තුළ අප විසින් සාක්ෂාත් කරගනු ලැබ ඇති ප්‍රගතිය අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයින් හා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ කාර්ය මණ්ඩල සාමාජිකයින් විසින් කරන ලද කැප කිරීම් වල හා දරන ලද ප්‍රයත්නයන්ගේ ප්‍රතිඵලයකි. ඔවුන්ගේ කැප කිරීම්, වෙහෙස නොබලා කාර්යයෙහි නියැලීම් හා උපහාරිතයන් නොතිබෙන්නට අප විසින් ලබාගෙන ඇති ජයග්‍රහණයන් ලබා ගැනීමට නොහැකි වන්නට ඉඩ තිබුණි. එළඹෙන වර්ෂයන් තුළදී ද පාරිභෝගිකයින් තුළ තෘප්තිය ඇති වන පරිදි ජල සම්පාදන හා සනීපාරක්ෂණ පහසුකම් සේවාවන්ගේ තත්ත්වය වැඩි දියුණු කිරීම මගින් රටේ සෑම ප්‍රදේශයකම ජීවත් වන ජනතාවගේ සෞඛ්‍ය, සමාජ හා ජීවන තත්ත්වයන් නංවා ලීම සඳහා ඔවුන්ගේ අප්‍රතිහත ආයාසය අපි අපේක්ෂා කරන්නෙමු. ඒ අතර, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලීය පාර්ශවය තුළ කිසියම් අඩු ලුහුඬුකම් දක්නට තිබේ නම් අප වෙනුවෙන් ඒවා ඉවසා දරාගන්නා ලෙස හා එවැනි තත්ත්වයන් තව දුරටත් වැඩි දියුණු කළ හැකි වන පරිදි අප වෙත එවැනි අඩු ලුහුඬුකම් දැනුම් දීමට කාරුණික වන ලෙස ද අපගේ ගණුදෙනුකරුවන්ගෙන් ඉල්ලා සිටිමු.

ඉංජිනේරු කේ. ඒ. අන්සාර්
සභාපති
ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය.

“අපි ජලය මගින් සෑම දෙයකටම ජීවනය දෙන්නෙමු”

ශුද්ධ වූ කුරානය

සංස්ථානික පාලනය හා සංවිධාන වෙනස්වීම සම්බන්ධය

පේර් ආරු වේල්ල

සංවිධාන ව්‍යුහය



අධ්‍යක්ෂ මණ්ඩලය

- 01 සභාපති
- 02 උප සභාපති
- 03 ක්‍රියාකාරී අධ්‍යක්ෂක
- 04 අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
- 05 අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
- 06 අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
- 07 අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
- අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්

ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය

- 08 සාමාන්‍යාධිකාරී
- 09 අතිරේක සාමාන්‍යාධිකාරීන්
- 10 කොට්ඨාස හාර නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීන්
- 11 පළාත් හාර නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීන්
- 12 ව්‍යාපෘති අධ්‍යක්ෂවරුන් ලෙස වැඩ කරන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීන්

අධ්‍යක්ෂ මණ්ඩලය

01. ඉංජිනේරු කේ. ඒ. අන්සාර්
Chartered Civil Engineer / Lead Auditor (QMS)
MSc. (Delft)) B. Sc. Eng. (Hons)
Dip. H.E. (Delft), C. Eng. MIE (SL)
සභාපති, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය
(2015.02.05 සිට)

02. එම්. ෂෆීක් රාජබ්ඩීන් මහතා
උප සභාපති, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය
(2015.03.10 සිට)

03. පී. අයි. ටී. මහිලාල් සිල්වා මහතා
BA, MA, M.S.Sc
ක්‍රියාකාරී අධ්‍යක්ෂ, ජාතික ජල සම්පාදන හා ජලාපවහන
මණ්ඩලය (2015.02.05 සිට)

04. වෛද්‍ය පී. ජී. මහිපාල
MBBS, MSc, MD, MBA, FCMA, DPM, DBS, DED, DMgt.
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්, සෞඛ්‍ය අමාත්‍යාංශය,
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික, ජාතික ජල සම්පාදන හා
ජලාපවහන මණ්ඩලය (2017.01.02 දක්වා)

වෛද්‍ය ටී. බී. ආනන්ද ජයලාල්
MBBS, MSc Medical Administration, PG Cert. in Paed Nutrition,
අධ්‍යක්ෂ, යොවුන්, වියපත් හා ආබාධිත පුද්ගලයින්
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික, ජාතික ජල සම්පාදන හා ජලාපවහන
මණ්ඩලය
(2017.01.20 සිට)

05. ජේ. එම්. ය්‍ූ. පී. ජයමහ මහතා
DPFM, PGD (A&F), APFASL ආශ්‍රිත සාමාජික
අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, මහජන ව්‍යවසාය දෙපාර්තමේන්තුව.
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික, ජාතික ජල සම්පාදන හා ජලාපවහන
මණ්ඩලය (2015. 04. 02 සිට)

06. ශාන්ත රත්නායක මහතා
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික, ජාතික ජල සම්පාදන හා ජලාපවහන
මණ්ඩලය (2015.02.12 සිට)

07. කේ. ඒ. සුබද්‍රා වල්පොල මහත්මිය,
ශාස්ත්‍රපති, ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්, පලාත් පාලන හා පලාත් සභා අමාත්‍යාංශය
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික, ජාතික ජල සම්පාදන හා ජලාපවහන
මණ්ඩලය (2015.02.13 සිට)

අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්
ඩබ්ලිව්. පී. සඳමාලි ද සිල්වා මහත්මිය
B Sc Special (Hons), Master of Public Management, IMSL (Member)

2017 වර්ෂය තුළදී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 13 ක් පවත්වන ලදි.

ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය

08. සාමාන්‍යාධිකාරී
ඉංජිනේරු ඩී. ය්‍ූ. සුමනසේකර
B Sc. Eng., C. Eng. FIE (SL), M. Sc. (Struct. E.) UK
(2017.04.22 සිට)

ඉංජිනේරු ජී. ඒ. කුමාරරත්න
B. Sc. Eng. (Hons), M. Sc. (UK), C. Eng. FIE (SL)
MICE (Lond.), MIWEM (Lond.), P.G. Dip. in Industrial Eng.
(2017.04.21 දක්වා)

09. අතිරේක සාමාන්‍යාධිකාරිවරුන්
ඉංජිනේරු ඩබ්ලිව්. බී. ජී.ප්‍රනාන්දු (සංස්ථානික සේවා)
B. Sc. Eng (Hons), P.G. Dip. (EWREM), C. Eng. FIE (SL)

ඉංජිනේරු ජේ. ආර්. බී. නැදුරන (මලාපවහනය)
B. Sc. Eng (Hons), PG Dip Environmental Science & Tecnology (Delft)., C Eng. MIE (SL)

ඉංජිනේරු ආර්. එච්. රුවිනිස් (ජල සම්පාදන ව්‍යාපෘති)
B Sc Eng. (Hons), PG Dip (App Hy), MBA,
C Eng. FIE (SL), MIE (Aus), CP Eng.,

ඉංජිනේරු එස්. පී. පේ. රාජ්කුමාර් (උතුරු මැද)
C Eng, FIE (SL), M Sc in Sanitary Engineering,
M Sc in Environmental Engineering and Management.

ඉංජිනේරු බී. එස්. විජේමාන්න (බටහිර)
B Sc (Eng), M Eng. Hydrology & Water Resources, IHE (Delft)
Dip in Construction Management, C Eng., MIE (SL)

ඉංජිනේරු එන්. එච්.ආර්. කුලනාථ (දකුණු නැගෙනහිර)
B.Sc Eng. C. Eng. MIE (SL)

ඉංජිනේරු තිලින එස්. විජේතුංග (ප්‍රතිපත්ති හා ක්‍රම සම්පාදන)
B Sc Eng, C Eng., FIE (SL), MBA, M Sc (Planning),
MA (Financial Economics), MIM (SL), PG Dip. (Finance),
ICA (SL), Dip. (Mgt) – DK

ඩී. තොටවත්ත මහතා (මූල්‍ය)
B Com (Sp), ACA, MA (Fin Econ)

ජී. කේ. ඉද්දමල්ගොඩ මහතා (මානව සම්පත් කළමනාකරණය)
B Sc. (B Admin), Dip in Per Mgt.
MA (Mgt & Admin) London

10. අංශ භාර නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරුන්
(2017 දෙසැම්බර් 31 වන විට)

ආර්. එම්. ඒ. එස්. විරසේන මහතා (අභ්‍යන්තර විගණන)
B Com (Sp) PGDBM (Col), ACA

ඒ. පී. එස් ද සිල්වා මහත්මිය (පිරිවැයකරණය)
FCA
එන්. වයි. එස්. අබේගුණවර්ධන මහත්මිය (කාර්මික සම්බන්ධතා)
BA, PG, Dip. in Management (PIM), Member (IMSL)

ආර්. එම්. ඒ. බණ්ඩාර මහතා (සැපයුම්)
B Sc (Business Administration – Spl)
Diploma in Purchasing & Materials Mgt)

එම්. එම්. එස්. පීරිස් මහත්මිය (මූල්‍ය)
B Sc (Accountancy & Finance Mgt), ACA (SL)

ඉංජිනේරු කේ. පී. ආර්. එස්. සමරසිංහ (සංවර්ධන)
M Sc (Water Supply Eng) – The Netherlands,
M Sc (Env Eng) Moratuwa, MIESL, AM (OACETT) Canada.

ඉංජිනේරු එස්. ජී. ජී. රාජ්කුමාර් (වාණිජ)
B Sc Eng. (Hons), C Eng, FIE (SL), M Sc (Denmark), MBA (PIM – USJ), M Eng (Moratuwa)

ඉංජිනේරු එස්. සුමනවීර (නිෂ්පාදන - බටහිර)
B Sc Eng, M Eng. (Env), AIT , C Eng, FIE (SL)

ඉංජිනේරු ශ්‍රූ. රත්නපාල (ව්‍යාපෘති සම්බන්ධීකාරක)
B Sc Eng, C Eng., FIE (SL), PG Dip. in Hydraulics Eng (Moratuwa)
PG Dip in Business & Financial Admin. (ICA)

ඉංජිනේරු කේ. ඩබ්ලිව්. ප්‍රේමසිරි (ක්‍රම සම්පාදන හා සැලසුම්)
B Sc Eng, M Eng. (Hydraulics), M Eng (Structural Eng. Designs),
Int. PE.C Eng., MIE (SL) MSSE (SL)

ඉංජිනේරු කේ. ඩී. පී. එෆ්. සිරිවර්ධන (සමූහික සැලසුම්)
M Sc (Env. Eng) Denmark, PG Dip (Const. Mgt) SL, C Eng, MIE (SL)

ඉංජිනේරු එස්. ජී. ජයවර්ධන (මලාපවහන)
B Sc, PG Dip. in Sanitary Eng., MIE (SL)

ඉංජිනේරු දුලිප් ගුණවර්ධන (ග්‍රාමීය ජල සම්පාදන)
B Sc Eng, C Eng., MIE (SL), M Eng, (IHE – UNESCO)

ඉංජිනේරු ජාලිය ලලිත් සික්කුගේ (ආසියානු සංවර්ධන බැංකු ව්‍යාපෘති)
B Sc Eng. Hons., C Eng., MIE (SL), MBA (PIM – SRJ), PG Diploma (Const. Mgt)
PG Diploma in Drinking Water Mgt.(Germany)

ඉංජිනේරු බී. එල්. ගුණරත්න (යාන්ත්‍රික හා විද්‍යුත්)
B Sc Eng, PG Dip (Sani. Eng) – Norway.

ඉංජිනේරු ජේ. චන්ද්‍රදාස (තොරතුරු තාක්ෂණ)
B Sc Eng, C. Eng. MIE (SL)

11. පලාත් භාර නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරුන් (2017 දෙසැම්බර් 31 වැනි දිනට

ඉංජිනේරු සී. සී. එච්. එස්. ප්‍රනාන්දු (බටහිර දකුණ)
B Sc Eng, MPM, PG Dip. (OSLO University)
MIE (SL), C Eng., MIM (SL),
ඉංජිනේරු ආර්. ඒ. බී. එස්. මෙන්ඩිස් (බටහිර උතුර)
B Sc Eng, C Eng., MIE (SL), M Sc in Sanitary Eng. (Netherlands)

ඉංජිනේරු එම්. එම්. උමා ලෙඛ්බේ (උතුර)
IESL, PG Dip (Str. Eng. Design)
PG Dip (Water & Waste Water Treatment)

ඉංජිනේරු ටී. ඩබ්ලිව්. එස්. පෙරේරා (බටහිර මධ්‍යම)
B Sc Eng. (Spl), C Eng. Masters in Dev. Science, MIE (SL)

ඉංජිනේරු අයි. එම්. ඩබ්ලිව්. කේ. ඉලංගසිංහ (වයඹ)
B Sc (Eng), M Eng (Japan), C Eng, MIE (SL)

ඉංජිනේරු ජී. වී. විජේරත්න (උතුරු මැද)
B Sc (Eng), M Sc (WREM), C Eng, MIE (SL)

ඉංජිනේරු ඩබ්ලිව්. ඩබ්ලිව්. ලියනගේ (සබරගමුව)
M Eng, (Structural Eng. & Design), M Sc (Environmental Eng. & Mgt), C. Eng. FIE (SL)

ඉංජිනේරු ආර්. එස්. ලියනගේ (ඌව)
B Sc (Eng), C Eng. FIC (SL), PGD (Management), MIM, M Sc. Eng (Water and Environmental Resources Management), MBA, M Sc (Water Resources Management, Holland)

ඉංජිනේරු ජේ. කේ. එස්. පතිරණ (දකුණ)
B Sc Eng. Hons, C Eng. MIE (SL), M Sc (Sanitary) Delft.

ඉංජිනේරු එස්. ඒ. රෂීඩ් (නැගෙනහිර)
M Sc (Sanitary Engineering) – The Netherlands,
P G Dip (Structural Engineering Design) Sri Lanka
B Sc (Eng) – Sri Lanka, C. Eng. MIE (SL).

ඉංජිනේරු එම්. කේ. ඩී. ජේ. එච්. මීගොඩ (මධ්‍යම)
B Sc Eng. M Sc (Water Management), MIE (SL), C. Eng.

12. ව්‍යාපෘති අධ්‍යක්ෂවරුන් වශයෙන් කටයුතු කරන අතිරේක සාමාන්‍යාධිකාරීවරුන් / නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරුන්

ඉංජිනේරු ආර්. කුලනාථ (රත්මලාන මොරටුව හා ජා ඇල / ඒකල ප්‍රදේශයන් සඳහා අපජල බැහැර කිරීමේ ව්‍යාපෘතිය)
B Sc (Eng), C Eng. MIE (SL)

ඉංජිනේරු බී. එස්. විජේමාන්න (විසල් කොළඹ පුනරුත්ථාපන ව්‍යාපෘතිය)
B Sc (Eng), M Eng. Hydrology & Water Resources, IHE (Delft)
Dip in Construction Management, C Eng., MIE (SL)

ඉංජිනේරු කේ. ජේ. වී. ඒ. පෙරේරා (ගම්පහ අත්තනගල්ල ජල සම්පාදන ව්‍යාපෘතිය)
P.G Dip in Environmental Engineering & Management,
B Sc (Eng), FIE (SL), M Eng (Sanitary), IHE (Delft)

ඉංජිනේරු ආර්. ඒ. බී. එස්. මෙන්ඩිස් (ආසියානු සංවර්ධන බැංකු 5 වැනි ව්‍යාපෘතිය)
B Sc Eng, C Eng., MIE (SL), M Sc in Sanitary Eng. (Netherlands)

ඉංජිනේරු කේ. පී. ආර්. එස්. සමරසිංහ (ලබුගම-කලටුවාව, සහ කොලොන්න-බලංගොඩ ජල සම්පාදන ව්‍යාපෘතිය)
M Sc (Water Supply Eng) – The Netherlands,
M Sc (Env Eng) Moratuwa, MIESL, AM (OACETT) Canada.

ඉංජිනේරු එස්. ඒ. රෂීඩ් (කොළඹ ජල සම්පාදන සේවා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය)
M Sc (Sanitary Engineering) – The Netherlands,
P G Dip (Structural Engineering Design) Sri Lanka
B Sc (Eng) – Sri Lanka, C Eng. MIE (SL),

ඉංජිනේරු පී. පී. කහදුව (රුහුණුපුර ජල සම්පාදන ව්‍යාපෘතිය)
B Sc (Eng), P G Dip (Water & Waste Water Treatment), PG Dip (BA) C Eng., MIE (SL).

ඉංජිනේරු ආර්. එස්. ලියනගේ (මහියංගනය ජල සම්පාදන ව්‍යාපෘතිය හා බදුල්ල හාලි-ඇල ජල සම්පාදන ව්‍යාපෘතිය)
B Sc (Eng), C Eng. FIC (SL), P G Dip. (Management), MIM, M Sc. Eng (Water and Environmental Resources Management), MBA, M Sc (Water Resources Management, Holland)

ඉංජිනේරු ආර්. ඒ. ඒ. රණවක (නගරාශ්‍රිත සෞඛ්‍ය හා සනීපාරක්ෂිත පහසුකම් වැඩිදියුණු කිරීමේ ජලසම්පාදන ව්‍යාපෘතිය)
B. Sc (Eng) Hons. P G Dip. (Env. Eng & Man). C Eng., FIE (SL).

ඉංජිනේරු අයි. වී. ඩබ්ලිව්. එදිරිවීර (අඹතලේ / ඔරුගොඩවත්ත නල ඵලිමේ ව්‍යාපෘතිය)
B Sc Eng. M Sc (Water Resources Management), M Sc (Development Studies), C Eng., MIE (SL), FIE (SL), MIWA (UK).

පවත්නා ජල සම්පාදන යෝජනා ක්‍රම



පලාත / කලාපීය සේවා මධ්‍යස්ථානය	ජල සම්පාදන යෝජනා ක්‍රම සංඛ්‍යාව.
මධ්‍යම	45
නැගෙනහිර	50
උතුරු මධ්‍යම	28
වයඹ	30
උතුරු	35
සබරගමුව	22
දකුණු	53
ඌව	34
බටහිර මධ්‍යම	11
බටහිර උතුරු	21
බටහිර දකුණු	14
එකතුව	343

සාමූහික සැලසුම්

"ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය යත්න දරන්නේ ප්‍රජාව විසින් පරිභෝජනය කරනු ලබන සියළු ජලය සුරක්ෂිත බව සහතික කිරීමටය."

2017 වර්ෂයේදී පවත්වන ලද තරඟයේදී වාණිජ අංශය විසින් ප්‍රථම ස්ථානය දිනා ගන්නා ලදී.

2016 - 2020 සංස්ථාපිත සැලැසුම ක්‍රියාත්මක කිරීමේ තත්ත්වය.

සමාලෝචනයට බඳුන් වන වර්ෂය 2016-2020 සංස්ථාපිත සැලැසුමේ දෙවන වර්ෂය විය. මෙම සංස්ථාපිත සැලැසුම පිළියෙල කරන ලද්දේ සාමාන්‍යාධිකාරිවරයා විසින් පත් කරන ලද ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන් 14 දෙනෙකුගෙන් සමන්විත වූ විශේෂ කමිටුවක් විසිනි.

පෙර සංස්ථාපිත සැලැසුමේ (2012-2016 සංස්ථාපිත සැලැසුම) ප්‍රධාන ප්‍රතිඵල ක්ෂෙත්‍රයන් අන්තර්ගත කිරීම මගින් විශේෂ කමිටුව විසින් අදාල ඉලක්කයන් යටතේ එන සෑම සියළු ක්‍රියාකාරකමකම ප්‍රගතිය වේගවත් ලෙස පසුවිපරම් කිරීමට හැකි වන පරිදි 2016-2020 නව සංස්ථාපිත සැලැසුමේ ඉලක්ක සංඛ්‍යාව 7 සිට 4 දක්වා අඩු කිරීමට තීරණය කරන ලදී.

සංස්ථාපිත සැලැසුම මගින් පිහිටුවනු ලැබ ඇති ඉලක්කයන් හා අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් වර්ෂය තුළ අඛණ්ඩ ලෙස ක්‍රියා කරන ලදී. පිහිටුවනු ලැබ ඇති අරමුණු හා ඉලක්කයන් සාර්ථක ලෙස සාක්ෂාත් කර ගැනීම සඳහා කාලෝචිත ලෙස සමාලෝචනය කිරීමේ ඇති වැදගත්කම සැලකිල්ලට බඳුන් කරන ලදී.

සංස්ථාපිත ක්‍රියාකාරී සැලැසුම ක්‍රියාත්මක කිරීමේ ත්‍රෛමාසික ප්‍රගතිය අදාල ඉලක්කය වෙනුවෙන් වගකීම දරන සෑම කළමනාකරුවකු විසින්ම අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් වෙත ඉදිරිපත් කරන ලදී. (ඒ ඒ ඉලක්කය සඳහා වගවීම පිණිස පත් කරනු ලැබ ඇති කළමනාකරුවකුගේ අභිප්‍රේක්ෂණය යටතේ ක්‍රියාත්මක කරනු ලබන එවැනි ඉලක්කයන් හතරක් තිබේ). ඒ අනුව, 2016 වර්ෂයේ සිව් වැනි කාර්තුවට හා 2017 වර්ෂයේ 1 වැනි, 2 වැනි හා 3 වැනි කාර්තු වලට අදාල සංස්ථාපිත ක්‍රියාකාරී සැලැසුම් ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය 2017 වර්ෂය තුළදී පවත්වන ලද අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලදී අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් වෙත ඉදිරිපත් කරන ලදී.

ජල සම්පාදන හා සනීපාරක්ෂණ ආවරණ ඉලක්කයන් සපුරා ගැනීම හා සම්බන්ධ ක්‍රියාකාරකම් මුළු රට පුරාම ක්‍රියාත්මක කරන ලදී. ආදායම් රහිත ජලය අවම කර ගැනීම හා බල ශක්ති පිරිවැය අඩු කර ගැනීම සඳහා 2017 වර්ෂය තුළ දරන ලද විශේෂ ප්‍රයත්නයන් සැලකිල්ලට ගැනීම වටනේය. කෙසේ වුවද, පාරිභෝගික සේවා වැඩි දියුණු කිරීම කෙරෙහි වැඩි ප්‍රමුඛත්වයක් දී කටයුතු කිරීමට ක්‍රියා කරන ලදී.

ආයතන සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම එක් සංස්ථාපිත ඉලක්කයක කොටසක් වේ. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලයේ, තෙලවල පරිශ්‍රයේ හා පොල්වත්ත පරිශ්‍රයේ සෑම අංශයකම ඵලදායිතාවය වැඩි දියුණු කිරීමේ පරමාර්ථයෙන් ඵලදායිතා සංවර්ධන ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කරන ලදී. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ''යටිතල පහසුකම් සංවර්ධන ක්‍රියාකාරකම් හඳුනාගැනීම'' යටතේ වූ 5 **S** වැඩ සටහන හොඳින්ම ක්‍රියාත්මක කරනු ලබන අංශය තෝරා ගැනීමට කටයුතු කරන ලද අතර මෙම තරඟයෙන් ප්‍රථම ස්ථානය දිනා ගන්නා ලද්දේ ප්‍රධාන කාර්යාලයයේ වාණිජ අංශය විසිනි.

''වඩාත් හොඳ වගවීමක් හා පාරදෘෂ්‍ය භාවයක් සහතික කිරීම'' යන ඉලක්කය සාක්ෂාත් කර ගැනීම සඳහා අභ්‍යන්තර විගණන අංශය හා රජයේ විගණන අංශය යන අංශයන් දෙකම විසින් වගවීම හා පාරදෘෂ්‍යභාවය පිළිබඳ ගැටළු සම්බන්ධයෙන් නිසි පියවර ගන්නා ලදී.

හඳුනා නොගත් හේතූන් නිසා ඇති වන නිදන්ගත වකුගඩු රෝග යේ බලපෑමට යටත් වී ඇති ප්‍රදේශයන් වෙත හා සුරක්ෂිත ජල සැපයුමක් නොලැබෙන ග්‍රාමීය ප්‍රජාවන් කෙරෙහි තිබෙන සම්පත් තුළ ප්‍රමුඛත්වය ලබා දී ක්‍රියා කරන ලදී.

ශ්‍රී ලංකාව තුළ ජල සුරක්ෂිතතා සැලැසුම් ක්‍රියාත්මක කිරීම ලෝක සෞඛ්‍ය සංවිධානයේ උපදේශකත්වය හා ක්‍රියාත්මක කිරීමේ සහායද සහිතව 2017 වර්ෂය තුළ අඛණ්ඩ ලෙස සිදු කරන ලදී. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය යත්න දරන්නේ ප්‍රජාව විසින් පරිභෝජනය කරනු ලබන සමස්ත ජලයේ සුරක්ෂිත භාවය තහවුරු කිරීමටය. මෙම සන්දර්භය යටතේ ජල සුරක්ෂිතතා සැලැසුම් ක්‍රියාත්මක කරනු ලැබේ. 2017 වර්ෂයේ අවසානය වන විට කලාපීය සහාය සේවා මධ්‍යස්ථාන භාර නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරුන් විසින්, මහනුවර ස්ථාපිත කරනු ලැබ ඇති ජල සුරක්ෂිතතා සැලැසුම් උපදේශක වීකකයේ සහාය ඇතිව දීප ව්‍යාප්ත ලෙස ක්‍රියාත්මක කරනු ලබන විවිධ ක්‍රියාත්මක අවස්ථාවන්හි පවත්නා නාගරික ජල සුරක්ෂිතතා සැලැසුම් 116 ක් ක්‍රියාත්මක වෙමින් තිබේ.

ප්‍රකාශිත ඉලක්කයන් සාක්ෂාත් කර ගැනීමේ ප්‍රගතිය.

ඉලක්කය	ප්‍රධාන අරමුණු		2017 අවසානයට ඉලක්කය	2017 අවසානයට සාක්ෂාත් වීම
1. ජල සම්පාදන හා සනීපාරක්ෂණ ආවරණය වැඩි කිරීම	1.1.	මුළු නල ජල සම්පාදන ආවරණය	52.3%	49.2%
	1.2.	නල මලාපවහන ආවරණය	2.4%	2.07%
	1.3.	සුරක්ෂිත පානීය ජලය ලබා ගැනීමේ හැකියාව ආවරණය	89.3%	89.3%
2. ව්‍යාපාර කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීම	2.1	ආදායම් රහිත ජලය (දීප ව්‍යාප්ත)	24.97%	25.98%
	2.2	සම්බන්ධතා 1000 කට මුළු සේවක සංඛ්‍යාව	4.72%	4.66%
	2.3	මුළු ප්‍රවර්තන පිරිවැයට සාපේක්ෂක ලෙස බල ශක්ති මත වියදම	20.38%	19.47%*
	2.4	මුළු ප්‍රවර්තන පිරිවැයට සාපේක්ෂක ලෙස නඩත්තු වියදම්	5.44%	6.16%*
	2.5	මුළු ප්‍රවර්තන පිරිවැයට සාපේක්ෂක ලෙස ආයතනික වියදම්	10.23%	10.83%*
	2.6	මුළු බිල් සංඛ්‍යාවට ඇස්තමේන්තුගත බිල්	1.0%	1.37%
	2.7	අය කර ගැනීමේ කාර්යක්ෂමතාවය	100%	103%
	2.8	ලැබිය යුතු මුදල් :		
		(අ) ගෘහස්තයන්ගෙන් හා වාණිජ ආයතනයන්ගෙන්	දින 30	දින 45
		(ආ) රාජ්‍ය ආයතනයන්ගෙන්	දින 40	දින 10
	2.9	මානව සම්පත් සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම		
		(අ) අභ්‍යන්තරික පුහුණුව (සහභාගි වූ සංඛ්‍යාව)	4600	9228
		(ආ) රට තුළ බාහිර පුහුණු (පුද්ගලයින්ගේ සංඛ්‍යාව)	250	182
		(ඇ) විදේශීය පුහුණුව (පුද්ගලයින්ගේ සංඛ්‍යාව)	80	239
	2.10	ගණු දෙනු කරුවන් වෙත සපයන සේවා වැඩි දියුණු කිරීම හා මහජන පැමිණිලි සම්බන්ධයෙන් ක්ෂණිකව කටයුතු කිරීම - දිවයින පුරා පැවැත්වීමට නියමිත ජනතාව දැනුවත් කිරීමේ වැඩ සටහන් (පාසැල් හා වෙනත්)	100 ක සංඛ්‍යාවක්	152 ක සංඛ්‍යාවක්
	2.11	බල ශක්ති කාර්යක්ෂම ව්‍යාපෘතීන් නිසා වාර්ෂිකව ඉතිරි වන මුදල්	මිලියන 36.7	මිලියන 18.1
	2.12	ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ පර්යේෂණ හා සංවර්ධන අංශය විසින් ක්‍රමවත්, විමර්ෂණාත්මක හා පරීක්ෂණාත්මක කටයුතු අඛන්ඩ ලෙස ඉටු කරමින් සිටින අතර එම කටයුතු කරනු ලබන්නේ ව්‍යාපාරික කටයුතු වල හා මෙහෙයුම් හා නඩත්තු ක්‍රියාකාරකම් වල කාර්යක්ෂමතාවය වර්ධනය කිරීමේ පරමාර්ථයෙන් නව දැනුම ලබා ගැනීම සඳහා වන්නේය.		
	2.13	ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය ගණුදෙනු කරුවන් හා මණ්ඩලය අතර ඇති සංස්ථානික සම්බන්ධතාවය වැඩි දියුණු කිරීම වාසියට හරවා ගැනීමට සූදානම් අතර, ඊට පෘථුල තොරතුරු හා සංනිවේදන සංවර්ධන ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමේ පරමාර්ථයෙන් එහි ව්‍යාපාරික කටයුතු දියුණු කිරීම පිණිස වන වෙම් ද්වාරයක් ඇතුලත් වනු ඇත.		

3. වඩාත් පුළුල් වග වීමක් හා පාරදෘෂ්‍ය භාවයක් සහතික කිරීම.		මානව සම්පත් සංවර්ධනය, කළමනාකරණ තොරතුරු පද්ධතිය හා ව්‍යාපාරික සැලැසුම මත පදනම් වූ කළමනාකරණ හා ව්‍යාපාරික මෙවලම් පූර්ණ පරාසයක් සංවර්ධනය කිරීම සඳහා ආරම්භක කටයුතු දියත් කරනු ලැබ ඇත. ■ මූල්‍ය අධිකාරි බලය පැවරීම. ■ අය වැය පාලනය හා මුදල් රෙගුලාසි පිළිබඳ පුහුණුව ■ වාණිජ මෙහෙයුම් විගණනයට භාජනය කිරීම ■ ගබඩා හා සැපැයුම් විගණනයට භාජනය කිරීම ■ මුදලින් හා චෙක්පත් මගින් කරන ගෙවීම් විගණනයට භාජනය කිරීම ■ ඉදි කිරීම් කොන්ත්‍රාත්තු විගණනයට භාජනය කිරීම ■ වත්කම් ආගණනය කිරීම ■ වැඩි දියුණු කළ කළමනාකරණ තොරතුරු හා සමායෝජනය		
4. ග්‍රාමීය හා ඌණ සේවිත ප්‍රජාවන් වෙත සුරක්ෂිත පානීය ජලය සම්පාදනය පහසුකරණය කිරීම	4.1	ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ රුකුල් දීම හා සහාය සහිතව ප්‍රජා මූල සංවිධානයන්, පලාත් පාලන අධිකාරීන් හා වෙනත් පාර්ශවයන් විසින් නඩත්තු කරනු ලබන ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රම	10.6%	10.5%

* විගණනයට පෙර සංඛ්‍යාවන් ඉදිරිපත් කරනු ලැබ ඇත.

ජල සම්පාදනයේ ප්‍රධාන කාර්ය සාධනය

"සේවා සම්බන්ධතාවයන් එක් දහසකට කාර්ය මණ්ඩල අනුපාතය 2016 වර්ෂයේ පැවැති 4.95 සිට 2017 වර්ෂයේදී 4.66 ක් දක්වා අඩු කරන ලදි."

ආරක්ෂිත ජලය ලබා ගැනීමේ හැකියාව ආවරණය කිරීම.



වර්ෂය තුළදී සේවා සම්බන්ධතාවයන් 126,701 ක් සැපැයීම හරහා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් පානීය නල ජලය සම්පාදනය කිරීම මගින් ආවරණය කරනු ලබන ජන ගහණය 38.7% ක් බවට පත් කරන ලදි.

වර්ෂය තුළදී රටේ විවිධ ප්‍රදේශයන්හි ප්‍රධාන හා සුළු ජල සම්පාදන ව්‍යාපෘතීන් කිහිපයක් දියත් කොට ක්‍රියාත්මක කිරීම මගින් නව ජල සම්බන්ධතාවයන් සැපැයීම හා ඒ වන විටත් සේවා ලබාගනිමින් සිටි පාරිභෝගිකයින් වෙත සපයන ලද සේවාවන්ගේ තත්ත්වය වැඩි දියුණු කිරීමට කටයුතු කරන ලදි. රටේ නල ජල සම්පාදන ආවරණය වර්ධනය කිරීම සඳහා දියත් කරන ලද බොහෝ කුඩා හා මධ්‍ය පරිමාණ ජල සම්පාදන ව්‍යාපෘතීන් නිම වෙමින් පැවැති අදියරෙහි තිබුණ අතර ඒවාට අමතර වශයෙන් විදේශ අරමුදල් යොදා ගනිමින් ක්‍රියාත්මක කරන ලද ජල සම්පාදන ව්‍යාපෘතීන් 19 ක් හා දේශීය බැංකු අරමුදලින් ක්‍රියාත්මක වන ජල සම්පාදන ව්‍යාපෘතීන් 10 ක් ක්‍රියාත්මක වෙමින් පැවැතිනි.

සේවා සම්බන්ධතාවයන් එක් දහසකට කාර්ය මණ්ඩල අනුපාතය 2016 වර්ෂයේ පැවැති 4.95 සිට 2017 වර්ෂයේදී 4.66 ක් දක්වා අඩු කරන ලදි.

ගාස්තු සංශෝධනය 2012 වර්ෂයේ සිට සිදු වෙමින් පැවැති මෙහෙයුම් වියදම් වැඩි වීම සමග ගැලැපුනේ නැත. මේ හේතුව නිසා ගත වූ වසර හය තුළ සිය මුදල් ප්‍රවාහය කළමනාකරණය කර ගැනීම සම්බන්ධයෙන් මණ්ඩලයට දුෂ්කරතා අත් විඳීමට සිදු විය. ශේෂ පත්‍රය ශක්තිමත් කිරීමේ අරමුණින් මුළු හිඟ ණය සම කොටස් බවට පරිවර්තනය කිරීමට 2014 වර්ෂයේදී මහා භාණ්ඩාගාරය විසින් ගන්නා ලද ප්‍රතිපත්තිමය තීරණය තිබියදී වුවද අළුත් ණය මුදල් වලට අදාල ණය බැඳීම් නිසා මේ තත්ත්වයෙහි දියුණුවක් ඇති වුනේ නැත.

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් 2015 වර්ෂයෙන් පසුව පිට පිට පැමිණි වර්ෂ තුන තුළ පිළිවෙලින් රුපියල් 1,030,044,119 ක, 2,926,304,392 ක හා 1,816,772,395 ක බද්දෙන් පසු ලාභ වාර්තා කරන ලදි.

ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ මධ්‍යම රසායනාගාරය විසින් කලාපීය රසායනාගාරයන් සමග එක්ව මණ්ඩලය විසින් සපයනු ලබන පානීය ජලයේ ගුණාත්මය සහතික කිරීම සඳහා අවශ්‍ය කටයුතු කරන ලද්දේය. වර්ෂය තුළදී ක්ෂුද්‍ර ජීව විද්‍යාත්මකව පරීක්ෂණයට භාජනය කරන ලද ජල නියැදීන් 31752 අතුරින් අහෘජතිකර ප්‍රතිඵල පෙන්වන ලද්දේ නියැදීන්ගෙන් 0.75% ක් පමණකි. තවද, නියැදීන් 29838 ක් භෞතික හා රසායනික පරාමිතීන් සොයා ගැනීම සඳහා පරීක්ෂණයට භාජනය කරන ලද අතර බොර භාවය, වර්ණය හා කඩිනත්වය පදනම් වූ අහෘජතිකර ප්‍රතිඵල එකී නියැදීන් අතුරින් 11.8% ක දක්නට ලැබිණි. දිවයින පුරා පිහිටි ජල සම්පාදන යෝජනා ක්‍රමයන්ගේ ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයන් 271 ක ප්‍රභව ජලයේ (අමු ජලයේ) ගුණාත්මය ශ්‍රී ලංකා ප්‍රමිති 722 මග පෙන්වීම අනුගමනය කරමින් මසකට දෙවරක් පරීක්ෂණයට භාජනය කරන ලද අතර ප්‍රතිකාරක ක්‍රියාවලියේ ජලයේ ගුණාත්මය සතියකට වරක් විශ්ලේෂණයට භාජනය කරන ලදි.

මධ්‍යම රසායනාගාරය විසින් රසායනික පරීක්ෂණ කිරීම් වෙනුවෙන් රසායනාගාර පිළිගැනීම (ISO 17025) අත් කර ගන්නා ලදි. භෞතික, රසායනික හා ක්ෂුද්‍ර ජීව විද්‍යාත්මක පරාමිතීන් පරීක්ෂා කිරීමේ පරීක්ෂණ පහසුකම් වලින් සමන්විත නව පූර්ණ රසායනාගාරයක් බදුල්ලේ (දෙමෝදර) ස්ථාපිත කරන ලදි. බණ්ඩාරවෙල රසායනාගාරයේ රසායනාගාර පරිශ්‍රය විස්තාරණය කරමින් නවීකරණය කොට ආසියානු සංවර්ධන බැංකු 5 වැනි අරමුදල වෙතින් ලැබුණ ඉහල තාක්ෂණික උපකරණ (ICP/OES) භාවිතා කරමින් බැර ලෝහ පරීක්ෂණ පහසුකම් සංවර්ධනය කරන ලදි. අනුරාධපුර රසායනාගාරයේ පරීක්ෂණ ධාරිතාවය 30% කින් වර්ධනය කරන ලදි.

ආදායම් රහිත ජලය අවම කිරීමේ ක්‍රියාකාරකම් කිහිපයක් වර්ෂය තුළදී ක්‍රියාවට නංවන ලද්දේය. කොළඹ නගරය තුළ, වසන ලද සීමාවන් ඇති කිරීමෙන් අනතුරුව බල පෑමට බෙහෙවින් ලක් වී ඇති ප්‍රදේශයන් තෝරාගෙන ප්‍රදේශයේ තුළු ගැලීම් මිණුම් ගන්නා ලදි. ඇසට පෙනෙන කාන්දු වීම් හඳුනා ගැනීම සඳහා රාත්‍රී සමීක්ෂණ, සොරොව් සමීක්ෂණ හා ගෙන් ගෙට කරනු ලබන සමීක්ෂණ පවත්වන ලද්දේය. එම ප්‍රදේශයන් තුළ ආදායම් රහිත ජලය සැලැකිය යුතු මට්ටමකින් අඩු විය. ඒ අනුව, බස්නාහිර පලාතේ හා දීප ව්‍යාප්ත ලෙස ආදායම් රහිත ජලය පිළිවෙලින් 27.68% ක් හා 25.98% ක් වශයෙන් අඩු කිරීමට හැකි විය.

පොදු කරුණු

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ අධීක්ෂණය යටතේ මේ වන විට විශාල, මධ්‍ය පරිමාණ හා කුඩා පරිමාණ ජල සම්පාදන යෝජනා ක්‍රමයන් 343 ක් ක්‍රියාත්මක කෙරෙමින් පවතී. මේ අතුරින් යෝජනා ක්‍රම 55 ක් විසින් ප්‍රධාන නගර ආවරණය කරනු ලබන අතර යෝජනා ක්‍රම 288 ක් මගින් කුඩා නගර හා ග්‍රාමීය ප්‍රදේශයන් ආවරණය කරනු ලබති.

ජනගහණයෙන් 3.2% ක් අත් පොම්ප නල ළිං වලින් ආවරණය කරනු ලබයි. ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රමයන් ප්‍රජාව විසින් කළමනාකරණය කරනු ලැබීම ප්‍රජා මූල සංවිධාන හරහා ප්‍රවර්ධනය කරනු ලැබේ. නිවැරදි ලෙස වර්ෂා ජලය රැස් කර ගැනීම පිළිගත හැකි පානීය ජල ප්‍රභවයක් වශයෙන් සැලැකිල්ලට ගන්නා ලදි.

ප්‍රධාන සංඛ්‍යා ලේඛන : ජල සම්පාදනය

		2016	2017	වෙනස් වීම %
ජල සම්පාදන යෝජනා ක්‍රම සංඛ්‍යාව		337	**343**	1.78
නල ජල නිෂ්පාදනය (ඝණ මීටර මිලියන)		649	**686**	5.70
නල ජල පරිභෝජනය (ඝණ මීටර මිලියන)		483	**508**	5.18
ගෘහස්ථ සම්බන්ධතා (සංඛ්‍යා)	(අ) බස්නාහිර පලාත (ආ)වෙනත් පලාත්	857,647 1073,609	**902,050** **1,143,859**	5.18 6.54
මුළු ගෘහස්ථ සම්බන්ධතා සංඛ්‍යාව		**1,931,256**	**2,045,919**	5.94
පොදු ජල කණු (සංඛ්‍යා)	(අ) බස්නාහිර පලාත (ආ)වෙනත් පලාත්	470 1,159	**489** **1,127**	4.04 (2.76)
මුළු පොදු ජල කණු සංඛ්‍යාව		**1,629**	**1,616**	(0.80)
ගෘහස්ථ නොවන සම්බන්ධතා සංඛ්‍යාව	(අ) බස්නාහිර පලාත (ආ)වෙනත් පලාත්	79,599 81,616	**84,878** **88,375**	6.63 8.28
මුළු ගෘහස්ථ නොවන සම්බන්ධතා සංඛ්‍යාව (මුළු පොදු ජල කණු සංඛ්‍යාවද ඇතුළුව)		**161,215**	**173,253**	7.47
සේවා සම්බන්ධතා මුළු සංඛ්‍යාව		**2,092,471**	**2,219,172**	6.06
සාමාන්‍ය ගෘහස්ථ මාසික පරිභෝජනය (එක් ගෘහස්ථ සම්බන්ධතාවයක් තුළ ඝණ මීටර)	(අ) බස්නාහිර පලාත (ආ)වෙනත් පලාත්	18.12 13.62	**17.61** **13.31**	(2.81)** (2.28)**
මසකට සාමාන්‍ය ගෘහස්ථ අයපත් වටිනාකම (රුපියල්)	(අ) බස්නාහිර පලාත (ආ)වෙනත් පලාත්	829.92 474.76	**795.33** **464.92**	(4.17)** (2.07)**
මුළු ආදායම (රුපියල් මිලියනඅගය එකතු කළ බද්ද සමඟ)		23,975	**24,846**	3.63
මුළු ප්‍රවර්තන වියදම (රුපියල් මිලියන)		20,917	***24,358**	16.45**
ආදායම් රහිත ජලය (%)	(අ) බස්නාහිර පලාත (ආ)වෙනත් පලාත් (ඇ) දීප ව්‍යාප්ත	28.26 22.18 25.55	**27.68** **23.92** **25.98**	(2.05) 7.84** 1.68
මෙහෙයුම් හා නඩත්තු කාර්ය මණ්ඩලය / සම්බන්ධතා 1000 කට		4.14	**3.88**	(6.28)
මුළු කාර්ය මණ්ඩලය / සම්බන්ධතා 1000 කට		4.95	**4.66**	(5.86)
ජල නිෂ්පාදනයේ ප්‍රවර්තන පිරිවැය සාමාන්‍යය		32.23	**31.63**	(1.86)
(ඝණ මීටරයකට රුපියල්)				
අලෙවි කළ ඒකකයක මුළු පිරිවැය සාමාන්‍යය (ඝණ මීටරයකට රුපියල්)		47.19	**47.37**	0.38**
ඒකකයකට ලැබුණ ආදායම් සාමාන්‍යය (අයපත් නිකුත් කිරීම /පරිභෝජනය) (ඝණ මීටරයකට රුපියල්)		49.62	**48.95**	(1.35)**
අය කර ගැනීමේ කාර්යක්ෂමතාවය		1.00	**1.03**	3.00
ගැඹුරු ළිං (සංඛ්‍යා)	(අ) සාරන ලද (ආ) සාර්ථක වූ	299 265	**291** **245**	(2.68) (7.55)
සංවර්ධන වියදම (රුපියල් මිලියන)		30,902.42	**30,176.68**	(2.35)**

*සංඛ්‍යාව විගණනයට පෙර තත්ත්වය දක්වයි **විචල්‍යය අවාසිදායක ලෙස සලකනු ලැබේ

මලාපවහනයේ ප්‍රධාන කාර්ය සාධනය.



ප්‍රධාන සංඛ්‍යා ලේඛන : මල අපවහනය

		2016	2017	වෙනස් වීම (%)
ගෘහස්ත සම්බන්ධතා	බස්නාහිර පලාත	13,757	**15,500**	11.25
	වෙනත් පලාත්	886	**886**	0.00
ගෘහස්ත නොවන සම්බන්ධතා	බස්නාහිර පලාත	1,332	**1,480**	10.00
	වෙනත් පලාත්	185	**187**	1.07
නිවාස යෝජනා ක්‍රම සම්බන්ධතා (තොග)	බස්නාහිර පලාත	2,907	**3,666**	20.70
	වෙනත් පලාත්	-	**-**	-
මුළු මල අපවහන සම්බන්ධතා සංඛ්‍යාව	දීප ව්‍යාප්ත	19,067	**21,719**	12.00
	බස්නාහිර පලාත	17,996	**20,646**	12.84
	වෙනත් පලාත්	1,071	**1,073**	0.19

මෙහෙයුම් සාරාංශය

"ප්‍රධාන වශයෙන්ම අඹතලේ, ලබුගම, කලටුවාව, බියගම, බම්බුකුලිය, කඳාන හා කළුතර කෙත්හේන යන මධ්‍යස්ථානයන්හි නිෂ්පාදනය කරනු ලබන පරිමාව පදනම් කොට ගෙන නිෂ්පාදනයෙහි ප්‍රධාන පංගුවට බස්නාහිර පලාතේ ජල සම්පාදන පද්ධතිය හිමිකම් කියන අතර එම පද්ධතිය මගින් නිෂ්පාදනය කරනු ලබන ජල පරිමාව ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් නිෂ්පාදනය කරනු ලබන මුළු ජල පරිමාවෙන් 54.84% ක් වේ."

ජල සම්පාදනය.
පානීය ජල නිෂ්පාදනය.

2017 වර්ෂය තුළදී නිෂ්පාදනය කරන ලද මුළු ජල පරිමාව ඝණ මීටර මිලියන 686 ක් විය. ගත වූ වසර 10 තුළදී පානීය ජලය නිෂ්පාදනය කිරීමේ ප්‍රවණතාවය මෙහි පහත ප්‍රස්තාර සටහන තුළ පෙන්නුම් කරනු ලැබ ඇත. ප්‍රධාන වශයෙන්ම අඹතලේ, ලබුගම, කලටුවාව, බියගම, බම්බුකුලිය, කඳාන හා කළුතර කෙත්හේන යන මධ්‍යස්ථානයන්හි නිෂ්පාදනය කරනු ලබන පරිමාව පදනම් කොට ගෙන නිෂ්පාදනයෙහි ප්‍රධාන පංගුවට බස්නාහිර පලාතේ ජල සම්පාදන පද්ධතිය හිමිකම් කියන අතර එම පද්ධතිය මගින් නිෂ්පාදනය කරනු ලබන ජල පරිමාව ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් නිෂ්පාදනය කරනු ලබන මුළු ජල පරිමාවෙන් 54.84% ක් වේ.





නිෂ්පාදන පිරිවැය.

2016 වර්ෂය හා සාපේක්ෂකව මුළු නිෂ්පාදන පිරිවැය (රුපියල් දස ලක්ෂ) මෙහි පහත දක්වනු ලැබ ඇත.



නිෂ්පාදන පිරිවැය ඝණ මීටරයකට රුපියල්

2016	2017
47.19	47.37

නිෂ්පාදන පිරිවැය = මුළු පිරිවැය / අලෙවි කළ ඒකක
= (මුළු ප්‍රවර්තන පිරිවැය + ක්‍රියාත්මක කර ඇති ව්‍යාපෘතීන් මත පොලිය + ක්ෂය කිරීම් / (අලෙවි කළ ප්‍රමාණය)

සේවා සම්බන්ධතාවයන් සංසන්දනය කිරීම

පලාත / කලාපීය සභාය සේවා මධ්‍යස්ථානය	පලාත / කලාපීය සභාය සේවා මධ්‍යස්ථානය අනුව සම්බන්ධතා සංඛ්‍යාව		වෙනස %	ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල කලාපය	ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල කලාප අනුව සම්බන්ධතා සංඛ්‍යාව		වෙනස %
	2016 දෙසැම්බර් අවසානයට	2017 දෙසැම්බර් අවසානයට			2016 දෙසැම්බර් අවසානයට	2017 දෙසැම්බර් අවසානයට	
බස්නාහිර / මධ්‍යම	443,998	**462,290**	4.12	ප්‍රමුඛතා **	2,293	**2,007**	(12.47)
				කොළඹ නගරය	140,841	**142,883**	1.45
				කෝට්ටේ	160,781	**166,770**	3.72
				මහරගම	140,083	**150,630**	7.53
බස්නාහිර / උතුරු	256,513	**271,735**	5.93	කැළණිය	183,519	**194,207**	5.82
				ගම්පහ	72,994	**77,528**	6.21
බස්නාහිර / දකුණු	236,735	**252,903**	6.83	දෙහිවල	105,136	**107,363**	2.12
				කළුතර	63,912	**67,570**	5.72
				පානදුර	67,687	**77,970**	15.19
මධ්‍යම	248,735	**261,356**	5.07	මහනුවර උතුර	93,804	**99,303**	5.86
				මහනුවර දකුණ	80,366	**85,103**	5.89
				මහනුවර නැගෙනහිර	74,565	**76,950**	3.20
වයඹ	73,782	**78,036**	5.77	කුරුණෑගල	73,782	**78,036**	5.77
උතුරු මැද	107,686	**114,351**	6.19	අනුරාධපුර	107,686	**114,351**	6.19
සබරගමුව	100,957	**106,606**	5.60	රත්නපුර	47,489	**51,219**	7.85
				කෑගල්ල	53,468	**55,387**	3.59
දකුණු	303,423	**312,024**	2.83	හම්බන්තොට	102,406	**106.237**	3.74
				මාතර	94,646	**97,267**	2.77
				ගාල්ල	106,371	**108,520**	2.02
ඌව	86,273	**94,794**	9.88	බණ්ඩාරවෙල	48,706	**53,409**	9.66
				මොනරාගල	37,567	**41,385**	10.16
උතුරු	17,817	**21,653**	21.53	යාපනය මන්නාරම වවුනියාව	17,817	**21,653**	21.53
නැගෙනහිර	216,552	**243,424**	12.41	අම්පාර	50,967	**58,005**	13.81
				ත්‍රිකුණාමලය	55,902	**63,866**	14.25
				අක්කරෙයිපත්තුව	68,935	**74,605**	8.23
				මඩකලපුව	40,748	**46,948**	15.22
එකතුව	**2,092,471**	**2,219,172**	**6.06**	**එකතුව**	**2,092,471**	**2,219,172**	**6.06**

සම්බන්ධතා වර්ධනය



වාර්ෂික බිල්කිරීම හා මුදල් අය කරගැනීම් සංසන්දනය කිරීම



මාසික ගෘහස්ථ පරිභෝජන සාමාන්‍යය (සම්බන්ධතාවයකට ඝණ මීටර)



මාසික ගෘහස්ථ බිල් පතෙහි සාමාන්‍යය



බිල් කිරීමට අදාල සංඛ්‍යා ලේඛන

විස්තරය	2016 (රුපියල් මිලියන)	2017 (රුපියල් මිලියන)
බිල් කිරීමේ ඉලක්කය (අගය එකතු කළ බද්ද සමග)	22,380	**26,346**
සැබෑ බිල් කිරීම (අගය එකතු කළ බද්ද සමග)	23,975	**24,846**
මුදල් අය කර ගැනීමේ ඉලක්කය (අගය එකතු කළ බද්ද සමග)	22,156	**27,913**
සැබැවින්ම එකතු කළ මුදල (අගය එකතු කළ බද්ද සමග)	23,971	**25,567**

පාරිභෝගික වර්ගය අනුව අලෙවි කරන ලද ජල පරිමාව හා ලැබුණ ආදායම (2017)

පාරිභෝගික වර්ගය	අලෙවි කළ පරිමාව		ආදායම	
	ඝණ මීටර 000	%	රුපියල් මිලියන	%
සෘජු බිල් කිරීම#	371,050	72.89	14,903	59.98
පාඨශාලා	5,782	1.14	136	0.55
කුලී නිවාස වතු	2,209	0.43	87	0.35
පොදු ජල කණු හරහා සැපැයුම	480	0.09	8	0.03
රජයේ ආයතන, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ පරිශ්‍රයන්	33,474	6.58	2,406	9.68
වාණිජ හා කාර්මික	58,174	11.43	5,794	23.32
සංචාරක හෝටල්	3,169	0.62	298	1.20
නැව් කටයුතු	124	0.02	69	0.28
ආයෝජන මණ්ඩලය	9,698	1.91	692	2.79
ආගමික පරිශ්‍රයන්	5,829	1.15	141	0.57
උප එකතුව	**489,989**	**96.26**	**24,534**	**98.74**
තොග බිල් කිරීම්	15,901	3.12	303	1.22
වෙනත් *	3,150	0.62	9.0	0.04
මුළු එකතුව	**509,040**	**100.00**	**24,846**	**100.00**

ගෘහස්ත, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ නිල නිවාස, රජයේ නිල නිවාස, තට්ටු නිවාස, අගය එකතු කළ බද්ද රහිත ගෘහස්ත සමෘද්ධි හා සමෘද්ධි කුලී නිවාස

සෘජු බිල් කිරීමට ඇතුලත් නොවන හෝ මෙහි ඉහත විශේෂයෙන් සඳහන් කර නොමැති අනිකුත් සියළුම බිල් කිරීම් වර්ගයන් "වෙනත්' යන වර්ගය යටතේ පෙන්වනු ලැබ ඇත. ප්‍රතිදාන හිලවු කරනු ලබන බිල් පත් ද මෙම වර්ගයට ඇතුළු කරනු ලැබ ඇත.

පාරිභෝගික වර්ගයන් අනුව ජලය පරිභෝජනය කිරීමේ පතිශතය



පාරිභෝගික වර්ගයන් අනුව ආදායම් ප්‍රතිශතය



ආයෝජන සාරාංශය.

> "ප්‍රාග්ධන වැඩ කටයුතු වෙනුවෙන් අරමුදල් වැය කිරීමේ ප්‍රවර්තන ක්‍රමය 2017 වර්ෂය තුළදී මහා භාණ්ඩාගාර බැඳුම්කර වලින් කරන ලද වැය කිරීම්ද ඇතුළුව රුපියල් බිලියන 30.18 ක ආයෝජනයන් කිරීමේ හැකියාව ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට ලබා දුන්නේය."

ජල සම්පාදනය හා මල අපවහන ප්‍රගතිය සඳහා වූ මුළු වෙන් කිරීම 2014 සිට 2016 දක්වා වූ කාල සීමාව තුළ ක්‍රමයෙන් වැඩි කරන ලද්දේය. 2016 වර්ෂය සඳහා වූ මුළු වෙන් කිරීම වූයේ රුපියල් බිලියන 37 කි. කෙසේ වුවද මෙම වෙන් කිරීම 2017 වර්ෂය තුළදී රුපියල් බිලියන 30.18 ක් දක්වා පහත වැටී ඇත. ප්‍රාග්ධන වැඩ කටයුතු වෙනුවෙන් අරමුදල් වැය කිරීමේ ප්‍රවර්තන ක්‍රමය 2017 වර්ෂය තුළදී මහා භාණ්ඩාගාර බැඳුම්කර වලින් කරන ලද වැය කිරීම්ද ඇතුළුව රුපියල් බිලියන 30.18 ක ආයෝජනයන් කිරීමේ හැකියාව ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට ලබා දුන්නේය. මෙය කෙසේ වුවද දේශීය බැංකු අරමුදල් යොදා ගනිමින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතීන් මත වැය කරන ලද මුදල් ප්‍රමාණයට අමතර වශයෙන් කරන ලද ආයෝජනයන් විය.

මූල්‍ය ප්‍රභවයන්

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත දේශීය ඒකාබද්ධ අරමුදලින් වෙන් කර දීම් කරන ලද්දේ නැගී එමින් පවතින කුඩා නගරයන් සඳහා දියත් කරනු ලබන (සුළු හා මධ්‍ය පරිමාණ) ජල සම්පාදන හා මල අපවහන ව්‍යාපෘතීන් වෙනුවෙන් හා තෝරා ගනු ලැබූ මහා පරිමාණ ජල සම්පාදන හා මල අපවහන ව්‍යාපෘතීන් 4 ක් වෙනුවෙන් පමණකි. එක් තෝරාගත් මහා පරිමාණ මල අපවහන ව්‍යාපෘතියක් වෙනුවෙන් ආපසු ගෙවීම් කළ හැකි විදේශ ආධාර ප්‍රදානයන් වෙන් කරන ලදි. මහා පරිමාණ ජල සම්පාදන හා මල අපවහන ව්‍යාපෘතීන් වෙනුවෙන් ලැබුණ ණය ආපසු ගෙවීම සඳහා රුපියල් බිලියන 16 ක තවත් වෙන් කිරීමක්ද කර තිබිණි. විදේශ අරමුදල් යොදා ගනිමින් ක්‍රියාත්මක කරන ලද ජල සම්පාදන හා මල අපවහන ව්‍යාපෘතීන් වල ඉතිරි කොටස් කළමනාකරණය කර ගන්නා ලද්දේ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත ලැබුණ භාණ්ඩාගාර බැඳුම්කර උපයෝගී කර ගනිමිනි.

2017 වර්ෂය තුළ මහා පරිමාණ ජල සම්පාදන හා මල අපවහන ව්‍යාපෘතීන් සම්බන්ධයෙන් වූ සංවර්ධන කාර්යයන් සඳහා බාධාවකින් තොරව ගෙවීම් කිරීමට ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට හැකි විය.

මේ අතර 2017 වර්ෂය තුළදී දේශීය බැංකු වලින් රුපියල් මිලියන 6,914 ක ණය මුදල් ලබා ගනිමින් (2016 වර්ෂයේ සිට ඉදිරියට පැමිණි) ජල සම්පාදන ව්‍යාපෘතීන් 15 ක් ක්‍රියාත්මක කිරීමට ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට හැකි විය. ජල අංශයේ ප්‍රජා පහසුකරණය කිරීමේ පරමාර්ථය වෙනුවෙන් රුපියල් මිලියන 1,322.84 ක දේශීය අරමුදල් වෙන් කිරීමක් හා තවත් රුපියල් මිලියන 158 ක අතිරේක දේශීය අරමුදල් වෙන් කිරීමක් ද සපයන ලදි.

ප්‍රාග්ධන අයවැය වෙන් කිරීම්.



ප්‍රාග්ධන අරමුදල් ප්‍රයෝජනයට ගැනීම.

2017 වර්ෂය තුළදී ප්‍රාග්ධන අරමුදල් යොදා



අනුග්‍රාහකයින් හා අදාල ශ්‍රී ලංකා රජයේ අරමුදල් හරහා ලැබුණ විදේශ ආධාර දායකත්වයන්.



2016/2017 ප්‍රාග්ධන අරමුදල් ප්‍රයෝජනයට ගැනීමේ සංසන්දනය.

විස්තරය	2016		2017	
විදේශීය සහභාගය (රුපියල් මිලියන)	24,335	91.8%	17,749	109%
විදේශීය ආධාර හා බැඳි දේශීය සහභාගය (රුපියල් මිලියන)	4,640	66.31%	11,293	98%
දේශීය ව්‍යාපෘති සඳහා වූ ඒකාබද්ධ අරමුදල් (රුපියල් මිලියන)	1,927	55.95%	1,135	48%
එකතුව	30,902	83.6%	30,177	100.2%

දැනට ක්‍රියාත්මක වන ජල සම්පාදන හා මල අපවහන යෝජනා ක්‍රමයන් පුනරුත්ථාපනය කිරීම හා වැඩි දියුණු කිරීම

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ක්‍රම සම්පාදනය කරනු ලැබ, සැලැසුම් කරනු ලැබ හා දේශීය අරමුදල් යොදා ගනිමින් ක්‍රියාත්මක කරනු ලැබූ ව්‍යාපෘතීන් තිබේ. එකී ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම අදාල පලාත් කාර්ය මණ්ඩලය විසින් සිදු කරනු ලබන අතර ඒවා සම්පූර්ණ කිරීමෙන් අනතුරුව පලාතේ මෙහෙයුම් හා නඩත්තු කාර්ය මණ්ඩලය විසින් සිය භාරයට ගනු ලැබේ. එවැනි දේශීය අරමුදල් යොදා ගනිමින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘතීන් අතුරින් වැඩි සංඛ්‍යාවක් වසර කිහිපයකට පෙර දියත් කරන ලද ඒවා වන අතර අය වැය වෙන් කිරීම් ප්‍රමාණවත් නොවූ හෙයින් ඒවා සම්පූර්ණ කිරීම දිග්ගැස්සෙමින් තිබී ඇත. මෙහි ප්‍රතිඵලයක් වශයෙන්, අවශ්‍ය ද්‍රව්‍යයන්ගේ මිළ ගණන් ඉහල යාම නිසා ඒවායේ මුළු පිරිවැය ඇස්තමේන්තු වැඩි වී ඇත.

මීට අමතර ලෙස, කොන්ත්‍රාත්කරුවන් විසින් ඉටු කරනු ලැබ ඇති කාර්යයන් සඳහා වූ ගෙවීම් පියවීම සඳහා අවශ්‍ය මුදල් කලට වේලාවට මුදා හැර තිබුනේද නැත. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපෘතීන් වෙනුවෙන් වූ ශ්‍රී ලංකා රජයේ වෙන් කිරීම් 2015 වර්ෂයේ සිට අඩු කරනු ලැබ ඇත. දැනට ක්‍රියාත්මක කරනු ලබමින් පවතින කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපෘතීන් දෙකක් සඳහා සහ රට පුරාම සිදු කරන ලද උපයෝගිතා විතැන් කිරීමේ කටයුතු වෙනුවෙන් මේ වර්ෂය තුළදී රුපියල් මිලියන 735 ක වෙන් කිරීමක් කරනු ලැබ ඇත.

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් 2017 වසර තුළ රුපියල් මිලියන 945.74 ක තමන්ගේම මූල්‍ය සම්පත් වෙන් කිරීම් යොදා ගනිමින් පවත්නා ජල සම්පාදන හා මල අපවහන යෝජනා ක්‍රමයන් පුනරුත්ථාපනය කිරීම හා වැඩි දියුණු කිරීම අබන්ධ ලෙස කරගෙන යන ලදි. මෙම අරමුදල් යොදා ගන්නා ලද්දේ ජල සම්පාදනයෙහි ගුණාත්මය හා ප්‍රමාණවත් බව පවත්වාගෙන යාමට හා මල අපවහන යෝජනා ක්‍රමයන් පවත්වාගෙන යාමටත්, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ වත්කම් නඩත්තු කරගෙන යාමට හා මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළ අදාල සහාය සේවාවන් ඉටු කර ලීමටත්ය.

මෙයින් පෙන්නුම් කරනු ලබන්නේ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් පුනරුත්ථාපන කටයුතු වෙනුවෙන් රුපියල් මිලියන 533.99 ක මුදලක්ද, ආදායම් රහිත ජලය අඩු කිරීම වෙනුවෙන් රුපියල් මිලියන 88.52 ක මුදලක්ද බල ශක්ති සංරක්ෂණය වෙනුවෙන් රුපියල් මිලියන 95.20 ක මුදලක් හා ප්‍රාග්ධන වත්කම් ප්‍රතිසම්පාදනය වෙනුවෙන් රුපියල් මිලියන 228.03 ක මුදලක්ද වැය කරනු ලැබ ඇති බවයි. අනුග්‍රාහක සහායක් නොලැබෙන හෝ ප්‍රධාන අරමුදල් සම්පාදනයක් නොලැබෙන යෝජනා ක්‍රමයන් වැඩි දියුණු කිරීම කෙරෙහි ප්‍රමුඛත්වය ලබා දෙන ලදි.

කුඩා පරිමාණ යටිතල පහසුකම් පුනරුත්ථාපන හා ඉහළ ශ්‍රේණිගත කිරීමේ ව්‍යාපෘතීන් මගින් ශ්‍රී ලංකා රජයේ අරමුදල් යෙදවීම

2017 වර්ෂයේ ආරම්භය වන විට සම්පූර්ණ කිරීමේ විවිධ අදියරයන් තුළ ඉදි කරනු ලබමින් පැවැති කුඩා හා මධ්‍යම පරිමාණ ජල සම්පාදන ව්‍යාපෘති 36 කින් හා මල අපවහන ව්‍යාපෘති 2 කින් සමන්විත කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යාපෘතීන් 38 ක් තිබුණ අතර ඒවා සම්පූර්ණයෙන් නිම කිරීම සඳහා අරමුදල් අවශ්‍ය වී තිබිණි.

(බොහෝ විට අඩක් නිම වී පැවැති) මෙම ව්‍යාපෘතීන් අරමුදල් නොමැති වීම හේතුවෙන් නතර කර දමන්නට සිදු විය. මේවා වෙනුවෙන් රඳවා ගැනීමේ ගාස්තු ගෙවීමට හා සම්පූර්ණ කරනු ලැබ තිබී ව්‍යාපෘතීන් වෙනුවෙන් හිඟ බිල් පත් ගෙවීම සඳහා රුපියල් මිලියන 130.28 ක වෙන් කිරීමක් පමණක් සපයන ලදි. කෙසේ වුවද, ඉල්ලුම් කර තිබී අරමුදල් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත නොලැබුණ හෙයින් මේ කාණ්ඩය සඳහා කර තිබුණ වෙන් කිරීම් වලින් 39.4% ක් වර්ෂය තුළදී ප්‍රයෝජනයට ගනු ලැබ ඇත.

දිස්ත්‍රික්ක අනුව ප්‍රාග්ධන කාර්ය වැඩ සටහන් - 2017			
දිස්ත්‍රික්කය	**2017 සඳහා වෙන් කිරීම රුපියල් මිලියන**	**වෙන් කිරීම යොදාගෙන නිම කරන ලද ව්‍යාපෘති සංඛ්‍යාව**	**ප්‍රතිලාභීන් සංඛ්‍යාව**
අම්පාර	19.65	2	30,000
අනුරාධපුර	14.36	2	155,855
බදුල්ල	22.18	2	16,000
කොළඹ	18.93	2	30,300
ගාල්ල	87.86	3	71,700
ගම්පහ	3.30	1	20,000
කළුතර	30.46	1	120,000
මහනුවර	66.46	4	187,000
කෑගල්ල	66.30	4	58,675
කුරුණෑගල	73.21	4	106,185
මාතලේ	27.96	1	400,000
මාතර	58.59	2	10,000
මොණරාගල	0.40	2	16,000
නුවරඑළිය	89.64	2	5,000
පොළොන්නරුව	39.92	2	74,800
යාපනය	1.38	1	200,000
රත්නපුර	73.99	6	152,900
ත්‍රිකුණාමලය	8.81	1	25,000
හම්බන්තොට	33.72	3	35,500
එකතුව*	**736.52**	**45**	**1,714,915**

* මීට අමතරව, උපයෝගිතාවයන් විතැන් කිරීම ඇතුළු අන්තර් පලාත් වැඩ කටයුතු වෙනුවෙන් රුපියල් මිලියන 763.48 ක් වෙන් කරනු ලැබ ඇත.

2017 වර්ෂය තුළදී නිම කරන ලද ව්‍යාපෘති වල විස්තර

කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය	**ව්‍යාපෘතියේ නම**	**ඒජන්සිය**	**මුළු ඇස්තමේන්තුගත පිරිවැය - රුපියල් මිලියන**	**ප්‍රතිලාභීන් සංඛ්‍යාව**
ඌව	මොනරාගල - බුත්තල ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය	KBC බෙල්ජියම	5,515.00	50,000
බස්නාහිර	ලබුගම හා කලටුවාව පුනරුත්ථාපනය කිරීම හා ආවර්ධනය කිරීම	WTP හන්ගේරියාව	7,302.00	375,000
නැගෙනහිර	නැගෙනහිර පලාතේ ජල සම්පාදන සංවර්ධන වැඩ සටහන	ජපාන ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිත ආයතනය	6,526.00	267,000
උතුරු	කිලිනොච්චි ජල සම්පාදන ව්‍යාපෘතිය පුනරුත්ථාපනය කිරීම	ජපාන ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිත ආයතනය	1,942.50	38,000

සේවක මණ්ඩලය.

"මිනිස් බල සංවර්ධන හා පුහුණු කිරීම් අංශය විසින් පෙර පරිදිම කාර්ය මණ්ඩල සාමාජිකයින් වෙත පුහුණු අවස්ථා ලබා දීම අබන්ධ ලෙස කරගෙන යන ලදී. 2017 වර්ෂය තුළදී නව පුහුණු වැඩ සටහන් / වැඩමුළු / දැනුවත් කිරීමේ වැඩසටහන් 41 ක් හඳුන්වා දෙන ලදී."

කාර්ය මණ්ඩල සංඛ්‍යා

කාර්ය මණ්ඩලය		2016	2017	වෙනස් වීම (%)
(අ)	ස්ථිර*	10,110	10,082	(0.28)
(ආ)	අනියම්	3	1	(66.67)
(ඇ)	කොන්ත්‍රාත්	215	229	(6.51)
(ඈ)	ආධුනික යන්ත්‍රාගාර තාක්ෂණ ශිල්පී හා GT	24	26	(8.33)
එකතුව		10,352	10,338	

* විදේශ අරමුදලින් ක්‍රියාත්මක කරන ව්‍යාපෘතීන් වෙනුවෙන් බඳවා ගනු ලැබ ඇති කාර්ය මණ්ඩල සාමාජිකයින් ස්ථිර කාර්ය මණ්ඩලයට ඇතුලත් නොවේ.

ප්‍රධාන කාර්ය කෘත්‍යයන් බෙදී ගොස් ඇති අන්දම.



2017 වර්ෂයේ අවසානය වන විට ස්ථිර කාර්ය මණ්ඩල සාමාජිකයින් 10,082 ක සංඛ්‍යාවට අමතරව කොන්ත්‍රාත් කාර්ය මණ්ඩල සාමාජිකයින් 229 ක් ද, එක් අනියම් සේවකයකු හා ආධුනික යන්ත්‍රාගාර කාර්මික ශිල්පීන් 26 දෙනෙකුද සිටියහ. කොන්ත්‍රාත් පදනම මත බඳවා ගනු ලැබූ කාර්ය මණ්ඩල සාමාජිකයින් වැඩි පිරිසක් බඳවා ගන්නා ලද්දේ විදේශීය අරමුදල් යොදාගනිමින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතීන් වෙනුවෙනි.

2017 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලය තුළදී ස්ථිර කාර්ය මණ්ඩල සාමාජිකයින් 648 ක්ද, කොන්ත්‍රාත් පදනම මත වූ කාර්ය මණ්ඩල සාමාජිකයින් 119 ක් හා විවිධ කාර්ය මණ්ඩල වර්ගයන්ට අයත් ආධුනික යන්ත්‍රාගාර තාක්ෂණික ශිල්පීන් 22 ක්ද බඳවා ගැනීම සිදු කරන ලදී. එම කාලය තුළදීම විශ්‍රාම ගැනීම්, සේවයෙන් ඉල්ලා අස්වීම්, නිලය අත හැර යාම් හා අභාවයන් හේතුකොට ගෙන විවිධ විවිධ කාර්ය මණ්ඩල වර්ගයන්ට අයත් ස්ථිර කාර්ය මණ්ඩල සාමාජිකයින් 676 දෙනෙකුගේද, අනියම් සේවකයින් දෙදෙනෙකුගේද, කොන්ත්‍රාත් කාර්ය මණ්ඩල සාමාජිකයින් 105 දෙනෙකුගේ හා යන්ත්‍රාගාර තාක්ෂණික ශිල්පීන් 20 දෙනෙකුගේද සේවය අවසන් කරන ලදී. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් සමස්ත කාර්ය මණ්ඩලය 14 කින් අඩු විය. යන්ත්‍රාගාර තාක්ෂණික ශිල්පීන් 26 දෙනා ඉදිරි කාලයේදී ස්ථිර තත්ත්වයට පත් කරනු ලැබීමේ හැකියාව පවතී.

ස්ථානය අනුව කාර්ය කෘත්‍යයන් බෙදී ගොස් ඇති අන්දම



කාර්ය මණ්ඩල ප්‍රතිලාභ.

- වර්ෂය තුළදී ඵලදායිත්ව දිරි ගැන්වීමක් ඇතුළුව රුපියල් 40,000.00 ක ප්‍රසාද දීමනාවක් ගෙවන ලදි.
- පෙර වසර වලදී මෙන්ම ප්‍රයෝජනයට නොගත් වෛද්‍ය නිවාඩු වෙනුවෙන් මුදල් ලබා දීම කරන ලදි.
- ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙනුවෙන් නොකැලැල්ල් සේවාවක් ඉටු කළ කාර්ය මණ්ඩල සාමාජිකයින් වෙත ලෝක ජල දිනය සමරමින් 2017 මාර්තු මාසයේදී නෙළුම් පොකුණ මහින්ද රාජපක්ෂ රංග ශාලාවේ පවත්වන ලද උත්සවයේදී සතුට ප්‍රකාශ කොට සිටින ලදි.
- කාර්ය මණ්ඩල සාමාජිකයින් වෙත සහන මිළ ගණන් වලට අනුව ප්‍රවාහන පහසුකම් සපයන ලදි.
- සේවයේ යෙදී සිටින කාලය අතරතුර මිය ගිය ස්ථිර කාර්ය මණ්ඩල සාමාජිකයින් වෙනුවෙන් මරණ ප්‍රදානයන් ගෙවීම සිදු කරන ලදි.
- කාර්ය මණ්ඩල සාමාජිකයින් වෙත දේශීය හා විදේශීය පුහුණු පහසුකම් ලබා දෙන ලදි.
- කාර්ය මණ්ඩල සාමාජිකයින් වෙත රුපියල් 650.00 ක මාසික තේ දීමනාවක් ප්‍රදානය කරන ලදි.
- (මහජන බැංකුව හා ලංකා බැංකුව වෙතින් පිළිවෙලින් නිවාස ණය හා වාහන ණය ආදී වශයෙන්) රාජ්‍ය බැංකු හරහා කාර්ය මණ්ඩල සාමාජිකයින් වෙත ණය පහසුකම් සලස්වා දෙන ලදි.
- එක් කාර්ය මණ්ඩල සාමාජිකයකුට රුපියල් 10,000.00 බැගින් කාර්ය මණ්ඩලය වෙත උත්සව අත්තිකාරමක් ලබා දෙන ලදි.
- 2017 වර්ෂය තුළදී කාර්ය මණ්ඩල සාමාජිකයින් 120 දෙනෙකු අතර මාස 12 ණය වශයෙන් රුපියල් 45,830,615.00 ක මුදලක් හා කාර්ය මණ්ඩල සාමාජිකයින් අතර මාස 10 ණය වශයෙන් රුපියල් 1,522,846,639.00 ක මුදලක් සහන අනුපාතිකයක් මත බෙදා දෙනු ලැබිණි.
- (පවුලේ සාමාජිකයින්ද ඇතුළු) කාර්ය මණ්ඩල සාමාජික සාමාජිකාවන්ගේ වෛද්‍ය වියදම් ප්‍රතිපූරණය කිරීම සඳහා (දල වශයෙන්) රුපියල් මිලියන 88 ක මුදලක් වැය කරන ලද අතර ඊට අමතරව ඉතා බරපතල රෝගයන් සඳහා වෛද්‍ය ප්‍රතිකාර ලබා දීමේ වියදම්ද දරන ලදි.

කාර්ය මණ්ඩලයේ පඩිනඩි හා ප්‍රතිලාභ
2016 හා 2017 වර්ෂයන්හි කාර්ය මණ්ඩල පඩිනඩි සසඳා බැලීම

විස්තරය	2016 රුපියල් මිලියන	2017 රුපියල් මිලියන
වැටුප්	10,104	10,421
සේවක අර්ථසාධක අරමුදලට දායකත්වය	902	911
සේවක භාර අරමුදලට දායකත්වය	226	228
එකතුව	**11,232**	**11,560**

මිනිස් බල සංවර්ධනය හා පුහුණුව

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ මිනිස් බල සංවර්ධන හා පුහුණු කිරීම් අංශය විසින් 2017 වර්ෂය තුළදී නව පුහුණු පාඨමාලාවන් 29 ක් හඳුන්වා දෙන ලදි. ඒවා නම්, සැලැසුම් ශිල්පීන් වෙනුවෙන් වූ මූලික යාන්ත්‍රික හා විද්‍යුත් වින්‍යාස සැලැසුම් පිළිබඳ පාඨමාලාව, ඉංජිනේරුවරුන් හා ඉංජිනේරු සහායකයින් වෙනුවෙන් වූ විලෝම ආශ්‍රැති යන්ත්‍රාගාර සැලැසුම් කිරීම, මෙහෙයුම් කිරීම හා නඩත්තු කිරීම පිළිබඳ පාඨමාලාව, රසායනාගාර සහායකයින් වෙනුවෙන් වූ ඇලම් හුණු විශ්ලේෂණය කිරීමේ පරීක්ෂණ හා රසායනාගාර මිණුම් උපකරණ නඩත්තු කිරීම හා ක්‍රමාංකනය කිරීම පිළිබඳ පාඨමාලාව, ඉංජිනේරු සහායකයින් වෙනුවෙන් වූ නල මාර්ග අළුත්වැඩියා කිරීමේ ක්‍රම, ජනේල පුවරු මෙහෙයවීම හා නඩත්තු කිරීම හා ඵලදායී නායකයකු වන්නේ කෙසේද යන්න පිළිබඳ පාඨමාලාව, ඉංජිනේරුවරුන් වෙනුවෙන් වූ ජලය පවිත්‍ර කිරීම සඳහා අල්ගේ ප්‍රතිකර්මය, වායු සම්කරණ පද්ධතීන් සැලැසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම සහ ඍෂෘෂක කොන්ත්‍රාත්තු කොන්දේසි පිළිබඳ පාඨමාලාව, විධායක නිලධාරීන් වෙනුවෙන් වූ වගකීම, හදිසි අනතුරු වාර්තා කිරීමේදී පැන නගින ගැටළු, ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රමයන් හා සම්බන්ධ ක්‍රියාකාරකම් පිළිබඳ පාඨමාලාව, විධායක නිලධාරීන් වෙනුවෙන් වූ ඉහල බලපෑමක් කළ හැකි ඉදිරිපත් කිරීම් නිර්මාණය කිරීම හා ඉදිරිපත් කිරීම, මූල්‍ය ක්‍රියා පටිපාටිය, විධායක නිලධාරීන් වෙත ඉදිරිපත් කිරීම සඳහා ඵලදායක බහු මාධ්‍ය ඉදිරිපත් කිරීම් නිර්මාණය කිරීම පිළිබඳ පුහුණු වැඩ සටහන, නල වැද්දුම් කරුවන් හා කම්කරුවන් වෙනුවෙන් වූ ජල මනු සම්බන්ධ කිරීම හා මනු විතැන් කිරීම පිළිබඳ පාඨමාලාව, කණ්ඩායම් වැඩ නංවා ලීම සඳහා වූ බැහැරට යන පුහුණුව, ගණුදෙනුකාර සේවාවන්ගේ උත්කෘෂ්ඨ භාවය, ස්කන්ධ තැපැල් කිරීම් සඳහා පරිගණකය භාවිතා කරමින් තැපෑල ඒකාබද්ධ (mail merge) කිරීම, පරිගණකය සහාය කර ගනිමින් වාර්තා පිළියෙල කිරීම, දත්ත කළමනාකරණය සඳහා පැතුරුම් පත් භාවිතා කිරීම, පැතුරුම් පත් උපයෝගී කර ගනිමින් දත්ත ඉදිරිපත් කිරීම, පරිගණක ආරක්ෂාව හා අන්තර්ජාල සුරක්ෂිත තාවය, මිශ්‍ර කණ්ඩායම් වෙනුවෙන් අවුට්ලුක් හා වෙබ් තැපෑල සමග විද්‍යුත් තැපෑල කළමනාකරණය කිරීම, සැපැයුම් හා ද්‍රව්‍ය කළමනාකරණය, වඩාත් හොඳ සේවාවන් ලබා දීම සඳහා අත්‍යවශ්‍ය සංනිවේදන කුසලතා, Ms Office 2010 ට හුරු වීම, MAA වරුන් වෙනුවෙන් අන්තර්ජාලය හා විද්‍යුත් තැපෑල භාවිතා කිරීම හඳුන්වා දීම හා පුහුණු /නුපුහුණු ශ්‍රේණීන් වෙනුවෙන් වෘත්තීය උත්කෘෂ්ඨ භාවය සඳහා අවශ්‍ය අන්තර් පුද්ගල කුසලතාවයන් පිළිබඳ පුහුණුවද වේ.

අභ්‍යන්තර පුහුණුව, සම්මන්ත්‍රණ හා වැඩ මුළු

මෙම අංශය විසින් 2017 වර්ෂය තුළදී විවිධ වර්ගයන්ට අයත් කාර්ය මණ්ඩල සාමාජිකයින් වෙනුවෙන් අභ්‍යන්තර පුහුණු වැඩ සටහන් 246 ක් මෙහෙයවනු ලැබ ඇති අතර ඒ තුළින් (කළමනාකරුවන් 600 ක්, වෙනත් විධායක නිලධාරීන් 2,385 ක්, අධීක්ෂණ ශ්‍රේණීන්ට අයත් නිලධාරීන් 2,593 ක්, ලිපිකාර හා ඒ හා අදාල නිලධාරීන් 2,139 ක් සහ මෙහෙයුම් කටයුතු වල නිරත කාර්ය මණ්ඩල සාමාජිකයින් 1,511 ක් ඇතුළු) කාර්ය මණ්ඩල සාමාජිකයින් 9ල228 ක මුළු සංඛ්‍යාවක් පුහුණු කරනු ලැබ ඇත.

රට තුළ පිහිටි වෙනත් පුහුණු කිරීම් ආයතනයන් තුළ ලබා දෙන ලද පුහුණුව

මිනිස් බල සංවර්ධන හා පුහුණු කිරීම් අංශය විසින් පුහුණු දින 2450 ක මුළු සංඛ්‍යාවක් ආවරණය කරමින් වෙනත් පුහුණු ආයතනයන් මගින් කාර්ය මණ්ඩල සාමාජිකයින් 182 ක් වෙත බාහිර පුහුණුව ලබා දී ඇත. මේවාට දේශීය විශ්ව විද්‍යාලයයන් විසින් මෙහෙයවනු ලැබූ දර්ශනපති, ශාස්ත්‍රපති හා පශ්චාත් උපාධි වැඩ සටහන් සහ ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ ජාතික ආයතනය, සැපැයුම් හා ද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ආයතනය, ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය, ලංකා ජර්මානු තාක්ෂණික පුහුණු ආයතනය

හා නිවාස සැලැසුම් කිරීමේ හා ඉදි කිරීමේ මධ්‍යස්ථානය ඇතුළු පිළිගත් ආයතනයන් විසින් මෙහෙයවන ලද ඩිප්ලෝමා හා සහතික පාඨමාලාවන් ද ඇතුලත් වේ. තවද මානව සම්පත් කළමනාකරණය, සැපැයුම් දාම කළමනාකරණය, ඉදි කිරීම් කළමනාකරණය, යාන්ත්‍රික හා විදුලි ක්ෂේත්‍රයන් හා යන්ත්‍ර ක්‍රියාත්මක කිරීම හා නඩත්තු කිරීම ආදියට අදාල කෙටි පාඨමාලාවන් කිහිපයක් හැදෑරීම සඳහා ද කාර්ය මණ්ඩල සාමාජිකයින් නම් කරන ලදි.

දිවයිනෙන් බැහැර පුහුණුව හා නිල චාරිකා

මේ යටතේ ආසියානු සංවර්ධන බැංකුවේ මූල්‍ය ආධාරයෙන් හා ජපන් ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සිය, කොරියානු ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සිය, ඉන්දියානු තාක්ෂණික ආර්ථික සහයෝගිතාවය, ආසියානු තාක්ෂණවේදී ආයතනය සමග එබාරා ආයතනය, ආසියානු ථලදායිතා සංවිධානය, ලෝක සෞඛ්‍ය සංවිධානය, සිංගප්පූරු සහයෝගිතා වැඩ සටහන හා චීන විද්‍යා ආයතනය යනාදී ආයතනයන් විසින් පිරිනමන ලද ද්වි පාර්ශවික අධි ශිෂ්‍යත්වයන් හරහා මණ්ඩලයේ කාර්ය මණ්ඩල සාමාජිකයින් 98 දෙනෙකුන් වෙත කෙටි කාලීන විදේශීය පුහුණු අවස්ථාවන් ලබා දෙන ලදි. මීට අමතර ලෙස මිනිස් බල සංවර්ධන හා පුහුණු අංශය විසින් 2017 වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද විවිධ වැඩ සටහන් හරහා නැවිගත කිරීමට පෙර පරීක්ෂණ, කර්මාන්ත ශාලා කොන්ත්‍රාත්තු ප්‍රමන්ත්‍රණ හා ඒකාබද්ධ වීමේ වැඩ සටහන් ආදිය සඳහා නිල විදේශ සංචාරයන්හි යෙදීමට නිලධාරීන් 134 දෙනෙකු වෙත පහසුකම් සලස්වා දෙන ලදි.

2017 වර්ෂය තුළදී ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ඉංජිනේරුවරුන් හා කළමනාකරු (වාණිජ) වෙත පූර්ණ කාලීනව විදේශ ගත වී අධ්‍යයනයෙහි යෙදීම සඳහා පහත සඳහන් දීර්ඝ කාලීන අධිශිෂ්‍යත්වයන් පිරිනමනු ලැබිණි.

a) ප්‍රංශ රජයේ අනුග්‍රහයෙන් පවත්වන ලද ජාත්‍යන්තර විධායක ශාස්ත්‍රපති උපාධි වැඩ සටහන (දෙදෙනයි)

b) නෙදර්ලන්ත අධිශිෂ්‍යත්ව වැඩ සටහන විසින් මෙහෙයවන ලද ජල කළමනාකරණය පාලනය හා ජල සේවා කළමනාකරණය පිළිබඳ විශේෂඥතාවය පිළිබඳ විද්‍යාපති වැඩ සටහන

c) නෙදර්ලන්ත අධිශිෂ්‍යත්ව වැඩ සටහන විසින් මෙහෙයවන ලද ජල විද්‍යාපන විද්‍යාව පිළිබඳ විශේෂඥතාවය සමග ජල විද්‍යා හා ඉංජිනේරු විද්‍යාපති වැඩ සටහන : ජල කළමනාකරණය සඳහා තොරතුරු ක්‍රමයක් නිරූපකරණය කිරීම පිළිබඳ වැඩ සටහන.

කාර්යස්ථ පුහුණු වැඩ සටහන්

උපාධි අපේක්ෂකයින්, ජාතික තාක්ෂණවේදී ඩිප්ලෝමා / ඉංජිනේරු විද්‍යාව පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමා ශිෂ්‍යයින්, ශිල්පීය ආධුනිකයින්, තාක්ෂණික විද්‍යාලයයන්හි හා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයෙහි ශිෂ්‍යයින්, AAT, වෘත්තීය පුහුණු කිරීම් අධිකාරිය හා ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය ආදියේ ශිෂ්‍යයින් ඇතුලත් වෘත්තීය ආධුනිකයින් වෙත කාර්යස්ථ පුහුණුව ලබා දෙන ලදි. මේ යටතේ උපාධි අපේක්ෂකයින් 133 දෙනෙකු වෙත ද, තාක්ෂණික පුහුණු ලාභීන් 60 දෙනෙකු වෙත ද, ගණකාධිකරණ පුහුණුලාභීන් 03 දෙනෙකු වෙත හා ලිපිකරු හා වෙනත් පුහුණුලාභීන් 37 දෙනෙකු වෙත ද මිනිස් දින 33,953 ක් ආවරණය කරමින් කාර්යස්ථ පුහුණුව ලබා දෙන ලදි.

අභ්‍යන්තර කාර්ය මණ්ඩල සාමාජිකයින් වෙත ලබා දුන් පුහුණු කිරීම් වල සාරාංශය

පුහුණුවේ ස්වභාවය	පුහුණු කරන ලද කාර්ය මණ්ඩල සාමාජිකයින් සංඛ්‍යාව			මිනිස් දින
	සැලැසුම් කළ	පුහුණු කළ	පුහුණුව ලැබූ %	
අභ්‍යන්තර පුහුණුව	4600	9228	200%	13328
රට තුළ බාහිර පුහුණුව	180	182	101%	2450
විදේශීය පුහුණුව	80	239	299%	3758
බාහිර ආයතනයන් විසින් මෙහෙයවන ලද වැඩමුළු හා තාක්ෂණික ඉදිරිපත් කිරීම්	240	245	102%	245
එකතුව	**5100**	**9894**	**194%**	**16867**

මිනිස් බල සංවර්ධන හා පුහුණු කිරීම් අංශය විසින් සපයන ලද පුහුණු කිරීම් සාරාංශය





2017 ප්‍රගතිය - සහභාගි වූවන්ගේ සංඛ්‍යාව

	සැලැසුම් කළ සංඛ්‍යාව	සහභාගි වූ සංඛ්‍යාව
බාහිර පුහුණුව	180	182
විදේශ පුහුණුව / සංචාර	80	239
තාක්ෂණික ඉදිරිපත් කිරීම්	240	245
කාර්මික පුහුණුව		230
අභ්‍යන්තර පුහුණුව	4600	9228

“ලෝකයේ ප්‍රථම හා ප්‍රමුඛතම ඖෂධය වන්නේ පවිත්‍ර ජලයයි.”

ස්ලොවැකියානු ආත්තෝපදේශයකි.

ගිරිසර වර්ෂාව

කලටුවාව ජල පවිත්‍රාගාරය

සේවාවේ උත්කෘෂ්ඨ භාවය හා මෙහෙයුම් කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම සඳහා තොරතුරු තාක්ෂණ විසඳුම්.

තොරතුරු තාක්ෂණ වර්ධනය හරහා නව්‍යකරණය කිරීම.

නූතන සන්දර්භය තුළ සංවිධානයේ වැඩීමට හා තිරසාරත්වයට තීරණාත්මක වශයෙන් වැදගත් වන නව්‍යකරණය ප්‍රවර්ධනය කිරීම සඳහා දායක වන වැදගත්ම දායකයා තොරතුරු තාක්ෂණය බව අවබෝධ කර ගැනීමත් සමග, සංවිධානය මුළු වර්ෂය මුළුල්ලේම තොරතුරු තාක්ෂණය දියුණු කිරීම කෙරෙහි සිය අවධානය යොමු කරමින් කටයුතු කළේය.

පවත්නා පද්ධතීන් හා විසඳුම් වැඩි දියුණු කරමින් නඩත්තු කරගෙන යන අතරතුර සංවිධානයේ ඉතාමත්ම වැදගත් කාර්යයන් ආවරණය කිරීම සඳහා වූ නව විසඳුම් මාර්ගයෙන් වැඩි දුර නව්‍යකරණයන් ගෙන ඒමට තොරතුරු තාක්ෂණ අංශයට හැකියාව ලැබිණි. තොරතුරු තාක්ෂණ අංශයේ ප්‍රධාන අවධානය යොමු වන ලද්දේ අළුතින් සැලැසුම් කිරීම හරහා ව්‍යාපාරික ක්‍රියාවලීන් අනුකූලනය කිරීම සඳහා තොරතුරු තාක්ෂණ විසඳුම් හඳුන්වා දීම මගින් සාම්ප්‍රදායික ප්‍රවේශයන් වැඩි දියුණු කිරීම කෙරෙහිය. පරිනාමය වෙමින් පවතින ඉරාජ්‍ය සංකල්පයන් (eGovernment Concepts) හා ගැලැපෙන පරිදි ගණුදෙනු කරුවන් බලා ගැනීමේ සේවාවන් හා විවිධ පරදුධාරී අන්තර් ක්‍රියාවන් වැඩි දියුණු කිරීම සඳහා විවිධ පියවර ගන්නා ලදි.

වැඩි වෙමින් පවතින ඉල්ලුමට අනුව සැපැයුම ලබා දීම සඳහා ප්‍රවේශය දීර්ඝ කිරීමට හා සංවිධාන ව්‍යුහයේ පහලම මට්ටම් දක්වා විසඳුම් සුලභ කිරීමටත් හැකි වන පරිදි දැනට පවතින තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම අඛන්ඩව වැඩි දියුණු කරන ලදි.

තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම සංවර්ධනය හා නඩත්තුව

තොරතුරු තාක්ෂණ විසඳුම් යොදා ගැනීමේ වේදිකාව වන්නේ තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම වේ. සංවිධානයේ තොරතුරු තාක්ෂණ යටිතල පහසුකමේ ප්‍රධාන අංගයන් මධ්‍යම සේවා යටිතල පහසුකම, සම්බන්ධතා විසඳුම් හා කෙළවර පරිශීලක මට්ටමේ දෘඩාංග ද වන්නේය. දත්ත මධ්‍යස්ථානයේ පහසුකම් වැඩි දියුණු කිරීමට පියවර ගනිමින් සිටින අතර පුද්ගලික පරිගණක හා පර්යන්ත උපකරණ වැනි කෙළවර පරිශීලක මට්ටමේ දෘඩාංග මහත් එකතුවක් පද්ධතියට එකතු කරන ලදි.

ප්‍රාදේශීය/ දිස්ත්‍රික් ඉංජිනේරු කාර්යාල, ස්ථාන භාර නිලධාරී කාර්යාල හා ගබඩා පිහිටි ස්ථාන ආදී වැඩි වැඩියෙන් වැදගත් පරිස්ථානයන් ක්‍රමවත්ව රැහැන් කළ IP VPN සම්බන්ධතා හරහා සම්බන්ධ කිරීම මගින් IP VPN විසඳුම තව දුරටත් ව්‍යාප්ත කරන ලද අතර, වෙනත් අඩු දත්ත සූක්ෂම පරිස්ථානයන් වෙත ප්‍රවේශ වීමේ හැකියාව සපයන ලද්දේ දුරස්ථ පාලක VPN සම්බන්ධතා මගිනි. බාධාවකින් තොරව දැනට පවත්නා විසඳුම් වල සුලභතාවය සහතික කිරීම සඳහා අවශ්‍ය තීරණාත්මක අවශ්‍යතාවයක් වශයෙන් සලකනු ලබන ආපදා ප්‍රතිසාධන පහසුකම ස්ථාපිත කිරීම පිණිස පියවර ගනු ලැබිණි.

තොරතුරු තාක්ෂණ අංශය විසින් වගකීම දරනු ලබන ප්‍රධාන ක්ෂේත්‍රයන්ගෙන් එකක් වන්නේ යටිතල පහසුකම් නඩත්තු කිරීමය. දෘඩාංග / ජාල ගත වීම් කාර්ය මණ්ඩලයේ සහභාගිත්වයෙන් හා අවශ්‍ය අවස්ථාවන්හිදී සේවා සපයන්නන්ගේ සහායද ලබා ගනිමින් දෘඩාංග හා සම්බන්ධතා විසඳුම් වලට අදාල ක්‍රියාකාරකම් අඛන්ඩව කරගෙන යන ලදි. පරිගණක අක්‍රීයව තිබෙන කාලය අඩු කිරීම සඳහා බොහෝ නඩත්තු ක්‍රියාකාරකම් ඉටු කරන ලද්දේ අභ්‍යන්තර කාර්ය මණ්ඩලය විසිනි.

මෘදුකාංග විසඳුම්

සංවිධානයේ ඉතාම වැදගත් මෘදුකාංග විසඳුම් වලින් එකක් වූයේ මෘදුකාංග සංවර්ධකයින්ගේ අභ්‍යන්තර කණ්ඩායමක් විසින් සංවර්ධනය කරන ලද වාණිජ මෙහෙයුම් කළමනාකරණ පද්ධතියයි. මෙම විසඳුම 2015 වර්ෂයේදී දියත් කරන ලද අතර වැඩි වැඩියෙන් ශ්‍රීතියතාවයන් අන්තර්ගත කරමින් විසඳුමේ විෂය පථය විස්තීර්ණ කිරීම සඳහා අඛන්ඩ ලෙස වැඩි දියුණු කිරීම් ක්‍රියාත්මක කරන ලදි. විසඳුමට අන්තර්ගත කරන ලද නව ශ්‍රීතියතාවයන්ට පැමිණිලි පිළිබඳව කටයුතු කිරීම, නව සම්බන්ධතා පිරිසැකසුම් කිරීම, ආදායම් රහිත ජලය ගණනය කිරීමේ පහසුකම් හා ක්ෂෙත්‍ර ක්‍රියාකාරකම් සඳහා සහාය දීම ආදිය ඇතුලත් විය. වාණිජ මෙහෙයුම් කළමනාකරණ පද්ධතියේ දිගුවක් වශයෙන් නෛතික අය කර ගැනීම් මොඩියුලය සංවර්ධනය කොට ක්‍රියාත්මක කරන ලද්දේය.

මනු කියවීම් දත්ත රැස් කර එම ස්ථානයේදීම බිල් පත් පිළියෙල කිරීමට මනු කියවන්නන් හට සහාය වනු පිණිස ජංගම පරිගණක උපයෝගයක් සංවර්ධනය කරන ලදි. වාණිජ මෙහෙයුම් කළමනාකරණ පද්ධතියට අතිරේක පහසුකමක් වශයෙන් මෙම ජංගම පරිගණක උපයෝගය සංවර්ධනය කරන ලද්දේ පවත්නා මනු කියවීම්, දත්ත රැස් කිරීම් හා දත්ත ඇතුළු කිරීමේ ක්‍රියාවලිය වෙනුවට වන අතර ඒ මගින් අතින් කරන බිල් පත් ගණනය කිරීමේ ක්‍රියාවලිය තුළ සිදු වන වැරදි ඵලදායක ලෙස අවම කර ගැනීමේ හැකියාව ලැබිණි.

නව අවශ්‍යතාවයන්ට හා ව්‍යාපාරික ක්‍රියාවලියේ වෙනස් කම් වලට ගැලැපෙන පරිදි මානව සම්පත් කළමනාකරණයට හා සේවක පඩි ලැයිස්තු මොඩියුලයන් අඛන්ඩ වැඩි දියුණු කිරීම් වලට හා සංශෝධනයන්ට භාජනය කරන ලදි. ඉන්වෙන්ටරි කළමනාකරණ ක්‍රමයට කරන ලද වැඩි දියුණු කිරීම් හා එම විසඳුම දීප ව්‍යාප්ත ලෙස ක්‍රියාත්මක කිරීම තොරතුරු තාක්ෂණ අංශයෙහි ප්‍රධාන ක්‍රියාකාරකම් අතර විය. මූල්‍ය අංශය වෙනුවෙන් විවිධ මෘදුකාංග වීසඳුම් සංවර්ධනය කිරීමේ ක්‍රියාකාරකම් ආරම්භ කරන ලද අතර පොදු ලෙජර ක්‍රමය වෙනුවෙන් වූ වැඩි දියුණු කිරීම් ක්‍රියාත්මක කරන ලදි.

ගණුදෙනු කරුවන්ගේ අවශ්‍යතාවයන් ඉටු කිරීමේ සේවාවන් සඳහා විසඳුම්

ඇමතුම් මධ්‍යස්ථාන පහසුකම තව දුරටත් වැඩිදියුණු කරන ලද අතර දීප ව්‍යාප්ත භාවිතය සඳහා වූ පොදු පැමිණිලි කළමනාකරණය කිරීමේ ක්‍රමයක් වශයෙන් එම විසඳුම වාණිජ මෙහෙයුම් කළමනාකරණ පද්ධතිය සමග ඒකාබද්ධ කරන ලදි. මෙම විසඳුම දැනට ගණුදෙනු කරුවන්ගේ පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා මාලිග ාකන්දේ පිහිටි ඇමතුම් මධ්‍යස්ථානය විසින් මෙන්ම කලාපීය කාර්යාලයන් විසින්ද භාවිතා කරනු ලබයි. ක්ෂෙත්‍ර නිලධාරීන් වෙත නිකුත් කරනු ලබන කාර්ය ඇණවුම් ද ජනනය කරනු ලබන්නේ එම පද්ධතියෙනි. ක්ෂෙත්‍ර නිලධාරීන් වෙත පැමිණිලි තොරතුරු ලබා දීමේ යාන්ත්‍රණයක් වශයෙන් කෙටි පණිවුඩ සේවා (SMS) පණිවුඩ ක්‍රමය භාවිතා කරනු ලැබේ. ගණුදෙනු කරුවන් වෙතින් ලැබෙන ප්‍රතිපෝෂණ පද්ධතිය මගින් ස්වයංව ජනනය වන අතර ඒවා කෙටි පණිවුඩ සේවාව මගින් ගණුදෙනු කරුවන් වෙත යැවීමට කටයුතු කරනු ලැබේ.

ගණුදෙනුකරුවන්ට බිල් පත් හා ගෙවීම් බැලීම හා විවිධ සේවා ඉල්ලීම් ඉදිරිපත් කිරීම පහසුකරණය කරන මාර්ගගත සේවා ද්වාරය ගණුදෙනු කරුවන්ගේ පහසුව නංවා ලීම සඳහා තව දුරටත් වැඩි දියුණු කරන ලදි. මාර්ගගත බිල් පත් ගෙවීමේ පහසුකම මාර්ගගත සේවා ද්වාරයට සම්බන්ධ කරනු ලැබ ඇත. මෙම මාර්ගගත බිල් ගෙවීමේ පහසුකම වෙත ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ නිල වෙබ් අඩවිය හරහාද ඍජුවම ප්‍රවේශ විය හැකිය.

ගණුදෙනුකරුවන් වෙත සහාය දීමේ ක්‍රියාකාරකම් වල වැඩි දියුණු කිරීමක් වශයෙන් ගණුදෙනුකාර ස්වයං සේවා ජංගම යෙදුමක්ද සංවර්ධනය කරන ලදි. දැනට ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ නිල වෙබ් අඩවිය තුළ තිබෙන මෙම යෙදුම විසින් ගණුදෙනුකරුවන්ට තමන් විසින් ගෙවිය යුතුව ඇති හිඟ

මුදල, බිල් කිරීමේ ඉතිහාසය හා තමන් විසින් අවසන් වරට කරනු ලැබ ඇති ගෙවීම් තුන පිළිබඳ විස්තර ද දැක ගැනීමේ පහසුකම සලස්වනු ලබයි. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ අයකැමි ස්ථානයන්හි දුරකථන කුඩුවක ආකාරයෙන් පිහිටුවනු ලැබ ඇති කාර්ය ස්ථානයන් හරහා ගණුදෙනු කරුවන්ට ප්‍රවේශ විය හැකි වෙබ් පදනම් වූ පහසුකමක් දියත් කරන ලදි. නිලධාරීන්ගෙන් විමසන්නේ නැතිව තමන් විසින් ගෙවිය යුතුව ඇති ශේෂය හා තමන්ගේ ගෙවීම් ඉතිහාසය දැන ගැනීමේ හැකියාව මෙම විසඳුම හරහා ගණුදෙනුකරුවන් වෙත උදා වේ. කාර්ය බහුල කාර්යාලයන් වෙත නොගොස් තමන්ට අවශ්‍ය තොරතුරු තමාටම බලා ගැනීමට ගණුදෙනුකරුවන්ට ඉඩ කඩ සැලැස්වීම තුළින් පාරිභෝගික සබඳතා නිලධාරීන්ගේ කාර්ය භාරය සෑහෙන මට්ටමකින් සැහැල්ලු කිරීමට මෙම පහසුකම උපකාරී විය.

ගණුදෙනුකාර ස්වයං සේවා ජංගම යෙදවුමක් සංවර්ධනය කිරීම ආරම්භ කරන ලද්දේ ජංගම වේදිකාව වෙත මාර්ගගත සේවා වෙබ් ද්වාරය විසින් පිරිනමනු ලබන සියළුම සේවාවන් සම්බන්ධ කර ගනිමින් වේ.

සේවාවේ ගුණාත්මය වැඩි දියුණු කිරීම සඳහා මතු වෙමින් පවත්නා තාක්ෂණවේදයන් භාවිතයට ගැනීම

මහජන සේවාවන් වැඩි දියුණු කිරීමෙහි ලා ප්‍රධාන සාධකය වන්නේ නව්‍යකරණයයි. වැඩි දියුණු වූ රාජ්‍ය සේවා ලබා දීමේ යාන්ත්‍රණයන්හි පාලන බල වේගය වශයෙන් ඉරාජ්‍ය සංකල්පයන් (eGovernment Concepts) මතු වෙමින් පවතින අතර තුර ලෝකය පුරාම මහජන උපයෝගිතා අංශය තුළ නව්‍යකරණාත්මක විසඳුම් සඳහා වූ වේදිකාවන් වශයෙන් භූගෝලීය තොරතුරු පද්ධතීන් (GIS) හා අධීක්ෂණාත්මක පාලනය හා දත්ත ප්‍රතිග්‍රහණ (SCADA) පද්ධතීන්, කෙටි පණිවුඩ සේවාවන් හා ජංගම දුරකථන පදනම් වූ තාක්ෂණවේදයන් වේගයෙන් මතු වෙමින් පවතී. මෙකී නව ප්‍රවණතාවයන් සමග වර්ෂය මුළුල්ලේම කරට කර සිටින අතරම, වඩාත් හොඳ පාරිභෝගික තෘප්තිමත්භාවයක් සහතික කිරීමේ අරමුණින් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් මෙහෙයුම් කාර්යක්ෂමතාවය, සපයනු ලබන සේවාවන්ගේ ගුනාත්මය හා ගණුදෙනු කරුවන්ගේ අවශ්‍යතාවයන් ඉටු කිරීමේ සේවාවන් වල තත්ත්වය වැඩි දියුණු කිරීම සඳහා මෙම මතු වෙමින් පවතින තාක්ෂණයන් යොදා ගැනීමෙහි ලා විශේෂයෙන් සඳහන් කළ යුතු ප්‍රයත්නයන් දරනු ලැබ ඇත.

ආදායම් රහිත ජලය පිළිබඳව පසුවිපරම් කිරීමේ මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම හා ජල උපයෝජ්‍යතා වත්කම් සම්බන්ධයෙන් භූගෝලීය තොරතුරු පද්ධති විසඳුමක් සංවර්ධනය කිරීම මෙම අභිප්‍රාය සාක්ෂාත් කර ගැනීම සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ගන්නා ලද පියවර කිහිපයකි. ජල සම්පාදන හා මල අපවහන යෝජනා ක්‍රමයන්ගේ මෙහෙයුම් හා නඩත්තු කටයුතු ඉටු කිරීමේ කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීමේ ක්‍රම වශයෙන් ස්වයංක්‍රීය කරණය, මධ්‍යගත පසුවිපරම් හා සමාලෝචන පහසුකමක් ඇති කිරීම හා ස්වයංක්‍රීය මනු කියවීම් හා බිල් කිරීම් ක්‍රමයක් ඇති කිරීම පිළිබඳ යෝජනා දැනට අගැයීමට භාජනය කරනු ලබමින් පවතී. ස්වයංක්‍රීය කරණයේ හා මධ්‍යගත පසුවිපරම් කරණයේ නවතම ප්‍රවණතාවය වන්නේ වේගයෙන් පරිණාමය වෙමින් පවතින Internet of Things (IoT) නම් තාක්ෂණවේදය වන අතර, එය අන්තර්ජාලය හරහා වැදගත් උපක්‍රමයන් වෙත ප්‍රවේශ වීම පහසුකරණය කරයි. ස්වයංක්‍රීයකරණය සඳහා සහ විවිධ වැදගත් උපක්‍රමයන්ගේ මෙහෙයුම් පසුවිපරම් කිරීම සඳහා සංකල්පයන් භාවිතා කිරීමේ හැකියාව දැනට සංවිධානයේ අගැයීමට භාජනය කරනු ලබමින් පවතී.

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ නිල වෙබ් අඩවිය

සංවිධානයේ නවතම ප්‍රතිරූපය පිළිබිඹු වන පරිදි ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ නිල වෙබ් අඩවිය අඛන්ඩ ලෙස යාවත්කාලීන කරනු ලබමින් පවතී. සංවිධානය පිළිබඳ ඉතාමත්ම යාවත්කාලීන තොරතුරු ඉදිරිපත් කරනු ලබන අතර ගණුදෙනුකරුවන්ගේ අන්තර් ක්‍රියාවන් නංවා ලීම සඳහා වෙබ් අඩවිය තුළට යම් යම් අන්තර් ක්‍රියාකාරී සේවාවන්ද අන්තර්ගත කරනු ලැබ ඇත. භාවිතා කරන්නන්ට බා ගැනීමට හැකි වන පරිදි අයැදුම් පත්‍ර, සේවාවන් ඉල්ලා සිටීමේ ඉල්ලුම් පත්‍ර, අත් පත්‍රිකා හා පල කිරීම් ආදිය වෙබ් අඩවිය තුළ තිබේ. වැදගත් සිදුවීම්, දැන්වීම් හා ප්‍රවෘත්ති නිරන්තරයෙන්ම යාවත්කාලීන කරනු ලැබේ.

මෙම වෙබ් අඩවියේ ඉතාම ජනප්‍රිය අංශයන් වන්නේ ටෙන්ඩර් දැන්වීම්, රැකියා අවස්ථාවන් හා ප්‍රතිසම්පාදන දැන්වීම් ආදිය වේ. ගණුදෙනුකාර ප්‍රතිපෝෂණ හා පැමිණිලි / දුක් ගැනවිලි යැවීමේ පහසුකම් සලස්වනු ලැබ තිබේ. වඩාත් ඵලදායී අන්තර්ගතය යාවත්කාලීන කිරීමේ ක්‍රියාවලියක් පහසුකරණය කිරීම සඳහා විවෘත ප්‍රභව වෙබ් සැලැසුම හා සංවර්ධන ක්‍රමවේදයන් භාවිතා කරමින් නිල වෙබ් අඩවිය අන්තර්ගතය කළමනාකරණය කිරීමේ විසඳුමක් බවට පරිවර්තනය කරනු ලැබ ඇත.

ක්‍රෙඩිට් කාඩ් පත් භාවිතා කරමින් අන්තර්ජාලය හරහා ජල බිල් පත් වෙනුවෙන් කරනු ලබන ගෙවීම් භාර ගැනීමේ පහසුකම් ද නව වෙබ් අඩවිය සතුව තිබේ.

ඇමතුම් මධ්‍යස්ථානයේ මෙහෙයුම්.

සිය පැමිණිලි හා දුක් ගැනවිලි ක්ෂණික දුරකථන අංක 1939 ඔස්සේ ඉදිරිපත් කිරීමට ගණුදෙනුකරුවන්ට උපකාර කිරීමේ පරමාර්ථයෙන් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය පැය 24 ඇමතුම් මධ්‍යස්ථාන පහසුකමක් පවත්වාගෙන යයි. ඇමතුම් මධ්‍යස්ථාන පහසුකම සඳහා අවශ්‍ය මෘදුකාංග මොඩියුල සංවර්ධනය කිරීම හා ක්‍රියාත්මක කිරීම කරන ලද්දේ තොරතුරු තාක්ෂණ අංශය විසිනි. ඇමතුම් මධ්‍යස්ථාන මෙහෙයුම් වල මධ්‍යතම ප්‍රධාන අංග ලක්ෂණය වන්නේ ගණුදෙනුකරුවන්ගේ පැමිණිලි ග්‍රහණය කරගෙන පිරිසැකැසුම් කොට ක්ෂණිකව කෙටි පණිවුඩ සේවාව හරහා ගණුදෙනුකරු වෙත හා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ අදාල නිලධාරීන් වෙත ප්‍රතිපෝෂණ/පණිවුඩ යැවීමේ හැකියාව ඇති කරන මෘදුකාංග පැකේජයයි. මෙම විසඳුම ගත වූ 6 වසර මුළුල්ලේ ක්‍රියාත්මක වෙමින් පැවැති අතර වාණිජ මෙහෙයුම් කළමනාකරණ පද්ධතියේ වර්ධනයත් සමග මෙම මෘදුකාංග විසඳුම ප්‍රධාන අධිශ්‍රේණිකරණයකට බඳුන් කරනු ලැබිණි. ඇමතුම් මධ්‍යස්ථාන මෘදුකාංගය දැනට නව වාණිජ මෙහෙයුම් කළමනාකරණ පද්ධතියේ එක් මොඩියුලයක් වශයෙන් ක්‍රියාත්මක වෙයි.

වාණිජ ක්‍රියාකාරකම්

ගණුදෙනුකරුවන් වෙත වඩාත් හොඳින් සේවා සැපැයීම සඳහා වාණිජ අංශය මෘදුකාංග භාවිතා කරයි. අභ්‍යන්තර කාර්ය මණ්ඩලය පුහුණු කිරීම හා දීප ව්‍යාප්ත ලෙස තිරසාරභාවය ඇති කිරීමට වග බලා ගැනීම ප්‍රධාන වැදගත් ක්ෂේත්‍රයන් වේ.

සේවා උත්කෘෂ්ඨ භාවය වෙනුවෙන් මෘදුකාංග සංවර්ධනය කිරීම

තොරතුරු තාක්ෂණ අංශය විසින් බිල් කිරීම හා මුදල් එකතු කිරීම සඳහා සංවර්ධනය කරන ලද "වාණිජ මෙහෙයුම් කළමනාකරණ පද්ධතිය" ස්ථාපිත කරන ලද අතර බාධා විරහිත මෙහෙයුම් හා පසුවිපරම් පරමාර්ථයන් සඳහා වාර්තා 400 කට වැඩි සංඛ්‍යාවක් සංවර්ධනය කරනු ලැබ ඇත. මූල්‍ය අංශය සමග සැසඳීම සමීප ලෙස පසුවිපරම් කරනු ලැබේ. කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීම සඳහා නව නිෂ්පාදනයන් හඳුන්වා දීම කරනු ලැබේ.

අ. ජංගම දුරකථන වෙනුවෙන් වූ යෙදුමක් භාවිතා කරමින් ජල මනු කියවීම සාර්ථක ලෙස දියත් කරන ලද අතර එය දීප ව්‍යාප්ත ලෙස ක්‍රියාත්මක කිරීම ආරම්භ කරනු ලැබ ඇත. මේ හරහා දෝෂ රහිත බිල්පත් ලැබීම හේතුකොට ගෙන වඩාත් හොඳ ගණුදෙනුකාර තෘප්තියක් ඇති වී ඇති අතර ගණනය කිරීම් අඩු වීම නිසා මනු කියවන්නන්ගේ කාර්යයද පහසු වී ඇත. මීට අමතරව, ජංගම මනු පසුවිපරම් කිරීමේ ක්‍රමය විසින් තීරණ ගන්නන්ට තමන්ගේ කාර්යය වඩාත් හොඳින් ඉටු කිරීමේ පහසුකමද සලස්වනු ලැබ ඇත.

ආ. අයකැමිවරුන් වෙත මුදල් ගෙවීම සඳහා පැමිණෙන ගණුදෙනුකරුවන්ට "ස්වයං සේවා යෙදුම" භාවිතා කරමින් තමන් විසින් එදිනට ගෙවන්නට තිබෙන මුදල් ප්‍රමාණය බලා ඒ අනුව ගෙවීම කිරීමේ හැකියාව ලැබී ඇත.

ඇ. දැනට ගෙවීමට හිඟ හිට ඇති මුදල බලා ගැනීමට හැකි ජංගම යෙදුම නිසා නොගෙවන ලද ජල බිල්පත් නිසා සේවාව විසංධි කිරීමට පෙර ගණුදෙනු කරුගෙන් අය වීමට ඇති හිඟ මුදල පරීක්ෂා කර බැලීමේ හැකියාව ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලයට ලැබේ.

ඈ. භෞතික වශයෙන් මනු කියවීමක් සිදු කර නොමැති මාස සඳහා පරිගණකය විසින් ජනනය කරන ලද බිල් පතක් නිකුත් කිරීමෙන් ගණුදෙනුකාර තෘප්තිය දියුණු කිරීමේ කාර්යය ඵලදායක වී ඇත.

ඉ. ආයතනය සතු කාර්යාලයන් දීප ව්‍යාප්තව තිබෙන අතර මුදල් රැස් කිරීම වැඩි දියුණු කිරීම පිණිස ඒවා හරහා සියළුම නිලධාරීන් වෙත මාසික බිල් නිකුත් කිරීමේදී එක් "කණ්ඩායම් බිල් පතක්" නිකුත් කිරීමේ ක්‍රමය ආරම්භ කරන ලදි.

තීරණ ගන්නන්ට "වාණිජ මෙහෙයුම් කළමනාකරණය" නුරු කරවීම සියළුම කලාපීය සහාය සේවා මධ්‍යස්ථානයන් 11 තුළම දැනුවත් භාවය නංවා ලීමේ වැඩ සටහන් පැවැත්වීම තුළින් සිදු කරන ලදි. කලාපයන්හි පවත්වන ලද මාසික බිල් කිරීමේ හා මුදල් රැස් කිරීමේ රැස්වීම් වලට සහභාගි වීම නිසා හොඳම ප්‍රාගුණ්‍යයන් බෙදා හදා ගැනීමද, විසංධි කිරීම් වලක්වමින් හිඟ මුදල් අය කර ගැනීම හා දීර්ඝ කාලයක් මුළුල්ලේ හිඟ හිට තිබෙන හිඟ මුදල් අය කර ගැනීමේ අවශ්‍යතාවය අවධාරණය කිරීමද කළ හැකි විය.

ගණුදෙනුකරුවා වෙත වඩාත් හොඳින් සේවය සැපැයීම

ප්‍රධාන කාර්යාලයේ ජල බිල් පත් ගෙවීම් භාරගනු ලබන්නේ මුදල් අයකැමි විසිනි. ගණුදෙනුකාර තෘප්තිය වැඩි දියුණු කිරීම සඳහා එම ගොඩනැගිල්ල නව්‍යකරණය කොට "ගණුදෙනුකාර සේවා මධ්‍යස්ථානය" යනුවෙන් නම් කරන ලදි. බිල පියවීමට පෙර "ස්වයං ආධාර මැදිරිය" භාවිතා කරමින් තමන් විසින් ගෙවීමට ඇති ශේෂය පිරික්සා දැන ගැනීමේ හැකියාව ගණුදෙනුකරුවන්ට තිබෙන අතර, කිසියම් පරීක්ෂා කිරීමක් අවශ්‍ය නම් හෝ පැමිණිල්ලක් කිරීමට තිබේනම් එය ගණුදෙනුකාර සේවා මේසයේදී කර ගත හැකි වේ. ගණුදෙනුකරුවන් වෙත සේවය සපයනු ලබන්නේ පෝලිම් කළමනාකරණ ක්‍රමයකින් යුත්, රූපවාහිනී විනෝදාශ්වාදය, ප්‍රමාණවත් හිඳ ගැනීමේ පහසුකම් හා පානීය ජල පහසුකම් සහිත වායු සමනය කර ඇති ගණුදෙනුකාර හිතකාමී පරිසරයක් තුළය. මෙම ආකෘතිය කලාපයන් සියළුම කලාපයන් වලට හඳුන්වා දීමට කටයුතු කරනු ලැබේ.

හිඟ මුදල් අය කර ගැනීම

මණ්ඩලයේ ආදායම් උත්පාදනය වැඩි කළ යුතු විය. විසංධි කරනු ලැබ ඇති පරිශ්‍රයන්ගෙන් අය විය යුතු දීර්ඝ කාලීන හිඟ මුදල් අය කර ගැනීම සඳහා අතිරේක ප්‍රයත්නයන් දරන ලදි. රුපියල් 100,000.00 හා රුපියල් 200,000.00 ඉක්මවා ගොස් ඇති හිඟ මුදල් ප්‍රමාණයන් අය කර ගැනීම සඳහා විශේෂ වැඩ සටහනක් ආරම්භ කරන ලද අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් රුපියල් මිලියන 7.34 ක හිඟ මුදලක් අය කර ගැනීමේ හැකියාව ලැබිණි. කොළඹ ප්‍රදේශය හාර නියෝජ්‍ය පොලිස්පතිවරයා සමග විශේෂ රැස්වීමක් පවත්වන ලද අතර ඒ හරහා ප්‍රවර්තන හිඟ මුදල් හා බොහෝ කාලයක් මුළුල්ලේ හිඟ හිට තිබුණ මුදල් අය කර ගැනීමේ මාර්ගය පෑදිනි. 2003 වර්ෂයේ සිට ඉතා දීර්ඝ කාලයක් මුළුල්ලේ හිඟ හිට තිබි මුදල් අය කර ගැනීමට හැකි වීම සැලැකිය යුතු කාරණයකි. රුපියල් මිලියන 10.1 ක විශාල හිඟ මුදලක් කොටස් වශයෙන් අය කර ගැනීමේ පදනම මත අය කර ගනිමින් පවතී. විසංධි කරනු ලැබ ඇති ගණුදෙනු කරුවන්ගෙන් අතිරේක ආදායම් එකතු කර ගැනීමට විවිධ ක්‍රමෝපායයන් යොදා ගැනීමෙහි ලා සියළුම කලාපීය කාර්යාලයන් විසින් ප්‍රධාන භූමිකාවක් ක්‍රියාත්මක කරන ලදි.

කාර්ය සාධනය නංවා ලීම හා ඵලදායිතාවය වැඩි දියුණු කිරීම

කාර්ය මණ්ඩලය සමග පවත්වනු ලබන මාසික ප්‍රගති සමාලෝචන රැස්වීම, දීප ව්‍යාප්ත වාණිජ කළමනාකරුවන්ගේ මාසික රැස්වීම හා හය මසකට වරක් පවත්වනු ලබන අනු අංශ කාර්ය මණ්ඩල රැස්වීම කාර්ය සාධනය නංවා ලීම කෙරෙහි අවධානය යොමු කරමින් පවත්වනු ලබන නිත්‍ය රැස්වීම් වශයෙන් පවත්වන ලදි. කාර්ය සාධනයේදී තමන්ට මුහුණ පෑමට සිදු වන බාධාවන් පිළිබඳව සාකච්ඡා කිරීමට කාර්ය මණ්ඩල සාමාජිකයින්ට අවසර ලබා දෙන ලද අතර එම ගැටළු වෙනුවෙන් විසඳුම් ලබා දෙන ලදි. පෙර වර්ෂයන් හා සසඳා බලන විට ආදායම් රැස් කිරීමේ, ආසන්න වශයෙන් 0.67 දක්වා ණය අඩු කිරීමේ, විසංධි කරන ලද පරිශ්‍රයන්ගෙන් හිඟ මුදල් අය කර ගැනීමේ සහ මූල්‍ය අංශය වෙත විශ්වාසදායක තොරතුරු සම්ප්‍රේෂණය කිරීමේ ද සැලැකිය යුතු වැඩි දියුණුවක් සිදු වී ඇත.

2017 මාර්තු මාසයේදී පවත්වන ලද ලෝක ජල දින උත්සවයේදී "ප්‍රධාන කාර්යාලය තුළ හා අවට කාර්යාලයන්හි 5 S සංකල්පය ක්‍රියාත්මක කිරීම" යන කාණ්ඩය යටතේ වූ ප්‍රථම ස්ථානය ප්‍රධාන කාර්යාලයේ වාණිජ අංශය විසින් දිනා ගන්නා ලදි.

ඵලදායිතාවය වැඩි දියුණු කිරීම සඳහා අවධානය යොමු විය යුතු අංශයන් හඳුනා ගැනීම පිණිස කාර්ය මණ්ඩලයේ හරස් කඩක් සමග කුඩා කණ්ඩායම් සාකච්ඡා පවත්වන ලදි. කාර්ය කණ්ඩායම විසින් ඉදිරිපත් කරන ලද යෝජනාවන් සාකච්ඡා කරන ලද අතර පුහුණු කිරීම් හා දැන උගත් පුද්ගලයින් වෙත ප්‍රවේශ වීමට ඔවුනට හැකියාව ඇති කිරීම මගින් ඔවුන්ගේ කුසලතාවයන් නංවා ලීමට අවශ්‍ය පියවර ගන්නා ලදි. දැනුම බෙදා හදා ගැනීම හරහා බොහෝ ගැටළු අබිභවා යාමට හැකි විය. මෙම අංශයේ වැඩ කටයුතු බොහෝ සෙයින් පරිගණකය මත රඳා පවත්නා හෙයින් සුළු පරිගණක ගැටළු කාර්ය සාධනය ඉදිරියේ ඇති බාධාවක් වශයෙන් හඳුනාගන්නා ලදි. සියළුම කාර්ය මණ්ඩල සාමාජිකයින් ඕනෑම පොදු ක්‍රියාකාරකමකට දායක වන හා සියළු දෙනාගේ මතයන්ට හිමි විය යුතු පිලිගැනීම ලැබෙන සහභාගිත්ව කළමනාකරණය සියළුම ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් ධෛර්යමත් කරන ලදි.

මෙම වර්ෂය තුළදී කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ කුසලතා වැඩි දියුණු කිරීම සඳහා සියළුම කාර්ය මණ්ඩල කාණ්ඩයන් ආවරණය වන පරිදි ඉලක්ක කණ්ඩායම් වෙනුවෙන් බොහෝ පුහුණු වැඩ සටහන් පවත්වන ලදි. (සම්පූර්ණ වශයෙන් සැසි 86 ක් පවත්වන ලද අතර සෑම කාර්ය මණ්ඩල සාමාජිකයකුටම 2.5 ක සාමාන්‍යයකි). එම සැසි වලින් සමහරක් නම් : වාණිජ අංශයේ සියළුම නිලධාරීන් වෙනුවෙන් පවත්වන ලද "ඵලදායක බහු මාධ්‍ය ඉදිරිපත් කිරීමක් නිර්මාණය කිරීම හා ඉදිරිපත් කිරීම" යන මැයින් වූ සැසිය සහ ගණුදෙනුකරුවන් වෙත සපයන සේවයේ උත්කෘෂ්ඨ භාවය, විනය ක්‍රියා පටිපාටීන් හා ඵලදායිතාවය නංවා ලීම සඳහා වූ ධනාත්මක චින්තනය සම්බන්ධයෙන් පවත්වන ලද වැඩ මුළුවයි.

කඳාන ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාර පරිශ්‍රයේදී අංශයේ සියළුම කාර්ය මණ්ඩල සාමාජිකයින් වෙත බැහැරට යන (outbound) පුහුණුවක් ලබා දුන් අතර එහිදී එහි ප්‍රධාන විෂය පථය වූ කණ්ඩායම් වැඩ වලට අවශ්‍ය කුසලතා වැඩි දියුණු කිරීමට අමතරව එකිනෙකා සමග අන්තර්ක්‍රියා කිරීමේ හොඳ අවස්ථාවක් කාර්ය මණ්ඩල සාමාජිකයින් වෙත ලැබිණි. එසේම යන්ත්‍රාගාරය වෙත ගිය ගමන

ප්‍රාග්ධන සූක්ෂ්ම ජල ප්‍රතිකාරක ක්‍රියාවලිය පිළිබඳ වඩාත් හොඳ අවබෝධයක් ලබා ගැනීමේ අවස්ථාවද ඔවුනට ලබා දුන්නේය.

සියළුම කාර්ය මණ්ඩල සාමාජිකයින් 2017 දෙසැම්බර් 28 වැනි දින රණවිරු ඇඟළුම් කර්මාන්ත ශාලාව නැරඹීමට ගියහ. මෙම ඇඟළුම් කර්මාන්ත ශාලාව ශ්‍රී ලංකා යුද හමුදාව විසින් කළමනාකරණය කරනු ලබන අතර ආබාධිත සෙබළුන් එහි නිෂ්පාදන කටයුතු වලට සහභාගි වෙති. මෙම කර්මාන්ත ශාලාව විසින් බොහෝ ඵලදායිතා තත්‍යාගයන් දිනනු ලැබ ඇති අතර ඵලදායිතාවය දියුණු කර ගැනීමේ ක්‍රම පිළිබඳ පාඩම් උගෙනීමට යා යුතු ස්ථානයන්ගෙන් එක් ස්ථානයක් මෙන් මෙම කර්මාන්ත ශාලාව නිර්දේශ කරනු ලැබ ඇත.

දිප ව්‍යාප්ත සියළුම වාණිජ අංශ නිලධාරීන්ගේ හැකියා වර්ධනය කිරීම

වාණිජ අංශයේ නිලධාරීන්ගේ පුහුණු අවශ්‍යතා හඳුනාගනු ලබන අතර පුහුණු කිරීම් මධ්‍යස්ථානය මගින් ඔවුන් වෙනුවෙන් සුදුසු පුහුණු වැඩසටහන් සකස් කිරීම කරනු ලැබේ. ප්‍රස්තුත වර්ෂය තුළදී වඩාත් හොඳින් සේවය කිරීම සඳහා ධනාත්මක චින්තනය, ගණුදෙනුකරුවන් වෙත සපයන සේවාවේ උත්කෘෂ්ඨ භාවය පිළිබඳ වැඩමුළුව "සේවයේ උත්කෘෂ්ඨ භාවය කරා : රාජ්‍ය අංශයේ සංවිධානයක් තුළ ගණුදෙනුකාර සම්බන්ධතා කළමනාකරණය කිරීම", ඵලදායක බහු මාධ්‍ය ඉදිරිපත් කිරීමක් නිර්මාණය කිරීම හා ඉදිරිපත් කිරීම, අයවැය ලේඛන පිළියෙල කිරීම, වාණිජ චක්‍රලේඛ පිළිබඳ දැනුවත්භාවය, සහ "වාණිජ මෙහෙයුම් කළමනාකරණය" පිළිබඳ නිරන්තර යාවත්කාලීන කිරීම යනාදී වැඩසටහන් ආරම්භ කොට මෙහෙයවන ලදි.

පුහුණු අවශ්‍යතා හඳුනාගැනීම

මණ්ඩලයේ සේවයේ යෙදී සිටින විවිධ මට්ටම් වල වාණිජ කාර්ය මණ්ඩල සාමාජිකයින්ට ලැබිය යුතු පුහුණුව පිළිබඳව පුහුණු කිරීම් අංශය දැනුවත් කරනු ලැබ ඇත. ලබා දිය යුතු පුහුණුවේ ස්වභාවය හා ඒ සඳහා පුහුණු කරුවන් වශයෙන් සුදුසුයැයි හඳුනාගනු ලැබ ඇති අභ්‍යන්තර සම්පත්ධාරීන් පිළිබඳ තොරතුරුද එම අංශය වෙත දැනුම් දෙනු ලැබ ඇත. ඒ අනුව විවිධ කලාපීය සහාය සේවා මධ්‍යස්ථානයන්ට අනුයුක්ත කාර්ය මණ්ඩල සාමාජිකයින් වෙත පුහුණුව ලබා දෙනු ලැබ ඇත.

වෙනස් වන ප්‍රවණතාවයන් සමග කරට කර සිටීම සඳහා විවිධ මට්ටම් වල කාර්ය මණ්ඩල සාමාජිකයින් වෙත පුහුණුව ලබා දීම අවශ්‍ය වන අතර එළඹෙන 2018 වර්ෂය තුළදී සැලැකිල්ලට ගැනීම සඳහා හඳුනාගනු ලැබ ඇති පුහුණු අවශ්‍යතාවයන් පුහුණු කිරීම් අංශය වෙත දැනුම් දී ඇත. අදාල කාර්ය මණ්ඩල සාමාජික වර්ගයන්ට වාණිජ නිලධාරීන්, වාණිජ සහායකයින්, වාණිජ ලිපිකරුවන්, කළමනාකරණ සහායකයින්, රියැදුරන් හා කාර්යාල කාර්ය සහායක වරුන් ආදීන් ඇතුලත් වේ.

ගණුදෙනුකාර දැනුවත්භාවය

"තිරසර යුගයක හරිත උදානය" නම් වූ ප්‍රදර්ශනයේ ප්‍රදර්ශන කුටියක් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙනුවෙන් වෙන් කරනු ලැබ තිබි අතර එහිදී වාණිජ අංශයේ කාර්ය මණ්ඩල සාමාජිකයින් විසින් ජල ප්‍රතිකාරක ක්‍රියාවලිය, ජලය පවිත්‍ර කිරීමට වැය වන පිරිවැය හා ජල ගාස්තු පිළියෙල කරන ආකාරය පිළිබඳව සාමාන්‍ය ජනතාව දැනුවත් කිරීමට පියවර ගනු ලැබිණි.

ග්‍රාමීය ජල සම්පාදනය හා සනීපාරක්ෂණය

ග්‍රාමීය ජල සම්පාදන හා සනීපාරක්ෂණ අංශයේ කාර්ය සාධනය හා ප්‍රධාන ක්‍රියාකාරකම්

2017 මාර්තු මස 22 වැනි දින "ජලය නාස්ති කරන්නේ ඇයි ?" යන තේමාව යටතේ නෙළුම් පොකුණ රඟ හලේදී 2017 ලෝක ජල දිනයට සමාන්තර ලෙස පවත්වන්නට යෙදුන බොහෝ ඉසවු වලදී ග්‍රාමීය ජල සම්පාදන හා සනීපාරක්ෂණ අංශය විසින් ප්‍රධාන සහායක භූමිකාවක් ඉටු කරන ලදි. ප්‍රධාන උත්සවයට සමාන්තර ලෙස හොඳම ප්‍රජා මූල සංවිධාන ප්‍රතිකාරක යන්ත්‍රාගාරය තෝරා ගැනීමට සැලැසුම් කොට ඒ සඳහා සියළුම දිස්ත්‍රික්ක වෙත ගොස් පරීක්ෂා කොට බලා ග්‍රාමීය ජල සම්පාදන හා සනීපාරක්ෂණ අංශය විසින් හොඳම යෝජනා ක්‍රමයන් තුන තෝරාගන්නා ලදි. මීට අමතර ලෙස 2017 පර්යේෂණ හා අධ්‍යයන සම්මන්ත්‍රණය වෙනුවෙන් ද, පාසැල් දරුවන් අතර පවත්වන ලද ගායන, චිත්‍ර හා රචනා තරඟයට හා ප්‍රධාන උත්සවයේදී සඟරාවක් දියත් කිරීමටද ප්‍රධාන සහායක් ග්‍රාමීය ජල සම්පාදන හා සනීපාරක්ෂණ අංශය විසින් ලබා දෙන ලදි.

2017 ලෝක ජල දිනයට සමාන්තර වශයෙන් ප්‍රජා මූල සංවිධාන වැඩ බිම් නිරීක්ෂණය සඳහා යාම හා දැනුවත් භාවය නංවා ලීමේ වැඩ සටහන් මෙහෙයවීමත්, සුගතදාස ගෘහස්ත ක්‍රීඩාංගනය තුළ පවත්වන ලද "සුපැන් ප්‍රජා අභිමානී" නම් වූ ප්‍රජා මූල සංවිධාන සමුළු රැස්වීම පැවැත්වීමත් (රත්නපුර, කුරුණෑගල හා කළුතර දිස්ත්‍රික්කයන් ඇතුළු) දිස්ත්‍රික්ක කිහිපයක් වෙත ගොස් ග්‍රාමීය ජල සම්පාදන හා සනීපාරක්ෂණ දත්ත සමුදාය යාවත්කාලීන කිරීම සඳහා අවශ්‍ය දත්ත රැස් කිරීම හා දත්ත සමුදාය සම්පූර්ණ කිරීමද 2017 වර්ෂය තුළදී ක්‍රියාත්මක කරන ලදි. ක්‍රියාත්මක කරන ලද අනිකුත් කටයුතු අතර පුනරුත්ථාපන ක්‍රියාකාරකම් වල යෙදීම, ජලාධර ප්‍රදේශ වැඩි දියුණු කිරීම, රදීවිට ප්‍රජා මූල සංවිධානය තුළ දැනුවත් භාවය නංවා ලීමේ වැඩ සටහනක් පැවැත්වීම හා ග්‍රාමීය ජල සම්පාදන හා සනීපාරක්ෂණ අංශය තුළ ඵලදායිතාවය නංවා ලීමේ වැඩ සටහනක් දියත් කිරීම පිණිස ක්‍රියාත්මක සැලැස්මක් පිළියෙල කිරීම ද විය. මීට අමතරව, දිස්ත්‍රික්ක 7 ක් තුළ ක්‍රියාත්මක වන ලෝක බැංකු ව්‍යාපෘතීන් සඳහා සහාය දීමේ ප්‍රධාන භූමිකාවක් ද ක්‍රියාත්මක කරන ලදි.

ග්‍රාම නිලධාරී වසම් වල නම්ද සහිතව සංඛ්‍යංක සිතියම් පිළියෙල කරන ලද අතර, ඒවා ග්‍රාමීය ජල සම්පාදන හා සනීපාරක්ෂණ අංශයේ වෙබ් අඩවිය තුළට ඇතුළු කරනු ලැබ ඇත. ජල සුරක්ෂිතතා සැලැසුම් පිළිබඳව සිංහල හා ඉංග්‍රීසි භාෂා වලින් පිළියෙල කොට තව දුරටත් සංවර්ධනය කරන ලද පෝස්ටර තුනක් ද්‍රවිඩ භාෂාවට පරිවර්තනය කිරීම හා ඊට අමතරව ග්‍රාමීය ජල සම්පාදන හා සනීපාරක්ෂණ අංශයේ දැනුවත් භාවය නංවා ලීමේ වැඩ සටහන් වලදී භාවිතා කිරීම පිණිස අධ්‍යාපනික වීඩියෝ තැටි වලට සිංහල උප ශීර්ෂ යොදන ලදි. ප්‍රජා මූල ජල සම්පාදනය සඳහා සංඛ්‍යා ලේඛනාත්මක මග පෙන්වීම් ග්‍රන්ථයක්ද දියත් කරන ලදි.

සනීපාරක්ෂණය සම්බන්ධ දකුණු ආසියානු සමුළුව (SACOSAN) ක්‍රියාකාරකම් වල ප්‍රගතිය පසු විපරම් කිරීම සඳහා වූ 9 වැනි අන්තර් දේශීය කාර්ය කණ්ඩායමේ රැස්වීම මාලදිවයිනේදී පවත්වනු ලැබීය. දැනුම කළමනාකරණය කිරීමේ හා ජාලකරණය කිරීමේ කේන්ද්‍රය වශයෙන් සනීපාරක්ෂණය සඳහා වූ කලාපීය මධ්‍යස්ථානය ශ්‍රී ලංකාව තුළ ස්ථාපනය කරන ලදි.

දත්ත රැස් කිරීමේ මාර්ගයන් වැඩි වැඩියෙන් විවෘත කිරීමට හා දත්ත යාවත්කාලීන කිරීම වේගවත් කිරීමට ද පියවර ගනු ලැබූ අතර ඒ හේතුවෙන් දත්ත සමුදායේ පූර්ණත්වය වැඩි දියුණු කිරීමට හැකියාව ලැබිණි. 2017 වර්ෂයේ අවසානය වන විට රැස් කරනු ලැබ තිබි දත්ත අනුව ප්‍රජා මූල සංවිධානයන් විසින් සපයනු ලබන නල ජල ආවරණය 10.5% ක තත්ත්වයට පත්ව ඇත. ග්‍රාමීය ජල සම්පාදන හා සනීපාරක්ෂණ අංශයේ nwsdbrws.org වෙබ් අඩවියට නව අංගයන් කිහිපයක් එකතු කරන ලදි.

ජනතාව දැනුවත් කිරීමේ වැඩ සටහන

මහජන සම්බන්ධතා ඒකකය විසින් ගණුදෙනුකාර කණ්ඩායම්, පාසැල් දරුවන් හා පාරිභෝගික සමිති ඉලක්ක කර ගනිමින් විවිධ අධ්‍යාපනික හා දැනුවත් භාවය නංවා ලීමේ වැඩ සටහන් දියත් කරන ලදි. ඒවායේ ප්‍රධාන අවධානය යොමු කරන ලද්දේ ජල සංරක්ෂණය කෙරෙහි හා පාරිසරික අංශයන් කෙරෙහිත්, එමෙන්ම ජලාශයන් ආරක්ෂා කර ගැනීම ආදිය කෙරෙහිත් වේ. මෙම වැඩ පිළිවෙල මුළු රට පුරාම ක්‍රියාත්මක කරන ලදි. පාසැල් තුළ ක්‍රියාත්මක කරන ලද වැඩ සටහන් සංඛ්‍යාව 35 ක් වන අතර රජයේ ආයතනයන් තුළ හා පෞද්ගලික අංශයේ ආයතනයන් තුළ ක්‍රියාත්මක කරන ලද වැඩ සටහන් සංඛ්‍යාව 10 කි.

2017 ලෝක ජල දිනය සැමැරීම සඳහා විවිධ ඉසව් පවත්වන ලදි. පාසැල් ළමුන් වෙනුවෙන් නාට්‍ය, චිත්‍ර හා රචනා තරඟයන් පවත්වන ලදි.

2017 ලෝක ජල දිනය

මහජන සම්බන්ධතා ඒකකය ජලය හා සමබන්ධ බොහෝ පැතිකඩ පිළිබඳව ඉලක්ක කණ්ඩායම වෙත අධ්‍යාපනය ලබා දීම පිණිස වාර ප්‍රකාශන පළ කිරීමෙහි යෙදුනේය. එම "ජලය" නමැති සඟරාවේ නිකුතු තුනක් 2017 වර්ෂයේ මාර්තු, ජුනි හා දෙසැම්බර් මාසයන් තුළදී පළ කරන ලද්දේය.

මහජන සම්බන්ධතා ඒකකය විද්‍යුත් හා මුද්‍රිත යන මාධ්‍යයන් දෙකෙහිම මාධ්‍ය බිහි දොර මගින් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ යථා තත්ත්වය පිළිබඳව මහා ජනතාව දැනුවත් කිරීමේ කර්තව්‍යයෙහි ද යෙදී සිටියේය. කාර්යාලයේ විවාදගත කාරණයන් පිළිබඳව ඉහල කළමනාකරණය විසින් කරුණු ඉදිරිපත් කර සිටින ලදි. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ විවෘත කිරීමේ උත්සවයන් පිළිබඳ තොරතුරු ද මාධ්‍ය හරහා සපයන ලද්දේය. එම පරමාර්ථය උදෙසාම අතිරේක පුවත් පත් ලිපි පිළියෙල කරන ලදි. මහියංගනයේ හා මහනුවර ජංගම ජල සේවාවන් පැවැත්වීම හා අදාලව ද මාධ්‍යයන් දැනුවත් කරන ලදි. ක්‍රෙඩිට් කාඩ් පත් සම්බන්ධ දැනුවත් කිරීම් ද සපයනු ලැබිණි. මහ ජනතාව හෝ ජල පාරිභෝගිකයින් විසින් මතු කරන ලද විවිධ ගැටළුකාරී තත්ත්වයන් පිළිබඳව ක්ෂණික ක්‍රියා මාර්ග ගැනීමේ කර්තව්‍යය මෙන්ම මුළු රට පුරාම සිටින පාසැල් ශිෂ්‍යයින්ගේ දැනුම වර්ධනය කිරීම සඳහා ලබා දෙන ලද මග පෙන්වීම්ද වර්ෂය තුළ සිදු කරන ලද මහජන සේවාවන්ගේ ගණයෙහි ලා සැලැකිය හැකි වේ.

මහජන සම්බන්ධතා ඒකකය හා සම්බන්ධ සියළුම කාර්ය මණ්ඩල සාමාජිකයින් එකිනෙකා සමග සමීප ප්‍රිය මනාප සම්බන්ධතාවයෙන් යුතුව එකා මෙන් කටයුතු කරන අතර වැඩ කිරීමේ පරිසරය සියළු දෙනාටම හිතකාමී වේ.

භූගත ජලය.

භූගත ජල අංශය විසින් ප්‍රධාන වශයෙන්ම කරනු ලබන්නේ නාගරික, අර්ධ නාගරික හා ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රමයන් වෙත ජල සම්පාදන පහසුකම් සපයා දීම සඳහා භූගත ජල සංවර්ධන ක්‍රියාකාරකම් වල යෙදී සිටීමය. 2017 වර්ෂය තුළදී භූගත ජල අංශය විසින් ඉටු කරන ලද එවැනි ක්‍රියාකාරකම් බොහෝ සංඛ්‍යාවක් තිබේ. ජල භූ විද්‍යාත්මක සමීක්ෂණයන්, ගැඹුරු හා නොගැඹුරු මිහි විදමන් ඉදි කිරීම හා දීර්ඝ කාලීන භූගත ජල නිස්සාරණය සඳහා ළිං හා ජලධරයන් තක්සේරු කිරීම ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය සහ WASSIP ව්‍යාපෘතිය විසින් වර්ෂය තුළදී සිදු කරන ලදි. ඊට අමතරව, ගැඹුරු හා නොගැඹුරු මිහි විදමන් ළිං සෝදා හරිමින් සංවර්ධනය කිරීම, වක්සත් ජාතීන්ගේ ජාත්‍යන්තර ළමා අධ්‍යාපන අරමුදල (UNICEF) අරමුදල් යටතේ හා මහජන ඉල්ලීම් අනුව අළුත් අත් පොම්ප සවි කිරීම, වැකී අරමුදල්, පිබිදෙමු පොලොන්නරුව අරමුදල් හා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ නියං සහන ආධාර අරමුදල් යොදා ගනිමින් පොදු ඉල්ලීම් අනුව පොදු අත් පොම්ප නල ළිං අළුත්වැඩියා කිරීම හා පුනරුත්ථාපනය කිරීම, වක්සත් ජාතීන්ගේ ජාත්‍යන්තර ළමා අධ්‍යාපන අරමුදල (UNICEF) අරමුදල් යටතේ භූගත ජල අධ්‍යයනයන් අනුව අත් යන්ත්‍ර නල ළිං නඩත්තු කිරීම සඳහා තට්ටු තුනේ ක්‍රමය ක්‍රියාත්මක කිරීම සහ පසු විපරම් කිරීම හා ජල ප්‍රවාහ මැණීම ද 2017 වර්ෂය තුළදී ඉටු කරන ලද වෙනත් භූගත ජලය හා සම්බන්ධ ක්‍රියාකාරකම් වශයෙන් සැලකිය හැකි වේ.

වෙක්‍යයන් වශයෙන් ගත් කල භූ ජල විද්‍යාත්මක සමීක්ෂණයන් 797 ක් ද, ගැඹුරු හා නොගැඹුරු මිහි විදමන් විදීම් 296 ක් ද, සෝදා හරිමින් ළිං සංවර්ධනය කිරීම් 1189 ක් ද, නව අත් පොම්ප ස්ථාපිත කිරීම් 679 ක් ද, අත් පොම්ප නල ළිං අළුත්වැඩියා කොට පුනරුත්ථාපනය කිරීම් 2118 ක් ද, පොම්ප කිරීමේ පරීක්ෂණ 132 ක් ද, යුනිසෙෆ් අරමුදල් යටතේ තට්ටු තුනේ ක්‍රමය ක්‍රියාත්මක කිරීම හා සම්බන්ධ පුහුණු වැඩ සටහන් 7 ක් ද වර්ෂය තුළදී පවත්වනු ලැබ ඇත.

ඉහතින් සඳහන් කරන ලද ක්‍රියාකාරකම් යටතේ දැනට ක්‍රියාත්මක වෙමින් පවතින නල ජල සම්පාදන යෝජනා ක්‍රමයන්ගේ ප්‍රභව ධාරිතාවය භූගත ජලය එකතු කිරීම නිසා දිනකට ඝණ මීටර 7642 කින් වර්ධනය වී ඇත. කුරුණෑගල, මොණරාගල, වවුනියාව හා මන්නාරම දිස්ත්‍රික්කයන් තුළ දැනට ක්‍රියාත්මක වන පොදු අත් පොම්ප නල ළිං අළුත්වැඩියා කිරීම හා පුනරුත්ථාපනය කිරීම වක්සත් ජාතීන්ගේ ජාත්‍යන්තර ළමා අධ්‍යාපන අරමුදල (UNICEF) අරමුදල් යටතේ සිදු කරන ලද අතර පොලොන්නරුව හා අනුරාධපුර යන දිස්ත්‍රික්කයන්හි එම කටයුතු කිරීම සඳහා පිළිවෙලින් පිබිදෙමු පොලොන්නරුව අරමුදල් හා නියං සහන අරමුදල් යොදා ගන්නා ලදි.

භූගත ජල අංශයේ හැකියා වර්ධන වැඩ සටහන් වශයෙන් විවිධ අරමුදල් භාවිතා කරමින් අළුත් යන්ත්‍ර සූත්‍ර සපයන ලද අතර ඊට අමතර ලෙස භූගත ජල අංශයේ කාර්ය මණ්ඩල සාමාජිකයින් වෙත හා අදාල අනිකුත් අය වෙත පුහුණු පහසුකම් සලස්වන ලදි.

අංශයේ නව අනාගත අවධානය යොමු වන්නේ භූගත ජලය පදනම් වූ ජල සම්පාදන යෝජනා ක්‍රමයන් අබන්ඩ ලෙස පසුවිපරම් කිරීමට භාජනය කිරීම කෙරෙහිත්, ජල සුරක්ෂිතතා සැලැසුම් පිළියෙල කිරීම කෙරෙහි හා අත්තනගලු ඔය ද්‍රෝණිය වෙනුවෙන් භූගත ජල ආදෘශ්‍යනයන් පිළියෙල කිරීම කෙරෙහි ද වේ.

බලශක්ති කළමනාකරණය

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ බලශක්ති කළමනාකරණය පිළිබඳව කටයුතු කරනු ලබන්නේ යාන්ත්‍රික හා විද්‍යුත් සේවා අංශය යටතේ ක්‍රියාත්මක වන බලශක්ති කළමනාකරණ ඒකකය විසින් වේ. බලශක්ති කළමනාකරණ ඒකකයට අමතරව යාන්ත්‍රික හා විද්‍යුත් සහාය සේවා අංශය, ප්‍රවාහන අංශය හා ගොඩනැගිලි නඩත්තු අංශය ද මෙම අංශය යටතේ ක්‍රියාත්මක වේ.

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් 2017 වර්ෂය තුළදී පරිභෝජනය කරන ලද විදුලි බලය සඳහා වූ පිරිවැය ආසන්න වශයෙන් රුපියල් මිලියන 4,120 ක් වූ අතර මේ අතුරින් 94% ක්, (එනම් රුපියල් මිලියන 3,935 ක්) වැය කරනු ලැබ ඇත්තේ ජලය නිෂ්පාදනය කිරීමට හා පොම්ප කිරීමට වේ. මල අපවහන පොම්ප කිරීමේ කටයුතු සඳහා විදුලි බලය වෙනුවෙන් රුපියල් මිලියන 48 ක් වැය කරනු ලැබ ඇත. මේ නිසා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය ලංකා විදුලි බල මණ්ඩලයේ ප්‍රධාන පාරිභෝගිකයා බවට පත් වී ඇත. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ විදුලි බලය පරිභෝජනය කිරීම අඩු කිරීම සඳහා 2004 වර්ෂයේදී බල ශක්ති සංරක්ෂණය කිරීමේ වැඩ සටහන හඳුන්වා දෙන ලද අතර එය ක්‍රම ක්‍රමයෙන් සෑහෙන ප්‍රගතියක් සාක්ෂාත් කරගෙන ඇත. පසු ගිය වර්ෂ කිහිපය මුළුල්ලේ ක්‍රියාකාරකම් ගුණාත්මක හා ප්‍රමාණාත්මක වශයෙන් උසස් මට්ටමක් දක්වා ඉහල ශ්‍රේණිගත කරනු ලැබ ඇත. යාන්ත්‍රික හා විද්‍යුත් සේවා අංශය පොම්ප කිරීමේ පද්ධතීන් සඳහා සියළුම ආකාරයන්ගේ බලශක්ති විගණනයන් පැවැත්වීමට මෙන්ම බලශක්ති කළමනාකරණ කාර්යයන් කිරීම සඳහා ද අවශ්‍ය බලශක්ති මැණීමේ උපකරණයන්ගෙන් පූර්ණ වශයෙන් සජ්ජිත වී ඇත. අය ක්‍රම වර්ග කිරීමේ දෝෂ නිදොස් කිරීමේත්, විද්‍යුත් හා යාන්ත්‍රික වැඩි දියුණු කිරීම් කාර්යයන් ඉටු කිරීමේ හා 2004 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා සම්පූර්ණ කරන ලද බලශක්ති සංරක්ෂණය කිරීමේ වැඩ සටහන් වලත් ප්‍රතිඵලයක් වශයෙන් ඉහල බලශක්ති හා පිරිවැය ඉතිරි වීමක් සිදු වී තිබේ. එසේම ප්‍රධාන ජාලකයෙන් ගනු ලබන බලශක්තිය අවම කිරීමේ අපේක්ෂාවෙන් බලශක්ති කළමනාකරණ ඒකකය විසින් සූර්ය බල ශක්ති ව්‍යාපෘතීන් කිහිපයක් ක්‍රියාත්මක කරමින් පවතී.

2017 වර්ෂය තුළදී බලශක්ති විගණනයන් විස්සක සංඛ්‍යාවක් ක්‍රියාත්මක කරන ලද අතර ඒ අතුරින් ව්‍යාපෘතීන් 15 ක් සම්පූර්ණ කරනු ලැබ ඇත. එම ව්‍යාපෘතීන් වල ප්‍රතිඵලයක් වශයෙන් රුපියල් මිලියන 17.81 ක පිරිවැය ඉතිරියක් සිදු වී ඇති අතර ඒ සඳහා වැය කරනු ලැබ ඇති මුදල රුපියල් මිලියන 84.19 කි. එසේම 2018 වර්ෂය තුළදී මෙවැනි නව ව්‍යාපෘතීන් 31 ක සංඛ්‍යාවක් ක්‍රියාත්මක කිරීමට ද තීරණය කරනු ලැබ ඇති අතර 2017 වර්ෂයේදී ක්‍රියාත්මක වෙමින් පැවැති ව්‍යාපෘතීන් ද ඇතුළුව මෙම ව්‍යාපෘතීන් වෙනුවෙන් යෝජිත පිරිවැය ආයෝජනය රුපියල් මිලියන 372 කි.

යාන්ත්‍රික හා විද්‍යුත් සහාය සේවා ඒකකය

මෙම අංශය යටතේ පහත සඳහන් කර්තව්‍යයන් ඉටු කරනු ලැබේ.

අ. යාන්ත්‍රික හා විද්‍යුත් අංශයට අදාල ටෙන්ඩර් ලේඛන හා වාහන, ජල මනු, මිණුම් උපකරණ හා වෙනත් යාන්ත්‍රික හා විද්‍යුත් උපකරණ වෙනුවෙන් පිරිවිතර පිළියෙල කිරීම.

ආ. මට්ටම් පසුවිපරම් පද්ධති සැපයීම, ස්ථාපිත කිරීම හා නඩත්තු කිරීම.

ප්‍රවාහන අංශය

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය සතුව වාහන 1822 ක සංඛ්‍යාවක් තිබෙන අතර එම වාහනයන්ට අදාල ආදායම් බලපත්‍ර, රක්ෂණ, හදිසි අනතුරු වලින් සිදු වන හානි අළුත්වැඩියා කිරීම් හා පැවරීම් ඇතුළු සියළුම පරිපාලන කටයුතු වෙනුවෙන් වග කීම දරන්නේ ප්‍රවාහන අංශයයි.

පරිශ්‍ර කළමනාකරණය

සම්පූර්ණ ප්‍රධාන කාර්යාල ගොඩ නැගිල්ලේ හා බඩෝවිට (නිල නිවාස 7 යි), සොයිසාපුර (B 20, B 23) අවිවාහක නිල නිවාස (නිල නිවාස 32 යි), සොයිසාපුර (C 23, C 24) නිල නිවාස (නිල නිවාස 16 යි), සොයිසාපුර අවිවාහක නිල නිවාස (නිල නිවාස 64 යි) හා රාවතාවත්ත නිල නිවාස 7 ඇතුළු සියළුම පරිශ්‍රයන්ට අදාල සියළුම අළුත්වැඩියා කටයුතු, නඩත්තු කටයුතු හා මෙහෙයුම් ක්‍රියාකාරකම් මෙම අංශය විසින් ඉටු කරනු ලැබේ.

සමාජ විද්‍යාත්මක ක්‍රියාකාරකම්

විශේෂ මෙහෙයුම් ක්‍රියාවලිය සලකා බැලීමේදී 2017 ජූනි සිට අගෝස්තු දක්වා සමාජ විද්‍යා අංශය විසින් මුළුමනින්ම සම්බන්ධීකරණය කරනු ලැබූ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සේවකයින් මුහුණ දුන් ගංවතුර හානි තක්සේරුව සැලැකිල්ලට ගැනීම වටනේය. අවසාන ප්‍රතිඵලය ලබා ගැනීම සඳහා ඒ වෙනුවෙන් පියවර මාලාවක් ගැනීමට සිදු වූ අතර, එකී අවසන් ප්‍රතිඵලය නිසා ආසන්න වශයෙන් සේවකයින් 160 කට මුහුණ පෑමට සිදු වූ නිවාස හා දේපල හානි වෙනුවෙන් වන්දි ගෙවීමට හැකි විය.

කලාපීය සහාය සේවා මධ්‍යස්ථානයන්ට අනුයුක්ත සමාජ විද්‍යාඥයින්ගේ සහාය ලබා ගනිමින් ආරම්භ කරන ලද බලශක්ති සංරක්ෂණ ක්‍රියාකාරකම් වලට මූලික වශයෙන් ඇතුලත් වුනේ ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩ සටහන් හා විසන්ධි කිරීමේ වැඩ සටහන් වේ. නැගෙනහිර කලාපීය සහාය සේවා මධ්‍යස්ථානයට අනුයුක්ත කලාපීය සමාජ විද්‍යාඥ වරයා විසින් එහි කාර්ය මණ්ඩල සාමාජිකයින්ද සමග එක් වී සෙයිවනගර් ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රමයට අයත් සම්බන්ධතාවයන් 433 ක් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත පවරා ගැනීමේ වැඩ සටහනක් දියත් කළේය. එසේම, නැගෙනහිර කලාපීය සේවා මධ්‍යස්ථානය විසින් පොදු විසංධි කිරීමේ වැඩ සටහනක් ක්‍රියාත්මක කරන ලද අතර ඊට අමතර ලෙස දෝෂ සහිත මනු වෙනුවට අළුත් මනු සවි කිරීමේ වැඩ සටහන පිළිබඳව දැනුවත් කිරීමේ වැඩ සටහනක් ත්‍රිකුණාමලයේ දියත් කරන ලදි. එහිදී විසංධි කරනු ලැබීමට භාජනය වූ පාරිභෝගිකයින් හමු වීම, ඔවුන් දැනුවත් කිරීම හා ශූන්‍ය බිල් පත් පිළිබඳ ගැටළුව සම්බන්ධයෙන් ද කටයුතු කරන ලදි. ඊට අමතර ලෙස කත්තන්කුඩි සෞඛ්‍ය වෛද්‍ය කාර්යාලයට අනුයුක්ත සියළුම සෞඛ්‍ය කාර්ය මණ්ඩල සාමාජිකයින් හා තෝරාගත් පාසැල් වල ශිෂ්‍ය ශිෂ්‍යාවන් වෙනුවෙන් "ජලයේ ගුණාත්මය, ගාස්තු ක්‍රමය හා ආදායම් රහිත ජලය අඩු කිරීම" පිළිබඳව දැනුවත් කිරීමේ වැඩ සටහනක් පැවැත්වීමට අවශ්‍ය සහාය ද ලබා දෙන ලදි.

සමාජ විද්‍යා අංශය විසින් ඉටු කරන ලද සංවර්ධන ක්‍රියාකාරකම් විශාල සංඛ්‍යාවක් වන අතර ඒවා විවිධත්වයකින් යුත් ඒවා වේ. ඒවා කිහිපයක් සඳහන් කරන්නේ නම්, දැනට ක්‍රියාත්මක වන ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රමයන් වැඩි දියුණු කිරීම හා ප්‍රජා මූල සංවිධානයන්හි හැකියා වර්ධන වැඩ සටහන් කලාපීය සමාජ විද්‍යාඥයින් විසින් ක්‍රියාත්මක කරන ලදි. 2017 වර්ෂය තුළදී ජල සුරක්ෂිතතා සැලැසුම් ක්‍රියාවලිය තුළ ඔවුන්ගේ සහභාගිත්වය පෙන්වා දිය හැකි වේ. ඒ තුළ ඉටු කරන ලද ක්‍රියාකාරකම් වලට කළු ගඟ ජලාධරය වෙනුවෙන් වූ බහු පරදුධාරී වැඩ සටහන තුළ මතු වූ ගැටළු පිළිබඳ වාර්තාව පිළියෙල කිරීම, ගණුදෙනුකාර තෘප්ති

සමීක්ෂණය, ජලාධර ආරක්ෂා කිරීමේ වැඩ සටහනේ ප්‍රගතිය පසු විපරම් කිරීම, WASSIP යටතේ පරදුධාරීන් වෙනුවෙන් දැනුවත් භාවය නංවා ලීමේ වැඩ සටහනක් සමායෝජනය කිරීම, ආපදා අඩු කිරීමේ වැඩ සටහන් හා ඒකාබද්ධ වීම හා මඩකලපුව ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රම 4 ක් වෙනුවෙන් වැඩි දියුණු කිරීමේ සැලැසුමක් පිළියෙල කිරීම, පාරදෙක ජල සම්පාදන යෝජනා ක්‍රමයට අයත් තුළු මුව ආරක්ෂා කිරීම සඳහා වැටක් ඉදි කිරීමට සහාය ලබා දීම හා මැදිරියේ රුක් රෝපන වැඩ සටහනක් සංවිධානය කිරීම ආදිය ඇතුළත් වේ. හඳුනා නොගත් හේතූන් නිසා ඇති වන නිදන්ගත වකුගඩු රෝගය වැලැක්වීමේ වැඩ සටහන යටතේ කල්කුඩාවේ හා මඩකලපුවේ පාසැල් සඳහා විලෝම ආශ්‍රැති යන්ත්‍රාගාර ලබා ගැනීම සඳහා වාර්තා පිළියෙල කොට ජනාධිපති ලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කිරීම සිදු කරන ලදි.

මීට අමතරව වතු අධිකාරීන් හා පරදුධාරීන් හමු වීම, සනීපාරක්ෂණය සම්බන්ධ දකුණු ආසියානු සමුළු (SACOSAN) වැඩ සටහන යටතේ ඉදි කරනු ලබන වැසිකිලි ඉදි කිරීමේ ප්‍රගතිය පසුවිපරම් කිරීම සඳහා වැඩ බිම් වලට යාම, ඉඩම් අත්පත් කර ගැනීම් පිළිබඳ අනුගාමී කටයුතු ඉටු කිරීම හා නැවත පදිංචි කිරීමේ සැලැසුම පිළියෙල කිරීම ආදී කටයුතු සිදු කරන ලදි.

ආයතන සංවර්ධන ක්‍රියාකාරකම් ගැන බලන විට, අධ්‍යයන වාර්තා, සංකල්ප පත්‍රිකා, කාර්ය පත්‍රිකා, යොමු නියමයන් හා අවබොධතා ගිවිසුම් ආදිය පිළියෙල කිරීම 2017 වර්ෂය තුළදී ප්‍රධාන කාර්යාලයේ සමාජ විද්‍යා අංශය විසින් ඉටු කරන ලදි. "නගර සඳහා වූ සනීපාරක්ෂණ හා ස්වස්ථතා ආරම්භක ක්‍රියා ව්‍යාපෘතිය (SHIFT) සඳහා භාවිතා කරන්නන්ගේ සහභාගිත්වය හා පරදුධාරීන්ගේ හවුල්කාරිත්වය" පිළිබඳ වාර්තා සකස් කිරීම, ජල හා සනීපාරක්ෂණ ව්‍යාපෘතීන් සඳහා වූ සහභාගිත්ව සංවර්ධන ක්‍රම, "බඩෝවිට ප්‍රදේශය සඳහා අපජල බැහැර කිරීමේ පද්ධතියක් ස්ථාපිත කිරීම පිළිබඳ සමාජ බල පෑම් තක්සේරු වාර්තාව" වැනි වාර්තා පිළියෙල කොට ප්‍රධාන කාර්යාලයේ පුස්තකාලය වෙත යැවීමට කටයුතු කරන ලදි. ස්ත්‍රී පුරුෂ සමාජ භාවය පිළිබඳ ක්‍රියාත්මක සැලැසුම හා ස්ත්‍රී පුරුෂ සමාජ භාවය පිළිබඳ කාරණා පසුවිපරම් කිරීමේ න්‍යාසය සැලැසුම් කොට පිළියෙල කිරීම සිදු කරන ලදි. ජල සම්පාදන හා සනීපාරක්ෂණ වැඩි දියුණු කිරීමේ (WASSIP) ව්‍යාපෘතියට අදාල දිස්ත්‍රික්කයන් තුළ සමාජය වෙත වැල්ල විය හැකි බලපෑම් පිළිබඳව සොයා බැලීමේ (social screening) වාර්තා සමාලෝචනය කොට අවසන් කරන ලද අතර, කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ පුහුණු අවශ්‍යතා හඳුනා ගැනීම සඳහා කුසලතා න්‍යාසය පිළියෙල කරන ලදි. තලෙයඩි සඳහා යෝජිත විලෝම ආශ්‍රැති යන්ත්‍රාගාරය සම්බන්ධයෙන් සමාජ බල පෑම් තක්සේරු වාර්තාව හා සමාජ පසුවිපරම් සැලැස්මද පිළියෙල කරන ලද අතර තලෙයඩි ධීවර කාර්මිකයින් වෙනුවෙන් පැවැත්වීමට යෝජිත සමාජ දැනුවත් කිරීමේ වැඩ සටහන වෙනුවෙන් වූ යොමු නියමයන් ද සම්පූර්ණ කරනු ලැබ ඇත.

ඵලදායිතාවය වැඩි දියුණු කිරීම සම්බන්ධයෙන් ගත් කල ඵලදායිතා සංවර්ධන වැඩ සටහන් සම්බන්ධීකරණය කිරීම හා අබන්ධ ලෙස ඒවා පවත්වාගෙන යාම පිළිබඳව සිය රාජකාරී ස්ථානයන්ට අදාලව ඒ ඒ සමාජ විද්‍යාඥයින් විසින් වාර්තා කරනු ලැබ ඇත. ඒ හැරුන විට වර්ෂය තුළ සාක්ෂාත් කරගෙන ඇති ප්‍රගතිය සොයා බැලීම පිණිස මාසික හා ත්‍රෛමාසික ක්‍රියාත්මක සැලැසුම් එක් තැන් කිරීම හරහා සමාජ විද්‍යාත්මක ක්‍රියාකාරකම් පසුවිපරම් කිරීම හා පාරිභෝගික පැමිණිළි හා මහජනයා විසින් ලිපි මගින් ඉදිරිපත් කරනු ලැබ ඇති ඉල්ලීම් සැලැකිල්ලට ගැනීම මගින් පාරිභෝගික පරීක්ෂණයන් සම්බන්ධව අනුගාමී ක්‍රියාමාර්ග ගැනීමත් අවධාරණය කළ හැකිය.

පාසලක පවත්වන ලද දැනුවත් කිරීමේ වැඩ සටහනක්.

ආදායම් නොලැබෙන ජලය අඩු කිරීම

නාගරික වූ ප්‍රදේශයන් වෙත ජලය සම්පාදනය කිරීමේ ප්‍රධාන ක්‍රමය වන්නේ නල ජල සම්පාදනය වන අතර ජල හානිය අවම මට්ටමක රඳවා තබා ගැනීම ප්‍රධාන කර්තව්‍යයකි. මේ හා සම්බන්ධ සමස්ත වගකීම ආදායම් රහිත ජල අංශය වෙත පැවරී ඇති අතර එම අංශය ආදායම් ජනනය කිරීමට දායක නොවන ජලය ඉතිරි කරගැනීමෙහි ලා විශාල කාර්ය භාරයක් ඉටු කිරීමෙහි යෙදී සිටියි. ආදායම් රහිත ජල අංශය ආදායම් රහිත ජලය පහල මට්ටමක රඳවා ගැනීම සඳහා බිල් නොකරනු ලබන ජල පරිභෝජනය කෙරෙහි අවධානය යොමු කරමින් හා ඒ අතර බටහිර මධ්‍යම කොට්ඨාශයේ නිවැසියන් වෙත විශ්වාසදායක ලෙස හා බාධා විරහිත ලෙස පානීය ජලය සම්පාදනය කරමින් හා ජල සම්පත සංරක්ෂණය කිරීමට පියවර ගනිමින් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (බටහිර මධ්‍යම) කොට්ඨාශය තුළ ක්‍රියාත්මක වෙයි.

1.හැඳින්වීම

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (බටහිර මධ්‍යම) ගේ පරිපාලනය යටතේ ක්‍රියාත්මක වන ආදායම් රහිත ජල අංශය ජල සම්පාදනය වැඩි දියුණු කිරීමත්, නොමිළයේ ජලය ලබා ගන්නා මාර්ගයන් නිසා ඇති වන පාඩු අඩු කරමින් ආදායම් ඉහල නැංවීමත්, අනවසර පරිභෝජනය අවම කිරීමත්, ප්‍රවාහ හා පීඩන මිනුම් කිරීම මගින් හා දිස්ත්‍රික් මනු හිඟ (DMAs) ස්ථාපිත කිරීම මගින් ආදායම් රහිත ජල පරිමාව ගණනය කිරීම හා පසු විපරම් කිරීමත් ඉලක්ක කර ගනිමින් කටයුතු කරයි.

ආදායම් රහිත ජල අංශය ක්‍රියාත්මක වන්නේ සහකාර සාමාන්‍යාධිකාරී (ආදායම් රහිත ජලය) ගේ හා ප්‍රධාන ඉංජිනේරු (නීති විරෝධී ක්‍රියා සොයාගැනීමේ ඒකකය) අධීක්ෂණය යටතේය. ආදායම් රහිත ජල ඒකකය හා රන්දිය ඒකකය ක්‍රියාත්මක වන්නේ කළමනාකරු (ආදායම් රහිත ජලය) යටතේ වන අතර නීති විරෝධී ක්‍රියා සොයාගැනීමේ ඒකකය ක්‍රියාත්මක වන්නේ ප්‍රධාන ඉංජිනේරු (නීති විරෝධී ක්‍රියා සොයාගැනීමේ ඒකකය) යටතේය.

ඵලදායී ආදායම් රහිත ජල කළමනාකරණයක් සඳහා ආදායම් රහිත ජලයේ ප්‍රධාන අංගයන් වෙන් කොට හඳුනා ගැනීම හා ආදායම් රහිත ජල මට්ටම ගණනය කිරීම සඳහා භාවිතා කරනු ලබන දත්තයන්ගේ නිරවද්‍යතාවය සහතික කිරීම ද අත්‍යවශ්‍ය වන්නේය.

2008 සිට 2017 දක්වා වූ කාල සීමාව ඇතුලත කොළඹ නගරයේ ආදායම් රහිත ජල පරිමාව 53.68% සිට 42.30% දක්වා අඩු කරනු ලැබ ඇති අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් ජල සම්පාදනය එම මට්ටමේම මෙන් පවත්වාගෙන යන අතර ජල අලෙවිය 23.05% කින් ඉහල ගොස් තිබේ. 2017 වර්ෂය තුළදී ආදායම් රහිත ජල පරිමාව අඩු වී ඇති අන්දම පිළිබඳ විස්තර අංක 1 දරන වගව පෙන්නුම් කරයි.

වගුව 1.

2017 වර්ෂයේ එක් එක් මාසය වෙනුවෙන් දත්ත සකස් කරන ලද අතර 2017 දෙසැම්බර් මාසය සඳහා දත්ත සකස් කරන ලද්දේ 2016 දෙසැම්බර් මාසය සඳහා වූ දත්ත සමග සංසන්දනාත්මකව වේ.

කොට්ඨාශය	**2016 දෙසැම්බර්**	**2017 දෙසැම්බර්**
කළමනාකරු (කෝට්ටේ)	26.85	27.27
කළමනාකරු (මහරගම)	17.10	16.13
කොළඹ නගරය	44.68	42.30
බටහිර මධ්‍යම	34.26	32.64
කළමනාකරු (කැළණිය)	18.62	17.40
කළමනාකරු (දෙහිවල)	24.36	22.91

බටහිර මධ්‍යම කොට්ඨාශයේ සැපැයුම හා පරිභෝජනය

ඝණ මීටර/මාසය		2016 දෙසැම්බර්	2017 දෙසැම්බර්
බටහිර මධ්‍යම	සපයන ලද ප්‍රමාණය	17.6	17.48
	අලෙවි කළ ප්‍රමාණය	11.6	11.77

2. සමිති සංවිධානය කිරීම, පොදු ජල සැපැයුම් ස්ථානයන් විසන්ධි කිරීම හා රන්දිය වැඩ සටහන යටතේ පෞද්ගලික ජල සම්පාදන සම්බන්ධතාවයන් සපයා දීම.

කොළඹ නගරය තුළ ඌණ සේවිත ජනාවාස පෙදෙස් 1571 ක් තිබෙන අතර ඒවා ආවරණය කිරීම සඳහා සහ නොමිළයේ ජලය නිකුත් කරනු ලබන ස්ථානයන්ට මනු සවි කිරීම පිණිස දැනටමත් සමිති 1778 ක් සංවිධානය කරනු ලැබ ඇත. සමිති සංවිධානය කිරීම හා ඒවායේ පරිභෝජන මට්ටම් පිළිබඳ විස්තර 2 වැනි වගුව මගින් පෙන්වනු ලබන අතර සම්බන්ධතා ලබා දීම හා පොදු ජල සැපැයුම් ස්ථානයන් විසන්ධි කිරීම පිළිබඳ විස්තර අංක 3 දරන වගුව මගින් පෙන්වා දෙනු ලබයි.

වගුව 2 : පාරිභෝගික සමිති සංවිධානය කිරීම

	2012	2013	2014	2015	2016	2017
බිල් කරන ලද සමිති	749	1,578	1,735	1,756	1,762	1,778
බිල් කරන ලද පරිභෝජනය (මසකට ඝණ මීටර)	91,844	166,103	159,445	147,923	135,282	120,807
ආදායම (මසකට රුපියල්)	312,732	576,609	624,438	584,933	478,796	432,171

වගුව 3 : සම්බන්ධතාවයන් සැපැයීම හා පොදු ජල සැපැයුම් ස්ථානයන් විසන්ධි කිරීම

	2012	2013	2014	2015	2016	2017
සපයන ලද සම්බන්ධතා සංඛ්‍යාව	817	948	528	54	110	131
විසන්ධි කරන ලද පොදු ජල සැපැයුම් ස්ථාන සංඛ්‍යාව	121	110	72	40	31	78

2017 වර්ෂයේදී ඌණ සේවිත ජනාවාසයන්හි වාසය කරනු ලබන වැසියන්ගේ ස්වස්ථතා තත්ත්වය හා ජීවන තත්ත්වය වැඩි දියුණු කිරීම සඳහා සහන ගාස්තු රේට් ප්‍රමාණයන් මත පෞද්ගලික සම්බන්ධතාවයන් 131 ක් සපයා දී පොදු ජල සැපැයුම් ස්ථානයන් 78 ක් විසන්ධි කරන ලදි.

3. අනවසර පරිභෝජනය අනාවරණය කර ගැනීම

නීති විරෝධී ලෙස ජලය පරිභෝජනය කිරීම් අනාවරණය කරගනු ලබන්නේ බටහිර මධ්‍යම කලාපයේ පරිශ්‍රයන් නිරන්තරයෙන් හා අහඹු ලෙස පරීක්ෂණයට භාජනය කිරීමෙන්, විසන්ධි කරනු ලැබ ඇති පරිශ්‍රයන් පරීක්ෂණයට භාජනය කිරීමෙන්, පැමිණිළි වෙත අවධානය යොමු කිරීමෙන්, විශාල වශයෙන් හිඟ හිටවා ඇති බිල් ලැයිස්තු පරීක්ෂණයට භාජනය කිරීමෙන්, ශූන්‍ය බිල් පත් පරීක්ෂණයට භාජනය කිරීමෙන් හා අඩු පරිභෝජනය හා ඇස්තමේන්තු කරන ලද බිල් පත් පරීක්ෂණයට භාජනය කිරීමෙනි.

මෙම වර්ෂය තුළදී අනවසර සම්බන්ධතාවයන් 1181 ක් අනාවරණය කරගනු ලැබ ඇති අතර රුපියල් මිලියන 41.62 ක මුදලක් අය කරගනු ලැබ ඇත. අනවසර සම්බන්ධතාවයන් අනාවරණය කර ගැනීම පිළිබඳ විස්තර 4 වැනි වගුව මගින් පෙන්වා දෙනු ලබයි.

වගුව 4 : අනවසර පරිභෝජනය අනාවරණය කර ගැනීම

	2012	2013	2014	2015	2016	2017
පරීක්ෂා කරන ලද පරිශ්‍රයන් සංඛ්‍යාව	13,619	13,343	12,812	12,250	13,417	9,654
අනාවරණය කරගැනීම් සංඛ්‍යාව	1,166	1,661	1,521	1,196	804	1,181

4. ආදායම් රහිත ජලය කළමනාකරණය කිරීම

ආදායම් රහිත ජලය ගණනය කිරීම සඳහා කොළඹ නගරය තුළ අර්බුදකාරී ප්‍රදේශයන් තෝරාගෙන වසන ලද මායිම් ස්ථාපිත කිරීමෙන් අනතුරුව ප්‍රදේශයේ තුළු ගැලීම් මිණුම් ගන්නා ලදි. දෘෂ්‍යමාන කාන්දු වීම් හඳුනා ගැනීම පිණිස රාත්‍රී සමීක්ෂණ, බෝක්කු සමීක්ෂණ හා ගෙන් ගෙට සමීක්ෂණ සිදු කරන ලදි. එම ප්‍රදේශයන්හි ආදායම් රහිත ජලයේ පරිමාව සැලැකිය යුතු මට්ටමකින් අඩු විය. එසේම ඉහත කී ක්‍රියාවලියට පහත සඳහන් ක්‍රියාකාරකම්ද ඇතුලත් විය :

- ජල කාන්දු වීම් හඳුනා ගැනීම
- ගලන හා පීඩන මිණුම් ගැනීම හා සනාථ කිරීම
- ආදායම් රහිත ජලය පිළිබඳව වෑල්ව හා නල පිහිටා ඇති ස්ථානයන් පසුවිපරමට භාජනය කිරීම
- භූගත තොරතුරු උපයෝජ්‍යතාවයන් නිශ්චය කිරීම
  - වෑල්ව පිහිටි ස්ථානයන් හඳුනා ගැනීම
  - භූගත ජල නල හඳුනා ගැනීම
- ජල කාන්දු සමීක්ෂණය

5. විදේශ අරමුදල් යොදාගනිමින් කරනු ලබන ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීම

මහ කොළඹ ජල හා අපජල කළමනාකරණය වැඩි දියුණු කිරීමේ ආයෝජන වැඩ සටහන ආසියානු සංවර්ධන බැංකුවේ මූල්‍ය සහාය සහිතව දැනට ක්‍රියාත්මක කෙරෙමින් පවතින අතර එයින් බලාපොරොත්තු වන්නේ කොළඹ නගරය තුළ ආදායම් රහිත ජලයේ මට්ටම 18% කට අඩුවෙන් පවත්වාගෙන යාමේ පරමාර්ථයෙන් අළුත් නල යොදා DMA/GIS පදනම මත වූ ආදායම් රහිත ජල කළමනාකරණ ක්‍රමයක් හඳුන්වා දී පැරණි ජල සම්පාදන ජාලය ප්‍රතිස්ථාපනය කිරීම වේ. නියමිත ආදායම් රහිත ජල ඉලක්කයන් සාක්ෂාත් කර ගැනීම පිණිස ව්‍යාපෘතිය විසින් ක්‍රියාත්මක කරනු ලබන ආදායම් රහිත ජල ක්‍රියාකාරකම් සමීප ලෙස පසුවිපරමට භාජනය කරනු ලැබේ.

6. ජයග්‍රහණයන්

- 2017 වර්ෂය තුළදී කොළඹ නගරයේ හා බටහිර මධ්‍යම කලාපීය සහාය සේවා මධ්‍යස්ථාන කොට්ඨාශයේ ආදායම් රහිත ජලයේ ප්‍රතිශතය පිළිවෙලින් 2.14% කින් හා 1.64% කින් අඩු වී ඇත.
- කොලොන්නාව ප්‍රදේශයේ DMA 4 ක් තුළ ආදායම් රහිත ජල ක්‍රියාකාරකම් ආරම්භ කරනු ලැබ ඇත.

සැපැයුම් හා ද්‍රව්‍ය කළමනාකරණය

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ක්‍රියාකාරකම් සමස්ත වශයෙන් මෙහෙයවීමේදී සැපැයුම් හා ද්‍රව්‍ය කළමනාකරණය වැදගත් ක්‍රියාකාරිත්වයන් වේ. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ මෙහෙයුම් සඳහා අවශ්‍ය වන්නා වූ ද්‍රව්‍ය බාධාවකින් තොරව ලබා ගැනීමේ හැකියාව තිබිය යුතු අතර එම අයිතමයන් ප්‍රතිසම්පාදනය කොට ගබඩා කිරීම සඳහා නිවැරදි මිළ දී ගැනුම් ප්‍රතිපත්තීන් හා ක්‍රියා පටිපාටීන් අනුගමනය කළ යුතු වන්නේය.

චීනයේ හා ඉන්දියාවේ ඇලුම් හා ලයිම් කර්මාන්ත ශාලාවන් වසා දැමීමේ තත්ත්වය යටතේ ඇතැම් රසායන ද්‍රව්‍ය ටෙන්ඩරයන් අවසන් කිරීමට සිදු වූ තත්ත්වයක් යටතේ වුවද 2017 වර්ෂය මුළුල්ලේම වෙනත් කිසිදු බාධාවකින් තොරව අවශ්‍ය රසායන ද්‍රව්‍ය සැපැයීමෙහි ලා සැපැයුම් හා ද්‍රව්‍ය කළමනාකරණ අංශය විසින් ගත් ප්‍රයත්නයන් බෙහෙවින් සාර්ථක විය. සැපැයුම් හා ද්‍රව්‍ය කළමනාකරණ අංශයේ අදාල කාර්ය මණ්ඩල සාමාජිකයින් විසින් වර්ෂය තුළදී දෙන ලද සියළුම නව සම්බන්ධතාවයන් වෙනුවෙන් සිය සහයෝගය ලබා දෙන ලද අතර ඊට අමතරව ඕනෑම අර්බුදකාරී තත්ත්වයකට මුහුණ දීම සඳහා ස්වාරක්ෂක තොගයක් ද පවත්වාගෙන ගියහ.

එය නගර සැලැසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය, මහා භාණ්ඩාගාරය, ශ්‍රී ලංකා රේගුව, බැංකු, ශ්‍රී ලංකා වරාය අධිකාරිය හා නැව් සමාගම් වැනි ආයතනයන් සමග සම්බන්ධීකරණය වෙමින් නැව් බඩු තොග 450 කට වැඩි සංඛ්‍යාවක් නිෂ්කාශනය කර ගැනීමේදී ඉහල ප්‍රමිතියක් පවත්වාගෙන ගියේය. තවද ප්‍රමාද ගාස්තු ගෙවීමෙන් වැලකීම සඳහා නිෂ්කාශන නියෝජිත උපචාරයන් හා අදාල ව්‍යාපෘති හා මෙහෙයුම් හා නඩත්තු කාර්යක්ෂමතාවය භාවිතා කරන ලදි. මීට අමතර ලෙස මිළ දී ගැනුම් ඇණවුම් 936 ක් හා දේශීය මිළ දී ගැනුම් වෙනුවෙන් ප්‍රදාන ලිපි 120 ක් ද නිකුත් කරන ලද අතර ඒවායේ අගය රුපියල් මිලියන 990 ක් විය.

තවද මෙම වර්ෂය තුළදී දිවයින පුරා පිහිටි කලාපීය සහාය සේවා මධ්‍යස්ථානයන් තුළ තිබී අතිරික්ත ද්‍රව්‍ය තොග නැවත බෙදා හැරීම තුළින් අළුතින් ද්‍රව්‍ය මිළයට නොගෙන රුපියල් මිලියන 100 කට අධික මුදලක් ඉතිරි කර ගැනීමටද අංශයට හැකි විය.

දිවයින පුරා පිහිටි තොග ගබඩා 336 ඉන්වෙන්ටරි කළමනාකරණ මෘදුකාංගයක් යොදා ගනිමින් සම්බන්ධ කිරීමේ ක්‍රියාවලියක් දැනට ක්‍රියාවට නැංවෙමින් තිබෙන අතර එය පියවරෙන් පියවර ක්‍රියාත්මක කරනු ලැබීමට නියමිතය. එය පූර්ණ වශයෙන් ක්‍රියාත්මක තත්ත්වයට පත් වන තෙක් අනිකුත් කලාපීය සහාය සේවා මධ්‍යස්ථානයන් සතුව ඇති අතිරික්ත හා භාවිතයට නොගන්නා ද්‍රව්‍ය, එවැනි ද්‍රව්‍ය අවශ්‍ය කරන කලාපීය සහාය සේවා මධ්‍යස්ථානයන් වෙත ලබා දීම සඳහා එවැනි අතිරික්ත හා භාවිතයට නොගන්නා තොග පිළිබඳව සොයා බැලීම පිණිස තොග කෙටි පණිවුඩ ක්‍රමයක් හඳුන්වා දෙනු ලැබ ඇත. මීට අමතරව, රුපියල් බිලියන 6.5 ක් වටිනා තොග විග්‍රහ කර බැලීම සඳහා තොරතුරු ලබා ගැනීමට කටයුතු කරන ලද අතර, එහිදී අනාවරණය කරගන්නා ලද්දේ ඒ අතුරින් රුපියල් බිලියන 1.8 ක් වටිනා තොග දැනට නිම කරනු ලැබ ඇති ව්‍යාපෘතීන්ගෙන් ශේෂ වී ඇති ද්‍රව්‍යයන් හා සුනාමි ආධාර හා එක්සත් ජාතීන් ළමා අරමුදලින් (UNICEF) ලැබුන ආධාර බවයි. ඊට අමතර ලෙස සියළුම ගබඩාවන් වටිනාකම් පදනම් කර ගනිමින් පහත සඳහන් ආකාරයට වර්ග 03 ක් යටතේ වර්ගීකරණය කිරීමට ද පියවර ගන්නා ලදි :

2016.12.31 වැනි දිනට තොග වටිනාකම් අනුව තොග ගබඩා වර්ගීකරණය කිරීම

වර්ගය	තොග ගබඩා සංඛ්‍යාව	තොග වටිනාකම (රුපියල්)	තොග වටිනාකමේ ප්‍රතිශතයක් (%) වශයෙන් වර්ගය	
A	65	4,976,546,757.07	රුපියල් මිලියන 25 කට වැඩි තොග වටිනාකම	76%
B	60	941,031,728.80	රුපියල් මිලියන 10 ක් හා රුපියල් 24,999,999.00 අතර තොග වටිනාකම.	14%
C	211	670,691,808.63	රුපියල් මිලියන 10 ට අඩු තොග වටිනාකම	10%
එකතුව	**336**	**6,588,270,294.50**		100%

2017 වර්ෂය තුළදී රුපියල් මිලියන 713 ක් වටිනා කොන්ත්‍රාත්තු ලේඛන 19 ක් පිළියෙල කරන ලදි. මේ වර්ෂය තුළදී ද සියළුම තොග ගබඩාවන්ගෙන් අනවශ්‍ය හා ප්‍රයෝජනයට ගත නොහැකි අයිතමයන් එක් රැස් කිරීමට පියවර ගන්නා ලද අතර එම ද්‍රව්‍යයන් විකිණීම සඳහා ටෙන්ඩර් කැඳවීම 2018 මාර්තු මාසයේදී කිරීමට අපේක්ෂා කරනු ලැබේ. 2017 වර්ෂයේදී ලෝක ජල දින සැමරුම් උත්සවය හා සමාන්තරව සංවිධානය කරන ලද වාර්ෂික ඵලදායිතා තරඟයේදී 4 වැනි ස්ථානය දිනා ගැනීමට මෙම අංශය සමත් විය. අය වැය වෙන් කිරීම් තුළ අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කර ගැනීමට සැපැයුම් හා ද්‍රව්‍ය කළමනාකරණ අංශයට හැකි වූ අතර අංශයේ සමස්ත කාර්ය සාධනය අපේක්ෂිත ඉලක්කයන්ට අනුව සිදු විය.

පර්යේෂණ හා සංවර්ධන අංශය

සංවර්ධන ක්‍රියාකාරකම්

මුරුන්කන් ද්‍රෝණියේ භූගත ජල ගතිකයන් පිළිබඳ පර්යේෂණය : මුරුන්කන් ළිං කෙෂ්ත්‍රය ඵලදායී ලෙස කළමනාකරණය කිරීම පිණිස පාරිසරික සමස්ථානික අධ්‍යයනයක්

මන්නාරම් දිස්ත්‍රික්කයේ ඉතාමත්ම වැදගත් ප්‍රභවය වන්නේ මුරුන්කන් අවසාදිත භූගත ජල ද්‍රෝණිය වේ. මතු පිට හා භූගත ජල නියැදීන් 45 ක මුළු සංඛ්‍යාවක් විශ්ලේෂණයට භාජනය කරමින් 2017 වර්ෂයේදී මෙම පර්යේෂණය නිම කරන ලදි. භූගත ජලයේ හා මතු පිට ජලාශයන්ගේ ජල මට්ටම් වෙනස් වීම හා භූගත ජලය පොම්ප කිරීම හේතුකොට ගෙන මුහුදු ජලය මිශ්‍ර වීමේ විභව හැකියාව අතර ඇති සම්බන්ධතාවය අවබෝධ කර ගැනීම සඳහා මෙම අධ්‍යයනය ඉතා වැදගත් වේ. තවද භූගත ජලය නැවත ආරෝපණය වීමට යෝධ වැවෙන් හා මල්වතු ඔයෙන් ලැබෙන දායකත්වය හා භූගත ජල නිස්සාරණය නිසා විභව ලෙස සිදු විය හැකි මුහුදු ජල ආක්‍රාන්තිය අවබෝධ කර ගැනීමට ද එය වැදගත් වේ. මුරුන්කන් ළිං කෙෂ්ත්‍රය වඩාත් හොඳින් කළමනාකරණය කිරීම සඳහා මෙම තොරතුරු අවශ්‍ය වේ. පර්යේෂණය වෙනුවෙන් වැය වූ සැබෑ පිරිවැය රුපියල් මිලියන 0.421 ක් විය.

නුවරඑලිය, වැලිමඩ හා බණ්ඩාරවෙල ප්‍රදේශයන්හි පානීය ජල ප්‍රභවයන් වල අන්තර්ගතව ඇති ඕර්ගැනෝක්ලෝරීන හා ඕර්ගැනෝෆොස්ෆේට් පලිබෝධනාශක අවශේෂයන් විශ්ලේෂණය කිරීම

ඉහල අස්වනු හා ලාභදායිතාවය පවත්වාගෙන යාම සඳහා ඉතා ඉහල මට්ටමින් පලිබෝධ නාශක භාවිතා කරමින් උඩරට තියුණු කඳු බෑවුම් වල පවත්වාගෙන යනු ලබන වීළවළු වගාවන් හා තේ වතු යායවල් විසින් ජලාශයන්හි ජල දූෂණය කෙරෙහි විශාල වශයෙන් දායක වනු ලැබේ. මෙම අධ්‍යයනයේ ප්‍රධාන ඉලක්කය වන්නේ නුවරඑලියේ, වැලිමඩ හා බණ්ඩාරවෙල තෝරාගත් ප්‍රදේශයන්හි පිහිටි ස්වාභාවික ජලාශයන් තුළ තැන්පත්ව ඇති පලිබෝධ නාශක අවශේෂයන් පිළිබඳව සොයා බැලීම හා එසේ සොයා ගනු ලබන තොරතුරු ජල දූෂණය වැලැක්වීම සඳහා යොදා ගැනීම වේ. නියැදි පරීක්ෂණ හා කෙෂ්ත්‍ර සමීක්ෂණයන් 2017 වර්ෂයේදී අවසන් කරන ලදි. දත්ත විශ්ලේෂණය, අවසන් නිගමනයන්ට එළඹීම හා වාර්තාව පිළියෙල කිරීම සිදු කිරීමට නියමිතය.

මොණරාගල දිස්ත්‍රික්කයේ බුත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ ප්‍රදේශය තුළ පිහිටි පොම්ප කිරීමේ ළිං වල හා ජලාධරයන්ගේ භූගත ජල අවදානම් තත්ත්වයන් තක්සේරු කිරීම

මොණරාගල දිස්ත්‍රික්කයේ බොහෝ ප්‍රදේශ වල ඇති ප්‍රධාන පානීය ජල ප්‍රභවයන්ගෙන් එකක් වන්නේ භූගත ජලයයි. මෙම අධ්‍යයනයේ ඉලක්කය වූයේ පොම්ප කිරීමේ ළිං වල ජලයේ ගුණාත්මය හා පරිමාව තිරසාර ලෙස පවත්වා ගැනීම පිණිස අවදානම් තත්ත්වයන් අවම කිරීම සඳහා නිර්නායකයන් ගොඩ නැගීමයි. ජල නියැදි විශ්ලේෂණය කිරීම හා පොම්ප කිරීම හා වර්ෂා ජලය නිසා ප්‍රති ආරෝපණය වීමෙන් භූගත ජලයට සිදු වන උච්චාවචනයන් අබන්ධ ලෙස පසුවිපරම් කිරීම සඳහා බුත්තල ප්‍රදේශයේ ළිං දෙකක් තුළ ස්ථිර දත්ත ලකුණුකරණයන් දෙකක් ස්ථාපිත කරනු ලැබීමෙන් පර්යේෂණය අවසන් කරන ලදි. මේ පර්යේෂණය සඳහා ඇත්ත වශයෙන්ම වැය වූ පිරිවැය රුපියල් මිලියන 1.562 ක් විය.

පාරිසරික හා සමාජ සාධකයන්ට අදාලව ජීවන රටාවන් පදනම් කර ගනිමින් නිදන්ගත වකුගඩු රෝගය හා සම්බන්ධ ඓතිහාසික සාක්ෂි හඳුනා ගැනීමට කරන ලද පර්යේෂණ

මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වූයේ නිදන්ගත වකුගඩු රෝගය ඇති වීමට තුඩු දුන් හේතු හා පානීය ජලය අතර ඇති සම්බන්ධතාවය හඳුනා ගැනීම හා භූගත ජලය දූෂිත වීම ජීවන ශෛලිය මත කරන බල පෑම හඳුනා ගැනීමත් වේ. මෑත අතීතය තුළ වකුගඩු රෝගීන්ගේ වර්ධනයක් දක්නට ලැබුණ විල්ගමුව ප්‍රදේශය තුළ මෙම පර්යේෂණය ක්‍රියාත්මක කරන ලදි. මෙය භූගත ජල අංශය සමග ඒකාබද්ධව ක්‍රියාත්මක කරන ලද පර්යේෂණයක් වූ අතර එය සිදු කරන ලද්දේ ජලාශයන්හි චර්යාව අධ්‍යයනය කිරීමට හා මධ්‍යම සහාය සේවා මධ්‍යස්ථානය විසින් භූගත ජලය දූෂණය වීම නිසා ජීවන රටාවන් මත වන බල පෑම අධ්‍යයනය කිරීම පිණිස ද වේ. මෙම පර්යේෂණය අවසන් කරන ලද්දේ රසායනික පරාමිතීන් අනුව ජල නියැදීන් හා පාරිසරික සමස්ථානිකයන් විශ්ලේෂණය කිරීමෙන් හා ජීවන ශෛලියට අදාල කාරණා සම්බන්ධයෙන් සමාජ සමීක්ෂණයන් සිදු කිරීමෙනි. පර්යේෂණය වෙනුවෙන් ඇත්ත වශයෙන්ම වැය වූ පිරිවැය රුපියල් මිලියන 0.333 ක් විය.

තිරසාර භාවය හා විවිධාංගීකරණය සඳහා ප්‍රජා මූල සංවිධාන ගාස්තු ක්‍රමයේ ප්‍රමාණවත් භාවය හා ඵලදායී භාවය අගැයීම පිණිස කරන ලද පර්යේෂණය

මෙම පර්යේෂණයේ අවධානය යොමු වන ලද්දේ ප්‍රජා ජල සම්පාදන යෝජනා ක්‍රමයන් කළමනාකරණය කරනු ලබන ප්‍රජා මූල සංවිධානයන් විසින් එම ප්‍රජා ජල සම්පාදන යෝජනා ක්‍රමයන් වඩාත් හොඳින් ක්‍රියාත්මක කිරීම සඳහා ඔවුන් සතුව ඇති මූල්‍ය හැකියාවන් තක්සේරු කොට බැලීම කෙරෙහිය. මෙම අධ්‍යයනය 2004 වර්ෂයේදී ආරම්භ කරන ලද්දේ ප්‍රජා මූල සංවිධානයන් විසින් කළමනාකරණය කරනු ලබන තෝරාගත් නල ජල සම්පාදන යෝජනා ක්‍රමයන් පදනම් කර ගෙන වන අතර, ගාස්තු ක්‍රම, ආදායම හා වියදම අධ්‍යයනය කිරීම සඳහා එම යෝජනා ක්‍රමයන් යොදා ගන්නා ලදි. පර්යේෂණයේ ඉලක්කය වූයේ ප්‍රජා මූල සංවිධානයන්ගේ විභව හැකියාවන් පෙන්නුම් කරන සාධකයන් පැහැදිලි කර ගැනීම වේ. දත්ත රැස් කිරීම සඳහා ප්‍රශ්නාවලී සමීක්ෂණයන් පවත්වන ලදි. පර්යේෂණය නිම කරන ලද්දේ දිස්ත්‍රික්ක 15 ක ප්‍රජා මූල සංවිධානයන්ගේ ප්‍රමාණාත්මක හා ගුණාත්මක දත්ත විශ්ලේෂණයට භාජනය කිරීමෙනි. පර්යේෂණය වෙනුවෙන් වැය වූ සැබෑ පිරිවැය රුපියල් මිලියන 0.034 ක් විය.

විශේෂ සිද්ධීන්

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ පර්යේෂණ හා සංවර්ධන අධ්‍යයන සම්මන්ත්‍රණය - 2017

තුන් වැනි පර්යේෂණ හා සංවර්ධන අධ්‍යයන සම්මන්ත්‍රණය 2017 මාර්තු 20 වැනි දින බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී සහභාගි වන්නන් 450 දෙනෙකුගේ පමණ සහභාගිත්වයෙන් පවත්වන ලද අතර එහිදී ජාත්‍යන්තර කතෘ වරුන් විසින් ඉදිරිපත් කරන ලද නිබන්ධනයන් 03 ක් ද ඇතුළු නිබන්ධනයන් 31 ක් ඉදිරිපත් කරන ලදි. ප්‍රධාන ආරාධිතයා වශයෙන් නගර සැලැසුම් හා ජල සම්පාදන කටයුතු පිළිබඳ ගරු අමාත්‍ය රවුෆ් හකීම් මහතා සහභාගි වූ අතර මුඛ්‍ය දේශකයා වශයෙන් සහභාගි වූයේ මහාචාර්ය අජිත් ද අල්විස් මහතාය. මෙම සිද්ධිය කණ්ඩායම් ක්‍රියාකාරකමක් වූ අතර එය සාර්ථක කිරීම පිණිස විවිධ වර්ගයන්ට අයත් පිරිස් හා විවිධ අංශයන්ට අයත් කාර්ය මණ්ඩල සාමාජිකයින් එය සංවිධානය කිරීම පිණිස සහභාගි වූහ.

ජලය හා අපජලය සම්බන්ධ ශික්ෂණයන් පිළිබඳව තමන් විසින් ලබාගෙන ඇති දැනුම හා අත් දැකීම් පතල කර හැරීම සඳහා සහ

එමෙන්ම හොඳම ප්‍රාගුණ්‍යයන් පර්යේෂකයින්, විධායක නිලධාරීන්, තීරණ ගන්නන්, ප්‍රතිපත්ති සම්පාදකයින් හා වෙනත් පරදුධාරීන් අතර බෙදා හදා ගැනීමට පර්යේෂකයින්ට, උගතුන්ට හා වෘත්තිකයින්ට යෝග්‍ය වේදිකාවක් නිර්මාණය කිරීම, ඒකාබද්ධ ජල සම්පාදන හා අපජල කළමනාකරණ ක්‍රමෝපායයන් පිළිබඳ විවිධ රට වල පර්යේෂණ හා සිද්ධි අධ්‍යයනයන් පිළිබඳ දැනුම හුවමාරු කර ගැනීම, හා එමෙන්ම එකතු කර ගත් දැනුම හා නව තාක්ෂණවේදයන් ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම ද මෙම සම්මන්ත්‍රණයේ අරමුණු විය.

මෙම අංශය විසින් ක්‍රියාත්මක කරන ලද ආයතන සංවර්ධන ක්‍රියාකාරකම්

පැකේජ ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාර සැලැසුම් අත් පොත

අනාගතයේදී පැකේජ ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාර සැලැසුම් සකස් කිරීම සඳහා මග පෙන්වීම් මාලාවක් වශයෙන් භාවිතා කිරීම පිණිස මෙම සැලැසුම් අත් පොත පිළියෙල කොට කලාපීය නියෝජ්‍ය සමානාධිකාරීවරුන් අතර බෙදා හරින ලදි. සැලැසුම් ගණනය කිරීම් හා දිනකට ඝණ මීටර 500 ක ධාරිතාවයකින් යුත් පැකේජ ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයක රූප සටහනක් ද මෙම අත් පොත තුළ අන්තර්ගත කොට තිබේ.

2017 ගෘහස්ත ජල පරිභෝජන සමීක්ෂණය

මහරගම ප්‍රදේශයේ නිවාස 106 ක් ආවරණය කරමින් ප්‍රශ්නාවලී සමීක්ෂණයක් පවත්වන ලදි. මෙම සමීක්ෂණයේ ඉලක්කය වූයේ ජලය සඳහා ඇති ඉල්ලුම වඩාත් හොඳින් ඇස්තමේන්තු කිරීම සඳහා පරිගණක මොඩලයක් නිර්මාණය කිරීම පිණිස නිවෙසක් තුළ ජීවත් වන පවුලේ සාමාජිකයින්ගේ සංඛ්‍යාව අනුව ගෘහස්ත පරිභෝජන රටාව වෙනස් වන ආකාරය අධ්‍යයනය කිරීම විය. දත්ත රැස් කිරීම, සකස් කිරීම, විග්‍රහ කිරීම හා මූලික ඉදිරිපත් කිරීම් සම්පූර්ණ කරනු ලැබ ඇත.

ශ්‍රී ලංකාවේ කුඩා පරිමාණ ජලය පවිත්‍ර කිරීමේ යන්ත්‍රාගාරයන් වෙනුවෙන් පටල පෙරණයන් භාවිතා කිරීම පිළිබඳව කොරියානු සහයෝගිතාවය සහිතව සිදු කරන ලද අධ්‍යයනය

කොලොන් ගෝලීය සංස්ථාව (KGC) විසින් යෝජනා කරනු ලැබ, කොරියානු මූල්‍ය ප්‍රදානයක් මත ක්‍රියාත්මක වන "ශ්‍රී ලංකාවේ කුඩා පරිමාණ ජලය පවිත්‍ර කිරීමේ යන්ත්‍රාගාරයන් වෙනුවෙන් පටල පෙරණයන් භාවිතා කිරීම" පිළිබඳ සහයෝගිත්ව පර්යේෂණයක් මෑතකදී දියත් කරන ලද අතර එය ආරම්භක අවස්ථාවේ සිට පර්යේෂණ හා සංවර්ධන අංශයේ කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ හා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (බස්නාහිර පලාත) හා ඔහුගේ අදාල කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ සහභාගිත්වයෙන් ක්‍රියාත්මක වෙයි. මෙම පර්යේෂණ ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණු වන්නේ මතු බලාපොරොත්තු ඇති කර ගත හැකි තාක්ෂණවේදයන් ස්ථානගත කරමින් හා නිරූපණය කිරීම මගින් පාරිසරික යටිතල පහසුකම් හා සම්බන්ධ ගැටළු නිරාකරණය කිරීම සඳහා විකල්ප විසඳුම් සපයා දීම, සහයෝගිත්ව පර්යේෂණ ව්‍යාපෘතියක් හරහා තාක්ෂණික දැනුම ආරම්භ කිරීම හා අත්පත් කර ගැනීම හා නිල සංවර්ධන සහයෝගය සමග අනාගත ව්‍යාපෘතීන් ඉදිරියට ගෙන යාමට සහයෝගිතා මාර්ගයක් විවර කර ගැනීම ද වේ.

යෝජිත ආදර්ශන යන්ත්‍රාගාරය දිනකට ඝණ මීටර 100 ක ධාරිතාවයකින් යුත් පූර්ණ වශයෙන් ස්වයංක්‍රීය ලෙස ක්‍රියා කරන පටල ක්ෂුද්‍ර පෙරණ පද්ධතියක් වන අතර එය සතුව (උපරිම වශයෙන් NTU 150 ක) බොර භාවය හා ක්ෂුද්‍ර වේන්ද්‍රිකයන් ඉවත් කිරීමේ හැකියාවද ඇත. කොරියාවෙන් ආනයනය කරන ලද කොටස් වශයෙන් නිර්මාණය කරන ලද මෙම යන්ත්‍රාගාරය ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ KGC හි පර්යේෂණ හා සංවර්ධන කණ්ඩායමේ, පර්යේෂණ හා සංවර්ධන අංශයේ හා බම්බුකුලිය ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයට අනුයුක්ත නිලධාරීන්ගේ සහභාගිත්වයෙන් සවි කරන ලද අතර දැනට එය ක්‍රියාත්මක වෙමින් පවතී.

යන්ත්‍රාගාරය 2017 සැප්තැම්බර් 11 වැනි දින බම්බුකුලිය ජල සම්පාදන යෝජනා ක්‍රම වැඩ බිම තුළ ස්ථානගත කරන ලද අතර අමු ජලයේ බොර භාවය NTU 150 කට අඩු නම් එය දිනකට පැය 24 ක් ක්‍රියාත්මක වෙමින් පවතින අතර පසුවිපරම් කාල සීමාව 2018 පෙබරවාරි මාසය දක්වා පවතිනු ඇත.



බම්බුකුලිය ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාර වැඩ බිම තුළ ස්ථාපිත කරනු ලැබ ඇති පටල පෙරණ යන්ත්‍රාගාරය

හඳුනා නොගත් හේතූන් නිසා ඇති වන නිදන්ගත වකුගඩු රෝගය පිළිබඳ වැඩසටහන

හඳුනා නොගත් හේතූන් නිසා ඇති වන නිදන්ගත වකුගඩු රෝගය ශ්‍රී ලංකාවේ ප්‍රධානතම සෞඛ්‍ය ගැටළුවක් බවට පත් වී තිබේ. මුල් කාලය තුළදී එය උතුරු මැද හා ඌව යන පලාත් වලට සීමා වී තිබිණි. එහෙත් දැන් එය වයඹ, උතුරු, මධ්‍යම, නැගෙනහිර, සබරගමුව හා දකුණු යන පලාත් වලටද ව්‍යාප්ත වී ගොස් තිබේ. ලෝක සෞඛ්‍ය සංවිධානයෙන් ලැබෙන තොරතුරු වලට අනුව උතුරු මැද හා ඌව යන පලාත් වල අවුරුදු 15 සිට 70 දක්වා වූ වයස් කාණ්ඩයේ ජන ගහණයෙන් 15% ක ප්‍රතිශතයක් හඳුනා නොගත් හේතූන් නිසා ඇති වන නිදන්ගත වකුගඩු රෝගයේ බල පෑමට ගොදුරු වී ඇත. 1991 වර්ෂයේදී හඳුනා නොගත් හේතූන් නිසා ඇති වන නිදන්ගත වකුගඩු රෝගය පළමු වරට හඳුනා ගැනීමෙන් අනතුරුව උතුරු මැද පලාතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ මෙම රෝගය හේතුකොට ගෙන සිදු වූ මරණ 35000 කට වැඩි සංඛ්‍යාවක් වාර්තාගත වී ඇත.

ඒ අනුව, ලෝක සෞඛ්‍ය සංවිධානයේ හා වෛද්‍ය වෘත්තිකයින්ගේ නිර්දේශයන්ට අනුකූල ලෙස හඳුනා නොගත් හේතූන් නිසා ඇති වන නිදන්ගත වකුගඩු රෝගයේ බල පෑමට යටත්ව ඇති ප්‍රදේශයන් වෙත ආරක්ෂාකාරී පානීය ජලය ලබා දීම සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ක්‍රමෝපාය හා කාර්ය සැලැසුම් සංවර්ධනය කරන ලදි. කෙටි කාලීන, මධ්‍ය කාලීන හා දීර්ඝ කාලීන ක්‍රමෝපායයන් ඊට ඇතුලත් වේ.

දීර්ඝ කාලීන විසඳුම යටතේ රෝගයට ගොදුරු වී ඇති ප්‍රදේශයන් නව ජල සම්පාදන ව්‍යාපෘතීන්ගෙන් ආවරණය කරනු ලබන අතර මධ්‍ය කාලීන විසඳුම මගින් හඳුනා නොගත් හේතූන් නිසා ඇති වන නිදන්ගත වකුගඩු රෝගයට ගොදුරු වී ඇති ප්‍රදේශයන් වෙත දැනට ක්‍රියාත්මක වෙමින් පවතින ජල සම්පාදන යෝජනා ක්‍රමයන්ගේ සිට ජල සම්පාදන දිගු ඉදි කරනු ලබනවා ඇත. කෙටි කාලීන විසඳුම හඳුනා නොගත් හේතූන් නිසා ඇති වන නිදන්ගත වකුගඩු රෝගයේ බල පෑමට ලක් වී ඇති ප්‍රදේශයන් වෙත බවුසර මගින් ජලය සැපැයීම, භූගත ජලය පානය කිරීමට හා ආහාර පිසීමට සුදුසු වන සේ පවිත්‍ර කිරීම පිණිස කුඩා පරිමාණ විලෝම ආශ්‍රැති ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාර ස්ථාපිත කිරීම හා වැසි ජලය රැස් කිරීම ප්‍රවර්ධනය කිරීම යන කර්තව්‍යයන්ගෙන් සමන්විත වේ.

නගර සැලැසුම් හා ජල සම්පාදන අමාත්‍යංශය විසින් 2017 වර්ෂය වෙනුවෙන් හඳුනා නොගත් හේතූන් නිසා ඇති වන නිදන්ගත වකුගඩු රෝගය හා අදාල ක්‍රියාකාරකම් සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත රුපියල් මිලියන 630.88 ක මුදලක් වෙන් කර දී ඇති අතර එම වෙන් කිරීම හඳුනා නොගත් හේතූන් නිසා ඇති වන නිදන්ගත වකුගඩු රෝගයට පාත්‍ර වී ඇති ප්‍රදේශයන් වෙත මධ්‍ය කාලීන හා කෙටි කාලීන විසඳුම් ලබා දීම සඳහා භාවිතා කරනු ලැබේ.

වර්ෂය තුළදී ආසන්න වශයෙන් කිලෝ මීටර 191.8 ක නල මාර්ග දිගු කිරීම් සිදු කරනු ලැබ ඇති අතර නල මාර්ග දීර්ඝ කිරීම් කිරීමේ හැකියාවක් නැති ප්‍රදේශයන් තුළ විලෝම ආශ්‍රැති යන්ත්‍රාගාර ස්ථාපිත කිරීම, වැසි ජල රැස් කිරීමේ ටැංකි ඉදි කිරීම හා බවුසර මගින් පානීය ජලය බෙදා හැරීම යනාදී ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කරන ලදි. විලෝම ආශ්‍රැති යන්ත්‍රාගාර ස්ථාපිත කිරීමේ වැඩ සටහන යටතේ පාසැල් සඳහා විලෝම ආශ්‍රැති යන්ත්‍රාගාර 153 ක් සපයනු ලැබ ඇත.

මීට අමතර වශයෙන් අමාත්‍යංශය විසින් ප්‍රාග්ධන අය වැය ලේඛනයේ වෙන් කිරීම් භාවිතා කරමින් විලෝම ආශ්‍රැති යන්ත්‍රාගාරයන් 111 ක් ඍජුවම සපයා දෙනු ලැබ ඇත.

තවද, චීන විද්‍යා ඇකඩමිය විසින් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය සමග එක්ව හඳුනා නොගත් හේතූන් නිසා ඇති වන නිදන්ගත වකුගඩු රෝගයට හේතු පාදක වූ මූල හේතූන් පිළිබඳව විමර්ෂණයක් කිරීම සඳහා ව්‍යාපෘතියක් ආරම්භ කරනු ලැබ ඇත. හඳුනා නොගත් හේතූන් නිසා ඇති වන නිදන්ගත වකුගඩු රෝගයට ගොදුරු වී ඇති ප්‍රදේශයන් වෙනුවෙන් ස්ථාවර ජල ප්‍රතිකාරක තාක්ෂණවේදයන් හඳුනා ගැනීම හා ආරක්ෂිත, දැරිය හැකි හා තිරසාර ජල සැපැයුමක් සම්පාදනය කර දීම කෙරෙහි ව්‍යාපෘතිය පුළුල් අවධානය යොමු කරයි. චීන මහජන සමූහාණ්ඩුව විසින් වර්ග මීටර 5000 ක ක්ෂේත්‍ර ඵලයකින් යුත් සියළුම දියුණු ජල ගුණාත්මය විශ්ලේෂණය කිරීමේ පහසුකම් වලින් සමන්විත වූ අති නවීන රසායනාගාරයක් ඉදි කිරීම සඳහා RMB මිලියන 97 ක් වෙන් කර දෙනු ලැබ ඇති අතර ඉදි කිරීමෙන් පසුව එය ජලය හා අදාල පාරිසරික පර්යේෂණ සඳහා ඇති දකුණු ආසියානු කලාපය තුළ පිහිටි හොඳම මධ්‍යස්ථානයන්ගෙන් එකක් වනු ඇත.

චීන විද්‍යා ඇකඩමිය හා පේරාදෙණිය විශ්ව විද්‍යාලය අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදි. ඒ අනුව, පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ ඉංජිනේරු පීඨ පරිශ්‍රය තුළින් ඉඩම් කොටසක් තෝරාගනු ලැබ ඇත. මේ දින වල චීන සැලැසුම් කණ්ඩායමක් එකී අති නවීන රසායනාගාරය සැලැසුම් කිරීමේ කටයුතු වල නිරත වී සිටිති. අති නවීන රසායනාගාරය ඉදි කිරීමේ කටයුතු 2018 සැප්තැම්බර් 30 වැනි දිනට පෙර ආරම්භ කරනු ලබනවා ඇත. ඉදි කිරීම් කටයුතු 2020 ජුනි මාසය වන විට නිම කෙරෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

ජල සුරක්ෂිතතා සැලැසුම්

පානීය ජල සැපැයුමක සුරක්ෂිතතාවය ස්ථාවර ලෙස සහතික කිරීමේ ඉතාමත්ම ඵලදායී ක්‍රමය විශයෙන් ලෝක සෞඛ්‍ය සංවිධානයේ පානීය ජලයේ ගුණාත්මක භාවය පිළිබඳ මග පෙන්වීම් මගින් නිර්දේශ කරනු ලබන්නේ ජල සුරක්ෂිතතා සැලැසුම් වන්නේය. ලෝක සෞඛ්‍ය සංවිධානයෙන් ලැබුණ උපදෙස් හා ක්‍රියාත්මක කිරීමේ සහාය යටතේ ශ්‍රී ලංකාව තුළ ජල සුරක්ෂිතතා සැලැසුම් ක්‍රියාත්මක කිරීම 2015 වර්ෂයේ සිට අඛන්ඩ ලෙස සිදු විය.

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ මිනිස් බල සංවර්ධන හා පුහුණු කිරීම් අංශය විසින් සියළුම සහාය සේවා මධ්‍යස්ථානයන් වෙනුවෙන් නාගරික ජල සුරක්ෂිතතා සැලැසුම් පිළිබඳව පුහුණු කිරීමේ වැඩ සටහන් එකොළහක් මෙහෙයවන ලදි. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ කැප වීම සමග නාගරික ජල සම්පාදන යෝජනා ක්‍රමයන් 149 ක් තුළ ජල සුරක්ෂිතතා සැලැසුම් ක්‍රියාත්මක කළ හැකි වූ අතර එය ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් නඩත්තු කරනු ලබන මුළු ජල සම්පාදන යෝජනා ක්‍රම සංඛ්‍යාවෙන් 45% ක් පමණ වන අතර ඊට අඹතලේ, බියගම, කඳාන, මීගමුව, විසල් මහනුවර, මහනුවර දකුණ, තුරුවිල, ගල්ලෑල්ල, කොණ්ඩුවටවන, හිමදුරාව, මඩකලපුව, විසල් මාතර හා විසල් ගාල්ල යන ජල සම්පාදන යෝජනා ක්‍රමයන් ඇතුලත් වේ. ඉහතින් සඳහන් කරනු ලැබ ඇති ජල සම්පාදන යෝජනා ක්‍රමයන් විසින් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයෙන් සේවා ලබන ප්‍රතිලාභීන් අතුරින් 60% කට වැඩි සංඛ්‍යාවක් නියෝජනය කරනු ලබයි.

මීට අමතර ලෙස, 2016 වර්ෂයේ සිට බාහිර අවිධිමත් කාණ්ඩය යටතේ ජල සුරක්ෂිතතා සැලැසුම් 16 ක් අගැයීම පිණිස ලෝක සෞඛ්‍ය සංවිධානයේ සහාය ලබා ගනිමින් ජාත්‍යන්තර ජල සුරක්ෂිතතා සැලැසුම් විගණන වැඩ සටහන් මාලාවක් ක්‍රියාත්මක කරන ලදි. තවද, අභ්‍යන්තර විධිමත් විගණන කටයුතු 2018 වර්ෂය තුළදී ආරම්භ කිරීමට නියමිතය. මේ හැරුන විට දිස්ත්‍රික්ක හතක ජල සුරක්ෂිතතා සැලැසුම් ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහා සහ ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ජල සම්පාදන අංශයේ හැකියා වර්ධනය කිරීම සඳහා ලෝක බැංකු සහාය ලබන ජල සම්පාදන හා සනීපාරක්ෂණ වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය (WASSIP) අත් වැල් බැඳගෙන ඇත.

මීට අමතර ලෙස, කලාපයේ පිහිටි වෙනත් රට වලට ද ආදර්ශයක් වෙමින් ගිණිකොන දිග හා දකුණු ආසියානු කලාපයන්හි ප්‍රථම වරට බාහිර විධිමත් විගණනය ස්ථාපිත කිරීමේ අපේක්ෂාවෙන් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ශ්‍රී ලංකාවේ ඉංජිනේරු ආයතනය, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය හා ලෝක සෞඛ්‍ය සංවිධානයේ දේශීය කාර්යාලය සමග සාකච්ඡා පවත්වන ලදි. මෙම ප්‍රයත්නයේ ස්වාධීන සත්කාරක ඒජන්ත ලෙස කටයුතු කරමින් එයට නායකත්වය දීම සඳහා ලෝක සෞඛ්‍ය සංවිධානයේ නව දිල්ලියේ පිහිටි කලාපීය කාර්යාලය විසින් ශ්‍රී ලංකාවේ ඉංජිනේරු ආයතනය වෙත ශ්‍රී ලාංකික රුපියල් මිලියන 2.8 ක මුදලක් දැනටමත් ප්‍රදානය කරනු ලැබ ඇත.

එහෙයින් "සාර්ථක ජීවිතයක් සඳහා සුරක්ෂිත ජලය" යන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ජල සුරක්ෂිතතා සැලැසුම් කණ්ඩායමේ දැක්ම අනුව රටේ සියළුම පුර වැසියන්ට සුරක්ෂිත ප්‍රවේශයක් සහතික කිරීම පිණිස ජල සුරක්ෂිතතා සැලැසුම් ක්‍රියාත්මක කිරීම සාකල්‍ය ප්‍රවේශයක් වශයෙන් ක්‍රියාත්මක කිරීමෙන් 2020 වන විට ජල සුරක්ෂිතතා සැලැසුම් ක්‍රමෝපාය සැලැසුමෙහි පිහිටුවාගෙන ඇති ඉලක්කයන් සපුරා ගැනීම සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය නිවැරදි මාවතට පිවිස ඇති බවට සැකයක් නැත.

“ළිඳ වියලී යන තෙක් අපට ජලයේ වටිනාකම දැනෙන්නේ නැත.”

තෝමස් ෆුලර්

යටිතල පහසුකම් සංවර්ධනය

හලාවත ජල සම්පාදන යෝජනා ක්‍රමයේ තුළුමුව

කලාපීය සහාය සේවා මධ්‍යස්ථාන.

පලාත/ කලාපීය සේවා මධ්‍යස්ථානය	සම්බන්ධතා සංඛ්‍යාව
මධ්‍යම	261,356
නැගෙනහිර	243,424
උතුරු මැද	114,351
වයඹ	78,036
උතුරු	21,653
සබරගමුව	106,606
දකුණු	312,024
ඌව	94,794
බටහිර මධ්‍යම	462,290
බටහිර උතුරු	271,735
බටහිර දකුණු	252,903
එකතුව	2,219,172



කලාපීය සහාය සේවා මධ්‍යස්ථාන

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ කලාපීය සහාය සේවා මධ්‍යස්ථාන 11 විසින් නව ව්‍යාපෘතීන් ආරම්භ කරනු ලැබ ඇත. ව්‍යාපෘති සමාලෝචන කමිටුවේ නියෝජිතයින් වශයෙන් කලාපීය සහාය සේවා මධ්‍යස්ථානයන්ට අනුයුක්ත කාර්ය මණ්ඩල සාමාජිකයින් විසින් නව ව්‍යාපෘති වල ක්‍රම සම්පාදනය හා නියාමක ක්‍රියා පටිපාටීන් සමීප ලෙස සම්බන්ධීකරණය කරනු ලැබේ. එසේම දැනට ක්‍රියාත්මක වන ජල සම්පාදන යෝජනා ක්‍රමයන් හා මල අපවහන යෝජනා ක්‍රමයන් මෙහෙයවමින් නඩත්තු කරනු ලබන්නේ ද ඔවුන් විසිනි. යටිතල පහසුකම් සංවර්ධනය, ආදායම් රහිත ජලය අඩු කිරීම, බල ශක්ති කළමනාකරණය හා ආයතන සංවර්ධනය හා අදාල වැඩ කටයුතු සහ ජල සම්පාදන සහ සනීපාරක්ෂණ අංශයන් උචිත අංශයන් යටතේ ගොනු කරනු ලැබ ඇත. ඉහතින් සඳහන් කරනු ලැබ ඇති කොටස් තුළ අන්තර්ගත වී නොමැති වෙනත් ඇතැම් වැදගත් තොරතුරු මෙහි පහත සාරාංශ ගත කොට පෙන්වනු ලැබ ඇත.

බටහිර - මධ්‍යම

බටහිර මධ්‍යම කලාපීය සහාය සේවා මධ්‍යස්ථාන කොට්ඨාශය කොළඹ නගරයේ උතුර, කොළඹ නගරයේ දකුණ, කෝට්ටේ හා මහරගම කළමනාකරණ ප්‍රදේශයන්ගෙන් සමන්විත වේ. පුරුදු පරිදිම 2017 වර්ෂය තුළදී ද බටහිර මධ්‍යම කලාපීය සහාය සේවා මධ්‍යස්ථාන කොට්ඨාශය තුළ බොහෝ විශේෂ සිද්ධීන් සිදු විය. සිංහල හා හින්දු අළුත් අවුරුද්ද හා ජනවාරි 1 වැනි දින නව ලිත් වර්ෂය උදා වීම සැමරීමේ වැඩ සටහන් හා වෙසක් හා පොසොන් උත්සව වෙනුවෙන් දන්සැල් පැවැත්වීම ද සිදු කරන ලදි. බටහිර මධ්‍යම කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය විසින් සංවිධානය කරන ලද බණ හා පිරිත් පිං කම් වැඩ සටහන්, වාර්ෂික විනෝද චාරිකා හා බටහිර මධ්‍යම කලාපීය සහාය සේවා මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩල සාමාජිකයින් හා කළමනාකරුවන් අතර විනෝද සාද පැවැත්වීම් ආදී ආගමික මෙන්ම විනෝද / අධ්‍යාපනික ක්‍රියාකාරකම් ද වර්ෂය තුළදී ක්‍රියාත්මක කරන ලදි.

වර්ෂය තුළදී බොහෝ ආදායම් රහිත ජලය අඩු කිරීමේ හා බල ශක්ති සංරක්ෂණය කිරීමේ ක්‍රියාකාරකම් ද බටහිර මධ්‍යම කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය විසින් ක්‍රියාත්මක කරන ලදි. (වෑල්ව පිළිබඳව සොයා බැලීම්, නල මාර්ග පිළිබඳව සොයා බැලීම්, නීති විරෝධී පරිභෝජනයන් අනාවරණය කර ගැනීම්, කාන්දු සමීක්ෂණ, අභ්‍යන්තර කාන්දු අනාවරණය කර ගැනීම්, දෝෂ සහිත මනු ප්‍රතිස්ථාපනය කිරීම්, කාන්දු අළුත්වැඩියා කිරීම් ආදී) කොට්ඨාශය තුළ ක්‍රියාත්මක කරන ලද ආදායම් රහිත ජලය අඩු කිරීමේ ක්‍රියා මාර්ගයන් සමග කොළඹ නගරයේ ආදායම් රහිත ජල පරිමාව 42.4% ක මට්ටම දක්වා අඩු කර ගත හැකි වූ අතර එය පසු ගිය වර්ෂය හා සාපේක්ෂක ලෙස බලන විට 2.2% ක අඩු වීමකි. බටහිර මධ්‍යම කලාපීය සහාය සේවා මධ්‍යස්ථාන කොට්ඨාශය තුළ ආදායම් රහිත ජල පරිමාව 32.9% ක් වන අතර එය ගත වූ වර්ෂය සඳහා වූ ප්‍රතිශතය හා සසඳා බලන විට 1.4% ක අඩු වීමකි.

ආදායම් රහිත ජලය අඩු වීම පද්ධතියේ කාර්යක්ෂමතාවයට හා බල ශක්ති සංරක්ෂණයට මග පෙන්වයි. ආදායම් රහිත ජලය තියුණු ලෙස අඩු කිරීම සඳහා කොළඹ නගරයේ නල ජාලය නවීකරණය කිරීම හා නල වැලීමේ කටයුතු මහ කොළඹ ජල හා අපජල කළමනාකරණය වැඩි දියුණු කිරීමේ ආයෝජන ව්‍යාපෘතිය විසින් ආරම්භ කරනු ලැබ ඇත. ඒ අනුව පොම්ප කිරීම සඳහා යොදා ගනු ලබන බල ශක්තිය තව දුරටත් අඩු වනු ඇත. ව්‍යාපෘතිය විසින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන ලද ප්‍රධාන කර්තව්‍යයන්ට අමතර ලෙස පොම්පාගාරයන් තුළ තිබී පැරණි පොම්ප ප්‍රතිස්ථාපනය කිරීම, අභ්‍යන්තර හා බාහිර විදුලි බුබුළු වෙනුවට ආලෝක විමෝචන ඩයෝඩ (LED) විදුලි බුබුළු සවි කරවීම, පොම්පාගාරයන්හි පොම්ප කිරීමේ කටයුතු බල ශක්ති භාවිතය අවම කාල වේලාවන් තුළ කිරීමට සැලැස්වීම හා බල ශක්ති පරිභෝජනය කරන සියළුම වැඩ බිම් තුළ බල ශක්ති නාස්තිය අවම කිරීමේ ක්ෂණික නිවාරක නඩත්තු කටයුතු කිරීම ආදිය මෙහෙයුම් හා නඩත්තු අංශය විසින් බල ශක්ති සංරක්ෂණය සඳහා ගන්නා ලද පියවරයන්ගෙන් කිහිපයකි.

නල මාර්ග දීර්ඝ කිරීම් හා හිඩැස් වැසීමේ නල මාර්ග වලීම බටහිර මධ්‍යම කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය විසින් වර්ෂය තුළදී ක්‍රියාත්මක කරන ලදි. මහරගම කළමනාකරු විසින් කරනු ලැබ ඇති මිලි මීටර 63 කට වැඩි විෂ්කම්භයකින් යුත් නල මාර්ග දීර්ඝ කිරීම් හා පොදු නල මාර්ග වැඩි දියුණු කිරීම් වල මුළු දිග කිලෝ මීටර 50.4 කි. කෝට්ටේ කළමනාකරු විසින් ක්‍රියාත්මක කරන ලද එම කර්තව්‍යයන්ගේ දිග කිලෝ මීටර 18.5 කි. එසේම කොළඹ නගරයේ කළමනාකරුවන් විසින් කරන ලද කෙටි නල මාර්ග දීර්ඝ කිරීම් වල මුළු දිග මීටර් 220 කි.

රුපියල් බිලියන 3.5 ක LBF ව්‍යාපෘතිය මගින් ව්‍යාපෘතියේ විෂය පථය තුළ අන්තර්ගත අනිකුත් අදාල යටිතල පහසුකම් අතර රුපියල් මිලියන 184.22 ක පිරිවැයක් වැය කරමින් හබරකඩ හා කොරතොට ප්‍රදේශයන් තුළ ජලය බෙදා හැරීමේ කටයුතු වැඩි දියුණු කිරීම සඳහා පද්ධතියට නල මාර්ග කිලෝ මීටර 15.96 ක් එකතු කරමින් මිලි මීටර 63 ක් හා ඊට වැඩි විෂ්කම්භයකින් යුත් නල යොදා ගනිමින් කරන ලද නල වැලීමේ වැඩ කටයුතු වර්ෂය තුළදී අවසන් කරනු ලැබ ඇත. මෙම ව්‍යාපෘතිය මගින් නව සම්බන්ධතාවයන් 1ල232 ක් සපයනු ලැබ ඇත.

නව සම්බන්ධතාවයන්, බිල් කිරීම් හා ගාස්තු රැස් කිරීම් පිළිබඳ ඉලක්කයන් වර්ෂය තුළදී සාර්ථක ලෙස සාක්ෂාත් කරගන්නා ලදි. බටහිර මධ්‍යම කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය විසින් ප්‍රස්තුත වර්ෂය තුළ නව සම්බන්ධතාවයන් 17ල513 ක් ලබා දී ඇත. සැලැසුම් කර තිබුනේ නව සම්බන්ධතා 15ල405 ක් ලබා දීමට හෙයින් මෙය එම ඉලක්කය ඉක්මවා යමින් සාක්ෂාත් කර ගන්නා ලද 100% ක ජයග්‍රහණයකි. එම ඉලක්කය සපුරා ගන්නා ලද්දේ කොළඹ මධ්‍යම උතුර කළමනාකාර කොට්ඨාශය, කොළඹ මධ්‍යම දකුණ කළමනාකාර කොට්ඨාශය, කෝට්ටේ කළමනාකාර කොට්ඨාශය හා මහරගම කළමනාකාර කොට්ඨාශය විසින් ලබා දෙන්නට යෙදුන පිළිවෙලින් 992 ක්, 643 ක්, 5456 ක් හා 9781 ක් වූ නව සම්බන්ධතාවයන් හා කළමනාකරු (ආදායම් රහිත ජලය) විසින් ලබා දෙන ලද නව සම්බන්ධතාවයන් 641 ද මගිනි. වර්ෂය සඳහා වූ බිල් කිරීමේ ඉලක්කය රුපියල් මිලියන 7,591 ක් වූ අතර 2017 නොවැම්බර් මාසය දක්වා සාක්ෂාත් කර ගන්නා ලද සැබෑ බිල් කිරීම රුපියල් මිලියන 7,629 ක් විය. එය 100% ක ජයග්‍රහණයකි. එම කාලය සඳහාම ගාස්තු රැස් කිරීම රුපියල් මිලියන 7,721 ක් වූ අතර එය රුපියල් මිලියන 7,992 ක වාර්ෂික ඉලක්කයෙන් 97% ක ජයග්‍රහණයකි. මුළු බටහිර මධ්‍යම කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය වෙනුවෙන් වූ ණය කාල සීමාව මසකට 0.6 ක් විය.

යටිතල පහසුකම් හා ආයතන සංවර්ධන වැඩ කටයුතු වශයෙන් යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා තමන්ට ලබා ගත හැකි අරමුදල් භාවිතා කරමින් මෙහෙයුම් හා නඩත්තු කළමනාකරුවන් විසින් ක්‍රියාත්මක කරන ලද වෙනත් බොහෝ සුළු සංවර්ධන ක්‍රියාකාරකම් අතර හල්පිට, මිරිස්වත්ත හා ජඹුරලිය පොම්පාගාරයන් තුළ ක්ලොරීන් එකතු කිරීමේ උපකරණ ස්ථාපිත කිරීම ද, මාලිගාකන්ද ජලාශයේ නව වෑල්ව මැදිරිය ඉදි කිරීම හා මහරගම කළමණාකරණ කොට්ඨාශය තුළ හෝමාගම, මහරගම, පන්නිපිටිය හා මිරිස්වත්ත ජල කුළුණු නවීකරණය කිරීම ද 2017 වර්ෂය තුළදී ක්‍රියාත්මක කරන ලදි.

කෝට්ටේ හා කොලොන්නාව ප්‍රදේශයන්හි ජල සුරක්ෂිතතා සැලැසුම් පිළියෙල කොට ක්‍රියාත්මක කරන ලද අතර බත්තරමුල්ල, මහරගම, කොළඹ උතුර හා කොළඹ දකුණ ප්‍රදේශයන් වෙනුවෙන් එකී සැලැසුම් සකස් කරනු ලැබ ඇත. මේ යටතේ CI හා GI නල පොලි එතිලින් නල යොදා ගනිමින් ප්‍රතිස්ථාපනය කිරීම ද, ජලය බෙදා හැරීමේ නල මාර්ගයන් තුළට ක්ෂීරණය වූ ද්‍රව්‍ය ඇතුළු වීම වලක්වනු සඳහා කසල ගොඩවල් අසල ඇති නල මාර්ග විතැන් කිරීම ද, වාතාශ්‍ර සිදුරු දැල් ආදියෙන් ආවරණය කිරීම මගින් ගබඩා ජලාශයන් දූෂණය වීම වැලැක්වීමේ පියවර ගැනීම ද මේ වර්ෂය තුළදී සිදු කරන ලදි.

වර්ෂා කාලයන් තුළදී වම ප්‍රදේශයන් දීර්ඝ කාලීන ලෙස ගංවතුරින් යටවී තිබීමේ ප්‍රවනතායක් පවත්නා හෙයින් කෝට්ටේ හා කොලොන්නාව ප්‍රදේශයන්හි පැන නැගිය හැකි ගංවතුර හා අනපේක්ෂිත තත්ත්වයන් වැනි ආපදා තත්ත්වයන්ට මුහුණ දීම පිණිස වී ප්‍රදේශයන් වෙනුවෙන් හදිසි තත්ත්වයන්ට ප්‍රතිචාර දැක්වීමේ සැලැසුමක් පිළියෙල කරන ලදි. 2017 වර්ෂය තුළදී අනාගත

පරම්පරාව වෙත ජලය පිළිබඳ අධ්‍යාපනය දීම සඳහා පාසැල් තුළ අධ්‍යාපනික වැඩ සටහන් හා ජලය සම්බන්ධයෙන් පවත්නා වත්මන් තත්ත්වය පිළිබඳව දැනුවත් කිරීම සඳහා විවිධ රාජ්‍ය හා පෞද්ගලික ආයතනයන් තුළ දැනුවත් කිරීමේ වැඩ සටහන් ද පවත්වන ලදි. බටහිර මධ්‍යම කලාපීය සහාය සේවා මධ්‍යස්ථාන කොට්ඨාශය යටතේ සේවයේ යෙදී සිටින සියළුම වර්ගයන්ට අයත් කාර්ය මණ්ඩල සාමාජිකයින් අතුරින් තෝරාගත් සාමාජිකයින් කාර්යයන්හි යෙදීමේදී ඔවුනොවුන්ගේ ඵලදායිතාවය වැඩි දියුණු කිරීමේ පරමාර්ථයෙන් (කාර්යයන්හි යෙදීමේදී ආරක්ෂාකාරී ලෙස කටයුතු කිරීම, සෞඛ්‍ය කළමනාකරණය හා හරිත ඵලදායිතාවය වැනි විෂයයන් හා සම්බන්ධ) විවිධ දැනුවත් භාවය ඇති කිරීමේ වැඩ සටහන් වලට සහභාගි කරවන ලදි. ඵලදායිතාවය නංවා ලීම පිණිස ස්මාර්ට් දුරකථන භාවිතා කරමින් මනු කියවීම සඳහා ජංගම යෙදුවුම යොදා ගැනීම කොළඹ නගරය තුළ හා කලාපයේ වෙනත් ප්‍රදේශයන්හි යම් යම් කොටස් තුළ ද ක්‍රියාත්මක කරනු ලැබ ඇත. බිල් කිරීමේ නිරවද්‍යතාවය හා පාරිභෝගිකයින් වෙත සපයනු ලබන සේවාවන්ගේ ගුණාත්මය වැඩි දියුණු කිරීම සඳහා මනු කියවීමේ විගණන හා දෝෂ සහිත මනු ප්‍රතිස්ථාපනය කිරීමේ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කරන ලදි.

බටහිර - දකුණ

බටහිර දකුණු කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය එම මධ්‍යස්ථානයේ කාර්යාලයෙන් හා දෙහිවල කලාප කළමනාකාර කාර්යාලය, පානදුර-හොරණ කලාප කළමනාකාර කාර්යාලය හා කළුතර කලාප කළමනාකාර කාර්යාලය යන කලාප කළමනාකාර කාර්යාල 3 න් ද සමන්විත වේ.

2017 වර්ෂය තුළදී කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය කොට්ඨාශය තුළ බොහෝ විශේෂ සිදු වීම් සිදු විය. කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය හා කළමනාකාර කලාප තුන විසින් ධනාත්මක චින්තනය, ආකල්ප වෙනස් කිරීම හා ඵලදායිතාවය වැඩි දියුණු කිරීම සඳහා වූ තත්ත්ව කව මෙවලම් පිළිබඳ විශේෂ වැඩ සටහන් ද, ජනවාරි 1 වැනි දින පිරිත් සජ්ජායන පිං කමක් සංවිධානය කිරීම ද, වෙසක්, පොසොන් හා නත්තල් සැමරුම් උත්සව පැවැත්වීමට කටයුතු කිරීමටද පියවර ගන්නා ලදි. 2017 වර්ෂයේ ජාතික ඵලදායිතා තරඟයට සහභාගි වීම පිණිස කලාපීය සහාය සේවා මධ්‍යස්ථාන කාර්යාලය තුළ හා කලාප කාර්යාලයන් තුළ පුහුණු කිරීමේ වැඩ සටහන් හා හඳුන්වා දීමේ වැඩ සටහන් සංවිධානය කොට පවත්වන ලදි.

බටහිර දකුණු කලාපීය සහාය සේවා මධ්‍යස්ථාන කොට්ඨාශය තුළ ආදායම් රහිත ජලය අඩු කිරීමේ ක්‍රියාකාරකම් කිහිපයක් ක්‍රියාත්මක කරන ලද අතර ඒ අනුව කලාපය තුළ ආදායම් රහිත ජලය 20% ක පමණ මට්ටමක පවත්වාගෙන යා හැකි විය. 2017 වර්ෂය තුළදී මාර්ග පුනරුත්ථාපන කටයුතු රාශියක් ක්‍රියාත්මක කරනු ලැබුව ද කළුතර, පානදුර - හොරණ හා දෙහිවල ප්‍රදේශයන් තුළ ආදායම් රහිත ජලය පිළිවෙලින් 15%, 17% හා 25% මට්ටම් වලට අඩුවෙන් පවත්වාගත හැකි විය.

ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රමයන් ඇතුළු ප්‍රදේශයන් කිහිපයක් තුළ ජල ගුණාත්ම ප්‍රවීක්ෂණ ක්‍රියාකාරකම් හා ජල සුරක්ෂිතතා ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කරන ලදි. මතුගම - වෑත්තෑව ජල සම්පාදන යෝජනා ක්‍රමය, අළුත්ගම ජල සම්පාදන යෝජනා ක්‍රමය, බේරුවල ජල සම්පාදන යෝජනා ක්‍රමය, පයාගල ජල සම්පාදන යෝජනා ක්‍රමය, පානදුර කලාපයේ 2, 3. 4 වී සහ 4 බී බෙදා හැරීමේ පද්ධතිය, බෝඹුවල - පිලොමිනා වත්ත ජල සම්පාදන යෝජනා ක්‍රමය, ඉංගිරිය - නිමලගම ජල සම්පාදන යෝජනා ක්‍රමය, දෙහිවල කලාප ඊ/වෆ් හා මොරටුව කලාප වී ඇතුළු ජල සම්පාදන යෝජනා ක්‍රම 11 ක් තුළ ජල සුරක්ෂිතතා සැලැසුම් සම්පූර්ණ කරන ලදි. කළුතර ජල සම්පාදන යෝජනා ක්‍රමය, අළුබෝමුල්ල ජල සම්පාදන යෝජනා ක්‍රමය හා දෙහිවල කලාප වී යන ජල සම්පාදන යෝජනා ක්‍රම තුන 5 වැනි මොඩියුලය දක්වා සම්පූර්ණ කරන ලද අතර මොරටුව බී කලාපයේ ජල සම්පාදන යෝජනා ක්‍රමය 4 වැනි මොඩියුලය දක්වා සම්පූර්ණ කරන ලදි. අථුළුගම ජල සම්පාදන යෝජනා ක්‍රමය, දෙහිවල බී, ඩී සහ ජී කලාප හා මොරටුව සී, ඩී, ඊ, වෆ්, හා ජී කලාප යන ජල සම්පාදන යෝජනා ක්‍රමයන් නවය මොඩියුල 3 දක්වා සම්පූර්ණ කරන ලදි. තවද, ප්‍රතිලාභී පවුල් 70,000 කට අධික සංඛ්‍යාවක් සම්බන්ධතාවයන් 13ල168 ක් මගින් ආවරණය වන පරිදි ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රම 126 ක් සැලැසුම් කොට කලාපය තුළ ක්‍රියාත්මක කරන ලදි.

තවද, කළුතර ප්‍රදේශයේ කිලෝ මීටර 20 කින් ද, පානදුර - හොරණ ප්‍රදේශයේ කිලෝ මීටර 75 කින් හා දෙහිවල ප්‍රදේශයේ කිලෝ මීටර 3 කින් ද සමන්විත වූ කිලෝ මීටර 98 ක මුළු දිගින් යුත් නල මාර්ග දීර්ඝ කිරීම් ක්‍රියාත්මක කරන ලදි. වර්ෂය මුළුල්ලේම සියළුම කලාපයන් තුළ ප්‍රති ආරෝපණ හා පුනරුත්ථාපන ක්‍රියාකාරකම් විශාල සංඛ්‍යාවක් ක්‍රියාත්මක කරන ලදි. තවද බටහිර දකුණු කලාපීය සහාය සේවා මධ්‍යස්ථාන නව සම්බන්ධතා ලබා දීම වේගවත් කිරීමේ හා නල චලීමේ වැඩ සටහනක් දේශීය බැංකු අරමුදල් යොදා ගනිමින් ක්‍රියාත්මක වන සම්බන්ධතා නංවා ලීමේ රුපියල් බිලියන 3.5 ක ව්‍යාපෘතිය යටතේ හා උපයෝජ්‍යතා විතැන් කිරීමේ අය වැය ලේඛනය යටතේ හා පෙරැදි සත්‍යායන අරමුදල් යොදා ගනිමින් ක්‍රියාත්මක කරන ලදි.

ඒ වකවානුවේ බල පැවැත්වූ වියලි කාල ගුණික තත්ත්වය හේතුකොට ගෙන කළුතර ප්‍රදේශයේ කළමනාකාර වරයා ලවණතාවය කාන්දු වී පැමිණීමේ උග්‍ර ගැටළුවකට මුහුණ දුන්නේය. මේ සඳහා තාවකාලික විසඳුමක් වශයෙන් සමස්ත කළුතර කළමනාකරණ ප්‍රදේශය ආවරණය කරමින් බවුසර මගින් ජලය බෙදා හැරීමේ වැඩ පිළිවෙලක් ක්‍රියාවේ යොදවන ලද අතර කළු ගඟ හරහා මහජන සමාලෝචනයට විවෘත ස්ථිර ලවණතා බාධකයක් LHI ලවා ස්ථාපිත කරවීමේ අපේක්ෂාවෙන් පාරිසරික බලපෑම් තක්සේරු කිරීමේ වාර්තාවක් ද පිළියෙල කරන ලදි. කළුතර ප්‍රදේශය භාර කළමනාකාර වරයා විසින් ක්‍රියාත්මක කරන ලද බවුසර මගින් ජලය සැපයීමේ ක්‍රියාකාරකමට අමතරව නියං සහනාධාර අරමුදල් වලින් රුපියල් මිලියන 20.00 ක මුදලක් භාවිතා කරමින් සංවර්ධන ක්‍රියාකාරකම් කිහිපයක් ද ක්‍රියාත්මක කරන ලදි. ඉහත පියවරයන්ට අමතර ලෙස, මෙකී තත්ත්වය අඛිභවා යාම සඳහා ප්‍රදේශයේ සම්බන්ධතාවයන් 7000 ක් පානදුර සිට පෝෂණය කරන ලදි.

මග්ගොන හා අල්විස් පෙදෙස ජලාශයන්හි ජලය අඩු වීමේ ස්වභාවය හඳුනා ගන්නා ලද අතර මෙම අඩු වීම් නවත්වා යථා තත්ත්වයට පත් කිරීම පිණිස පුනරුත්ථාපන අරමුදල් භාවිතා කරමින් අවශ්‍ය ද්‍රව්‍ය ප්‍රතිසම්පාදනය කිරීමේ කටයුතු ආරම්භ කරන ලදි. ඉහතින් සඳහන් කරනු ලැබ ඇති ක්‍රියාකාරකම් වලට අමතර ලෙස, ජලය බෙදා හැරීමේ කටයුතු වැඩි දියුණු කිරීම සඳහා විෂ්කම්භය මිලි මීටර 225 හා විෂ්කම්භය මිලි මීටර 160 මෙලෙක් නොකරන ලද පොලි විනිල් ක්ලෝරයිඩ් නල ඉංගිරිය - හොරණ මාර්ගයේ (වගවත්තේ සිට ඉංගිරිය දක්වා කිලෝ මීටර 7.5 ක දුරක්) චලීම ද, විෂ්කම්භය මිලි මීටර 160 හා විෂ්කම්භය මිලි මීටර 110 මෙලෙක් නොකරන ලද පොලි විනිල් ක්ලෝරයිඩ් නල හොරණ - ගලගෙදර මාර්ගයේ (පාදුක්ක මාර්ගය ඔස්සේ කිලෝ මීටර 2.5 ක දුරක්) චලීම හා බටහිර දකුණු කලාපීය සහාය සේවා මධ්‍යස්ථානයේ පුනරුත්ථාපන අරමුදල් යොදා ගනිමින් වික් මාර්ග ව්‍යාපෘතියක් ද ආරම්භ කරන ලදි. බටහිර දකුණු කලාපීය සහාය සේවා මධ්‍යස්ථාන කාර්යාලයේ, පානදුර - හොරණ කළමනාකාර කාර්යාලයේ හා දෙහිවල කළමනාකාර කාර්යාලයේ ජාල මනු සූර්ය බල ශක්ති පද්ධතිය (Net metering Solar Power System) ඉහල ශ්‍රේණිගත කිරීමේ හා ස්ථාපනය කිරීමේ වැඩ කටයුතු බල ශක්ති සංරක්ෂණය කිරීමේ අරමුදල් යොදා ගනිමින් සම්පූර්ණ කරනු ලැබ ඇත. බේරුවල ඉහල ඔසොව් පොම්පාගාරය තුළ කේන්ද්‍රාපසාරී පොම්ප ස්ථාපිත කිරීම ද බල ශක්ති සංරක්ෂණය කිරීමේ අරමුදල් යටතේ ක්‍රියාත්මක කිරීම සඳහා උපලේඛන ගත කරනු ලැබ ඇත.

දෙහිවල කළමනාකාර කලාපය තුළ තමන්ගේ මනු කියවීම් 100% ක් ම මනු කියවීමේ යෙදවුම මෘදුකාංගය භාවිතා කරමින් සිදු කරනු ලැබ ඇති අතර, අනිකුත් කලාපයන් දෙක තුළ මනු කියවීම් වලින් 75% ක් ඉහත සඳහන් යෙදවුම යොදා ගනිමින් සිදු කරනු ලැබ ඇත.

ප්‍රස්තුත වර්ෂය තුළදී ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ විශේෂ විමර්ෂණ ඒකකය විසින් දිවයින පුරා ඇති නීති විරෝධී සම්බන්ධතාවයන් 1148 ක සංඛ්‍යාවක් පරීක්ෂණයට භාජනය කරනු ලැබ ඇති අතර ඒ අතුරින් සම්බන්ධතා 123 ක සංඛ්‍යාවක් නියත වශයෙන්ම නීති විරෝධී සම්බන්ධතාවයන් බවට තහවුරු කර ගැනීමට හැකි වී ඇත. මෙම 123 ක සංඛ්‍යාවෙන් 32 ක සංඛ්‍යාවක් බටහිර දකුණු කලාපීය සහාය සේවා මධ්‍යස්ථාන කලාපය තුළ තිබෙන අතර බටහිර දකුණු කලාපීය සහාය සේවා මධ්‍යස්ථාන කලාපය තුළ සම්බන්ධතාවයන් 349 ක සංඛ්‍යාවක් යටෝක්ත විමර්ෂණයේදී පරීක්ෂණයට භාජනය කරනු ලැබ ඇත.

බටහිර - උතුර

බාහිර වටරවුම් මහා මාර්ග වකපෘතිය (කඩවත සිට කෙරවලපිටිය දක්වා) - ගුණසේකර මාවත ඔස්සේ නල එලීමේ කටයුතු

බටහිර උතුරු සහාය සේවා මධ්‍යස්ථාන කොට්ඨාශය කළමනාකරු (කැළණිය) කලාපය හා කළමණාකරු (ගම්පහ) කලාපය යන කලාප කළමනාකාර කොට්ඨාශ දෙකින් සමන්විත වේ.

බටහිර උතුරු සහාය සේවා මධ්‍යස්ථාන කොට්ඨාශය තුළ 2017 වර්ෂය තුළදී බොහෝ විශේෂ සමාජ සිදු වීම් සිදු විය. ජනවාරි 01 වැනි දින අළුත් දින දර්ශනයේ කොළය පෙරලීම, වෙසක් උත්සවය, පොසොන් උත්සවය හා නත්තල් උත්සවය සැමැරීම සඳහා වැඩ සටහන් පිළියෙල කරන ලදි. ප්‍රාදේශීය ඉංජිනේරු (කැළණිය) ගේ කාර්යාල පරිශ්‍රය තුළ බුද්ධ ප්‍රතිමාවක් ඉදි කොට ස්ථාපිත කරන ලදි. 2017 වර්ෂයේ ඔක්තෝබර් මාසයේදී කළමනාකරු (ගම්පහ කලාපය) විසින් ධාතු පූජා පුණ්‍ය කර්මයක් සංවිධානය කරන ලදි. වර්ෂාවසාන පැදුරු සාජ්ජය කළමනාකරු (කැළණිය කලාපය) තුළ සාර්ථක ලෙස පවත්වන ලදි. තවද කැළණිය ප්‍රදේශයේ ගං වතුරට ගොදුරු වූවන් වෙනුවෙන් ආහාර ද්‍රව්‍ය ආදිය බෙදා දීම සංවිධානය කරන ලදි. ඊට අමතරව, "ආධ්‍යාත්මික සංවර්ධනය" හා "පොදු සෞඛ්‍යය හා පෝෂණය" වැනි මාතෘකාවන් පිළිබඳව දේශන සංවිධානය කිරීම හා කාර්ය මණ්ඩල සාමාජිකයින් ආනන්දයට පත් කිරීම සඳහා "තුණුවටයේ කථාව" නම් වේදිකා නාට්‍යය වේදිකා ගත කිරීම සංවිධානය කිරීම හා අසාධ්‍ය ලෙස රෝගී තත්ත්වයට පත්ව ඇති ජාතික ජල සම්පාදන මණ්ඩලයේ කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ පවුල් වෙත භාණ්ඩ හා මූල්‍ය ආධාර සැපැයීම බටහිර උතුරු සහාය සේවා මධ්‍යස්ථානයේ සුබ සාධක සමිතිය විසින් සංවිධානය කරන ලදි.

වර්ෂය තුළදී, සෑම වර්ගයකටම අයත් කාර්ය මණ්ඩල සාමාජිකයින් අතුරින් තෝරාගත් කාර්ය මණ්ඩල සාමාජිකයින් ඔවුන්ගේ කුසලතා, දැනුම හා ඵලදායිතාවය වැඩි දියුණු කිරීමේ පරමාර්ථයෙන් උපලේඛනගත කරන ලද අභ්‍යන්තර, බාහිර හා විදේශීය පුහුණු වැඩ සටහන් සඳහා සහභාගි කරවන ලදි. බටහිර උතුරු සහාය සේවා මධ්‍යස්ථානයේ පුහුණු අංශය විසින් ද ජල සුරක්ෂිතතාව, ආදායම් රහිත ජලය, ඵලදායී තාවය, වාණිජ්‍යය, විගණනය හා ගිණුම් තැබීම සහ ගණකාධිකරණය, විනය ක්‍රියා පටිපාටීන්, තොග ගබඩා පාලනය හා පාරිභෝගික සම්බන්ධතා යනාදී විෂය ක්ෂේත්‍රයන් ආවරණය කරමින් වර්ෂය තුළදී පුහුණු වැඩ සටහන් 20 ක් මෙහෙයවන ලදි. තවද කැළණිය කලාපයේ සමස්ත ඵලදායී තාවය නංවා ලීමේ පරමාර්ථයෙන් එහි කළමනාකාර, ප්‍රාදේශීය ඉංජිනේරු හා ස්ථාන භාර නිලධාරී යන කාර්යාල 10 කින් සමන්විත සියළුම කාර්යාලයන් වෙත **"5 S"** ක්‍රමය හඳුන්වා දී ඒවායේ එය ක්‍රියාත්මක කරන ලදි.

දෝෂ සහිත මනු ප්‍රතිස්ථාපනය කිරීම, බෙදා හැරීමේ පද්ධතීන් තුළ පවත්නා බවට වාර්තා වූ කාන්දු අළුත්වැඩියා කිරීම, නීති විරෝධී සම්බන්ධතාවයන් අනාවරණය කර ගැනීම, ගෘහස්තයන් අහඹු ලෙස පරීක්ෂණයට භාජනය කිරීම හා කැළණිය කලාපය සඳහා මට්ටම මන්තු කිරීමේ ක්‍රමයක් සපයා ස්ථාපිත කිරීම ආදී ආදායම් රහිත ජලය අඩු කිරීමේ ක්‍රියාකාරකම් රැසක් මෙහෙයුම් හා නඩත්තු සහ ආදායම් රහිත ජලය අවම කිරීම සඳහා වූ අරමුදල් උපයෝගී කර ගනිමින් කලාපය තුළ ක්‍රියාත්මක කරන ලදි. බටහිර උතුරු සහාය සේවා මධ්‍යස්ථාන ප්‍රදේශය තුළ දැනට පවත්නා ආදායම් රහිත ජල පරිමා මට්ටම 18.57% ක් වන අතර එය පසුගිය වර්ෂය අවසානයේ තත්ත්වය හා සාපේක්ෂක ලෙස බලන විට 0.51% ක අඩු වීමකි.

බල ශක්ති සංරක්ෂණය ප්‍රධාන වශයෙන්ම සාක්ෂාත් කර ගන්නා ලද්දේ බියගම ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයේ මෙහෙයුම් පොම්පාගාරය මග හරිමින් චර්චිල් ජල ශීර්ෂය සමග ගුරුත්ව බලයෙන් ක්‍රියාත්මක වීමට ප්‍රතිසංවිධානය කිරීම මගිනි. බටහිර උතුරු සහාය සේවා මධ්‍යස්ථාන කාර්යාලය තුළ සූර්ය බල ශක්ති පද්ධතියක් ස්ථාපනය කිරීමට ද වැඩි දුරටත් කටයුතු කරන ලද අතර එය 80% ක් සම්පූර්ණ කරනු ලැබ ඇත. පරීක්ෂණ කටයුතු සිදු කිරීම ඉතිරිව තිබේ.

බියගම, කැළණිය, ජා ඇල, රද්දොළුගම, රන්පොකුණගම, වේයන්ගොඩ හා යක්කල යන ජල සම්පාදන යෝජනා ක්‍රම හත වෙනුවෙන් ජල සුරක්ෂිතතා සැලැසුම් ක්‍රියාත්මක කිරීම වර්ෂය තුළදී සිදු කරන ලදි. බියගම ප්‍රදේශය වෙනුවෙන් ජල සුරක්ෂිතතා සැලැසුමේ මොඩියුල හතක් ද, රද්දොළුගම ප්‍රදේශය වෙනුවෙන් ජල සුරක්ෂිතතා සැලැසුමේ මොඩියුල පහක් ද සම්පූර්ණ කරන ලද අතර සෙසු ප්‍රදේශයන් වෙනුවෙන් ජල සුරක්ෂිතතා සැලැසුමේ මොඩියුල හතර බැගින් ද සම්පූර්ණ කරනු ලැබ ඇත.

පානීය ජලයේ රසායනික අම්ලකර ඉල්ලුම හා පෙව රසායනික අම්ලකර ඉල්ලුම පිළිබඳව හා අපජලයේ රසායනික අම්ලකර ඉල්ලුම හා පෙව රසායනික අම්ලකර ඉල්ලුම සහ මුළු අවලම්බිත ඝණ ද්‍රව්‍යයන් පිළිබඳ විශ්ලේෂණ පරීක්ෂණ 2017 වර්ෂය තුළ කඩවත කලාපීය රසායනාගාරයේදී ආරම්භ කොට ක්‍රියාත්මක කරන ලදි. ඇතැම් කර්මාන්ත ශාලාවන් විසින් සිය අප ද්‍රව්‍යයන් කෙළින්ම කැළණි ගඟ වෙත මුදා හරිනු ලබන බව සොයා දැන ගැනීමෙන් පසුව විශේෂයෙන්ම පූගොඩ ජල සම්පාදන යෝජනා ක්‍රමය මගින් නිෂ්පාදනය කරනු ලබන පානීය ජලය නිරන්තරයෙන් ජල ගුණාත්මය පිළිබඳ පරීක්ෂණයන්ට බඳුන් කරන ලදි. පාරිභෝගිකයින් වෙත නිකුත් කරනු ලබන ජලයේ ගුණාත්මය ලෝක සෞඛ්‍ය සංවිධානයේ ප්‍රමිතියට අනුකූල ලෙස පවත්වාගනු ලබන බව සහතික කිරීම සඳහා කඩවත හා මීගමුව රසායනාගාරයන් තුළදී ජල ගුණාත්මය පිළිබඳ පරීක්ෂණ 10071 ක මුළු සංඛ්‍යාවක් 2017 වර්ෂය තුළදී පවත්වනු ලැබ ඇත. නල මාර්ග සෝදා හැරීමේ වැඩ සටහන මාර්ග පුනරුත්ථාපන වැඩ කටයුතු වලට සමාන්තර ලෙස දිනපතා කරනු ලබන කාර්යයක් මෙන් අඛණ්ඩ ලෙස ක්‍රියාත්මක කරන ලද්දේය. තවද ජල ගුණාත්මය පිළිබඳ පරාමිතීන් පසුවිපරමට භාජනය කරමින් වාර්තා පිළියෙල කිරීම සඳහා වූ දත්ත සංචිතයක් ආරම්භ කරන ලද අතර එය පසුව දැනට ක්‍රියාත්මක වන ජල ජාල සිතියම් හා සම්බන්ධ කරනු ලබනවා ඇත.

දේශීය බැංකු අරමුදල් යොදා ගනිමින් ක්‍රියාත්මක කරන ලද නල එලීමේ වැඩ කටයුතු 2017 වර්ෂය තුළදී සම්පූර්ණ කරන ලදි. කටාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අක්කර පණහ ප්‍රදේශය තුළ මිලි මීටර 63, 90, 110 හා 225 යන විෂ්කම්භයන්ගෙන් යුත් නල යොදා ගනිමින් මුළු දිග කිලෝ මීටර් 16.78 ක් නල ජාලයට එකතු කරන ලද අතර ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පහල යාගොඩ ප්‍රදේශය තුළ මිලි මීටර 90 හා 110 යන විෂ්කම්භයන්ගෙන් යුත් නල යොදා ගනිමින් මුළු දිග කිලෝ මීටර් 3.69 ක් නල ජාලයට එකතු කරනු ලැබ ඇත.

මහ නගර සභා හා ප්‍රාදේශීය සභා මාර්ගයන් උපයෝජ්‍යතා විතැන් කිරීම් ප්‍රාග්ධන අය වැය යටතේ ක්‍රියාත්මක කරන ලදි. ගලගහදූව මාර්ගයේ ඉහල ඝණත්වයේ පොලි එතිලින් නල එලීමේ කටයුතු 2017 වර්ෂය තුළදී නිම කරන ලදි. කෙලින් විදිය, සිරිවර්ධන පෙදෙස, ශාන්ත ලෝරන්ස් පාර, සෝන්ඩර්ස් පාර, ආර් පරාක්‍රම පාර, නිකුලස් පාර, වෑබොඩ පාර හා පුෂ්පාරාම පාර යන මාර්ගයන් ඔස්සේ නල මාර්ගයන් මාරු කිරීමේ වැඩ කටයුතු දැනට සිදු කරනු ලබමින් පවතී. කැළණි විහාරයේ සිට කොහුවල පාර දක්වා වූ බියගම මාර්ගය සහ මරදානේ සිට හැඳල පාර දක්වා වූ කොටස ඔස්සේ AC නල ප්‍රතිස්ථාපනය කිරීමේ කටයුතු ද දැනට සිදු කරනු ලබමින් පවතී. මීට අමතර වශයෙන් බටහිර උතුරු සහාය සේවා මධ්‍යස්ථාන ප්‍රදේශයේ ඉදි කිරීම් අංශය විසින් ප්‍රති ආරෝපණය කළ හැකි අරමුදල් යටතේ නල එලීමේ හා වැඩි දියුණු කිරීමේ වැඩ කටයුතු කිහිපයක් ක්‍රියාත්මක කරනු ලැබ ඇත. බාහිර වටරවුම් මහා මාර්ගය - කඩවත සිට කෙලවරපිටිය දක්වා (ගල උඩ පිට, ගුණසේකර මාවත, හීන්කෙන්ද, තපෝවනාරාම පාර හා පොල්පිතිමූකලාන) හා දිවුලපිටියේ බෝක්කු පැන්නුමේ ඉදි කිරීම් වලට සමාන්තර ලෙස නල මාර්ග නැවත එලීමේ වැඩ කටයුතු සම්පූර්ණ කරනු ලැබ ඇත. තවද, ගම්පහ ජල සම්පාදන යෝජනා ක්‍රමය හා අදාල වැඩි දියුණු කිරීම් වැඩ කටයුතු, ගම්පහ සහ කැළණිය ප්‍රදේශයන් තුළ නල එලීමේ වැඩ කටයුතු,

ගනේමුල්ල පාරේ වෑල්ව මැදිරි නංවා ලීමේ වැඩ කටයුතු, කටුනායක ගුවන් තොටු පොල වැඩි දියුණු කිරීම හා සම්බන්ධ නල වළලීමේ හා සම්බන්ධ කිරීමේ වැඩ කටයුතු හා මරදාන පාරේ AC නල මාර්ගය ප්‍රති ස්ථාපනය කිරීමේ වැඩ කටයුතු ආදිය අනුමත ප්‍රති ආරෝපණය කළ හැකි අරමුදල් වල ශේෂ වී ඇති මුදල් යොදා ගනිමින් ක්‍රියාත්මක කොට අවසන් කරනු ලැබ ඇත. මීට අමතරව, කොළඹ - මහනුවර මහා මාර්ගය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතියට සමාන්තර ලෙස (මිරිස්වත්තේ සිට වීදිය වත්ත දක්වා) නල මාර්ගයන් නැවත වළලීම සහ ගනේමුල්ල ගුවන් පාලම හා දරනාගම පාලම සඳහා නල මාර්ග යන් විතැන් කිරීමේ වැඩ කටයුතු දැනට සිදු කරනු ලබමින් පවතී.

ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්, ජාතික ප්‍රජා ජල සම්පාදන දෙපාර්තමේන්තුව හා පලාත් සභා ආදිය විසින් සපයන ලද අරමුදල් භාවිතා කරමින් ග්‍රාමීය ජල සම්පාදන හා සනීපාරක්ෂණ වැඩි දියුණු කිරීමේ වැඩ කටයුතු ක්‍රියාත්මක කරන ලදි. මීතිරිගල, කලටුවාව, අකරගම, හපනකන්ද, උඳුගොඩ, ඇටිකෙහෙල්ගල්ල හා තරාල ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රමයන් ප්‍රස්තුත වර්ෂය තුළදී නිම කරන ලදි. මීට අමතරව කුට්ටිවිල, පොල්හේන, බොලන්කන්දගම, රන්දියදහර, සාරසිය, මන්ගලතිරිය, නිකහැටිකන්ද, පරකන්දෙනිය, ඌරුවල, කිතුලකන්ද හා මධ්‍යම කිඹුලාපිටිය යන ක්‍රියාත්මක වෙමින් පවතින ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රමයන්ට අදාල වැඩි දියුණු කිරීමේ වැඩ කටයුතු ආරම්භ කරන ලද අතර දැනට එම කටයුතු සිදු කරනු ලබමින් පවතී. මේරිලන්ඩ් පෙදෙස තුළ හා හීනටියන නව ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රමයන් ස්ථාපිත කිරීම සඳහා වූ මූලික සැලැසුම් වැඩ කටයුතු ආරම්භ කරනු ලැබ ඇත.

පුනරුත්ථාපන හා මෙහෙයුම් හා නඩත්තු අරමුදල් යටතේ යටිතල පහසුකම් සංවර්ධන ක්‍රියාකාරකම් කිහිපයක් ක්‍රියාත්මක කොට නිම කරනු ලැබ ඇත. මීගමුවේ රසායනාගාරය නවීකරණය කිරීම, වේයන්ගොඩ, රද්දොළුව - නව සහ පැරණි, ගම්පහ හා යක්කල ජල සම්පාදන යෝජනා ක්‍රමයන් වෙනුවෙන් ගෑස් ක්ලෝරිනීකරණ යන්ත්‍ර සපයා සවි කිරීම, ගම්පහ, දිවුලපිටිය, මිනුවන්ගොඩ, උඩුග මිපොල හා පූගොඩ ජල සම්පාදන යෝජනා ක්‍රමයන් වෙනුවෙන් මිහි විදමන් සඳහා ගිල්විය හැකි පොම්ප සපයා භාර දීම, සහ කටානේ තොග ගබඩා ගොඩනැගිල්ල ඉදි කිරීම ආදිය ප්‍රධාන ක්‍රියාකාරකම් වලට ඇතුලත් වේ. ඉහත සඳහන් කාර්යයන්ට අමතරව කැළණිය ප්‍රාදේශීය ඉංජිනේරු, ජා ඇල ප්‍රාදේශීය ඉංජිනේරු සහ ජා ඇල, රාගම හා වත්තල ස්ථාන භාර නිලධාරීන් වෙනුවෙන් ගබඩා කටයුතු පවත්වාගෙන යාමේ පරමාර්ථය සඳහා අඩි 20 හා අඩි 40 බහළුම් කැබින් වකක් සපයා ස්ථාපිත කිරීම හා අති ධීවනික තොග මනු සපයා සවි කිරීම ද, රන්පොකුණ වත්ත තුළු මුව පොම්ප හා කිරිඳිවෙල ඉහල ඔසොව් පොම්ප සපයා ස්ථාපිත කිරීම ඇතුළු වැඩ කටයුතු කිහිපයක් ආරම්භ කරන ලද අතර ඒවා දැනට සිදු කරනු ලබමින් පවතී.

බියගම සෘජු පොම්ප කිරීමේ ප්‍රදේශය තුළ ජල ජාල ආකෘතිකරණය සිදු කරන ලදි. කැළණිය ප්‍රාදේශීය ඉංජිනේරු වරයා වෙනුවෙන් ආයෝජන මණ්ඩල ගුරුත්ව සම්ප්‍රේෂණයේද, එඩේරමුල්ල ප්‍රදේශය හා ආදර්ශ යාවත්කාලීන කිරීම් ආකෘතීන් සම්පාදනය කරන ලදි. ජල ජාල සිතියම දැනටමත් පවත්නා හා නව නල මාර්ග හා සවි කිරීම් පිළිබඳ විස්තර ඇතුළු කරමින් යාවත්කාලීන කරන ලදි. තවද, විසංධි කිරීම් වලට හා දෝෂ සහිත මනු ප්‍රති ස්ථාපනය කිරීමට සහාය දීම සඳහා පංගම යෙදවුම් දියුණු කරන ලදි.

රන්පොකුණගම හා කිරිඳිවෙල ජල සම්පාදන යෝජනා ක්‍රමයන්ගේ නිෂ්පාදන හැකියාවන් හා බෙදා හැරීමේ හැකියාවන් වැඩි දියුණු කිරීම් සඳහා සහ ගම්පහ ජල සම්පාදන යෝජනා ක්‍රමය වර්ධනය කිරීම සඳහා සවිස්තරාත්මක සැලැසුම්, යාවත්කාල ඇස්තමේන්තු හා ප්‍රමාණ පත්‍ර පිළියෙල කිරීම නිම කරන ලදි. මීට අමතරව, දිවුලපිටිය ජල සම්පාදන යෝජනා ක්‍රමයට අදාල තුළු මුව ව්‍යුහය හා ප්‍රධාන සම්ප්‍රේෂණ මාර්ගය ඉදි කිරීම සඳහා වටු ටෙන්ඩර් ලේඛනය පිළියෙල කිරීම නිම කරන ලදි. තවද බියගම තෝරාගත් ප්‍රදේශයන් වෙත සෘජු පොම්ප කිරීමේ ක්‍රමය හඳුන්වා දීම සඳහා සවිස්තරාත්මක සැලැස්ම පිළියෙල කරන ලදි. ජල සම්පාදන යෝජනා ක්‍රමයන්ට අදාලව පවත්නා ගැටළු නිරීක්ෂණයට බඳුන් කරන ලද අතර බටලීය, මීරිගම හා උඩුගම්පොල ජල සම්පාදන යෝජනා ක්‍රමයන් වැඩි දියුණු කිරීම අරමුණු කරගත් පර්යේෂණයන් දැනට ක්‍රියාත්මක වෙමින් පවතී.

තවද, මාර්ග පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතීන්ට සමාන්තර ලෙස ක්‍රියාත්මක කළ යුතු නල විතැන් කිරීමේ හා නල වළලීමේ වැඩ කටයුතු වෙනුවෙන් සැලැසුම්, ඉංජිනේරු වරයාගේ ඇස්තමේන්තුව හා ටෙන්ඩර් ලියවිලි පිළියෙල කිරීම අවසන් කරනු ලැබ ඇත. මීට කොළඹ - මහනුවර මහා මාර්ගයේ මිරිස්වත්ත සිට නිට්ටඹුව දක්වා වූ වැඩි දියුණු කිරීම්, බාහිර වටරවුම් මාර්ගයේ කඩවත සිට කෙරවලපිටිය දක්වා වූ වැඩි දියුණු කිරීම් හා මධ්‍යම අධිවේගී මාර්ග යේ වැඩි දියුණු කිරීම් හා පාලම් ඉදි කිරීම් හා පුනරුත්ථාපනය කිරීම් ආදී කටයුතු ද ඇතුලත් වේ.

ප්‍රස්තුත වර්ෂය තුළදී ව්‍යාපෘති අඟැයීම් කමිටුවේ අනුමැතිය ලද ව්‍යාපෘතීන් වන්නේ මීගමුව විලෝම ආශ්‍රැති යන්ත්‍රාගාරය පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය හා කටාන ජල සම්පාදන යෝජනා ක්‍රමය වෙනුවෙන් ඝණ මීටර 1000 ක ධාර්තාවයකින් යුත් භූමි ජලාශය හා පොම්පාගාරය ඉදි කිරීමේ ව්‍යාපෘතියත් වේ. ඒ අනුව මීගමුව විලෝම ආශ්‍රැති යන්ත්‍රාගාරය වෙනුවෙන් යෝජනා කැඳවීමේ ලියවිල්ල පිළියෙල කරන ලදි. තවද මීරිගම ජල සම්පාදන ව්‍යාපෘතිය - 1 වැනි අදියර වෙනුවෙන් පිළියෙල කරන ලද යෝජනා කැඳවීමේ ලියවිල්ල වීන අරමුදල් යටතේ අඟැයීමට බඳුන් කිරීම සඳහා නැවත ඉදිරිපත් කරන ලදි.

මීට අමතරව යටිතල පහසුකම් වැඩි දියුණු කිරීමට අදාල සවිස්තරාත්මක සැලැසුම, ඉංජිනේරු වරයාගේ ඇස්තමේන්තුව හා ටෙන්ඩර් ලියවිල්ල පිළියෙල කරන ලදි. කැළණිය කළමනාකාර කොට්ඨාශය තුළ ව්‍යුහාත්මක වානේ බඩු ගබඩා 3 ක් ඉදි කිරීම හා එම කළමනාකාර කොට්ඨාශයේම කාර්යාලය සඳහා රැඳවුම් බැම්මක් ඉදි කිරීම ද ඊට ඇතුලත් වේ. තවද මීගමුවේ චර්චිල්හි රසායනාගාරය හා ක්ලෝරිනීකරණ මැදිරිය සඳහා දෙමහල් ගොඩනැගිල්ලක් ඉදි කිරීමට අදාල සවිස්තරාත්මක සැලැසුම ද සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇත.

වර්ෂය තුළදී ජල සම්පාදන ව්‍යාපෘතීන් කිහිපයක් වෙත සහාය ලබා දෙන ලදි. කටාන ජල සම්පාදන ව්‍යාපෘතියේ අදියර 1 හි මූලික සැලැස්ම පිළිබඳ නිරීක්ෂණ පිළියෙල කොට ඉදිරිපත් කරන ලදි. ආසියානු සංවර්ධන බැංකු අරමුදල් යටතේ ක්‍රියාත්මක කරනු ලැබීමට යෝජිත කැළණිය කළමනාකරණ ප්‍රදේශයේ ආදායම් රහිත ජලය අඩු කිරීමේ ව්‍යාපෘතියට අදාලව ව්‍යාපෘති අඟැයීම් කමිටුව වෙත ඉදිරිපත් කළ යුතු වාර්තාව පිළියෙල කරන ලද අතර එය අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට නියමිතය. තවද ව්‍යාපෘතිය හා අදාල ජල ජාල ආකෘතිකරණය හා DMA සැලැසුම් කිරීමේ කාර්යයන් දැනට සිදු කරනු ලබමින් පවතී.

බටහිර උතුරු සහාය සේවා මධ්‍යස්ථාන කොට්ඨාශය තුළ ප්‍රස්තුත වර්ෂය තුළදී නව සම්බන්ධතාවයන් 12,745 ක මුළු සංඛ්‍යාවක් ලබා දෙන ලදි. මෙය ගම්පහ හා කැළණිය යන ප්‍රදේශ දෙකෙහිම ප්‍රමාණවත් ජල පරිමාවක් නොතිබුණ හෙයින් මුහුණ දෙන්නට සිදු වූ බරපතල ගැටළුකාරී තත්ත්වයක් යටතේ වුවද ඉලක්ක කරන ලද මුළු සම්බන්ධතා සංඛ්‍යාවෙන් 85.4% ක් සාක්ෂාත් කර ගැනීමකි.

වර්ෂය තුළදී ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයන්, ජලාශ, ජල කුළුණු, ටැංකි, පොම්පාගාර, ක්ලෝරිනීකරණ උපකරණයන්, බෙදා හැරීම් පද්ධතිය හා ජලය බෙදා හැරීමේ නල ජාලයේ අනිකුත් අංගයන් සම්බන්ධයෙන්ද ප්‍රමුඛතා පදනමක් මත දෝෂ වැලැක්වීමේ නඩත්තු වැඩ කටයුතු කරන ලදි. 2017 වර්ෂයේ පෙබරවාරි සිට මැයි මාසය දක්වා කාලය තුළ බල පැවැත්වූ දැඩි වියලි කාල ගුණික තත්ත්වයන් නිසා සාරන ලද ළිං වියලී යාම හේතුවෙන් ගම්පහ දිස්ත්‍රික්කයට උග්‍ර ගැටළු වලට මුහුණ දීමට සිදු විය. මෙම ගැටළු වලට තාවකාලික විසඳුමක් වශයෙන් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ හා බස්නාහිර පලාත් සභාවේ සහාය ද ලබා ගනිමින් කටාන, දිවුලපිටිය, මීරිගම හා මිනුවන්ගොඩ යන ප්‍රදේශයන්හි ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ආවරණය නොකරනු ලබන ප්‍රදේශයන් වෙත අඛණ්ඩ ලෙස බවුසර ජලය සැපයීමේ වැඩ පිළිවෙලක් ආරම්භ කොට ක්‍රියාත්මක කරන ලදි. බල පවත්වමින් තිබී වියලි කාල ගුණික තත්ත්වයන් හේතුකොට ගෙන කටාන ප්‍රදේශය වෙත බවුසර ජලය සම්පාදනය කිරීම 2017 ඔක්තෝබර් මාසය දක්වා දීර්ඝ කරන ලදි.

තොරතුරු තාක්ෂණ අංශය විසින් හඳුන්වා දෙන ලද මනු කියවීමේ යෙදවුම භාවිතා කිරීම බටහිර උතුර කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය විසින් 2017 වර්ෂය තුළදී ආරම්භ කරන ලදි.

දකුණ

බද්දේගම හික්කඩුව අධිවේගී මාර්ගයට ප්‍රවේශ වීමේ මාර්ගය ඔස්සේ නල එලීම

අන්තර් ක්‍රියාවන් හා සමාජ සේවාවන් වැඩි දියුණු කිරීමේ පරමාර්ථයෙන් වාර්ෂික ක්‍රිකට් තරඟ මාලාව, දානමය පිං කම, 5 වැනි ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගය සාර්ථක ලෙස සමත් වූ දකුණු කලාපයේ කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ දරුවන් වෙත සුභ සාධක සම්මිතිය විසින් ශිෂ්‍යත්ව පිරිනැමීම, සෞඛ්‍යය සහ පෝෂණය හා අපද්‍රව්‍ය ජනනය වීම අඩු කිරීම පිළිබඳ දැනුවත් භාවය ඇති කිරීමේ වැඩ සටහන් දෙකක් පැවැත්වීම සහ කාර්ය මණ්ඩල සාමාජිකයින් වෙනුවෙන් දකුණු පලාත් කලාපීය සහාය සේවා මධ්‍යස්ථාන කාර්යාල පරිශ්‍රය තුළ නොමිළයේ අක්ෂි සායනයක් පැවැත්වීම වැනි විවිධ වැඩ සටහන් 2017 වර්ෂය තුළදී ක්‍රියාත්මක කරන ලදි.

දකුණු පලාත් කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය විසින් සේවා සපයනු ලබන බොහෝ ප්‍රදේශයන් 2017 වර්ෂයේ මැයි මාසයේ හටගත් ගං වතුර තත්ත්වයේ බල පෑමට පත් විය. මෙම ගං වතුර නිසා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ දේපල වලට, විශේෂයෙන්ම පොම්පාගාර වලට, මෝටර් වලට, පොම්ප වලට හා උපකරණ වලට, මිහි විදමන් වලට, තුළු මුවට, නිල නිවාසයන්ට හා කාර්යාලයන්ට හානි සිදු වූ අතර ඒ හේතුවෙන් ජල සම්පාදනය ඇණහිටීම හා පාරිභෝගික ජනතාව වෙත සපයනු ලබන සේවාවන් අඩු මට්ටමකට පත් වීමද සිදු විය. ප්‍රවේශ වීමේ මාර්ග අවහිර වීම හේතුවෙන් මෙහෙයුම් හා නඩත්තු කටයුතු කරගෙන යාම ද අතිශයින්ම දුෂ්කර තත්ත්වයකට පත් විය. කෙසේ වුවද ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සියළුම කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ අති මහත් දායකත්වය හා කැප වීමත් සමග තීරණාත්මක ප්‍රදේශයන්ට සිදුව තිබි හානිය දින 3 ක් ඇතුලත නිවැරදි කරමින් ජල සම්පාදන සේවා කටයුතු යථා තත්ත්වයට පත් කිරීමේ හැකියාව ලැබිනි. සිදු වූ දෙයින් පාඩම් ඉගෙන ගනිමින් අනාගතයේදී සිදු විය හැකි මෙ වැනි තත්ත්වයන් සම්බන්ධයෙන් නිසි කටයුතු කළ හැකි වන පරිදි හදිසි ක්‍රියාත්මක සැලැසුම් පිළියෙල කරමින් පවතින අතර ගං වතුරින් ආරක්ෂා වීමේ පියවර දැනට ගනිමින් පවතී.

මේ කාලය තුළදී ද ගං වතුර ආපදාවට ලක් වූවන් වෙත වියලි ආහාර ද්‍රව්‍ය, පානීය ජලය, වස්ත්‍ර හා වෙනත් අවශ්‍ය ද්‍රව්‍ය ලබා දීමට කටයුතු කරන ලදි. මේ වෙනුවෙන් සියළුම කාර්ය මණ්ඩල සාමාජිකයින් විසින් සිය දායකත්වය උපරිම මට්ටමින් ලබා දෙන ලදි. දකුණු කලාපය තුළ සිදු වූ මෙම ගං වතුර උවදුරෙහි බල පෑමට පාත්‍ර වූ කාර්ය මණ්ඩල සාමාජිකයින් හඳුනා ගැනීම පිණිස පශ්චාත් ආපදා විශ්ලේෂණයක් ද සිදු කරනු ලැබූ අතර ගං වතුර ආපදාවට ලක්ව පීඩා විඳි කාර්ය මණ්ඩල සාමාජිකයින් වෙත වන්දි ලබා දීම සඳහා නිර්දේශයන්ද ඉදිරිපත් කරනු ලැබ ඇත. කරන ලද නිර්දේශ අනුව වර්ෂය අවසාන වන විට එම කාර්ය මණ්ඩල සාමාජිකයින් වෙත වික්තරා දුරකට වන්දි ලැබී තිබිණි.

2017 වර්ෂය තුළදී බල ශක්ති සංරක්ෂණය කිරීමෙන් ඉතිරි වූ අරමුදල් යොදා ගනිමින් ඉසඳීන් නගරය වෙත පොම්ප සපයා සවි කරනු ලැබූ අතර එසේම නාදුගල තුළු මුව පහල ඔසොව් පොම්ප ප්‍රති ස්ථාපනය කිරීම සඳහා කොන්ත්‍රාත්තුවක් ද ප්‍රදානය කරන ලදි. මෙම කාර්යයන්ට අමතර ලෙස බල ශක්ති සංරක්ෂණ යෙදවුම් අවශ්‍ය ප්‍රදේශයන් හඳුනා ගැනීම පිණිස විවිධ බල ශක්ති විගණනයන් හා හඳුනා ගැනීමේ වැඩ සටහන් ගණනාවක් ක්‍රියාත්මක කරන ලදි. ඒ අනුව දික්වැල්ල අරාහේන පොම්පය, බද්දේගම ඉහල ඔසොව් හා පහල ඔසොව් පොම්ප, ඇල්පිටිය ඉහල ඔසොව් පොම්ප, මුරුතවෙල තුළු මුව පොම්ප, වකමුල්ල තුළු මුව හා ඉහල ඔසොව් පොම්ප හා රිදියගම තුළු මුව පොම්ප ආදී වැඩි දියුණු කළ හැකි ප්‍රධාන ප්‍රදේශයන් ගණනාවක් හඳුනා ගන්නා ලදි. මෙම වැඩි දියුණු කිරීම් බල ශක්ති සංරක්ෂණය කිරීමෙන් ඉතිරි වූ අරමුදල් යොදා ගනිමින් 2018 වර්ෂය තුළදී ආරම්භ කරනු ලබනවා ඇත. එසේම යාන්ත්‍රික හා විද්‍යුත් අංශයට අනුයුක්ත කාර්ය මණ්ඩල සාමාජිකයින් වෙනුවෙන් බල ශක්ති සංරක්ෂණ ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩ සටහන් හා පුහුණු වැඩ සටහන් ගණනාවක් දකුණු කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය තුළදී මෙහෙයවන ලදි.

ආදායම් රහිත ජල පරිමාව අඩු කිරීමේ ක්‍රියාකාරකම් යටතේ පැරණි ජල මනු අළුත් ජල මනු යොදා ගනිමින් ප්‍රති ස්ථාපනය කිරීම, යතුරු දැමිය හැකි වෑල්ව සවි කිරීම හා ඒ සමග නව මනු කණු සවි කිරීම ද පුනරුත්ථාපන අරමුදල් යටතේ ගාල්ල කලාපය තුළ ක්‍රියාත්මක කරන ලදි. නල පුපුරා යාමේ සිද්ධීන් අවම කිරීම සඳහා බද්දේගම සිට හික්කඩුව දක්වා දිවෙන මිලි මීටර 280 ක විෂ්කම්භයකින් යුත් සම්ප්‍රේෂණ නල මාර්ගය මිලි මීටර 400 විෂ්කම්භයකින් යුත් පොලි එතිලින් නල යොදා ගනිමින් ප්‍රති ස්ථාපනය කරන ලද අතර ඒ සඳහා යොදා ගන්නා ලද්දේ (බද්දේගම වෙනුවෙන් වූ) කුඩා හා මධ්‍යම වැඩි දියුණු කිරීම් ප්‍රාග්ධන අය වැය යටතේ වූ අරමුදල් වේ.

මාතර කලාපය තුළ අකුරැස්ස ජල සම්පාදන යෝජනා ක්‍රම ප්‍රදේශයේ ධිවනිත ක්‍රමයන් යොදා ගනිමින් රාත්‍රී කාලය තුළ කාන්දු සමීක්ෂණයන් පවත්වමින් කාන්දු අනාවරණය කර ගෙන එම කාන්දු ඒ මොහොතේම අළුත්වැඩියා කිරීම සඳහා කණ්ඩායමක් පත් කරන ලදි. එසේම මාතර, මිරිස්ස, මාලිම්බඩ, වැලිගම, අකුරැස්ස, කරගොඩ උයන්ගොඩ හා මාකඳුර ජල සම්පාදන යෝජනා ක්‍රමයන් තුළද රාත්‍රී කාන්දු සමීක්ෂණයන් සිදු කරන ලදි. සියළුම ජල සම්පාදන යෝජනා ක්‍රමයන් වෙනුවෙන් භූගෝලීය තොරතුරු පද්ධති සිතියම්කරණය සම්පූර්ණ කරනු ලැබ ඇති අතර එම සිතියම් යාවත්කාලීන තත්ත්වයේ පවතී.

ආදායම් රහිත ජලය ඉතා නිවැරදි ලෙස ගණනය කිරීම සඳහා පුනරුත්ථාපන අරමුදල් භාවිතා කරමින් හම්බන්තොට ප්‍රදේශයේ ජලාශයන් තුළ හා තුළු මුව තුළ තොග මනු ස්ථාපිත කරන ලදි.

මෙම විශේෂිත ක්‍රියාකාරකම් සමග සියළුම කලාප තුන තුළම ජලය බෙදා හැරීම වැඩි දියුණු කිරීම්, දෝෂ සහිත මනු ප්‍රති ස්ථාපනය කිරීම්, නීති විරෝධී සම්බන්ධතාවයන්, ශූන්‍ය බිල් පත් හා ඇස්තමේන්තු කරන ලද බිල් පත් පරීක්ෂණයට භාජනය කිරීම් හා ඒ සමගම සැලැසුම් කරන ලද වලක්වා ලීමේ නඩත්තු කටයුතු ඇතුළු ආදායම් රහිත ජලය අඩු කිරීමේ ක්‍රියාකාරකම් නිරන්තරයෙන්ම සියළුම කලාප තුන තුළම ක්‍රියාත්මක කරන ලදි. (මිලි මීටර 63 සිට මිලි මීටර 110 දක්වා වූ විෂ්කම්භයකින් යුත් නල යොදා ගනිමින් කිලෝ මීටර 46 ක මුළු දිගකින් යුත් නල මාර්ග දීර්ඝ කිරීම් සියළුම කලාපයන් තුළ (ගාල්ල කලාපය තුළ කිලෝ මීටර 7.6 ක්, මාතර කලාපය තුළ කිලෝ මීටර 2.4 ක් හා හම්බන්තොට කලාපය තුළ කිලෝ මීටර 36 ක් යනාදී වශයෙන්) ක්‍රියාත්මක කරන ලද අතර වර්තමාන නිෂ්පාදනයේ ඇති සීමා කිරීම් හේතුකොට ගෙන ඇතැම් ජල සම්පාදන යෝජනා ක්‍රමයන්හි නල මාර්ග දීර්ඝ කිරීම් සීමා කරනු ලැබ ඇත.

මාතර කලාපයේ ජල නියැදීන් 7,393 ක මුළු සංඛ්‍යාවක් හා හම්බන්තොට කලාපයේ ජල නියැදීන් 5,495 ක මුළු සංඛ්‍යාවක් ජලයේ ගුණාත්මය දැන ගැනීම සඳහා පරීක්ෂණයට භාජනය කරන ලදි. මෙම ක්‍රියාකාරකම් වලට වැඩිමනත් වශයෙන් තුළු මුව හා ප්‍රභවයන්හි ජල ගුණාත්ම ප්‍රවීක්ෂණ වැඩ කටයුතු නිරන්තරයෙන්ම සිදු කරනු ලබයි. ඊට අමතර ලෙස, තංගල්ල, කිරින්ද, පුහුල්වැල්ල හා මාතර සමූහයේ සහ පිටිගල ජල සම්පාදන යෝජනා ක්‍රමයේ ජල සුරක්ෂිතතා සැලැසුම් වර්ෂය තුළදී ප්‍රගතියක් පෙන්වමින් තිබිණි.

2017 වර්ෂය තුළදී දකුණු ප්‍රදේශය තුළ බොහෝ ග්‍රාමීය ජල සම්පාදන හා සනීපාරක්ෂණ ක්‍රියාකාරකම් මෙහෙයවනු ලැබිණ. මේ යටතේ යක්කලමුල්ල ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රමය ඉදි කිරීමෙන් අනතුරුව ප්‍රාදේශීය සහාව වෙත භාර දීම, පහල මිල්ලෑව ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රමයේ රළු පෙරීමේ පෙරණ ටැංකිය

ඉදි කිරීමට තාක්ෂණික සහාය ලබා දීම මෙන්ම ඕපාත - තවලම ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා සහාය ලබා දීම, ගනේගොඩ දකුණ ග්‍රාමීය ජල සම්පාදන ක්‍රමය සැලැසුම් කිරීම, නෙළුව කළුගල් දෙනිය ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රමය සැලැසුම් කර ඇස්තමේන්තු පිළියෙල කිරීම හා ගං වතුර ආපදාවේ බල පෑමට ගොදුරු වී ඇති ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රම නැවත ඉදි කිරීම සඳහා නෙළුව හා තවලම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන් වෙත මිලි මීටර 63 ක විෂ්කම්භයෙන් යුත් පොලි විනිල් ක්ලෝරයිඩ් (PVC) නල ප්‍රදානය කිරීම ද ගාල්ල කලාපය තුළ සිදු කරන ලදී. තවද ගොඩකොග්ගල කිලෝ මීටර 4.8 ක දුරකට නල වලීමද, මිණිකිරුල ප්‍රජා මූල සංවිධාන ප්‍රදේශය තුළ මීටර 500 ක නල නැවත වලීම හා බරවකුඹුක, දිවුලන්ගැටේ හා වලව මව් නදී සඳහා කිලෝ මීටර 4 ක නල නැවත වලීම ද අධිවේගී මාර්ගය ඉදි කිරීමේ කටයුතු නිසා හම්බන්තොට කලාපය තුළ සිදු කරන ලදී.

2017 වර්ෂය තුළදී දකුණු කලාපය තුළ බොහෝ සංවර්ධන ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කරන ලදී. හපුගල ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය තුළ පෙරණයන් 3 ක් අළුත්වැඩියා කිරීම හා පෙරණ නොසල සැපයීම හා පෙරණ මාධ්‍ය සැපයීම, ගාල්ල කලාපයේ බද්දේගම හා ඇල්පිටියේ කාන්දු අළුත්වැඩියා වැඩ කටයුතු, හපුගල ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයට අයත් මතු පිට පෙට්ටි හා වෑල්ව මැදිරි නඩත්තු කිරීමේ කටයුතු, පරණ මනු ප්‍රති ස්ථාපනය කිරීම හා යතුරු දැමිය හැකි වෑල්ව හා අළුත් මනු කණු සමග නව මනු ස්ථාපනය කිරීම, මතු පිට පෙට්ටි හා වෑල්ව මැදිරි නඩත්තු කිරීමේ කටයුතු, ජල නල මාර්ගය නැවත වලීමෙන් පසු මාර්ග යථා තත්ත්වයට පත් කිරීමේ පිරිවැය ගෙවීම, ජල නල මාර්ගය නැවත වලීමෙන් පසු කන්දෙවත්ත මාර්ගය හා වැකුණගොඩ මාර්ගය යථා තත්ත්වයට පත් කිරීමේ ගාස්තු ගෙවීම හා වාහන මඩුව හා පා පැදි මඩුව ඉදි කිරීම ද ගාල්ල කලාපය තුළ ක්‍රියාත්මක කරන ලද සංවර්ධන කටයුතු වේ.

වාර්ෂික වැඩ සටහන අනුව උකහාගත හැකි ජල පරිමාව වැඩි කර ගැනීම සඳහා සහ අමු ජලය තුළ ඇති යකඩ ප්‍රමාණය අඩු කිරීම සඳහා කරගොඩ උයන්ගොඩ, තිහගොඩ, හක්මන සහ මාකඳුර ජල සම්පාදන යෝජනා ක්‍රමයන්ට අයත් නල ලීං සංවර්ධනය කිරීමේ කටයුතු, අමු ජල ධාරිතාවය වැඩි දියුණු කිරීම සඳහා රදම්පොල අළුතින් ගැඹුරු නල ළිඳක් ඉදි කිරීම හා තිහගොඩ නොගැඹුරු මිහි විදමන් අළුතින් ඉදි කිරීම, වැලිගම ජල සම්පාදන යෝජනා ක්‍රමය සඳහා ජල සුරක්ෂිතතා සැලැසුම පිළියෙල කිරීම, අකුරැස්ස ජල සම්පාදන යෝජනා ක්‍රමයේ සිට මාලිම්බඩ ජල සම්පාදන යෝජනා ක්‍රමය දක්වා දිනකට ජලය ඝණ මීටර 1000 ක් ගෙන යාම සඳහා අකුරැස්ස වටරවුම් පාර ඔස්සේ නල වලීම, ජල සැපයුම වැඩි දියුණු කිරීම සඳහා දෙවිනුවර ජල සම්පාදන යෝජනා ක්‍රමයට අයත් කුමාරදාස මාවත ඔස්සේ හා පට්ටිහේන ප්‍රදේශයේ නල වලීම,අකුරැස්ස ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය වෙත හා ඉසදීන් නගරය හා මිරිස්ස පොම්පාගාරයන් වෙත විදුලි ජනක යන්ත්‍ර සැපයීම හා ස්ථාපනය කිරීම සහ දිනකට ජලය ඝණ මීටර 6000 කින් පොම්ප කිරීමේ ධාරිතාවය වැඩි කිරීම සඳහා කද්දුව තුළු මුවට පොම්ප සපයා ස්ථාපනය කිරීම වර්ෂය තුළදී මාතර කලාපය තුළ ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ක්‍රියාකාරකම් වේ.

අම්බලන්තොට ජල සම්පාදන යෝජනා ක්‍රමයට අයත් ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය නවීකරණය කිරීම, මුරුතවෙල ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය තුළ පරිනාමක පුවරුව ස්ථාපනය කිරීම, හම්බන්තොට කලාපීය කළමනාකාරවරයාගේ කාර්යාලය නවීකරණය කිරීම, නල ගබඩාව ඉදි කිරීම හා තංගල්ල ජල සම්පාදන යෝජනා ක්‍රමයට අයත් දම්වැල් පුරුක් වැට නවීකරණය කිරීම හා නෝනාගම කුළුණට අයත් වැට නව්‍යකරණය කිරීම ද 2017 වර්ෂය තුළදී පුනරුත්ථාපන අරමුදල් යොදා ගනිමින් හම්බන්තොට කලාපය තුළ ක්‍රියාත්මක කරන ලද ක්‍රියාකාරකම් වේ. තවද, හම්බන්තොට කලාපීය කාර්යාලය වෙත පරිගණක ජාල පද්ධතියක් සපයා ස්ථාපනය කිරීම හා හම්බන්තොට කලාපයේ මනු කියවන්නන් වෙත ස්මාර්ට් දුරකථන සපයා භාර දීම ද 2017 වර්ෂය තුළදී සිදු කරන ලදී.

සාධ්‍යතා තත්ත්වයේ ඇති බොහෝ වැඩ සටහන් වල ප්‍රගතියක් දක්නට ඇත. පිටිගල ජල ප්‍රතිකාරක ක්‍රියාවලිය දැනට නිම කරනු ලබමින් පවතින අතර, නෙළුව, ගාල්ල මහ නගර සභා ප්‍රදේශය තුළ ජල සම්පාදන යෝජනා ක්‍රමය හා කරන්දෙනිය ප්‍රදේශය වෙත ජල සම්පාදනය කිරීම පිළිබඳ යෝජනා වෙනුවෙන් වූ කැබිනට් පත්‍රිකාව අනුමැතිය සඳහා ඉදිරිපත් කරනු ලැබ ඇත. විසල් ගාල්ල ජල සම්පාදන යෝජනා ක්‍රමයේ 111 වැනි අදියර සඳහා වූ නව ඇස්තමේන්තුව ව්‍යාපෘති සමාලෝචන කමිටුව විසින් අනුමත කරනු ලැබ ඇති අතර එම යෝජනාව මණ්ඩලයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරනු ලැබ ඇත. මේ අතර මොරවක ජල සම්පාදන යෝජනා ක්‍රමය, උඉරුබොක්ක ජල සම්පාදන යෝජනා ක්‍රමය, මිද්දෙනිය අඟුනකොලපැලැස්ස ඒකාබද්ධ ජල සම්පාදන යෝජනා ක්‍රමය, වීරකැටිය ජල සම්පාදන යෝජනා ක්‍රමය අදියර 11 (ප්‍රතිකාරක යන්ත්‍රාගාරය පුනරුත්ථාපනය කිරීම, තුළු මුව ඉදි කිරීම හා මුරුතවෙල ජල සම්පාදන යෝජනා ක්‍රමය සඳහා බෙදා හැරීමේ කටයුතු වැඩි දියුණු කිරීම්), බරවකුඹුර රෝටේ ජල සම්පාදන යෝජනා ක්‍රමය, රුහුණු පුර අදියර 11 ජල සම්පාදන යෝජනා ක්‍රමය (රිදියගම දිනකට ජලය ඝණ මීටර 17500 ක ධාරිතාවයකින් යුත් ප්‍රතිකාරක යන්ත්‍රාගාරය ඉදි කිරීමට අදාල සාධ්‍යතා වාර්තාව පිළියෙල කිරීම) හා ලුනුගම් වෙහෙර ජල සම්පාදන යෝජනා ක්‍රමය සාධ්‍යතා තත්ත්වයේ පවතී.

සැලැසුම් තත්ත්වයේ පවත්නා ව්‍යාපෘතීන්

ගාල්ලේ පොකුරු ජල සම්පාදන ව්‍යාපෘතිය වැඩි දියුණු කිරීම (යාවත්කාල ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් මිලියන 1595 ක් වේ), වක්වැල්ල වැඩි දියුණු කිරීම, බද්දේගම ජල සම්පාදන යෝජනා ක්‍රමයේ වැඩි දියුණු කිරීම්, කද්දුව තුළු මුව ක්‍රියාත්මක කිරීම, වැලිගම ජල සම්පාදන යෝජනා ක්‍රමයේ හල්ලල ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයේ ධාරිතාවය වැඩි කිරීම, ඇල්ලකන්ද ජල සම්පාදන යෝජනා ක්‍රමයේ දිනකට ඝණ මීටර 5ල000 ක ජල ධාරිතාවයකින් යුත් ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය ඉදි කිරීමේ කටයුතු, වීරකැටිය ජල සම්පාදන යෝජනා ක්‍රමය වෙනුවෙන් පා වෙන තුළු මුවක් ඉදි කිරීම හා ක්‍රියාත්මක වන යන්ත්‍රාගාරය ඉහල ශ්‍රේණිගත කිරීම, අඟුනකොලපැලැස්ස ජල සම්පාදන යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම (යාවත්කාල ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් මිලියන 483 ක් වේ), හා දැනට ක්‍රියාත්මක වෙමින් පවතින රන්න ජල සම්පාදන යෝජනා ක්‍රමය ඉහල ශ්‍රේණිගත කිරීම සහ තිස්සමහාරාම ජල සම්පාදන යෝජනා ක්‍රමයේ ගුණාත්මය හා ධාරිතාවය වැඩි දියුණු කිරීම සඳහා වූ සැලැසුම පිළියෙල කිරීම (යාවත්කාල ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් මිලියන 392 ක් වේ) දැනට සිදු කෙරෙමින් පවතින වැඩ කටයුතු වේ.

පෙර-සාධ්‍යතා තත්ත්වයේ පවතින ව්‍යාපෘතීන්

නාගොඩ ජල සම්පාදන යෝජනා ක්‍රමය, අම්පානගල ජල සම්පාදන යෝජනා ක්‍රමය, දෙයියන්දර ජල සම්පාදන යෝජනා ක්‍රමය, කිරිබ්බන්වැව ජල සම්පාදන යෝජනා ක්‍රමය සහ ලුනුගම් වෙහෙර ඒකාබද්ධ ජල සම්පාදන යෝජනා ක්‍රමය හා අදාල පෙර-සාධ්‍යතා වාර්තාවන් පිළියෙල කරනු ලැබ ඇත.

උතුරු මැද

අවුරුදු උත්සවය, ධර්ම දේශනා පිංකම, සංස්කෘතික සමිතියේ වැඩ සටහන, යාපනය වෙත ගිය වාර්ෂික චාරිකාව, හා ක්‍රිකට් තරඟාවලිය වැනි විශේෂ සිද්ධීන් 2017 වර්ෂය තුළදී උතුරු මැද කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය විසින් ක්‍රියාත්මක කරන ලදී.

ආයතන සංවර්ධන ක්‍රියාකාරකම් වශයෙන් විවිධ පුහුණු වැඩසටහන් හා වැඩ මුළු පවත්වන ලදී. ඒ යටතේ භූගෝලීය තොරතුරු පද්ධතිය පිළිබඳ හුරු කිරීමේ වැඩසටහන (සහභාගි වූවන්ගේ සංඛ්‍යාව 23 කි), තීරණ ගැනීම සඳහා වාණිජ මෙහෙයුම් කළමනාකරණ ක්‍රමය පිළිබඳ දැනුවත් භාවය නංවා ලීමේ වැඩසටහන (සහභාගි වූවන්ගේ සංඛ්‍යාව 70 කි), මහා මාර්ගයේ රථ වාහන ගමනාගමනය හා මහා මාර්ගයේ සංඥා පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන (සහභාගි වූවන්ගේ සංඛ්‍යාව 60 කි), පෞද්ගලික ජේත්තු වීම හා සමාජ හා ව්‍යාපාරික ආචාර රීතීන් පිළිබඳ වැඩසටහන (සහභාගි වූවන්ගේ සංඛ්‍යාව 100 කි), සහභාගිවන්නන් 120 දෙනෙකු වෙනුවෙන් පැවැත්වූ අත් පොම්ප අළුත්වැඩියා කිරීම පිළිබඳ වැඩමුළුව හා සහභාගිවන්නන් 100 දෙනෙකු වෙනුවෙන් පැවැත්වූ 2018 ක්‍රියාකාරී සැලැස්ම පිළිබඳ වැඩමුළුව ද 2017 වර්ෂය තුළදී පවත්වන ලදී. මීට අමතර ලෙස මූල්‍ය අධිකාරී බලය පැවැරීම පිළිබඳ පුහුණු කිරීමේ වැඩසටහන් (සහභාගි වූවන්ගේ සංඛ්‍යාව 60 කි), විගණනය පිළිබඳ වැඩසටහන (සහභාගි

වූවන්ගේ සංඛ්‍යාව 23 කි), මනු කියවීම පිළිබඳ වැඩසටහන (සහභාගි වූවන්ගේ සංඛ්‍යාව 65 කි), කළමනාකරණ සහායකයින් සඳහා වූ වැඩසටහන (මානව සම්පත් - සහභාගි වූවන්ගේ සංඛ්‍යාව 30 කි), මානව සම්පත් කොමිෂන් සභාවේ රාජකාරී හා අදාල පණතේ බලය පිළිබඳ වැඩසටහන (සහභාගි වූවන්ගේ සංඛ්‍යාව 93 කි), සැපයුම් හා ද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ වැඩසටහන (සහභාගි වූවන්ගේ සංඛ්‍යාව 50 කි), ස්මාර්ට් දුරකථන හා කළමනාකරණ තොරතුරු පද්ධතිය පිළිබඳ වැඩසටහන (සහභාගි වූවන්ගේ සංඛ්‍යාව 160 කි), ක්ලෝරිනීකරණයන් ආරක්ෂිත ලෙස භාවිතා කිරීම හා නඩත්තු කිරීම පිළිබඳ වැඩසටහන (සහභාගි වූවන්ගේ සංඛ්‍යාව 140 කි) හා මානව සම්පත් කළමනාකරණය පිළිබඳ වැඩසටහන (සහභාගි වූවන්ගේ සංඛ්‍යාව 31 කි) යන වැඩසටහන් 2017 වර්ෂය තුළ සතුටුදායක ලෙස පවත්වන ලදි. පුහුණු වැඩසටහන් වෙනුවෙන් වැය කරන ලද මුළු පිරිවැය රුපියල් 283,810.00 ක් පමණ විය.

විශේෂයෙන්ම ජපාන ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනයේ (JICA) 11 වැනි අදියරේ නව ව්‍යාපෘතීන් වෙනුවෙන් හා පොලොන්නරුවට නැගෙනහිරින් පිහිටි නගර ජල සම්පාදන ව්‍යාපෘතිය, විසල් අනුරාධපුර හා විසල් ත්‍රිකුණාමලය ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය, එප්පාවල රාජාංගනය, නොච්චියාගම හා හිරිබාව ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය හා අනුරාධපුර දකුණ 11 වැනි අදියර ජල සම්පාදන ව්‍යාපෘතිය වෙනුවෙන් වූ ඉඩම් අත්පත් කර ගැනීම් සිදු වෙමින් පැවැතිනි. ඉහතින් සඳහන් කරන ලද ව්‍යාපෘතීන් වෙනුවෙන් දැනටමත් බිම් කොටස් හැට පහක් හඳුනා ගනු ලැබ ඇත.

2017 වර්ෂය අතරතුරදී උතුරු මැද කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය භාරයේ පැවැති මුළු වත්කම් වල අගය රුපියල් මිලියන 11,652 ක් බව සොයා ගනු ලැබිණි. වාර්ෂික වත්කම් සමීක්ෂණය ද 2017 වර්ෂය තුළදී නිම කරන ලදි. කලා වැව හා රණවිරුගම ජල සම්පාදන යෝජනා ක්‍රමයන් වෙනුවෙන් ප්‍රාග්ධනය සපයන ලද අතර මින්නේරිය හා මැදිරිගිරිය ජල සම්පාදන ව්‍යාපෘතීන් අඩ වශයෙන් නිම කරනු ලැබ ඇත.

අනුරාධපුර කලාප කළමනාකාර කාර්යාලයේ හා පොලොන්නරුව කලාප කළමනාකාර කාර්යාලයේ අධීක්ෂණය යටතේ ජල සම්පාදන යෝජනා ක්‍රම 30 ක සංඛ්‍යාවක් ක්‍රියාත්මක වෙමින් තිබිණි. 2017.12.31 වැනි දිනට මුළු සම්බන්ධතා සංඛ්‍යාව 114,351 ක් විය. 2017 වර්ෂය තුළ පමණක් දෙන ලද නව සම්බන්ධතා සංඛ්‍යාව 6ල665 ක් විය. 2017 දෙසැම්බර් මාසය දක්වා වූ බිල් කිරීමේ ඉලක්කය රුපියල් 963,456,000.00 ක් වූ අතර එය සාක්ෂාත් කර ගැනීම රුපියල් 1,119,865,000.00 ක් විය. ඒ අතර 2017 දෙසැම්බර් මාසය දක්වා මුදල් රැස් කිරීමේ ඉලක්කය රුපියල් 1,067,604,000.00 ක් වූ අතර එය සාක්ෂාත් කර ගැනීම රුපියල් 1,176,737,000.00 ක් විය.

රසායනාගාර පහසුකම් හා ජල ගුණාත්මය පසුවිපරම් කිරීමේ ක්‍රියාකාරකම් ජාත්‍යන්තර ප්‍රමිතිකරණ සංවිධාන (ISO) - 17025 ලබා ගැනීම සඳහා වැඩි දියුණු කරනු ලැබ ඇත. උතුරු මැද පලාතේ උතුරු කොට්ඨාශයේ සියළුම යෝජනා ක්‍රමයන් විසින් අමු ජලය ලබාගන්නේ භූගත ජල ප්‍රභවයන්ගෙන් හා මල්වතු ඔයේ මතුපිට ජලයෙන් වන හෙයින් (උදාහරණ වශයෙන් ක්ෂාරීයතාවය, කඨිනත්වය සහ ෆ්ලෝරයිඩ් ආදී) ඇතැම් ජල ගුණාත්ම පරාමිතීන් ඉඩ දිය හැකි මට්ටමට වඩා ඉහල මට්ටමක තිබිණි. නියං කාලයන් තුළ ළිං වලින් ලබා ගත හැකි ජලය ප්‍රමාණවත් නොවන හෙයින් ඇතැම් ජල සම්පාදන යෝජනා ක්‍රමයන් යටතේ පැය 24 ක ජල සම්පාදනයක් ලබා දීම කළ නොහැක්කක් විය. කෙසේ වුවද ප්‍රමාණවත් සේවා මට්ටමක් පවත්වාගෙන යා හැකි විය. තුරුවිල ජල සම්පාදන යෝජනා ක්‍රමය වෙනුවෙන් ජල සුරක්ෂිතතා සැලැසුම හා ජල සුරක්ෂිතතා සැලැසුමේ පශ්චාත් තක්සේරුව සම්පූර්ණ කරනු ලැබ ඇත. තුරුවිල ජල සම්පාදන යෝජනා ක්‍රමය සම්බන්ධයෙන් වූ ජල සුරක්ෂිතතා සැලැසුම් විගණනය ලෝක සෞඛ්‍ය සංවිධානයේ සහාය සහිතව නිම කරන ලද අතර නුවරවැව, ඉහලගම, ශුද්ධ නගරය හා එප්පාවල යෝජනා ක්‍රමයන්ට අදාල ජල සුරක්ෂිතතා සැලැසුම් පිළියෙල කරනු ලබමින් පැවැතිනි. මූලික භෞතික, රසායනික හා බැක්ටීරියාවේදීය ගුණාත්ම විශ්ලේෂණයන් කලාපය පුරාම ක්‍රියාත්මක කරන ලද අතර එම විශ්ලේෂණයන්ට බැර ලෝහ හා ඇල්ගී අන්තර්ගතයන් ආවරණය කර ගැනීම සඳහා ත්‍රෛමාසික පදනමකින් ක්‍රියාත්මක කරන ලද වැව් වල ජලයේ ගුණාත්ම විශ්ලේෂණයන් ද ඇතුළත් වේ.

කලාපීය කර්මාන්ත ශාලාවට හා වාණිජ අංශයට කරන ලද වැඩි දියුණු කිරීම් වැනි ඵලදායිතා නංවා ලීමේ ක්‍රියාකාරකම් ද ක්‍රියාත්මක කරන ලදි. 2017 වර්ෂයේ ලෝක ජල දිනය හා සමගාමී ලෙස පවත්වන ලද තරඟයන්හිදී හොඳම කර්මාන්ත ශාලාව වශයෙන් අනුරාධපුර කර්මාන්ත ශාලාව සම්මානය හිමි කර ගත් අතර, වාණිජ අංශයන් අතර පවත්වන ලද තරඟයෙන් අනුරාධපුර වාණිජ අංශය දෙවැනි ස්ථානය දිනා ගත්තේය.

ප්‍රස්තුත වර්ෂයේ අවසානය වන විට ප්‍රජා මූල සංවිධානයන් විසින් මෙහෙයවනු ලබන ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රම 284 ක සංඛ්‍යාවක් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය යටතේ ලියාපදිංචි වී තිබිණි. බොහෝ ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රමයන් වෙත ග්‍රාමීය ජල සම්පාදන අංශය විසින් තාක්ෂණික උපදෙස් සපයනු ලැබ තිබිණි. ප්‍රජා මූල සංවිධානයන්ට අමතර වශයෙන්, අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ ප්‍රජා ජල සම්පාදන දෙපාර්තමේන්තුව විසින් ආරම්භ කරනු ලබන ග්‍රාමීය ජලය හා බැඳුන ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් ප්‍රධාන තාක්ෂණික උපදේශක ලෙස කටයුතු කරනු ලබන්නේ දිස්ත්‍රික් ග්‍රාමීය ජල සම්පාදන ඒකකය විසිනි. ප්‍රජා මූල සංවිධාන නිලධාරීන්, ග්‍රාම නිලධාරීන්, සංවර්ධන නිලධාරීන් හා සාමාන්‍ය මහජනතාව වෙනුවෙන් පොලොන්නරුව දිස්ත්‍රික්කයේදී පුහුණු වැඩසටහන් 04 ක් මෙහෙයවන ලදි. තවද වර්ෂය තුළදී පොලොන්නරුව දිස්ත්‍රික්කය තුළ විලෝම ආශ්‍රැති යන්ත්‍රාගාර 162 ක් හා ජල ටැංකි 337 ක් ස්ථාපිත කරනු ලැබ ඇත.

මිහි විදමන් ඉදි කිරීමේ මෙහෙයුම් 71 ක සංඛ්‍යාවක් ද, අත් පොම්ප ස්ථාපිත කිරීම් වකක් ද, ළිං සෝදා පිරිසිදු කිරීම් 417 ක සංඛ්‍යාවක් ද, අත් පොම්ප අළුත්වැඩියා කිරීම් 421 ක සංඛ්‍යාවක් ද, අත් පොම්ප පුනරුත්ථාපනය කිරීම් 8 ක සංඛ්‍යාවක් ද, සාධ්‍යතා අධ්‍යයනයන් 64 ක සංඛ්‍යාවක් හා විස්තරාත්මක පටක වේදීය විමර්ෂණයන් 84 ක සංඛ්‍යාවක් හා එසේම පොලොන්නරුව හා අනුරාධපුර දිස්ත්‍රික්කයන්හි ප්‍රාදේශීය සභා කාර්ය මණ්ඩල සාමාජිකයින් සඳහා දැනුවත් කිරීමේ වැඩ සටහන් දෙකක් ද ඇතුළු භූගත ජලය හා සම්බන්ධ ක්‍රියාකාරකම් ගණනාවක් 2017 වර්ෂය තුළදී ක්‍රියාත්මක කරන ලදි. ග්‍රාමීය ජල සම්පාදන හා සනීපාරක්ෂණ ක්‍රියාකාරකම් දියුණු කිරීම හා ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයන් හා ගබඩාවන් දියුණු කිරීම සඳහා කොන්ත්‍රාත්තු පහලොවක සංඛ්‍යාවක් ප්‍රදානය කරන ලදි. හඳුනා නොගත් හේතූන් නිසා ඇති වන නිදන්ගත වකුගඩු රෝග අරමුදල් යටතේ තවත් කොන්ත්‍රාත්තු 10 ක් ප්‍රදානය කරනු ලැබ ඇත. පොලොන්නරුවට නැගෙනහිරින් පිහිටි නගර වෙනුවෙන් වූ ජල සම්පාදන ව්‍යාපෘතියට අදාල ටෙන්ඩරය ද ප්‍රදානය කරනු ලැබ ඇත. තඹුත්තේගම ජල සම්පාදන යෝජනා ක්‍රමයට අදාල ණය ගිවිසුම අත්සන් කරනු ලැබ ඇති අතර ව්‍යාපෘතියේ වැඩ කටයුතු ආරම්භ කරනු ලැබ ඇත.

වයඹ

වයඹ කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය යටතේ ක්‍රියාත්මක වන විවිධ අංශයන් 2017 වර්ෂය තුළදී බොහෝ සංවර්ධන හා වැඩි දියුණු කිරීම් ක්‍රියාකාරකම් සඳහා සිය සහභාගිත්වය ලබා දී ඇත. ආංශික ක්‍රම සම්පාදන අංශය විසින් කටුපොත - බමුණාකොටුව ඒකාබද්ධ ජල සම්පාදන යෝජනා ක්‍රමය, මැල්සිරිපුර ජල සම්පාදන යෝජනා ක්‍රමය, බිංගිරිය - පන්නල - උඩුබද්දාව ජල සම්පාදන ව්‍යාපෘතිය, හලාවත ජල සම්පාදන ව්‍යාපෘතිය පියවර 11 සහ කල්පිටිය ලාවණ්‍යය ඉවත් කිරීමේ ජල සම්පාදන ව්‍යාපෘතියට ද අදාල ව්‍යාපෘති යෝජනාවන් ද යාවත්කාල ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් බිලියන 64 ක් වූ වඳුරාපිනූ ඇල ජලාශය හා සම්බන්ධ සාධ්‍යතා වාර්තාව ද පිළියෙල කරනු ලැබ ඇත.

වයඹ කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය වශයෙන් ආසියානු සංවර්ධන බැංකුව විසින් අරමුදල් සපයනු ලබන හලාවත ජල සම්පාදන ව්‍යාපෘතිය පියවර 11 (රුපියල් බිලියන 7.2), පුත්තලම ජල සම්පාදන ව්‍යාපෘතිය පියවර 11 (රුපියල් බිලියන 15), කටුපොත ජල සම්පාදන ව්‍යාපෘතිය (රුපියල් බිලියන 18) හා හන්ගේරිය විසින් අරමුදල් සපයනු ලබන බිංගිරිය ජල සම්පාදන යෝජනා ක්‍රමය (රුපියල් බිලියන 10) ඇතුළු ජල සම්පාදන යෝජනා ක්‍රමයන් වෙනුවෙන් ආධාර ප්‍රතිඥාවන් ලබා ගැනීමට අපට හැකි විය.

ක්‍රම සම්පාදන හා සැලැසුම් අංශය විසින් හඳුනා නොගත් හේතූන් නිසා ඇති වන නිදන්ගත වකුගඩු රෝගය, පුරනැගුම හා ප්‍රති ආරෝපනය කළ හැකි අරමුදල් යටතේ ක්‍රියාකාරකම් කිහිපයක් සම්පූර්ණ කරනු ලැබ ඇත. සිතියම් නිර්මාණය කිරීමේ වැඩ කටයුතු නිම කිරීමෙන් අනතුරුව සියළුම ක්‍රියාත්මක යෝජනා ක්‍රමයන් ජාල ආකෘතිකරණය කිරීම වයඹ කලාපීය සහාය සේවා මධ්‍යස්ථානයේ සුවිශේෂ ජයග්‍රහණයක් සේ සැලැකිය හැකි වේ. 2017 වර්ෂයේ අවසානයත් සමග නාරම්මල, වාරියපොල, රම්බඩගල්ල, දොඩම්ග ස්ලන්ද හා මාහෝ / නිකවැරටිය යන සියළුම ජල සම්පාදන යෝජනා ක්‍රමයන් මෙහෙයුම් හා නඩත්තු අංශය වෙත භාර දීමට අපට හැකි විය.

2017 වර්ෂය තුළදී වයඹ කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය විසින් නගර සැලැසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය යටතේ ප්‍රාග්ධන අරමුදල් යොදා ගනිමින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘතීන් කිහිපයක් ආරම්භ කරනු ලැබ ඇත. මෙම ව්‍යාපෘතීන් ආරම්භ කරනු ලැබ ඇත්තේ නගර සැලැසුම්, හඳුනා නොගත් හේතූන් නිසා ඇති වන නිදන්ගත වකුගඩු රෝගය පිළිබඳ වැඩසටහන්, ග්‍රාමීය ජල සම්පාදන වැඩසටහන්, RWH වැඩසටහන් හා උපයෝජ්‍යතා විතැන් කිරීමේ ව්‍යාපෘතීන් වශයෙන් වන අතර ඒවා සඳහා කරනු ලැබ ඇති වෙන් කිරීම් පිළිවෙලින් රුපියල් මිලියන 140 ක්, රුපියල් මිලියන 125 ක්, රුපියල් මිලියන 37 ක්, රුපියල් මිලියන 2 ක් හා රුපියල් මිලියන 26.05 ක වේ.

වයඹ කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය විසින් ප්‍රධාන වශයෙන්ම ජල ප්‍රතිකාරක කටයුතු හා පොම්ප කිරීමේ කටයුතු වෙනුවෙන් විදුලි බලය සඳහා දල වශයෙන් රුපියල් මිලියන 120 ක මුදලක් වැය කරනු ලබයි. කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය විසින් බල ශක්ති සංරක්ෂණ අරමුදලින් වෙන් කර ගන්නා ලද රුපියල් මිලියන 2.4 ක පිරිවැයක් ආයෝජනය කරමින් කුරුණෑගල ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයෙහි එක් බල ශක්ති සංරක්ෂණ ව්‍යාපෘතියක් දියත් කරනු ලැබ ඇති අතර 2017 වර්ෂයේදී ඒ හරහා රුපියල් මිලියන 0.66 ක ඉතිරියක් සාක්ෂාත් කර ගත හැකි විය. ගිරිඋල්ල ජල සම්පාදන යෝජනා ක්‍රමය තුළ යාන්ත්‍රික හා විද්‍යුත් අංශයේ අරමුදල් වලින් වෙන් කර ගත් රුපියල් මිලියන 0.5 ක් ආයෝජනය කරමින් මට්ටම් පසුවිපරම් හා දුරස්ථ මෙහෙයුම් ක්‍රමයක් ක්‍රියාත්මක කරන ලද අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් (ප්‍රජා මූල සංවිධාන මෙහෙයුම්කරුවන් තිදෙනෙකුගේ සේවය අවසන් කරමින්) 2017 වර්ෂය තුළදී රුපියල් මිලියන 0.65 ක් ඉතිරි කර ගත හැකි විය.

කුරුණෑගල ඉහල ඔසොව් පොම්ප කිරීමේ ස්ථානයේ එකක් හා දෙවැන්න නිකවැරටිය ජල සම්පාදන යෝජනා ක්‍රමය තුළ ද යනාදී වශයෙන් වසරකට රුපියල් මිලියන 3.5 ක මුදල් ඉතිරි කිරීමක් ඉලක්ක කරමින් ආදායම් රහිත ජල අය වැය ලේඛනය යටතේ රුපියල් මිලියන 1.8 ක ආයෝජනයකින් ක්‍රියාත්මක කිරීම සඳහා තවත් ව්‍යාපෘතීන් දෙකක් 2017 වර්ෂය තුළදී සම්පූර්ණ කිරීම සඳහා සැලැසුම් කරනු ලැබ ඇත. කෙසේ වුවද වැඩබිම් වල පවත්නා තත්ත්වයන් හේතුකොට ගෙන එකී ව්‍යාපෘතීන් දෙක 2018 වර්ෂයේ 1 වැනි කාර්තුව තුළදී සම්පූර්ණ කරනු ලැබීමේ අපේක්ෂාවෙන් කල් තබනු ලැබ ඇත. තවද, වර්ෂය තුළදී ගිරිඋල්ල, ආනමඩුව හා පන්නල යන ජල සම්පාදන යෝජනා ක්‍රමයන්ට ස්වයංක්‍රියකරණ පද්ධතීන් එකතු කිරීමද සිදු කරන ලදි.

මෙහෙයුම් හා නඩත්තු අංශය විසින් පද්ධති වැඩි දියුණු කිරීම් කිහිපයක් ක්‍රියාත්මක කරන ලදි. ඒවා නම් නාත්තන්ඩියේ ප්‍රතිකාරක ක්‍රම වැඩි දියුණු කිරීම හා හලාවත, ආනමඩුව, නාරම්මල, අලව්ව, ආඩිගම හා දොඩම්ගස්ලන්ද යන ප්‍රදේශයන්හි අළුත් මිහි විදමන් ඉදි කිරීමත් වේ. 2017 වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද ආදායම් රහිත ජලය අඩු කිරීම යටතේ වූ එක් ක්‍රියාකාරකමක් වන්නේ සියළුම සම්බන්ධතාවයන් ඉහල ඝණත්වයේ පොලි එතිලින් නල යොදාගෙන පමණක් දීමට ගත් තීරණය හා ඒ අනුව කාකපල්ලියේ හා නිකවැරටියේ සම්බන්ධතාවයන් සියල්ලේ නල ඉහල ඝණත්වයේ පොලි එතිලින් නල යොදාගනිමින් ප්‍රති ස්ථාපනය කිරීම සඳහා නියමු ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම ද වන්නේය. මීට වැඩිමනත් වශයෙන් මුළු කලාපය පුරාම නව සම්බන්ධතාවයන් දීම සඳහා කිලෝමීටර 20 ක පමණ නල මාර්ග දීර්ඝ කිරීම් ක්‍රියාත්මක කරනු ලැබ ඇත.

මාස 6 ක් මුළුල්ලේ පැවැති උග්‍ර නියං තත්ත්වයේ දැඩි බලපෑමට වයඹ පලාත භාජනය විය. කෙසේ වුවද කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය ඒකකයක් වශයෙන් එකී තත්ත්වයට සාර්ථක ලෙස මුහුණ දුන්නේය. සමස්ත කලාපය පුරාම අබන්ඩ ලෙස ජල සම්පාදනය සැපැයීම සහතික කිරීම සඳහා ගන්නා ලද ක්‍රියාකාරකම් ස්වල්පයක් වශයෙන් කාකපල්ලිය, කුරුණෑගල හා දන්කොටුව තුළු මුවයන්ගේ ගැටළු සඳහා විසඳුම් ලබා දීම, පීවීසී ටැංකි බෙදා හැරීම, බවුසර මඟින් ජලය සැපැයීම, පීඩන නල මාර්ගය මාහෝ සිට ගල්ගමුව වෙත හැරවීම හා වාරියපොල හිර කපොල්ල ඉවත් කිරීම ආදිය පෙන්වා දිය හැකිවේ.

නිකවැරටිය, නෙළුම් පොකුණ හා වාරියපොල යන යෝජනා ක්‍රමයන් තුළ ජල සුරක්ෂිතතා සැලැසුම් ක්‍රියාත්මක කරන ලද අතර එම වැඩසටහන් වලට සහභාගි වූ පරදු ධාරීන් විශාල සංඛ්‍යාව මඟින් ජල අංශය මත වූ සමාජ හා ගුණාත්ම බලපෑම හඳුනා ගැනීමට හැකි වූ හෙයින් එකී වැඩසටහන් බෙහෙවින් ප්‍රතිඵලදායක විය.

2017 වර්ෂය තුළදී ග්‍රාමීය ජල සම්පාදන අංශය විසින් දැදුරු නදීගම හා රාගගෙදර ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රමයන් සාර්ථක ලෙස නිම කොට ජලය සම්පාදනය කිරීමේ කටයුත්තෙහි යොදවනු ලැබ ඇත. වයඹ කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය වෙත වයඹ පලාත තුළ ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රමයන් 12 ක් ක්‍රියාත්මක කිරීම සඳහා වයඹ සංවර්ධන අමාත්‍යාංශය වෙතින් රුපියල් මිලියන 250 ක මුදලක් ලැබී ඇත.

2017 වර්ෂය තුළදී විවිධ අංශයන් තුළ විවිධ වැඩි දියුණු කිරීම් කිරීමට වයඹ කලාපීය සහාය සේවා මධ්‍යස්ථානයට හැකියාව ලැබුණි. ඒවා අතර ජංගම යෙදවුම යොදා ගනිමින් මනු කියවීම, වයඹ කලාපීය සහාය සේවා මධ්‍යස්ථානයේ ටෙන්ඩර ලියවිලි හා ලියුම් පිළියෙල කිරීම සඳහා භාවිතා කිරීමට ක්‍රියාත්මක තත්ත්වයේ ඇති දත්ත සංචිතයන් නිර්මාණය කිරීම හා විවිධ ඉදි කිරීම් ක්‍රියාකාරකම් ද විය. ප්‍රස්තුත වර්ෂය තුළදී කුරුණෑගල කලාපීය ගබඩාවේ හා හලාවත ගබඩාවේ වැඩි දියුණු කිරීම් රාශියක් ක්‍රියාත්මක කරන ලද අතර ඒ සමගම නව ගබඩාවන් දෙක තුළ ඉන්වෙන්ටරි කළමනාකරණ ක්‍රමය ද ස්ථාපිත කරන ලදි. 2017 වර්ෂය තුළදී සාක්ෂාත් කර ගන්නා ලද විශේෂ ජයග්‍රහණයක් වශයෙන් ආදායම් රහිත ජල ඒකකය පිහිටුවා ගැනීම ද සඳහන් කළ හැකි වේ. එම ඒකකය යටතේ ක්‍රියාත්මක වෙමින් පවතින නල ජාලයන් සිතියම් කිරීම හා ද්‍රාව විශ්ලේෂණ කටයුතු ක්‍රියාත්මක කිරීම මෙන්ම ආදායම් රහිත ජලය හා කාන්දු වීම් නිවැරදි බවට පැමිණවීම ක්‍රියාත්මක කරනු ලැබ ඇත. ආයතන සංවර්ධන ක්‍රියාකාරකම් වශයෙන් කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය සඳහා නව ගොඩනැගිල්ලක් ඉදි කිරීම පිණිස ගෘහ නිර්මාණ ශිල්පීය සැලැසුමක් පිළියෙල කිරීම, ප්‍රමිතිකරණය සඳහා වූ ජාත්‍යන්තර සංවිධාන (ISO) ක්‍රියාවලිය ආරම්භ කිරීම, කලාපීය සහාය සේවා මධ්‍යස්ථාන පරිශ්‍රය තුළ හා ගොඩනැගිලිවල වැඩි දියුණු කිරීම් ක්‍රියාත්මක කිරීම, වාරියපොල භූගත ජල අංශය වෙත අතිරේක ඉඩම් ලබා ගැනීම මෙන්ම ප්‍රමිතිකරණය සඳහා වූ ජාත්‍යන්තර සංවිධාන (ISO) ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම, ජල ප්‍රතිකාරක ක්‍රියාවලිය, ඉන්වෙන්ටරි කළමනාකරණ ක්‍රමය, ජල CAD යොදා ගනිමින් ජාල ආකෘතිකරණය කිරීම හා මනු කියවන්නන් වෙනුවෙන් ජංගම දුරකථන යෙදවුම යොදා ගැනීම යනාදී විෂයයන් සම්බන්ධයෙන් අභ්‍යන්තර පුහුණුකිරීම් වැඩසටහන් මෙහෙයවීමද ප්‍රස්තුත වර්ෂය තුළදී ක්‍රියාත්මක කරන ලදි.

මධ්‍යම

මධ්‍යම කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය විසින් 2017 නව වර්ෂයේ වැඩ කටයුතු ආරම්භ කරන ලද්දේ මධ්‍යම කලාපීය නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරයාගේ මග පෙන්වීම අනුව සියළුම කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ සහභාගිත්වයෙන් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ඉලක්කයන් සාක්ෂාත් කර ගැනීමට හැකි වේවායි යන ප්‍රාර්ථනයත් සමග මධ්‍යම කලාපීය සහාය සේවා මධ්‍යස්ථාන කාර්යාලය තුළ පවත්වන ලද ආගමික ක්‍රියාකාරකම් සමඟිනි. සැලැසුම් කරන ලද ක්‍රියාකාරකම් ගණනාවක්ම 2017 වර්ෂය තුළදී සැලැසුම් කරන ලද ආකාරයෙන් ක්‍රියාත්මක කළ හැකි විය. මෙම වර්ෂය තුළදී මුළු ජල සම්පාදන සම්බන්ධතා සංඛ්‍යාව මිලියන 1.1 ක ප්‍රතිලාභීන් සමග 260ල862 ක් දක්වා ඉහලට ගෙන ඒමට හැකි වූ අතර එම ප්‍රතිලාභීන් සංඛ්‍යාව මධ්‍යම පලාතේ ජන ගහණයෙන් 40% ක් ආවරණය කරයි.

ආදායම් රහිත ජලය අඩු කිරීම සඳහා හඳුනා ගනු ලැබූ ක්‍රියාමාර්ගයන් යටතේ ක්‍රියාමාර්ගයන් කිහිපයක් ක්‍රියාත්මක කරන ලදි. මහනුවර දකුණ ජල සම්පාදන යෝජනා ක්‍රමය යටතට වැටෙන අඟුනාවල ප්‍රදේශය තුළ රාත්‍රී ප්‍රවාහ පරීක්ෂණ හා තල පරීක්ෂණ ක්‍රියාත්මක කරන ලදි. රාත්‍රී කාන්දු සමීක්ෂණ ක්‍රියාවලිය සිදු කිරීමේදී කිලෝ මීටර 41 ක පමණ බෙදා හැරීමේ නල මාර්ග ආවරණය කරන ලදි. කළමනාකරුවන්ගේ හා ප්‍රාදේශීය ඉංජිනේරුවරුන්ගේ ඉල්ලීම මත සිදු කරන ලද කාන්දු සමීක්ෂණය තුළදී අදෘෂ්‍යමාන කාන්දු වීම් 170 කට අධික සංඛ්‍යාවක් අනාවරණය කර ගන්නට හැකි විය. ජල සම්පාදන යෝජනා ක්‍රමයන් තුළ ඇති තොග මනු වල තත්ත්වය දැක්වෙන චාර්තාවක් පිළියෙල කරන ලද අතර සියළුම කලාපයන් තුන තුළම තොග මනු හා වෑල්ව ස්ථාපිත කිරීම සඳහා වූ ටෙන්ඩර ලිපි ලේඛන දැනට පිළියෙල කරනු ලබමින් පවතී. මහනුවර උතුරු කලාපයේ හාරිස්පත්තුව, පොල්ගොල්ල හා අකුරන ප්‍රදේශයන් තුළ හා මහනුවර දකුණු කලාපයේ දවුලගල, ගන්නෝරුව, අඟුනාවල හා ගම්පොල යන ප්‍රදේශයන් තුළ කාන්දු අළුත්වැඩියා කිරීමේ කොන්ත්‍රාත්තු දැනට ක්‍රියාත්මක කරනු ලබමින් පවතී. ඊරියගම කලාපය තුළ ක්‍රියාත්මක කිරීමට නියමිත ආදායම් රහිත ජලය අඩු කිරීමේ වැඩ සටහන සඳහා අවශ්‍ය ද්‍රව්‍ය සැපයීම සඳහා වූ ටෙන්ඩරය ප්‍රදානය කරනු ලැබ ඇති අතර සිවිල් වැඩ සම්බන්ධ ලේඛනය පිළියෙල කිරීම දැනට සිදු වෙමින් පවතී.

බල ශක්ති සංරක්ෂණය කිරීම හරහා මෙහෙයුම් කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීම සඳහා ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන ක්‍රියාකාරකම වූයේ මධ්‍යම කලාපීය සහාය සේවා මධ්‍යස්ථානයේ ප්‍රධාන කාර්යාලයේ කිලෝ වොට් 58 ක සූර්ය බල පුවරු පද්ධතිය ස්ථාපිත කොට ක්‍රියාත්මක කිරීමයි. සූර්ය බල පුවරු පද්ධතිය ස්ථාපිත කොට ක්‍රියාත්මක කිරීමට පෙර මධ්‍යම කලාපීය සහාය සේවා මධ්‍යස්ථානයේ ප්‍රධාන කාර්යාලයේ විදුලි බිල මසකට රුපියල් 150,000.00 ක් වූ අතර, එය ක්‍රියාත්මක කිරීමෙන් පසුව එහි මාසික විදුලි බිල රුපියල් 30,000.00 දක්වා පහත වැටුනි. අනාගතයේදී සමස්ත විදුලි බිලම මේ ක්‍රමය භාවිතාවෙන් ආවරණය කිරීමට අපේක්ෂා කරනු ලැබේ. අරත්තන ජල සම්පාදන යෝජනා ක්‍රමය තුළ රසායනික මාත්‍රා ක්‍රමය ස්ථාපිත කිරීම වෙනුවෙන් වන ටෙන්ඩර ලිපි ලේඛන අගැයීම මහනුවර නැගෙනහිර කලාපයේ සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇත. මහනුවර දකුණු කලාපය තුළ ඇල්පිටියේ තැළු මුව ස්ථාපිත කිරීම සඳහා වූ ටෙන්ඩරය ප්‍රදානය කරනු ලැබ ඇති අතර තලවකැලේ පොම්ප සවි කිරීමේ වැඩ කටයුතු සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇත. මාතලේ ජල සම්පාදන යෝජනා ක්‍රමය සඳහා වූ ඉහල ඔසොව් පොම්පය සවි කිරීම හා පොල්ගොල්ල ජල සම්පාදන යෝජනා ක්‍රමයේ සර්ජන බඳුන හා හුවන පොම්පය ස්ථාපිත කිරීම සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇත. පොල්ගොල්ලේ තැළු මුව පොම්පය සවි කිරීමේ කටයුතු දැනට සිදු කරනු ලබමින් පවතී. පවත්නා අරමුදල් හිඟය නිසා මහනුවර දකුණු හා මහනුවර උතුරු කලාපයන් තුළ ලේඛන කිහිපයක් රඳවා තබාගනු ලැබ ඇත.

පොම්ප සඳහා වූ සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටිය, කාන්දු අනාවරණය කර ගැනීම, මනු කියවන්නන් දැනුවත් කිරීමේ වැඩසටහන්, ව්‍යාත්තීය සෞඛ්‍යය හා ආරක්ෂිතභාවය, කොන්ත්‍රාත්තු කළමනාකරණය, සූර්ය බල ශක්තිය පිළිබඳව දැනුවත් වීම හා මයික්‍රොසොෆ්ට් ප්‍රවේශය ආදී මාතෘකා යටතේ වූ අභ්‍යන්තර පුහුණුකිරීම් වැඩසටහන් කිහිපයක් එක් දින වැඩසටහන් වශයෙන් කලාපය තුළ මෙහෙයවනු ලැබිණි. නල වැද්දුම්කරුවන් වෙනුවෙන් වූ පුහුණු වැඩසටහන් හා ශ්‍රමිකයින් පිළිබඳ දැනුවත් වීමේ හා ක්ලෝරිනීකරණයන් නඩත්තු කිරීම පිළිබඳව දැනුවත් වීමේ වැඩසටහන් දෙදින පුහුණු කිරීම් වැඩසටහන් වශයෙන් මෙහෙයවන ලද්දේය.

ජලයේ ගුණාත්මය හා ජලාධරයන්හි ජල පරිමාව වැඩි දියුණු කිරීම යන මාතෘකාවන් යටතේ වූ තෝරාගත් වැඩසටහන් කිහිපයක් ක්‍රියාත්මක කරන ලදි. උඩතැන්න ජල සම්පාදන යෝජනා ක්‍රම ප්‍රදේශය තුළ වැසිකිලි ඉදි කිරීමේ අවශ්‍යතාවය සහිත ගෘහස්තයන් 332 ක සංඛ්‍යාවක් හඳුනා ගන්නා ලද අතර වැසිකිලි 50 ක් ඉදි කිරීම සඳහා සැලැසුම් සකස් කරනු ලැබිණි. ඒවායේ ඉදි කිරීම් වැඩ කටයුතු වලින් ආසන්න වශයෙන් 90% ක් පමණ නිම කරනු ලැබ ඇත. අරත්තන ජල සම්පාදන යෝජනා ක්‍රමය වෙත අමු ජලය ලබා ගනු ලබන ජලාධරයේ සනීපාරක්ෂණ තත්ත්වය වැඩි දියුණු කිරීමේ කටයුතු වැසිකිලි පහක් ඉදි කිරීම මගින් ආරම්භ කරන ලදි.

සෑම යන්ත්‍රාගාරයක්ම සෑම මසක් තුළදීම ජලයේ ගුණාත්මය පිරික්සා බැලීම සඳහා කලාපීය රසායනඥයා විසින් පරීක්ෂණයට බඳුන් කරනු ලැබේ. ජල සුරක්ෂිතතා සැලැසුමේ උපදෙස් අනුව සෑම කලාපයකම ජලය බැර ලෝහ අන්තර්ගතය සම්බන්ධයෙන් පසුවිපරමට භාජනය කරනු ලැබේ. උතුරු මහනුවර රසායනාගාර පහසුකමේ ධාරිතාවය pH මිණුම් උපකරණ, පටල ප්‍රවාහ හා රසායනික අම්ලකර ඉල්ලුම් පාචකයන් (COD digesters) වැනි උපකරණ සැපයීම මගින් නංවා ලන ලදි. මහනුවර නැගෙනහිර කලාපය තුළ නව කලාපීය රසායනාගාරයක් ස්ථාපිත කරන ලද අතර ඒ වෙනුවෙන් රසායනාගාර උපකරණ මිළයට ගැනීම සිදු කරනු ලබමින් පවතී.

භූගත ජල ප්‍රභවයන් සංවර්ධනය කිරීම සඳහා ආසන්න වශයෙන් ද්‍රව භූ විද්‍යාත්මක විමර්ෂණයන් 40 ක් පමණ පැවැත්වීම ද, ළිං 4 ක සංඛ්‍යාවක් සෑරීම ද, ළිං 50 ක පමණ සංඛ්‍යාවක් සෝදා පවිත්‍ර කිරීම ද, අත් පොම්ප 70 කට අධික සංඛ්‍යාවක් පුනරුත්ථාපනය කිරීම හා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ යෝජනා ක්‍රම 4 ක් තුළ භූගත ජලය කළමනාකරණය කිරීමේ වැඩ සටහන් මෙහෙයවීම ද යන ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කරන ලදි. මිහි විදමන් විදීම හා උඩතැන්න ජල සම්පාදන යෝජනා ක්‍රමය තුළ විමර්ෂණයන් සිදු කිරීම ද දැනට ක්‍රියාත්මක කරමින් පවතී.

ජල සුරක්ෂිතතා සැලැසුමට අදාල ක්‍රියාකාරකම් 2017 වර්ෂය තුළදීද දිගටම ක්‍රියාත්මක කරනු ලබමින් පැවැතිණි. දැනට විසල් මහනුවර ජල සම්පාදන යෝජනා ක්‍රමය හා රිකිල්ලගස්කඩ ජල සම්පාදන යෝජනා ක්‍රමය 07 වැනි පියවරේද, අරත්තන හා හැටන් ජල සම්පාදන යෝජනා ක්‍රමයන් 05 වැනි පියවරේද, පොල්ගොල්ල ජල සම්පාදන යෝජනා ක්‍රමය 03 වැනි පියවරේද, හාරගම, මස්කෙලිය හා තලවකැලේ ජල සම්පාදන යෝජනා ක්‍රමයන් 02 වැනි පියවරේද පවතී. නාවලපිටිය හා උලපනේ ජල සම්පාදන යෝජනා ක්‍රමයන්ගේ ජල සුරක්ෂිතතා සැලැසුම් වලට අදාල කටයුතුද දැනට කරගෙන යමින් පවතී.

විල්ගමුව, ලග්ගල/පල්ලේගම, ගලේවෙල, නාඋල හා දඹුල්ල යන හඳුනා නොගත් හේතූන් නිසා ඇති වන වකුගඩු රෝගයට ගොදුරු වී ඇති ප්‍රදේශයන් තුළ නියැදි විශ්ලේෂණ කටයුතු ක්‍රියාත්මක කරනු ලබමින් පවතී. ප්‍රජා ජල සම්පාදන යෝජනා ක්‍රමයන් 06 ක සංඛ්‍යාවක් තුළ ජල නියැදි විශ්ලේෂණ කටයුතු සිදු කරනු ලැබ ඇත. ප්‍රජා මූල සංවිධානයන් තිස් හතක් වෙත තාක්ෂණික උපදෙස් හා පුහුණු වැඩ සටහන් මගින් අවශ්‍ය පහසුකම් සම්පාදනය කර දෙන ලදි. මාතලේ දිස්ත්‍රික්කයේ ප්‍රජා මූල සංවිධාන 50 ක් අතර ක්ලෝරිනීකරණ හා RCI පරීක්ෂණ කට්ටල බෙදා දෙන ලද අතර ප්‍රජා මූල සංවිධානයන් 08 ක් තුළ ඒවා ස්ථාපිත කිරීමේ කටයුතුද නිම කරනු ලැබ ඇත. එම ප්‍රජා මූල සංවිධානයන් 08 ප්‍රජා මූල සංවිධාන ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කරවා ලියාපදිංචි ප්‍රජා මූල සංවිධාන වශයෙන් යාවත්කාලීන කරන ලදි. නුවරඑලිය දිස්ත්‍රික්කයේ නව ප්‍රජා මූල සංවිධානයන් 03 ක් වෙනුවෙන් ඇස්තමේන්තු පිළියෙල කරන ලද අතර ප්‍රජා මූල සංවිධාන 10 ක සංඛ්‍යාවක් වෙත තාක්ෂණික උපදෙස් ලබා දෙන ලදි. එසේම මාතලේ දිස්ත්‍රික්කයේ පාසැල් තුනක් තුළ විලෝම ආශ්‍රැති යන්ත්‍රාගාර 03 ක් ස්ථාපිත කරන ලදි. පාඨශාලා 09 ක් තුළ හා තාක්ෂණික විද්‍යාලයයන් 03 ක් තුළ ජලය හා සනීපාරක්ෂණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩ සටහන් පවත්වන ලදි.

වාණිජ ක්‍රියාකාරකම් වැඩි දියුණු කිරීම සඳහා වැඩසටහන් කිහිපයක් හඳුන්වා දෙන ලදි. මනු කියවීම සඳහා ස්මාර්ට් දුරකථන බෙදා දෙන ලද අතර තැපැල් කාර්යාලයන් තුළ බිල් ගෙවීමේ මධ්‍යස්ථානයන් විවෘත කරන ලදි. ස්මාර්ට් දුරකථන භාවිතා කිරීම සම්බන්ධයෙන් මනු කියවන්නන් වෙනුවෙන් පුහුණු කිරීමේ වැඩසටහනක් මෙහෙයවන ලදි. තොරතුරු ලැබුන සැනින් දෝෂ සහිත මනු ප්‍රති ස්ථාපනය කිරීම සඳහා වූ වැඩ පිළිවෙලක් දකුණු මහනුවර හා උතුරු මහනුවර යන කලාපයන් තුළ ආරම්භ කරනු ලැබ ඇත. ජල මනු වල වයස විශ්ලේෂණයක් වළඹෙන වසර තුළදී ක්‍රියාත්මක කරනු ලැබීමට නියමිතව තිබේ. ඇස්තමේන්තු කරන ලද බිල් පත් නිකුත් කිරීම අවම කිරීමේ අරමුණින් දැනට විශ්ලේෂණයක් ක්‍රියාත්මක කරමින් යනු ලැබේ. නීති විරෝධී සම්බන්ධතාවයන් අනාවරණය කර ගැනීමේ පරීක්ෂණ ක්‍රියා පටිපාටිය ශක්තිමත් කිරීම සඳහා දැනට සැලැසුම් සකස් කරනු ලැබ ඇත. විසන්ධි කරනු ලැබ ඇති පාරිභෝගිකයින් විසින් ජලය භාවිතා කරන අන්දම හෙළි කර

ගැනීම සඳහා කරනු ලබන අහඹු පරීක්ෂා කිරීම් ද සිදු කරනු ලැබ ඇත. ඉහල මුදල් ප්‍රමාණයන් හිඟ හිටවා ඇති ගණුදෙනුකරුවන්ට ලබා දෙන සේවාව විසන්ධි කිරීමට පෙර ඔවුනට ඒ බව දැනුම් දීමට කටයුතු කරන ලදි.

ගණුදෙනුකරුවන් වෙතින් ලැබෙන පැමිණිලි සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ කාර්යය වාණිජ නිලධාරී වරයාගෙන්, ඉංජිනේරු සහකාරවරයාගෙන් හා සම්බන්ධීකරණ ඉංජිනේරුවරයාගෙන් සමන්විත වගකිව යුතු නිලධාරීන් තුන් දෙනෙකුට පැවරීම මගින් එම ක්‍රියා පටිපාටිය වඩාත් ශක්තිමත් කරන ලදි. ගණුදෙනුකරුවන්ගේ පැමිණිලි සම්බන්ධයෙන් පසුවිපරම් කිරීම සඳහා නව තොරතුරු තාක්ෂණ වැඩසටහන ක්‍රියාත්මක කරන ලද්දේය.

පොල්ගොල්ල ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයේ යන්ත්‍රාගාරය වැඩි දියුණු කිරීමේ වැඩ කටයුතු දැනට ක්‍රියාත්මක කරනු ලබමින් පවත්නා අතර මාතලේ තුළු මුව වැඩි දියුණු කිරීමේ කටයුතු සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇත. ඇල්පිටිය ජල සම්පාදන යෝජනා ක්‍රමයේ නල වලීමේ වැඩ කටයුතු දැනට ක්‍රියාත්මක කරනු ලබමින් පවතී. තලවාකැලේ, මාතලේ සහ කුණ්ඩසාලේ ජල සම්පාදන යෝජනා ක්‍රමයන්ට අදාලව සැලැසුම් කරන ලද ඉදි කිරීම් කටයුතු කිහිපයක් අරමුදල් හිඟ වීම හේතුකොට ගෙන අතරමග නතර වී ඇත. බලගොල්ල ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය පුනරුත්ථාපනය කිරීමේ වැඩ කටයුතු සඳහා වූ ටෙන්ඩර් ලිපි ලේඛන සූදානම් කිරීමේ කටයුතු නිම කරන ලදි. මැද දුම්බර ජල සම්පාදන යෝජනා ක්‍රමයට අදාල බෙදා හැරීමේ පද්ධතිය පුනරුත්ථාපනය කිරීමේ වැඩ කටයුතු දැනට සිදු කරනු ලබමින් පවතී. බලන - මොටාන ජල සම්පාදන යෝජනා ක්‍රමය සම්බන්ධතාවයන් 400 ක් ලබා දීම සඳහා ක්‍රියාත්මක තත්ත්වයට පත් කරන ලදි.

දේශීය බැංකු අරමුදල් යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘතීන් සම්බන්ධයෙන් බලන කල ලග්ගල හා විල්ගමුව ජල සම්පාදන ව්‍යාපෘතිය ඉදි කිරීම් ක්‍රියාකාරකම් ආරම්භ කරනු ලැබ ඇත. ප්‍රංශ සංවර්ධන ඒජන්සිය විසින් අරමුදල් සපයනු ලබන විසල් මාතලේ ව්‍යාපෘතිය සැලැසුම් කටයුතු කෙරෙමින් ඉදිරියට යමින් පවතී. කුණ්ඩසාලේ හාරගම ජල සම්පාදන ව්‍යාපෘතිය හා නානුඔය ජල සම්පාදන ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ලංසු කරුවන් සමග කොන්ත්‍රාත්තු සංසන්ධි කතිකාවන් දැනට සිදු කරගෙන යනු ලබමින් පවතී. මහනුවර උතුර පාතදුම්බර ජල සම්පාදන ව්‍යාපෘතිය වෙනුවෙන් වූ ණය ගිවිසුම අත්සන් කරනු ලැබ ඇත. ජල සම්පාදන ආවරණය පිළිබඳ ඇතැම් වැඩි දියුණු කිරීම් නුවරඑලිය දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක වන ජල සම්පාදනය හා සනීපාරක්ෂණය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය විසින් දැනට ක්‍රියාත්මක කරනු ලබමින් පවතී.

මෙම වර්ෂය තුළදී මණ්ඩලයේ අනුමැතිය ලැබුණ නව ජල සම්පාදන ව්‍යාපෘතීන් තුන හා සම්බන්ධයෙන් ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීම සඳහා ලිපි ඉදිරිපත් කරනු ලැබ ඇත. මේ වර්ෂය තුළ තවත් ජල සම්පාදන ව්‍යාපෘතීන් දෙකක් දියත් කිරීම වෙනුවෙන් වූ තවත් සාධ්‍යතා වාර්තාවන් දෙකක් පිළියෙල කරනු ලබමින් තිබෙන අතර ජල සම්පාදන ව්‍යාපෘතීන් හතරක් දැනට ආරම්භක අදියර තුළ පවතී.

අන්‍යොන්‍ය සහයෝගි තාවය හා කාර්ය මණ්ඩල සාමාජිකයින් අතර ඇති සම්බන්ධතාවයන් වැඩි දියුණු කිරීමේ පරමාර්ථයෙන් මධ්‍යම කලාපීය සහාය සේවා මධ්‍යස්ථානයේ සුබ සාධක සමිතිය විසින් බොහෝ අවස්ථාවන් සංවිධානය කරන ලද්දේය. ඒ අතර වූ ඇතැම් සිද්ධීන් වන්නේ වෛද්‍ය කඳවුර, සර්ව රාත්‍රික පරිත්‍රාණ ධර්ම දේශනය හා දානමය පුණ්‍ය කර්මය, වෙසක් ධර්ම දේශනා පිං කම හා දන්සැල, බෝධි පූජා, ලේ දන් දීමේ වැඩ සටහන හා අන්තර් කලාපීය ක්‍රිකට් තරඟ මාලාවයි.

මේ අතර මධ්‍යම කලාපීය සහාය සේවා මධ්‍යස්ථානයේ සේවයේ නියුක්තව සිටින නිලධාරීන් දෙදෙනෙකු වූ බී ජී ඊ. ධනසේන හා ඩී එම් එස් එස්. දිසානායක විසින් මීටර් 800, මීටර් 400, මීටර් 200 හා මීටර් 1500 යන මලල ක්‍රීඩා ඉසවු තුළ ජාතික හා ජාත්‍යන්තර මට්ටමේදී (චීනයේදී) ශ්‍රී ලංකාව නියෝජනය කරමින් තරඟ වැදී පදක්කම් කිහිපයක් දිනාගනු ලැබ ඇත.

විල්ගමුව යන්ත්‍රාගාරය

සබරගමුව

සබරගමුව පලාත තුළ තල පසුවිපරම් ක්‍රමය ස්ථාපිත කිරීම හා රත්නපුර කලාපයේ පොම්පාගාරයේ බල සාධකය නිවැරදි කිරීම සඳහා විදුලි බල ධාරක බැංකු ස්ථාපිත කිරීම වැනි බල ශක්ති සංරක්ෂක ක්‍රියාකාරකම් කිහිපයක් ක්‍රියාත්මක කරන ලදි. මෙම ව්‍යාපෘතීන් වෙනුවෙන් වැය කළ සම්පූර්ණ පිරිවැය රුපියල් මිලියන 11.2 ක් විය. සියළුම ව්‍යාපෘති 2017 වර්ෂයේ අවසානය වන විට සම්පූර්ණයෙන් නිම කරන ලදි. තල පසුවිපරම් ක්‍රමය හරහා ඉතිරි වන වක්‍ර ඉතිරියට අමතර ලෙස ඉතිරි වෙතැයි අපේක්ෂිත මාසික ඉතිරිය රුපියල් 120,000.00 කි. ටැංකි වල අන්තර්ගත ජලය පිටාර යාමට ඉඩ නොදී පාලනය කිරීම ආරක්ෂිත පානීය ජලය, බල ශක්තිය, කාලය හා කාර්යක්ෂමතාවය ඉතිරි කර ගැනීමට හේතු වෙයි. රත්නපුර හා කෑගල්ල කලාපයන් තුළ ඇති සියළුම ජල සම්පාදන යෝජනා ක්‍රමයන්ට අදාල පොම්ප හා උපකරණ සම්බන්ධයෙන් නිවැරදි ලෙස පිළියෙල කරන ලද වැඩ සටහනකට අනුව නිවාරණ නඩත්තු කටයුතු ක්‍රියාත්මක කරන ලදි. ජලය බෙදා හැරීම වැඩි දියුණු කිරීම්, පොදු නල ප්‍රති ස්ථාපනය කිරීම, හානි වූ වෑල්ව වෙනුවට නව වෑල්ව යෙදීම, අළුත් වෑල්ව මැදිරි ඉදි කිරීම, නල මාර්ග ප්‍රති ස්ථාපනය කිරීම හා සම්බන්ධතා මාරු කිරීම ආදී ආදායම් රහිත ජල පරිමාව අඩු කිරීමේ ක්‍රියා මාර්ගයන් රාශියක් ක්‍රියාත්මක කරන ලදි.

කලාපය තුළ හා කලාපීය සහාය සේවා මධ්‍යස්ථාන කාර්යාලය තුළ ඵලදායිතාවය වැඩි දියුණු කිරීමේ ක්‍රියාකාරකම් ද ක්‍රියාත්මක කරන ලද අතර මූලික ඵලදායිතා සංකල්පයන් පිළිබඳව දැනුවත් භාවය ඇති කිරීමේ වැඩ සටහන් ඒවාට ඇතුලත් විය. මූලික **"5 S"** සංකල්පයන්ට "ආරක්ෂාව" සංකේතවත් කරමින් තවත් එක් **"S"** එකක් එකතු කරමින් මදක් වෙනස් කරන ලද අතර එහි ප්‍රතිඵලය වූ **"6 S"** වැඩ සටහන් කලාපයේ කාර්යාලයන් තුළ ක්‍රියාත්මක කරන ලදි.

"6 S" තරඟය ආරම්භ කරන ලද අතර එය ඵලදායිතා වැඩි දියුණු කිරීමේ ක්‍රියාකාරකම් සමග සමගාමී ලෙස ක්‍රියාත්මක කරගෙන යන ලදි. රත්නපුර හා කෑගල්ල කලාපයන් තුළ ක්‍රියාත්මක වන ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයන් තුළ ගුණාත්ම කළමනාකරණ ක්‍රමය ක්‍රියාත්මක කිරීම ද ආරම්භ කරන ලදි. මෙම ක්‍රියාකාරකම් වල අවසානාත්මක ඉලක්කය වන්නේ කලාපය තුළ ක්‍රියාත්මක වන දිනකට ජලය ඝණ මීටර 10000 කට වැඩි ධාරිතාවයකින් යුත් ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයන් වෙනුවෙන් ජාත්‍යන්තර ප්‍රමිති සංවිධාන (ISO) 9001 - 2008 සහතිකය ලබා ගැනීම වේ.

ජල සුරක්ෂිතතා සැලැසුම් ක්‍රියාත්මක කිරීම 2015 වර්ෂය තුළදී ආරම්භ කරන ලද අතර එය 2017 වර්ෂය තුළදී ද දිගටම ක්‍රියාත්මක කරන ලදි. මෙම වැඩ සටහන සඳහා නියමු ව්‍යාපෘතිය වශයෙන් තෝරා ගන්නා ලද්දේ ඇහැලියගොඩ ජල සම්පාදන යෝජනා ක්‍රමයයි. මෙම වැඩ සටහන යටතේ කාබනික වගාව, රුක් සිටුවීමේ වැඩ සටහන් හා ජලාධර ප්‍රදේශය තුළ ජීවත් වන ජනතාව වෙත සනීපාරක්ෂණ පහසුකම් සම්පාදනය කොට දීම වැනි ජලාධර ආරක්ෂක ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කරන ලදි. මෙම ක්‍රියාකාරකම් වලට වැඩිමනත් වශයෙන් දිය පාරේ රක්ෂිතය වෙන් කිරීම හා පැල්මඩුල්ල සහ කොලොන්න යන ජල සම්පාදන යෝජනා ක්‍රමයන්ගේ ජලාධර ප්‍රදේශය තුළ ජීවත් වන මිනිසුන් වෙත සනීපාරක්ෂණ පහසුකම් සපයා දීම ද සිදු කරන ලදි. ව්‍යාපෘතිය සඳහා වැය වූ මුළු පිරිවැය රුපියල් මිලියන 3.7 ක් විය.

ජල ප්‍රතිකාරක ක්‍රියාවලිය හා ජල සම්පාදනය පිළිබඳ දැනුම, සංකල්ප හා ආකල්ප නංවා ලීමේ පරමාර්ථයෙන් ඵලදායිතාවය, ගුණාත්ම කළමනාකරණ ක්‍රමය, ජල නල කාර්මික පුහුණුව හා වෙනත් දැනුවත් භාවය නංවා ලීමේ වැඩ සටහන් වලට අදාල පුහුණු වැඩ සටහන් දහ හතක් 2017 වර්ෂය තුළදී කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය තුළ පවත්වන ලදි. රසායනාගාර සඳහා පිළිගැනීම් කිරීම 2015 වර්ෂය තුළදී ආරම්භ කරන ලද අතර 2017 වර්ෂය තුළදී ද දිගටම කරගෙන යන ලදි.

ප්‍රස්තුත වර්ෂය තුළදී කෑගල්ල කලාපය තුළ ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රම 48 ක් හා රත්නපුර කලාපය තුළ ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රම 51 ක් ආවරණය කරමින් ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රම කිහිපයක් වෙත අවශ්‍ය තාක්ෂණික සහාය ලබා දෙන ලදි. 2017 වර්ෂය තුළදී ක්‍රියාත්මක කරන ලද අනිකුත් ඇතැම් ක්‍රියාකාරකම් වන්නේ කලාපයන් තුළ ක්‍රියාත්මක වන ප්‍රජා මූල සංවිධාන යෝජනා ක්‍රමයන්ට අදාල දත්ත රැස් කිරීම හා ප්‍රජා මූල සංවිධාන යෝජනා ක්‍රමයන්ගේ ජල ගුණාත්ම පරීක්ෂණ මෙහෙයවීම ද වේ. මීට වැඩිමනත් වශයෙන් ග්‍රාමීය ජල අංශය විසින් ලෝක බැංකු අරමුදල් යටතේ ක්‍රියාත්මක වන ජල සම්පාදන හා සනීපාරක්ෂණ වැඩි දියුණු කිරීම් ව්‍යාපෘතිය විසින් ක්‍රියාත්මක කරනු ලබන පුනරුත්ථාපන ක්‍රියාකාරකම් වලට ද සිය සහාය ලබා දෙන ලදි.

තවද රත්නපුර හා කෑගල්ල කලාපයන් තුළ ක්‍රියාත්මක කරන ලද නල මාර්ග දීර්ඝ කිරීම් වල සමස්ත දිග ප්‍රමාණය පිළිවෙලින් කිලෝ මීටර 19 ක් හා කිලෝ මීටර 12 ක් විය. එසේම කලාපීය සහාය සේවා මධ්‍යස්ථාන කොට්ඨාශය තුළ 2017 වර්ෂය තුළදී දෙන ලද සම්බන්ධතා සංඛ්‍යාව 5342 කි.

භූගෝලීය තොරතුරු පද්ධතිය (GIS) අනුව ක්‍රියාත්මක කරනු ලබන සිතියම් පිළියෙල කිරීමේ කටයුත්ත කෑගල්ල හා රත්නපුර කලාපයන් තුළ දිගටම ක්‍රියාත්මක වෙමින් පවතී. භූගෝලීය තොරතුරු පද්ධතිය (GIS) අනුව සිතියම් පිළියෙල කිරීම පිළිබඳ පුහුණු වැඩ සටහනක් 2017 වර්ෂයේ නොවැම්බර් 24 වැනි දින සිට 29 වැනි දිනය දක්වා රත්නපුර පුස්තකාල ශාලාවේදී මෙහෙයවන ලදි.

දේශීය අරමුදල් යටතේ රත්නපුර හා කෑගල්ල කලාපයන් දෙක පුරාම ප්‍රස්තුත වර්ෂය තුළදී ක්‍රියාත්මක කරන ලද නල මාර්ග දීර්ඝ කිරීමේ ව්‍යාපෘති සඳහා වැය කරන ලද මුළු පිරිවැය රුපියල් මිලියන 295 ක් වේ. වැඩ සටහන සඳහා වෙන් කරන ලද මුළු මුදල රුපියල් මිලියන 82 කි. වර්ෂය අවසානය වන විට වැඩ සටහනේ ප්‍රගතිය ආසන්න වශයෙන් 80% ක් පමණ විය.

2017 වර්ෂය තුළදී කෑගල්ල කලාපය තුළ බොහෝ ඉදි කිරීම් ක්‍රියාකාරකම් සිදු කරන ලද අතර ඒවා වෙනුවෙන් අවසන් ගෙවීම් හා රඳවා ගැනීම් සඳහා ප්‍රාග්ධන අරමුදල් යටතේ රුපියල් මිලියන 11.3 ක මුදලක් ගෙවිය යුතුව ඇති අතර රුපියල් මිලියන 13.6 ක මුදලක් උපයෝජ්‍යතා විතැන් කිරීමේ අරමුදල් යටතේ ගෙවිය යුතුව ඇත. ආසන්න වශයෙන් පවුල් 1000 ක් වෙත ජලය සපයා දීම සඳහා ගෝනගල ජල සම්පාදන යෝජනා ක්‍රමය සැලැසුම් කරනු ලැබ ඇති අතර කෑගල්ල නගරය තුළ නිරන්තරයෙන් සිදු වන නල පුපුරා යාම් අවම කිරීමේ පරමාර්ථයෙන් කෑගල්ල නගරය තුළ නල මාර්ග විතැන් කිරීමේ කටයුතු ක්‍රියාත්මක කිරීමට සැලැසුම් කරනු ලැබ ඇත. එම කාර්යයන් සඳහා ගෙවිය යුතු ශේෂ ගෙවීම් කිරීම සඳහා වැය කළ යුතුව ඇති මුදල් ප්‍රමාණය ආසන්න වශයෙන් රුපියල් මිලියන 3.0 ක් වේ.

ගලිගමුව ජල සම්පාදන යෝජනා ක්‍රමයේ ඉදි කිරීම් වැඩ කටයුතු ආරම්භ කරනු ලැබ ඇති අතර එය සැලැසුම් කරනු ලැබ ඇත්තේ 48450 ක ජනතාවක් වෙත ජලය සම්පාදනය කර දීම සඳහා වේ. එසේම ලෝක බැංකු අරමුදල් යටතේ ආරම්භ කරන ලද පඹහින්න ජල සම්පාදන ව්‍යාපෘතියේ ඉදි කිරීම් කටයුතු ද ආරම්භ කරනු ලැබ ඇති අතර එම ව්‍යාපෘතිය සැලැසුම් කරනු ලැබ ඇත්තේ සබරගමුව විශ්ව විද්‍යාලයයට හා 18200 ක ජනතාවකට ජලය සම්පාදනය කර දීමේ අපේක්ෂාවෙනි. මෙම ව්‍යාපෘතීන් දෙකම ක්‍රියාත්මක කරන ලද්දේ ලෝක බැංකු අරමුදල් යටතේ ක්‍රියාත්මක වන ජල සම්පාදන හා සනීපාරක්ෂණ වැඩි දියුණු කිරීම් ව්‍යාපෘතීන් යටතේ වන්නේය.

කොරියාවේ අපනයන ආනයන බැංකුවේ අරමුදල් සම්පාදනය යටතේ ක්‍රියාත්මක වීමට නියමිත විසල් රුවන්වැල්ල ජල සම්පාදන යෝජනා ක්‍රමයේ යන්ත්‍රාගාර සැලැසුම් කිරීම හා ඉදි කිරීමේ කොන්ත්‍රාත්තුව සඳහා ලංසු කැඳවන ලද්දේය. ලංසු අගැයීම දැනට සිදු කරනු ලබමින් පවතී.

2016 වර්ෂය තුළදී කෑගල්ලේ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට විශාල අභියෝගයකට මුහුණ දීමට සිදු විය. විනම් නාය යාම් වල බල පෑමට ගොදුරු වී සිටි හා තවත් නාය යාම් සිදු වීමේ අවදානමක් ඇති හෙයින් වෙනත් ස්ථානයන්හි පදිංචි කරවනු ලැබ සිටි ආසන්න වශයෙන් පවුල් 2000 කට පමණ ජලය සැපැයීමේ අභියෝගයයි. සංක්‍රමණ මධ්‍යස්ථානයන් වෙත ජලය සම්පාදනය කිරීම හා බල පෑමට ලක් වී සිටි පුද්ගලයින් නැවත පදිංචි කරන ලද ස්ථානයන් සඳහා ජල සම්පාදන යෝජනා ක්‍රමයන් ඉදි කිරීම සමග මෙම ක්‍රියාවලිය දිගටම ක්‍රියාත්මක කරන ලදි. 2016 වර්ෂයේ මැද භාගයේදී ආසන්න වශයෙන් පවුල් 2000 ක් පමණ කෑගල්ල දිස්ත්‍රික්කයේ ග්‍රාම නිලධාරී වසම් 11 කට වැඩි සංඛ්‍යාවක් තුළ නැවත පදිංචි කිරීම සිදු කරන ලදි. එම කඩිනම් නැවත පදිංචි කරවීමේ වැඩ සටහන එක්සත් ජාතීන්ගේ ළමා අරමුදලේ (UNICEF) මූල්‍ය සහාය යටතේ සම්පූර්ණ කරන ලද්දේය. අංක wum/16/1840/714/036 හා 2016.09.27 දින දරන කැබිනට් පත්‍රිකාව අනුව කෑගල්ල දිස්ත්‍රික්කයේ නාය යාම් උවදුරට ගොදුරු වූ තැනැත්තන් නැවත පදිංචි කරවනු ලැබූ ගම් වෙත ජල සම්පාදන පහසුකම් සැපැයීම සඳහා රුපියල් මිලියන 455 ක මුදල් ප්‍රමාණයක් ප්‍රදානය කරන ලද්දේය. 2017 වර්ෂය සඳහා වූ ක්‍රියාත්මක සැලැසුමට අනුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 6 ක් තුළ ජල සම්පාදන යෝජනා ක්‍රම 11 ක් වෙනුවෙන් වූ සැලැසුම් ව්‍යාපෘතිය විසින් ආවරණය කරන ලද අතර ඒ සඳහා කරන ලද මුදල් වෙන් කිරීම රුපියල් මිලියන 158 ක් විය.

ඉහතින් සඳහන් කරනු ලැබ ඇති ක්‍රියාකාරකම් වලට වැඩිමනත් වශයෙන් වෙනත් බොහෝ සිද්ධීන් ද කෑගල්ල හා රත්නපුර කලාපයන් තුළ හා සබරගමුව කලාපීය සේවා මධ්‍යස්ථාන කාර්යාලය තුළ ද සිදු විය. ලෝක ජල දිනය සැමැරීමේ උත්සවය, විවිධ ස්ථාන තුළ පවත්වන ලද ජංගම සේවාවන්, ක්‍රිකට් තරඟ මාලාව හා ප්‍රිය සාද අවස්ථාවන් ද එම සිද්ධීන් අතර වූ ඇතැම් ඒවා වේ.

මාවනැල්ල ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය

උඟව

කාර්ය මණ්ඩලය දැනටමත් බදුල්ල දෙමෝදර ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාර පරිශ්‍රය තුළ ඉදි කරන ලදුව 2017 සැප්තැම්බර් මස 27 වැනි දින විවෘත කරනු ලැබූ කලාපීය සහාය සේවා මධ්‍යස්ථාන ප්‍රධාන කාර්යාලයේ නව ගොඩනැගිල්ලට ගොස් ඇත. ඇතැම් යෝජනා ක්‍රමයන් තුළ ජල ගුණාත්මය පිළිබඳ ගැටළු ද මතු වූ අතර, තුළු මුව වලට තිබි බාධක ඉවත් කිරීම, බොර භාවය අඩු කිරීම හා කුඩා ජල සම්පාදන යෝජනා ක්‍රමයන් තුළ ක්ලෝරිනීකරණ උපකරණ ස්ථාපිත කිරීම වැනි ප්‍රතිකාර්මික ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කරන ලදි. හපුතලේ ජල සම්පාදන යෝජනා ක්‍රමය, බදුල්ල ජල සම්පාදන යෝජනා ක්‍රමය හා දියතලාව ජල සම්පාදන යෝජනා ක්‍රමය හා අදාලව ජලාධර ආරක්ෂා කිරීමේ පියවර ගැනීම සිදු කරන ලදි. ඒ අතර බල ශක්ති සංරක්ෂණ ක්‍රියාකාරකම් ද ක්‍රියාත්මක කරන ලදි.

වර්ෂය තුළදී ක්‍රියාත්මක කරන ලද ඇතැම් බල ශක්ති සංරක්ෂණ ක්‍රියා මාර්ගයන් වූයේ ගාස්තු ක්‍රමය හා අනුගත වෙමින් විදුලි පිරිවැය අඩු කිරීම, අකාර්යක්ෂම පොම්ප ප්‍රති ස්ථාපනය කිරීම හා විදුලි බල ඉල්ලුම උපරිම තත්ත්වයේ පවත්නා කාල වේලාවන් තුළදී පොම්ප කිරීමේ කටයුතු වලින් වැලැකී සිටීමත් වේ. විදුලි බල පිරිවැය අඩු

කිරීමේ ක්‍රියා මාර්ගයන්ට වැඩිමනත් වශයෙන් සියළුම පොම්ප කිරීමේ ස්ථානයන් තුළ නිවාරණ නඩත්තු කටයුතු ක්‍රියාත්මක කිරීම මගින් නඩත්තු කිරීමේ පිරිවැය හා පොම්ප අක්‍රීය තත්ත්වයේ පවතින කාල වේලාවන් ද අඩු කරනු ලැබ ඇත. වැලිමඩ ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය තුළ ඉහල ඔසොව් පොම්ප හා විදුලි බල ධාරක පුවරුවක් ස්ථාපිත කරනු ලැබ ඇත. ඒ අතර වෙනස් කළ හැකි වේග ධාවක (VSD) පොම්පයක් මොණරාගල ස්ථාපිත කරනු ලැබ ඇත. එසේම නව කලාපීය සහාය සේවා මධ්‍යස්ථාන කාර්යාල ගොඩනැගිල්ලේ සූර්ය බල ශක්ති පුවරු සවි කරනු ලැබ ඇත.

බුත්තල ජල සම්පාදන යෝජනා ක්‍රමය වෙත අධීක්ෂණාත්මක පාලන හා දත්ත ලබා ගැනීමේ ක්‍රමය (SCADA system) හඳුන්වා දීම, මහියංගන ජල සම්පාදන ව්‍යාපෘතිය හා බදුල්ල හාලිඇල ඇල්ල ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය වර්ධනය කිරීම හා ආදායම් රහිත ජල පරිමාව මිණීම සඳහා තොග මනු ලබා දීම, පැරණි වෑල්ව ප්‍රතිස්ථාපනය කිරීම, කාන්දු අනාවරණය කර ගැනීමේ උපකරණයක් ලබා දීම, දැනට ක්‍රියාත්මක වන ගෘහ සම්බන්ධතාවයන්ගේ දෝෂ නිදොස් කිරීම, පොදි නල ප්‍රති ස්ථාපනය කිරීම හා පැරණි නල මාර්ග නැවත වැලීම කලාපීය සහාය සේවා මධ්‍යස්ථාන කොට්ඨාශය තුළ ක්‍රියාත්මක කරන ලද ආදායම් රහිත ජලය අඩු කිරීමේ ක්‍රියා මාර්ගයන් වේ.

බදුල්ලේ රත්කිඳ, අගලඔය හා වෙහෙරගලතැන්න ජල සම්පාදන යෝජනා ක්‍රමයන් තුළ හා මොණරාගල කුමාරපුර ජල සම්පාදන ව්‍යාපෘතියේ ද නල මාර්ග දීර්ඝ කිරීමේ වැඩ කටයුතු සිදු කරන ලදි.

ප්‍රති ආරෝපණය කිරීමේ ක්‍රියාකාරකම් යටතේ වලදලුව නිල නිවාස පුනරුත්ථාපනය කිරීම (භෞතික ප්‍රගතිය 20% කි), බණ්ඩාරවෙල ජල සම්පාදන යෝජනා ක්‍රමයේ උමා ඔය ව්‍යාපෘතියේ බල පෑමට ලක් වූ ප්‍රදේශයන් තුළ නල මාර්ග වැලීම (භෞතික ප්‍රගතිය 30% කි) හා වෙහෙරගලතැන්න සඳහා ප්‍රජා මූල සංවිධාන සේවා කොන්ත්‍රාත්තු (භෞතික ප්‍රගතිය 25% කි) සහ මකුලැල්ල සඳහා ප්‍රජා මූල සංවිධාන සේවා කොන්ත්‍රාත්තු (භෞතික ප්‍රගතිය 75% කි) ද ක්‍රියාත්මක කරන ලදි.

උමාඔය දුෂ්කරතා අඩු කිරීමේ ජල සම්පාදන ව්‍යාපෘතිය යටතේ (ප්‍රති ආරෝපණය කිරීමේ ක්‍රියාකාරකම්) මකුලැල්ල ජල සම්පාදන යෝජනා ක්‍රමය, කුරුදුගොල්ල ජල සම්පාදන යෝජනා ක්‍රමය හා වෙහෙරගලතැන්න ජල සම්පාදන යෝජනා ක්‍රමය ක්‍රියාත්මක වේ. මෙම ව්‍යාපෘතිය මකුලැල්ල, බඹරගම, අඹදන්ඩෙගම. එගොඩගම, වෙහෙරගලතැන්න, හීල්ඔය හා පල්ලෙපේරුව යන ප්‍රදේශයන් තුළ ජල සම්බන්ධතාවයන් 2500 ක් සපයා දීමට අපේක්ෂා කරයි. මේ සඳහා වූ මුළු පිරිවැය ඇස්තමේන්තුව රුපියල් මිලියන 443 ක් වේ. 2017 වර්ෂයේ අවසානය වන විට ව්‍යාපෘතියේ භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් ආසන්න වශයෙන් 95% ක් හා 76% ක් විය.

පුනරුත්ථාපන ක්‍රියාකාරකම් යටතේ ලුනුවත්ත ජල සම්පාදන යෝජනා ක්‍රමය වෙත මෘදු යකඩ නල සැපැයීම, බොරලන්ද ජල සම්පාදන යෝජනා ක්‍රමයේ මෘදු යකඩ නල වැලීම, බණ්ඩාරවෙල කලාපීය කාර්යාලයට අනුබද්ධ රසායනාගාරය නවීකරණය කිරීම, බුත්තල ස්ථාන භාර නිලධාරී කාර්යාලය වැඩි දියුණු කිරීම, අලිකොට ආර තුළු මුව වැඩි දියුණු කිරීම, තනමල්විල ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය පුනරුත්ථාපනය කිරීම, මොණරාගල කලාප කාර්යාලය පුනරුත්ථාපනය කිරීම, මොණරාගල නිල නිවාස අළුත්වැඩියා කිරීම, වැල්ලවාය ස්ථාන භාර නිලධාරී කාර්යාලය වැඩි දියුණු කිරීම, තනමල්විල ජල සම්පාදන යෝජනා ක්‍රමය පුනරුත්ථාපනය කිරීම සහ බුත්තල ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය වැඩි දියුණු කිරීමේ කටයුතු ක්‍රියාත්මක කරනු ලැබ සම්පූර්ණයෙන් නිම කරන ලද කර්තව්‍යයන්ගෙන් ඇතැම් වීවා වන අතර සෙසු වැඩ කටයුතු දැනට ක්‍රියාත්මක කරනු ලබමින් පවතී.

බිබිල මැදගම ජල සම්පාදන ව්‍යාපෘතිය, උල්හිටිය ජල සම්පාදන ව්‍යාපෘතිය හා ගවරම්මන බෝගහකුඹුර ජල සම්පාදන ව්‍යාපෘතිය ද වෙනුවෙන් ප්‍රස්තුත වර්ෂය තුළදී ව්‍යාපෘති අගැයීමේ කමිටු අනුමැතිය ලබා ගන්නා ලදි.

ඌව කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය හා අනුයුක්ත ග්‍රාමීය ජල සම්පාදන සේවා ඒකකය විසින් ක්‍රියාත්මක කිරීම සඳහා භාර ගන්නා ලද ව්‍යාපෘතීන් විශාල සංඛ්‍යාවක් තිබේ. වීවා නම් කුට්ටියාගොල්ල ජල සම්පාදන ව්‍යාපෘතිය - සම්බන්ධතා සංඛ්‍යාව 170 යි, සින්නමාලිගාතැන්න ජල සම්පාදන ව්‍යාපෘතිය - සම්බන්ධතා සංඛ්‍යාව ආසන්න වශයෙන් 110 යි (ප්‍රජා මූල සංවිධානය විසින් නඩත්තු කරනු ලබන), රහන්ගල ජල සම්පාදන ව්‍යාපෘතිය - සම්බන්ධතා සංඛ්‍යාව ආසන්න වශයෙන් 120 යි (ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් නඩත්තු කරනු ලබන), ගලඋඩ ජල සම්පාදන යෝජනා ක්‍රමය - සම්බන්ධතා සංඛ්‍යාව 350 යි (කන්දෙකැටිය ප්‍රාදේශීය සභාව විසින් නඩත්තු කරනු ලබන) ද වේ. හඳුනා නොගත් හේතූන් නිසා ඇති වන නිදන්ගත වකුගඩු රෝග අය වැය ලේඛනය යටතේ බදුල්ලේ, රිදීමාලියද්දේ හා මහියංගනයේ පාඨශාලා සඳහා ජලය සම්පාදනය කිරීම වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය (එනම් පාසැල් 13 ක් වෙත විලෝම ආශ්‍රැති යන්ත්‍රාගාර සපයා සවි කර දීම) ක්‍රියාත්මක කරන ලදි. තවද, ග්‍රාමීය ජල සම්පාදන ඒකකය විසින් ඌව කලාපීය සහාය සේවා මධ්‍යස්ථාන කොට්ඨාශය තුළ ක්‍රියාත්මක කරන ලද අනිකුත් ව්‍යාපෘතීන් වශයෙන් අගලඔය ඉහල ජල සම්පාදන ව්‍යාපෘතිය - සම්බන්ධතාවයන් 256 යි (දීර්ඝ කිරීමක් වශයෙන් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් නඩත්තු කරනු ලබන), වෑවත්ත ජල සම්පාදන ව්‍යාපෘතිය - සම්බන්ධතා 58 යි (ප්‍රජා මූල සංවිධානය විසින් නඩත්තු කරනු ලබන), ගින්නොරුව වර්ෂා ජලය රැස් කිරීමේ ව්‍යාපෘතිය - පවුල් 34 යි හා රත්කිඳ ජල සම්පාදන ව්‍යාපෘතිය (රුපියල් මිලියන 110 ක පුරනැගුම මුදල යටතේ) - සම්බන්ධතාවයන් 803 යි (ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් නඩත්තු කරනු ලබන) පෙන්වා දිය හැකි වේ.

(ප්‍රාග්ධන හා ග්‍රාමීය ජල සම්පාදන අරමුදල් යටතේ) ක්‍රියාත්මක කරන ලද පල්ලෙවැල්ල ගොවිඳුපුර ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රමය සම්පූර්ණයෙන් නිම කරන ලදි. ගංගොඩගම, කොලොන්වින්න, කුරුගම්වැටිය හා තන්වත්ත යන ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රමයන් තුළ (ඌව පලාත් සභාව විසින් සපයන ලද අරමුදල් යටතේ ක්‍රියාත්මක කරන ලද) පුනරුත්ථාපන ව්‍යාපෘතීන් 2017 වර්ෂය තුළදී සම්පූර්ණයෙන් නිම කරන ලද අතර ව්‍යාපෘතිය වෙනුවෙන් වැය කරන ලද මුළු පිරිවැය රුපියල් මිලියන 21 කි. හඳුනා නොගත් නිදන්ගත වකුගඩු රෝගයේ බල පෑමට ගොදුරු වී ඇති ගම් වල දිනකට ඝණ මීටර 10 ක ජල ධාරිතාවයකින් යුත් විලෝම ආශ්‍රැති යන්ත්‍රාගාර ස්ථාපනය කිරීමේ කටයුතු 2017 වර්ෂය තුළදී මොණරාගල දිස්ත්‍රික්කය තුළ ආරම්භ කරන ලද අතර ඒ යටතේ වූ ප්‍රථම ව්‍යාපෘතිය තුන ලුනුගල ජනපදය, ගල්ටැම්මන්ඩිය හා ඇතිමලේ ජනපදය යන ග්‍රාමයන් තුළ ක්‍රියාත්මක කොට සම්පූර්ණයෙන් නිම කරන ලද අතර ඒ මගින් ආසන්න වශයෙන් පවුල් 900 ක් පමණ ආවරණය කරනු ලබයි. ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තු කරන ලද මුළු පිරිවැය රුපියල් මිලියන 6.5 ක් විය.

විලෝම ආශ්‍රැති යන්ත්‍රාගාරයක් ස්ථාපිත කිරීම

ක්‍රියාත්මක කෙරෙමින් පවතින ව්‍යාපෘතීන් - ග්‍රාමීය ජල සම්පාදන ඒකකය

ආර්ථික ව්‍යාපෘති පිළිබඳ අමාත්‍යංශය යටතේ වූ මහකැලේ ජල සම්පාදන ව්‍යාපෘතිය (ප්‍රති ආරෝපණය කළ හැකි) හා ප්‍රාග්ධන අයවැයේ ග්‍රාමීය ජල සම්පාදන වෙන් කිරීම් යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘතීන් තුනක් වූ බොරගස් ජල සම්පාදන ව්‍යාපෘතිය - (රුපියල් මිලියන 46.39 යි), පැලගහතැන්න ජල සම්පාදන ව්‍යාපෘතිය - (රුපියල් මිලියන 22 යි) හා රහුප්පොල ජල සම්පාදන ව්‍යාපෘතිය - (රුපියල් මිලියන 17.8 යි) යන ව්‍යාපෘතීන් වර්ෂය තුළදී ක්‍රියාත්මක

කෙරෙමින් පැවතිණි. එසේම ඉඳිගස්ඇල්ල හා තොට්ල්ලකැටිය යන ග්‍රාමීය ජල සම්පාදන ක්‍රමයන්ගේ වැඩි දියුණු කිරීමේ වැඩ කටයුතු ද වර්ෂය තුළදී ක්‍රියාත්මක කෙරෙමින් පැවැතිණි.

පුරනැගුම ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක වන අඩු පිරිවැය ව්‍යාපෘතියක් වූ ඇකිරියන්කුඹුර (රුපියල් මිලියන 150) හා කුරුලේවෙල යන ජල සම්පාදන ව්‍යාපෘතීන් දෙක ද ක්‍රියාත්මක කෙරෙමින් පවතී. කොස්ලන්දේ නාය යාම් උවදුරෙහි බල පෑමට බඳුන් වූ ප්‍රජාව වෙනුවෙන් දියත් කරන ලද මකල්දෙනිය ජල සම්පාදන ව්‍යාපෘතිය දැනට සම්පූර්ණයෙන් නිම වනු ලැබ සේවය ලබා දෙමින් ඇති අතර ඇතැම් ඉතිරි කටයුතු දැනට ක්‍රියාත්මක කරනු ලබමින් පවතී.

හඳුනා නොගත් හේතූන් මත ඇති වන නිදන්ගත වකුගඩු රෝග අරමුදල යටතේ වූ බලගොල්ල ජල සම්පාදන ව්‍යාපෘතිය (රුපියල් මිලියන 24 යි) හා විලඔය ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රමය දැනට ක්‍රියාත්මක කරනු ලබමින් පවතී. පවුල් 250 ක් ආවරණය කරනු ලබන කුමාරපුර දිගුව පිළිබඳ වැඩ කටයුතු දැනට සිදු කරනු ලබමින් පවතී. මේ සඳහා නල මාර්ග වීලීමේ කටයුතු 2017 වර්ෂය තුළදී සම්පූර්ණයෙන් නිම කරන ලද අතර බෝක්කු පැන්නුම්, වෑල්ව සවි කිරීම් කටයුතු හා වෑල්ව මැදිරිය ඉදි කිරීමේ කටයුතු 2018 වර්ෂය තුළදී සම්පූර්ණයෙන් නිම කරනු ලැබීමට නියමිතව ඇත.

දඹේපිටිය හා විල්ලඔය ග්‍රාමයන් තුළ විලෝම ආශ්‍රැති යන්ත්‍රාගාරයන් ස්ථාපනය කිරීමේ කටයුතු දැනට සිදු කරනු ලබමින් පවතින අතර එම කටයුතු වල භෞතික ප්‍රගතිය 80% ක් වන අතර මූල්‍ය ප්‍රගතිය 60% ක් වේ. පාසැල් පරිශ්‍රයන් තුළ විලෝම ආශ්‍රැති යන්ත්‍රාගාරයන් ස්ථාපිත කිරීමේ වැඩ කටයුතු හඳුනා නොගත් හේතූන් මත ඇති වන නිදන්ගත වකුගඩු රෝග අරමුදල යටතේ ක්‍රියාත්මක කරන ලදි. ඒ සඳහා විලෝම ආශ්‍රැති යන්ත්‍රාගාරයන් ස්ථාපිත කිරීම පිණිස ඌව පලාත් සභාවේ සහාය සහිතව දුර්වල ගුණාත්මයෙන් යුත් ජල පහසුකම් තිබී පාසැල් 14 ක් තෝරාගන්නා ලද්දේය. විලෝම ආශ්‍රැති යන්ත්‍රාගාර සැපයුම හා ස්ථාපිත කිරීම සම්පූර්ණයෙන් නිම කරන ලද අතර සිවිල් වැඩ වලින් 90% ක් 2017 වර්ෂය තුළදී නිම කරන ලදි. ව්‍යාපෘතියේ මුළු ප්‍රතිලාභීන් සංඛ්‍යාව එකී පාසැල් වල ඉගෙනුම ලබන දරුවන් ආසන්න වශයෙන් 3000 කින් හා ගුරු භවතුන් 250 කින් සමන්විත වේ. ව්‍යාපෘතිය සඳහා වූ මුළු ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් මිලියන 5.6 ක් වේ. ඉතිරි සිවිල් වැඩ හා විලෝම ආශ්‍රැති යන්ත්‍රාගාරයන් සේවා සැපැයීමේ තත්ත්වයට පත් කිරීම සම්පූර්ණ කළ යුතුව ඇත.

වර්ෂය තුළදී බදුල්ල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 9 ක් තුළ ප්‍රජා මූල සංවිධානයන් සඳහා පුහුණු කිරීම් වැඩ සටහන් පවත්වන ලද අතර මොණරාගල දිස්ත්‍රික්කයේ ග්‍රාම නිලධාරි වසම් හතක් තුළ ප්‍රජා මූල සංවිධාන නායකයින් වෙනුවෙන් ජල සුරක්ෂිතතාවය පිළිබඳ පුහුණු කිරීම් වැඩ සටහන් මෙහෙයවන ලදි. ජල සුරක්ෂිතතාවය හා සුරක්ෂිත සනීපාරක්ෂණ චර්යාවන් පිළිබඳ පුහුණු වැඩ සටහන් පාසැල් දෙකක් තුළ මෙහෙයවන ලදි. මඩුල්ල, සියඹලාණ්ඩුව, මොනරාගල, සින්නමාලිගාතැන්න, වෑවත්ත හා කුට්ටියාගොල්ල ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රමයන්ට අනුයුක්ත මෙහෙයුම් හා නඩත්තු කාර්ය මණ්ඩල සාමාජිකයින් වෙනුවෙන් පුහුණු වැඩ සටහන් ද මෙහෙයවන ලදි. වර්ෂය තුළ පවත්වන ලද ප්‍රජා මූල සංවිධාන රැස්වීම් හා සන්සද රැස්වීම් හැටකට පමණ සහභාගි වන ලදි.

උතුරු

උතුරු පලාතේ සහාය සේවා මධ්‍යස්ථානයේ ප්‍රධානියා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරයා විසින් වන අතර සහකාර සාමාන්‍යාධිකාරි (උතුර) ඔහුගේ සහායට සිටියි. මෙහෙයුම් හා නඩත්තු කටයුතු කලාපීය කළමනාකරු (යාපනය) හා කලාපීය කළමනාකරු (වවුනියා) යන කලාපයන් දෙක අතර බෙදා දෙනු ලැබ ඇත. 2015 සිදු කරන ලද සංගණනය අනුව පලාතේ මුළු ජනගහණය මිලියන 1.23 ක් වේ. 2017 දෙසැම්බර් 31 වැනි දිනට ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් නඩත්තු කරනු ලබන මුළු ජල සම්පාදන සම්බන්ධතා සංඛ්‍යාව 21,085 ක් වන අතර නල ජල සම්පාදනය හරහා ආවරණය වන ප්‍රතිශතය 8.60% ක් වේ. ඒ අතර ග්‍රාමීය ජල සම්පාදනයෙන් ආවරණය වන ප්‍රතිශතය 1.13% ක් වේ.

උතුරු සහාය සේවා මධ්‍යස්ථානයේ ප්‍රධාන කාර්යයන් වන්නේ මෙහෙයුම් හා නඩත්තු ක්‍රියාකාරකම් සඳහා කලාපීය කළමනාකාර කාර්යාලයන් දෙක වෙත අවශ්‍ය සහාය ලබා දීම වන අතර එසේම ක්‍රියාත්මක වෙමින් පවතින යෝජනා ක්‍රමයන් වෙත විශේෂ අවධානය යොමු කරමින් කටයුතු කිරීම හා කලාපය තුළ පුනරුත්ථාපන කටයුතු හා වර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීමත් වේ. 2017 දෙසැම්බර් මස අවසානය වන විට කාර්ය මණ්ඩල සාමාජිකයින් 230 ක කාර්ය මණ්ඩලයක් උතුරු සහාය සේවා මධ්‍යස්ථානයට අනුයුක්තව සේවයේ යෙදී සිටියහ.

නාගරික හා ග්‍රාමීය ජනගහණය ආවරණය කිරීම නංවා ලීම සඳහා අවශ්‍ය නව ව්‍යාපෘති ප්‍රදේශයන් හඳුනා ගැනීම, හඳුනා නොගත් හේතූන් නිසා ඇති වන නිදන්ගත වකුගඩු රෝගය වැලැක්වීමේ ක්‍රියාකාරකම් හා භූගත ජල ප්‍රභව සංවර්ධනය ඇතුළු සියළුම සංවර්ධන ක්‍රියාකාරකම් සඳහා වගකීම දරනු ලබන්නේ සහකාර සාමාන්‍යාධිකාරි (උතුර) විසිනි.

යාපනය ප්‍රදේශය භාර කලාප කළමනාකාරවරයා යාපනය, කිලිනොච්චි හා මුලතිවු යන දිස්ත්‍රික්ක තුන ආවරණය කරයි. යාපනය කලාපයේ කලාප කළමනාකාරවරයා විසින් මෙහෙයවීම් කටයුතු සිදු කරනු ලබන ජල සම්පාදන යෝජනා ක්‍රමයන් 22 ක සංඛ්‍යාවක් යාපනය කලාපය තුළ ක්‍රියාත්මක වේ. මාර්ග සංවර්ධන අධිකාරිය විසින් කරවෙඩ්ඩි ප්‍රදේශය තුළ ක්‍රියාත්මක කරන ලද මාර්ග පුළුල් කිරීමේ කටයුතු නිසා අවශ්‍ය වූ AC නල ප්‍රතිස්ථාපනය කිරීමේ කටයුතු ඇතුළු ජලය බෙදා හැරීමේ කාර්යය වැඩි දියුණු කිරීමේ කටයුතු හා කරවෙඩ්ඩි, නෙදුන්කර්නි, ඔඩ්ඩුසුඩාන් හා මල්ලවි යන ප්‍රදේශයන් තුළ හානි වූ වෑල්ව වෙනුවට අළුත් වෑල්ව යෙදීම හා වෑල්ව කුටි ඉදි කිරීම වැනි ආදායම් රහිත ජලය අඩු කිරීමේ ක්‍රියාකාරකම් 2017 වර්ෂය තුළදී කලාපය තුළ ක්‍රියාත්මක කරන ලදි. බල ශක්ති සංරක්ෂණය කිරීමේ ක්‍රියා මාර්ගයන් වශයෙන් 2017 ඔක්තෝබර් මස මැද යාපනය කිලිනොච්චි ජල සම්පාදන හා සනීපාරක්ෂණ ව්‍යාපෘති අරමුදල් යොදා ගනිමින් කලාපීය කළමනාකරුගේ කාර්යාලයෙහි කිලෝ වොට් 25 ක සූර්ය බල ශක්ති පද්ධතියක් ස්ථාපනය කරන ලදි. වර්ල්ඩ් විෂන් ලංකා ආධාර යොදා ගනිමින් (කිලෝ වොට් 5.2 ක හා කිලෝ වොට් 4.8 ක) සූර්ය බල ශක්ති පද්ධතීන් දෙකක් 2017 දෙසැම්බර් අවසන් සතිය තුළදී වෙම්බිරාල් ජල සම්පාදන යෝජනා ක්‍රමය තුළ ස්ථාපිත කරන ලදි. 2017 අගෝස්තු මස මැදදී බල ශක්ති විගණන වාර්තාවේ අන්තර්ගත නිර්දේශය අනුව බල ශක්ති අරමුදල භාවිතා කරමින් කයිතඩ්හි කේන්ද්‍රාපසාරී පොම්පය ප්‍රති ස්ථාපනය කරන ලදි. එසේම 2017 සැප්තැම්බර් මස මුල් සතිය තුළදී බල ශක්ති විගණන වාර්තාවේ අන්තර්ගත නිර්දේශය අනුව බල ශක්ති අරමුදල භාවිතා කරමින් කයිට්ස්හි කේන්ද්‍රාපසාරී පොම්පය ප්‍රතිස්ථාපනය කරන ලදි. 2016 වර්ෂයේ පශ්චාත් සත්‍යායන වාර්තාවේ ලැයිස්තුගත කරනු ලැබ තිබී ප්‍රයෝජනයට ගැනීමේ හැකියාවක් නැති අයිතමයන් තොග මට්ටම් අඩු කිරීම සඳහා ඉවත් කරන ලදි. චුන්නාකම් ජල සම්පාදන යෝජනා ක්‍රමය හා මල්ලවි ජල සම්පාදන යෝජනා ක්‍රමය වෙනුවෙන් සන්කුවෙලිහි පොම්පාගාර ඉදි කිරීම වැනි ආයතන සංවර්ධන ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කරන ලදි. කලාපීය රසායනාගාරය ශ්‍රී ලංකාවේ ඇති ප්‍රමුඛතම ජල පරීක්ෂණ රසායනාගාරයන්ගෙන් එකක් වන අතර, ඉහල පරාසයක විශ්ලේෂණාත්මක ධාරිතාවයකින් යුතුව කටයුතු කරන එම රසායනාගාරය සතුව බොහෝ ජල ගුණාත්ම පරාමිතීන්, විශේෂයෙන්ම බැර ලෝහ විශ්ලේෂණ කටයුතු කිරීමේ හැකියාව ඇත. ගත වූ වර්ෂ දෙක මුළුල්ලේ ඔවුන් විසින් බැර ලෝහ විශ්ලේෂණ කටයුතු සඳහා පරමාණුක අවශෝෂණ වර්ණාවලී මාණය භාවිතා කරමින් සිටින අතර එය ආධාර කර ගනිමින් ඊයම්, කැඩ්මියම්, ක්‍රෝමියම්, රසදිය, පාසානම්, තඹ, තුත්තනාගම්, ඇළුමිනියම්, සෝඩියම් හා පොටෑසියම් ඇතුළු සෑම ගැටළු සහගත බැර ලෝහ වර්ගයක්ම විශ්ලේෂණයට භාජනය කළ හැකි වේ. භූගත ජල, මතු පිට ජල හා මුහුදු ජල ජල සම්පාදන යෝජනා ක්‍රමයන් විසින් විවිධ ප්‍රතිකාරක ක්‍රම වේදයන් භාවිතා කරනු ලැබේ. කිලිනොච්චි ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය පසුවිපරම් කිරීම සඳහා සහ මුලතිවු හා කිලිනොච්චි දිස්ත්‍රික්කයන් වෙත රසායනාගාර සේවාවන් දීර්ඝ කිරීම පිණිස කිලිනොච්චි ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාර පරිශ්‍රය තුළ කුඩා රසායනාගාරයක් ස්ථාපිත කරනු ලැබ ඇත. බොහෝ ජල සම්පාදන යෝජනා ක්‍රමයන් භූගත ජලය මත යැපෙමින් සිටින බැවින් එම යෝජනා ක්‍රමයන් ගුණාත්මය හා ප්‍රමාණවත්භාවය පිළිබඳ ගැටළු වලට

මුහුණ දෙමින් සිටිති. මේ හේතුව නිසා කලාපය තුළ සැලැකිය යුතු මට්ටමකින් සම්බන්ධතා සංඛ්‍යාව වැඩි කිරීමේ හැකියාවක් අප සතුව නොමැති අතර, ඒ නිසා අපි විශේෂයෙන්ම යාපනය දිස්ත්‍රික්කයේ ජල සම්පාදනය සඳහා විකල්ප ප්‍රභවයන් සොයමින් සිටින්නෙමු. කඩිනත්වය, ලවණතාවය හා නයිට්‍රේට් යාපනය කලාපයේ ඉතා සුලභ ගැටළු සහිත පරාමිතීන් වේ. ඒ අතර නාගරික ප්‍රදේශයන් ඉහල මට්ටමක බැක්ටීරියාවේදීය දූෂණය වීමකට මුහුණ දෙමින් සිටී. මීට වැඩිමනත් වශයෙන් ඔඩ්ඩුසුඩාන් හා නෙදුන්කර්නි ජල සම්පාදන යෝජනා ක්‍රමයන් ඉහල මට්ටමේ ෆ්ලූඕරයිඩ් ගැටළුවකට මුහුණ දෙමින් සිටිති. ජලධරයන්ගේ තත්ත්වය හේතුකොට ගෙන නිෂ්පාදන ළිං වලින් ලබා ගත හැකි ජලය බෙහෙවින් සීමා වී ඇත. යාපනය දිස්ත්‍රික්කයේ පේදුරු තුඩුව හා වෙම්පිරායි ජල සම්පාදන යෝජනා ක්‍රමයන් වෙත හා කිලිනොච්චි දිස්ත්‍රික්කයේ මල්ලවි ජල සම්පාදන යෝජනා ක්‍රමය වෙත ජලය සැපයීම සඳහා සකස් කරන ලද ජල සැපයුම් සැලැස්ම ක්‍රියාත්මක කිරීම අප විසින් ආරම්භ කරනු ලැබ ඇත. යාපනය දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක වන මාදගල් හා ෂන්තායි නම් ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රමයන් දෙක හා කිලිනොච්චි දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක වන අක්කරායන්, වද්දකාච්චි හා ඉයක්කච්චි යන ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රමයන් තුන යාපනයේ ග්‍රාමීය ජල සම්පාදන ඒකකය විසින් පසුවිපරම් කරනු ලබන අතර ඒවා මෙහෙයවමින් නඩත්තු කරනු ලබන්නේ ඒ ඒ යෝජනා ක්‍රමයන් හා සම්බන්ධ ප්‍රජා මූල සංවිධානයන් විසිනි. පේදුරුතුඩුව, වැල්වෙට්ටිතුරෙයි, කරවෙඩ්ඩි, වේලනෙයි, ඩෙල්ෆ්ට්, නයිනතිවු, ඔඩ්ඩුසුඩාන්, පාන්ඩියන්කුලම්, මල්ලවි හා කිලිනොච්චි යන ජල සම්පාදන යෝජනා ක්‍රමයන් තුළ කිලෝ මීටර 39 ක් වූ නල මාර්ග දීර්ඝ කිරීම් ක්‍රියාත්මක කරනු ලැබ ඇත. වෙනත් ක්‍රියාකාරකම් යටතේ චුන්නාකම්හි ජල දූෂණයට ගොදුරු වී ඇති ප්‍රදේශයන් වෙත බවුසර මගින් ජලය සම්පාදනය කිරීම සිදු කරනු ලැබ ඇත. උඩුප්පිඩි දක්වා සිදු කරනු ලබන නල මාර්ගය දීර්ඝ කිරීම සම්පූර්ණයෙන්ම පාහේ නිම කරනු ලැබ ඇත. තවද, ලෝක බැංකුව විසින් අරමුදල් සම්පාදනය කරනු ලබන ජල සම්පාදන හා සනීපාරක්ෂණ වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය හා ආසියානු සංවර්ධන බැංකු 6 විසින් අරමුදල් සම්පාදනය කරනු ලබන යාපනය කිලිනොච්චි ජල සම්පාදන හා සනීපාරක්ෂණ ව්‍යාපෘතිය එම ප්‍රදේශයන් තුළ දැනට ක්‍රියාත්මක කරනු ලබමින් පවතී. යාපනය කලාපීය කළමනාකාර ප්‍රදේශය තුළ පවත්නා පොදු ගැටළුකාරී තත්ත්වයන් වන්නේ පේදුරු තුඩුව ජල සම්පාදන යෝජනා ක්‍රමයේ ඇති යකඩ අන්තර්ගතය ද, ඔඩ්ඩුසුඩාන් ජල සම්පාදන ක්‍රමය තුළ ඇති සීමිත ෆ්ලූඕරයිඩ් අන්තර්ගතය හා නෙදුන්කර්නි ජල සම්පාදන යෝජනා ක්‍රමය තුළ චුන්නාකම්හි ඇති තෙල් දූෂණය ද වේ.

මන්නාරම දිස්ත්‍රික්කය හා වවුනියාව දිස්ත්‍රික්කය යන දිස්ත්‍රික්කයන් දෙක ආවරණය කරනු ලබන වවුනියා කලාපය විසින් ගැසට් කරන ලද මඩු උත්සව සමයේ මඩු දේවස්ථානය වෙත එක් රොක් වන ආසන්න වශයෙන් 600,000 ක පමණ බැතිමතුන් වෙනුවෙන් පානීය ජලය හා වෙනත් අවශ්‍යතාවයන් සඳහා අවශ්‍ය වන ජලය සම්පාදනය කර දෙනු ලබයි. අළුතින් ආරම්භ කරන ලද වියලි කලාපීය නාගරික ජල සම්පාදන හා සනීපාරක්ෂණ ව්‍යාපෘතියේ හා පෙරියමඩු ජල සම්පාදන ව්‍යාපෘතියේ වැඩ කටයුතු උත්සවාකාරයෙන් ආරම්භ කරන ලදි. මහා ශිව රාත්‍රී උත්සවය සඳහා තිරුකෙතීස්වරම් සිද්ධස්ථානය වෙත එක් රැස් වූ 300,000 ක පමණ වන්දනා කරුවන් වෙත පානීය ජල පහසුකම් සලස්වා දෙන ලදි. ළිං ක්ෂේත්‍ර ඉඩම ආරක්ෂා කර ගැනීම සඳහා මුරුන්ග න් ළිං ක්ෂේත්‍රය වටා වැට ඉදි කිරීමේ කටයුතු ආරම්භ කරනු ලැබ ඇත. මන්නාරම ජල සම්පාදන යෝජනා ක්‍රමයේ නැවත අංක කිරීමේ කටයුතු ආරම්භ කරනු ලැබ ඇත. නියඟයේ බල පෑමට ගොදුරු වූ ප්‍රදේශයන් වෙත බවුසර මගින් ජලය බෙදා හැරීම සිදු කරන ලදි. දිනෙන් දින සිදු කරනු ලබන කාන්දු අළුත්වැඩියා කිරීම්, රාත්‍රී සමීක්ෂණ, දෝෂ සහිත මනු ප්‍රති ස්ථාපනය කිරීම, නීති විරෝධී සම්බන්ධතාවයන් අනාවරණය කර ගැනීම, ශූන්‍ය බිල් පත් පරීක්ෂණයට භාජනය කිරීම, නල ප්‍රති ස්ථාපනය කිරීම්, තොග මනු සවි කිරීම් හා වැල්ව ප්‍රතිස්ථාපනය කිරීම් වැනි ආදායම් රහිත ජලය අඩු කිරීමේ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කරන ලදි. බල ශක්ති සංරක්ෂණ ක්‍රියාකාරකම් කිහිපයක් ක්‍රියාත්මක කරනු ලැබ ඇත. ක්‍රියාත්මක කරන ලද ඇතැම් බල ශක්ති සංරක්ෂණ ක්‍රියාකාරකම් වන්නේ සාමාන්‍ය විදුලි බුබුළු සංගත ප්‍රතිදීප්ත පහන් විදුලි බුබුළු යොදා ගනිමින් ප්‍රතිස්ථාපනය කිරීම හා විදුලි බිල අඩු කිරීම සඳහා පොම්ප ක්‍රියාත්මක කරන වේලාවන් පාලනය කිරීමත් වේ. මන්නාරම් දිස්ත්‍රික්කය තුළ කිලෝ මීටර 25 ක මුළු දිග ප්‍රමාණයකට නල මාර්ග දීර්ඝ කිරීම් සිදු කරන ලද අතර එම දීර්ඝ කිරීම් වලට අඩම්පන් ජල සම්පාදන යෝජනා ක්‍රමය, විඩත්තල්තිවු ජල සම්පාදන යෝජනා ක්‍රමය, තේවන්පිඩ්ඩි ජල සම්පාදන යෝජනා ක්‍රමය, එරුක්කාලම්පිඩ්ඩි ජල සම්පාදන යෝජනා ක්‍රමය, මන්නාරම ජල සම්පාදන යෝජනා ක්‍රමය හා මඩු ජල සම්පාදන යෝජනා ක්‍රමය යන ජල සම්පාදන ක්‍රම ප්‍රදේශයන් තුළ කරන ලද දීර්ඝ කිරීම් ඇතුලත් වේ. එරුක්කාලම්පිඩ්ඩි ජල සම්පාදන යෝජනා ක්‍රමය තුළ (යකඩ හා මැන්ගනීස් අන්තර්ගත වීම නිසා ඇති වී තිබෙන) ජල ගුණාත්මය පිළිබඳ ගැටළු මතු වී ඇති අතර ඒ සම්බන්ධයෙන් ක්‍රියාත්මක කළ යුතු ප්‍රතිකාර්මික ක්‍රියාකාරකම් දැනට තීරණය කරනු ලැබ ඇත. එවැනි ප්‍රතිකාර්මික ක්‍රියාකාරකම් දැනට ක්‍රියාත්මක වෙමින් පවතින වියලි කලාපීය නාගරික ජල සම්පාදන හා සනීපාරක්ෂණ ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක කරනු ලබනවා ඇත. මාර්ග පුළුල් කිරීමේ වැඩ හේතුකොට ගෙන (මිලි මීටර 280) සම්ප්‍රේෂණ නල මාර්ගයට හා බෙදා හැරීමේ නල මාර්ගයට හානි සිදුව තිබුණ අතර එම හානි වලට ක්ෂණිකව පිළියම් යොදන ලදි. බිල් නිකුත් කිරීම හා ගාස්තු රැස් කිරීම පහසුකරණය කිරීම සඳහා මන්නාරම ජල සම්පාදන යෝජනා ක්‍රමය වෙනුවෙන් මාර්ග සිතියම් පිළියෙල කරනු ලැබ ඇත.

උතුරු කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය විසින් ආරම්භ කරන ලද යෝජිත ජල සම්පාදන යෝජනා ක්‍රමය යටතේ විසල් මන්නාරම ජල සම්පාදන යෝජනා ක්‍රමය වෙනුවෙන් ව්‍යාපෘති සමාලෝචන කමිටුවේ අනුමැතිය ලබාගෙන ඇති අතර එම ව්‍යාපෘතිය සඳහා වූ යාවත්කාල ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් මිලියන 37,532.86 ක් වේ. එක් එක් දිස්ත්‍රික්කය වෙනුවෙන් මතු පිට ජල ප්‍රභවයන් හඳුනා ගනු ලැබ ඇති අතර ඒවා නම් මන්නාරම් දිස්ත්‍රික්කය වෙනුවෙන් මල්වතු ඔය, කල්ආරු, වියාඩිකුලම් හා කූරෙයි යන ප්‍රභවයන් ද, වවුනියා දිස්ත්‍රික්කය වෙනුවෙන් මල්වතු ඔය හා පරංකි ආරු යන ප්‍රභවයන් ද, මුලතිව් දිස්ත්‍රික්කය වෙනුවෙන් පේර් ආරු ප්‍රභවය ද, කිලිනොච්චි දිස්ත්‍රික්කය වෙනුවෙන් ඉරනමඩු හා කූරෙයි වැව හා යාපනය දිස්ත්‍රික්කය වෙනුවෙන් පහල පරංකි ආරු ජලාශය හා පාලි ආරු ද වේ. සමස්ත උතුරු පලාත වෙනුවෙන්ම ජලය වෙන් කිරීමේ සම්මුතිය ලබා ගැනීමේ ව්‍යායාමයෙහි අපි වර්තමානයේ යෙදී සිටින්නෙමු. වවුනියා දිස්ත්‍රික්කය වෙනුවෙන් පහල මල්වතු ඔය ජලාශයෙන් ජලය වෙන් කර දෙන ලෙස හා මන්නාරම හා යාපනය දිස්ත්‍රික්කයන් වෙනුවෙන් පහල පරංගි ආරු ප්‍රභවයෙන් ජලය වෙන් කර දෙන ලෙසද ඉල්ලා සිටිමින් ජලය වෙන් කර දෙන ලෙස ඉල්ලා සිටීමේ ඉල්ලුම් පත්‍රය වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉදිරිපත් කරන ලදි. මන්නාරමේ සහ වවුනියාවේ සක්‍යතා අධ්‍යයනයන් ආරම්භ කරන ලදි. මාන්කුලම් හා වවුනියා උතුර ජල ප්‍රභව අධ්‍යයනයන් මහවැලි උපදේශක කාර්යාංශය විසින් සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇත. මහවැලි උපදේශක කාර්යාංශය විසින් ක්‍රියාත්මක කරන ලද අධ්‍යයනයෙන් හෙලිදරව් වන්නේ විභව ප්‍රභවයන් වන්නේ ඉහල පරංකි ආරු ජලාශය හා පහල පරංකි ආරු ජලාශය බවයි. දැනට ක්‍රියාත්මක වන ජල සම්පාදන යෝජනා ක්‍රමයන්ට අදාලව සිතියම් පිළියෙල කිරීම හා දත්ත රැස්කිරීම අප විසින් ආරම්භ කරනු ලැබ ඇත. උතුරු කලාපීය සහාය සේවා මධ්‍යස්ථානයේ සෑම ප්‍රදේශයක් වෙනුවෙන්ම විලෝම ආශ්‍රැති යන්ත්‍රාගාර, අතින් පොම්ප කරන ලද නල ළිං (HPTW) හා ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රමයන් වෙන් කර දෙනු ලැබ ඇති අතර සෑම දිස්ත්‍රික්කයක් වෙනුවෙන්ම ජල සම්පාදන ආවරණ සිතියම් ද පිළියෙල කරනු ලැබ ඇත.

ඉදිකිරීම් අංශය විසින් දේශීය බැංකු අරමුදල්, එක්සත් ජාතීන්ගේ ළමා අරමුදලේ ප්‍රදානයන් හා පුනරුත්ථාපන අරමුදල් යොදා ගනිමින් ලංකා රුපියල් මිලියන 65.9 ක් වටිනා ඉදි කිරීම් කටයුතු නිම කරනු ලැබ ඇත. ඒ යටතේ නිම කරන ලද කර්තව්‍යයන් වූයේ මන්නාරම හා යාපනය යන දිස්ත්‍රික්කයන් තුළ නල ජල සම්පාදන ආවරණය නංවා ලීමේ පරමාර්ථයෙන් එම දිස්ත්‍රික්කයන්හි ජලය බෙදා හැරීමේ කටයුතු හා සම්බන්ධ සිවිල් වැඩ කටයුතු වලට අදාලව නල සැපැයීම, නල එලීම හා සේවයේ යෙදවීම, ඝණ මීටර 80 ක ධාරිතාවයකින් යුත් වැර ගැන්වූ කොන්ක්‍රීට් උහිස් කුළුනට අදාල නල මාර්ග එලීම් ආදිය කිරීම හා එහි කටයුතු සම්පූර්ණ කිරීම, මන්නාරම් දිස්ත්‍රික්කයේ තෝට්ටකඩු තුළු මුව වට කොට ඉදි කරනු ලැබ ඇති වැට වැඩි දියුණු කිරීම වැනි පවත්නා පහසුකම් සංවර්ධනය කිරීමේ වැඩ කටයුතු හා ඒ සමගම උතුරු කලාපීය සහාය සේවා මධ්‍යස්ථාන කාර්යාලය හා නිල නිවාස

කිහිපයක් පුනරුත්ථාපනය කිරීමේ කටයුතු ද වේ.

උතුරු කලාපීය භූමිය තුළ දීර්ඝ කාලයක් මුළුල්ලේ නවතා තිබුණ ප්‍රයෝජනයට ගත නොහැකි වාහන 15 ක සංඛ්‍යාවක් බැහැර කිරීමේ කටයුත්ත යාන්ත්‍රික හා විද්‍යුත් අංශය විසින් සම්පූර්ණයෙන් නිම කරන ලද අතර ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට අයත් එම වාහන වල අයිතිය පැවැරීමේ කටයුත්ත මණ්ඩලයේ අනුමැතිය සහිතව ආරම්භ කර නිම කරන ලදි. එම වාහන උතුරු ප්‍රදේශයේ ගැටුම් හා සුනාමි උවදුර පැවැති කාලය තුළදී වෙනත් රජයේ සංවිධානයන් වෙත භාර දෙන්නට කටයුතු කරන ලදි. පොම්ප හා වාහන දත්ත සංචිතයන් පවත්වාගෙන යන ලදි. ප්‍රධාන කාර්යාලයේ යාන්ත්‍රික හා විද්‍යුත් අංශයේ සහයෝගය සහිතව බල ශක්ති විගණනයන් ක්‍රියාත්මක කරන ලද අතර බල ශක්ති අරමුදල් යටතේ යාපනය කලාපය තුළ කයිතඩිහි පොම්ප ප්‍රති ස්ථාපනය කරන ලදි. (රුපියල් මිලියන 0.59 ක් වැය කරමින් සිදු කරන ලද ප්‍රති ආරෝපණ කාර්යය ද සමගින්) රුපියල් මිලියන 3.94 ක් වැය කරමින් ජල සම්පාදන යෝජනා ක්‍රමයන් වෙනුවෙන් යාන්ත්‍රික හා විද්‍යුත් ස්ථාපිත කිරීම සම්පූර්ණයෙන් නිම කොට උතුරු කලාපයේ යාපනය හා වවුනියා මෙහෙයුම් හා නඩත්තු අංශයන් වෙත භාර දෙන ලදි. ඒ අතර ජල සම්පාදන යෝජනා ක්‍රමයන් තුළ රුපියල් මිලියන 9.24 ක් වැය කරමින් යාන්ත්‍රික හා විද්‍යුත් වැඩ කටයුතු අඛන්ඩ ලෙස කරගෙන යන ලදි. තවද වැලිඔය රුපියල් මිලියන 23.59 ක් වටිනා ආයෝජන මණ්ඩලයේ (BOI) කාර්යය කිරීම සඳහා ටෙන්ඩර් ලිපි ලේඛන පිළියෙල කරන ලදි.

වවුනියාව කලාපයේ ග්‍රාමීය ජල සම්පාදන අංශය විසින් මන්නාරම් දිස්ත්‍රික්කයේ මඩුකරෙයි හි රුපියල් මිලියන 4.80 ක් සඳහා සක්‍යතා වාර්තාවක් පිළියෙල කරන ලදි. 2016 වර්ෂය තුළදී හඳුනා නොගත් හේතූන් නිසා ඇති වන නිදන්ගත වකුගඩු රෝග මර්දන වැඩසටහනට වෙන් කරන ලද අරමුදල් යටතේ මුලතිව් දිස්ත්‍රික්කය තුළ ජල සම්පාදන යෝජනා ක්‍රම 2 ක සංඛ්‍යාවක් ඉදි කිරීමේ කටයුතු ආරම්භ කරන ලද අතර එම වැඩ කටයුතු 2017 වර්ෂය තුළ අඛන්ඩව කරගෙන යන ලදි. මෙම ව්‍යාපෘති දෙක මගින් පවුල් 800 කට සෙත සැලැසෙනු ඇත. මීට වැඩිමනත් ලෙස දිනකට ජලය ඝණ මීටර 10 ක ධාරිතාවයකින් යුත් විලෝම ආශ්‍රැති යන්ත්‍රාගාර 10 ක සංඛ්‍යාවක් ගම් අතර ස්ථාපිත කරන ලද අතර උතුරු පලාතේ තෝරාගත් පාසැල් තුළ විලෝම ආශ්‍රැති යන්ත්‍රාගාර 34 ක සංඛ්‍යාවක් ස්ථාපිත කරන ලදි.

ජල කළමනාකරණය හා හඳුනා නොගත් හේතූන් නිසා ඇති වන නිදන්ගත වකුගඩු රෝගය යන මාතෘකාවන් යටතේ වූ පුහුණු කිරීමේ වැඩසටහන් හතරක් 2017 වර්ෂය තුළදී පාසැල් ළමයින් වෙනුවෙන් මෙහෙයවන ලදි.

නැගෙනහිර

නැගෙනහිර කලාපීය සහාය සේවා මධ්‍යස්ථාන කොට්ඨාශය තුළ මෙහෙයුම් හා නඩත්තු කටයුතු කළමනාකරණය කරනු ලබන්නේ ත්‍රිකුණාමලය, අම්පාර, මඩකලපුව හා අක්කරෙයිපත්තු කලාපයන් හාර කලාපීය කළමනාකරුවන් සිව් දෙනා විසිනි.

විශේෂ සිද්ධීන්

පවුල් 5,418 කට සේවය සැපැයීම සඳහා වූ සේරු නුවර ජල සම්පාදන යෝජනා ක්‍රමය රුපියල් මිලියන 950 ක පිරිවැයක් යටතේ ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ සේරු නුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ 2017. 07. 15 වැනි දින විවෘත කරන ලදි. එසේම, ප්‍රජා මූල සංවිධාන යෝජනා ක්‍රමයන් 8 ක් වැඩ දියුණු කොට ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත පවරා ගන්නා ලදි. බුත්තන්ගල පූතික ටැංකිවලින් ඉවත් කරනු ලබන නල පිරිපහදු කිරීමේ මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම සඳහා අම්පාර නගර සභාව වෙත උපදේශක සේවාවන් සපයන ලද අතර එම යන්ත්‍රාගාරය 2017 දෙසැම්බර් මාසය තුළ ඔවුන් වෙත භාර දෙන ලදි. අම්පාර දිස්ත්‍රික්කයේ පරගහගල හා ගොනාගොල්ල ස්ථාන භාර නිලධාරී කාර්යාල හා ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය රුපියල් මිලියන 79.0 ක පිරිවැයක් දරා ඉදි කරන ලද අතර ඒවා 2017 අප්‍රේල් මාසය තුළදී විවෘත කරන ලදි.

2017.07.15 වැනි දින නගර සැලසුම් හා ජල සම්පාදන කටයුතු පිළිබඳ ගරු අමාත්‍ය තුමන්ගේ සහභාගිත්වයෙන් ත්‍රිකුණාමලයේදී ජංගම සේවාව පවත්වන ලද අතර එහිදී ඉදිරිපත් කරන ලද පැමිණිළි 314 අතුරින් පැමිණිළි 277 ක් වහාම විසඳන ලදි. කිලෝ මීටර 334 ක නල මාර්ග දීර්ඝ කිරීමක් ඉල්ලා සිටින ලද අතර එය ක්‍රියාත්මක කිරීමට එකඟත්වය පළ කළ නමුත් 2017 වර්ෂය තුළදී කිලෝ මීටර 12 ක පමණක් නල එලීම සම්පූර්ණයෙන් සිදු කර ඇති අතර ඉතිරි කොටස විවිධ අරමුදල් යටතේ නිම කරනු ලැබීමට යෝජිත විය.

2017 මාර්තු 29 වැනි දින සිට 2017 අප්‍රේල් 02 වැනි දින දක්වා ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ මෙහෙයවීම යටතේ ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේදී පවත්වන ලද යොවුන්පුර වැඩ සටහන වෙනුවෙන් රුපියල් මිලියන 7.0 ක පිරිවැයක් දරමින් ජල සම්පාදන හා සනීපාරක්ෂණ පහසුකම් සපයා දෙන ලදි.

සේරුනුවර ප්‍රදේශය තුළ නව සේවා සම්බන්ධතාවයන් ලබා දීම කඩිනම් කිරීමේ අපේක්ෂාවෙන් ත්‍රිකුණාමලය කලාපීය කළමනාකාරවරයාගේ මෙහෙයවීමෙන් ජංගම සේවාවක් පවත්වන ලද අතර එහිදී සක්‍යතා වාර්තා හා අදාල ස්ථානය තුළදීම කරන ලද ඇස්තමේන්තු 536 ක් එක් දිනක් තුළදී සම්පූර්ණයෙන් නිම කරන ලදි.

ප්‍රතිලාභීන් 2,000 කට සේවය ලබා දෙන වාන් ඇල ජල සම්පාදන යෝජනා ක්‍රමය (වැය කරන ලද මුදල රුපියල් මිලියන 250.00 කි) 2017.01.08 වැනි දින උත්සවාකාරයෙන් විවෘත කරන ලදි.

වවුනතිවු ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය වෙත ජාත්‍යන්තර ප්‍රමිති සංවිධාන (ISO) ප්‍රමිතිය ලබා ගන්නා ලදි.

ආදායම් රහිත ජලය අඩු කිරීම හා බල ශක්ති සංරක්ෂණය

ප්‍රස්තුත වර්ෂය තුළදී ආදායම් රහිත ජලය අඩු කිරීමේ වැඩ සටහන යටතේ ආදායම් රහිත ජලය අඩු කිරීමේ බොහෝ ක්‍රියා මාර්ග යන් මෙහෙයවන ලදි. දෝෂ සහිත මනු මාරු කිරීම් 6,336 ක සංඛ්‍යාවක් ද, කාන්දු අළුත්වැඩියා කිරීම් 18,443 ක සංඛ්‍යාවක් ද, නීති විරෝධී සම්බන්ධතාවයන් අනාවරණය කර ගැනීම් 44 ක සංඛ්‍යාවක් ද සියළුම කලාපයන් තුළ ප්‍රධාන ක්‍රියාකාරකම් වශයෙන් සිදු කරන ලදි. ඊට වැඩිමනත් වශයෙන් සමස්ත යෝජනා ක්‍රමය තුළ ඇති වන ආදායම් රහිත ජල පරිමාව පසුවිපරම් කිරීම සඳහා සහ පාලනය කිරීම සඳහා මඩකලපුව කලාපය තුළ චිරාවුර් හා ඉරුදයපුරම් යන ප්‍රදේශයන් තුළ කලාපයන්ට වෙන් කිරීමේ වැඩ පිළිවෙල සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇත. අම්පාර කළමනාකරුගේ කාර්යාලය හා සහකාර සාමාන්‍යාධිකාරී කාර්යාලය තුළ (එක් කාර්යාලයක් වෙනුවෙන් කිලෝ වොට් 25 ක ධාරිතාවයකින් යුත්) සූර්ය බල ජාල මනු පද්ධතීන් ස්ථාපිත කරනු ලැබ ඇත. ඒ සඳහා වැය කරන ලද මුදල රුපියල් 6,300,000.00 ක් වේ. මුළු කලාපීය සහාය සේවා මධ්‍යස්ථාන කොට්ඨාශය තුළම පාවිච්චි කිරීම සඳහා රුපියල් 564,800.00 ක පිරිවැයක් දරමින් තැනින් තැන ගෙන යා හැකි බල විශ්ලේෂකයක් හා සංඛ්‍යාංක සංයුක්ත පීඩන මිණුම් ගන්නා උපකරණයක් මිළයට ගන්නා ලදි. රුපියල් මිලියන 1.057 ක පිරිවැයක් වැය කරමින් පිළිවෙලින් කිලෝ වෝල්ට් ඇම්පියර 150 ක හා කිලෝ වෝල්ට් ඇම්පියර 60 ක ධාරිතාවයන්ගෙන් යුත් විදුලි බල ධාරක පුවරු දෙකක් කල්මුනෙයි හා සම්මාන්තුරෙයි ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයන් තුළ ස්ථාපිත කරන ලදි.

සංවර්ධන ක්‍රියාකාරකම්

2017 වර්ෂය තුළදී බොහෝ ග්‍රාමීය ජල සම්පාදන ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කරන ලදි. පදවි සිරිපුර ආරෝග්‍ය ශාලාව තුළ හා නොච්චිකුලම් ග්‍රාමය තුළ විලෝම ආශ්‍රැති යන්ත්‍රාගාරයන් ස්ථාපිත කිරීම හා අදාල වූ සිවිල් වැඩ කටයුතු සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇති අතර ස්ථාපිත කිරීම සඳහා යන්ත්‍රාගාරයන් වැඩබිම් වෙත ගෙන එනු ලැබ ඇත. ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ බක්මීගම ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රමය රුපියල් මිලියන 24.0 ක පිරිවැයක් වැය කරමින් සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇති අතර ඒ මගින් ප්‍රතිලාභීන් 1,120 දෙනෙකුට සෙත සැලැසෙනු ඇත. ප්‍රතිලාභීන් 5,000 ක් වෙනුවෙන් වන සූරියපොකුණ පුස්සල්වින්න ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රමය රුපියල් මිලියන 35.0 ක මුදලක් වැය

කරමින් සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇති අතර ප්‍රතිලාභීන් 3,700 දෙනෙකු සඳහා වන සන්තුම්පුර ලිහිණියාගම ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රමය (පිරිවැය රුපියල් මිලියන 21.00 කි) පුනරුත්ථාපනය කිරීමේ කටයුතු හා ප්‍රතිලාභීන් 5,000 දෙනෙකු සඳහා වන හේනානිගල ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රමය (පිරිවැය රුපියල් මිලියන 31.3 කි) ඉදි කිරීමේ කටයුතු ක්‍රියාත්මක කරනු ලබමින් පැවැතිණි.

ත්‍රිකුණාමලය ජල සම්පාදන යෝජනා ක්‍රමය වර්ධනය කිරීමේ වැඩසටහන යටතේ කන්තලේ ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය, තුළු මුවයන් හා පොම්ප කිරීමේ ප්‍රධාන නල මාර්ගය වැඩි දියුණු කිරීමේ වැඩ කටයුතු ද, පැරණි ජලය බෙදා හැරීමේ නල මාර්ග ප්‍රතිස්ථාපනය කිරීමේ වැඩ කටයුතු හා බෙදා හැරීමේ නල මාර්ග දීර්ඝ කිරීමේ වැඩ කටයුතු රුපියල් මිලියන 350 ක මුදලක් වැය කරමින් දැනට ක්‍රියාත්මක කරනු ලබමින් පවතී. වාලච්චේනෙයි ජල සම්පාදන ව්‍යාපෘතිය වෙනුවෙන් යෝජනා කැඳවීමේ කටයුතු සිදු කරනු ලැබ ඇති අතර එහි යාවත්කාල ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් බිලියන 12 ක් වේ. විසල් ත්‍රිකුණාමලය ජල සම්පාදන පුළුල් කිරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් වන සක්‍යතා අධ්‍යයනය දැනට සිදු කරනු ලබමින් පවතින අතර හැඩ ඔය ජල සම්පාදන යෝජනා ක්‍රමය වෙනුවෙන් වූ සක්‍යතා අධ්‍යයනය අවසන් කරනු ලැබ දැනට ඒ සඳහා ව්‍යාපෘති සමාලෝචන කමිටුවේ අනුමැතිය අපේක්ෂාවෙන් සිටිනු ලැබේ.

ප්‍රති ආරෝපන වැඩ කටයුතු වශයෙන් රුපියල් මිලියන 11.5 ක පිරිවැයක් දරමින් ත්‍රිකුණාමල දිස්ත්‍රික්කය තුළ කිලෝ මීටර 12.5 ක නල මාර්ග දීර්ඝ කිරීම ද, රුපියල් මිලියන 69.6 ක පිරිවැයක් දරමින් මඩකලපුව දිස්ත්‍රික්කය තුළ කිලෝ මීටර 46.5 ක නල මාර්ග දීර්ඝ කිරීම හා රුපියල් මිලියන 10 ක පිරිවැයක් දරමින් අක්කරෙයිපත්තු කලාපය තුළ කිලෝ මීටර 10 ක නල මාර්ග දීර්ඝ කිරීම ද 2017 වර්ෂය තුළදී ක්‍රියාත්මක කරන ලදි. රුපියල් මිලියන 5 ක පිරිවැයක් වැය කරමින් පොලි එතිලින් නල මිළ දී ගෙන ඒවා අම්පාර පරගහගල පිහිටි ජලජීවී රෝපණ දෙපාර්තමේන්තුව වෙත භාර දෙනු ලැබ ඇත.

දේශීය බැංකු අරමුදල් යොදා ගනිමින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතිය හා සම්බන්ධ වැඩිමනත් කර්තව්‍යයක් වශයෙන් (මෙම ව්‍යාපෘතියට අදාල මූලික විෂය පථය 2014 වර්ෂයේදී සම්පූර්ණයෙන් නිම කරන ලදි) රුපියල් මිලියන 104 ක පිරිවැයක් වැය කරමින් ඔට්ටමාවඩු ප්‍රදේශය දක්වා සේවාව දිගු කිරීම පිණිස කිලෝ මීටර 52 කින් නල මාර්ග දීර්ඝ කිරීමේ වැඩ කටයුතු දැනට සිදු කරනු ලබමින් පවතී.

පොදු ක්‍රියාකාරකම් හා ගැටළු

නැගෙනහිර කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය විසින් දෙනු ලැබ ඇති මුළු සේවා සම්බන්ධතා සංඛ්‍යාව 244,061 ක් දක්වා නැග ඇත. රුපියල් මිලියන 1,524.67 ක බිල් නිකුත් කිරීමක් කරනු ලැබ ඇති අතර ඒ වෙනුවෙන් රුපියල් මිලියන 1,680.49 ක මුදලක් රැස් කිරීම වාර්තා වී තිබේ. අගැයීම් කටයුතු කරන ලද ටෙන්ඩර මුළු සංඛ්‍යාව 127 ක් වන අතර රුපියල් මිලියන 447.95 ක අගයකින් යුත් කොන්ත්‍රාත්තු 70 ක සංඛ්‍යාවක් ප්‍රදානය කරනු ලැබ ඇත.

කලාපීය තොග ගබඩාවේ ඇති තොග මට්ටම් අඩු කිරීමට අදාලව, 2017 තොග සමීක්ෂණය අතරතුරදී ප්‍රයෝජනයට ගත නොහැකි හා පාවිච්චියට ගනු නොලබන භාණ්ඩ තොග හඳුනා ගන්නා ලද අතර සමීක්ෂණ මණ්ඩල වාර්තාව අනුව ඒවා ඉවත් කිරීමට කටයුතු කරනු ලබනවා ඇත. මද වශයෙන් භාවිතයට ගනු ලබන අතිරික්ත අයිතමයන් වෙනත් කලාපයන් විසින් ඉල්ලා සිටිනු ලබන සෑම අවස්ථාවකදීම එම කලාපයන් සමග බෙදා හදා ගැනීමට කටයුතු කරනු ලැබේ. සියළුම කලාපීය තොග ගබඩාවන් තුළ තිබෙන ද්‍රව්‍යයන්ට අදාලව මධ්‍යගත දත්ත සංචිතයක් ස්ථාපිත කරනු ලැබ ඇති අතර (මෙලෙක් නොකළ පොලි විනිල් ක්ලෝරයිඩ් / මෘදු යකඩ නල මිලයට ගැනීම සඳහා) ටෙන්ඩර කැඳවීමට පෙර දත්ත සංචිතය පරීක්ෂා කර බලනු ලැබේ.

වත්කම් කළමනාකරණ ක්‍රියාකාරකම් වශයෙන් ස්ථාවර වත්කම් හරි වැරදි බැලීම සිදු කරන ලද අතර (කලාපීය සහාය සේවා මධ්‍යස්ථාන මට්ටමින් හා කලාප මට්ටමින්) ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කරන ලදි. අළුත් ව්‍යාපෘතීන් වෙනුවෙන් ඉඩම් අත් පත් කර ගැනීම අදාල ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා මිණුම් දෙපාර්තමේන්තුව ආදී අදාල ආයතනයන් සමග සම්බන්ධීකරණයෙන් යුතුව සිදු කරන ලදි. කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය සතුව ඇති වාහන, යටිතල පහසුකම්, යන්ත්‍රාගාර හා යන්ත්‍ර සූත්‍ර, වෙනත් උපකරණ, ජංගම උපකරණ, පරිගණක හා ඉඩම් පිළිබඳ විස්තර මත වූ භාණ්ඩාගාර වාර්තාව පිළියෙල කරන ලදි.

ගබඩා වැඩි දියුණු කිරීමේ ක්‍රියාකාරකම් වශයෙන් ත්‍රිකුණාමල ජල සම්පාදන යෝජනා ක්‍රමය වර්ධන කටයුතු වැඩසටහන යටතේ රුපියල් මිලියන 5.0 ක පිරිවැයක් වැය කරමින් ත්‍රිකුණාමලයේ කලාපීය ගබඩා ගොඩනැගිල්ල පුනරුත්ථාපනය කරන ලදි.

ප්‍රස්තුත වර්ෂය තුළදී කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය ප්‍රධාන ගැටළු කිහිපයකට මුහුණ දුන්නේය. පුල්මොඩ්ඩෙයි ජල සම්පාදන යෝජනා ක්‍රමය හා සම්බන්ධ තුළු මුවට අදාලව ජල සුරක්ෂිතතාවය පිළිබඳ ගැටළුවක් පවතින අතර ඉදි කිරීම සඳහා නව ප්‍රභවයක් හඳුනා ගනු ලැබ ඇත. මුතූර් ජල සම්පාදන යෝජනා ක්‍රමය හා සම්බන්ධ නීලපොල තුළු මුවෙහි ජලය වියලි කාලයන් තුළදී ජල මට්ටම පෙරහන් මට්ටමින් පහලට යයි. තිරුක්කෝවිල් ජල සම්පාදන යෝජනා ක්‍රමය සම්බන්ධයෙන් ගත් කල වියලි කාලයන් තුළදී ගොවීන්ගේ ජලය සඳහා ඇති ඉල්ලුම වැඩි වීම හේතුකොට ගෙන සාගමම් වාරිමාර්ග වැවෙන් ජලය උකහා ගැනීමට සීමාවන් ඇති වෙයි. එසේම, පොතුවිල් ජල සම්පාදන යෝජනා ක්‍රමයට අමු ජලය ලබා ගන්නා භූගත ජල ප්‍රභවය ප්‍රමාණවත් නොවන හෙයින් ජල සම්පාදනය පැය දෙකක කාලයකට සීමා කිරීමට සිදු වී තිබේ.

දැනට ක්‍රියාත්මක කෙරෙමින් පවතින විදේශීය / දේශීය බැංකු විසින් අරමුදල් සපයනු ලබන ජල සම්පාදන ව්‍යාපෘතීන්.

නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක කරනු ලබන ප්‍රධාන ජල සම්පාදන ව්‍යාපෘතී විසින් සාක්ෂාත් කරගෙන ඇති සාර්ථකත්වයන්.

2017 වර්ෂය තුළදී ඉදි කෙරෙමින් / වර්ධනය කෙරෙමින් පැවැතුන විදේශීය /දේශීය බැංකු විසින් අරමුදල් සම්පාදනය කරනු ලබන ජල සම්පාදන ව්‍යාපෘතීන් පෙන්නුම් කරනු ලබන සිතියම.

විදේශීය ඒජන්සි විසින් අරමුදල් සපයනු ලබන ව්‍යාපෘති.



	ව්‍යාපෘතියේ නම	අරමුදල් සපයන ඒජන්සිය
1	අනුරාධපුර උතුර ජල සම්පාදන ව්‍යාපෘතිය	ජපාන ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සිය.
2	වීසල් දඹුල්ල ජල සම්පාදන ව්‍යාපෘතිය පියවර I	ඉන්දියාව
3	වියළි කලාපීය ජල හා සනීපාරක්ෂණ ව්‍යාපෘතිය	ආසියානු සංවර්ධන බැංකුව
4	යාපනය - කිලිනොච්චි ජල හා සනීපාරක්ෂණ ව්‍යාපෘතිය	ආසියානු සංවර්ධන බැංකුව
5	වීසල් කොළඹ ජල හා අපජල කළමනාකරණය වැඩි දියුණු කිරීමේ ආයෝජනය	ආසියානු සංවර්ධන බැංකුව
6	අම්පාර දිස්ත්‍රික්කය තුළ සේවා නොලැබුන ප්‍රදේශ සඳහා ඒකාබද්ධ ජල සම්පාදන යෝජනා ක්‍රමය - අදියර 111	ආසියානු සංවර්ධන බැංකුව
7	කොලොන්න - බලංගොඩ ජල සම්පාදන ව්‍යාපෘතිය	බෙල්ජියම
8	ලබුගම - කැලුවාව ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය	හන්ගේරියාව
9	බදුල්ල, හාලි ඇල හා ඇල්ල ජල සම්පාදන ව්‍යාපෘතිය	එක්සත් ජනපද අපනයන ආනයන බැංකුව
10	ගම්පහ, අත්තනගල්ල හා මිනුවන්ගොඩ ජල සම්පාදන ව්‍යාපෘතිය	චීනය
11	මොණරාගල - බුත්තල ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය	KBC බෙල්ජියම
12	අඹතලේ ජල සම්පාදන යෝජනා ක්‍රම වැඩි දියුණු කිරීමේ හා බල ශක්ති සංරක්ෂණය කිරීමේ ව්‍යාපෘතිය	ප්‍රංශ සංවර්ධන ඒජන්සිය
13	ආනමඩුව ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය	ස්පාඤ්ඤය
14	කැළණි දකුණු ඉවුර ජල සම්පාදන ව්‍යාපෘතිය - පියවර 11	ප්‍රංශය
15	මාතර පියවර iv	NDB
16	වීසල් මාතලේ ජල සම්පාදන ව්‍යාපෘතිය	ප්‍රංශ
17	අලුත්ගම, මතුගම හා අහලවත්ත ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය	ඉන්දියානු අපනයන ආනයන බැංකුව

දේශීය බැංකු විසින් අරමුදල් සපයන ලද ව්‍යාපෘතීන්

A	බෙන්තොට ජල සම්පාදන ව්‍යාපෘතිය
B	අම්පාර බෙදා හැරීම් ජාල ජල සම්පාදන ව්‍යාපෘතිය
C	රුහුණුපුර බෙදා හැරීම් ජල සම්පාදන ව්‍යාපෘතිය
D	කොළඹ ජල සම්පාදන වැඩි දියුණු කිරීම් ව්‍යාපෘතිය
E	කොළඹ දිස්ත්‍රික්කයට නැගෙනහිරින් පිහිටි ජල සම්පාදන ව්‍යාපෘති - 1 වැනි පැකේජය
F	ගාල්ල පොකුරු ජල සම්පාදන ව්‍යාපෘතිය
G	අවිස්සාවේල්ල හා කොස්ගම ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය
H	ගලගෙදර / මාවනගම ජල සම්පාදන ව්‍යාපෘතිය
I	ලග්ගල නව නගර ජල සම්පාදන ව්‍යාපෘතිය
J	වැලිගම ජල සම්පාදන ව්‍යාපෘතිය
K	මැද්දිරිගිරිය ජල සම්පාදන ව්‍යාපෘතිය
L	ඇටම්පිටිය ජල සම්පාදන ව්‍යාපෘතිය කිලියන 3.5 ක ව්‍යාපෘතිය.

විදේශීය ආයතනයන් විසින් අරමුදල් සම්පාදනය කරනු ලබන ව්‍යාපෘතීන්

ජපාන ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සියෙහි සහයෝගිතාවය සහිතව ක්‍රියාත්මක කිරීම ආරම්භ කරන ලද ව්‍යාපෘතීන්

1. අනුරාධපුර උතුර ජල සම්පාදන ව්‍යාපෘතිය (අදියර 1)

මෙම ව්‍යාපෘතියේ විෂය පථය වන්නේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ ග්‍රාම නිලධාරී වසම් 75 කින් සමන්විත මැදවච්චිය හා රඹෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයන් තුළ ජල සම්පාදන යෝජනා ක්‍රමයක් ඉදි කිරීම මගින් එම ප්‍රදේශයන් තුළ (2034 වන විට) ජීවත් වන ආසන්න වශයෙන් 115,600 ක් වූ ජන ගහණය වෙත ආරක්ෂාකාරී පානීය ජලය සම්පාදනය කර දීම වන්නේය. (මීට අතිරේක වශයෙන් මිහින්තලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ග්‍රාම නිලධාරී වසම් දෙකක් ද මෙම ව්‍යාපෘතිය මගින් ආවරණය කිරීමට නියමිත අතර දැනට එම ප්‍රදේශයේ සිටින ජනතාව යැපෙන්නේ දන්ත හා අස්ථි ෆ්ලෝරෝසියාවට හේතු වන හා හඳුනා නොගත් හේතූන් නිසා ඇති වන නිදන්ගත වකුගඩු රෝගයට තුඩු දීමේ ඉහළ ප්‍රවණතාවයක් ඇති අනාරක්ෂිත භූ ගත ජලය මත වේ.

ව්‍යාපෘතිය වෙත මූල්‍ය ප්‍රදාන දායකත්වය ලබා දෙන ඒජන්සි ආයතනය වන්නේ ජපාන ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සිය වන අතර ව්‍යාපෘතියේ ආරම්භක පිරිවැය ජපන් යෙන් මිලියන 5,166 ක් හා රුපියල් මිලියන 2,786 ක් වන්නේය. ණය මුදල් 2013 ජූලි 5 වැනි දින සිට බලාත්මක වූ අතර උපදේශක කොන්ත්‍රාත්තුව 2014 ජූලි 15 වැනි දින ආරම්භ විය.

ව්‍යාපෘතියේ අංගයන් වන්නේ මහකනදුරාව වැවෙහි ඉදි කරනු ලබන දිනකට ජලය ඝණ මීටර 19,800 ක ධාරිතාවයකින් යුත් තුළු මුව ද, දිනකට ජලය ඝණ මීටර 9,400 ක ධාරිතාවයකින් යුත් ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය ද, කිලෝ මීටර 89 ක දිගින් යුත් ඉහළ ඝණත්වයේ පොලි එතිලින් ප්‍රධාන සම්ප්‍රේෂණ නල මාර්ගය ද, කිලෝ මීටර 163 ක දිගින් යුත් ඉහළ ඝණත්වයේ පොලි එතිලින් ප්‍රධාන බෙදා හැරීමේ නල මාර්ග පද්ධතිය ද, කිලෝ මීටර 330 ක දිගින් යුත් පීවීසී බෙදා හැරීම් නල මාර්ග පද්ධතිය ද, ඔසොවු ටැංකි 4 ක් ද, බිම් ටැංකි 3 ක් හා යාන්ත්‍රික හා විද්‍යුත් වැඩ ද වේ.

සවිස්තරාත්මක සැලසුම් හා සියළුම කොන්ත්‍රාත්තු පැකේජ වෙනුවෙන් වූ කොන්ත්‍රාත්තු ලිපි ලේඛන පිළියෙල කිරීම ද සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇත.

"ඒ" කොටස (තුළු මුව පහසුකම්, ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය ඉදි කිරීම, ජලය ගබඩා කිරීමේ ව්‍යුහයන් ඉදි කිරීම් සහ සහ යාන්ත්‍රික, විද්‍යුත් හා ගොඩනැගිලි වැඩ) සඳහා වූ ජපාන ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සියේ එකඟ තාවය 2017.11.22 වැනි දින ලැබුන අතර දැනට එය කොන්ත්‍රාත්තු ප්‍රදානය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය අපේක්ෂාවෙන් රඳවාගෙන තිබේ.

"බී" කොටස (සම්ප්‍රේෂණ නල මාර්ග, උප ප්‍රධාන සම්ප්‍රේෂණ නල මාර්ග හා ප්‍රධාන බෙදා හැරීම් නල මාර්ග සපයා වීලීම) සඳහා වූ කොන්ත්‍රාත්තුව ප්‍රදානය කරන ලද්දේය.

"සී - 1" කොටස (ඉසින්බැස්සගල බෙදා හැරීම් කලාපය තුළ මෙලෙක් නොකල පොලි විනිල් ක්ලෝරයිඩ් (uPVC) නල මාර්ග වීලීම, සවි කිරීම් හා විශේෂාංග සැපයීම, මෘදු යකඩ හා ගැල්වනයිස් යකඩ නල මාර්ග සපයා වීලීම හා සවි කිරීම් හා විශේෂාංග සැපයීම) වෙනුවෙන් වූ කොන්ත්‍රාත්තුව ප්‍රදානය කරන ලද අතර 2017 වර්ෂයේ දෙසැම්බර් මාසය අවසන් වන විට කිලෝ මීටර් 94.8 ක් දිගින් යුත් නල මාර්ග වීලා අවසන් කරනු ලැබ ඇත.

"සී - 2" කොටස (මෙලෙක් නොකල පොලි විනිල් ක්ලෝරයිඩ් (uPVC) නල, සවි කිරීම් හා විශේෂ උපාංග සපයා ගෙනැවිත් භාර දීම) සම්බන්ධ කොන්ත්‍රාත්තුව ප්‍රදානය කරන ලද අතර එය 2017ග02ග06 දින වන විට සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇත.

"සී - 3" කොටස (නැගෙනහිර රඹෑව, ඇතාකඩ හා රඹෑව යන බෙදා හැරීම් කලාපයන් තුළ මෙලෙක් නොකල පොලි විනිල් ක්ලෝරයිඩ් (uPVC) නල මාර්ග වීලීම, සවි කිරීම් හා විශේෂ උපාංග යන් සවි කිරීම, මෘදු යකඩ හා ගැල්වනයිස් යකඩ නල මාර්ග සපයා වීලීම හා සවි කිරීම් හා විශේෂ උපාංගයන් සපයා සවි කිරීම) සම්බන්ධ කොන්ත්‍රාත්තුව ප්‍රදානය කරනු ලැබ ඇති අතර 2017 දෙසැම්බර් මස අවසානය වන විට කිලෝ මීටර් 113.4 ක දිගින් යුත් නල මාර්ග වලනු ලැබ ඇත.

"ඩී - 1" දරන කොටසට (මෙහෙයුම් හා නඩත්තු උපකරණ මිලයට ගැනීම) අදාල කොන්ත්‍රාත්තුව උපකරණ හතරක් වෙනුවෙන් ප්‍රදානය කරන ලද අතර ඉතිරි උපකරණ ආපසු කැඳවීමට විසින් තීරණය කරන ලදි.

"ඩී - 2" කොටස හා සම්බන්ධ කොන්ත්‍රාත්තු පැකේජය (බවුසර, කැබ් රථ, මිනි බැක්හෝ රථ හා යතුරු පැදි මිළයට ගැනීම) ප්‍රදානය කරන ලද අතර එය 2014 අප්‍රේල් 28 වැනි දින විට සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇත.

2017 වර්ෂය අවසානය වන විට ව්‍යාපෘතියේ සමස්ත භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් 12.23% ක් හා 8.64 % ක් විය.

ව්‍යාපෘතිය හා අදාල සාමාන්‍ය ගැටළු වශයෙන් පෙන්වා දිය හැක්කේ "ඒ" කොටසට අදාල කොන්ත්‍රාත්තුව (තුළු මුව පහසුකම් හා ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය ඉදි කිරීම, භූමි ටැංකි ඉදි කිරීම, ඔසොව් ටැංකි ඉදි කිරීම, කාර්යාල ගොඩනැගිලි ඉදි කිරීම සහ යාන්ත්‍රික හා විද්‍යුත් වැඩ) ප්‍රදානය කිරීම හා "බී" කොටසට අදාල කොන්ත්‍රාත්තුව (ප්‍රධාන සම්ප්‍රේෂණ නල මාර්ගය හා උප ප්‍රධාන බෙදා හැරීම් නල මාර්ග සපයා වීලීම) ප්‍රදානය කිරීම ප්‍රමාද වීමට හේතුව වූයේ ලිපි ලේඛන අඟැයීමේ කටයුතු, ලංසු ඉදිරිපත් කිරීමේ හා ලංසු අඟැයීමට භාජනය කිරීමේදී සිදු වූ ප්‍රමාදයන් මෙන්ම ජපාන ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සි ආයතනයේ එකඟත්වය ලබා ගැනීමේදී සිදු වූ ප්‍රමාදයත්ය.

ඉන්දියානු සහයෝගිතාවය සහිතව ක්‍රියාත්මක කිරීම ආරම්භ කරන ලද ව්‍යාපෘතීන්

2. විසල් දඹුල්ල ජල සම්පාදන ව්‍යාපෘතිය - පියවර 1.

විසල් දඹුල්ල ජල සම්පාදන ව්‍යාපෘතිය - පියවර 1 සැලසුම් කොට ඉදි කිරීමේ කොන්ත්‍රාත්තුවක් වූ අතර එය ආරම්භ කරන ලද්දේ 2012 වර්ෂයේ මාර්තු මාසය තුළදීය. එම ව්‍යාපෘතිය වෙත අරමුදල් සපයනු ලබන්නේ ඉන්දියාවේ අපනයන ආනයන බැංකුව විසින් හා ශ්‍රී ලංකාවේ මහජන බැංකුව විසින් වන අතර මුළු ව්‍යාපෘති පිරිවැය අමෙරිකානු ඩොලර් මිලියන 77.8 ක් වේ.

මෙම ව්‍යාපෘතියේ අරමුණ වන්නේ දඹුල්ල සංවර්ධන ප්‍රදේශය ආවරණය වන පරිදි ජල සම්පාදන යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම වේ. මෙහි ප්‍රතිලාභීන් වන්නේ දඹුල්ල, ගලේවෙල, කැකිරාව, පලාගල, පලුගස්වැව හා ඒ අවට ප්‍රදේශ වල ජීවත් වන 174,100 ක ජනතාව වේ.

ව්‍යාපෘති අංගයන් වන්නේ දිනකට ජලය ඝණ මීටර 65,000 ක ධාරිතාවයකින් යුත් තුළු මුවක්, දිනකට ජලය ඝණ මීටර 32,000 ක ධාරිතාවයකින් යුත් සම්පූර්ණයෙන් ස්වයංක්‍රීයව මෙහෙයවෙන ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයක් හා ඝණ මීටර 2,500 ක ධාරිතාවයකින් යුත් පවිත්‍ර ජල ටැංකියක් ඊට අනුබද්ධ දෙවැනි පොම්පාගාරයක් හා ජලය ඝණ මීටර 1350 ක ධාරිතාවයකින් යුත් භූමි ජලාශයක් හා තවත් භූමි ජලාශයන් 6 ක්ද, මුළු ධාරිතාවය ඝණ මීටර 5500 කින් යුත් ඔසොව් කුළුණු දෙකක් ද කිලෝ මීටර 0.7 ක දිගින් යුත් හා විෂ්කම්භය මිලි මීටර 900 කින් යුත් මෘදු යකඩ ප්‍රධාන අමු ජල සම්ප්‍රේෂණ නල මාර්ග යක් ද විෂ්කම්භය මිලි මීටර 450 සිට 250 ක් වූ කිලෝ මීටර 71.5 ක දිගින් යුත් මෘදු යකඩ ප්‍රධාන සම්ප්‍රේෂණ නල මාර්ගයක් ද, කිලෝ මීටර් 218 ක දිගින් යුත් විෂ්කම්භය මිලි මීටර 280 සිට 63 ක් දක්වා වූ බෙදා හැරීමේ ප්‍රධාන මෙලෙක් නොකළ පොලි එතිලින් ක්ලෝරයිඩ් (uPVC) නල මාර්ගයක් ද ස්ථාන භාර නිලධාරී කාර්යාල ගොඩනැගිල්ල, එක් නඩත්තු කාර්යාලයක්, කාර්ය මණ්ඩල නිල නිවාසයක් හා ක්‍රියාත්මක කරන්නන්ගේ නිල නිවාස 3 ක් ඇතුළු මෙහෙයුම් ගොඩනැගිලි ද වේ.

තුළු මුව, අමු ජල සම්ප්‍රේෂණ ප්‍රධාන නල මාර්ගය, ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය, ඉහාමලුව දෙවැනි පොම්පාගාරය හා ඉහාමලුව හා සීගිරිය යන බෙදා හැරීමේ කලාපයන් කලකට පෙර ක්‍රියාත්මක කරන ලද අතර දැනට ඒවා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් මෙහෙයවනු ලබයි. ජලාශයන් හා කුළුනෙහි ඉදි කිරීම් වල ප්‍රගතිය 90% ක් වේ. සම්ප්‍රේෂණ හා බෙදා හැරීම් පද්ධතීන්ගේ ප්‍රගතිය පිළිවෙලින් 89.6% ක් හා 91.5% ක් වේ.

2017.12.31 වන දිනය වන විට ව්‍යාපෘතියේ සමස්ත භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් 93.6% ක් හා 85% ක් විය. ව්‍යාපෘතිය 2018 වර්ෂය තුළදී සේවයේ යොදවනු ලැබීමට අපේක්ෂිතය.

ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය

ආසියානු සංවර්ධන බැංකුවේ සහයෝගිතාවය සහිතව ක්‍රියාත්මක කිරීම ආරම්භ කරන ලද ව්‍යාපෘතීන්

3. වියලි කලාපීය ජල සම්පාදන හා සනීපාරක්ෂණ ව්‍යාපෘතිය (ආසියානු සංවර්ධන බැංකුවේ 5 වැනි ව්‍යාපෘතිය)

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් වියලි කලාපීය ජල සම්පාදන හා සනීපාරක්ෂණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබන්නේ වයඹ හා උතුරු පලාත් වල ජල සම්පාදන හා සනීපාරක්ෂණ සේවාවන් වැඩි දියුණු කිරීමේ අපේක්ෂාවෙනි. මෙම ව්‍යාපෘතිය යටතේ වවුනියාව, මන්නාරම, හලාවත හා පුත්තලම යන නගරයන් වෙත ඉහල මට්ටමක ජල සම්පාදන හා සනීපාරක්ෂණ සේවා පහසු කම් සපයා දීමට අපේක්ෂා කරනු ලැබේ. ව්‍යාපෘතිය වෙනුවෙන් ඇස්තමේන්තු කරනු ලැබ ඇති මුලු පිරිවැය ඇමෙරිකානු ඩොලර් මිලියන 144.73 ක් (ආසන්න වශයෙන් රුපියල් මිලියන 17,196.39 ක්) වේ. 2017 වර්ෂයේ දෙසැම්බර් මාසය අවසන් වන විට ව්‍යාපෘතියේ සමස්ත භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් 93.84 % ක් හා 91.0 % ක් විය. 2014 වර්ෂය තුළදී කොන්ත්‍රාත්තු විසි හතක සංඛ්‍යාවක් ද, 2015 වර්ෂය තුළ දී කොන්ත්‍රාත්තු 8 ක සංඛ්‍යාවක් හා 2016 වර්ෂය තුළ දී කොන්ත්‍රාත්තු 02 ක් ද මෙම ව්‍යාපෘතිය යටතේ ප්‍රදානය කරනු ලැබ ඇත. 2017 වර්ෂය තුළදී ප්‍රදානය කරන ලද කොන්ත්‍රාත්තු සංඛ්‍යාව 4 කි. මීල ගණන් කැඳවීමේ කොන්ත්‍රාත්තු (Shopping Contract) සංඛ්‍යාව මෙම වාර්තාව තුළ විස්තරාත්මක ලෙස දක්වනු ලැබ නැත.

වවුනියාව

මෙම ව්‍යාපෘතිය විසින් දිනකට ජලය ඝණ මීටර 12,000 ක ධාරිතාවයකින් යුත් ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයක් වවුනියාවේ ඉදි කරනු ලබන අතර එය 99.1% ක භෞතික ප්‍රගතියකි. ප්‍රතිකාරක යන්ත්‍රාගාරය ඉදි කිරීමේ කොන්ත්‍රාත්තුව යටතේ වූ සියලුම සිවිල් වැඩ සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇති අතර යාන්ත්‍රික හා විද්‍යුත් ස්ථාපිත කිරීම් සම්පූර්ණයෙන් නිම කොට පරීක්ෂණාට බඳුන් කරනු ලැබ තිබේ. ඝණ මීටර මිලියන 3.83 ක ධාරිතාවයකින් යුත් රැලි පැන්නුම සහිත රැස්කුරු ජලාශයක් පේරු ආරු ඔය හරහා ඉදි කිරීමේ කටයුතු මේ වන විට සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇත. 2018 වර්ෂය තුළ දී පවුල් 15,950 ක් වෙත ප්‍රතිකාරිත ජලය දිනකට ඝණ මීටර 9,800 ක් සැපයීම සඳහා මතු පිට ජලය මෙන්ම භූ ගත ජලය ද ඒකාබද්ධ කොට යොදාගනු ලබනවා ඇත. ව්‍යාපෘතියේ ප්‍රධාන අංගයන් වන්නේ අලුත් ජල කුලුණු 3 ක්, ජලාශයක් හා කිලෝ මීටර් 245 ක් දිගින් යුත් බෙදා හැරීමේ නල මාර්ග පද්ධතිය වන අතර එම කටයුතු දැනට නිම වීමේ අවසන් අදියරෙහි පවතී. (ආසන්න වශයෙන් කිලෝ මීටර් 07 ක පමණ දිගින් යුත් බෙදා හැරීම් නල වීථිම හා කිලෝ මීටර් 16.5 ක දිගින් යුත් සම්ප්‍රේෂණ නල මාර්ගය ඉදි කිරීම ද කිරීමට ඉතිරි වී ඇති වැඩ වේ). මෙම ව්‍යාපෘතිය යටතේ සනීපාරක්ෂණ සංරචකයක් ද තිබෙන අතර ඒ යටතේ පොදු වැසිකිළි 4 ක් සපයා දීම ද, දිනකට ඝණ මීටර 28 ක තුළු ගැලීම් ධාරිතාවයකින් යුත් දැනට ක්‍රියාත්මක වන පූතික යන්ත්‍රාගාරය වැඩි දියුණු කිරීම හා වවුනියාවේ ගෘහස්තයන් 500 ක් වෙනුවෙන් ගෘහස්ත වැසිකිළි ඉදි කර දීම ද දැනට සම්පූර්ණයෙන්ම නිම කරනු ලැබ ඇත. මෙම ව්‍යාපෘතිය මගින් 2035 වර්ෂය වන විට ආවරණය කරනු ලැබීමට සැලසුම් කරනු ලැබ ඇති ප්‍රතිලාභ ලබන්නන්ගේ සංඛ්‍යාව 109,432 ක් වේ.

මන්නාරම

මන්නාරම සිදු කරනු ලබන වැඩි දියුණු කිරීම් වලට මන්නාරම, මුරුලකන්, වන්කාලි හා තිරුකෙතීස්වරම් යන ප්‍රදේශයන් වෙත ප්‍රතිකාර කරන ලද ජලය දිනකට ඝණ මීටර 12,000 ක් සැපයීමට හැකි වන පරිදි මිහි විදමන් 10 ක් සංවර්ධනය කිරීම ඇතුලත් වේ. 2017 වර්ෂය තුළ දී පවුල් 6,672 ක සැලැසුම්ගත ජනගහණයක් වෙත පූර්ණ වශයෙන් ප්‍රතිකාර කරන ලද ජලය සම්පාදනය කිරීම සඳහා කිලෝ මීටර 27.6 ක දිගින් යුත් සම්ප්‍රේෂණ නල මාර්ගයකින් හා කිලෝ මීටර 105 ක දිගින් යුත් බෙදා හැරීම් නල මාර්ග පද්ධතියකින්ද යුක්ත වූ එක් නව ජල කුළුණක් හා භූ ගත ජල ජලාශයන් දෙකක් දැනට ඉදි කරනු ලබමින් තිබේ. මීට අමතරව පොදු වැසිකිළි 4 ක් හා ගෘහස්ත වැසිකිළි 330 ක් දැනට ඉදි කිරීම් පියවර තුළ පවතී. වැඩ සියල්ලක්ම මෙන් සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇත.

පූතික ප්‍රතිකාරක පහසුකම, ජලය ගබඩා කිරීමේ ව්‍යුහයන්, පොදු වැසිකිළි හා බෙදා හැරීමේ පද්ධතිය සඳහා වූ මෘදු යකඩ හා ඉහල ඝණත්වයේ පොලි එතිලින් සහ පොලි විනිල් ක්ලෝරයිඩ් (PVC) නල සපයා වීථිම ද සඳහා වූ කොන්ත්‍රාත්තු ප්‍රදානය කරනු ලැබ ඇත. පූතික ප්‍රතිකාරක පහසුකම හා පොදු වැසිකිළි ඉදි කිරීම සම්පූර්ණයෙන්ම නිම කරනු ලැබ ඇති අතර නල මාර්ග වීථිමේ කටයුතු 100% ක් නිම කරනු ලැබ ඇත. ජලය ගබඩා කිරීමේ ව්‍යුහයන් සම්බන්ධයෙන් වූ සිවිල් ඉදි කිරීම් කටයුතු හා යාන්ත්‍රික හා විද්‍යුත් උපකරණ ස්ථාපනය කිරීමේ කටයුතු 2016 දෙසැම්බර් මාසය තුළ දී සම්පූර්ණයෙන් නිම කරන ලදි. 2017 වර්ෂයේදී යෝජනා ක්‍රමය සේවයේ යෙදවීමත් සමග මුළු ප්‍රතිලාභීන් සංඛ්‍යාව 55,000 ක් වූ අතර, 2035 වර්ෂය වන විට යෝජනා ක්‍රමය විසින් ආවරණය කෙරෙනු ලැබෙතැයි අපේක්ෂිත ප්‍රතිලාභී සංඛ්‍යාව 90,000 ක් වේ.

හලාවත

හලාවත ජල සම්පාදන කටයුතු සඳහා දැදුරු ඔයෙන් අමු ජලය ලබා ගැනීමට යෝජිත අතර එම ජලය යොදා ගනිමින් 93,165 ක සැලැසුම්ගත ජනගහණයක් වෙත ප්‍රතිකාර කරන ලද ජලය දිනකට ඝණ මීටර 12,000 ක් සම්පාදනය කර දීමට අපේක්ෂා කරනු ලැබේ. මෙම යෝජනා ක්‍රමයේ ප්‍රධාන අංගයන් සමන්විත වන්නේ බිංගිරියේ ඉදි කරනු ලබන දිනකට ජලය ඝණ මීටර 12,000 ක ධාරිතාවයකින් යුත් ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයකින් (එහි භෞතික ප්‍රගතිය 95% කි), ජලාශයන් දෙකකින්, සම්ප්‍රේෂණ නල මාර්ග කිලෝ මීටර 49 කින් හා ජලය බෙදා හැරීමේ නල මාර්ග කිලෝ මීටර 79 කිනි. සම්ප්‍රේෂණ හා බෙදා හැරීම් සම්බන්ධ සියළු වැඩ කටයුතු සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇත. සනීපාරක්ෂණ අංශය යටතේ පොදු වැසිකිළි 5 ක් හා ගෘහස්ත වැසිකිළි 500 ක් ඉදි කිරීමේ වැඩ කටයුතු දැනට සිදු කරනු ලබමින් පවතී. පූතික ප්‍රතිකාරක පහසුකම හා නල මාර්ග වීථිම හා සම්බන්ධ කොන්ත්‍රාත්තු අතරින් වැඩි කොටසක් සම්පූර්ණයෙන්ම නිම කරනු ලැබ ඇත. තුළු මුව ඉදි කිරීමේ කටයුතු දැනට සිදු කරනු ලබමින් පවතින අතර එහි ප්‍රගතිය 92% ක් වේ.

හලාවත ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය

පුත්තලම

පුත්තලම ජල සම්පාදන යෝජනා ක්‍රමයට දිනකට ජලය ඝණ මීටර 12,000 ක ධාරිතාවයකින් යුත් තෑළු මුවක් ඇතුලත් වන අතර ඊට ජලය උකහා ගනු ලබන්නේ කලා ඔයෙනි. සේවා සැපැයීමට අපේක්ෂා කරනු ලබන ජන ගහණය 197,440 ක් වේ. යෝජිත යෝජනා ක්‍රමය ජලාශයන් දෙකකින් ද,පොම්පාගාර 7 කින් ද, එලුවන්කුලමේ සිට පුත්තලම දක්වා දිවෙන කිලෝ මීටර 48 ක දිගකින් යුත් සම්ප්‍රේෂණ නල පද්ධතියකින් ද, දිනකට ජලය ඝණ මීටර 12,000 ක ධාරිතාවයකින් යුත් ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයකින් ද (එහි භෞතික ප්‍රගතිය 95% කි) හා කිලෝ මීටර 129 ක ජලය බෙදා හැරීමේ නල මාර්ග පද්ධතියකින් ද සමන්විත වේ. පුත්තලම නගරය තුළ හා ඒ අවට අර්ධ නාගරික ප්‍රදේශයන් තුළ පොදු වැසිකිලි 6 ක් ඉදිකිරීම හා ගෘහස්ත වැසිකිලි 500 ක් ඉදි කිරීම සනීපාරක්ෂණ අංශයේ වැඩ කටයුතු වලට ඇතුලත් වේ. පූතික ප්‍රතිකාරක පහසුකම හා පොදු වැසිකිලි ඉදි කිරීම සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇත. නල මාර්ග එලීමේ කොන්ත්‍රාත්තුව දැනට සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇති අතර තුළු මුව ඉදි කිරීමේ කටයුතු දැනට ක්‍රියාත්මක වෙමින් පවතී. ප්‍රගතිය 92 % ක් වේ.

මන්නාරම ජල සම්පාදන යෝජනා ක්‍රමය ගරු අග්‍රාමාත්‍ය වරයා විසින් 2017 ජූලි 07 වැනි දින උත්සවාකාරයෙන් විවෘත කරනු ලැබිණි.

4. යාපනය - කිලිනොච්චි ජල සම්පාදන හා සනීපාරක්ෂණ ව්‍යාපෘතිය

ජල ප්‍රභවය ඉරනමඩුව වැවෙන් ඉවත් කොට කරදියෙන් ලුණු ඉවත් කරනු ලබන යන්ත්‍රාගාරය වෙත විතැන් කිරීමෙන් අනතුරුව හා ජල සම්පාදන අංගය වඩාත් ශක්තිමත් කිරීමේ අපේක්ෂාවෙන් යාපනය - කිලිනොච්චි ජල සම්පාදන හා සනීපාරක්ෂණ ව්‍යාපෘතිය ප්‍රති ව්‍යුහාත්මක කරන ලදි. පහත දැක්වෙන වෙනස්කම් කිරීම යෝජනා කරනු ලැබේ : ඒවා නම් (1) මුලදී සම අරමුදල් සම්පාදක ලෙස ප්‍රංශ සංවර්ධන ඒජන්සිය විසින් කටයුතු කරන ලද ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය ඉදි කිරීමේ කටයුතු හා ඉරනමඩු වැවේ සිට තොග ජල සම්ප්‍රේෂණය අවලංගු කිරීම (2) මල අපවහන අංගය ඉවත් කිරීම (3) කරදියෙන් ලුණු ඉවත් කරනු ලබන යන්ත්‍රාගාරයක් ඇතුලත් කිරීම, (4) ගෘහස්ත ජල සම්පාදන සම්බන්ධතාවයන් ඇතුලත් කිරීම හා (5) ජල සම්පත් කළමනාකරණය හා සමාජ සම්බන්ධතාවයන් පුළුල් කිරීමේ ක්‍රියාකාරකම් ඇතුලත් කිරීම ද වේ. සංශෝධිත පිරිවැය ඇස්තමේන්තු මත හා ප්‍රංශ සංවර්ධන ඒජන්සියේ මූල්‍ය දායකත්වය අවලංගු වීම මත ද පදනම් වෙමින් ව්‍යාපෘතියේ විෂය පථය වෙනස් වීම මත වූ පිරිවැයේ වෙනස පියවා ගැනීම සඳහා ඇමෙරිකානු ඩොලර් මිලියන 120 ක අතිරේක මූල්‍ය දායකත්වයක් රජය විසින් ආසියානු සංවර්ධන බැංකුව වෙතින් ඉල්ලා සිටින ලද අතර එම අතිරේක ණය පහසුකම වෙනුවෙන් වූ ගිවිසුම 2017 දෙසැම්බර් 15 වැනි දින අත්සන් කරන ලදි. දැනට ක්‍රියාත්මක වන ව්‍යාපෘතිය හා යෝජිත අතිරේක අරමුදල් සම්පාදනයන් හරහා සංශෝධනය කරන ලද ව්‍යාපෘති විෂය පථය සම්පූර්ණයෙන් නිම කිරීමට හැකි වල ලෙස දැනට බල බවත්නා ණය මුදල පියවීමේ දිනය 2017 අගෝස්තු 14 වැනි දින සිට 2020 දෙසැම්බර් 31 වැනි දිනය දක්වා දීර්ඝ කරනු ලැබ ඇත.

ප්‍රතිව්‍යුහගත කරන ලද ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා වන සම්පූර්ණ පිරිවැය ඇස්තමේන්තුව ඇමෙරිකානු ඩොලර් මිලියන 266 ක් වේ. (අතිරේක මූල්‍ය සම්පාදනය ආසියානු සංවර්ධන සංවර්ධන බැංකුව වෙතින් ලැබෙන ඇමෙරිකානු ඩොලර් මිලියන 120 ක මුදල් ප්‍රමාණයකින් හා ශ්‍රී ලංකා රජයේ දායකත්වය වන ඇමෙරිකානු ඩොලර් මිලියන 33 ක මුදල් ප්‍රමාණයකින් සමන්විත වේ).

මෙම ව්‍යාපෘතිය යටතට වැටෙන ප්‍රධාන පැකේජයන් අතර ඇති පැකේජයන් දෙකක් වූ සහකාර සාමාන්‍යාධිකාරිවරයාගේ කාර්යාලය ගොඩ නැගීම (පිරිවැය රුපියල් මිලියන 282.36 කි) හා නිල නිවාස ගොඩ නැගීම (පිරිවැය රුපියල් මිලියන 29.51 කි) සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇත. 1 වැනි පැකේජය වූ ජලය බෙදා හැරීමේ නල මාර්ග ජාල සපයා එලීමේ වැඩ කටයුතු (රු. මිලියන 354.88) සෑහෙන මට්ටමක් දක්වා නිම කරනු ලැබ ඇත. කිලෝ මීටර 187 ක දිගින් යුත් ජල සම්ප්‍රේෂණ ප්‍රධාන නල මාර්ග පැකේජ 2 ක් (1 වැනි පැකේජය රුපියල් මිලියන 2646.18 ක් වන අතර 2 වැනි පැකේජය රුපියල් මිලියන 2890.39 ක් වේ) හා ඔසොව් ජල කුළුණු දෙකක් (15 ක සංඛ්‍යාවක්) (1 වැනි පැකේජය රුපියල් මිලියන 525.34 ක් වන අතර 11 වැනි පැකේජය රුපියල් මිලියන 614.77 ක් වේ) හා ඉරනමඩු වැව හා අදාල මා වැඩ ඇතුලත් කොන්ත්‍රාත්තු පැකේජ හතරක් දැනට ක්‍රියාත්මක වෙමින් පවතී. ඉතිරි බෙදා හැරීම් ජාල වැඩ කටයුතු - 2 වැනි පැකේජය (කිලෝ මීටර 248) හා යාපනය නාගරික ප්‍රදේශය (කිලෝ මීටර 285), ඔසොව් ජල කුළුණ - 3 වැනි පැකේජය (කුළුණු 5 ක සංඛ්‍යාවක්) සහ යාන්ත්‍රික හා විද්‍යුත් වැඩ කටයුතු මෙන්ම අධීක්ෂණාත්මක පාලන හා දත්ත අත් පත් කර ගැනීම් දැනට ප්‍රතිසම්පාදන පියවර තුළ පවතින අතර චුන්නාකම් ජල සම්පාදන යෝජනා ක්‍රමය ලිපි ලේඛන පිළියෙල කරනු ලැබීමේ තත්ත්වයෙහි පවතී.

2017 වර්ෂයේ අවසානය වන විට ව්‍යාපෘතියේ සමස්ත භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් 24.91 % ක් හා 13.91 % ක් විය.



පැරණි පාර්ක් කුළුණ ඉදි කිරීම

5. විසල් කොළඹ ජල හා අපජල කළමනාකරණය වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩ සටහන

වර්ෂ 1800 ගණන් වල නල ජල සම්පාදන ක්‍රමයක් ලැබී තිබුණ ආසියානු නගර කිහිපය අතුරින් කොළඹ ද එක් නගරයක් විය. කොළඹ ජලය බෙදා හැරීමේ නල ජාලයේ බොහෝ කොටස් ඉදි කරනු ලැබ ඇත්තේ වසර 100 කටත් වඩා ඉහත කාලයකට පෙර වේ. වර්ධනය වෙමින් පවතින ජලය සඳහා වන ඉල්ලුම සම්බන්ධයෙන් කටයුතු කිරීමේ අරමුණින් ව්‍යාපෘතීන් මහත් සංඛ්‍යාවක් දියත් කරනු ලැබුවද, බෙදා හැරීමේ නල මාර්ග ජාලය සැලැකිය යුතු මට්ටමකින් පුනරුත්ථාපනය නොවූ අතර එහි ප්‍රති විපාකයක් වශයෙන් කොළඹ නගරය තුළ ඉහල මට්ටමක, එනම් 49% ක ආදායම් රහිත ජල තත්ත්වයක් ඇති විය. තවද උච්චාවචනය වන පීඩන තත්ත්වයන් හා කඩින් කඩ අක්‍රිය වන ජල සම්පාදනය කොළඹ නගරය තුළ ඇතැම් තැන් වල පොදු ලක්ෂණයක් බවට පත් විය. 2011 වර්ෂය තුළදී සම්බන්ධතාවයන්

127,000 ක් තුළින් ආසන්න වශයෙන් 700,000 ක ජන ගහණයක් වෙත සේවය සැපැයීම පිණිස දිනකට ජලය ඝණ මීටර 290,000 ක සාමාන්‍යයක් සම්පාදනය කරන ලද අතර ඉන් 49% ක පරිමාවක් නැති වීම හේතුකොට ගෙන එයින් කිසිදු ආදායමක් ජනනය කරනු ලැබුවේ නැති අතර ඒ නිසා ආදායම් රහිත ජලය අවම කිරීම අවශ්‍යයෙන්ම හදිසි පදනමක් මත වහාම ක්‍රියාත්මක කළ යුතු කර්තව්‍යයක් බවට පත් වේ. මෙම සැලැකිය යුතු ගැටළුව විසඳීම සඳහා ආසියානු සංවර්ධන බැංකුව හා ශ්‍රී ලංකා රජය විසින් පිළිවෙලින් ඇමෙරිකානු ඩොලර් මිලියන 202 ක හා ඇමෙරිකානු ඩොලර් මිලියන 73 ක ආයෝජනයන් කරනු ලැබ ඇත.

මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණු වන්නේ (i) කොළඹ නගරය තුළ ජල සම්පාදනයේ සුලභතාවය හා කාර්යක්ෂමතාවය වැඩි කිරීම, (ii) බෙදා හැරීමේ පද්ධතිය නංවා ලීම හා 2020 වර්ෂය වන විට ආදායම් රහිත ජල පරිමාව 49% සිට 18% ට අඩු තත්ත්වයක් දක්වා අඩු කිරීම, (iii) මෙය සාක්ෂාත් කර ගැනීම සඳහා ආදායම් රහිත ජල පරිමාව අඩු කිරීම පිණිස දීර්ඝ කාලීන යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම හා (iv) ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ආයතනික, මෙහෙයුම් ක්‍රියාකාරිත්ව හා ව්‍යාපෘති කළමනාකරණ හැකියාවන් නංවා ලීම ද වන්නේය.

කොළඹ ජල සම්පාදන සේවා වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය (CWSSIP) විසින් ප්‍රධාන වශයෙන්ම ආවරණය කරනු ලබන්නේ කොළඹ මහ නගර සභා බල ප්‍රදේශය වන අතර මෙහෙයුම් හා නඩත්තු කටයුතු පහසු කිරීම පිණිස එකී ප්‍රදේශය දිස්ත්‍රික් මනු ප්‍රදේශයන් (DMAs) 75 කට බෙදනු ලැබ තිබේ. ව්‍යාපෘතිය මගින් අපේක්ෂා කරනු ලබන ප්‍රධානතම හා වැදගත්ම සම්පාදනයන් වන්නේ කිලෝ මීටර 565 ක දිගින් යුත් නල මාර්ග ප්‍රති ස්ථාපනය කිරීම, කොළඹ නගර මායිම තුළ පද්ධති යෙදවුම් මනු (SIV) දහ හතක් ස්ථාපිත කිරීම, ජල මනු ප්‍රති ස්ථානගත කිරීම සහ දෝෂ සහිත ජල මනු ප්‍රති ස්ථාපනය කිරීම, භූගෝලීය තොරතුරු පද්ධති ජාලය ක්‍රමාංකනය කිරීම හා යාවත්කාලීන කිරීම සහ ගොඩනැගිලි ඉදි කිරීම ද වේ.

ඒ අනුව දිස්ත්‍රික් මනු ප්‍රදේශ සැලැසුම් යටතේ වූ නල වැලීමේ කටයුතු දිස්ත්‍රික් මනු ප්‍රදේශයන් 26 ක ආරම්භ කරනු ලැබ ඇති අතර ඒ අතුරින් දිස්ත්‍රික් මනු ප්‍රදේශයන් 03 ක නල වැලීමේ කටයුතු 100% ක් සම්පූර්ණ කරනු ලැබ ඇත. මෙයින් පෙන්නුම් කරනු ලබන්නේ නල මාර්ග වැලීම සඳහා සැලැසුම් කරනු ලැබ ඇති කිලෝ මීටර 565 ක දුර ප්‍රමාණයෙන් කිලෝ මීටර 142 ක නල වැලීමේ කටයුතු 2017 දෙසැම්බර් දක්වා සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇති බවයි. තවද, ඉහතින් සඳහන් කර ඇති වැඩ නිම කරනු ලැබ ඇති දිස්ත්‍රික් මනු ප්‍රදේශයන් දෙක තුළ (දිස්ත්‍රික් මනු ප්‍රදේශ 1 හා දිස්ත්‍රික් මනු ප්‍රදේශ 3) කරන ලද ආදායම් රහිත ජල කළමනාකරණ අධ්‍යයනයන්ගෙන් පෙනී යන්නේ එම ප්‍රදේශයන් තුළ ආදායම් රහිත ජල පරිමාව 18% ට වඩා පහල බැස ඇති බවයි. මීට වැඩිමනත් වශයෙන් කොළඹ නගරයට ආදාන ලක්ෂ්‍යයන් තුළ පද්ධති යෙදවුම් මනු ස්ථාපනය කිරීම සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇත. ඉහත සඳහන් ව්‍යාපෘතිය හා නිරන්තරයෙන් ක්‍රියාත්මක කරනු ලබන මෙහෙයුම් හා කළමනාකරණ ක්‍රියාකාරකම් හේතුකොට ගෙන කොළඹ නගරයේ ආදායම් රහිත ජල පරිමාව ආසන්න වශයෙන් 42% ක් දක්වා පහත බැස ඇත.

ව්‍යාපෘතිය උත්සවාකාරයෙන් දියත් කිරීමේ අවස්ථාව ගරු මුදල් අමාත්‍ය තුමාගේ ද, නගර සැලසුම් හා ජල සම්පාදන කටයුතු පිළිබඳ ගරු අමාත්‍යතුමාගේ ද, නගර සැලසුම් හා ජල සම්පාදන කටයුතු පිළිබඳ ගරු රාජ්‍ය අමාත්‍ය තුමියගේ හා ව්‍යාපෘතියේ පරදුධාරීන් සියළුම දෙනාගේ ද සහභාගිත්වයෙන් 2017 මාර්තු 27 වැනි දින ටාජ් සමුද්‍ර හෝටලයේදී පවත්වන ලදී. ව්‍යාපෘතියේ සියළුම කොටස් කරුවන්ගේ සහභාගිත්වය සහිතව සිංහල හා දෙමල අළුත් අවුරුදු උත්සවය පවත්වන ලදී.

දැනට ක්‍රියාත්මක කෙරෙමින් පවතින කොළඹ ජල සම්පාදන සේවා වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය (CWSSIP) සම්බන්ධයෙන් මහ ජනතාව තුළ දැනුවත් භාවය නංවා ලීම සඳහා "සංවර්ධනය වන කොළඹ වෙනුවෙන් අළුත් වෙමින් පවතින ජල සම්පාදනය" යන මාතෘකාව යටතේ පවත්වන ලද ප්‍රදර්ශනය හා පාසැල් ළමුන් සඳහා වූ චිත්‍ර තරඟයේ ජයග්‍රාහකයින් වෙත තෑග්ග බෙදා දීම ඇතුළු බොහෝ



නල වැලීම

2017 වර්ෂය තුළදී ව්‍යාපෘතියට මුහුණ දීමට සිදු වූ සාමාන්‍ය ගැටළු වූයේ ශ්‍රී ලංකා රජය වෙතින් ලැබිය යුතු ගෙවීම් ප්‍රමාද වීම, කොළඹ මහ නගර ප්‍රදේශය තුළ ක්‍රියාත්මක කරන ලද වරායට ප්‍රවේශ වීමේ උන්නත අධිවේගී මාර්ග ව්‍යාපෘතිය හේතුකොට ගෙන නල වැලීමේ මාර්ගයන් වෙනස් කිරීමට සිදු වීම්, ප්‍රමාණවත් නොවූ මූල්‍ය වෙන් කිරීම (වය බිලියන 15 ක් වූ අය වැය ලේඛන තොග වෙන් කිරීම තුළ විය) හා අනපේක්ෂිත ලෙස හමු වූ භූගත උපයෝගිතාවයන් (කොළඹ මහ නගර සභාවේ මල අපවහන නල මාර්ග, ලංකා විදුලි බල මණ්ඩලයේ රැහැන් මාර්ග, ශ්‍රී ලංකා ටෙලිකොම් රැහැන් මාර්ග ආදිය) ද විය.

ඕස්ට්‍රේලියානු සහාය සහිතව ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතීන්

6. අම්පාර දිස්ත්‍රික්කය තුළ සේවා නොලබන ප්‍රදේශයන් වෙනුවෙන් වූ ඒකාබද්ධ ජල සම්පාදන යෝජනා ක්‍රමය - අදියර 111 ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතිය ආරම්භ කරන ලද්දේ අම්පාර දිස්ත්‍රික්කයේ සේවා නොලබන ප්‍රදේශ වල මෙන්ම මොනරාගල දිස්ත්‍රික්කයේ හා මඩකලපුව දිස්ත්‍රික්කය තුළ ද ඇතැම් ප්‍රදේශ වල ජීවත් වන ආසන්න වශයෙන් 200,000 ක පමණ ජනතාවක් වෙත සේවා සපයා දීම පිණිස වේ. ව්‍යාපෘතියේ ප්‍රධාන අංගයන් වන්නේ දිනකට ජලය ඝණ මීටර 27,000 ක ධාරිතාවයකින් යුත ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය හා තුළු මුව ඉදි කිරීමත්, කෝනේෂපුරම් හා බක්කිඇල්ලේ ඝණ මීටර 1,000 ක ධාරිතාවයකින් යුත් ඔසොව් කුළුණු ඉදි කිරීමත්, නාමල් ඔය, ඉඟිනියාගල හා මැද කඳවුර තුළ ඝණ මීටර 750 ක ධාරිතාවයකින් යුත් ඔසොව් කුළුණු ඉදි කිරීම හා තොට්ටම ඝණ මීටර 600 ක ධාරිතාවයකින් යුත් ඔසොව් කුළුණක් ඉදි කිරීමත්, හිමිදුරාවේ ඝණ මීටර 2,500 ක ධාරිතාවයකින් යුත් බිම් ටැංකියක් ඉදි කිරීම හා පරගහකැලේ, දඩයන්තලාව හා ගොනාගොල්ල ඝණ මීටර 1,600 ක ධාරිතාවයන්ගෙන් යුත් බිම් ටැංකි ඉදි කිරීමත්, කිලෝ මීටර 100 ක දිගින් යුත් මෘදු යකඩ ප්‍රධාන සම්ප්‍රේෂණ නල මාර්ගය සපයා වැලීමත්, බෙදා හැරීම් පද්ධතිය වෙනුවෙන් කිලෝ මීටර 900 ක පමණ දිගින් යුත් පොලි එතිලින් නල හා උපාංග සපයා වැලීමත් වේ. නව සම්බන්ධතාවයන් ආසන්න වශයෙන් 40,000 ක් පමණ ලබා දීමේ හැකියාව මෙම ව්‍යාපෘතිය සතුව ඇති අතර ව්‍යාපෘතියට වැය වන මුළු පිරිවැය රුපියල් මිලියන 20,825 ක් වනු ඇතැයි ඇස්තමේන්තු කරනු ලැබ ඇත.

2017 වර්ෂයේ දෙසැම්බර් මස අවසානය වන විට ව්‍යාපෘතියේ සමස්ත භෞතික ප්‍රගතිය 98.95 % ක් වූ අතර මූල්‍ය ප්‍රගතිය 76.17 % ක් විය. ජල කුළුණු හැරෙන්නට ව්‍යාපෘතියේ මූලික විෂය පථය යටතේ වූ අනිකුත් වැඩ කටයුතු සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇත.

බෙල්ජියන් සහාය සහිතව ආරම්භ කරන ලද ව්‍යාපෘතිය.

7. කොලොන්න / බලන්ගොඩ ජල සම්පාදන ව්‍යාපෘතිය.

මෙම යෝජනා ක්‍රමය බලන්ගොඩ ජල සම්පාදන යෝජනා ක්‍රමය වර්ධනය කිරීම හා කොලොන්න සඳහා නව ජල සම්පාදන යෝජනා ක්‍රමයක් ඉදි කිරීම ද යන ප්‍රධාන අංගයන් ද්විත්වයෙන් සමන්විත වේ. ව්‍යාපෘතිය වෙත අරමුදල් සපයනු ලබන්නේ ශ්‍රී ලංකා රජය හා බෙල්ජියන් රජය විසිනි. මුලු (සංශෝධිත) පිරිවැය වූයේ ශ්‍රී ලංකා රුපියල් මිලියන 4,988 ක් වූ අතර, ඒ සඳහා දේශීය අරමුදල් වශයෙන් ශ්‍රී ලංකා රජය විසින් ශ්‍රී ලංකා රුපියල් මිලියන 1,562 ක් සපයනු ලබන අතර, විදේශීය අරමුදල් වශයෙන් බෙල්ජියානු රජය විසින් ශ්‍රී ලංකා රුපියල් මිලියන 3,426 ක් සපයනු ලබයි. ව්‍යාපෘතියේ වැඩ කටයුතු 2015 වර්ෂය තුළ දී භෞතික වශයෙන් 100 % ක් සම්පූර්ණයෙන්ම නිම කරන ලදි.

බලන්ගොඩ ජල සම්පාදන යෝජනා ක්‍රමය වර්ධනය කිරීම සැලැසුම් කරන ලද්දේ පවුල් 8,000 ක් වෙත නව සම්බන්ධතාවයන් ලබා දීම මගින් ජල සම්පාදන ආවරණය වර්ධනය කිරීමේ හා දැනට පවත්නා අඩු ලුහුඬු කම් අවසන් කිරීමේ ද අපේක්ෂාව ඇතිව වේ. මේ පිළිබඳව සලකා බලන කල්හී, බලන්ගොඩ ජල සම්පාදන යෝජනා ක්‍රමය වර්ධනය කිරීම තුළින් 40,000 ක ජන ගහනයක් වෙත සැපයීමට හැකි වන සේවාවට අමතරව රත්නපුර දිස්ත්‍රික්කයේ පිහිටි බලන්ගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන්, බලන්ගොඩ නගර සභා බල ප්‍රදේශයෙන් හා ඉඹුල්පේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කොටසක් තුළින් ලැබෙන වාණිජ හා කාර්මික ජල ඉල්ලුම සපුරා ලිමේ හැකියාව ද ලැබෙනු ඇත. මේ අනුව 2030 වර්ෂය සඳහා ප්‍රක්ෂේපිත සම්පූර්ණ ජල ඉල්ලුම දිනකට ඝණ මීටර 7,000 ක් වෙතැයි ගණන් බලනු ලැබ ඇති අතර ඒ සඳහා අවශ්‍ය අමු ජලය දැනට බලන්ගොඩ ජල සම්පාදන යෝජනා ක්‍රමය සඳහා තුළු මුව පිහිටුවනු ලැබ ඇති වලවේ ගඟේ වැලිහරනාව නම් ස්ථානයෙන් ලබා ගැනීමට අපේක්ෂා කරනු ලැබේ.

කොලොන්න ජල සම්පාදන යෝජනා ක්‍රමය සැලැසුම් කරන ලද්දේ කොලොන්න ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ජීවත් වන 40,000 ක ජනතාව වෙත මුළු වර්ෂය පුරාම ආරක්ෂිත පානීය ජලය සම්පාදනය කිරීමට හා වර්ෂා ඍතුව තුළ දී ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කොටසක ජීවත් වන ජනතාව වෙත ආරක්ෂිත පානීය ජලය සම්පාදනය කර දීමත් සඳහා වේ. එම නිසා වාණිජ හා කාර්මික අංශයන්ගේ ඉල්ලුම සපුරා ලීමට අමතර ලෙස නව ජල සම්බන්ධතා 8,000 ක් සපයා දෙනු ලැබීමට නියමිත වේ. 2030 වර්ෂය වන විට ඉල්ලුම දිනකට ජලය ඝණ මීටර 7,000 ක් වනු ඇතැයි තක්සේරු කරනු ලැබ ඇති අතර ඒ සඳහා අමු ජලය ඇරැපෝරුව ගංගාව හරහා විජේරිය නම් ස්ථානයේ මීටර 3 ක් උස මීටර 25 ක දිගින් යුත් අමුණක් ඉදි කර ඒ ස්ථානයෙන් ලබා ගැනීමට අපේක්ෂා කෙරේ. තවද වාරි මාර්ග දෙපාර්තමේන්තුව හා ගොවි ජන සංවර්ධන දෙපාර්තමේන්තුව ද ආසන්න වශයෙන් අක්කර 1,500 ක වී වගාවන් සඳහා එකී අමුණේ ගඟ පහලින් ජලය ලබා ගැනීම සිදු කරනු ලබයි. එම නිසා විශේෂයෙන්ම වියලි ඍතුව තුළ දී ජලය බෙදා හදා ගැනීම සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුව, ගොවි ජන සංවර්ධන දෙපාර්තමේන්තුව හා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය අතර අවබෝධතා ගිවිසුමක් ද අත්සන් කරන ලදි.

පනාමුර බිම් ජලාශයේ බෑවුම් ඉවුරු තහවුරු කිරීම හා බලංගොඩ දැනට ක්‍රියාත්මක වන ප්‍රධාන අමු ජල නල මාර්ගයේ තිබුණ AC නල වෙනුවට නව AC නල එලීම ද ව්‍යාපෘතියේ ඉතිරි අරමුදල් භාවිතා කරමින් සිදු කරන ලද අතර, එම මුදල් ඉතිරි වී තිබුනේ ශ්‍රී ලංකා රජය විසින් දෙනු ලැබ තිබි අරමුදල් වලිනි.

පනාමුර බිම් ජලාශයේ බෑවුම් ඉවුරු තහවුරු කිරීම මෙම ව්‍යාපෘතිය යටතේ සිදු කරන ලද්දේ එම ජලාශය නාය යාමේ තර්ජනයන්ට ලක් වීමේ අවදානමට මුහුණ දී තිබුණ හෙයිනි.

බලංගොඩ දැනට භාවිතා කරනු ලබන ප්‍රධාන අමු ජල නල මාර්ගය හොඳ ක්‍රියාත්මක තත්ත්වයක තිබුනේ නැත. එසේම දැනට ක්‍රියාත්මක කරනු ලබන යන්ත්‍රාගාරයේ ධාරිතාවය අනාගතයේදී ඝණ මීටර 3000 සිට ඝණ මීටර 5000 ක් දක්වා වර්ධනය කිරීමට ද සැලැසුම් කරනු ලැබ ඇත. එම නිසා, දැනට තිබෙන විෂ්කම්භය මිලි මීටර 200 ක් වූ AC නල වෙනුවට මිලි මීටර 400 විෂ්කම්භයෙන් යුත් ඉහළ ඝණත්වයේ පොලි එතිලින් (HDPE) නල කිලෝ මීටර 1785 ක් එලීම සිදු කරන ලදි.

කොලොන්න බලංගොඩ ජල සම්පාදන ව්‍යාපෘතියට අදාල සියළුම වැඩ කටයුතු සෑහෙන මට්ටමකට සම්පූර්ණ කරනු ලැබ ඇති හෙයින් හා සියළුම පරීක්ෂණ සාර්ථක ලෙස අවසන් කරනු ලැබ ඇති හෙයින් ද, වැඩ කටයුතු සෑහෙන මට්ටමකට නිම කොට ඇති බවට සහතිකයක් 2015 සැප්තැම්බර් 30 වැනි දින නිකුත් කරන ලදි. ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාර ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට අනුයුක්ත මෙහෙයුම් හා නඩත්තු කාර්ය මණ්ඩල සාමාජිකයින් විසින් ප්‍රධාන ගැටළුවකින් තොරව ක්‍රියාත්මක කරමින් පවතින අතර මහ ජනතාව වෙත ජල සම්බන්ධතා සපයා දීම දැනට සිදු කර ගෙන යනු ලබයි. එසේම සමස්ත ව්‍යාපෘතියම මෙහෙයවීම් කටයුතු සඳහා මෙහෙයුම් හා නඩත්තු අංශය වෙත භාර දෙනු ලැබ ඇත.

පනාමුර බිම් ජලාශයේ බෑවුම් ඉවුරු තහවුරු කිරීමේ කටයුතු හා බලංගොඩ දැනට ක්‍රියාත්මක වන අමු ජල ප්‍රධාන නල මාර්ගයේ AC නල ප්‍රති ස්ථාපනය කිරීමේ වැඩ කටයුතු සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇත. එසේම ගත වූ වර්ෂය තුළදී කොන්ත්‍රාත්තු දෙකක් ප්‍රදානය කරන ලදි. කොලොන්න ජල සම්පාදන යෝජනා ක්‍රමයේ පනාමුර කලාපයේ බෙදා හැරීම් පද්ධතිය හා සම්බන්ධ ඉහල ඝණත්වයේ පොලි එතිලින් නල හා මෘදු යකඩ නල, සවි කිරීම්, විශේෂ උපාංග, මෘදු යකඩ වෑල්ව හා උපාංගයන් සපයා, ගෙනැවිත් දී එලීම සහ බලංගොඩ ජල සම්පාදන යෝජනා ක්‍රමයේ බෙදා හැරීම් පද්ධතිය හා සම්බන්ධ ඉහල ඝණත්වයේ පොලි එතිලින් නල හා මෘදු යකඩ නල, සවි කිරීම්, විශේෂ උපාංග, මෘදු යකඩ වෑල්ව හා උපාංගයන් සපයා, ගෙනැවිත් දී එලීම කොලොන්න හා බලංගොඩ ජල සම්පාදන ව්‍යාපෘතිය වෙනුවෙන් වෙන් කරනු ලැබ ඇති ශ්‍රී ලංකා රජයේ අරමුදල් උපයෝගී කර ගනිමින් හා කොලොන්න හා බලංගොඩ ජල සම්පාදන ව්‍යාපෘතියේ අධීක්ෂණය යටතේ දැනට සිදු කෙරෙමින් පවතී.

2017 වර්ෂය තුළදී මුහුණ පෑමට සිදු වූ ප්‍රධාන ගැටළුව වූයේ නල එලීමේ ක්‍රියාකාරකම් සඳහා මාර්ග සංවර්ධන අධිකාරියේ අනුමැතිය ලබා ගැනීමයි. එසේම අහිතකර කාලගුණික තත්ත්වයන් හා ප්‍රමාණවත් නොවූ අරමුදල් මුදා හැරීම ද ව්‍යාපෘතියේ ප්‍රගතිය වෙත අහිතකර බල පෑම් එල්ල කළේය. තවත් ගැටළුවක් වූයේ ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයන් ක්‍රියාත්මක කරගෙන යන අතරතුර පැන නැගුන දෝෂ සම්බන්ධයෙන් කොන්ත්‍රාත්කරු විසින් අවධානය යොමු කිරීම ප්‍රමාණවත් තත්ත්වයක නොතිබීමයි.

කොලොන්න බලංගොඩ ජල සම්පාදන ව්‍යාපෘතිය හා අදාල සියළුම ඉදි කිරීම් කටයුතු 2015 වර්ෂය තුළ දී සම්පූර්ණයෙන්ම නිම කරන ලදි. ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාර දෙකම සම්බන්ධයෙන් වූ ජල ගුණාත්මය හා අවශ්‍ය ධාරිතාවය පිළිබඳව පරීක්ෂා කර බලන ලද අතර සියළු පරීක්ෂණයන් සාර්ථක ලෙස නිම විය. එම නිසා මෙම ව්‍යාපෘතිය සාර්ථක ලෙස නිම කරනු ලැබ ඇති බවට පිළිගත හැකි වේ.

ව්‍යාපෘතියේ විෂය පථය තුළ ජලය බෙදා හැරීම සම්බන්ධයෙන් දෙනු ලැබ ඇත්තේ සීමිත ප්‍රතිපාදන හෙයින් ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයන් වීවායේ පූර්ණ ධාරිතාවයට මෙහෙයවීම් කරනු ලබන්නේ නැත. එබැවින්, ව්‍යාපෘතියේ 11 වැනි අදියර (එනම් ජලය බෙදා හැරීම) ඉක්මනින්ම ක්‍රියාත්මක කළ යුතුව ඇත.

හන්ගේරියානු සහාය සහිතව ආරම්භ කරන ලද ව්‍යාපෘති.

8. ලබුගම - කලටුවාව ප්‍රතිකාරක යන්ත්‍රාගාර පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය.

මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබන්නේ හන්ගේරියානු රජයේ අරමුදල් හා දේශීය රාජ්‍ය අරමුදල් යටතේය. ව්‍යාපෘතියේ පිරිවැය ලබුගම ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය පුනරුත්ථාපනය කිරීම සඳහා යුරෝ 16,714,045 ක් හා කලටුවාව ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය පුනරුත්ථාපනය කිරීම සඳහා යුරෝ 17,383,906 කි.

ලබුගම හා කලටුවාව ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයන් සම්බන්ධයෙන් හඳුනා ගනු ලැබ ඇති අංගයන්ට අදාල වන්නා වූ සියළුම නව්‍යකරණ වැඩ කටයුතු හා අළුතින් ඉදි කිරීම් කටයුතු ව්‍යාපෘතියට ඇතුලත් වේ. 2013 ඔක්තෝබර් 21 වැනි දින ව්‍යාපෘතිය ආරම්භ කරන ලද අතර එය 2017 පෙබරවාරි මස 26 වැනි දින භාර ගන්නා ලදී.

ව්‍යාපෘතියේ අරමුණ වූයේ ලබුගම හා කලටුවාවේ පිහිටි ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයන් දෙකේම නිෂ්පාදන ධාරිතාවය වැඩි දියුණු කිරීම මෙන්ම ජලයේ ගුණාත්මය වර්ධනය කිරීම ද විය. ඒ අනුව ලබුගම හා කලටුවාවේ නිෂ්පාදන ධාරිතාවය දිනකට ජලය ඝණ මීටර 45,000 කින් වර්ධනය වී ඇති බව දක්නට ලැබේ.

ගොහොඩු ප්‍රතිකාරක යන්ත්‍රාගාරය

දැනට ව්‍යාපෘතිය 3 වැනි අදියර තුළ තිබෙන අතර, ඒ අනුව යන්ත්‍රාගාරයන් තුළ සවි කරනු ලැබ ඇති නව පද්ධතීන් වලට අදාල මෙහෙයුම් කටයුතු කිරීම හා නඩත්තු කටයුතු සම්බන්ධයෙන් ඉදිරි මාස 12 තුළ ව්‍යාපෘතිය වෙත තාක්ෂණික සහාය ලැබීමට නියමිතය.

ඇමෙරිකා එක්සත් ජනපදයේ හා ශ්‍රී ලංකා රජයේ ආධාර සහිතව ආරම්භ කරන ලද ව්‍යාපෘතීන්.

09. බදුල්ල, හාලි ඇල හා ඇල්ල ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතියෙන් අදහස් කරනු ලබන්නේ නල මඟින් ජලය සැපැයීමේ යෝජනා ක්‍රමය සංවර්ධනය කිරීම මඟින් ව්‍යාපෘති ප්‍රදේශය වෙත ආරක්ෂාකාරී හා විශ්වාස දායක ජල සම්පාදන සේවාවක් සැපැයීම සිදු කරනු ලබන ඒකාබද්ධ ජල සම්පාදන යෝජනා ක්‍රමයක් බදුල්ල, හාලි ඇල හා ඇල්ල ප්‍රදේශයන් ආවරණය වන පරිදි ක්‍රියාත්මක කිරීම වන්නේය. බදුල්ල, හාලි ඇල හා ඇල්ල සංවර්ධන සැලැස්ම බාධාවකින් තොරව හා කලට උචිත පරිදි ක්‍රියාත්මක කිරීමට සහාය දීම ව්‍යාපෘතිය විසින් ඉලක්ක කරන ලද අතර ව්‍යාපෘති ප්‍රදේශය තුළ කර්මාන්ත සංවර්ධනය හා ආර්ථික වර්ධනය කෙරෙහි සිය දායකත්වය දීමට ද ව්‍යාපෘතිය අපේක්ෂා කරයි.

ව්‍යාපෘතියේ ඉදි කිරීම් කටයුතු පසු ගිය දෙසැම්බර් මාසය වන විට සම්පූර්ණයෙන්ම නිම කරනු ලැබීය. ජල සම්පාදන පද්ධතිය ජනිත වන්නේ බදුල්ල නගරයේ සිට ආසන්න වශයෙන් කිලෝ මීටර 12 ක් පමණ ගඟ ඉහල කොටසේ ඇති බදුලු ඔයෙහි (බදුල්ල ගඟෙහි) ඉදි කරනු ලැබ ඇති දෙමෝදර වේල්ල තුළය. පද්ධතිය සඳහා අමු ජලය ගබඩා කිරීම සඳහා වූ ජලාශයක් මෙම වේල්ල මඟින් නිර්මාණය වී ඇත. වේල්ලේ සිට යටි ගං කොටස තුළ ඉදි කරනු ලැබ ඇති නව පොම්පාගාරයක් විසින් පද්ධතියේ ඊ ළඟ ප්‍රධාන අංගය වන දෙමෝදර ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය වෙත අමු ජලය මාරු කර යවනු ලබයි. මෙම නව ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය සතුව ඉහල ඝණ ද්‍රව්‍යයන් අසුරන ලද ප්‍රතිකාරක ඒකකයන් හතරක් භාවිතා කරමින් දිනකට ජලය ඝණ මීටර 15,000 ක් ප්‍රතිකාරිත කිරීමේ හැකියාව තිබේ. ඒකාබද්ධ ජල සම්පාදන පද්ධතිය තුළ ඇති ගබඩා කිරීමේ හා බෙදා හැරීමේ පහසුකම් වලට බහුවිධ දුරස්ථ ස්ථානයන් තුළ ස්ථානගත කරනු ලැබ ඇති ඇණ යෙදූ වානේ ටැංකි අටක් හා ලුහුටු මත සවි කරන ලද නුවන පොම්පාගාරයන් ද ඇතුලත් වේ. නල මාර්ග පද්ධතියට කිලෝ මීටර 46 ක දිගින් යුත් සම්ප්‍රේෂණ, ප්‍රධාන හා රෝහක ප්‍රධාන නල මාර්ග හා බෙදා හැරීමේ පද්ධති නල මාර්ග කිලෝ මීටර 111 ක් ඇතුලත් වේ.

දෙමෝදර ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය හා ජලාශය

මෙම ව්‍යාපෘතිය තුළින් ආසන්න වශයෙන් 110,000 ක පමණ ජනතාවක් ප්‍රතිලාභ ලබනු ඇතැයි අපේක්ෂා කරනු ලැබේ. එම ජනතාවට වෙනස් නොවී පවත්නා සුරක්ෂිත පානීය ජල සම්පාදනයක් කෙරෙහි විශ්වාසය තැබීමේ හැකියාව ඇති වන අතර ඒ තුළින් ව්‍යාපෘතිය විසින් ආවරණය කරනු ලබන මුළු මහත් ප්‍රදේශය තුළ ජීවන තත්ත්වයේ සෘජු වැඩි දියුණු වීමක් දැකිය හැකි වනු ඇත. බණ්ඩාරපුර, විලදළුව, මාදිරිය හා හාලිඇල පිහිනුවනු ලැබ ඇති දැනට ක්‍රියාත්මක වෙමින් පවතින ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයන් සහ තුළු මුව ව්‍යුහයන් පුනරුත්ථාපනය කිරීම ද ව්‍යාපෘතිය විසින් සම්පූර්ණ කරනු ලබමින් පවතී.

කලාපීය සහාය සේවා මධ්‍යස්ථාන කාර්යාල ගොඩනැගිල්ල හා බණ්ඩාරපුර, පිංගරාව, කුමාරසිංහ මාවත, දෙමෝදර හා ගොටුවල කාර්ය මණ්ඩල නිල නිවාස හතක් ඉදි කිරීම සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත භාර දෙනු ලැබ ඇත. රුපියල් මිලියන 1,322 ක් වටිනා ඉතිරි නල සපයා නල මාර්ග වීලීම හා අදාල කොන්ත්‍රාත්තු ලිපි ලේඛන ශ්‍රී ලංකා රජයේ අරමුදල් යටතේ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් පිළියෙල කරනු ලැබ ඇත. මාර්ග යථා තත්ත්වයට පත් කිරීමේ වැඩ කටයුතු ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරනු ලැබේ.

චීනයේ සහාය සහිතව ක්‍රියාත්මක කිරීම ආරම්භ කරන ලද ව්‍යාපෘතීන්

10. ගම්පහ, අත්තනගල්ල හා මිනුවන්ගොඩ ඒකාබද්ධ ජල සම්පාදන යෝජනා ක්‍රමය

මෙම ව්‍යාපෘතියේ විෂය පථය වන්නේ ගම්පහ, අත්තනගල්ල හා මිනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන් තුළ වූ ග්‍රාම නිලධාරී වසම් 449 ක් වෙත හා මීරිගම හා මහර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන්හි කොටසක් වෙත සුරක්ෂිත හා විශ්වාසය තැබිය හැකි අන්දමේ පානීය ජල සම්පාදනයක් නල මාර්ගයෙන් ලබා දීම වේ. මෙතෙක් ආවරණය කර නොමැති ප්‍රදේශයන් වෙත ජලය සම්පාදනය

කර දීම හා එමෙන්ම ව්‍යාපෘති ප්‍රදේශය තුළ දැනටමත් සේවා ලබමින් සිටින පාරිභෝගිකයින් වෙත සපයනු ලබන සේවාවන්ගේ මට්ටම වැඩි දියුණු කිරීම ද ව්‍යාපෘතිය තුළින් අපේක්ෂා කරනු ලැබේ. ව්‍යාපෘතියේ කාල සීමාව වන්නේ 2017 පෙබරවාරි 20 වැනි දින සිට 2020 පෙබරවාරි 19 දක්වා වූ කාලයයි.

ව්‍යාපෘතිය දියත් කරන ලද්දේ ගම්පහ, අත්තනගල්ල හා මිනුවන්ගෙ ාඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන් හා මීරිගම හා මහර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන්හි කොටසක් ආවරණය කිරීම සඳහා වන අතර ඒ හරහා පුද්ගලයින් 300,000 ක් වෙත නව සේවා සම්බන්ධතාවයන් සම්පාදනය කර දීම හා දැනටමත් සේවා ලබමින් සිටින පාරිභෝගිකයින් 100,000 වෙත දැනට ක්‍රියාත්මක වන යෝජනා ක්‍රමය මගින් සපයනු ලබන සේවාවන්ගේ මට්ටම වැඩි දියුණු කිරීම ද ව්‍යාපෘතිය තුළින් අපේක්ෂා කරනු ලැබේ. අමු ජල ප්‍රභවය වන්නේ අත්තනගලු ඔය හා සම්බන්ධ බස්නාගොඩ ජලාශයයි.

ව්‍යාපෘතිය සමන්විත වන අංගයන් වන්නේ ඝණ මීටර මිලියන 3.5 ක ජල ධාරිතාවයකින් යුත් රැස්කුරු ජලාශය ද, දිනකට ඝණ මීටර 85,000 ක ජල ධාරිතාවයකින් යුත් තුළු මුව පහසුකම ද, දිනකට ජලය ඝණ මීටර 54,000 ක ධාරිතාවයකින් යුත් ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය ද, ජලය ඝණ මීටර 10,000 ක ධාරිතාවයකින් යුත් උස් මට්ටමේ ජලාශය ද, රන්පොකුණුගම, බැළුම්මහර, නයිවල, මිනුවන්ගොඩ හා පස්යාලේ ඉදි කරනු ලබන ජලය ඝණ මීටර 1,500 ක ධාරිතාවයකින් යුත් ඔසොව් ජල කුළුණු 5 ක් ද, කිලෝ මීටර 89.2 ක දිගින් යුත් මෘදු යකඩ ගුරුත්ව සම්ප්‍රේෂණ ප්‍රධාන නල මාර්ගය ද, නයිවල, අත්තනගල්ල, පස්යාල, මිනුවන්ගොඩ, බැලුම්මහර, ගම්පහ සහ නිට්ටඹුව යන ප්‍රදේශයන්හි ක්‍රියාත්මක වන උප ව්‍යාපෘති හතක් යටතේ කිලෝ මීටර 630 ක දිගින් යුත් නල මාර්ග වලීම ද, වර්ග මීටර 500 ක කලාපීය කාර්යාලය ගොඩ නැගීම ද, වර්ග මීටර 200 ක ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය ගොඩ නැගීම ද, එකක් වර්ග මීටර 150 ක් බැගින් වූ ස්ථාන හාර නිලධාරී කාර්යාල දෙකක් ගොඩ නැගීම හා එකක් වර්ග මීටර 150 ක් බැගින් වූ නිල නිවාස පහක් ගොඩ නැගීම ද වේ.

2017 දෙසැම්බර් මාසය වන විට පැවැති තත්ත්වය

ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය ඉදි කිරීම සඳහා භූමිය සකස් කිරීමේ කටයුතු ප්‍රධාන කොන්ත්‍රාත්කරු විසින් සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇති අතර ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයට අදාල අංගයන් සැලැසුම් කිරීමේ වැඩ කටයුතු 2017 පෙබරවාරි මාසයේ සිට ආරම්භ කරනු ලැබ ඇත.

පස්යාල, බැලුම්මහර, නයිවල හා මිනුවන්ගොඩ යන ප්‍රදේශයන් වෙත ඔසොව් කුළුණු හරහා ජලය බෙදා හැරීම සැලැසුම් කිරීමේ කටයුතු ද ආරම්භ කරනු ලැබ ඇත.

කේබීසී බෙල්ජියම් සමග එක් වී ආරම්භ කරන ලද ව්‍යාපෘතින්

11. මොණරාගල - බුත්තල ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය

මොණරාගල - බුත්තල ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය 2014 දෙසැම්බර් 30 වැනි දින ආරම්භ කරන ලද්දේ මොණරාගල ග්‍රාම නිලධාරී වසම් 22 ක් ද, බුත්තල ග්‍රාම නිලධාරී වසම් 20 ක් හා මඩුල්ල ග්‍රාම නිලධාරී වසම් 11 ක් ද ආදී වශයෙන් වූ ග්‍රාම නිලධාරී වසම් 53 ක් තුළ පවත්නා ආරක්ෂිත පානීය ජල අවශ්‍යතාවයන් සපුරා ලීමේ පරමාර්ථයෙනි. මෙය සිදු කරන ලද්දේ ප්‍රදේශය තුළ ජීවත් වන ප්‍රතිලාභී ජනතාව තුළ දැනට ඇති හා අනාගතයේදී ඇති විය හැකි නල ජල අවශ්‍යතාවයන් සපුරා ලමින් ඔවුන්ගේ සෞඛ්‍ය හා ජීවන තත්ත්වයන් නංවාලීම පෙරදැරි කරගෙන වන්නේය.

නව සේවා සම්බන්ධතාවයන් 6,000 ක් හා දැනටමත් සේවය ලබා ගනිමින් සිටින පාරිභෝගිකයින් 12,000 කට පමණ සපයනු ලබන සේවාවන්ගේ මට්ටම ඉහල ශ්‍රේණිගත කර ලීම ඇතුළුව මෙම ව්‍යාපෘතිය හරහා 60,000 ක ජන සංඛ්‍යාවක් ප්‍රතිලාභ භුක්ති විඳිති. මෙම ව්‍යාපෘතිය සැලැසුම් කොට ඉදි කිරීමේ ව්‍යාපෘතියක් වන අතර ව්‍යාපෘතියේ මුළු පිරිවැය රුපියල් මිලියන 5,515 ක් වේ. ඉන් රුපියල් මිලියන 4,205 ක මුදලක් බෙල්ජියමේ කේබීසී බැංකුව හරහා බෙල්ජියන් රජය විසින් හා ශ්‍රී ලංකාවේ හැටන් නැෂනල් බැංකුව විසින් සපයන ලද අතර ඉතිරි රුපියල් මිලියන 1,310 ක් වූ අරමුදල් සපයා දෙන ලද්දේ ශ්‍රී ලංකා රජය විසිනි.

ව්‍යාපෘතිය ආරම්භ කරන ලද්දේ 2014 වර්ෂයේ දෙසැම්බර් 30 වැනි දින වන අතර 2017 මාර්තු 30 වැනි දින එය සම්පූර්ණයෙන් නිම කරන ලදි. ඒ අනුව එය නිම කරනු ලැබීමට සැලැසුම් කරන ලද දිනයට මාස 3 කට පෙර නිම කරනු ලැබ ඇත.

කුඹුක්කන් ඔය තුළු මුව

ප්‍රංශ සංවර්ධන හා ආසියානු සංවර්ධන බැංකු වල සහාය සහිතව ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතිය

12. අඹතලේ ජල සම්පාදන පද්ධතීන් වැඩි දියුණු කිරීමේ හා බල ශක්ති සංරක්ෂණය කිරීමේ ව්‍යාපෘතිය

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් අඹතලේ ජල සම්පාදන පද්ධතීන් වැඩි දියුණු කිරීමේ හා බල ශක්ති සංරක්ෂණය කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලද්දේ 2012 / 2013 වර්ෂයන් තුළදී මෙහෙයවන ලද කොළඹ ප්‍රධාන ක්‍රම සැලැසුම් ව්‍යාපෘතිය විසින් ඉදිරිපත් කරන ලද නිර්දේශයන්ට අනුව වේ. මෙම ව්‍යාපෘතියේ විෂය පථය තුළට ඇතුලත් වන කරුණු වන්නේ අඹතලේ පානීය ජල නිෂ්පාදනයේ විශ්වාසනීයත්වය නංවා ලීම, බල ශක්ති සංරක්ෂණ පියවර හඳුන්වා දීම හා ජලය බෙදා හැරීමේ පහසුකම් වල කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීමත් වේ. ප්‍රංශ සංවර්ධන ඒජන්සිය ආසියානු සංවර්ධන බැංකුව හා ශ්‍රී ලංකා රජය විසින් මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් අරමුදල් සම්පාදන කටයුතු කරනු ලබයි. ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තු කරන ලද මුළු පිරිවැය ඇමෙරිකානු ඩොලර් මිලියන 100 ක් වේ.

මෙම ව්‍යාපෘතිය යටතේ කොන්ත්‍රාත්තු පැකේජ පහක් තිබේ. ඒවා නම් සැලැසුම් සමාලෝචන හා ඉදි කිරීම් අධීක්ෂණ උපදේශක සේවාවන් (DRCSC), ගොතටුව ඝණ මීටර 15,000 ක ධාරිතාවයකින් යුත් ජලාශය හා භුවන පොම්පාගාරය ඉදි කිරීම හා ඒ සමග මිලි මීටර 1200 ක විෂ්කම්භයෙන් යුත් මෘදු යකඩ නල කිලෝ මීටර 5 ක් සපයා වීලීම (ICB 03), මිලි මීටර 1200 ක විෂ්කම්භයෙන් යුත් මෘදු යකඩ නල කිලෝ මීටර 9 ක් හා අනිකුත් උපාංගයන් සපයා අඹතලේ සිට එලි හවුස් ජලාශය දක්වා නල මාර්ගය වීලීම (ICB 04), අඹතලේ නිෂ්පාදන පහසුකම් වලට අදාලව විශ්වාසනීයත්වය නංවා ලීම හා බල ශක්ති සංරක්ෂණ කටයුතු ක්‍රියාත්මක කිරීම (1CB 05) හා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ බටහිර නිෂ්පාදනය වෙනුවෙන් උපකරණ හා යන්ත්‍රෝපකරණ සැපයීම (1CB 06) ද වන්නේය.

ප්‍රධාන වශයෙන් ගත් කල මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබන්නේ සම්ප්‍රේෂණ ප්‍රධාන මාර්ගයන්හි ඇති වන අධික ඝර්ෂණ තත්ත්වය හේතුකොට ගෙන ඇති වන බල ශක්ති නාස්තිය අවම කිරීම සඳහා ජලය සම්ප්‍රේෂණය කිරීමේ පද්ධතිය වැඩි දියුණු කිරීම

මගින් අඹතලේ ජල සම්පාදන පද්ධතිය තුළ සිදු වන අධික බල ශක්ති පරිභෝජනය වැලැක්වීම සඳහාත්, පෙරණ පිළිසෝදා ප්‍රතිසාධන පද්ධතිය ඉදි කිරීම සඳහාත්, ඉහල කාර්යසාධන කාර්යක්ෂමතාවයකින් යුත් පොම්ප හඳුන්වා දීම සඳහා සහ මෙහෙයුම් කාර්යක්ෂමතාවය ප්‍රශස්ත මට්ටමට නංවා ලීම පිණිස ක්‍රියාවලි ස්වයංක්‍රියකරණය ස්ථාපිත කිරීම සඳහාත් වන්නේය. මෙම වැඩි දියුණු කිරීම් මගින් ප්‍රධාන වශයෙන්ම ඉලක්ක කරනු ලබන්නේ 2040 වර්ෂය සඳහා ප්‍රක්ෂේපිත ජන ගහනයයි.

ඉහතින් සඳහන් කරනු ලැබ ඇති කොන්ත්‍රාත්තු පැකේජ පහ අතුරින් කොන්ත්‍රාත්තු පැකේජයන් 3 ක් (එනම් DRCSC, ICB 03 හා ICB 04 යන කොන්ත්‍රාත්තු පැකේජයන්) ප්‍රදානය කරනු ලැබ ඇති අතර ඒවා දැනට ක්‍රියාත්මක කරනු ලබමින් පවතී. ICB 03 කොන්ත්‍රාත්තුව යටතේ පැන නැගුන ඉඩම් ගැටළු දෙකක් (එනම් භූමි ජලාශය ඉදි කිරීම සඳහා අවශ්‍ය වූ බෝවන රෝග ආරෝග්‍ය ශාලාවට අයත් ඉඩම පිළිබඳ ගැටළුව හා හුවන පොම්පාගාරය ඉදි කිරීම සඳහා අවශ්‍ය වූ ගොතටුව /මොරගස්මුල්ල ඉඩම පිළිබඳ ගැටළුව) නිරාකරණය කර ගන්නා ලදි. ICB 04 කොන්ත්‍රාත්තු පැකේජය යටතේ වූ නල හා සවි කිරීම් සැපැයීමේ කටයුතු වලින් 50% ක් සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇත.

කෙසේ වුවද දේශීය අරමුදල් සම්පාදනය නොලැබී යාම හේතුකොට ගෙන කොන්ත්‍රාත් කරුවන් වෙත ගෙවිය යුතු NBT හා අගය එකතු කළ බදු නොගෙවා රඳවා ගැනීමට සිදු වී ඇති අතර එසේ නොගෙවා රඳවා ගනු ලැබ ඇති NBT හා අගය එකතු කළ බදු වෙනුවෙන් කොන්ත්‍රාත් කරුවන් විසින් පොලී හිමිකම් පෑමේ හැකියාවක් පවතී. ඊට අමතර වශයෙන්, ICB 04 කොන්ත්‍රාත්තුව යටතේ නල හා සවි කිරීම් 1 වැනි තොගය භාර දීමේ දීර්ඝ ප්‍රමාදයක් සිදු විය. මෙසේ සිදු වීමට හේතු වී ඇත්තේ අවශ්‍ය අනුමැතීන් ලබා ගැනීමේද කොන්ත්‍රාත් කරු අතින් සිදු වී ඇති ප්‍රමාදය හා අවශ්‍ය ප්‍රතිසම්පාදන කටයුතු වල සිදු වී ඇති ප්‍රමාදයනුත්ය. මේ හේතුකොට ගෙන ව්‍යාපෘතියේ ප්‍රගතිය සැලැසුම් වලට සාපේක්ෂකව පසු පසට ගොස් තිබේ.

ඉලක්ක කරන ලද ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය වූ 26.94% ට සාපේක්ෂක ලෙස ගත් කල සාක්ෂාත් කර ගනු ලැබ ඇති සමස්ත භෞතික ප්‍රගතිය 7.70% ක් වන අතර ඉලක්ක කරන ලද ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රගතිය වූ 19.54% ට සාපේක්ෂක ලෙස ගත් කල සාක්ෂාත් කර ගනු ලැබ ඇති සමස්ත මූල්‍ය ප්‍රගතිය 5.49% ක් විය.

ස්පාඤ්ඤ රජය සමග එක් වී ආරම්භ කරන ලද ව්‍යාපෘතිය

13. ආනමඩුව ඒකාබද්ධ ජල සම්පාදන යෝජනා ක්‍රමය

මෙම ව්‍යාපෘතිය සඳහා අරමුදල් සම්පාදනය කරනු ලබන්නේ ස්පාඤ්ඤය හා ශ්‍රී ලංකාවේ හැටන් නැෂනල් බැංකුව විසිනි. ව්‍යාපෘතිය ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය යටතේ ක්‍රියාත්මක කරනු ලබන අතර එය සැලැසුම් කරනු ලැබ ඇත්තේ පුත්තලම හා කුරුණෑගල දිස්ත්‍රික්කයන් තුළ ජීවත් වන ජනතාව වෙත සුරක්ෂිත නල ජලය ලබා ගැනීමේ හැකියාව වර්ධනය කර ලබා දීම පිණිසය.

යෝජිත ආනමඩුව ඒකාබද්ධ ජල සම්පාදන යෝජනා ක්‍රමය හරහා, දැනට භූගත ජලය මත යැපෙමින් සිටින, ආසන්න වශයෙන් 81,700 ක පමණ ජන ගහණයක් ආවරණය කරනු ලැබීමට අපේක්ෂා කරනු ලබන අතර පුත්තලම හා කුරුණෑගල දිස්ත්‍රික්කයන් වෙත බල පාන සාමාන්‍ය වියලි කාලගුණික තත්ත්වයන් යටතේ පවා එම ජනතාවට දැඩි ජල හිඟයන්ට මුහුණ පෑමට සිදු වේ. ආනමඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ හා ඒ අවට ප්‍රදේශයන් තුළ බල පවත්නා පානීය ජල ප්‍රශ්නය සම්බන්ධයෙන් මෙම ව්‍යාපෘතිය විසින් ස්ථාවර විසඳුමක් ලබා දෙනු ඇත. ප්‍රජා මූල සංවිධානයන් විසින් කළමනාකරණය කරනු ලබන ජල සම්පාදන යෝජනා ක්‍රමයන් වෙත යෝජිත ව්‍යාපෘතිය වෙතින් ප්‍රතිකාර කරන ලද ජලය තොග වශයෙන් ලබා ගැනීමේ හැකියාව ඇති වන හෙයින් එම සංවිධානයන් විසින් ක්‍රියාත්මක කරනු ලබන ජල සම්පාදන යෝජනා ක්‍රමයන්ට අදාල ජල ගුණාත්මය පිළිබඳ ගැටළු ද මේ මගින් සම්පූර්ණයෙන්ම මුලිනුපුටා දැමිය හැකි වනු ඇත.

ආනමඩුව ඒකාබද්ධ ජල සම්පාදන යෝජනා ක්‍රමය විසින් දිනකට ජලය ඝණ මීටර 12,500 ක ධාරිතාවයකින් යුත් නව තුළු මුවක් ඉඟිනිමිටිය ජලාශය තුළ ඉදි කිරීමට ද, අපජල ප්‍රතිකාරක පහසුකම් ද ඇතුළු දිනකට ජලය ඝණ මීටර 11,000 ක ධාරිතාවයකින් යුත් පූර්ණ ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයක් ඉදි කිරීමට ද, කිලෝ මීටර 1 ක දිගින් යුත් ප්‍රධාන අමු ජල නල මාර්ගයක්, කිලෝ මීටර 61 ක දිගින් යුත් ප්‍රධාන පවිත්‍ර ජල සම්ප්‍රේෂණ නල මාර්ගයක්, ඝණ මීටර 1,500 ක, ඝණ මීටර 1000 ක හා ඝණ මීටර 300 ක ධාරිතාවයන්ගෙන් යුත් සේවා ජල කුළුණු හා සියළු විද්‍යුත් යාන්ත්‍රික උපකරණයන්ගෙන් සමන්විත කිලෝ මීටර 328 ක දිගින් යුත් ජලය බෙදා හැරීමේ පද්ධතියක් ද ඉදි කරනු ලැබීමට ද නියමිත වේ.

කොටවෙහෙර කුළුණු වැඩ බිම

භූ තාක්ෂණික හා ජල විද්‍යාත්මක විමර්ෂණයන් සමග පිළියෙල කරනු ලබන සම්ප්‍රේෂණ හා බෙදා හැරීම් පද්ධතීන් හා සම්බන්ධ සවිස්තරාත්මක සැලැසුම් දැනට සම්පූර්ණයෙන්ම මෙන් නිම කරනු ලැබ ඇත. නවගත්තේගම හා කොටවෙහෙර ජලය බෙදා හැරීමේ ජාලයන් සම්බන්ධ වැඩ කටයුතු සම්පූර්ණයෙන්ම අවසන් කරනු ලැබ ඇත. සියළුම කුළුණු සඳහා වූ මූලික සැලැසුම් සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇත. කොටවෙහෙර කුළුණ සඳහා වූ සවිස්තරාත්මක සැලැසුම සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇති අතර එහි ඉදි කිරීම් කටයුතු දැනටමත් ආරම්භ කරනු ලැබ ඇත. 2017.12.31 වැනි දිනට ව්‍යාපෘතියේ සමස්ත භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් 17% ක් හා 21.9% ක් වේ.

ක්‍රෙඩිට් ඇග්‍රිකොල් කෝපරේටි හා ප්‍රංශ ජාත්‍යන්තර බැංකුව සමග ආරම්භ කරන ලද ව්‍යාපෘතිය

14. කැළණි දකුණු ඉවුර ජල සම්පාදන ව්‍යාපෘතිය - පියවර 2

කැළණි දකුණු ඉවුර ජල සම්පාදන ව්‍යාපෘතිය - පියවර 2 යනු සැලැසුම් කොට ගොඩ නැගීමේ කොන්ත්‍රාත්තුවක් වන අතර 2017 ජනවාරි 23 වැනි දින එහි වැඩ කටයුතු ආරම්භ කරනු ලැබිණි. අරමුදල් සම්පාදනය කරනු ලබන ඒජන්සි ආයතනයන් වන්නේ ක්‍රෙඩිට් ඇග්‍රිකොල් කෝපරේටි, ප්‍රංශ ජාත්‍යන්තර බැංකුව, හැටන් නැෂනල් බැංකුව හා ශ්‍රී ලංකා රජයේ මහා භාණ්ඩාගාරය ද වේ. ව්‍යාපෘතියේ පිරිවැය රුපියල් මිලියන 32,700 ක් වේ.

දිනකට ජලය ඝණ මීටර 180,000 ක ධාරිතාවයකින් යුත් ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය පිළිබඳව විමර්ෂණ පවත්වා, සැලැසුම් කොට, ක්‍රියාත්මක කොට අදාල වැඩ කටයුතු සම්පූර්ණයෙන් නිම කිරීම, ප්‍රධාන පානීය ජල සම්ප්‍රේෂණ නල මාර්ගය හා ජාලය එලීම හා ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය වෙත අමු ජලය ලබා ගන්නා තුළු මුව ආසන්නයේ ගංගා ජලයේ ගුණාත්මය වැඩි දියුණු කිරීමේ වැඩ කටයුතු සිදු කිරීම මෙම ව්‍යාපෘතියේ විෂය පථය තුළට ඇතුලත් වේ. මීට වැඩිමනත් වශයෙන් ව්‍යාපෘතිය විසින් කෑගල්ල දිස්ත්‍රික්කයේ ඉදි කිරීමට යෝජිත වී ඔය ජලාශයට අදාල සක්‍යතා අධ්‍යයනය හා පාරිසරික බල පෑම් තක්සේරුව සිදු කිරීම සඳහා අවශ්‍ය අරමුදල් සම්පාදනය ද සිදු කරනු ලබයි.

නව ජල සම්පාදන සේවා සම්බන්ධතා 120,000 ක් ද සමග ප්‍රතිලාභීන්ගේ සංඛ්‍යාව 1,750,000 ක් බවට පත් වනු ඇත. පවිත්‍ර කරන ලද ජලය කැළණිය, කඩවත, මහර, වත්තල, පෑලියගොඩ, රාගම, බියගම, වැලිසර, කඳාන, ජා ඇල, පමුණුගම, ඒකල හා කටුනායක ප්‍රදේශයන් වෙත බෙදා හැරීමට කටයුතු කරනු ලබනවා ඇත.

ව්‍යාපෘතියේ වැඩ කටයුතු දැනටමත් ආරම්භ කරනු ලැබ ඇති අතර වැඩ කටයුතු දැනට කරගෙන යනු ලබමින් පවතී. සැලැසුම් කිරීමේ වැඩ කටයුතු, ඉදි කිරීම් රූප සටහන් පිළියෙල කිරීම, පාංශු විමර්ෂණ කටයුතු, ඉඩම් අත් පත් කර ගැනීම්, මෘදු යකඩ හා පොලි එතිලින් නල සැපැයීමේ කටයුතු හා වානේ නල පිරිසැකැසුම් කිරීම ආදී වැඩ කටයුතු දැනට සිදු කරනු ලබමින් පවතී. මෘදු යකඩ හා පොලි එතිලින් නල වලින් කොටසක් දැනටමත් වැඩ බිම් වෙත ගෙන ගොස් භාර දෙනු ලැබ ඇති අතර නල වලීමේ වැඩ කටයුතු දැනට ආරම්භ කරනු ලැබ ඇත.

2017 වර්ෂයේ අවසානයට සැලැසුම් කරන ලද භෞතික ප්‍රගතිය 15% ක් වන අතර ඊට විරෙහිව සාක්ෂාත් කරගනු ලැබ ඇති භෞතික ප්‍රගතිය 13% ක් වේ. අතුරු ගෙවීම් 4 ක සංඛ්‍යාවක් සඳහා කොන්ත්‍රාත් කරු විසින් ඉල්ලීම් ඉදිරිපත් කරන ලද අතර ඒ වෙනුවෙන් කොන්ත්‍රාත් කරු වෙත දැනටමත් ගෙවීම් සිදු කරනු ලැබ ඇත. 2017 වර්ෂයේ අවසානයට සැලැසුම් කරන ලද මූල්‍ය ප්‍රගතිය 31.04% ක් වන අතර ඊට විරෙහිව සාක්ෂාත් කරගනු ලැබ ඇති මූල්‍ය ප්‍රගතිය 31.84% ක් වේ.

ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය

ජාතික සංවර්ධන බැංකුවේ සහාය සහිතව ආරම්භ කරන ලද ව්‍යාපෘතිය

15. මාතර ජල සම්පාදන ව්‍යාපෘතිය පියවර IV

ව්‍යාපෘතිය ආරම්භ කරන ලද්දේ 2017 වර්ෂයේ ඔක්තෝබර් මස 11 වැනි දින වේ. ව්‍යාපෘතියේ අරමුණ වන්නේ සපයනු ලබන සේවාවන්ගේ මට්ටම හා සේවා ආවරණය නංවා ලීම හා මාතර දිස්ත්‍රික්කය තුළ හා හම්බන්තොට දිස්ත්‍රික්කයේ කොටසක් තුළ පිහිටා ඇති යෝජිත සේවා ප්‍රදේශය වෙත ජලය සම්පාදනය කිරීමේදී ඵලදායක හා තිරසාර ජල භාවිතයක් සාක්ෂාත් කර ගැනීම ද වන්නේය.

ව්‍යාපෘතියේ මුළු නිෂ්පාදන ධාරිතාවය දිනකට ජලය ඝණ මීටර 60,000 ක් වේ. දිනකට ජලය ඝණ මීටර 60,000 ක් සම්පාදනය කිරීම සඳහා ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය හැර නල මාර්ග ඇතුළු අනිකුත් සියළුම ව්‍යුහයන් ඉදි කරනු ලබන අතර එහෙත් මෙම පියවර යටතේ ජල ප්‍රතිකාරක ධාරිතාවය දිනකට ඝණ මීටර 30,000 ක් පමණක් වනු ඇත. දැනට ක්‍රියාත්මක වෙමින් පවත්නා මාතර - මිරිස්ස ඒකාබද්ධ ජල සම්පාදන යෝජනා ක්‍රමයේ වර්තමාන සේවා ආවරණය 284,808 ක ජන ගහණයක් වන අතර නව ව්‍යාපෘතිය ක්‍රියාත්මක වීමෙන් අනතුරුව 2046 වර්ෂයේදී මාතර, තිහගොඩ, දෙවිනුවර, දික්වැල්ල, වැලිගම, වැලිපිටිය, මාලිම්බඩ, කඹුරුපිටිය, කිරින්ද - පුහුල්වැල්ල, අතුරලිය, බෙලිඅත්ත හා තංගල්ල යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන් තුළ ජීවත් වන 285,000 ක ජන ගහණයක් ආවරණය කිරීමට හැකි වනු ඇතැයි ඇස්තමේන්තු කරනු ලැබ ඇත.

නිල්වලා ගඟ ව්‍යාපෘතියේ ප්‍රභවයක් බවට පත් වේ. දිනකට ජලය ඝණ මීටර 66,000 ක ධාරිතාවයකින් යුත් තුළු මුව කටුවන්ගොඩ ඉදි කරනු ලබනවා ඇත. එසේම දිනකට ජලය ඝණ මීටර 30,000 ක ධාරිතාවයකින් යුත් ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය ද කටුවන්ගොඩ ඉදි කරනු ලබනවා ඇත. ආසන්න වශයෙන් කිලෝ මීටර 300 ක දිගින් යුත් ප්‍රධාන අමු ජල නල මාර්ගයක් ද, ආසන්න වශයෙන් කිලෝ මීටර 78 ක දිගින් යුත් සම්ප්‍රේෂණ නල මාර්ගයක් හා ආසන්න වශයෙන් කිලෝ මීටර 200 ක් වූ ජලය බෙදා හැරීමේ පද්ධතියක් හා ඊට අමතරව මාලිම්බඩ, ගල්කැටිය, යටියන, දන්දෙනිය, කොඩිගහකන්ද හා මිරිස්වත්ත යන ස්ථානයන්හි භූමි ජලාශයන් 06 ක සංඛ්‍යාවක් ද ඉදි කරනු ලබනවා ඇත.

ව්‍යාපෘතිය වෙනුවෙන් ඇස්තමේන්තු කරනු ලැබ ඇති මුළු පිරිවැය රුපියල් මිලියන 18,208 ක් වන අතර එය විදේශ අරමුදල් දායකත්වය රුපියල් මිලියන 14,000 කින් හා දේශීය අරමුදල් දායකත්වය රුපියල් මිලියන 4,208 කින් ද සමන්විත වේ. මේ අතර ව්‍යාපෘතියේ කාල සීමාව (මෙහෙයුම් හා නඩත්තු කටයුතු සඳහා වූ දින 90 ක් හැර) මාස 36 ක් වේ. රුපියල් මිලියන 4,208 ක් වූ මණ්ඩලීය වෙන් කිරීම සම්බන්ධයෙන් මෙතෙක් අවසන් තීරණයක් ගෙන නොමැති අතර ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය ඉදි කිරීම සඳහා අවශ්‍ය ඉඩම හා අවශ්‍ය වෙනත් ඉඩම් අත් පත් කර ගැනීමේ කටයුතු වහාම ක්‍රියාත්මක කරනු ලබනවා ඇත.

ගරු අමාත්‍යවරුන් හා රාජ්‍ය නිලධාරිහු සහභාගි වීම

මාතර ජල සම්පාදන ව්‍යාපෘතිය පියවර IV සමාරම්භක උත්සවය 2017.08.06 වැනි දින නගර සැලසුම් හා ජල සම්පාදන කටයුතු පිළිබඳ ගරු අමාත්‍යතුමාගේ හා අනිකුත් සම්භාවනීය අමුත්තන්ගේ සහභාගිත්වය සහිතව පවත්වන ලදි. (ව්‍යාපෘති අධ්‍යක්ෂවරයකුගෙන් , ප්‍රධාන ඉංජිනේරු වරුන් තුන් දෙනෙකුගෙන්, ඉංජිනේරු වරුන් දෙදෙනෙකුගෙන්, ලේකම් වරයකුගෙන් හා ඉංජිනේරු සහායකයන් හය දෙනෙකුගෙන් සමන්විත) අවශ්‍ය අවම කාර්ය මණ්ඩල සාමාජිකයින් සංඛ්‍යාවකින් සමන්විත ව්‍යාපෘති කාර්ය මණ්ඩලය ස්ථාපිත කරන ලදි. මූලික සැලැසුම් සකස් කිරීම සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇති අතර සවිස්තරාත්මක සැලැසුම සමාලෝචනය කිරීම දැනට සිදු කරනු ලබමින් පවතී.

දේශීය බැංකුව (ජාතික සංවර්ධන බැංකුව) සමග ණය ගිවිසුම අත්සන් කරන ලදි. කොන්ත්‍රාත්තු ගිවිසුම අත්සන් කරන ලද අතර 2017.10.11 වැනි දින අත්තිකාරම් ගෙවීම සිදු කරන ලදි.

ඉන්දියානු අපනයන ආනයන බැංකුව හා ලංකා බැංකුව සමග එක් වී ආරම්භ කරන ලද ව්‍යාපෘතීන්

16. අළුත්ගම, මතුගම හා අගලවත්ත

මෙම ව්‍යාපෘතියේ අරමුණ වන්නේ මතුගම, දොඩංගොඩ, කළුතර, බේරුවල, අගලවත්ත හා මදුරාවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන් තුළ පිහිටි ග්‍රාම නිලධාරී වසම් 269 ක් තුළ වෙසෙන ජනතාවගේ දිනෙන් දින වැඩි වෙමින් පවතින ජලය සඳහා වූ ඉල්ලුම සපුරා ලීම සඳහා ආරක්ෂිත පානීය ජලය සම්පාදනය කර දීම වන අතර එය ඉටු කිරීමට අපේක්ෂා කරනු ලබන්නේ කෙත්හේන ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයේ නිෂ්පාදන ධාරිතාවය වර්ධනය කිරීම මගින් හා දැනට පවත්නා ලාවණ්‍ය ආක්‍රාන්තිය අඩු කිරීමට අවශ්‍ය පියවර ගැනීමත් මගිනි.

ව්‍යාපෘතිය වෙනුවෙන් අරමුදල් සම්පාදනය කර දෙනු ලබන්නේ ඉන්දියානු අපනයන ආනයන බැංකුව, ලංකා බැංකුව හා ශ්‍රී ලංකා රජය විසිනි.

ව්‍යාපෘතිය වෙනුවෙන් ඇස්තමේන්තු කරනු ලැබ ඇති මුළු පිරිවැය රුපියල් මිලියන 32,278 ක් වන අතර එය සමන්විත වී ඇත්තේ ඉන්දියානු අපනයන ආනයන බැංකුවේ මුල්‍ය දායකත්වය වූ රුපියල් මිලියන 24,285 කින් ද, ලංකා බැංකුවේ මුල්‍ය දායකත්වය වූ රුපියල් මිලියන 4,286 කින් හා ශ්‍රී ලංකා රජයේ මුල්‍ය දායකත්වය වූ රුපියල් මිලියන 3,707 කින් ද වේ.

නගර සැලසුම් හා ජල සම්පාදන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ මග පෙන්වීම් අනුව මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබන්නේ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසිනි.

නව ජල සම්පාදන සම්බන්ධතාවයන් 32,000 ක් ලබා දීමට හා 2030 වර්ෂය වන විට ප්‍රතිලාභීන් 573,000 ක් වෙත වැඩි දියුණු කළ සේවා පහසුකම් ලබා දීමට මෙම ව්‍යාපෘතිය සැලැසුම් කරනු ලැබ ඇත.

ව්‍යාපෘතියේ ප්‍රධාන අංගයන් වන්නේ කොලේමෝදර නව තුළු මුවක් ඉදි කිරීම, කෙත්හේන ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය වෙත අමු ජලය සම්ප්‍රේෂණය කිරීම සඳහා අමු ජල සම්ප්‍රේෂණ පද්ධතියක් ඉදි කිරීම, තෙබුවන තුළු මුව පුනරුත්ථාපනය කිරීම හා 3 එම්.ජී.ඩී ධාරිතාවය සහිත නව ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයක් සමගින් කෙත්හේන දැනට ක්‍රියාත්මක වන ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය පුනරුත්ථාපනය කිරීම, ධාරිතාවය ඝණ මීටර 2000 කින් යුත් ජලාශයක් මතුගම හා ධාරිතාවය ඝණ මීටර 1500 කින් යුත් ජලාශයක් දොඩංගොඩ ඉදි කිරීම, නෑබොඩ (ධාරිතාවය ඝණ මීටර 600), මතුගම කන්ද (ධාරිතාවය ඝණ මීටර 225) හා අගලවත්ත (ධාරිතාවය ඝණ මීටර 600) වශයෙන් ජල කුළුණු ඉදි කිරීම, විෂ්කම්භය මිලි මීටර 800 / 300 මෘදු යකඩ නල හා පොලි එතිලීන් නල යොදා ගනිමින් කිලෝ මීටර 58 ක දිගින් යුත් ප්‍රධාන සම්ප්‍රේෂණ නල මාර්ගය ඉදි කිරීම, කිලෝ මීටර 260 ක බෙදා හැරීමේ පද්ධතිය ඉදි කිරීම, කාර්යාල හා කාර්ය මණ්ඩල නිල නිවාස ඉදි කිරීම සහ අධීක්ෂණාත්මක පාලනය හා දත්ත අත් පත් කර ගැනීමේ පද්ධතිය සහිතව සම්පූර්ණයෙන් ස්වයංක්‍රීයකරණය කිරීම ද වන්නේය.

ව්‍යාපෘතිය 2017.05.15 වැනි දින ආරම්භ කරන ලද අතර එය 2020.05.14 වැනි දින වන විට සම්පූර්ණයෙන් නිම කරනු ලැබීමට සැලැසුම් කර තිබේ. 2017.12.31 වැනි දිනට ව්‍යාපෘතියේ සමස්ත භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් 8.5% ක් හා 26.59% ක් ද විය.

කෙත්හේන දැනට ක්‍රියාත්මක පැහැදිලිකරණය පුනරුත්ථාපනය කිරීම

ප්‍රංශය සමග ආරම්භ කරන ලද ව්‍යාපෘතීන්

17. විසල් මාතලේ ව්‍යාපෘතිය

විසල් මාතලේ ජල සම්පාදන ව්‍යාපෘතිය විසින් සිය වැඩ කටයුතු 2017 අප්‍රේල් 17 වැනි දින ආරම්භ කරන ලදි. 2017 වර්ෂය තුල මාස 8 ක කාලයක් තුළ එහි සැලැසුම් වැඩ කටයුතු කරමින් ව්‍යාපෘතිය ඉදිරියට ගිය අතර ඉදි කිරීම් කටයුතු 2018 වර්ෂය තුළදී ආරම්භ කරනු ලැබීමට අපේක්ෂා කරනු ලැබේ.

මෙම ව්‍යාපෘතිය මාතලේ දිස්ත්‍රික්කය තුළ ඉදි කරනු ලබන ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයන් පහකින් හා එකිනෙකට වෙන්ව ඉදි කරනු ලබන ජලය බෙදා හැරීමේ පද්ධතීන් පහක් සහිත තුළු මුව පහකින් ද සමන්විත වේ. සමස්ත ව්‍යාපෘතිය මගින් අපේක්ෂා කරනු ලබන්නේ මාතලේ, රත්තොට, උකුවෙල, පල්ලෙපොල, යටවත්ත හා නාඋල ප්‍රාදේශීය කොට්ඨාශයන් ආවරණය කරමින් ආරක්ෂිත පානීය ජලය සම්පාදනය කර ලීමට වේ.

ප්‍රධාන කොන්ත්‍රාත්තුව යුරෝ 105,645,791ූ රුපියල් 8,210,959,043 ක් සඳහා වන අතර එය යුරෝ 1 ක්ූ රුපියල් 162.69 ක විනිමය අනුපාතයට අනුව යුරෝ 156,115,758 මුළු මුදලකට සමාන වේ. මේ අතර කොන්ත්‍රාත්තු කාල සීමාව මාස 36 කි. ප්‍රස්තුත ව්‍යාපෘතිය සැලැසුම් කොට ගොඩ නැගීමේ වර්ගයට අයත් කොන්ත්‍රාත්තුවක් වන අතර මූලික සැලැසුම ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ මධ්‍යම කලාපීය සහාය සේවා මධ්‍යස්ථානයට අනුබද්ධ ආංශික ක්‍රම සම්පාදන අංශය විසින් පිළියෙල කරන ලදි. ව්‍යාපෘතියේ එක් කොටසක් ශ්‍රී ලංකා රජයේ අරමුදල් යොදා ගනිමින් නිම කළ යුතු වන අතර ඒ වෙනුවෙන් රුපියල් මිලියන 5,081 ක මුදලක් දැනට වෙන් කරනු ලැබ ඇත. කෙසේ වුවද එය රුපියල් මිලියන 14,500 ක් දක්වා වැඩි කරවා ගනු ලැබීමට අපේක්ෂා කරනු ලැබේ.

ජලය බෙදා හැරීමේ පද්ධතීන් සැලැසුම් කිරීමේ සුළු ප්‍රමාදයක් තිබුණද ව්‍යාපෘතියේ ප්‍රගතිය සතුටුදායක මට්ටමක පවතී.

දැනුවත් කිරීමේ වැඩ සටහන

නල සපයා ගැනීමේ ප්‍රතිසම්පාදන වැඩ කටයුතු කොන්ත්‍රාත්කරු විසින් දැනටමත් ආරම්භ කරනු ලැබ ඇති අතර ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය ඉදි කිරීමේ වැඩ වෙනුවෙන් දේශීය කොන්ත්‍රාත් කරුවන් වෙතින් ලංසු කැඳවනු ලැබ ඇත.

වර්ෂය තුළ සිදු කරන ලද විශේෂ සිද්ධියක් වශයෙන් ව්‍යාපෘතියේ වැඩ කටයුතු සම්බන්ධයෙන් රජයේ නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩ සටහනක් ව්‍යාපෘති කාර්ය මණ්ඩලය විසින් සංවිධානය කොට මෙහෙයවනු ලැබිනි. ජාතික මෙහෙයුම් කමිටුවේ රැස්වීමක් නොවැම්බර් 26 වැනි දින නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය තුළ පවත්වන ලදි. යෝජිත ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයන්ගෙන් හතරක් මහවැලි ගඟේ විවිධ ස්ථානයන්ගෙන් ජලය උකහා ගැනීමට සැලැසුම් කරනු ලැබ ඇති අතර එසේ ලබා ගැනීමට අපේක්ෂිත ජල පරිමාව හා ස්ථානයන් හා යෝජිත තුළු මුව ව්‍යුහයන් සඳහා ද ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ අනුමැතිය දෙනු ලැබ ඇත. ගොවි සංවිධානයන් සමග පවත්වන ලද සාකච්ඡා වට කිහිපයකින් පසුව රත්තොට ජල සම්පාදන යෝජනා ක්‍රමය සඳහා තුළු මුවයන් වශයෙන් යෝජනා කරනු ලැබ ඇති බඹරකිරි ඇල්ල හා වෙරළුගස්තැන්න ජලාශයන් යන ප්‍රභවයන් දෙක තුළින් උකහා ගත හැකි ජල පරිමාව සඳහා ගොවි ජන සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් අනුමැතිය දෙනු ලැබ ඇත.

ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාර පහ, තුළු මුව, සේවා ජලාශයන්, කාර්යාල ගොඩනැගිලි හා නිල නිවාස ඉදි කිරීම සඳහා යෝජනා කරන ලද ඉඩම් 17 අතුරින් ඉඩම් 12 ක් පවරා ගනු ලැබීමේ තත්ත්වයේ පවතින අතර සැලැසුම් අවස්ථාව තුළදී ඉඩම් පිහිටි ස්ථාන සම්බන්ධයෙන් සිදු

වූ වෙනස් කම් හේතුකොට ගෙන ඉතිරි ඉඩම් පහ මෙතෙක් ඉඩම් අත් පත් කර ගැනීමේ ක්‍රියාවලි තත්ත්වයේ පවතී. මාර්ග සංවර්ධන අධිකාරියට හා පලාත් මාර්ග සංවර්ධන අධිකාරියට අයත් මාර්ග ඔස්සේ නල එලීමේ කටයුතු සම්බන්ධයෙන් අදාල ආයතනයන්ගෙන් අනුමැතිය ලබා ගැනීමේ කටයුතු දැනට සිදු කරනු ලබමින් පවතී. අළුතින් කාපට් කරනු ලැබ ඇති මාර්ග සංවර්ධන අධිකාරියට අයත් මාර්ග ඔස්සේ නල එලීමට යාමෙන් මාර්ග වලට සිදු විය හැකි හානිය සම්බන්ධ ගැටළුව තවමත් විසඳාගත නොහැකිව ඉතිරි වී ඇති අතර වෙනත් අධිකාරීන් විසින් නඩත්තු කරනු ලබන මාර්ගයන් ඔස්සේ නල එලීම සඳහා අනුමැතිය ලබා ගැනීමේ කටයුතු දැනට සිදු කරනු ලබමින් පවතී.

ශ්‍රී ලංකා රජය වෙතින් ලැබිය යුතු අරමුදල් ලැබීමේ ප්‍රමාදය ව්‍යාපෘතියේ ප්‍රගතියට බල පාන ප්‍රධාන ගැටළුවක් බවට පත්ව තිබේ. මේ හේතුව නිසා ඇතැම් ගෙවීම් කිරීම ප්‍රමාද වී ඇති අතර එබැවින් වම පාර්ශවයන් වෙතින් කරවා ගැනීමට නියමිත ඉතිරි වැඩ කොටස් කරවා ගැනීමට නොහැකි වන තත්ත්වයක් මේ ගැටළුව නිසා උද්ගත වී ඇත. මේ හේතූන් නිසා ව්‍යාපෘතියේ වැඩ කටයුතු ප්‍රමාද වීමේ තත්ත්වයක් පැන නැගී ඇත. අගය එකතු කළ බද්ද ගෙවීම, රේගු ගාස්තු ගෙවීම, මාර්ග සංවර්ධන අධිකාරිය වෙත කළ යුතු ගෙවීම් කිරීම, ගොහොදු ඉවත් කිරීමේ පද්ධතීන්ට යන වියදම් හා කාර්ය මණ්ඩල සාමාජිකයින් වෙත ගෙවිය යුතු වැටුප් ආදිය ශ්‍රී ලංකා රජයේ අරමුදල් දායකත්වය යටතට වැටේ.

ව්‍යාපෘති අධ්‍යක්ෂ, ප්‍රධාන ඉංජිනේරු වරුන් දෙදෙනා හා එක් ඉංජිනේරු වරයකු හැර සෙසු කාර්ය මණ්ඩලය ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයෙන් පිටස්තරව මෙම ව්‍යාපෘතිය වෙනුවෙන්ම බඳවා ගත් කාර්ය මණ්ඩල සාමාජිකයෝ වෙති. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ 2016 චක්‍ර ලේඛය අනුව බඳවා ගැනීම් කරන ලද හෙයින් හැකියාවන් ඇති හා කාර්යක්ෂම කාර්ය මණ්ඩල සාමාජිකයින් බඳවා ගැනීම සම්බන්ධයෙන් යම් යම් දුෂ්කරතාවයන් මතු වන ලද්දේය. 2018 වර්ෂය තුළදී පුනුණු කිරීම් වැඩ සටහන් පැවැත්වීමට සැලැසුම් කරනු ලැබ ඇත.

දේශීය බැංකු විසින් අරමුදල් සම්පාදනයකරනු ලබන ජල සම්පාදන ව්‍යාපෘතීන්

1. බෙන්තොට ජල සම්පාදන ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතියේ අරමුණ වන්නේ ගාලු පාර ඔස්සේ කොස්ගොඩ සිට බෙන්තොට පාලම දක්වා ආසන්න වශයන් කිලෝ මීටර 9 ක් දිගට හා බෙන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටි ග්‍රාම නිලදාරී වසම් 22 ක් තුළ ඇති අතුරු මාර්ග ඔස්සේ ජලය බෙදා හැරීම දිර්ඝ කිරීම වේ. ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තු කරන ලද පිරිවැය රුපියල් මිලියන 1,239 ක් වේ. අරමුදල් සම්පාදනය කරනු ලබන්නේ ජාතික ඉතිරි කිරීමේ බැංකුව විසිනි. ව්‍යාපෘතියේ ප්‍රධාන අංගයන් වන්නේ පොලි විනිල් ක්ලෝරයිඩ් (PVC) / මෘදු යකඩ නල හා වෑල්ව සැපයීම, පොලි විනිල් ක්ලෝරයිඩ් (PVC) / මෘදු යකඩ නල හා උපාංගයන් එලීම, බද්දේගම සර්ජන බඳුන (surge vessel) හා උපාංග සපයා ස්ථාපිත කිරීම හා අම්බලන්ගොඩ හුවන පොම්ප හා උපාංග සපයා ස්ථාපිත කිරීම ද වේ. ව්‍යාපෘතිය 2014 නොවැම්බර් මාසයේදී ආරම්භ කරන ලද අතර 2017 ඔක්තෝබර් මාසය වන විට සියළුම වැඩ කටයුතු සම්පූර්ණයෙන් නිම කරන ලදි. ව්‍යාපෘතිය සේවා සම්බන්ධතාවයන් ලබා දීම සඳහා මෙහෙයුම් හා නඩත්තු අංශය වෙත භාර දෙනු ලැබ ඇත. අපේක්ෂා කරනු ලබන සම්බන්ධතා සංඛ්‍යාව 4,500 ක් වන අතර ප්‍රතිලාභීන්ගේ සංඛ්‍යාව 18,000 ක් වේ.

බද්දේගම ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය තුළ සර්ජන බඳුන ස්ථාපිත කිරීම

2. ගාල්ල පොකුරු ජල සම්පාදන ව්‍යාපෘතිය

වැලිගම, උඉරගස්මන්හන්දිය, ගෝනාපීනුවල හා දික්කුඹුර ජල සම්පාදන යෝජනා ක්‍රමයන්ගේ ජලය බෙදා හැරීමේ ජාලයන් වැඩි දියුණු කිරීමේ වැඩ කටයුතු වලින් ව්‍යාපෘතිය සමන්විත වේ. ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තු කරන ලැබ ඇති පිරිවැය රුපියල් මිලියන 1,755 ක් වන අතර අරමුදල් සම්පාදනය කරනු ලබන්නේ මහජන බැංකුව හා ලංකා බැංකුව විසිනි. ව්‍යාපෘතියේ ප්‍රධාන අංගයන් වන්නේ කිලෝ මීටර 93.5 ක දිගින් යුත් පොලි විනිල් ක්ලෝරයිඩ් (PVC) හා මෘදු යකඩ නල, මෘදු යකඩ හා වාත්තු යකඩ වෑල්ව හා උපාංගයන් සැපැයීම, යෝජනා ක්‍රමයන් 4 ක් තුළ කිලෝ මීටර 89.7 ක දිගින් යුත් පොලි විනිල් ක්ලෝරයිඩ් (PVC) හා මෘදු යකඩ නල සහ උපාංගයන් එලීම, උඉරගස්මන්හන්දිය, ගෝනාපීනුවල, කොවුල්හේන, වක්වැල්ල හා වැලිගම පොම්ප ස්ථාපනය කිරීම, උඉරගස්මන්හන්දියේ ඝණ මීටර 100 ක ජල ධාරිතාවයකින් යුත් භූමි ජලාශයක් හා ඉහල ඔසොව් පොම්පාගාරයක් ඉදි කිරීම හා වැලිගම ඉදි කරනු ලබන ඝණ මීටර 225 ක ජල ධාරිතාවයකින් යුත් භූමි ජලාශය, රැක බලා ගන්නාගේ නිල නිවාසය හා පොම්පාගාරය ඉදි කිරීම ද වේ. ව්‍යාපෘතිය සම්පූර්ණ වශයෙන් ග්‍රාම නිලධාරී වසම් 55 ක් ආවරණය කරයි. දෙනු ලැබීමට අපේක්ෂිත සේවා සම්බන්ධතා සංඛ්‍යාව 20,000 ක් වන අතර එහි සේවය ලබන ප්‍රතිලාභීන්ගේ සංඛ්‍යාව 82,000 ක් වනු ඇත. ව්‍යාපෘතිය ආරම්භ කරන ලද්දේ 2017 වර්ෂයේ මාර්තු මාසයේදීය. ව්‍යාපෘතියේ සමස්ත භෞතික ප්‍රගතිය 19% ක් වන අතර මූල්‍ය ප්‍රගතිය 18% ක් වේ.

3. අම්පාර බෙදා හැරීමේ ජාල ජල සම්පාදන ව්‍යාපෘතිය

අම්පාර අදියර 111 ව්‍යාපෘතිය 2010 වර්ෂය තුළදී ආරම්භ කරන ලද අතර එහි ප්‍රධාන අංගයේ ඉදි කිරීම් කටයුතු 2014 වර්ෂය තුළදී සම්පූර්ණයෙන් නිම කරන ලදි. ව්‍යාපෘතිය දිනකට ජලය ඝණ මීටර 27,000 ක ධාරිතාවයකින් යුත් ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය හා තුළු මුව ඉදි කිරීම ද, ඝණ මීටර 2,500 ක ධාරිතාවයකින් යුත් බිම් ටැංකියක් හිමිදුරාවේ හා එකක් ඝණ මීටර 1,600 ක ධාරිතාවයකින් යුත් බිම් ටැංකි 3 ක් පරගහකැලේ, දඩයන්තලාව හා ගොනාගොල්ල යන ප්‍රදේශයන් තුළ ඉදි කිරීම ද, කිලෝ මීටර 100 ක දිග ප්‍රමාණයකින් යුත් ප්‍රධාන මෘදු යකඩ සම්ප්‍රේෂණ නල මාර්ගය සපයා එලීම හා බෙදා හැරීමේ ජාලය සඳහා කිලෝ මීටර 698 ක දිගින් යුත් පොලි එතිලින් නල සැපයීම ද යන ප්‍රධාන අංගයන්ගෙන් සමන්විත වේ.

කෙසේ වුවද, අවශ්‍ය අරමුදල් නොලැබීමේ හේතුව නිසා අවශ්‍ය වූ බෙදා හැරීමේ පද්ධතියට වුවමනා නල සපයා නල මාර්ග එලීම අපහසු විය. ව්‍යාපෘතියේ අවසාන ප්‍රයත්නය වුනේ ප්‍රදේශය තුළ ජීවත් වන දිළිඳු ජනතාව වෙත නව ජල සම්පාදන සම්බන්ධතාවයන් 40,000 ක් සපයා දීම විය. එම නිසා, ශ්‍රී ලංකාවේ දේශීය බැංකු කිහිපයක් වෙතින් ලැබෙන අරමුදල් උපයෝගී කර ගනිමින් අම්පාර බෙදා හැරීම් ජාල ජල සම්පාදන ව්‍යාපෘතිය දියත් කිරීමට ශ්‍රී ලංකා රජය විසින් තීරණය කරන ලදි.

අම්පාර බෙදා හැරීම් ජාල ජල සම්පාදන ව්‍යාපෘතිය යටතේ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් කිලෝ මීටර් 1,119.33 ක දිගින් යුත් ජලය බෙදා හැරීමේ නල ජාලය ද, කිලෝ මීටර 527 ක දිගින් යුත් පොලි එතිලින් නල සහ අවශ්‍ය සවි කිරීම් හා විශේෂ උපාංග සැපයීම ද පැකේජ කිහිපයකට සකස් කොට කොන්ත්‍රාත්තු ප්‍රදානය කරන ලද්දේය. ඒ අනුව 10,000 + 2,000 නිවාස සම්බන්ධතාවයන් දෙන්නට කටයුතු කරන ලද්දේය.

"ඒ" පැකේජය සමන්විත වන්නේ කිලෝ මීටර 527 ක මුළු දිග ප්‍රමාණයකට ඉහල ඝණත්වයේ පොලි එතිලින් (HDPE) නල හා සවි කිරීම් සැපැයීම හා මෘදු යකඩ හා වාත්තු යකඩ වෑල්ව, උපාංගයන්, මනුබිල් ආවරණ හා මතු පිට පෙට්ටි සපයා ගෙනැවිත් භාර දීම යන කටයුතු වලිනි.

"බී" පැකේජය සමන්විත වන්නේ පාලම් හරස් මාරු හා බෝක්කු හරස් මාරු ද, වෑල්ව කූටි හා වෙනත් අදාල ඉදි කිරීම් ද සහිතව බක්කිඇල ප්‍රදේශය තුළ කිලෝ මීටර 124 ක දිග ප්‍රමාණයකින් හා ගොනාගොල්ල ප්‍රදේශය තුළ කිලෝ මීටර 218 දිග ප්‍රමාණයකින් යුත් පොලි එතිලින් නල මාර්ග වීලා සවි කිරීම්, විශේෂ උපාංගයන්, මෘදු යකඩ හා වාත්තු යකඩ වෑල්ව හා උපාංගයන් යෙදීම ද යන අංගයන්ගෙනි.

"සී" පැකේජය සමන්විත වන්නේ පාලම් හරස් මාරු හා බෝක්කු හරස් මාරු ද, වෑල්ව කූටි හා වෙනත් අදාල ඉදි කිරීම් ද සහිතව කිලෝ මීටර 776 ක මුළු දිග ප්‍රමාණයකින් යුක්තව පොලි එතිලින් නල මාර්ග වීලා සවි කිරීම්, විශේෂ උපාංගයන්, මෘදු යකඩ හා වාත්තු යකඩ වෑල්ව හා උපාංගයන් යෙදීම හා ද යන අංගයන්ගෙනි.

"ඩී" පැකේජය සමන්විත වන්නේ අවිවාහක නිල නිවාස, කාර්ය මණ්ඩල නිල නිවාස, කළමනාකාර නිල නිවාස, දිස්ත්‍රික් ඉංජිනේරු වරයාගේ නිල නිවාසය, ඉංජිනේරු නිල නිවාස, රැක බලා ගන්නාගේ නිල නිවාසය ඉදි කිරීම ද, ඒ සමග පරගහකැලේ, ගොනාගොල්ලේ හා නාමල් ඔය ප්‍රදේශයන්හි ගබඩා ගොඩනැගිලි ඉදි කිරීම ද, උහන, දමන හා මැද කඳවුර තුළ ස්ථාන භාර නිලධාරී නිල නිවාස ඉදි කිරීම ද යන අංගයන්ගෙනි.

අම්පාර බෙදා හැරීම් ජාල ජල සම්පාදන ව්‍යාපෘතිය සැලැසුම් කරන ලද පරිදි ක්‍රියාත්මක කරනු ලබමින් පවතී. අමතර වැඩ කටයුතු හැර අනිකුත් සියළු වැඩ 2017 ඔක්තෝබර් 31 වැනි දිනය වන විට සම්පූර්ණයෙන් නිම කරනු ලැබ තිබිණි. සැලැසුමට අනුව දැනටමත් නව සම්බන්ධතාවයන් 10,000 + 2,000 ක සංඛ්‍යාවක් ලබා දෙනු ලැබ ඇත.

2017 වර්ෂය වෙනුවෙන් වූ වෙන් කිරීම රුපියල් මිලියන 1,278.5 ක් වූ අතර වැය කරන ලද මුදල් ප්‍රමාණය රුපියල් මිලියන 731.37 ක් විය. සාක්ෂාත් කරගනු ලැබූ භෞතික ප්‍රගතිය 99.6% ක් වේ.

පරගහකැලේ ස්ථාන භාර නිලධාරී කාර්යාලය

4. රුහුණුපුර බෙදා හැරීමේ ජල සම්පාදන ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතියේ අරමුණ වන්නේ සූරියවැව, හම්බන්තොට, ලුනුගම්වෙහෙර හා සෙවනගල යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයන් තුළ ඇති ග්‍රාම නිලධාරී වසම් 24 ක් තුළ ඇති ජල සම්පාදන සම්බන්ධතා නංවා ලීම වේ. ව්‍යාපෘතියේ පිරිවැය රුපියල් මිලියන 1,929.61 ක් වූ අතර ව්‍යාපෘතිය සඳහා නියමිත කාල සීමාව 2014 නොවැම්බර් 20 වැනි දින සිට 2017 අගෝස්තු 31 වැනි දිනය දක්වා වේ. අරමුදල් සපයනු ලබන බැංකුව ශ්‍රී ලංකාවේ කොමර්ෂල් බැංකුව වේ. සූරියවැව හා හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයන් වෙත ජල සම්පාදන සම්බන්ධතා 15,630 ක් සැපැයීමට සැලැසුම් කරනු ලැබ ඇත. මිලි මීටර 63 සිට මිලි මීටර 225 ක් දක්වා වූ විවිධ විෂ්කම්භයන්ගෙන් යුත් කිලෝ මීටර 238 ක දිගින් යුත් හා 600 වර්ගයේ හා 1000 වර්ගයේ පොලි විනිල් ක්ලෝරයිඩ් නල යොදා ගනිමින් නල මාර්ග වීලීම සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇති අතර ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය 99.97 % ක් වේ. ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රගතිය 53% ක් විය.

පොම්පාගාරය

5. කොළඹ නාගරික ජල සම්පාදන වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය - 1 වැනි අදියර.

කොළඹ නාගරික ජල සම්පාදන වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය - 1 වැනි අදියර ක්‍රියාත්මක කරනු ලබන්නේ 2040 වර්ෂය සඳහා ප්‍රක්ෂේපිත ඉල්ලුම සැලැකිල්ලට ගනිමින් අනාගත සංවර්ධනය වෙත දායක වීමේ අපේක්ෂාවෙන් කොල්ලුපිටිය, කොටුව, ගාලු මුව දොර, ඩී. ආර්. විජේවර්ධන මාවත, බොරැල්ල හා යුනියන් පෙදෙස යන ප්‍රදේශයන්හි දැනට ක්‍රියාත්මක වෙමින් පවතින කොළඹ නගරයේ ජලය බෙදා හැරීමේ ජාලය වැඩි දියුණු කිරීම සඳහා වේ. මෙම ව්‍යාපෘතිය යටතේ ආසන්න වශයෙන් කිලෝ මීටර් 6.1 ක මෘදු යකඩ නල වීලීමට ද, පාලම් හරස් මාරු හයක් ඉදි කිරීමට හා කිලෝ මීටර 3.6 ක දිගින් යුත් ඉහල ඝණත්වයේ පොලි එතිලින් නල මාර්ග වීලීමට ද සැලැසුම් කරනු ලැබ ඇත. ව්‍යාපෘතියේ මුළු පිරිවැය වන්නේ ඇමෙරිකානු ඩොලර් මිලියන 6.3 ක් හා රුපියල් මිලියන 1,948 ක් වන අතර ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන්නේ දේශීය බැංකු අරමුදල් වලින් ක්‍රියාත්මක වන ව්‍යාපෘතියක් වශයෙනි. මෙම ව්‍යාපෘතිය ආරම්භ කරන ලද්දේ 2014 නොවැම්බර් 20 වැනි දින වන අතර එය සම්පූර්ණයෙන් නිම කරනු ලැබීමට සැලැසුම් කරනු ලැබ තිබුනේ 2016 නොවැම්බර් 19 වැනි දින වුව ද පසුව එය 2017 සැප්තැම්බර් අවසානය දක්වා දීර්ඝ කරනු ලැබිණි. ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය 100% ක් වූ අතර මූල්‍ය ප්‍රගතිය 94.9% ක් විය. ගාමිණී සිනමා ශාලා හන්දියේ KVA 132 ක බල සන්දාමයක් හරස් මාරු කිරීම සම්බන්ධයෙන් ලංකා විදුලි බල මණ්ඩලයෙන් පැණ නැගුන විරෝධතාවයක් නිසා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම ප්‍රමාද විය. සිදු විය හැකි ඉදි කිරීම් දුෂ්කරතාවයන් මග හරවා ගැනීම පිණිස ඔවුන්ගේ ව්‍යාපෘතිය ද සමග එක් වී මාලිගාකන්ද වෑල්ව කූටි පරිශ්‍රය තුළ එක වර නල වීලීමේ කටයුතු සම්පූර්ණයෙන් නිම කිරීමට කටයුතු කරන මෙන් විසල් කොළඹ ජල පුනරුත්ථාපන ව්‍යාපෘතියේ ව්‍යාපෘති අධ්‍යක්ෂ වරයා විසින් ඉල්ලීමක් කරන ලදි.

නල එළීම

6. කොළඹ දිස්ත්‍රික්කයට නැගෙනහිරින් පිහිටි නගර ජල සම්පාදන ව්‍යාපෘතිය.

මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබන්නේ හෝමාගම, කඩුවෙල, පාදුක්ක, සීතාවක හා හොරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයන් තුළ වාසය කරනු ලබන 373,000 ක ඇස්තමේන්තුගත ජන ගහණයක් වෙත ආරක්ෂිත නල මාර්ග පානීය ජලය සම්පාදනය කර දීමේ ඉලක්කය සහිතවය. මෙම ජල සම්පාදන ව්‍යාපෘතිය මගින් ව්‍යාපෘති ප්‍රදේශය තුළ වෙසෙන ජනතාව වෙත ජල සම්පාදන සම්බන්ධතාවයන් 91,000 කට වැඩි සංඛ්‍යාවක් ලබා දීමට යෝජිතය. මෙම ව්‍යාපෘතිය කොන්ත්‍රාත්තු පැකේජ 3 කින් සමන්විත වන අතර පැකේජ 1 (කිලෝ මීටර 4 ක් දිග ප්‍රධාන සම්ප්‍රේෂණ නල මාර්ගය හා කිලෝ මීටර් 222 ක දිගින් යුත් ප්‍රධාන බෙදා හැරීම් නල මාර්ග), පැකේජ 2 (කිලෝ මීටර 8 ක් දිග ප්‍රධාන සම්ප්‍රේෂණ නල මාර්ගය, ඝන මීටර 18000 ක ධාරිතාවයකින් යුත් භූමි ජලාශයන් හා ගොඩනැගිලි කිලෝ මීටර් 10 ක දිගින් යුත් ප්‍රධාන බෙදා හැරීම් නල මාර්ග), හා පැකේජ 3 (කිලෝ මීටර් 400 ක් දිග බෙදා හැරීම් නල මාර්ග හා ගෘහ සේවා සම්බන්ධතා 10,000) සඳහා වැය වෙතැයි අපේක්ෂිත ව්‍යාපෘති පිරිවැය පිළිවෙලින් රුපියල් මිලියන 5,170.00 ක්, රුපියල් මිලියන 4,823.00 ක් හා රුපියල් මිලියන 10,049.00 ක් වේ. 2017 දෙසැම්බර් මාසය වන විට කොන්ත්‍රාත්තු පැකේජ තුන විවිධ ප්‍රගති මට්ටම් වල පැවැතිනි.

කොන්ත්‍රාත්තු පැකේජ අංක 1 යටතේ කිලෝ මීටර 201 ක දිගින් යුත් බෙදා හැරීමේ නල මාර්ග හා කිලෝ මීටර 0.64 ක දිගින් යුත් සම්ප්‍රේෂණ නල මාර්ග වලනු ලැබ තිබිණි. එම පැකේජයට අදාල භෞතික ප්‍රගතිය 87% ක් වූ අතර මූල්‍ය ප්‍රගතිය 57% ක් විය. කොන්ත්‍රාත්තු පැකේජ 2 යටතේ කිලෝ මීටර 4.6 ක දිගින් යුත් ජලය බෙදා හැරීමේ නල මාර්ග හා කිලෝ මීටර 2.6 ක දිගින් යුත් සම්ප්‍රේෂණ නල මාර්ග වලනු ලැබ ඇති අතර ස්ථාන භාර නිලධාරී වරයාගේ කාර්යාල ගොඩනැගිල්ල ඉදි කිරීමේ කටයුතු නිම වීමට ආසන්න වෙමින් පවතී. අංක 2 දරණ කොන්ත්‍රාත්තු පැකේජයේ භෞතික ප්‍රගතිය 23% ක් වූ අතර මූල්‍ය ප්‍රගතිය 28% ක් විය. අංක 3 දරන කොන්ත්‍රාත්තු පැකේජය යටතේ කිලෝ මීටර 321 ක දිගින් යුත් ජලය බෙදා හැරීමේ නල මාර්ග වලනු ලැබ ඇති අතර සාක්ෂාත් කර ගනු ලැබ ඇති භෞතික ප්‍රගතිය 72% ක් වූ අතර මූල්‍ය ප්‍රගතිය 54% ක් විය.

ගොඩගම හන්දියේ තප්ත සැවිනි (hot tapping) **ක්‍රියාවලිය**

කොන්ත්‍රාත්තු පැකේජ 1 හා කොන්ත්‍රාත්තු පැකේජ 3 2017 වර්ෂය තුළදී සම්පූර්ණයෙන් නිම කරනු ලැබීමට නියමිතව තිබුණද මාර්ග සංවර්ධන අධිකාරියේ අනුමැතිය ලබා ගැනීමේදී සිදු වූ ප්‍රමාදය නිසා නිම කිරීමේ දිනයන් 2018 වර්ෂය දක්වා ඉදිරියට ගෙන යාමට සිදු විය. ජලාශය ඉදි කිරීම සඳහා තෝරාගත් ඉඩමේ සිටි තැනැත්තන් එම ස්ථානයෙන් වෙනත් තැනක් වෙත යැවීමට සිදුව තිබුණ හෙයින් එකී වැඩ බිම කොන්ත්‍රාත් කරු වෙත භාර දෙනු ලැබුවේ මාස 15 ක ප්‍රමාදයකින් පසුවය. මේ හේතුකොට ගෙන කොන්ත්‍රාත්තු පැකේජ 3 ද නිම කිරීම ප්‍රමාද විය.

කොන්ත්‍රාත්තු ලිපි ලේඛන තුළ ව්‍යාකූලත්වයන් තිබුණ අතර ලිපි ලේඛන අගැයීමට බඳුන් කරන අවස්ථාවේදී එම ව්‍යාකූලත්වයන් නිරවුල් කිරීම සම්බන්ධයෙන් කටයුතු කර තිබුනේ නැත. මේ හේතුව නිසා කොන්ත්‍රාත්තු පරිපාලනය අභියෝගයක් බවට පත් විය. මුහුණ දෙන්නට සිදු වූ අනිකුත් පොදු ගැටළු වූයේ මාර්ග සංවර්ධන අධිකාරිය යටතේ හා පලාත් මාර්ග සංවර්ධන අධිකාරිය යටතේ වූ මාර්ග සම්බන්ධයන් මතු වූ ගැටළුකාරී තත්ත්වයන් නිසා නල එලීමේදී සිදු වූ ප්‍රමාදය, අවශ්‍ය කාර්ය මණ්ඩල සාමාජිකයින් බඳවා ගැනීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව අනුමැතිය දීම සම්බන්ධයෙන් සිදු වූ ප්‍රමාදය, ජල සුලභතාවය සම්බන්ධයෙන් ඇති වූ ගැටළු හේතුකොට ගෙන එලීම සම්පූර්ණයෙන් නිම කරන ලද නල මාර්ගයන් පවත්නා ප්‍රධාන සම්ප්‍රේෂණ නල මාර්ගය හා සම්බන්ධ කිරීම සම්බන්ධයෙන් පැන නැගි ගැටළු සහගත තත්ත්වය, මාර්ග සංවර්ධන අධිකාරියේ අනුමැතිය ලබා ගැනීමේදී සිදු වූ ප්‍රමාදය, ජලාශ වැඩ බිමෙන් නීති විරෝධී පදිංචි කරුවන් ඉවත් කිරීමේදී සිදු වූ ප්‍රමාදය නිසා ජලාශය ඉදි කිරීමේදී සිදු වූ ප්‍රමාදය හා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අවසරය ලැබෙන තෙක් බලා සිටීමට සිදු වීම යන ගැටළු වූහ.

කණ්ඩායමක් මෙන් කණ්ඩායම් හැඟීමෙන් යුතුව වැඩ කිරීමට සූදානම් යථා පරිදි සුදුසුකම් ලබාගෙන ඇති පුද්ගලයින් ව්‍යාපෘති අධ්‍යක්ෂගේ කැමැත්ත ඇතිව කාර්ය මණ්ඩල සාමාජිකයින් වශයෙන් බඳවා ගැනීම මූලික අවශ්‍යතාවයක් වේ. මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ගත් කල එම මූලික අවශ්‍යතාවය ඉටු වුනේ නැත. තවද කොන්ත්‍රාත්තු ලිපි ලේඛන පිළියෙල කිරීම හා ටෙන්ඩර අගැයීමේ කටයුතු නිසි ආකාර සිදු කරනු ලැබ නොමැති විට පැන නැගෙන ගැටළු වඩාත් විශාල මහත්වයකට පත් වී ඉදි කිරීම් පියවර වෙත යා හැකි බව පෙන්වා දෙන හොඳ උදාහරණයක් ලෙස මෙම ව්‍යාපෘතිය පෙන්වා දිය හැකි වේ.

ඉහතින් සඳහන් කරනු ලැබ ඇති බාධකයන් පසෙක තිබියදී නිෂ්පාදිත ජලය සම්ප්‍රේෂණය කිරීම සම්බන්ධයෙන් දැනට මුහුණ පා ඇති ගැටළුව නිරාකරණය කිරීමට හැකි වනු පිණිස 2018 වර්ෂය තුළදී ප්‍රධාන සම්ප්‍රේෂණ නල මාර්ගය ඉදි කිරීමේ වැඩ කටයුතු සම්පූර්ණයෙන් නිම කිරීමට දැනට සැලැසුම් කරනු ලැබ ඇත.

7. අවිස්සාවේල්ල හා කොස්ගම ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතියේ අරමුණ වන්නේ අවිස්සාවේල්ල හා කොස්ගම ප්‍රදේශයන්හි නල මාර්ගයෙන් ජලය බෙදා හැරීමේ පද්ධතිය නංවා ලීමයි. අවිස්සාවේල්ල හා කොස්ගම ඒකාබද්ධ ජල සම්පාදන යෝජනා ක්‍රමය සඳහා පොලි විනිල් ක්ලෝරයිඩ් (PVC) හා මෘදු යකඩ නල හා සවි කිරීම් හා උපාංග සපයා එලීමේ කටයුතු සහ වෙනත් අදාල කාර්යයන් වෙනුවෙන් වූ (රුපියල් මිලියන 1,382.4 ක් වූ) කොන්ත්‍රාත්තුව කොන්ත්‍රාත්තු අංක P&P/D&B/LBF/AVISSAWELLA/2013/01 යටතේ ප්‍රදානය කරන ලදි. අරමුදල් සම්පාදනය කරනු ලබන ප්‍රභවය වන්නේ දේශීය බැංකු අරමුදල් වේ. කොස්ගම උප ව්‍යාපෘතිය වෙනුවෙන් වන ව්‍යාපෘති කාල සීමාව ව්‍යාපෘතිය ආරම්භ කළ දිනයේ සිට මාස 12 ක් වන අතර අවිස්සාවේල්ල උප ව්‍යාපෘතිය වෙනුවෙන් වූ එම කාල සීමාව ව්‍යාපෘතිය ආරම්භ කළ දිනයේ සිට මාස 18 ක් වනු ඇත. ඇත්ත වශයෙන්ම ව්‍යාපෘය ආරම්භ කරන ලද දිනය වූයේ 2016.06.01 වැනි දිනය වේ.

මෙම ව්‍යාපෘතිය යටතේ සිදු කරන ලද කර්තව්‍යයන් තුළට ඇතුලත් වූයේ කොස්ගම හා අවිස්සාවේල්ල ප්‍රදේශය තුළ කිලෝ මීටර 51 ක (මුළු දිග ප්‍රමාණය 2017 වර්ෂයේ ජනවාරි මාසයේදී සංශෝධනය කරන ලදි) දිගින් යුත් ජලය බෙදා හැරීමේ නල පද්ධතිය සපයා වීලීම ද, කොස්ගම තුළු මුව වැඩි දියුණු කිරීමේ වැඩ කටයුතු හා අවිස්සාවේල්ල වැඩ බිම තුළ ගොඩනැගිලි ඉදි කිරීමේ වැඩ කටයුතු හා පුනරුත්ථාපන වැඩ කටයුතු ද වේ. වර්ෂය අවසන් වන විට ව්‍යාපෘතිය 85.80% ක භෞතික ප්‍රගතියක් හා 45.29% ක මූල්‍ය ප්‍රගතියක් සාක්ෂාත් කර ගෙන තිබුණ අතර ණය මුදලින් වියදම් දැරීම සමස්තයක් වශයෙන් ගත් කල රුපියල් මිලියන 626.1 ක් විය.

නල මාර්ග බෝක්කු පැන්නුම

8. ගලගෙදර /මාවතගම ජල සම්පාදන ව්‍යාපෘතිය

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් මෙම ව්‍යාපෘතිය ආරම්භ කරන ලද්දේ ගලගෙදර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ පිහිටි සියළුම ග්‍රාම නිලධාරී වසම් ද, මාවතගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ පිහිටි ග්‍රාම නිලධාරී වසම් 23 ක් හා ආයෝජන මණ්ඩලය සහ මල්ලවපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ පිහිටි ග්‍රාම නිලධාරී වසම් 2 ක් ද ආවරණය වන පරිදි ගලගෙදර, මාවතගම හා තදාසන්න අර්ධ නාගරික ප්‍රදේශයන් වෙත පානීය ජල පහසුකම් සම්පාදනය කර දීම සඳහා වේ. ප්‍රතිලාභීන්ගේ සංඛ්‍යාව පවුල් 33,000 ක් වන අතර ව්‍යාපෘතිය සඳහා වැය වන පිරිවැය රුපියල් මිලියන 3,126 කි. අරමුදල් සම්පාදනය කරනු ලබන්නේ දේශීය බැංකු අරමුදල් යටතේ ඩීඒෆ්සීසී බැංකුව පුද්ගලික සීමිත සමාගම විසිනි.

මෙම ව්‍යාපෘතිය යටතේ විසල් මහනුවර ජල සම්පාදන ව්‍යාපෘතියට අයත් කටුගස්තොට පිහිටි ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයේ සිට ප්‍රතිකාරිත ජලය ඝණ මීටර 5,000 ක් හරවා යවනු ලබනවා ඇත. මෙම ජල පරිමාවෙන් දිනකට ජලය ඝණ මීටර 3000 ක් මාවතගම ආයෝජන මණ්ඩලය ඇතුළු මාවතගම හා තදාසන්න අර්ධ නාගරික ප්‍රදේශයන් වෙත සම්පාදනය කරනු ලබන අතර ඉතිරි දිනකට ජලය ඝණ මීටර 2000 ක පරිමාව ගලගෙදර ජල සම්පාදන යෝජනා ක්‍රමය වෙත සම්පාදනය කරනු ලබනවා ඇත.

(මිලි මීටර 400 හා මිලි මීටර 280 අතර විෂ්කම්භයන්ගෙන් යුත් ඉහල ඝණත්වයේ පොලි එතිලින් නල (HDPE) හා මිලි මීටර 250 හා මිලි මීටර 200 අතර විෂ්කම්භයන්ගෙන් යුත් මෘදු යකඩ **(DI)** නල යොදා ගනිමින්) කිලෝ මීටර 27 ක දිගින් යුත් නල සපයා ප්‍රධාන සම්ප්‍රේෂණ නල මාර්ගය වීලීම ද, (මිලි මීටර 280 හා මිලි මීටර 63 අතර විෂ්කම්භයන්ගෙන් යුත් මෙලෙක් නොකරන ලද පොලි විනිල් ක්ලෝරයිඩ් (uPVC) නල යොදා ගනිමින්) කිලෝ මීටර 113 ක දිගින් යුත් ජලය බෙදා හැරීමේ පද්ධතිය සපයා වීලීම ද, ඝණ මීටර 1,000 ක ජල ධාරිතාවයකින් යුත් ජල කුළුණ මාවතගම ඉදි කිරීම ද, පිලැස්සේ ඝණ මීටර 450 ක ජල ධාරිතාවයකින් යුත් ජලාශයක් ඉදි කිරීම ද, පීඩන බන්ඩන ටැංකි දෙකක් ඉදි කිරීම ද, කාර්යාල ගොඩනැගිල්ල ඉදි කිරීම හා ක්ලෝරිනීකරණ කාමරය ඉදි කිරීම ද ව්‍යාපෘතියේ අංගයන් වේ.

මෙම ව්‍යාපෘතිය 2014.11.17 වැනි දින ආරම්භ කරන ලද අතර එය 2015.02.12 වැනි දින සිට 2016.08.23 වැනි දින දක්වා අත්හිටවනු ලැබ තිබිණි. ඉන් පසු මෙම ව්‍යාපෘතිය 2016.08.23 වැනි දින නැවත ආරම්භ කරන ලද අතර එය සම්පූර්ණයෙන් නිම කිරීමට අපේක්ෂිත දිනය වන්නේ 2018.06.12 වැනි දිනයයි.

මෙම ව්‍යාපෘතිය දැනට හොඳින් ඉදිරියට යමින් පවතී. කෙසේ වුවද මෙතෙක් අසම්පූර්ණ තත්ත්වයේ පවතින ඉඩම් අත් පත් කර ගැනීමේ කටයුතු හේතුවෙන් ව්‍යාපෘතියේ ඇතැම් අංගයන් කලට වේලාවට සම්පූර්ණ කරනු ලැබීමට නොහැකි විය හැකි වේ. ජලාශය හා ඉදි කිරීමට සැලැසුම් කරන ලද ඉඩම හා ස්ථාන හාර නිලධාරී ගොඩනැගිල්ල ඉදි කරනු ලැබීමට සැලැසුම් කරන ලද ඉඩම ද අත් පත් කර ගැනීම ප්‍රමාද වී ඇත. ජලය බෙදා දීමේ පද්ධතියේ නල වීලීම 70% ක් නිම කරනු ලැබ ඇති අතර ජලය ඝණ මීටර 1,000 ක ධාරිතාවයකින් යුත් ජල කුළුණ ඉදි කිරීමේ කටයුතු 71% ක් නිම කරනු ලැබ ඇත.

ඉහල ඝණත්වයේ පොලි එතිලින් නල (HDPE) හා මෘදු යකඩ (DI) නල ප්‍රධාන සම්ප්‍රේෂණ නල මාර්ගය වීලීමේ කටයුතු දැනට සිදු කරනු ලබමින් පවතී. ආසන්න වශයෙන් කිලෝ මීටර 40 ක නල මාර්ග දිර්ඝ කිරීම් සඳහා වූ ඉල්ලීම් ලැබී ඇත. වැඩ බිම තුළ සමස්ත භෞතික ප්‍රගතිය 56.39% ක් වූ අතර මූල්‍ය ප්‍රගතිය 41% ක් විය.

9. ලග්ගල නව නගර ජල සම්පාදන ව්‍යාපෘතිය

නල එලීමේ වැඩ කටයුතු

ලග්ගල නව නගර ජල සම්පාදන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබන්නේ ප්‍රධාන වශයෙන්ම මොරගහකන්ද - කළුගඟ වාරිමාර්ග ව්‍යාපෘතිය හේතුකොට ගෙන අවතැන් වූ ජනතාව නැවත පදිංචි කරනු ලැබ ඇති ප්‍රදේශය වෙත සුරක්ෂිත පානීය ජල පහසුකම් සම්පාදනය කර දීමේ පරමාර්ථයෙනි. එම ව්‍යාපෘතිය විසින් මධ්‍යම පලාතේ මාතලේ දිස්ත්‍රික්කය තුළ පිහිටි ලග්ගල පල්ලෙගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ ඇති ග්‍රාම නිලධාරී වසම් 11 ක් හා තදාසන්න ප්‍රදේශයන් ද ආවරණය වන පරිදි ජලය සම්පාදනය කර දෙනු ලබනවා ඇත.

සැලැසුම් ක්‍රිස්තු වර්ෂය වූ 2036 වන විට සේවා සම්බන්ධතාවයන් 8,000 ක් ඔස්සේ සේවය ලබා දෙනු ලැබීමට අපේක්ෂිත ප්‍රතිලාභීන්ගේ සංඛ්‍යාව 30,133 ක් වේ. ව්‍යාපෘතියේ පිරිවැය රුපියල් මිලියන 4,496 ක් වන අතර අරමුදල් සම්පාදනය කරනු ලබන්නේ දේශීය බැංකු අරමුදල් යටතේ හැටන් නැෂනල් බැංකුව විසිනි. ව්‍යාපෘතිය 2016.07.21 වැනි දින ආරම්භ කරන ලද අතර එය 2018 ජූලි මාසය වන විට සම්පූර්ණ කරනු ලැබීමට අපේක්ෂිතය. ජල ප්‍රභවය වන්නේ කළු ගඟේ අතු ගංගාවක් වූ රඹුකොලුව ඔයයි. ව්‍යාපෘතියේ විෂය පථය දිනකට ජලය ඝණ මීටර 4,250 ක ධාරිතාවයකින් යුත් තුළු මුවකින් ද, දිනකට ජලය ඝණ මීටර 4,000 ක ධාරිතාවයකින් යුත් ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයකින් ද, ඝණ මීටර 200 ක ධාරිතාවයකින්

යුත් සේවා ජලාශ 1 කින්, ඝණ මීටර 225 ක ධාරිතාවයකින් යුත් සේවා ජලාශ 2 කින්, ඝණ මීටර 450 ක ධාරිතාවයකින් යුත් සේවා ජලාශ 1 කින් හා ඝණ මීටර 600 ක ධාරිතාවයකින් යුත් සේවා ජලාශ 1 කින් ද සමන්විත සේවා ජලාශ පහකින් ද, ප්‍රධාන සම්ප්‍රේෂණ නල මාර්ග යකින් ද, පිළිවෙලින් කිලෝ මීටර 23.5 ක්, කිලෝ මීටර 17.5 ක්, හා කිලෝ මීටර් 190 ක දිග ප්‍රමාණයන්ගෙන් යුත් බෙදා හැරීමේ ප්‍රධාන නල මාර්ගයකින් හා බෙදා හැරීමේ පද්ධතියකින් ද සමන්විත වේ. මීට වැඩිමනත් වශයෙන් ස්ථාන භාර නිලධාරී කාර්යාලය හා නිල නිවාසය, රසායනාගාරය, ගබඩාව හා රැක බලා ගන්නන්ගේ නිල නිවාස 03 ක සංඛ්‍යාවක් වැනි අනිකුත් යටිතල පහසුකම් ද මෙම ව්‍යාපෘතිය යටතේ සපයනු ලබනවා ඇත.

ඉදි කිරීම් වැඩ කටයුතු 2017 වර්ෂයේ නොවැම්බර් මැද භාගයේදී ආරම්භ කරන ලද අතර නල එලීමේ කටයුතු හා කාර්යාලය හා නිල නිවාස ගොඩ නැගීමේ වැඩ කටයුතු දැනට සිදු කරනු ලබමින් පවතී.

තුළු මුව හා ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය ඉදි කරනු ලැබීමට සැලැසුම් කර තිබුණ ස්ථානයන් මහජන විරෝධතාවය නිසා වෙනස් කිරීමට සිදු වූ අතර ඒ අනුව ප්‍රධාන අමු ජල නල මාර්ගය හා ප්‍රතිකාරිත ජලය සම්ප්‍රේෂණය කරනු ලබන ප්‍රධාන නල මාර්ගය ද වෙනස් කිරීමට සිදු විය. මේ හේතුකොට ගෙන සැලැසුම් වැඩ කටයුතු වල සැලැකිය යුතු ප්‍රමාදයක් ඇති විය. විෂය පථය තුළ සිදු වූ වෙනස් කම් හේතුකොට ගෙන ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කළ යුතුව ඇත්තේ විවලන ආකාරයක් යටතේ වේ. එසේම, රඹුකොලුව තුළු මුව වැඩ බිම වෙත හා වෙල්ලවල ජලාශ වැඩ බිම් වෙත ප්‍රවේශ වීම සඳහා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් හා ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය වෙතින් ලැබිය යුතු අනුමැතිය මේ වන තුරුත් ලැබී නැත. තවත් ගැටළුවක් නම් ව්‍යාපෘතිය සඳහා කාර්ය මණ්ඩල සාමාජිකයින් බඳවා ගැනීමේ ප්‍රමාදයයි. ව්‍යාපෘති කාර්ය මණ්ඩලය බඳවා ගැනීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙතින් ලැබිය යුතු අනුමැතිය මෙතෙක් ලැබී නැත.

නොවැම්බර් මාසයේදී ලග්ගල නව නගර ජල සම්පාදන ව්‍යාපෘතිය සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩ සටහනක් අනිකුත් පරදු ධාරීන් නියෝජනය කරන නිලධාරීන්ගේ, කොන්ත්‍රාත් කරුගේ හා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සහභාගිත්වයෙන් දඹුල්ලේදී මෙහෙයවන ලදී.

ව්‍යාපෘතිය වෙනුවෙන් වැය කරන ලද සමුච්චිත වියදම රුපියල් මිලියන 883 ක් වේ. 2017 වර්ෂයේ අවසානය වන විට සාක්ෂාත් කරගනු ලැබ ඇති සමස්ත භෞතික ප්‍රගතිය 17.5% ක් වූ අතර මූල්‍ය ප්‍රගතිය 17.44% ක් විය.

10. විල්ගමුව ජල සම්පාදන ව්‍යාපෘතිය.

විල්ගමුව ජල සම්පාදන ව්‍යාපෘතිය දේශීය බැංකු අරමුදල් යොදා ගනිමින් ජාතික සංවර්ධන බැංකුවෙන් ලබා ගත් ණය මුදලක් මත ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘතියක් වන අතර එහි කොන්ත්‍රාත් මුදල රුපියල් මිලියන 3,580 ක් වේ. ව්‍යාපෘතිය 2016 අගෝස්තු 21 වැනි දින ආරම්භ කරන ලද අතර එය සම්පූර්ණයෙන් නිම කිරීමේ සැලැසුම්ගත දිනය 2018 ජූලි 31 වැනි දාය.

ව්‍යාපෘතිය දියත් කරන ලද්දේ ප්‍රදේශය තුළ බල පවත්නා හඳුනා නොගත් හේතූන් නිසා ඇති වන නිදන්ගත වකුගඩු රෝගය පාලනය කිරීමේ පියවරක් වශයෙන් මාතලේ දිස්ත්‍රික්කයේ විල්ගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය වෙත ජල සම්පාදන පහසුකම් සම්පාදනය කර ලීම සඳහා වේ. අමු ජලය උකහාගනු ලබන්නේ හීන් ගඟෙනි. 2034 වර්ෂය වන විට ආවරණය කරනු ලැබීමට අපේක්ෂිත ජන ගහණය 33,725 කි. ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයේ ධාරිතාවය දිනකට ඝණ මීටර 5,500 ක් වේ. ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය වෙත ජලය සම්ප්‍රේෂණය කිරීමට අපේක්ෂා කරනු ලබන්නේ පොම්ප කිරීම මගින් වන හෙයින් විද්‍යුත් යාන්ත්‍රික උපකරණ සපයා ස්ථාපිත කිරීම හා පොම්ප හා ඒ හා අදාල උපාංගයන් ද සපයා ස්ථාපිත කිරීම ව්‍යාපෘතියේ කොටසක් බවට පත් වී ඇත.

ව්‍යාපෘතියේ ප්‍රධාන අංගයන් වන්නේ දිනකට ජලය ඝණ මීටර 5,500 ක ධාරිතාවයකින් යුත් ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය ද, ජලය ඝණ මීටර 800 ක ධාරිතාවයකින් යුත් ගබඩා ටැංකිය ද, එකක් ජලය ඝණ මීටර 225 ක් බැගින් වූ ධාරිතාවයකින් යුත් ගබඩා ටැංකි 2 ක් ද, ජලය ඝණ මීටර 100 ක ධාරිතාවයකින් යුත් ගබඩා ටැංකි එකක් ද, කිලෝ මීටර 1 ක දිගින් යුත් ප්‍රධාන අමු ජල නල මාර්ගයක් ද, කිලෝ මීටර 18 ක දිගින් යුත් පිරිසිදු කරන ලද ජලය සම්ප්‍රේෂණය කිරීමේ නල මාර්ගයක් ද, කිලෝ මීටර් 100 ක දිගින් යුත් බෙදා හැරීමේ නල මාර්ගයන් ද, ස්ථාන භාර නිලධාරී කාර්යාලයක් ද, මෙහෙයුම් කරන්නාගේ නිල නිවාසයක් ද, තනි මහලකින් යුත් කාර්ය මණ්ඩල නිල නිවාසයක් හා රැක බලා ගන්නාගේ නිල නිවාසයක් ද වේ.

2017 දෙසැම්බර් 31 වැනි දිනය වන විට ව්‍යාපෘතිය වෙනුවෙන් වැය කරන ලද පිරිවැය රුපියල් මිලියන 665 ක් වූ අතර 2017 වර්ෂයේ අවසානය වන විට ව්‍යාපෘතියේ සමස්ත භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් 12.8 % ක් හා 18.57% ක් විය.

ව්‍යාපෘතියට අනුයුක්ත කාර්ය මණ්ඩල සාමාජිකයින් හා ව්‍යාපෘති වැඩ කටයුතු වලට සම්බන්ධ වන කලාපීය සහාය සේවා මධ්‍යස්ථානයට අනුයුක්ත කාර්ය මණ්ඩල සාමාජිකයින්, ප්‍රධාන ඉංජිනේරු වරුන්, ඉංජිනේරු වරුන් හා ඉංජිනේරු සහායකයින් වෙනුවෙන් ‘‘ඉදි කිරීම් ව්‍යාපෘති කළමනාකරණය’’ යන මාතෘකාව යටතේ වූ දින 4 ක පුහුණු කිරීම් වැඩ සටහනක් මෙහෙයවන ලදී.

සුලුගුනේ ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයේ ගොහොදු ඝනත්වයට පත් කිරීමේ පදනම සඳහා R/F හා F/W සවි කිරීමේ වැඩ කිරීම

වර්ෂය තුළදී මුහුණ පෑමට සිදු වූ සාමාන්‍ය ගැටළු වූයේ හීන්ගඟ අමුණේ ජලය බෙදා ගැනීම සඳහා වාරි මාර්ග දෙපාර්තමේන්තුව විසින් අනුමැතිය දීමේදී සිදු වූ ප්‍රමාදය, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව හා විල්ගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙතින් ඉඩම් ලබා ගැනීමේදී සිදු වූ ප්‍රමාදය ද වේ. මීට අමතරව භාණ්ඩ අලෙවි කරන්නන්ගේ අනුමත කරන ලද ලැයිස්තුව ටෙන්ඩර ගිවිසුම තුළ අන්තර්ගත වී නොතිබීම හේතුවෙන් ඉහළ ඝණත්වයෙන් යුත් පොලි එතිලින් නල ප්‍රතිසම්පාදනය කර ගැනීමේ ද ප්‍රමාදයන් සිදු විය.

11. ඇටම්පිටිය ජල සම්පාදන ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතිය ඇටම්පිටිය, උඟව මහවෙලගම, නෙලුදන්ඩ, දෙහිවින්න, මලිත්ත, හින්නාරංගොල්ල, නිලිඅතුගොඩ, කුඩුමහුවෙල, නෙලුව, මාලිගාතැන්න, පල්ලේගම, වෑපස්සවෙල, කටුගහ, පහමුණුතොට හා උදාගම යන ග්‍රාමයන් ආවරණය කරමින් බදුල්ල දිස්ත්‍රික්කයේ හාලි ඇල ප්‍රදේශයේ ප්‍රතිලාභීන් 15,000 ක් වෙත ජලය සම්පාදනය කොට දීමට අපේක්ෂා කරයි. ජල ප්‍රභවය වන්නේ උමා ඔය රුස්කුරු ජලාශයයි. ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයේ ධාරිතාවය දිනකට ජලය ඝණ මීටර 3500 ක් වේ. මුළු පිරිවැය ඇස්තමේන්තුව රුපියල් මිලියන 2,244 ක් වේ. 2017 වර්ෂයේ අවසානයට සාක්ෂාත් කර ගත හැකි වූ භෞතික හා මූල්‍ය ප්‍රගතිය දල වශයෙන් පිළිවෙලින් 6% ක් හා 15% ක් විය.

හුවන පොම්පාගාරය

12. මැදිරිගිරිය බෙදා හැරීම් ජාලය අදියර 11

මැදිරිගිරිය බෙදා හැරීම් ජාලය අදියර 11 දේශීය බැංකු අරමුදලින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘතියක් වශයෙන් ආරම්භ කරන ලද්දේ මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කොටසක් වෙත ජලය සම්පාදනය කරනු ලබන ජලය බෙදා හැරීමේ පද්ධතිය ආවරණය කිරීම සඳහා වේ. මෙය සැලැසුම් කරනු ලැබ ඇත්තේ වර්ෂ 2030 වන විට මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ග්‍රාම නිලධාරී වසම් 31 ක් ආවරණය කරමින් ගෘහස්ත ජල සම්පාදන සේවා සම්බන්ධතාවයන් 15,000 ක් ලබා දීමේ අරමුණ ඇතිව වේ. ව්‍යාපෘතිය ආරම්භ කරන ලද්දේ 2016 මාර්තු 1 වැනි දින වන අතර 2018 වර්ෂය තුළදී එය සම්පූර්ණයෙන් නිම කරනු ලැබීමට සැලැසුම් කරනු ලැබ ඇත. අරමුදල් සම්පාදනය කරනු ලබන බැංකුව ලංකා බැංකුව වන අතර සපයනු ලැබීමට අපේක්ෂිත අරමුදලේ ප්‍රමාණය රුපියල් මිලියන 1,500 ක් වේ.

කොන්ත්‍රාත්තුවේ ප්‍රධාන අංගයන් වන්නේ මැණිම් හා සැලැසුම් කිරීම් ද සහිතව පැරණි නගරයේ හා නව නගරයේ බෙදා හැරීම් පද්ධතීන් වෙනුවෙන් පොලි විනිල් ක්ලෝරයිඩ් (PVC) හා මෘදු යකඩ (DI) නල, සවි කිරීම් හා විශේෂ උපාංගයන් සැපැයීම හා නල මාර්ග වැලීම ද, කවුඩුල්ල ඔය හරහා නල මාර්ග පාලමක් ඉදි කිරීම හා කාර්යාලය සහ නිල නිවාස ඉදි කිරීම ද වේ. ව්‍යාපෘතිය විසින් වලනු ලැබීමට අපේක්ෂිත නල මාර්ගයන්ගේ සම්පූර්ණ දිග ප්‍රමාණය කිලෝ මීටර 243 ක් වන අතර එය පැරණි නගරය තුළ කුළුනේ සිට වලනු ලබන බෙදා හැරීමේ ප්‍රධාන නල මාර්ගය කිලෝ මීටර 14 කින් ද, නව නගරය තුළ අභ්‍යන්තර බෙදා හැරීම් පද්ධතිය කිලෝ මීටර 102 කින් හා පැරණි නගරයේ අභ්‍යන්තර බෙදා හැරීම් පද්ධතිය කිලෝ මීටර 127 කින් ද සමන්විත වේ. කිලෝ මීටර 217 ක දිගින් යුත් නල වැලීමේ වැඩ කටයුතු දැනටමත් සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇත. 2017 වර්ෂය අවසන් වන විට ව්‍යාපෘතිය විසින් සාක්ෂාත් කර ගනු ලැබ ඇති සමස්ත භෞතික ප්‍රගතිය 91% ක් වේ. හිඟුරක්ගොඩ - මැදිරිගිරිය මාර්ගයේ මාර්ග පැන්නුම් වැඩ කටයුතු සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය වෙතින් අනුමැතිය ලබා ගැනීමේදී සිදු වූ ප්‍රමාදය නිසා මෙන්ම මෘදු යකඩ නල සැපැයීමේදී සිදු වූ ප්‍රමාදයන් නිසා ද නල මාර්ග වැලීමේ වැඩ කටයුතු ප්‍රමාද විය. 2017 වර්ෂයේ අවසානය වන විට ව්‍යාපෘතිය විසින් සාක්ෂාත් කර ගනු ලැබ ඇති සමස්ත මූල්‍ය ප්‍රගතිය 54% ක් වේ.

දැනට වැඩ කටයුතු අවසන් කරනු ලැබ ඇති ප්‍රදේශයන්හි නව සේවා සම්බන්ධතාවයන් දීමේ වැඩ සටහන දැනටමත් ආරම්භ කරනු ලැබ ඇති අතර 2017 දෙසැම්බර් 06 වැනි දින අතිගරු ජනාධිපති තුමන් විසින් එම කාර්යය උත්සවාකාරයෙන් දියත් කරන ලදි. තවද, අඩු ආදායම් ලාභී හා හඳුනා නොගත් හේතූන් නිසා ඇති වන නිදන්ගත වකුගඩු රෝගයට ගොදුරු වී ඇති පවුල් සඳහා සේවා සම්බන්ධතාවයන් 5,000 ක් ලබා දීම සඳහා ජනාධිපති කාර්ය බලකාය වෙතින් රුපියල් මිලියන 45 ක මුදලක් වෙන් කර දෙනු ලැබ ඇත.

13. රුපියල් බිලියන 3.5 ක ව්‍යාපෘතිය (ජල සම්පාදන ව්‍යාපෘතීන් 22 ක් සඳහා)

මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලද්දේ දේශීය බැංකු විසින් අරමුදල් සම්පාදනය කරනු ලබන ව්‍යාපෘතීන් යටතේ වේ. ව්‍යාපෘතිය විසින් අරමුණු කරන ලද්දේ ඌව, දකුණු, උතුරු, බටහිර මධ්‍යම, බටහිර උතුරු, බටහිර දකුණු, නැගෙනහිර, වයඹ, උතුරු මැද, මධ්‍යම හා සබරගමුව යන කලාපීය සහාය සේවා මධ්‍යස්ථාන කොට්ඨාශයන් තුළ දෙනු ලබන සේවා සම්බන්ධතාවයන් සංඛ්‍යාව දැනට ක්‍රියාත්මක වන ජලය බෙදා හැරීමේ පද්ධතීන් තුළ නල මාර්ග දීර්ඝ කිරීම් හා හිඩැස් පිරවීම හරහා වැඩි දියුණු කිරීම වන්නේය. ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තු කරන ලද මුළු පිරිවැය රුපියල් බිලියන 3.5 ක් වන අතර ව්‍යාපෘතිය අවසන් වීමෙන් පසුව සපයා දීමට අපේක්ෂා කරනු ලබන සේවා සම්බන්ධතා සංඛ්‍යාව 33,250 කි. මෙම ව්‍යාපෘතිය 2014 වර්ෂයේදී ආරම්භ කරන ලද අතර 2018 වර්ෂය තුළදී එය සම්පූර්ණයෙන් නිම කරනු ලැබීමට සැලැසුම් කරනු ලැබ ඇත. 2017 දෙසැම්බර් මාසය වන විට ව්‍යාපෘතියේ සමස්ත භෞතික ප්‍රගතිය 89% ක් වූ අතර මූල්‍ය ප්‍රගතිය 61% ක් විය.

ශ්‍රී ලංකා රජයේ මූල්‍යාධාරයෙන් සිදු කෙරෙමින් පවතින සුළු හා මධ්‍ය පරිමාණ ජල සම්පාදන ව්‍යාපෘතීන්

2017 වර්ෂය තුළ දී ශ්‍රී ලංකා රජය විසින් සපයන ලද අරමුදල් යොදා ගනිමින් ක්‍රියාත්මක කෙරෙමින් / සංවර්ධනය කෙරෙමින් පැවැති ව්‍යාපෘතීන්ගේ පිහිටීම පෙන්නුම් කරනු ලබන සිතියම.



ශ්‍රී ලංකා රජය විසින් අරමුදල් සපයන ලද කුඩා හා මධ්‍යම පරිමාණ ජල සම්පාදන ව්‍යාපෘතීන්

1). මධ්‍යම පලාත

ශ්‍රී ලංකා රජය විසින් අරමුදල් සම්පාදනය කරන ලද පුනරුත්ථාපන හා වර්ධන වැඩ ව්‍යාපෘතිය යටතේ කුණ්ඩසාලේ ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය, මාතලේ ජල සම්පාදන ව්‍යාපෘතිය, මාරස්සන ජල සම්පාදන ව්‍යාපෘතිය හා තලවකැලේ / ලිඳුල ජල සම්පාදන ව්‍යාපෘතිය යන ජල සම්පාදන ව්‍යාපෘතීන් හා සම්බන්ධ පුනරුත්ථාපන හා වර්ධන වැඩ කටයුතු ක්‍රියාත්මක කිරීම 2016 වර්ෂයේ සිට අඛන්ඩ ලෙස සිදු කරමින් පැමිණි අතර එම වැඩ කටයුතු 2017 වර්ෂය තුළදී සම්පූර්ණයෙන් නිම කරනු ලැබීමට සැලැසුම් කරන ලද්දේය. කෙසේ වුවද, මෙම ව්‍යාපෘතීන් වෙනුවෙන් 2017 වර්ෂය තුළදී වෙන් කිරීම් කරනු ලැබුවේ නැත. මේ හේතුව නිසා 2017 වර්ෂයේ අවසානයට ඉහතින් සඳහන් කරන ලද ව්‍යාපෘතීන්ගේ ප්‍රගතිය 2016 වර්ෂය අවසානයේ ලබා තිබූ ප්‍රගතියම විය.

2). උතුරු මැද පලාත

2017 වර්ෂය තුළදී උතුරු මැද පලාත තුළ ක්‍රියාත්මක කරනු ලබමින් පැවති කුඩා හා මධ්‍ය පරිමාණ ජල සම්පාදන ව්‍යාපෘතීන් කිසිවක් තිබුනේ නැත.

3). උතුරු පලාත

2017 වර්ෂය තුළදී උතුරු පලාත තුළ ක්‍රියාත්මක කරනු ලබමින් පැවති කුඩා හා මධ්‍ය පරිමාණ ජල සම්පාදන ව්‍යාපෘතීන් කිසිවක් තිබුනේ නැත.

4). සබරගමුව පලාත

i.ඇඹිලිපිටිය ජල සම්පාදන ව්‍යාපෘතිය

මේ වනාහී නින්දගම්පැලැස්ස, ඇඹිලිපිටිය, නව නගරය, පල්ලෙගම, උඩගම, කලගෙඩිආර, හල්මිල්ලකැටිය, යෝදගම, කුබුගොඩ ආර, මොරකැටිය, හිඟුර, තුන්කම හා කැටගල් ආර යන ප්‍රදේශයන්හි වාසය කරන ප්‍රතිලාභීන් 84,000 කට සේවා සැපැයීමේ අපේක්ෂාවෙන් දැනට ක්‍රියාත්මක වන යෝජනා ක්‍රමය වෙත ජල ප්‍රතිකාරක යන්ත්‍රාග ාරයක් එක් කොට වර්ධනය කිරීම අරමුණු කර ගනිමින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘතියකි. මේ සඳහා ඇස්තමේන්තු කරනු ලැබ ඇති මුළු පිරිවැය රුපියල් මිලියන 607.89 ක් වේ. තුළු මුව, ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය, ජල කුළුණ, කාර්යාල ගොඩනැගිල්ල හා ජලය බෙදා හැරීමේ පද්ධතිය ආදියෙහි ඉදි කිරීම් කටයුතු සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇත. 2017 වර්ෂයේ අවසානයට ව්‍යාපෘතියේ භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් 100% ක් හා 101% ක් විය. ව්‍යාපෘතිය දැනටමත් සේවයෙහි යොදවනු ලැබ ඇති අතර රඳවා ගැනීම් වියදම් වශයෙන් රුපියල් 3,630,067. 00 ක මුදලක් ගෙවිය යුතුව ඇත.

ii.උඩවලව ජල සම්පාදන ව්‍යාපෘතිය - පියවර 1 හා 11

මෙම ව්‍යාපෘතියෙන් සිදු වන්නේ දැනට ක්‍රියාත්මක ජල සම්පාදන යෝජනා ක්‍රමය වර්ධනය කිරීම වන අතර ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තු කරන ලද මුළු පිරිවැය රුපියල් මිලියන 973.20 ක් වේ. මුළු ප්‍රතිලාභීන් වන්නේ කොළඹගෙ ආර, නින්දගම් පැලැස්ස, රන්වමඩම, තිබුල්කැටිය හා උඩවලව යාය 2, අන්දළුව, මඩුවන්වල, පනහදුව, රත්කරව්ව, ගඟේයාය, සන්කපාල මිරිස්වැල්පොත හා මහගම යන ප්‍රදේශයන්හි වාසය කරන 62,500 ක ජන සංඛ්‍යාවකි. ව්‍යාපෘතියේ මුල් විෂය පථයට ඇතුලත් වන කාර්යයන් සම්පූර්ණ ලෙස නිම කරනු ලැබ ඇත. 2017 වර්ෂයේ අවසානයට ව්‍යාපෘතිය විසින් සාක්ෂාත් කරගනු ලැබ ඇති භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් 100% ක් හා 75% ක් වන අතර ව්‍යාපෘතිය දැනටමත් සේවයෙහි යොදවනු ලැබ ඇත. රඳවා ගැනීම් වියදම් වශයෙන් රුපියල් 461,318.00 ක මුදලක් ගෙවිය යුතුව ඇත.

iii.ගොඩකවෙල ජල සම්පාදන ව්‍යාපෘතිය

මෙම නව ව්‍යාපෘතිය විසින් ගොඩකවෙල, ගලහිටිය, මස්ඉඹුල, තදාසන්න අර්ධ නාගරික ප්‍රදේශ, ඇල්පිටිය, නැගෙනහිර බලවින්න, ගොඩකවෙල, වරායාය, බටහිර බලවින්න, උතුරු බලවින්න, කෝන්පිටිය, මාවතලන්ද, මැද්දෙගම, රිදීවිට, දඹවින්න, කපුහේන්තැන්න, නැගෙනහිර බලවින්න, මාවතලන්ද හා මල්වත්ත යන ප්‍රදේශයන් තුළ වාසය කරනු ලබන ප්‍රතිලාභීන් 22,500 ක සංඛ්‍යාවක් වෙත සුරක්ෂිත පානීය ජලය සම්පාදනය කර දීමට අපේක්ෂා කරනු ලබයි. ජල ප්‍රභවය රක්වාන ගඟ වන අතර දිනකට ජලය ඝණ මීටර 4,500 ක ධාරිතාවයකින් යුත් ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයක් මගින් ජලය සම්පූර්ණයෙන්ම ප්‍රතිකාරිත කරනු ලබයි. ජල තුළු මුව, ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය, ගබඩා ටැංකිය හා ජලය බෙදා හැරීමේ පද්ධතිය ඉදි කිරීම සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇත. ව්‍යාපෘතියේ මුල් විෂය පථයට අදාල සියළුම වැඩ කටයුතු සම්පූර්ණයෙන්ම නිම කරනු ලැබ ඇත. ඇස්තමේන්තු කරනු ලැබ ඇති මුළු පිරිවැය රුපියල් මිලියන 288.80 ක් වේ. 2017 වර්ෂයේ අවසානය වන විට ව්‍යාපෘතිය විසින් සාක්ෂාත් කරගනු ලැබ ඇත භෞතික හා මූල්‍ය ප්‍රගතිය 100% ක් වේ. ව්‍යාපෘතිය දැනටමත් සේවයෙහි යොදවනු ලැබ ඇති අතර කොන්ත්‍රාත්තුව රඳවා ගැනීම් වියදම් වශයෙන් රුපියල් 575,700.00 ක මුදලක් ගෙවිය යුතුව ඇත.

iv.ගලිගමුව ජල සම්පාදන ව්‍යාපෘතිය

ශ්‍රී ලංකා රජයේ අරමුදල් සම්පාදනය යටතේ ක්‍රියාත්මක කරන ලද මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ වැඩ කටයුතු සියල්ලක්ම මෙම වර්ෂය තුළදී අවසන් කරනු ලැබ ඇත. නල එලීම සඳහා ක්‍රියාත්මක කරන ලද කොන්ත්‍රාත්තු වෙනුවෙන් රැඳවුම් ගාස්තු වශයෙන් ගෙවීම සඳහා ඉතිරිව ඇති රුපියල් මිලියන 0.84 ක මුදලක් ගෙවීමට ඇති අතර ලෝක බැංකු අරමුදල් සම්පාදනය යටතේ ක්‍රියාත්මක කිරීම සඳහා ව්‍යාපෘතිය පවරා දෙනු ලැබ ඇත.

v. නිවිතිගල ජල සම්පාදන ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතිය රත්නපුර දිස්ත්‍රික්කය තුළ පිහිටි වටාපොත, සිදුරුපිටිය, තුත්තිරිපිටිය, හල්කඳලිය, නිවිතිගල සහ යක්දෙහිවත්ත යන ප්‍රදේශයන් තුළ වාසය කරනු ලබන ප්‍රතිලාභීන් 6,000 ක සංඛ්‍යාවක් වෙත සුරක්ෂිත පානීය ජල පහසුකම් සම්පාදනය කර දීමට අපේක්ෂා කරයි. ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තු කරන ලද මුළු පිරිවැය රුපියල් මිලියන 153.4 ක් වේ. යෝජනා ක්‍රමය සඳහා වූ ව්‍යාපෘති අංගයන් සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇත. ඉඩම සම්බන්ධයෙන් පැන නැඟි ගැටළුවක් හේතුකොට ගෙන කාර්යාල ගොඩනැගිල්ල ඉදි කිරීමේ කටයුතු අත් හැර දමන්නට සිදු විය. 2017 වර්ෂයේ අවසානය වන විට ව්‍යාපෘතිය විසින් සාක්ෂාත් කර ගෙන තිබූ භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් 100% ක් හා 68% ක් විය. ව්‍යාපෘතිය දැනටමත් සේවයෙහි යොදවනු ලැබ ඇති අතර රඳවා ගත් ගාස්තු වෙනුවෙන් රුපියල් 236,850.00 ක මුදලක් ගෙවිය යුතුව ඇත.

vi. පැල්මඩුල්ල ජල සම්පාදන ව්‍යාපෘතිය

පැල්මඩුල්ලේ පිහිටි ඉහල බෝපිටිය, පැල්මඩුලුගම, පැල්මඩුල්ල නගරය, පහල බෝපිටිය, කුට්ටපිටිය, ගනේගම, ගොඩගම, රිල්හේන, උඩතුල, දෙනවක, උඩකඩ, පනාවැන්න, බෝරැල, මොරතොට, නැගෙනහිර නුගවෙල, බටහිර නුගවෙල, කට්ටන්ගේ, කොටකෙතන, වැල්ලඳුර, යායින්න හා නාරන්ගොඩ යන ප්‍රදේශයන් තුල වාසය කරනු ලබන ප්‍රතිලාභීන් 22,500 ක සංඛ්‍යාවක් ආවරණය කරමින් ඔවුන් වෙත සුරක්ෂිත පානීය ජලය සම්පාදනය කර දීමට මෙම ව්‍යාපෘතිය අපේක්ෂා කරයි. ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තු කරනු ලැබ ඇති මුළු පිරිවැය රුපියල් මිලියන 421.09 ක් වන අතර 2017 වර්ෂය අවසානය වන විට ව්‍යාපෘතිය විසින් සාක්ෂාත් කරගනු ලැබ තිබුණ භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් 100% ක් හා 98% ක් විය. ව්‍යාපෘතියේ මුල් විෂය පථය හා අදාල සියළුම වැඩ කටයුතු සම්පූර්ණයෙන් නිම කරනු

ලැබ ඇති අතර ව්‍යාපෘතිය දැනටමත් සේවයෙහි යොදවනු ලැබ ඇත. රඳවාගත් ගාස්තු වශයෙන් රුපියල් 359,472.00 ක මුදලක් ගෙවිය යුතුව ඇත.

vii. කිරිඇල්ල ජල සම්පාදන ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතිය රත්නපුර දිස්ත්‍රික්කය තුළ පිහිටි ඉඩංගොඩ හා කිරිඇල්ල යන ප්‍රදේශයන් තුළ ජීවත් වන ප්‍රතිලාභීන් 8,000 ක සංඛ්‍යාවක් වෙත සුරක්ෂිත පානීය ජලය සම්පාදනය කර දීමට අපේක්ෂා කරයි. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ඇස්තමේන්තු කරනු ලැබ ඇති මුළු පිරිවැය රුපියල් මිලියන 205 ක් වේ. ව්‍යාපෘතියේ 1 වැනි පියවර සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇත. 2017 වර්ෂය අවසානය වන විට ව්‍යාපෘතිය විසින් සාක්ෂාත් කරගනු ලැබ තිබුණ භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් (1 වැනි පියවර හා අදාලව) 100% ක් හා 25% ක් විය. ව්‍යාපෘතිය සේවයේ යොදවනු ලැබ අතර රඳවාගත් ගාස්තු වශයෙන් රු. 680,723.00 ක් ගෙවිය යුතුව ඇත.

viii. මාදොල ජල සම්පාදන ව්‍යාපෘතිය

මාදොල විකුම්සිහගම ග්‍රාම නිලධාරී වසම වෙත අවිස්සාවේල්ල ජල සම්පාදන යෝජනා ක්‍රමය යටතේ නල ජලය සම්පාදනය කර දීම ව්‍යාපෘතියේ අපේක්ෂාව වේ. ව්‍යාපෘතියේ ප්‍රතිලාභීන්ගේ සංඛ්‍යාව 4,000 ක් වනු ඇති අතර ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ මුළු පිරිවැය රුපියල් මිලියන 132 ක් වශයෙන් ඇස්තමේන්තු කරනු ලැබ ඇත. ව්‍යාපෘතිය සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇති වුවද පැන නැගි ප්‍රායෝගික ගැටළු හේතුකොට ගෙන රාජ්‍ය සේවක ගම්මානය වෙත බෙදා හැරීම දීර්ඝ කළ නොහැකි විය. ක්‍රියාත්මක කළ හැකි වැඩ කොටස් සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇති අතර ඒ අනුව ව්‍යාපෘතිය විසින් 2017 වර්ෂයේ අවසානය වන විට සාක්ෂාත් කරගනු ලැබ ඇති භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් 82% ක් හා 58% ක් විය. ව්‍යාපෘතිය සේවයේ යොදවනු ලැබ ඇති අතර රඳවාගත් ගාස්තු වශයෙන් රුපියල් 1,147,878.00 ක මුදලක් ගෙවිය යුතුව ඇත.

ix. මාවනැල්ල ජල සම්පාදන ව්‍යාපෘතිය

මාවනැල්ල ජල සම්පාදන යෝජනා ක්‍රමය වර්ධනය කිරීම සිදු කරන ලද්දේ කැටි ගස්වනය, ශීෂ්‍ර වැලි පෙරණයන් හා පොම්පාගාරය ඉදි කිරීමේ කටයුතු නිම කිරීමෙන් සහ තුළු මුව පොම්ප හා ඉහල ඔසෝවි පොම්ප ආදිය සපයා සවි කිරීමෙන් ද වේ. ඒ අනුව ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයේ එචකට පැවැති දිනකට ජලය ඝණ මීටර 9,500 ක ධාරිතාවය දිනකට ජලය ඝණ මීටර 5,500 කින් ඉහල නැංවීමට හැකි විය. මේ හා සම්බන්ධ කොන්ත්‍රාත්තු සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇති අතර අවසන් ගෙවීම් හා රඳවා ගනු ලැබූ ගාස්තු වශයෙන් රුපියල් මිලියන 1.6 ක මුදලක් ගෙවීමට ඉතිරිව තිබේ.

x. පදලන්ගල ජල සම්පාදන යෝජනා ක්‍රමය

මෙම නව ව්‍යාපෘතිය මගින් පදලන්ගල ප්‍රදේශයේ වාසය කරන ප්‍රතිලාභීන් 10,000 ක් වෙත සුරක්ෂිත පානීය ජලය සම්පාදනය කර දීමට අපේක්ෂා කරනු ලැබේ. ව්‍යාපෘතිය නිම කිරීම සඳහා ඇස්තමේන්තු කරනු ලැබ ඇති සම්පූර්ණ පිරිවැය රුපියල් මිලියන 609.05 ක් වේ. ව්‍යාපෘතියේ අංගයන් වන්නේ පොම්පාගාරය හා ඝණ මීටර 100 ක ධාරිතාවයකින් යුත් ජල කුළුණ ඉදි කිරීම, ජලය බෙදා හැරීමේ නල පද්ධතිය සපයා වීලීම, පොම්ප කිරීමේ ප්‍රධාන නල මාර්ගය සපයා වීලීම සහ යාන්ත්‍රික හා විද්‍යුත් උපකරණ සහිත පොම්ප සපයා සවි කිරීම ද වේ. මෙම අංගයන් අතුරින් මුල් අංගයන් තුන ජල සම්පාදන හා සනීපාරක්ෂණ කටයුතු වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ නිම කරනු ලැබීමට කටයුතු කරනු ලබන අතර ඉතිරි අංගයන් දෙක ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් නිම කරනු ලබනවා ඇත. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් නිම කිරීමට අපේක්ෂිත වැඩ කොටස් වෙනුවෙන් ඇස්තමේන්තු කරනු ලැබ ඇති සම්පූර්ණ පිරිවැය රුපියල් මිලියන 185.7 ක් වේ. පොම්ප කිරීමේ ප්‍රධාන නල මාර්ගය සපයා වීලීමේ වැඩ කටයුතු දැනට සිදු කරනු ලබමින් පවතින අතර 2017 වර්ෂයේ අවසානයට ව්‍යාපෘතිය විසින් සාක්ෂාත් කර ගනු ලැබ ඇති භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් 45% ක් හා 20% ක් වේ.

5. දකුණු පලාත

i. බද්දේගම ජල සම්පාදන යෝජනා ක්‍රමය

වර්ෂ 2013 දී බද්දේගම ජල සම්පාදන යෝජනා ක්‍රමය ආරම්භ කරන ලද්දේ බද්දේගම හා තදාසන්න අර්ධ නාගරික ප්‍රදේශයන් වෙත සිදු කරනු ලබන ජලය බෙදා හැරීමේ වැඩ කටයුතු වැඩි දියුණු කිරීමේ අපේක්ෂාවෙනි. ප්‍රදේශය තුළ මෙලෙක් නොකළ පොලි විනිල් ක්ලෝරයිඩ් (uPVC) නල, මෘදු යකඩ (DI) නල හා පොලි එතිලින් (PE) නල සපයා වීලීම යන කර්තව්‍යයන්ගෙන් මෙම ව්‍යාපෘතිය සමන්විත වේ. මේ වන විට කළ යුතුව තිබී වැඩ කටයුතු සියල්ල සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇති අතර මූල්‍ය ප්‍රගතිය 85% ක් වේ. ව්‍යාපෘතිය නිම කිරීම සඳහා ඇස්තමේන්තු කරනු ලැබ ඇති සම්පූර්ණ පිරිවැය රුපියල් මිලියන 441 ක් වන අතර අපේක්ෂිත ප්‍රතිලාභීන්ගේ සංඛ්‍යාව 33,800 ක් වේ.

ii. සිතුල්පව්ව ජල සම්පාදන යෝජනා ක්‍රමය

සිතුල්පව්ව ජල සම්පාදන යෝජනා ක්‍රමය සමන්විත වන්නේ තුළු මුව ළිඳ ඉදි කිරීම, දඩු කාමරය (crib chamber) ඉදි කිරීම, පොම්පාගාර පාලන කාමරය ඉදි කිරීම, ඝණ මීටර 25 ක ධාරිතාවයෙන් යුත් අතර මැදි බිම් ටැංකිය ඉදි කිරීම, පහල ඔසෝවි පොම්ප හා ඉහල ඔසෝවි පොම්ප, පිළිසෝදු පොම්ප හා උපාංගයන් සපයා සවි කිරීම, මෙහෙයුම් කිරීමේ ගොඩනැගිල්ල ඉදි කිරීම හා ඊට අදාල අනිකුත් වැඩ යන අංගයන්ගෙනි. දිනකට ජලය ඝණ මීටර 500 ක නිෂ්පාදන ධාරිතාවයක් සහිත මෙම යෝජනා ක්‍රමය මගින් සිතුල්පව්ව විහාරස්ථානයට හා ආසන්න වශයෙන් වන්දනා කරුවන් 10,000 කට ජල සම්පාදන සේවාවන් සපයා දීමට අපේක්ෂා කරනු ලැබේ. මෙහෙයුම් කටයුතු කිරීමේ ගොඩනැගිල්ල ඉදි කිරීමේ වැඩ හැර අනිකුත් සියළු වැඩ කටයුතු සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇත. ව්‍යාපෘතිය නිම කිරීම සඳහා ඇස්තමේන්තු කරනු ලැබ ඇති සම්පූර්ණ පිරිවැය රුපියල් මිලියන 116 ක් වූ අතර වර්ෂය අවසාන වන විට ව්‍යාපෘතිය විසින් සාක්ෂාත් කර ගනු ලැබ ඇති භෞතික ප්‍රගතිය 85% ක් වූ අතර මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් 65% ක් විය.

iii. තිස්සමහාරාම ජල සම්පාදන යෝජනා ක්‍රමය

තිස්සමහාරාම ජල සම්පාදන යෝජනා ක්‍රමය වර්ධනය කිරීම සඳහා ඇස්තමේන්තු කරනු ලැබ ඇති ව්‍යාපෘති පිරිවැය රුපියල් මිලියන 393 ක් වේ. ව්‍යාපෘතියේ පළමු අදියර යටතේ තිස්සමහාරාම ජල සම්පාදන යෝජනා ක්‍රමය වැඩි දියුණු කිරීමේ කටයුතු ක්‍රියාත්මක කිරීමට නියමිත අතර ඒ සඳහා වූ රුපියල් මිලියන 113 ක් වූ කොන්ත්‍රාත්තුව ප්‍රදානය කරනු ලැබ ඇත. වාතන උපකරණය ඉදි කිරීම, අවසාදන ටැංකිය ඉදි කිරීම, රසායන කුටිය ඉදි කිරීම හා මෙහෙයුම් කටයුතු කිරීමේ ගොඩනැගිල්ල ඉදි කිරීම යන වැඩ කටයුතු වලින් කොන්ත්‍රාත්තුව සමන්විත වේ. අපේක්ෂා කරනු ලබන ප්‍රතිලාභීන්ගේ සංඛ්‍යාව 10,000 ක් වේ. ව්‍යාපෘතිය විසින් සාක්ෂාත් කර ගනු ලැබ ඇති භෞතික ප්‍රගතිය 9% ක් වන අතර මූල්‍ය ප්‍රගතිය 18% ක් විය.

iv. අන්දරගස්යාය ජල සම්පාදන යෝජනා ක්‍රමය

මෙම යෝජනා ක්‍රමයේ අරමුණ වන්නේ අන්දරගස්යාය හා බදගිරිය යන ප්‍රදේශයන් වෙත සේවාව සැපැයීම වේ. අන්දරගස්යාය ජල සම්පාදන යෝජනා ක්‍රමය මෘදු යකඩ නල හා සවි කිරීම් සැපැයීම හා මෘදු යකඩ නල හා සවි කිරීම් වීලීම යන අංගයන්ගෙන් සමන්විත වේ. මට්ටම් පසුවිපරම් පද්ධතිය සම්පූර්ණයෙන්ම නිම කරනු ලැබ ඇති අතර නල සැපැයීම 75% ක් ද නල වීලීම 24% ක් ද සම්පූර්ණ කරනු ලැබ ඇත. යෝජනා ක්‍රමය නිම කිරීම සඳහා ඇස්තමේන්තු කරනු ලැබ ඇති ව්‍යාපෘති පිරිවැය රුපියල් මිලියන 214 ක් වන නමුත් මේ වන විට ප්‍රදානය කරනු ලැබ ඇති කොන්ත්‍රාත්තුවට අදාල පිරිවැය රුපියල් මිලියන 66 ක් වේ. ව්‍යාපෘතිය විසින් සාක්ෂාත් කර ගනු ලැබ ඇති භෞතික ප්‍රගතිය 44% ක් වන අතර මූල්‍ය ප්‍රගතිය 45% ක් විය.

v. පලාපොත ජල සම්පාදන යෝජනා ක්‍රමය

පොම්ප කිරීමේ ප්‍රධාන නල මාර්ගය වීලීම පලාපොත ජල සම්පාදන යෝජනා ක්‍රමය යටතේ අපේක්ෂා කරනු ලබන අතර වීම කර්තව්‍යය

මෘදු යකඩ නල හා සවි කිරීම් සපයා ගෙනැවිත් භාර දීම හා පලාපොත පොම්ප කිරීමේ ප්‍රධාන නල මාර්ගයට අදාලව මෘදු යකඩ නල, සවි කිරීම් හා උපාංග වැලීම යන අංගයන්ගෙන් සමන්විත වේ. මෘදු යකඩ නල සැපැයුම් කිරීම දැනටමත් සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇති අතර නල වැලීමේ කටයුතු දැනට සිදු කරනු ලබමින් පවතී. කොන්ත්‍රාත්තුව විසින් සාක්ෂාත් කරගනු ලැබ ඇති භෞතික ප්‍රගතිය 8% ක් වන අතර මූල්‍ය ප්‍රගතිය 20% ක් වේ.

6. ඌව පලාත

2017 වර්ෂය තුළ ක්‍රියාත්මක කරනු ලබමින් තිබී කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපෘතීන් කිසිවක් ඌව පලාත තුළ නොවීය.

7. බස්නාහිර පලාත

බටහිර උතුරු, බටහිර මධ්‍යම හා බටහිර දකුණු

2017 වර්ෂය තුළ ක්‍රියාත්මක කරනු ලබමින් තිබී කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපෘතීන් කිසිවක් බටහිර උතුරු, බටහිර මධ්‍යම හා බටහිර දකුණු යන පලාත් තුළ නොවීය.

8. නැගෙනහිර පලාත

කන්තලේ (අග්බෝ පුර) ජල සම්පාදන ව්‍යාපෘතිය 2015 වර්ෂයේදී ආරම්භ කොට එම වර්ෂය තුළදීම සම්පූර්ණයෙන් නිම කරන ලදි. කෙසේ වුවද මඩගම, තලසස්වැව හා පේරමඩුව යන ගම්මානයන් වෙත අතිරේක නල මාර්ග දීර්ඝ කිරීමේ වැඩ කටයුතු රුපියල් මිලියන 29.0 ක පිරිවැයක් දරමින් 2016 වර්ෂය තුළ ආරම්භ කරන ලද එම වැඩ කටයුතු 2017 වර්ෂය තුළදී සම්පූර්ණයෙන් නිම කරන ලදි. වාන් ඇල ජල සම්පාදන යෝජනා ක්‍රමයේ නල වැලීමේ කටයුතු සම්පූර්ණයෙන්ම නිම කරනු ලැබ ඇති අතර සෘජු පොම්ප කිරීම මගින් ජල සම්පාදනය කිරීමේ ක්‍රියාවලිය ද ආරම්භ කරනු ලැබ ඇත. මඩකලපුව ප්‍රදේශයේ ඉරුදයපුරම්, චෙන්කලඩි හා වීරාවුර් යන ප්‍රදේශයන් වෙත කිලෝ මීටර 7.0 ක නල මාර්ග දීර්ඝ කිරීමේ වැඩ කටයුතු රුපියල් මිලියන 12.0 ක පිරිවැයක් දරමින් සම්පූර්ණයෙන්ම නිම කරන ලදි.

9. වයඹ පලාත

2017 වර්ෂය තුළ ක්‍රියාත්මක කරනු ලබමින් තිබී කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපෘතීන් කිසිවක් වයඹ පලාත තුළ නොවීය.

ක්‍රියාත්මක කිරීම සඳහා පෙල ගස්වනු ලැබ ඇති ව්‍යාපෘතීන්

(ජල සම්පාදන ව්‍යාපෘතීන්)

1. කිරම කටුවන ජල සම්පාදන ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතියේ අරමුණ වන්නේ කිරම හා කටුවන ප්‍රදේශයන්හි ජීවත් වන ජනතාව වෙත දැනට සම්පාදනය කරනු ලබන සුරක්ෂිත හා විශ්වාසනීය පානීය ජල සම්පාදනය වැඩි දියුණු කිරීම වේ. දැනට කටුවන ප්‍රදේශය තුළ පිහිටි නෑඹිලිදොල, බීරදෙනිය දොල හා ඇතාවලකන්ද දොල යන ජල පහර පදනම් කර ගනිමින් ක්‍රියාත්මක කරනු ලබන ගුරුත්ව නල ජල සම්පාදන ක්‍රමයක් මෙම ප්‍රදේශය තුළ ක්‍රියාත්මක වේ. දැනට ක්‍රියාත්මක වන කටුවන ජල සම්පාදන යෝජනා ක්‍රමය යටතේ ගෘහස්ත සේවා සම්බන්ධතාවයන් 976 ක් හා වාණිජ සේවා සම්බන්ධතාවයන් 58 ක් ද ක්‍රියාත්මක වේ. එසේම කිරම ප්‍රදේශය තුළ පිහිටා ඇති රම්මලේකන්ද ඔය නමින් යුත් ජල පහර පදනම් කර ගනිමින් දැනට ක්‍රියාත්මක වන ගුරුත්ව නල ජල සම්පාදන යෝජනා ක්‍රමය යටතේ ද ගෘහස්ත සේවා සම්බන්ධතාවයන් 497 ක සංඛ්‍යාවක් හා වාණිජ සේවා සම්බන්ධතාවයන් 31 ක සංඛ්‍යාවක් ක්‍රියාත්මක වේ. වාරි මාර්ග දෙපාර්තමේන්තුව විසින් ඉදි කරනු ලැබ ඇති කැකිරිඕඩඩ ජලාශය යෝජිත ජල සම්පාදන යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා අතිරේක ජල ප්‍රභවයක් වශයෙන් භාවිතා කළ හැකි වනු ඇත. කිරම හා කටුවන ප්‍රදේශයේ සාමාන්‍ය පානීය ජල අවශ්‍යතාවය ආසන්න වශයෙන් දිනකට ජලය ඝණ මීටර 3,500 ක් පමණ වන අතර එයින් දිනකට ජලය ඝණ මීටර 2,500 ක් සපයා දීමට වාරි මාර්ග දෙපාර්තමේන්තුව එකඟ වී ඇති අතර, ඉතිරි අවශ්‍යතාවය වූ දිනකට ජලය ඝණ මීටර 1000 ක පරිමාව දැනට භාවිතා කරනු ලබන ප්‍රභවයන්ගෙන් උකහා ගත හැකි වනු ඇත.

මෙම යෝජනාව යටතේ හම්බන්තොට දිස්ත්‍රික්කයට අයත් කටුවන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි ග්‍රාම නිලධාරී වසම් 34 ක් ආවරණය කරනු ලැබීමට යෝජිත වේ.

2. හසලක ජල සම්පාදන ව්‍යාපෘතිය

මෙම යෝජනා ක්‍රමය යටතේ ඇති ව්‍යාපෘති ප්‍රදේශය පිහිටා ඇත්තේ මධ්‍යම පලාතේ මහනුවර දිස්ත්‍රික්කයේ නැගෙනහිර මායිම තුළ මිනිපේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුල වේ. මිනිපේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය ග්‍රාම නිලධාරී වසම් 48 කින් සමන්විත වන අතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය යටතේ ඇති මුළු භූමියේ වර්ග ප්‍රමාණය වර්ග කිලෝ මීටර 165 ක් වේ. කෙසේ වුව ද, ප්‍රදේශය තුළ පවත්නා සංකීර්ණ භූගෝලීය භූමි ලක්ෂණ හේතුකොට ගෙන යෝජිත හසලක ජල සම්පාදන යෝජනා ක්‍රමය මගින් ආවරණය කළ හැකි වන්නේ ග්‍රාම නිලධාරී වසම් 48 අතුරින් ග්‍රාම නිලධාරී වසම් 33 ක් පමණකි. මෙම ආවරණ ප්‍රදේශයට මිනිපේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ පිහිටි මොරයාය, හඳගනාව, බුලත්වැල්කඳුර, වේරගන්තොට, දියබුබුල, හසලක, රත්න ඇල්ල හා දඹේපිටිය යන ග්‍රාම නිලධාරී වසම් අයත් වන අතර අදාල ග්‍රාම නිලධාරී වසමේ පිහිටීම හා මුහුදු මට්ටමේ සිට ඇති උස අනුව සම්පූර්ණයෙන් හෝ කොටසක් වශයෙන් ආවරණය කිරීම සිදු කරනු ලබනවා ඇත. දැනට හසලක පලාත් පාලන අධිකාරිය විසින් මිනිපේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ පිහිටි ගුරුළුපොත, ඔරුවලයාය, බෝගහයාය, මහඇස්වැද්දුම, දොඹගහවෙල හා ලුනුමඩලකැටිය යන ප්‍රදේශයන් තුළ ජල සම්පාදන යෝජනා ක්‍රම කිහිපයක් ක්‍රියාත්මක කිරීමෙහි යෙදී සිටින අතර ඒ අතුරින් ප්‍රධාන ජල සම්පාදන යෝජනා ක්‍රමය වන්නේ හසලක නගරය හා තදාසන්න අර්ධ නාගරික ප්‍රදේශයන් වෙත ජල සම්පාදන සේවා සපයනු ලබන ගුරුළුපොත ජල සම්පාදන යෝජනා ක්‍රමය වේ. දැනට ක්‍රියාත්මක වෙමින් පවත්නා ජලය බෙදා හැරීමේ පද්ධතිය තුළ ආසන්න වශයෙන් සේවා සම්බන්ධතාවයන් 950 ක් පමණ ක්‍රියාත්මක වෙමින් පවතී.

3. ගිරිදර ජල සම්පාදන යෝජනා ක්‍රමය

මෙම ව්‍යාපෘතියේ අරමුණ වන්නේ ගිරිදර හා ඒ අවට පිහිටා ඇති ජල හිඟ තත්ත්වයන්ට මුහුණ පාමින් තිබෙන ප්‍රදේශයන් වෙත පානීය ජලය සම්පාදනය කර දීමේ සුදුසු ක්‍රමයක් සොයා ගැනීම වේ. යෝජිත ගිරිදර ප්‍රදේශය පිහිටා තිබෙන්නේ කැළණි ගඟේ දකුණු ඉවුර ආසන්නයේය. යෝජිත ව්‍යාපෘතිය මගින් ගම්පහ දිස්ත්‍රික්කය තුළ පිහිටි දොම්පේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ දැනට සේවා සපයනු නොලබන ග්‍රාම නිළධාරී වසම් 16 ක් වෙත පානීය ජලය සම්පාදනය කර දීමට අපේක්ෂා කරනු ලැබේ. ව්‍යාපෘති ප්‍රදේශය තුළ දැනට පවත්නා ජල ප්‍රභවයන් වන්නේ සාරන ලද ළිං, නල ළිං හා ගංගාවන්ය. වියලි කාලගුණය පවතින කාලයන් තුළදී බොහෝ ප්‍රදේශ වල ඇති සාරන ලද ළිං වියලී යන අතර ඒ හේතුකොට ගෙන ඒ ප්‍රදේශ තුළ ජීවත් වන මිනිසුන්ට තමන්ගේ එදිනෙදා අවශ්‍යතාවයන් සඳහා ජලය සපයා ගැනීමට යාමේදී උග්‍ර ගැටළුකාරී තත්ත්වයන්ට මුහුණ දීමට සිදු වේ.

මේ ප්‍රදේශය තුළ පිහිටා ඇති ප්‍රධාන ජල ප්‍රභවය වන්නේ කැළණි ගඟ වන අතර ඒ හැරෙන්නට ජලය ලබා ගත හැකි අනිත් ප්‍රභවය වන්නේ භූගත ජලයයි. කෙසේ වුවද, පානීය ජලය සඳහා ඇති ඉහල ඉල්ලුම හා භූගත ජලයේ ජල ගුණාත්මය සම්බන්ධයෙන් පවතින ගැටළු හේතුවෙන් භූගත ජලය විශ්වාසනීය ජල ප්‍රභවයක් වශයෙන් භාවිතා කිරීමේ හැකියාවක් නැත. ප්‍රදේශය තුළ ඇති ඇතැම් ළිං

නියං සමයේදී වියලි යන අතර ඒ නිසා දොම්පේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ පිහිටා ඇති එකම විශ්වාසනීය ජල ප්‍රභවය වශයෙන් කැළණි ගඟ හඳුනා ගනු ලැබ ඇත.

4. වාලච්චේනෙයි ජල සම්පාදන ව්‍යාපෘතිය

වාලච්චේනෙයි ජල සම්පාදන ව්‍යාපෘතිය 2004 වර්ෂය තුළදී ශ්‍රී ලංකාවට බලපාන ලද සුනාමි ව්‍යසනය හේතුකොට ගෙන ප්‍රදේශයේ ජනතාවට මුහුණ පාන්නට සිදු වූ බරපතල හානි පිළිසකර කිරීමෙහි ලා ඉදි කිරීම් කටයුතු කරමින් එකී ජනතාවගේ ජීවන තත්ත්වය ඉහල නංවා ලීමේ කටයුත්තට දායක වෙයි. මෙම යෝජිත ප්‍රදේශය තුළ පොදු ජල සම්පාදන යෝජනා ක්‍රම කිසිවක් ක්‍රියාත්මක වන්නේ නැත. ළිං වල ජල නියැදි පරීක්ෂා කිරීමේදී පෙනී ගොස් ඇත්තේ අධික ජන ගහණයකින් යුත් ප්‍රදේශය තුළ ඇති ළිඳෙහි ජලය තුළ ඇති ක්ලෝරයිඩ් අන්තර්ගතය නිර්දේශිත ප්‍රමාණය වූ ලීටරයකට මිලි ග්‍රෑම් 250 ඉක්මවා යන බව හා පරීක්ෂණයට බඳුන් කරන ලද නොගැඹුරු ළිං වල ජලය තුළ ඊ කොලි (E-coli) බැක්ටීරියාව අන්තර්ගතව ඇති බවත්ය.

මෙම ව්‍යාපෘතිය යටතට වන යෝජිත ව්‍යාපෘති ප්‍රදේශය කෝරලෙයිපත්තු, කෝරලෙයිපත්තු බටහිර, කෝරලෙයිපත්තු මධ්‍යම, කෝරලෙයිපත්තු දකුණ, කෝරලෙයිපත්තු උතුර හා වීරාවුර් පත්තු යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 06 න් සමන්විත වේ. යෝජිත ව්‍යාපෘතිය මුහුදු බඩ කොට්ඨාශයන් ඔස්සේ වාලච්චේනෙයි සිට වීරාවුර් දක්වා ආසියානු සංවර්ධන බැංකුවේ 4 වැනි ව්‍යාපෘතිය සමග ඒකාබද්ධ වනු ලබනවා ඇත. 2025 වර්ෂය වන විට ආසන්න වශයෙන් 148,581 ක පමණ ජන ගහණයක් මෙම ව්‍යාපෘතිය හරහා සෘජු ප්‍රතිලාභ ලබනු ඇතැයි අපේක්ෂා කරනු ලබන අතර එම ඉලක්කය සාක්ෂාත් කර ගැනීම සඳහා දිනකට පානීය ජලය ඝණ මීටර 27,000 ක නිෂ්පාදනයක් අවශ්‍ය වනු ඇත. රූගම් වාරිමාර්ග ජලාශය වෙතින් අමු ජලය උකහා ගැනීමට අපේක්ෂා කරනු ලබන අතර තුළු මුව ආසන්නයේ පිහිටි ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයක් මගින් ජලය ප්‍රතිකාරිත කරනු ලබනවා ඇත. වාලච්චේනෙයි, කල්කුඩා, කිරන් සිත්තන්ඩි හා රූගම් යන ප්‍රධාන ප්‍රදේශයන් හතර වෙත ආසන්න වශයෙන් කිලෝ මීටර 423 ක පමණ දිගින් යුත් බෙදා හැරීමේ නල පද්ධතියක් හරහා ජලය බෙදා හරිනු ලබනවා ඇත.

5. පොලොන්නරුව නැගෙනහිර ජල සම්පාදන ව්‍යාපෘතිය.

පොලොන්නරුව දිස්ත්‍රික්කය තුළ පිහිටා ඇති ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 7 අතුරින් වැලිකන්ද, දිඹුලාගල, තමන්කඩුව, ලංකාපුර හා හිඟුරක්ගොඩ යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන් වෙත ලැබෙන්නේ ඉතාම අඩු මට්ටමක සුරක්ෂිත පානීය නල ජල සැපයුමක් වේ. වර්තමානයේදී සීමිත ප්‍රදේශයක් වෙත දැනට ක්‍රියාත්මක වෙමින් පවත්නා ජල සම්පාදන යෝජනා ක්‍රමයන් මගින් නල ජල සම්පාදනය කරනු ලබන අතර ජනයාගෙන් වැඩි පිරිසක් යැපෙන්නේ නල ළිං හෝ සාරන ලද ළිං වැනි ගැඹුරු හෝ නොගැඹුරු භූගත ජල ප්‍රභවයන් මත වේ. භූගත ජලය තුළ අන්තර්ගත ඉහල මට්ටමක ක්ලෝරයිඩ් හා ජලයේ කඨිනත්වය හේතුකොට ගෙන එම ජලයේ ගුණාත්මය අනුමත ප්‍රමිතීන්ට අනුකූල වන්නේ නැත.

ඉලක්ක ප්‍රදේශයේ පවත්නා ස්වභාවය සැලැකිල්ලට ගනිමින් එම ප්‍රදේශය කලාප දෙකකට වෙන් කොට ඒ ඒ කලාපය වෙනුවෙන් වෙන වෙනම ජල සම්පාදන යෝජනා ක්‍රම දෙකක් ස්ථාපිත කිරීමට තීරණය කරන ලදි. ඒ අනුව යෝජිත දිනකට ජලය ඝණ මීටර 15,000 ක ධාරිතාවයකින් යුත් මනම්පිටිය ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය විසින් මහවැලි ගඟේ දකුණු පැත්තේ පිහිටි වැලිකන්ද හා දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන් වෙත ජලය සපයනු ලැබීමට යෝජිත අතර යෝජිත දිනකට ජලය ඝණ මීටර 12,000 ක ධාරිතාවයකින් යුත් ගල්ලෑල්ල ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය විසින් මහවැලි ගඟේ වම් පැත්තේ පිහිටි තමන්කඩුව, ලංකාපුර හා හිඟුරක්ගොඩ යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන් වෙත ජලය සපයනු ලැබීමට යෝජිත වේ.

6. බණ්ඩාරවෙල, හපුතලේ හා දියතලාව ඒකාබද්ධ ජල සම්පාදන යෝජනා ක්‍රමය

මෙම ව්‍යාපෘතියේ අරමුණ වන්නේ බණ්ඩාරවෙල, හපුතලේ හා දියතලාව යන ප්‍රදේශයන් තුළ ජීවත් වන ජනතාව වෙත නල මාර්ගයෙන් ජලය සම්පාදනය කර දීම වේ. ව්‍යාපෘති ප්‍රදේශය තුළ බණ්ඩාරවෙල ජල සම්පාදන යෝජනා ක්‍රමය, දියතලාව ජල සම්පාදන යෝජනා ක්‍රමය හා හපුතලේ ජල සම්පාදන යෝජනා ක්‍රමය නමින් හඳුන්වනු ලබන ජල සම්පාදන යෝජනා ක්‍රම 3 ක් දැනටමත් ක්‍රියාත්මක කරනු ලබමින් පවතී. කෙසේ වුවද වියලි කාල ගුණය පවත්නා කාලයන් තුළදී අමු ජලය ලබා ගැනීමේ හැකියාව සීමා වීම නිසා සහ තෙත් කාලගුණික තත්ත්වයන් පවත්නා කාලයන් තුළදී මුහුණ දෙන සීමිත නිෂ්පාදන ධාරිතාවය නිසා පහල යන ජල නිෂ්පාදන පරිමාව ඉහල නැංවීමට අපේක්ෂා කරනු ලැබේ. මීට වැඩිමනත් වශයෙන් දැනට ජල සම්පාදනයක් නොකෙරෙන ප්‍රදේශයන් වෙත ද මෙම ව්‍යාපෘතිය වෙතින් නල ජල සම්පාදනය හිමි වීමේ ප්‍රතිලාභය ලබනු ඇත.

ග්‍රාම නිලධාරී වසම් 52 කින් සමන්විත බණ්ඩාරවෙල, දියතලාව හා හපුතලේ නගරයන් හා තදාසන්න අර්ධ නාගරික ප්‍රදේශයන් ද මෙම ව්‍යාපෘති ප්‍රදේශය තුළට ඇතුලත් වන අතර සැලැසුම් කෂිතිජ වර්ෂය වන විට මෙම ප්‍රදේශයන් තුළ ජීවත් වන ආසන්න වශයෙන් 141,000 ක පමණ ජන ගහණයක් වෙත මෙම ව්‍යාපෘතිය හරහා ප්‍රතිලාභ ලැබෙනු ඇත.

7. කුණ්ඩසාලේ හාරගම ජල සම්පාදන ව්‍යාපෘතිය

මෙම අධ්‍යයනය යටතේ වූ ව්‍යාපෘති ප්‍රදේශය පිහිටා ඇත්තේ මධ්‍යම පලාතේ නැගෙනහිර මායිමේ වන අතර ඊට මහනුවර දිස්ත්‍රික්කයේ කුණ්ඩසාලේ, මහනුවර කඩවත් සතර හා පාතහේවාහැට යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන් ඒකාබද්ධව අයත් වේ. මෙම අධ්‍යයනය යටතේ වූ ව්‍යාපෘති ප්‍රදේශය පිහිටා ඇත්තේ මහනුවර නගරයේ සිට ආසන්න වශයෙන් කිලෝ මීටර 15 ක පමණ දුරකින් මහනුවර - මහියංගනය මාර්ගය හා මහනුවර - බදුල්ල මාර්ගය ආශ්‍රිතව වේ. මෙම යෝජිත ප්‍රදේශය තුළ දැනටමත් කුණ්ඩසාලේ ජල සම්පාදන යෝජනා ක්‍රමය, හාරගම ජල සම්පාදන යෝජනා ක්‍රමය, අරත්තන ජල සම්පාදන යෝජනා ක්‍රමය, මාරස්සන ජල සම්පාදන යෝජනා ක්‍රමය හා මැද දුම්බර ජල සම්පාදන යෝජනා ක්‍රමය යනුවෙන් හඳුන්වනු ලබන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් පවත්වාගෙන යනු ලබන ජල සම්පාදන යෝජනා ක්‍රමයන් පහක් ක්‍රියාත්මක කරනු ලබමින් පවතී. කෙසේ වුව ද, පලාත තුළ පවත්නා ජලය සඳහා වූ ඉල්ලුම සපුරා ලීම සඳහා ප්‍රමාණවත් ධාරිතාවයක් මෙම ජල සම්පාදන යෝජනා ක්‍රමයන් සතුව නොමැති හෙයින් එම ජල සම්පාදන යෝජනා ක්‍රමයන් කඩිනමින් වැඩි දියුණු කිරීමේ අවශ්‍යතාවය පැන නැඟී තිබේ.

මෙම යෝජිත කුණ්ඩසාලේ - හාරගම ජල සම්පාදන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම මගින් ග්‍රාම නිලධාරී වසම් 136 ක වාසය කරනු ලබන ජනතාවක් වෙත සුරක්ෂිත පානීය නල ජලය සම්පාදනය කර දීමට හැකි වනු ඇත. සැලැසුම් කෂිතිජ වර්ෂය වන විට සේවය සේවය ලබා දීම සඳහා ප්‍රක්ෂේපිත මුළු ජන ගහණය 251,387 ක් වන අතර ප්‍රක්ෂේපනය කරනු ලැබ ඇති සේවා සම්බන්ධතාවයන් මුළු සංඛ්‍යාව 70,500 ක් වේ.

8. පාතදුම්බර, මහනුවර උතුර ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතිය විසින් අරමුණු කරනු ලබන්නේ මහනුවර දිස්ත්‍රික්කය තුළ පිහිටා ඇති පාතදුම්බර, පූජාපිටිය, අකුරන, හාරිස්පත්තුව හා ගඟවට කෝරලය (ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙන් කොටසක්) සහ ගලගෙදර යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 6 ආවරණය කරමින් මහනුවර නගරයේ උතුරු කොටස වෙත 24 පැය පානීය ජල සම්පාදන සේවාවක් සපයා දීම වන්නේය.

යෝජිත පාතදුම්බර, මහනුවර උතුර ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය ස්ථානගත කරනු ලැබ ඇත්තේ ශ්‍රී ලංකාවේ කඳු රටෙහි වයඹ කොටස සිසාරා පැතිර පවත්නා කඳු සහිත ප්‍රදේශයක් තුළ වේ.

විසල් මහනුවර ජල සම්පාදන ව්‍යාපෘතියේ 1 වැනි අදියර සඳහා හඳුනා ගනු ලැබූ ප්‍රභවය වූ කිලෝ මීටර 4.1 ක් උඩු ගං ප්‍රදේශයේ පිහිටා ඇති පොල්ගොල්ල මහ අමුණ යෝජිත පාතදුම්බර, මහනුවර උතුර ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතියේ ප්‍රභවය වශයෙන් ද තෝරාගනු ලැබ ඇත.

මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලැබීමෙන් පසුව මහනුවර නගරය තුළ, තදාසන්න අර්ධ නාගරික ප්‍රදේශයන් තුළ හා ඉහත සඳහන් කරනු ලැබ ඇති ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන් තුළ වාසය කරන්නා වූ 450,000 ක මුළු ජන සංඛ්‍යාවක් ඒ හරහා ප්‍රතිලාභ භුක්ති විඳිනු ලබනවා ඇත.

මෙහි පහත පෙන්වනු ලැබ ඇති ව්‍යාපෘතීන් ද ක්‍රියාත්මක කිරීම සඳහා පෙල ගස්වනු ලැබ ඇති ව්‍යාපෘතීහු වෙති:

1. අනුරාධපුර උතුර ජල සම්පාදන ව්‍යාපෘතිය (පියවර 11) ජපාන ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සියේ Kh SLP 115
2. විසල් අනුරාධපුර උතුරු හා ත්‍රිකුණාමලය ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය
3. බියගම, කොග්ගල, වතුපිටියල ආයෝජන මණ්ඩලීය කලාපයන් වෙත ජලය සම්පාදනය කිරීම සඳහා වූ ජල සම්පාදන ව්‍යාපෘතිය
4. මාකඳුර, පන්නල, කුලියාපිටිය
5. අඹතලේ ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය වැඩි දියුණු කිරීමේ ජල සම්පාදන ව්‍යාපෘතිය
6. කළු ගඟ ජල සම්පාදනය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය - අදියර 1
7. නානු ඔය ජල සම්පාදන ව්‍යාපෘතිය
8. කාතන්කුඩි අපජල ව්‍යාපෘතිය
9. අනුරාධපුර දකුණ ජල සම්පාදන ව්‍යාපෘතිය
10. ගල්ගමුව ජල සම්පාදන ව්‍යාපෘතිය
11. එප්පාවල රාජාංගනය ගිරිබාව ජල සම්පාදන ව්‍යාපෘතිය
12. දෙල්තොට ජල සම්පාදන ව්‍යාපෘතිය
13. අම්පාර බෙදා හැරීමේ ජාලයේ හිඩැස් පිරවීමේ ජල සම්පාදන ව්‍යාපෘතිය
14. දෙහිවල ගල්කිස්ස අපජල කළමනාකරණ ව්‍යාපෘතිය දීර්ඝ කිරීම
15. දන්කොටුව ජල සම්පාදන ව්‍යාපෘතිය
16. අඩ වශයෙන් ප්‍රතිකාරිත කිරීමේ ජල සම්පාදන ව්‍යාපෘතිය
17. හම්බන්තොට අපජල බැහැර කිරීමේ ව්‍යාපෘතිය

ක්‍රම සම්පාදනය හා සැලැසුම් කිරීම (ජල සම්පාදන ව්‍යාපෘති)

ක්‍රම සම්පාදනය හා සැලැසුම් කිරීම (ජල සම්පාදනය)

බටහිර කොට්ඨාශය

2017 වර්ෂය තුළදී සිදු කරන ලද ක්‍රම සම්පාදන කටයුතු

ක්‍රම සම්පාදන හා සැලැසුම් අංශයේ බටහිර අනු අංශය විසින් පහත සඳහන් ව්‍යාපෘතීන්ට අදාල ක්‍රම සම්පාදන කටයුතු සිදු කරන ලදි.

- ජුබිලි පද්ධතිය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් සාධ්‍යතා වාර්තාව පිළියෙල කිරීම.

  ජුබිලි ජලාශයන් ඉදි කරනු ලැබ ඇත්තේ කොළඹ මහ නගර සභා ප්‍රදේශයේ දකුණු කොටස වෙත හා කෝට්ටේ හා මහරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන්හි කොටසක් වෙත ජලය සම්පාදනය කර දීම පිණිස වේ.

  ඉහත සඳහන් කරනු ලැබ ඇති ප්‍රදේශයන් වෙත ජලය සම්පාදනය කිරීමෙහි ලා පැන නැගෙනු ඇතැයි අපේක්ෂා කරනු ලබන තීරණාත්මක අවශ්‍යතාවයන් සැලැකිල්ලට ගනිමින් මෙම ව්‍යාපෘතිය ආසියානු සංවර්ධන බැංකුව විසින් පිළියෙල කරනු ලැබ ඇති රට තුළ මෙහෙයුම් හා සම්බන්ධ (2018 - 2020 සඳහා වූ) ව්‍යාපාරික සැලැස්ම තුළ යෝජනා කරනු ලැබ ඇති ප්‍රමුඛතා නාගරික ජල සම්පාදන ව්‍යාපෘති ලැයිස්තුව තුළට අන්තර්ගත කරනු ලැබ ඇත.

  ජුබිලි ජලාශයන්හි ගබඩා කිරීමේ ධාරිතාවය නංවා ලීම, නව ප්‍රධාන සම්ප්‍රේෂණ නල මාර්ගය, DMA කළමනාකරණය සහිතව ජලය බෙදා හැරීමේ කටයුතු වැඩි දියුණු කිරීම, පොම්පාගාරය ඉදි කිරීම හා වෙනත් ආයතන සංවර්ධන ක්‍රියාකාරකම් මෙම ව්‍යාපෘතියට ඇතුලත් වේ.

  මෙම ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තු කරනු ලැබ ඇති මුළු පිරිවැය රුපියල් මිලියන 8,627 ක් වේ.

- අඹතලේ ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයේ ධාරිතාව දිනකට ජලය ඝණ මීටර 50,000 කින් පුළුල් කිරීම

  බස්නාහිර පලාතේ ප්‍රධාන සැලැසම් අධ්‍යයනය - 2013 ට අනුව මුළු මහත් කොළඹ මහනගර සභා ප්‍රදේශය වෙත හා තදාසන්න අර්ධ නාගරික ප්‍රදේශයන් වෙත ජලය සපයනු ලැබීමට අපේක්ෂා කරනු ලබන්නේ අඹතලේ ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය වෙතින් වන්නේය. මේ හේතුව නිසා බස්නාහිර පලාත් මහා නගර සැලැස්ම විසින් කොළඹ මහ නගර සභා ප්‍රදේශය වෙනුවෙන් යෝජනා කරනු ලැබ ඇති බහුවිධ ශිෂ්ඨණ සංවර්ධන කටයුතු වෙනුවෙන් අඛන්ඩ ලෙස වැඩි වෙමින් පවතින ජලය සඳහා වූ ඉල්ලුම සපුරා ලීම සඳහා අඹතලේ ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයේ ධාරිතාව වර්ධනය කිරීම අවශ්‍යයෙන්ම කළ යුතු කාර්යයක් වන්නේය.

  එම නිසා, තුළු මුවක්, පිරිසිදු කිරීමේ ඒකකයක් හා පෙරණ ඒකක 2 ක් ඉදි කිරීම හා අනිකුත් අදාල කර්තව්‍යයන් ඉටු කිරීම මගින් අඹතලේ ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයේ දැනට පවත්නා ධාරිතාව දිනකට ජලය ඝණ මීටර 50,000 කින් වර්ධනය කිරීමට සැලැසුම් කරනු ලැබ ඇත.

  මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ඇස්තමේන්තු කරනු ලැබ ඇති මුළු පිරිවැය රුපියල් මිලියන 5,460 ක් වේ.

- කළු ගඟ ජල සම්පාදන පුළුල් කිරීමේ ව්‍යාපෘතිය (1) යටතේ උපදේශක සේවාවන් ලබා ගැනීම සඳහා යෝජනා ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටීමේ ලිපි ලේඛන පිළියෙල කිරීම.

  දිනකට ජලය ඝණ මීටර 294,000 ක ධාරිතාවයකින් යුත් තුළු මුවකින් හා කඳානේ ඉදි කිරීමට යෝජිත දිනකට ජලය ඝණ මීටර 140,000 ක ධාරිතාවයකින් යුත් ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයකින් ද, මෘදු යකඩ ප්‍රධාන සම්ප්‍රේෂණ නල මාර්ගයකින් ද, ජලය බෙදා හැරීමේ ජාලයකින් හා කුළුණු හා භූමි ජලාශයන් ඉදි කිරීමේ වැඩ කටයුතු වලින් ද යෝජිත ව්‍යාපෘතිය සමන්විත වේ.

- ප්‍රධාන කාර්යාලය වැඩි දියුණු කිරීමේ වැඩ කටයුතු සැලැසුම් කිරීම

2017 වර්ෂය තුළදී ඉටු කරන ලද සවිස්තරාත්මක සැලැසුම් වැඩ කටයුතු

- ජුබිලි වැඩ බිම තුළ ජලය ඝණ මීටර 10,000 ක ධාරිතාවයකින් යුත් භූමි ජලාශය ඉදි කිරීමට අදාල සවිස්තරාත්මක සැලැසුම හා රූප සටහන් පිළියෙල කිරීම
- ජුබිලි වැඩ බිම තුළ ජලය ඝණ මීටර 6,000 ක ධාරිතාවයකින් යුත් භූමි ජලාශය ඉදි කිරීමට අදාල සවිස්තරාත්මක සැලැසුම හා රූප සටහන් පිළියෙල කිරීම
- ප්‍රධාන කාර්යාලයේ ගොඩනැගිලි නව්‍යකරණය කිරීම හා වැඩි දියුණු කිරීම

2017 වර්ෂය තුළදී ඉටු කරන ලද සැලැසුම් සමාලෝචනය කිරීමේ වැඩ කටයුතු

- ගම්පහ, අත්තනගල්ල හා මිනුවන්ගොඩ ඒකාබද්ධ ජල සම්පාදන යෝජනා ක්‍රමයට අදාල සැලැසුම් සමාලෝචනය කිරීම
- කැළණි දකුණු ඉවුර ජල සම්පාදන ව්‍යාපෘතිය - පියවර 11 ට අදාල සැලැසුම් සමාලෝචනය කිරීම
- කොළඹට නැගෙනහිරින් පිහිටි නගර ජල සම්පාදන ව්‍යාපෘතිය පැකේජ 1, 2 හා 3
- කටාන ජල සම්පාදන ව්‍යාපෘතියට අදාල සැලැසුම් සමාලෝචනය කිරීම
- අළුත්ගම, මතුගම හා අගලවත්ත ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතියට අදාල සැලැසුම් සමාලෝචනය කිරීම

(උතුරු/ උතුරු මැද) අංශය

2017 වර්ෂය තුළදී ඉටු කරන ලද ක්‍රම සම්පාදන කටයුතු

- මුලතිව් ජල සම්පාදන යෝජනා ක්‍රමය සඳහා ලංසු කැඳවීමේ ලිපි ලේඛන පිළියෙල කිරීම හා ටෙන්ඩර් කැඳවීම (ලෝක බැංකු අරමුදල් යටතේ)
- චිරුක්කලම්පිඩ්ඩි ජල සම්පාදන යෝජනා ක්‍රමය සැලැසුම් කිරීම
- මුලන්කාවිල් ජල සම්පාදන යෝජනා ක්‍රමය සඳහා ලංසු කැඳවීමේ ලිපි ලේඛන පිළියෙල කිරීම හා ටෙන්ඩර් කැඳවීම (ලෝක බැංකු අරමුදල් යටතේ)
- දැදුරු ඔය ජල සම්පාදන ව්‍යාපෘතිය සැලැසුම් කිරීම (ආර්ථික සංවර්ධන සහයෝගිතා අරමුදල හා කොරියානු නිර්යාත ආයාත බැංකු අරමුදල්), උපදේශක සේවා සඳහා යෝජනා කැඳවීම් පිළියෙල කිරීම, ඉදිකිරීම් කොන්ත්‍රාත්තු ප්‍රලේඛනය සැලැසුම් කිරීම, කැනේඩියානු නිර්යාත සංවර්ධන ආයතනයේ හා අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ස්ථාවර ප්‍රතිසම්පාදන කමිටුවේ අනුමැතීන් ලබා ගැනීම හා පෙර-සම්මන්ත්‍රණ, පෙර-ලංසු තැබීම් රැස්වීම් ආදිය පැවැත්වීම.

2017 වර්ෂය තුළදී ඉටු කරන ලද සැලැසුම් සමාලෝචනය කිරීමේ වැඩ කටයුතු

- ආනමඩුව ඒකාබද්ධ ජල සම්පාදන යෝජනා ක්‍රමයේ ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයට අදාල සවිස්තරාත්මක සැලැසුම් සමාලෝචනය කිරීම
- පොල්ගහවෙල ජල සම්පාදන යෝජනා ක්‍රමයට අදාල සවිස්තරාත්මක සැලැසුම් සමාලෝචනය කිරීම
- අනුරාධපුර උතුර ජයිකා ජල සම්පාදන යෝජනා ක්‍රමයේ 1 වැනි අදියරේ ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයට අදාල සම්ප්‍රේෂණ හා බෙදා හැරීම් ජාලයේ සැලැසුම් හා කාර්ය පත්‍රයන් සමාලෝචනය කිරීම

2017 වර්ෂය තුළදී ඉටු කරන ලද සවිස්තරාත්මක සැලැසුම් වැඩ කටයුතු

- (ලෝක බැංකු අරමුදල් යටතේ ක්‍රියාත්මක වන) මුලතිව් ජල සම්පාදන යෝජනා ක්‍රමය සඳහා රළු කැපීමේ පෙරණය, කුළුණ හා බිම් ටැංකිය, පොම්පාගාරය හා උපබද්ධ ගොඩනැගිලි වලට අදාල සැලැසුම් පිළියෙල කොට නිම කිරීම හා රූප සටහන් සහ ටෙන්ඩර ලිපි ලේඛන සම්පූර්ණයෙන් පිළියෙල කිරීම .
- (ලෝක බැංකු අරමුදල් යටතේ ක්‍රියාත්මක වන) මුලන්කාවිල් ජල සම්පාදන යෝජනා ක්‍රමය සඳහා වාතන උපකරණය, හුණු වකතු කිරීමේ ටැංකිය, රළු කැපීමේ පෙරණය, කුළුණ හා බිම් ටැංකිය, පොම්පාගාරය හා උපබද්ධ ගොඩනැගිලි වලට අදාල සැලැසුම් පිළියෙල කොට නිම කිරීම හා රූප සටහන් සම්පූර්ණයෙන් පිළියෙල කිරීම.
- (ලෝක බැංකු අරමුදල් යටතේ ක්‍රියාත්මක වන) මුලන්කාවිල් ජල සම්පාදන යෝජනා ක්‍රමය සඳහා ජලය බෙදා හැරීමේ ජාලය හා ජල කුළුණු ගොඩනැගිලි වලට අදාල සැලැසුම් පිළියෙල කොට නිම කිරීම.

දකුණු / නැගෙනහිර අංශය

2017 වර්ෂය තුළදී ඉටු කරන ලද ක්‍රම සම්පාදන වැඩ කටයුතු

- ඇහැලියගොඩ ජල සම්පාදන යෝජනා ක්‍රමය

  ඇහැලියගොඩ ජල සම්පාදන යෝජනා ක්‍රමයට අදාල ව්‍යාපෘතිය පිළියෙල කිරීමට අරමුදල් සපයනු ලබන්නේ ආසියානු සංවර්ධන බැංකුවේ අංක 3348 දරණ ණය මුදලේ PDF සහාය (විසල් කොළඹ ජල හා අපජල කළමනාකරණ වැඩි දියුණු කිරීම් ආයෝජන වැඩ සටහනේ 3 වැනි මුදල් කොටස) යටතේ වේ. ව්‍යාපෘතිය පිළියෙල කිරීමේ කර්තව්‍යය පවරනු ලැබ තිබෙන්නේ ක්‍රම සම්පාදන හා සැලැසුම් අංශය වෙතය. යටිතල පහසුකම් සඳහා ඉඩම් අත් පත් කර ගැනීම සම්බන්ධ සැලැසුම් ක්‍රම සම්පාදන හා සැලැසුම් අංශය විසින් සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇති අතර ඉඩම් අත් පත් කර ගැනීමේ කටයුතු දැනට ක්‍රියාත්මක කරනු ලබමින් පවතී. භූ විද්‍යාත්මක සමීක්ෂණ පැවැත්වීම හා භූ ලක්ෂණ මැණුම් වලට අදාල ටෙන්ඩර් ලිපි ලේඛන පිළියෙල කොට ටෙන්ඩර් කැඳවීමට අදාල වැඩ කටයුතු සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇති අතර ඉඩම් ස්ථාවර භාවය පිළිබඳ NBRO අනුමැතිය ලබාගෙන ඇත.

- හැඩ ඔය ජල සම්පාදන යෝජනා ක්‍රමය

  පෙර සාධ්‍යතා වාර්තාව සඳහා ව්‍යාපෘති සමාලෝචන කමිටුවේ අනුමැතිය ලබාගෙන ඇත.

- බදුල්ල හාලිඇල ජල සම්පාදන ව්‍යාපෘතිය

  දෙමෝදර පා පාලම හරස් පැන්නුමට අදාල සැලැසුම සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇත.

2017 වර්ෂය තුළ ඉටු කරන ලද සවිස්තරාත්මක සැලැසුම් වැඩ කටයුතු

- හල්දුමුල්ල ජල සම්පාදන යෝජනා ක්‍රමය

  හල්දුමුල්ල ජල සම්පාදන යෝජනා ක්‍රමයට අදාල සැලැසුම් පිළියෙල කිරීම සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇති අතර ටෙන්ඩර් කැඳවීම ද සිදු කරනු ලැබ ඇත.

- රුවන්වැල්ල ජල සම්පාදන ව්‍යාපෘතිය

උපදේශක සේවා

කැමැත්ත ප්‍රකාශ කිරීමේ ප්‍රකාශන කැඳවීම නැවත සිදු කර උපදේශක වරුන් කෙටි ලැයිස්තුගත කිරීම කරන ලදි. ඒ අතර යෝජනා කැඳවීමේ ලිපි නිකුත් කිරීම සඳහා බැංකුවේ එකඟත්වය අපේක්ෂාවෙන් සිටිනු ලැබේ.

සැලැසුම් කොට ඉදි කිරීම

මාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ප්‍රතිසම්පාදන ස්ථාවර කමිටුවේ ඉල්ලීම පරිදි ඉංජිනේරු වරුන්ගේ ඇස්තමේන්තු සංශෝධනය කිරීම (3 වැනි සංශෝධනය) සිදු කරන ලද අතර අගැයීමේ කටයුතු දැනට සිදු කරනු ලබමින් පවතී.

සැලැසුම් සමාලෝචනය කිරීමේ වැඩ කටයුතු

- මාතර වැනි පියවරට අදාල මූලික සැලැසුම් සමාලෝචනයට භාජනය කරන ලදි.
- **අම්පාර අදියර 111 ජල සම්පාදන යෝජනා ක්‍රමය** - අම්පාර අදියර 111 ජල සම්පාදන යෝජනා ක්‍රමයේ කුළුණු වැඩ බිම් 6 කට අදාල අංගන නල මාර්ග වලීම සඳහා වූ අංගන නල මාර්ග සැලැසුම් පිළියෙල කිරීම දැනට සිදු කරනු ලබමින් පවතී.

යාන්ත්‍රික හා විද්‍යුත් අංශය

ක්‍රම සම්පාදන හා සැලැසුම් අංශයේ යාන්ත්‍රික හා විද්‍යුත් අංශ අනු අංශය විසින් 2017 වර්ෂය තුළදී පහත දැක්වෙන සැලැසුම් කටයුතු සිදු කරනු ලැබ ඇත.

යෝජනා ක්‍රම හා ප්‍රලේඛන සැලැසුම් කිරීම

- ගොතටුව - මොරගස්මුල්ල පොම්පාගාරය
- දෘෂ්‍ය හා අභිවාහ්‍ය කලා විශ්ව විද්‍යාලයේ පිරිමි සිසුන් සඳහා දෙහිවල පිහිටුවනු ලැබ ඇති ශිෂ්‍ය නේවාසිකාගාරය තුළ මල අපවහන කට්ටල හා අදාල උපාංගයන් සපයා සවි කිරීම
- හැඩ ඔය යාන්ත්‍රික හා විද්‍යුත් වැඩ කටයුතු සඳහා යෝජනා ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටීමේ ලිපි හා ඉංජිනේරු ඇස්තමේන්තු පිළියෙල කිරීම
- යෝජිත වීගණන / මල අපවහන / තොරතුරු තාක්ෂණ කාර්යාලය සඳහා වායු සම්කරණ හා විදුලි වැඩ වෙනුවෙන් පිරිවිතර පිළියෙල කිරීම සහ ප්‍රමාණ පත්‍රය පිළියෙල කිරීම
- මොරටුව - රත්මලාන මල අපවහන ව්‍යාපෘතිය වෙනුවෙන් යෝජනා කැඳවීමේ ලිපි පිළියෙල කිරීම
- පොලොන්නරුවට නැගෙනහිරින් පිහිටි නගර සඳහා වූ ජල සම්පාදන ව්‍යාපෘතියට අදාල යාන්ත්‍රික හා විද්‍යුත් වැඩ කටයුතු සඳහා ඉංජිනේරු ඇස්තමේන්තුව පිළියෙල කිරීම
- උමා ඔය ජල සම්පාදන ව්‍යාපෘතියට අදාල යාන්ත්‍රික හා විද්‍යුත් වැඩ කටයුතු සඳහා සේවයාගේ අවශ්‍යතාවයන් හා ඉංජිනේරු ඇස්තමේන්තුව පිළියෙල කිරීම
- පිබිදෙමු පොලොන්නරුව යාන්ත්‍රික හා විද්‍යුත් වැඩ කටයුතු සැලැසුම් කිරීමේ වැඩ ඉටු කිරීම
- මුලතිව් ජල සම්පාදන පද්ධතිය
- රුවන්වැල්ල ඉංජිනේරු ඇස්තමේන්තුව
- D5 අත් පොත හා ඉදි කිරීම් පුහුණු කිරීමේ හා සංවර්ධනය කිරීමේ ප්‍රකාශනයන් යාවත්කාලීන කිරීම
- මුලන්කාවිල් ජල සම්පාදන ව්‍යාපෘතිය
- E අංශය හා විගණන අංශය වෙනුවෙන් කුඩා බල ශක්ති හා ආලෝක පද්ධතීන් සැලැසුම් කිරීම
- ජුබිලි පොම්පාගාරය වෙනුවෙන් සූර්ය බල ශක්ති යෝජනාව පිළියෙල කිරීම

සිදු කරන ලද සැලැසුම් සමාලෝචනය කිරීමේ වැඩ කටයුතු

පහත සඳහන් සැලැසුම් සමාලෝචනය කිරීමේ වැඩ කටයුතු 2017 වර්ෂය තුළදී ක්‍රියාත්මක කරන ලදි :

- ගම්පහ, අත්තනගල්ල හා මිනුවන්ගොඩ ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය
- අම්පාර දිස්ත්‍රික්කය තුළ සේවා නොලබන ප්‍රදේශයන් සඳහා වූ ජල සම්පාදන ව්‍යාපෘතිය අදියර 111
- දකුණු පැත්තේ ගොඩනැගිල්ලේ යාන්ත්‍රික හා විද්‍යුත් වැඩ කටයුතු අධීක්ෂණය කිරීමේ කාර්යයන්
- කැළණි දකුණු ඉවුර පියවර 11 ජල සම්පාදන ව්‍යාපෘතිය
- විසල් මාතලේ ජල සම්පාදන ව්‍යාපෘතිය
- ආනමඩුව ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය
- දැදුරු ඔය ජල සම්පාදන යෝජනා ක්‍රමය
- පොල්ගහවෙල අලව්ව ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය
- අළුත්ගම, මතුගම හා අගලවත්ත ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය
- කටාන ජල සම්පාදන ව්‍යාපෘතිය

ප්‍රලේඛන අංශය

ප්‍රලේඛන අංශය ප්‍රලේඛන අනු අංශය, සැලැසුම් අත් පොත් යාවත්කාලීන කිරීමේ අනු අංශය හා ප්‍රමාණ සමීක්ෂණ අනු අංශය යනුවෙන් හඳුන්වනු ලබන අනු අංශයන් තුනකින් සමන්විත වේ.

ප්‍රලේඛන අනු අංශය

ප්‍රලේඛන අනු අංශය විසින් සම්මත ලංසු තැබීමේ ලේඛනයන්, සම්මත පිරිවිතර විස්තර හා පෙර සුදුසුකම් විස්තර පිළියෙල කිරීම හා යාවත්කාලීන කිරීම ද, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ වෙබ් අඩවිය තුළට තොරතුරු ඇතුළු කරනු ලැබීම ද සිදු කරනු ලබයි.

2017 වර්ෂය තුළදී ප්‍රලේඛන අනු අංශය විසින් සම්පූර්ණයෙන් නිම කරන ලද වැඩ කටයුතු මෙහි පහත සංක්ෂිප්ත වශයෙන් දක්වනු ලැබ ඇත :

- සම්මත ලංසු තැබීමේ ලේඛන 05 ක් අළුතින් පිළියෙල කිරීම
- සම්මත ලංසු තැබීමේ ලේඛන 62 ක් සංශෝධනය කිරීම
- පිරිවිතර විස්තර 02 ක් අළුතින් පිළියෙල කිරීම
- පිරිවිතර විස්තර 08 ක් සංශෝධනය කිරීම
- එක් අළුත් පෙර සුදුසුකම් විස්තර ලේඛනයක් පිළියෙල කිරීම
- පෙර සුදුසුකම් තිබේදැයි පිරික්සීසා බැලීම සඳහා මෘදු යකඩ නල නිෂ්පාදකයින් 08 දෙනෙකු පරීක්ෂණයට භාජනය කිරීම.
- පෙර සුදුසුකම් තිබේදැයි පිරික්සීසා බැලීම සඳහා මෘදු යකඩ හා වාත්තු යකඩ වෑල්ව නිෂ්පාදකයින් 02 දෙනෙකු පරීක්ෂණයට භාජනය කිරීම.

ඉහත සඳහන් කර්තව්‍යයන්ට අමතරව ප්‍රලේඛන අනු අංශය ලංසු තැබීමේ ලේඛන සමාලෝචනය කිරීම සඳහා සහ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ප්‍රතිසම්පාදන ගැටළු විසඳීම සඳහා 2008 වර්ෂයේදී නැවත ස්ථාපනය කරන ලද සම්මත ලංසු ලිපි ලේඛන සමාලෝචන කමිටුවේ ලේකම් කාර්යාලය ලෙස ද ක්‍රියා කළේය. සම්මත ලංසු ලිපි ලේඛන සමාලෝචන කමිටුව වාර 22 ක් රැස් විය.

තවද ප්‍රලේඛන අනු අංශය ක්‍රම සම්පාදන හා සැලැසුම් අංශය විසින් පවත්වන ලද මාසික ප්‍රගති සමාලෝචන රැස්වීම් සඳහා ද ලේකම් කාර්යාලය වශයෙන් කටයුතු කරන ලදි.

2. සැලැසුම් අත් පොත් යාවත්කාලීන කිරීමේ අනු අංශය

ක්‍රම සම්පාදන හා සැලැසුම් අංශයේ සැලැසුම් අත් පොත් අංශය ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ කාර්ය පටිපාටි හා සැලැසුම් අත් පොත් පිළියෙල කිරීම හා යාවත්කාලීන කිරීම සිදු කරයි. 2017 වර්ෂය තුළදී ක්‍රම සම්පාදන හා සැලැසුම් අත් පොත් සමාලෝචන කමිටුවේ මග පෙන්වීම හා උපදෙස් යටතේ පහත සඳහන් කරනු ලැබ ඇති කර්තව්‍යයන් සිදු කරන ලදි :

- PI අත් පොතේ අවසාන කෙටුම් පත සම්පූර්ණයෙන් නිම කරන ලදුව එය ක්‍රම සම්පාදන හා සැලැසුම් අත් පොත් සමාලෝචන කමිටුවේ අදහස් දැක්වීම් සඳහා ඉදිරිපත් කරන ලදි.
- අත් පොත සම්බන්ධ ක්‍රම සම්පාදන හා සැලැසුම් අත් පොත් සමාලෝචන කමිටුවේ අදහස් දැක්වීම් ඇතුලත් කරමින් D3 අත් පොත සම්පූර්ණයෙන් නිම කරන ලදි. එය අවසන් අනුමැතිය සඳහා ක්‍රම සම්පාදන හා සැලැසුම් අත් පොත් සමාලෝචන කමිටුව වෙත ඉදිරිපත් කරනු ලබනවා ඇත. 2017 වර්ෂය තුළ පවත්වන ලද සමාලෝචන රැස්වීම් 26 ක මුළු සංඛ්‍යාව අතුරින් සැලැසුම් අත් පොත් සමාලෝචන රැස්වීම් පහක සංඛ්‍යාවක් මෙම කර්තව්‍යය නිම කිරීම සඳහා පවත්වන ලදි.
- කවාකාර ටැංකි (D 10) සඳහා වූ පෙර සවි ගැන්වූ කොන්ක්‍රීට් පිළිබඳ අත් පොතෙහි අවසන් කෙටුම් පත හා සවිස්තරාත්මක ව්‍යුහාත්මක ගණනය කිරීම් කොන්ත්‍රාත් කාර ABE Nikko, JPU අංශය හා ප්‍රධාන ඉංජිනේරු (සැලැසුම් අත් පොත්) යන පාර්ශවයන්ගේ සහභාගිත්වය සහිතව සම්පූර්ණයෙන් නිම කරන ලදි. එය අවසන් අනුමැතිය සඳහා ක්‍රම සම්පාදන හා සැලැසුම් අත් පොත් සමාලෝචන කමිටුව වෙත ඉදිරිපත් කරනු ලබනවා ඇත.
- ඉංජිනේරු (සැලැසුම් අත් පොත්) විසින් D 2 අත් පොත සමාලෝචනය කිරීම ආරම්භ කරන ලද අතර දැනට එම කර්තව්‍යය සිදු කරනු ලබමින් පවතී.

3. ප්‍රමාණ සමීක්ෂණ අනු අංශය

ප්‍රමාණ සමීක්ෂණ වැඩ කටයුතු තුළට ප්‍රධාන කාර්යාලයේ ක්‍රම සම්පාදන හා සැලැසුම් අංශය විසින් ක්‍රියාත්මක කරනු ලබන සියළුම සැලැසුම් වැඩ වලට අදාල ප්‍රමාණ පත්‍ර පිළියෙල කිරීම, ඉංජිනේරු ඇස්තමේන්තු පිළියෙල කිරීම, ජල හා මල අපවහන වැඩ සඳහා ගාස්තු ප්‍රමාණ පොත පිළියෙල කිරීම, විචල්‍යයන් අගැයීමට බඳුන් කිරීම, වැඩ අයිතමයන් මිළ කිරීම සඳහා කාර්ය ප්‍රතිමාණයන් පිළියෙල කිරීම සඳහා ජල හා මල අපවහන අධ්‍යයනයන් පැවැත්වීම හා ව්‍යාපෘති විසින් පිළියෙල කරනු ලබන ඉංජිනේරු ඇස්තමේන්තු සමාලෝචනය කිරීම ද ඇතුලත් වේ.

2017 වර්ෂය තුළදී අනු අංශය විසින් ප්‍රමාණ පත්‍ර 146 ක් පිළියෙල කිරීම ද, දේශීය අරමුදල් මත ක්‍රියාත්මක කරන ලද කොන්ත්‍රාත් වෙනුවෙන් ඉංජිනේරු ඇස්තමේන්තු 16 ක සංඛ්‍යාවක් පිළියෙල කිරීම ද, විදේශ අරමුදල් මත පදනම් වූ ජල සම්පාදන හා මල අපවහන ව්‍යාපෘතීන් සඳහා ඉංජිනේරු ඇස්තමේන්තු 2 ක සංඛ්‍යාවක් පිළියෙල කිරීම ද, අඩ වශයෙන් ප්‍රතිකාරිත කරන ලද ජල සම්පාදන යෝජනා ක්‍රමයන් වෙනුවෙන් සැලැසුම් කොට ගොඩ නැගීමේ සනීපාරක්ෂණ ව්‍යාපෘති හා පිරිවැය යෝජනාවන් 2 ක සංඛ්‍යාවක් පිළියෙල කිරීම ද, 2018 වර්ෂය සඳහා ජල සම්පාදන වාර්ෂික ගාස්තු ප්‍රමාණ පොත හා මල අපවහන ගාස්තු ප්‍රමාණ පොත පිළියෙල කිරීම ද සිදු කරනු ලැබ ඇත. ඇතැම් ව්‍යාපෘතීන් වෙනුවෙන් ප්‍රමාණ පත්‍ර හා ඉංජිනේරු ඇස්තමේන්තු පිළියෙල කිරීම සඳහා ඒ ඒ වැඩ බිම් වෙත පිවිසෙන ලදි. ඇතැම් ව්‍යාපෘතීන් සම්බන්ධයෙන් කොන්ත්‍රාත් කරුවන් සමග මිල ගණන් ප්‍රමන්ත්‍රණය කිරීමේ සාකච්ඡාවන්ට ද මෙම අංශය සහභාගි විය.

ක්‍රියාත්මක වන මල අපවහන යෝජනා ක්‍රම.

පලාත / සහාය සේවා මධ්‍යස්ථානය	යෝජනා ක්‍රම සංඛ්‍යාව
මධ්‍යම	01
නැගෙනහිර	00
උතුරු මැද	00
වයඹ	00
උතුරු	00
සබරගමුව	00
දකුණු	01
ඌව	01
බටහිර මධ්‍යම	07
බටහිර උතුර	03
බටහිර දකුණ	01
එකතුව	14

* කොළඹ මහ නගර සභාව විසින් ක්‍රියාත්මක කරනු ලබන මල අපවහන යෝජනා ක්‍රමය හා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරනු ලබන යෝජනා ක්‍රම 13 ක් ද මීට ඇතුලත්ව ඇත.



මලාපවහන ක්‍රියාකාරකම්

මල අපවහන ක්‍රියාකාරකම් පුළුල් වීමත් සමග ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් 2007 වර්ෂය තුළදී නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරයකුගේ මූලිකත්වයෙන් අපජල ක්‍රියාකාරකම් සඳහා වෙනම අංශයක් නිර්මාණය කරන ලදි. මෙම නව අංශය යටතට වැටෙන කාර්යාංශයන් වන්නේ විසල් කොළඹ මල අපවහන මෙහෙයුම් අංශය, ක්‍රම සම්පාදන හා සැලැසුම් අංශය හා මල අපවහන ව්‍යාපෘති අංශය වේ.

ව්‍යාපෘතීන් සංවිධානය කිරීම හා ක්‍රියාත්මක කිරීම, සනීපාරක්ෂණ විසඳුම් සපයා දීම හා කාර්යක්ෂම කාර්ය මණ්ඩලයක පූර්ණ සහාය සහිතව දැනුම හා අත් දැකීම් බෙදා හදා ගැනීම මගින් පරදු ධාරීන්ගේ තෘප්තියට හා ආභාෂයට හේතු වන පරිදි පහසුකම් මෙහෙයවීම හා නඩත්තු කිරීම සිදු කිරීම හරහා රටට අවශ්‍ය සනීපාරක්ෂණ පහසුකම් සම්පාදනය කර දීම සඳහා මල අපවහන අංශය විසින් උපරිම වශයෙන් ප්‍රයත්න දරනු ලබයි.

දැනට ක්‍රියාත්මක වන මල අපවහන පද්ධතීන් සතුව රත්මලාන, මොරටුව, ජා ඇල, වීකල, දෙහිවල, කොලොන්නාව, හික්කඩුව හා කතරගම යන ප්‍රදේශයන් තුළ හා හන්තාන, රද්දොලුව, මත්තෙගොඩ, මද්දුමගෙවත්ත හා ජයවඩනගම වැනි නිවාස යෝජනා ක්‍රම කිහිපයක් තුළ ද සම්බන්ධතාවයන් 16,000 ක් පවතී. මීට වැඩිමනත් වශයෙන් සීතාවක, බියගම හා කොග්ගල වැනි ප්‍රදේශයන්හි පිහිටි ආයෝජන මණ්ඩලයට අයත් මල අපවහන යෝජනා ක්‍රමයන් ගණනාවක් නඩත්තු කිරීමේ වග කීම ද ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත පවරා දෙනු ලැබ ඇති අතර ඊට හේතු වී ඇත්තේ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සේවාවන් කෙරෙහි ඇති විශ්වාසනියත්වය හා එහි කාර්ය මණ්ඩල සාමාජිකයින් සතුව ඇති සාකල්‍ය තාක්ෂණික දැනුම ද වන්නේය.

මෙහෙයුම් හා නඩත්තු ක්‍රියාකාරකම්

දෙහිවල - ගල්කිස්ස මහ නගර සභා ප්‍රදේශය තුළ ද, මොරටුව නගර සභා ප්‍රදේශය තුළ ද, ජා ඇල නගර සභා ප්‍රදේශය තුළ හා කොලොන්නාව නගර සභා ප්‍රදේශය තුළ සහ ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සතු ඇතැම් නිවාස යෝජනා ක්‍රමයන් තුළ හා මහ කොළඹ ප්‍රදේශය තුළ පිහිටි රාජ්‍ය ආයතන කිහිපයක් තුළ ද ඇති මල අපවහන පද්ධතීන් හා සම්බන්ධ මෙහෙයුම් හා නඩත්තු කටයුතු ක්‍රියාත්මක කිරීමේ වග කීම විසල් කොළඹ මල අපවහන අංශය වෙත පැවරී ඇත.

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් නඩත්තු කරනු ලබන මල අපවහන සේවා සම්බන්ධතාවයන් ආසන්න වශයෙන් 17,429 ක් පමණ තිබේ. ඒ අනුව, සොයිසාපුර, මත්තේගොඩ, ජයවඩනගම, රද්දොලුගම, මද්දුමගෙවත්ත හා මොදරවිල නිවාස යෝජනා ක්‍රමයන් හා ජනාධිපති ලේකම් කාර්යාලය, කථානායක වරයාගේ නිවාසය, පාර්ලිමේන්තුව (ජලය හා මල අපවහන), සෙත්සිරි පාය (ජලය හා මල අපවහන), ඉසුරු පාය (ජලය හා මල අපවහන) හා ජයවර්ධනපුර ආරෝග්‍ය ශාලාව වැනි රාජ්‍ය ආයතනයන් තුළ ක්‍රියාත්මක වන මල අපවහන පද්ධතීන් නඩත්තු කරනු ලබන්නේ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් වේ.

මීට අමතරව, කතරගම, හික්කඩුව හා හන්තාන නිවාස යෝජනා ක්‍රමය තුළ ඇති මල අපවහන පද්ධතීන් ද නඩත්තු කරනු ලබන්නේ ඒ ඒ කලාපීය සහාය සේවා මධ්‍යස්ථානයන්ට අනුබද්ධ අදාල ප්‍රාදේශීය කළමනාකාර වරුන් විසිනි. තවද, ආයෝජන මණ්ඩලය සතු කොග්ගල, බියගම සහ සීතාවක කර්මාන්ත උද්‍යානයන් තුළ මල අපවහන පද්ධතීන්ගේ නඩත්තු කටයුතු කොන්ත්‍රාත් පදනම මත ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරනු ලැබේ.

විසල් කොළඹ මල අපවහන අංශය විසින් මහරගම ජාතික තරුණ සේවා සභාවේ ප්‍රති ආරෝපණය කළ හැකි අරමුදල් යටතේ මහරගම ජාතික තරුණ සේවා සභා පරිශ්‍රය තුළ දැනට ක්‍රියාත්මක වෙමින් පවතින අපජල ප්‍රතිකාරක පද්ධතිය පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරනු ලැබ ඇත. මෙම ව්‍යාපෘතිය සඳහා වැය වූ පිරිවැය රුපියල් මිලියන 48.3 ක් වූ අතර ප්‍රතිකාරක යන්ත්‍රාගාරයේ ධාරිතාව දිනකට ඝණ මීටර 45 ක් වන්නේය.

නීති විරෝධී සේවා සම්බන්ධතාවයන් නීත්‍යානුකූල කිරීමේ වැඩ සටහන යටතේ ප්‍රස්තුත වර්ෂය තුළදී නීති විරෝධී සේවා සම්බන්ධතාවයන් 141 ක සංඛ්‍යාවක් නීත්‍යානුකූල කරනු ලැබ ඇත. මල අපවහන මාර්ග දීර්ඝ කිරීමේ වැඩ සටහන යටතේ මීටර 389 ක දිගින් යුත් පොලි විනිල් ක්ලෝරයිඩ් (PVC) නල වලනු ලැබ ඇත. බල ශක්ති සංරක්ෂණය කිරීමේ වැඩ සටහන යටතේ රුපියල් මිලියන 10.3 ක මුදලක් වැය කරමින් ඇතුල්කෝට්ටේ පොම්පාගාරය තුළ නව පොම්ප ස්ථාපිත කරනු ලැබ ඇත. පුනරුත්ථාපන අය වැය ලේඛනය යටතේ සම්පූර්ණයෙන් නිම කරන ලද ව්‍යාපෘතීන් වෙනුවෙන් වැය කරන ලද මුළු පිරිවැය රුපියල් මිලියන 40 ක් වේ.

ක්‍රියාත්මක කරනු ලබමින් පවතින මල අපවහන ව්‍යාපෘතීන්.

නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ප්‍රධාන මලාපවහන ව්‍යාපෘතීන් විසින් අත් කර ගනු ලැබ ඇති සාර්ථකත්වයන්.
2017 වර්ෂය තුළදී විදේශීය අරමුදලින් ඉදි කෙරෙමින් පැවැති / වැඩි වර්ධනය කෙරෙමින් පැවැති ස්ථානයන් දැක්වෙන සිතියම.



	ව්‍යාපෘතියේ නම	අරමුදල් සපයන ඒජන්සිය
1	විසල් කොළඹ අපජල කළමනාකරණ ව්‍යාපෘතිය	ආසියානු සංවර්ධන බැංකුව
2	රත්මලාන/මොරටුව හා ජා ඇල/ඒකල ප්‍රදේශයන් සඳහා අපජල බැහැර කිරීමේ පද්ධතීන් ව්‍යාපෘතිය	ස්විඩන් ජාත්‍යන්තර සංවර්ධන ඒජන්සිය
3	මහනුවර මහ නගර සහ අපජල කළමනාකරණ ව්‍යාපාරය	ජපාන ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සිය
4	විසල් කොළඹ ප්‍රදේශයේ මලාපවහන සම්බන්ධතාවයන් වැඩි කිරීම සඳහා වූ IGPOBA ව්‍යාපෘතිය	ලෝක බැංකුව
5	විසල් කුරුණෑගල ජල සම්පාදන හා සනීපාරක්ෂණ සේවා ව්‍යාපෘතිය	චීනය
6	නගර සඳහා වූ සනීපාරක්ෂණ හා ස්වස්ථතා ආරම්භක ක්‍රියා ව්‍යාපෘතිය	ප්‍රංශ සංවර්ධන ඒජන්සිය
7	කතරගම අපජල බැහැර කිරීමේ ව්‍යාපෘතිය	ඔස්ට්‍රියාව

විදේශීය අරමුදල් යටතේ වූ මලාපවහන ව්‍යාපෘතීන්.

ආසියානු සංවර්ධන බැංකුවේ සහාය ඇතිව ආරම්භ කරන ලද ව්‍යාපෘතීන්.

1) විසල් කොළඹ අපජල කළමනාකරණ ව්‍යාපෘතිය.

මෙම ව්‍යාපෘතියේ විෂය පථය සංක්ෂිප්ත ලෙස දක්වතොත් එය දෙහිවල - ගල්කිස්ස මහ නගර සභා බල ප්‍රදේශය තුළ හා කොලොන්නාව නගර සභා ප්‍රදේශය තුළ ක්‍රියාත්මක වන අපජල පොම්පාගාරයන් 6 ක් පුනරුත්ථාපනය කිරීම හා වර්ධනය කිරීම වශයෙන් දැක්විය හැකි වේ. මෙම ව්‍යාපෘතිය සැලැසුම් කරනු ලැබ ඇත්තේ දෙහිවල ගල්කිස්ස හා කොලොන්නාව - මීතොටමුල්ල යන ප්‍රදේශයන් තුළ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ කළමනාකරණය යටතේ ක්‍රියාත්මක කරමින් පවතින සාමූහික අපජල හා මල අපවහන පද්ධතීන් වැඩි දියුණු කිරීමේ අපේක්ෂාවෙනි. ව්‍යාපෘතිය සඳහා අරමුදල් සම්පාදනය කරනු ලබන්නේ 2009 දෙසැම්බර් මාසයේදී අත්සන් කරන ලද අංක 2557 – SRI (SF) ණය මුදල යටතේ ආසියානු සංවර්ධන බැංකුව විසින් වේ.

ව්‍යාපෘතියේ විෂය පථය සකස් කරනු ලැබ ඇත්තේ සියළුම ඉදි කිරීම් ක්‍රියාකාරකම් තනි කොන්ත්‍රාත්තුවක් මෙන් ක්‍රියාත්මක කරනු ලැබීමට වන අතර එම කොන්ත්‍රාත්තුව ජාත්‍යන්තර මට්ටමින් තරඟකාරී ලෙස ලංසු තැබීමේ ක්‍රියාවලියක් අනුගමනය කරමින් ඇමෙරිකානු ඩොලර් මිලියන 7.795 ක් සඳහා ප්‍රදානය කරන ලදි. ව්‍යාපෘතිය වෙනුවෙන් වූ මුළු ආසියානු සංවර්ධන බැංකු වෙන් කිරීම (2016 වර්ෂය තුළදී ලැබුණ ප්‍රති වෙන් කිරීමත් සමග) ඇමෙරිකානු ඩොලර් මිලියන 9.43 ක් වූ අතර ශ්‍රී ලංකා රජයේ දායකත්වය රුපියල් මිලියන 364 ක් විය. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ඇස්තමේන්තු කරනු ලැබ ඇති මුළු පිරිවැය (2016 වර්ෂයේ දෙසැම්බර් 30 වැනි දිනට වලංගු වූ ශ්‍රී ලංකා මහ බැංකුවේ විනිමය අනුපාතය, (එනම් ඇමෙරිකානු ඩොලර් 1 = ශ්‍රී ලංකා රුපියල් 151.66 ට අනුව) රුපියල් මිලියන 1430 ක් වේ.

KP - 2 පොම්පාගාරය

ව්‍යාපෘතිය ආරම්භ කරන දිනය වශයෙන් සඳහන් කරනු ලැබ තිබුනේ 2014 සැප්තැම්බර් මස 16 වැනි දිනය වන අතර ව්‍යාපෘතිය සම්පූර්ණයෙන් නිම කළ යුතු දිනය වශයෙන් මුලින් නියම කරනු ලැබ තිබුනේ 2016 අගෝස්තු මස 16 වැනි දිනයයි. එහෙත් පසුව ඉදි කිරීම් කටයුතු සම්පූර්ණයෙන් නිම කිරීම සඳහා 2017 මාර්තු 31 වැනි දිනය දක්වා කාලය දීර්ඝ කර දෙන ලදි. ව්‍යාපෘතියේ විෂය පථය සැලැසුම් කරනු ලැබ ඇත්තේ සෑම පොම්පාගාරයකම සජීවී පද්ධතීන් බාධාවකින් තොරව ක්‍රියාත්මක කරනු ලබමින් පවතින අතර සියළුම ඉදි කිරීම් ක්‍රියාකාරකම් සජීවී ලෙස ක්‍රියාත්මක කළ හැකි වන පරිද්දෙන් වන්නේය.

පොම්පාගාරයන් 6 ම මෙහෙයුම් හා නඩත්තු අංශය වෙත භාර දෙනු ලැබ ඇති අතර ඒවා දැනට සේවයෙහි යොදවනු ලැබ ඇත. ප්‍රධාන පොම්ප 15 ක මුළු සංඛ්‍යාවම දැනට ස්ථාපිත කරනු ලැබ ඇති අතර ඒවා පොම්පාගාරයන් 6 තුළ ක්‍රියාත්මක කරනු ලබමින් පවතී. සියළුම පොම්පාගාර 6 ම සඳහා වූෂණ නල ප්‍රමාණය ඉහල නැංවීම හා නව්‍යකරණයන් හා සකස් කිරීම් කරනු ලැබ ඇත. පොම්පාගාර තුල පිටාර ගලා යාමේ අවදානම කාර්යක්ෂම ලෙස පොම්ප කිරීම මගින් කළමනාකරණය කරනු ලැබ ඇති අතර සවි කරනු ලැබ ඇති සජීවී පද්ධතියට සිදු විය හැකි බාධාවන් අවම කරනු ලැබ ඇත. විදුලි පුවරු හා අධීක්ෂණාත්මක පාලනය හා දත්ත අත් පත් කර ගැනීම (SCADA) සඳහා අවශ්‍ය උපකරණ සැපැයීම මෙහෙයුම් තත්ත්වයේ පවතී.

පොම්පාගාරයන් තුළ MLP 1 සඳහා පිටාර ගැලීම හා හඳුනා ගනු ලැබ ඇති දෝෂයන් නිදොස් කිරීම හැර මුල් විෂය පථය තුළ වූ අනිකුත් සියළුම ව්‍යාපෘති ක්‍රියාකාරකම් සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇත. 2017 දෙසැම්බර් මාසය වන විට ඇතැම් කොන්ත්‍රාත් විචලනයන්ට වැඩිමනත් වශයෙන් ව්‍යාපෘතියේ මුල් විෂය පථයට අදාලව 99% ක භෞතික ප්‍රගතියක් සාක්ෂාත් කරගනු ලැබ ඇති අතර, සාක්ෂාත් කර ගනු ලැබ ඇති මූල්‍ය ප්‍රගතිය 82% ක මට්ටමේ පවතී.

MLP – 1 පොම්පාගාරය වෙනුවෙන් වූ හදිසි පිටාර ගැලීම් නලය වෙරළ කොටස නිදහස් කිරීම සඳහා රළ ගසන සීමාව ඉක්මවා යන තරම් දුරක් දක්වා මුහුදට දීර්ඝ කිරීම අවශ්‍ය වේ. එහෙත් අවාසනාවකට මෙන් අරමුදල් හිඟ වීම නිසා මේ අවස්ථාවේදී අත් හැර දමන්නට සිදු වී ඇත.

පාරිසරික උපද්‍රව තත්ත්වය අවම කිරීම සඳහා සංවිධානාත්මක ගලි හිස් කිරීමේ ක්‍රමයක් ක්‍රියාත්මක කරන ලෙස පොලිසිය (දෙහිවල පොලිස් ස්ථානය) විසින් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත දැනුම් දීමක් කරනු ලැබ ඇත. යාන්ත්‍රික නිවාරණ හා වැලි ගල් කැට ඉවත් කිරීම හා රැස් කිරීම සහිත ගලි හිස් කිරීමේ ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම සඳහා ව්‍යාපෘති කාර්යාලය විසින් පූර්ණ දේශීය සැලැසුමක් යෝජනා කරනු ලැබ ඇත. ආසියානු සංවර්ධන බැංකුවේ අරමුදල් සම්පාදනය සීමිත හෙයින් මේ සඳහා අවශ්‍ය අයිතමයන් ප්‍රතිසම්පාදනය කිරීමේ කටයුතු දේශීය කොන්ත්‍රාත් කරුවන් මගින් සිදු කර ගැනීමට යෝජිතය. ආසියානු සංවර්ධන බැංකු අරමුදල් සම්පාදනය භාවිතා කරමින් අරමුදල් තිබෙන ප්‍රමාණය මත පදනම් වෙමින් ප්‍රතිසම්පාදනය කර ගැනීමට අදහස් කරනු ලබන්නේ වැලි ගල් කැට ඉවත් කිරීමේ පොම්පය, වැලි ගල් කැට වර්ගීකරණය කිරීමේ ඒකකය හා යාන්ත්‍රික රේක්ක නිවාරණ උපකරණය යන උපකරණ තුන පමණක් වේ.

ස්වීඩන් සහයෝගිතාවය සහිතව ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘතීන්

2) මල අපවහන නල මාර්ග පද්ධති ආවරණය මොරටුව හා ඒකල යන ප්‍රදේශයන් දක්වා පුළුල් කිරීම

රත්මලාන/මොරටුව හා ජා ඇල/ඒකල ප්‍රදේශයන් සඳහා වූ අපජල බැහැර කිරීමේ පද්ධතීන් ස්වීඩන් ජාත්‍යන්තර සංවර්ධන ඒජන්සියේ අරමුදල් සම්පාදනය යටතේ ඉදි කරන ලද අතර ඉලක්ක ප්‍රදේශයෙන් 20% ක් ආවරණය වන රැස් කිරීමේ ජාලයක් සහිතව එය 2016 වර්ෂයේ ජුනි මාසයේදී සම්පූර්ණයෙන් නිම කරන ලදි.

මල අපවහන නල මාර්ග පද්ධති ආවරණය මොරටුව හා ඒකල යන ප්‍රදේශයන් දක්වා පුළුල් කිරීමේ ව්‍යාපෘතිය සැලැසුම් කරන ලද්දේ රත්මලාන / මොරටුව හා ජා ඇල / ඒකල යන ප්‍රදේශයන් දෙක තුළ ජීවත් වන ජනතාවයට අදාලව දැනට පවත්නා ආවරණය 65% ක් දක්වා වැඩි කිරීමට රත්මලාන මොරටුව හා ජා ඇල / ඒකල ප්‍රදේශයන්හි දැනට ක්‍රියාත්මක වන අපජල බැහැර කිරීමේ පද්ධතීන් පුළුල් කිරීම සඳහා වේ. අදාල අරමුදල් හා අනිකුත් සම්පත් ලබා ගැනීමේ හැකියාව තිබෙන හෙයින් මෙම පුළුල් කිරීමේ කටයුතු අදියර දෙකක් යටතේ, එනම් පියවර 1 අදියර 11 හා පියවර 1 අදියර 111 යටතේ ක්‍රියාත්මක කරනු ලැබීමට තීරණය කරනු ලැබ ඇත.

රත්මලාන / මොරටුව ප්‍රදේශයේ පියවර 1 අදියර 11 සඳහා නව පොම්පාගාර 07 ක සංඛ්‍යාවක් ඉදි කිරීම ද, රැස් කිරීමේ නල ජාලය සඳහා කිලෝ මීටර 110 ක දිගින් යුත් නල මාර්ග එලීම ද, ආංශික සම්බන්ධතාවයන් 11,600 ක සංඛ්‍යාවක් සැපැයීම හා දැනට

ක්‍රියාත්මක වන පොම්පාගාර හා අපජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය වැඩි දියුණු කිරීම ක්‍රියාත්මක කිරීමට ද ප්‍රංශ සංවර්ධන ඒජන්සියේ අරමුදල් සම්පාදනය හඳුනා ගනු ලැබ ඇත.

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ පිරිවැය රුපියල් මිලියන 16,073 ක් වනු ඇතැයි ඇස්තමේන්තු කරනු ලැබ ඇති අතර 2040 වර්ෂය වන විට ව්‍යාපෘතිය හරහා ප්‍රතිලාභ ලබනු ඇතැයි ඇස්තමේන්තු කරනු ලැබ ඇති ප්‍රතිලාභීන්ගේ සංඛ්‍යාව 56,429 ක් වේ.

පියවර 1 අදියර 11 යටතේ රැස් කිරීම් ජාලයේ සවිස්තරාත්මක සැලැසුම් හා රත්මලාන / මොරටුව ප්‍රදේශයේ යෝජිත පොම්පාග ාරයන්ගේ මූලික සැලැසුම් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ අභ්‍යන්තර සම්පත් උපයෝගී කර ගනිමින් පිළියෙල කිරීම සිදු කරන ලදි. ලංසු තැබීමේ ලිපි ලේඛන පිළියෙල කිරීම ද දැනට සිදු කරනු ලබමින් පවතී. දැනට ණය ගිවිසුම් වෙනුවෙන් අමාත්‍ය මණ්ඩල අනුමැතිය අපේක්ෂාවෙන් සිටිනු ලැබේ. ජා ඇල /ඒකල ප්‍රදේශයට අදාල පියවර 1 අදියර 111 සම්බන්ධයෙන් සලකන කල්හී 2019 වර්ෂය තුළදී ජා ඇල /ඒකල ප්‍රදේශයන් තුළ ක්‍රියාත්මක කරනු ලැබීමට නියමිත වැඩ කටයුතු වෙන්වෙන් අරමුදල් සම්පාදනය කර දීමට ප්‍රංශ සංවර්ධන ඒජන්සිය විසින් සිය එකඟත්වය පළ කරනු ලැබ ඇත. ව්‍යාපෘතියට ඇතුලත් අංගයන් වන්නේ නව පොම්පාගාර 07 ක සංඛ්‍යාවක් ඉදි කිරීම ද, කිලෝ මීටර 75 ක දිගින් යුත් රැස් කිරීමේ නල මාර්ග වීලීම ද, ආංශික සම්බන්ධතාවයන් 4,100 ක සංඛ්‍යාවක් දීම හා දැනට ක්‍රියාත්මක වන පොම්පාගාරයන් හා අපජල ප්‍රතිකාරක යන්ත්‍රාග ාරය වැඩි දියුණු කිරීම ද වේ. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා වැය වන මුදල රුපියල් මිලියන 8,105 ක් වශයෙන් ඇස්තමේන්තු කරනු ලැබ අතර ඒ හරහා 2040 වර්ෂයේදී ප්‍රතිලාභ ලබනු ඇතැයි ඇස්තමේන්තු කරනු ලැබ ඇති ප්‍රතිලාභීන්ගේ සංඛ්‍යාව 19,945 ක් වේ.

පියවර 1 අදියර 111 යටතේ ඉඩම් අත් පත් කර ගැනීම ඇතුළු මූලික වැඩ කටයුතු දැනට සිදු කරගෙන යමින් පවතී. ජා ඇල / ඒකල ප්‍රදේශය සඳහා වූ සවිස්තරාත්මක සැලැස්ම හා ප්‍රලේඛන පිළියෙල කිරීම එම සම්පත්ම උපයෝගී කර ගනිමින් 2018 වර්ෂය තුළදී ආරම්භ කරනු ලබනවා ඇත.

ජපාන ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සියේ සහාය සහිතව ආරම්භ කරන ලද ව්‍යාපෘතීන්

3. මහනුවර මහ නගර අපජල කළමනාකරණ ව්‍යාපෘතිය.

4 වැනි පැකේජය සමාරම්භක අවස්ථාව

මහනුවර මහ නගරය තුළ සිදු වන කිසිදු වග විභාගයක් ඉවක් බවක් නොමැති අපජල බැහැර කිරීමේ හේතුවෙන් මහනුවර හා මාතලේ දිස්ත්‍රික්කයන් වෙත ජලය සපයනු ලබන ප්‍රධාන ප්‍රභවයන් වූ නුවර වැව, මැද ඇල හා මහවැලි ගඟ දූෂණයට ලක් වෙයි. මෙම ගැටළුවට ස්ථිරසාර විසඳුමක් සොයා ගැනීම සඳහා මහනුවර මහ නගරය වෙනුවෙන් අපජල බැහැර කිරීමේ ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමට ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් යෝජනා කරන ලදි. යෝජිත ව්‍යාපෘතිය මගින් අදහස් කරන ලද්දේ නගරය තුළ හෙක්ටෙයාර 732 ක භූමි ප්‍රදේශයක අපජලය රැස් කොට, ඉන් පසු එය කිලෝ මීටර 92 ක් දිගින් යුත් නල මාර්ග ජාලයක් ඔස්සේ දිනකට ජලය ඝණ මීටර 14,000 ක ධාරිතාවයකින් යුත් ප්‍රතිකාරක යන්ත්‍රාගාරයක් වෙත යැවීමට වේ.

මෙම ව්‍යාපෘතිය 2018 වර්ෂය තුළදී සම්පූර්ණයෙන් නිම කරනු ලැබීමට අපේක්ෂිතය. ආසන්න වශයෙන් 55,000 ක පදිංචි ජන ගහණයක් හා 150,000 ක සංක්‍රමණික ජන ගහණයක් මෙම ව්‍යාපෘති හරහා ප්‍රතිලාභ ලබනු ඇත.

ප්‍රතිකාරක යන්ත්‍රාගාරය විසින් මධ්‍යම පරිසර අධිකාරියේ මග පෙන්වීම් තුල නියම කරනු ලැබ ඇති අපවාහ බැහැර කිරීම් සම්මතයන්ට අනුකූල වන පරිදි ප්‍රතිකාර කරන ලද අපජලය නැවතත් පරිසරය වෙත මුදා හැරීම සහතික කරනු ලබනවා ඇත.

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ඇස්තමේන්තු කරනු ලැබ ඇති මුළු පිරිවැය රුපියල් මිලියන 22,588 කි. ජපාන ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සියේ ණය අරමුදල් දායකත්වය වන ජපන් යෙන් මිලියන 14,087 ක් වන අතර රජයේ ඒකාබද්ධ අරමුදලේ දායකත්වය වන රුපියල් මිලියන 4,060 මුදල පරිපාලන වියදම්, බදු, තීරු බදු හා ඉඩම් අත් පත් කර ගැනීමේ පිරිවැය දැරීම සඳහා ද වෙන් කරනු ලැබ ඇත.

මෙම ව්‍යාපෘතිය පැකේජ 4 කින් සමන්විත වන අතර පැකේජයන්ට අදාල සියළුම කොන්ත්‍රාත්තු ප්‍රදානය කරනු ලැබ ඇත. පැකේජ 4 ම සම්බන්ධ කොන්ත්‍රාත්තු දැනට ක්‍රියාත්මක කෙරෙමින් පවතී.

පැකේජ අංක 1 අපජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය, ප්‍රධාන පොම්පාගාරය, ප්‍රතිකාරිත අපවාහ බැහැර කිරීමේ පද්ධතිය හා ගොහොදු මඩ වියලීමේ තට්ටු සැලැසුම් කිරීම හා ඉදි කිරීම යන අංගයන්ගෙන් සමන්විත වේ. පැකේජ අංක 1 ට අදාල සැලැසුම් වැඩ කටයුතු 2015 මාර්තු 03 වැනි දින ආරම්භ කරන ලද අතර ඉදි කිරීම් වැඩ කටයුතු 2016 පෙබරවාරි 19 වැනි දින ආරම්භ කරන ලදි. අපජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය සඳහා අවසාදන ටැංකිය ඉදි කිරීමේ වැඩ කටයුතු, ඔක්සිකරණ අගල්, මූලික ක්‍රියාවලී ගොඩනැගිල්ල, ගොහොදු ප්‍රතිකාරක ගොඩනැගිල්ල හා පරිපාලන ගොඩනැගිල්ල ආදිය ඉදි කිරීමේ කටයුතු දැනට සිදු කරනු ලබමින් පවතී. ප්‍රධාන පොම්පාග ාරය, ස්ථිර පාලම හා කාර්ය මණ්ඩල සාමාජිකයින් වෙනුවෙන් නිල නිවාස ඉදි කිරීමේ කටයුතු ද දැනට ක්‍රියාත්මක කරනු ලබමින් පවතී. ගොහොදු වියලීමේ තට්ටු ඉදි කිරීමේ වැඩ කටයුතු ද ආරම්භ කරනු ලැබ ඇත.

2017 දෙසැම්බර් 31 වැනි දිනට සාක්ෂාත් කරගනු ලැබ ඇති සමස්ත ප්‍රගතිය 44.09% ක් වේ.

පැකේජ අංක 2 ප්‍රධාන පල් දෝරු නල මාර්ග, ශාඛා පල් දෝරු නල මාර්ග හා සේවා සම්බන්ධතාවයන් හා මනු බිල් පොම්ප කිරීමේ ස්ථානයන් සැලැසුම් කොට ඉදි කිරීම හා මෙහෙයුම් හා නඩත්තු උපකරණ සැපයීම යන අංගයන්ගෙන් සමන්විත වේ. පැකේජ අංක 2 ට අදාල ඉදි කිරීම් වැඩ කටයුතු 2015 අප්‍රේල් මාසයේදී ආරම්භ කරන ලද අතර දැනට එම වැඩ කටයුතු සිදු කෙරෙමින් පවතී. ප්‍රධාන හා ශාඛා පල්දෝරු නල මාර්ග කිලෝ මීටර 47 කින් හා සේවා නල මාර්ග කිලෝ මීටර 56 කින් සැදුම් ලත් කිලෝ මීටර 103 ක මුළු දිග ප්‍රමාණයකින් යුත් පල්දෝරු නල මාර්ග වීලනු ලැබ ඇති අතර එම වැඩ කටයුතු වලට මනු බිල් ස්ථාපිත කිරීම (2,789 ක් වූ මුළු මනු බිල් සංඛ්‍යාව අතුරින් මනු බිල් 1,811 ක් ස්ථාපිත කිරීම සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇත), හා සේවා නල මාර්ගයන් ද ඇතුළත් විය. එම නල මාර්ගයන් ෂක සමග වීලනු ලැබ ඇති අතර ඇතැම් නල මාර්ග යන් වෙනුවෙන් ආලෝක හා දර්පන සහ වායු පරීක්ෂණ වැනි අවශ්‍ය පරීක්ෂණයන් ද සිදු කරනු ලැබ ඇත. අංක 13-1 හා 08-2 දරණ මනු බිල් පොම්පාගාරයන්ට අදාල ඉදි කිරීම් කටයුතු දැනට සිදු කරනු ලබමින් පවතී. 2017 දෙසැම්බර් 31 වැනි දිනට සාක්ෂාත් කරගනු ලැබ ඇති සමස්ත ප්‍රගතිය 45.82% ක් වේ.

පැකේජ අංක 3 දේපල සම්බන්ධතාවයන් සැලැසුම් කොට ඉදි කිරීම, පරීක්ෂා කිරීම හා ක්‍රියාත්මක තත්ත්වයට පත් කිරීම යන අංගයන්ගෙ න් සමන්විත වේ. මෙම කොන්ත්‍රාත්තුව දේපල සම්බන්ධතාවයන් 9,205

ක සංඛ්‍යාවක් ආවරණය කරයි. කොන්ත්‍රාත්තුවට අදාල වැඩ කටයුතු 2016 ජූලි 05 වැනි දින ආරම්භ කරන ලදි. තෝරාගත් දේපල සඳහා සවිස්තරාත්මක සැලැසුම් පිළියෙල කිරීම හා අදාල ඉදි කිරීම් කටයුතු දැනට සිදු කෙරෙමින් පවතී. කොන්ත්‍රාත් කරු විසින් 2017 දෙසැම්බර් මාසය වන විට පරිශ්‍රයන් 458 කට අදාල වැඩ කටයුතු සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇත. 2017 දෙසැම්බර් 31 වැනි දිනට සාක්ෂාත් කරගනු ලැබ ඇති සමස්ත ප්‍රගතිය 18.42% ක් වේ.

පැකේජ අංක 4 තෝරා ගනු ලැබ ඇති අඩු ආදායම්ලාභී ප්‍රදේශයන් තුළ පොදු සනීපාරක්ෂණ පහසු කම් ඉදි කිරීම, පරීක්ෂණයට භාජනය කිරීම හා ක්‍රියාත්මක තත්ත්වයට පත් කිරීම යන අංගයන්ගෙන් සමන්විත වේ. මහනුවර මහ නගර සභා බල ප්‍රදේශය තුළ වැසිකිලි 138 කින් හා ස්නානය කිරීමේ ස්ථාන 02 කින් සමන්විත වැසිකිලි ගොඩනැගිලි 14 ක සංඛ්‍යාවක් ඉදි කිරීම හා පුනරුත්ථාපනය කිරීම කොන්ත්‍රාත්තුවට ඇතුලත් විය. කොන්ත්‍රාත්තු වැඩ කටයුතු 2016 පෙබරවාරි 03 වැනි දින ආරම්භ කරන ලදි. වැසිකිලි ගොඩනැගිලි 11 ක හා එක් ස්නානය කිරීමේ ස්ථානයක ඉදි කිරීම් වැඩ කටයුතු සම්පූර්ණයෙන්ම නිම කරනු ලැබ ඇති අතර ඒවා මහනුවර මහ නගර සභාව හරහා ප්‍රජාව වෙත භාර දෙනු ලැබ ඇත. තවත් වැසිකිලි ගොඩනැගිලි දෙකක් දැනට ඉදි කරනු ලබමින් පවතී. එසේම මහනුවර මහ නගර සභා උප කාර්යාල ගොඩනැගිල්ල ඉදි කිරීමේ වැඩ කටයුතු ද දැනට ක්‍රියාත්මක කරනු ලබමින් පවතින අතර 2017 දෙසැම්බර් 31 වැනි දිනට සාක්ෂාත් කරගනු ලැබ ඇති සමස්ත ප්‍රගතිය 93.90% ක් වේ.

පෞද්ගලික වැසිකිලි වැඩ සටහන.

මෙම වැඩ සටහන යටතේ තනි වැසිකිලි 512 ක් ඉදි කරනු ලැබීමට නියමිත වේ. මෙම වැඩ සටහන ක්‍රියාත්මක කරනු ලබන්නේ ප්‍රජා මූල සංවිධාන මාර්ගයෙන් ය. දැනටමත් ප්‍රජා මූල සංවිධානයන් 03 ක සංඛ්‍යාවක් සංවිධානය කරනු ලැබ ඇති අතර ඒවායේ සාමාජිකයින් මුදල් පරිහරණය කිරීම සහ මෙහෙයුම් හා නඩත්තු කටයුතු සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩ සටහන් දැනට සිදු කරගෙන යනු ලැබේ. බෝගොඩවත්ත ප්‍රදේශයේ නිවාස 29 ක සංඛ්‍යාවකින් නිවාස 20 ක සංඛ්‍යාවක් සඳහා වැසිකිලි ඉදි කිරීමේ කටයුතු දැනට ආරම්භ කරනු ලැබ ඇති අතර 2017 දෙසැම්බර් 31 වැනි දිනට සාක්ෂාත් කරගනු ලැබ ඇති සමස්ත ප්‍රගතිය 21.0% ක් වේ. C:/Users/hp/Desktop/Annual Raport/2017/KCWMP/docx ISO 9001 : 2015 ගුණාත්ම කළමනාකරණ ක්‍රම සහතිකය ව්‍යාපෘතිය වෙනුවෙන් ලබා ගන්නා ලදි.

මුහුණ පාන්නට සිදු වූ පොදු ගැටළු : අපේක්ෂා කරන ලද ප්‍රගතිය සාක්ෂාත් කර ගැනීමට නොහැකි වූයේ ප්‍රදේශය තුළ පවත්නා කඳු සහිත භූමි ලක්ෂණ, නගරය තුළ ඇති තදබදය හා පුරා විද්‍යාත්මක වැදගත් කමකින් යුත් ස්ථාන පිහිටා තිබීම හා වෙනත් පරදු ධාරීන් විසින් නගරය තුළ සිදු කරනු ලබන සංවර්ධන කටයුතු හේතුකොට ගෙන සැලැසුම් වෙනස් කිරීමට සිදු වීම නිසා ද වේ.

4) විසල් කොළඹ ප්‍රදේශය තුළ මලාපවහන සම්බන්ධතාවයන් වැඩි කිරීම සඳහා වූ ප්‍රතිඵල මත පදනම් වූ ආධාර සම්බන්ධ ගෝලීය හවුල (GPOBA - ලෝක බැංකුව) විසින් අරමුදල් සම්පාදනය කරනු ලබන ව්‍යාපෘතිය.

පොම්ප කිරීම සමග බඩෝවිට සරල දීර්ඝ කිරීමට අදාල ප්‍රගති ඡායාරූප

මෙම ව්‍යාපෘතියේ විෂය පථය සංක්ෂිප්ත වශයෙන් සඳහන් කරන්නේ නම් විසල් කොළඹ ප්‍රදේශය තුළ ගෘහස්ත මල අපවහන සම්බන්ධතාවයන් වැඩි කිරීම හා ප්‍රදේශය තුළ ඇති අඩු ආදායම් ලාභී නිවෙස් වෙත ජාලයෙන් පිටස්තර සනීපාරක්ෂණ විසඳුම් ලබා දීමත් වන්නේය.

සෝමානන්ද මාවතෙහි පරිශ්‍ර තුළ සම්බන්ධතාවයන් 100 ක් ද ඇතුළුව ඍජු මල අපවහන සම්බන්ධතාවයන් 1234 ක් දෙහිවල ගල්කිස්ස, ජා ඇල /වීකල, රත්මලාන / මොරටුව හා කොලොන්නාව ප්‍රදේශයන් වෙත සපයා දීම මගින් එකී අනු ව්‍යාපෘතිය සම්පූර්ණයෙන් නිම කරන ලද්දේය. විමධ්‍යගත අපජල ප්‍රතිකාර කිරීම් හා බැහැර කිරීම් ක්‍රමය (DEWTS) දියවරපුර පිහිටි ධීවර නිවාස 64 ක් සම්බන්ධයෙන් සාර්ථක ලෙස ක්‍රියාත්මක තත්ත්වයට පත් කර අඩු පාඩු සඳහා වග කිව යුතු කාල සීමාව නිම කරන ලද්දේය.

බඩෝවිට සරල දීර්ඝ කිරීමේ වැඩ සටහන තුළ පොම්ප කිරීම සමග පොම්ප කිරීමේ ස්ථානයන් තුනක් ඉදි කොට ක්‍රියාත්මක තත්ත්වයට පත් කරන ලද අතර පරිශ්‍රය ඇතුලත පල්දොරු කාණු සහිතව මල අපවහන සම්බන්ධතාවයන් 1500 ක් නිම කරන ලදි.

දැනට ක්‍රියාත්මක වන ප්‍රතිකාරක යන්ත්‍රාගාරය පුනරුත්ථාපනය කිරීම හා මල අපවහන සම්බන්ධතාවයන් 328 ක් සැපයීම මගින් රත්මලාන සුනාමි නිවාස යෝජනා ක්‍රමයේ උප ව්‍යාපෘතිය හා සම්බන්ධ විමධ්‍යගත අපජල ප්‍රතිකාර කිරීම් හා බැහැර කිරීම් ක්‍රමය නිම කරන ලදි.

දෙහිවල ගල්කිස්ස, මොරටුව, කොලොන්නාව හා ජා ඇල ඒකල ප්‍රදේශයන්හි සරල හා සාම්ප්‍රදායික දීර්ඝ කිරීම් උප ව්‍යාපෘතිය තුළ කිලෝ මීටර 12 ක දිගින් යුත් ගුරුත්ව පල් දෝරු දීර්ඝ කිරීම සම්පූර්ණයෙන් නිම කරන ලද අතර ඒ මගින් සම්බන්ධතාවයන් 1475 ක් ආවරණය කරනු ලබනවා ඇත. එහි භෞතික ප්‍රගතිය 98.5 % ක් වේ.

ගෘහස්තයන් 3785 ක් ආවරණය කරනු ලබන වැඩ බිම තුළ සනීපාරක්ෂණ වැඩි දියුණු කිරීම් දැනට ක්‍රියාත්මක කරනු ලබමින් පවතින අතර එම ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය 26.52 % ක් වේ.

ලුනාව සමුද්‍ර ශක්ති නිවාස යෝජනා ක්‍රමය වෙනුවෙන් වූ පෙරණයන් 12 ක සංඛ්‍යාවක් ඉදි කිරීම, පොම්පාගාරයක් ඉදි කිරීම හා මුහුදු කරා දිව යන මෝයක් ඉදි කිරීම ඇතුළු විමධ්‍යගත අපජල ප්‍රතිකාරක පද්ධතියේ ඉදි කිරීම් වැඩ කටයුතු දැනට සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇති අතර ඒ මගින් පවුල් 160 කට සෙත සැලැසෙනු ඇත.

ව්‍යාපෘති ප්‍රදේශයන් තුළ දැනුවත් කිරීමේ වැඩ සටහන් හා රැස්වීම් පවත්වන ලද අතර ඊට අමතරව පෝස්ටර් ප්‍රදර්ශනය කිරීම් හා ජංගම නිවේදනය කිරීම් වැඩ සටහන් ද ක්‍රියාත්මක කරන ලදි. වැඩ සටහන පිළිබඳව ග්‍රාම නිලධාරීන්ගේ හා සංවර්ධන නිලධාරීන්ගේ දැනුවත් භාවය නංවා ලීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන් තුළ රැස්වීම් පවත්වන ලදි. ඵලදායී තාවය නංවා ලීමේ පියවරක් වශයෙන් ව්‍යාපෘතිය තුළ විස් 5 වැඩ සටහන් ක්‍රියාත්මක කරන ලදි.

කොන්ත්‍රාත් කරුවන් කියා සිටින පරිදි මල අපවහන වැඩ කටයුතු සඳහා මිනිස් බලය සොයා ගැනීම දුෂ්කර කටයුත්තක් වී ඇති අතර මේ හේතුව නිසා ඇතැම් ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීම ප්‍රමාද වී ඇත.

5. විසල් කුරුණෑගල ජල සම්පාදන හා මලාපවහන ව්‍යාපෘතිය

විසල් කුරුණෑගල ජල සම්පාදන හා මලාපවහන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබන්නේ ඇමෙරිකානු ඩොලර් මිලියන 77.3 ක් වූ ණය ආධාර යටතේ චීන රජය විසින් දෙනු ලබන සහාය හා ශ්‍රී ලංකා රජයේ අරමුදල් දායකත්වය වූ රුපියල් මිලියන 3,200 ක මුදල ද උපයෝගී කර ගනිමිනි. රුපියල් මිලියන 13,250 ක් වූ එකී මුදල් ප්‍රමාණය භාවිතා කරනු ලබන්නේ කුරුණෑගල නගර සීමාව තුළ හා තදාසන්න අර්ධ නාගරික ප්‍රදේශයන් තුළ ජීවත් වන්නා වූ ජනතාව විසින් මුහුණ දෙනු ලබන ජල හිඟය හා ප්‍රමාණවත් නොවන සනීපාරක්ෂණ ගැටළු සඳහා සම්පූර්ණ විසඳුමක් ලබා දීම සඳහා වන්නේය. මෙය ශ්‍රී ලංකාව තුළ ජල සම්පාදන හා මලාපවහන යන අංගයන් දෙක එකට සම්බන්ධ කරමින් ක්‍රියාත්මක කරනු ලබන පළමු වැනි ව්‍යාපෘතිය වන අතර කොළඹ හා ඊට තදාසන්න අර්ධ නාගරික ප්‍රදේශයන්ගෙන් බාහිර ලෙස ක්‍රියාත්මක කරනු ලබන පළමු වැනි මහා පරිමාණ මලාපවහන ව්‍යාපෘතිය ද වන්නේය.

මෙම ව්‍යාපෘතියේ ප්‍රධානතම ඉලක්කය වන්නේ සුරක්ෂිත පානීය ජල සැපයුමක් සම්පාදනය කර දීම හා ප්‍රමාණවත් සනීපාරක්ෂණ පහසුකම් සම්පාදනය කර දීම මගින් කුරුණෑගල නගරය තුළ හා ඒ අවට ජීවත් වන මිනිසුන්ගේ ජීවන තත්ත්වය වැඩි දියුණු කිරීම වේ. ව්‍යාපෘතිය ප්‍රධාන අංගයන් දෙකකින් සමන්විත වේ.

ජල සම්පාදන අංගය

දැනට ජල සම්පාදන කටයුතු කුරුණෑගල මහ නගර සභා බල ප්‍රදේශයට පමණක් සීමා වී ඇති හෙයින්, එම සේවාවන් එක්තරා දුරකට කුරුණෑගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ද ආවරණය වන සේ ව්‍යාප්ත කරනු ලැබීමට ක්‍රියා කරනු ලැබේ. ඒ මගින් ප්‍රතිලාභ ලබන්නන්ගේ මුළු සංඛ්‍යාව ආසන්න වශයෙන් 71,000 දෙනෙකු පමණ වනු ඇත. ඒ හැරෙන්නට කුරුණෑගල ශික්ෂණ ආරෝග්‍ය ශාලාව වෙත හා කුරුණෑගල මහනගර සභා සීමාව තුළ දැනට සිටින ජල පාරිභෝගිකයින් 35,000 ක් වෙත දවසේ පැය 24 පුරා බාධාවකින් තොරව ජල සම්පාදනය ලබා දීමට ද සැලැසුම් කරනු ලැබේ. මීට අමතරව කුරුණෑගල නගරය වෙත දිනපතා යන එන ආසන්න වශයෙන් එක් ලක්ෂයක පමණ ජනතාව වෙත ද සුරක්ෂිත පානීය ජලය ලබා ගැනීමේ පහසුකම මේ හරහා ලැබෙනු ඇත.

අළුත් තුළු මුව පොම්පාගාරයක් හා කිලෝ මීටර 8.5 ක දිගින් යුත් මිලි මීටර 500 ක විෂ්කම්භයකින් යුත් මෘදු යකඩ සම්ප්‍රේෂණ නල මාර්ගය ඉදි කිරීමේ වැඩ කටයුතු හා දැනට ක්‍රියාත්මක වන ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයේ ධාරිතාව දිනකට ජලය ඝණ මීටර 9000 ක් දක්වා වර්ධනය කිරීම මගින් එය වැඩි දියුණු කිරීම ද, දිනකට ජලය ඝණ මීටර 5000 ක ධාරිතාවයකින් යුත් නව ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයේ ඉදි කිරීම් කටයුතු ද දැනට 100% ක් සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇත. දැනට ක්‍රියාත්මක වන ජලය බෙදා හැරීමේ පද්ධතිය ආසන්න වශයෙන් කිලෝ මීටර 118 ක පමණ නල මාර්ග යොදා ගනිමින් කලාප තුනක් වෙත ව්‍යාප්ත කිරීමේ වැඩ කටයුතු දැනට 98% ක් සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇත. ජලය ඝණ මීටර 1500 ක ධාරිතාවයකින් යුත් ඔසොව් ටැංකිය ඉදි කිරීමේ වැඩ කටයුතු 100% ක් සම්පූර්ණ කරනු ලැබ ඇත. නව ජල සම්පාදන සේවා සම්බන්ධතාවයන් 6,500 ක් සැපයීම හා කුරුණෑගල ශික්ෂණ ආරෝග්‍ය ශාලාව වෙත ජල සම්පාදන ප්‍රධාන නල මාර්ගය එළීම ද ව්‍යාපෘතිය තුළට ඇතුලත්ව ඇති කර්තව්‍යයන් වේ.

මලාපවහන අංගය

කුරුණෑගල නගරය හා අද්දාලව බලන කල්හී, නගරය තුළ අපජල ප්‍රතිකාරිත කිරීම් කිසිවක් සිදු නොවන හෙයින් මුළු මහත් මහ නගර සභා ප්‍රදේශයම රඳා පවතින්නේ ස්ථානීය සනීපාරක්ෂණය මත වේ. වැව වටා පිහිටා ඇතැම් ආපන ශාලා විසින් තමන්ගේ අප ද්‍රව්‍යයන් කෙලින්ම වැව තුළට මුදා හැරීම කරනු ලැබේ. මෙම තත්ත්වය නිසා නගරය බරපතල ලෙස පාරිසරික හායනයකට භාජනය වී තිබේ. මෙම ප්‍රදේශය තුළ ඇති එක් මලාපවහන යෝජනා ක්‍රමයක් කුරුණෑගල ශික්ෂණ ආරෝග්‍ය ශාලාවට අයත් වන අතර එය දැනට වසර 10 කට අධික කාලයක් මුළුල්ලේ ක්‍රියා විරහිත තත්ත්වයක පැවැතී ඇත.

ඉහතින් සඳහන් කරනු ලැබ ඇති සියළුම සාධකයන් සැලැකිල්ලට ගැනීමෙන් අනතුරුව මහ නගර සභා ප්‍රදේශය තුළ ජීවත් වන 43,000 ක ජනතාවක් හා කුරුණෑගල ශික්ෂණ ආරෝග්‍ය ශාලාව ද ආවරණය වන පරිදි මල අපවහන පද්ධතියක් ඉදි කිරීමට සැලැසුම් කරන ලදි. මහ නගර සභා බල ප්‍රදේශය තුළ පැන නගින් බොහෝ පාරිසරික ගැටළු වලට මෙම ව්‍යාපෘතිය මගින් විසඳුම් සපයා දෙනු ලබනවා ඇත.

මලාපවහන ප්‍රතිකාරක යන්ත්‍රාගාරය

මලාපවහන ව්‍යාපෘතිය හා සම්බන්ධ ප්‍රධාන අංගයන් සම්පූර්ණයෙන් නිම කරනු ලැබීමේ තත්ත්වයට ළඟා වෙමින් පවතී. දිනකට ඝණ මීටර 4,500 ක ධාරිතාවයකින් යුත් මල අපවහන ප්‍රතිකාරක යන්ත්‍රාගාරය හා එයට අනුයුක්ත පොම්පාගාරයන් ඉදි කිරීමේ වැඩ කටයුතු 100% ක් නිම කරනු ලැබ ඇත. මලාපවහන ජාලය හා සම්බන්ධ සියළුම පොම්පාගාරයන් 6 හි ඉදි කිරීම් කටයුතු 94% ක් නිම කරනු ලැබ ඇත. කිලෝ මීටර 138 ක මුළු දිග ප්‍රමාණයකින් යුත් මලාපවහන නල ජාලයෙන් කිලෝ මීටර 98.5 ක් සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇත. කුරුණෑගල ශික්ෂණ ආරෝග්‍ය ශාලාවට අයත් මල අපවහන පද්ධතිය වැඩි දියුණු කිරීමේ වැඩ කටයුතු ද ක්‍රියාත්මක කරන ලදි.

2017 වර්ෂයේ අවසානය වන විට ව්‍යාපෘතිය විසින් සාක්ෂාත් කර ගනු ලැබ තිබුණ සමස්ත භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් 98.02% ක් හා 73.75% ක් විය.

2017 වර්ෂයේ ජුනි මස 03 වැනි දින ජාත්‍යන්තර ප්‍රමිති සංවිධානයේ (ISO) 9001:2015 ගුණාත්ම ප්‍රමිතිය ලබා ගැනීම ද, 2017 වර්ෂයේ මාර්තු 28 වැනි දින පවත්වන ලද ජාතික මෙහෙයුම් කමිටුවේ රැස්වීම හා දැනට සිදු කරගෙන යමින් තිබෙන තුළු මුවෙහි, අමු ජල ප්‍රධාන නල මාර්ගයෙහි හා ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයෙහි පරීක්ෂණ මෙහෙයුම් ද 2017 වර්ෂය තුළදී ව්‍යාපෘතිය තුළ සිදු වූ විශේෂිත සිදු වීම් වශයෙන් සැලැකිල්ලට ගත හැකි වේ.

මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමෙන් පසුව කුරුණෑගල මහ නගර සභා බල ප්‍රදේශය තුළ හා ඒ අවට ජීවත් වන ජනතාව වෙත දිනකට පැය 24 ක් පුරා ප්‍රමාණවත් සුරක්ෂිත පානීය ජල සැපයුමක් හා සියළුම ගෘහස්තයන්, ආයතනයන් හා ආරෝග්‍ය ශාලාවන් ආදිය වෙත මනා සනීපාරක්ෂණ පහසුකම් සැපයුමක් ද සිදු වන අතර ඒ මගින් ප්‍රදේශය තුළ පාරිසරික තත්ත්වයන්ගේ වැඩි දියුණුවක් සිදු වනු ඇතැයි අපේක්ෂා කළ හැකි වේ.

මෙම ව්‍යාපෘතිය මහ ජනතාවගේ සෞඛ්‍ය සම්පන්න ජීවන තත්ත්වයන් සහතික කරමින් ඔවුනට අවශ්‍ය ජල සම්පාදනය හා සනීපාරක්ෂණ පහසුකම් සම්පාදනය කර දෙමින් හා පරිසර හිතකාමී තත්ත්වයක් ප්‍රවර්ධනය කරමින් කුරුණෑගල නගරය තුළ වැදගත් සිදු වීමක් හෙවත් හැරුවුම් ලක්ෂ්‍යයක් බවට පත් වනු ඇත.

6. නගර වෙනුවෙන් වූ සනීපාරක්ෂණ හා ස්වස්ථතා මුල පිරීමේ (SHIFT) ව්‍යාපෘතිය

මීගමුව, ගාල්ල - උනවටුන හා කැළණිය - පෑලියගොඩ නම් දකුණු හා බටහිර වෙරළාසන්න ප්‍රදේශයන් තුළ වාසය කරන 200,000 ක පමණ ජනතාවක් වෙත අපජල බැහැර කිරීමේ යටිතල පහසුකම් සම්පාදනය කර දීම නගර වෙනුවන් වූ සනීපාරක්ෂණ හා ස්වස්ථතා මුල පිරීමේ (SHIFT) ව්‍යාපෘතිය විසින් ඉලක්ක කරනු ලබයි.

මීගමුව නගරය වෙත අපජල බැහැර කිරීමේ යටිතල පහසුකම් සම්පාදනය කර දීම, ගාල්ල - උනවටුන හා කැළණිය - පෑලියගොඩ ප්‍රදේශයන් සම්බන්ධ අධ්‍යයන හා ටෙන්ඩර ලිපි ලේඛන පිළියෙල කිරීම හා ව්‍යාපෘති ප්‍රදේශය තුළ ජීවත් වන අඩු ආදායම් ලාභී ජනතාව වෙත සනීපාරක්ෂණ පහසුකම් සම්පාදනය කර දීම සඳහා වූ දිළින්දන් සඳහා වූ අරමුදල පිහිටුවීම ද 1 වැනි නගර වෙනුවන් වූ සනීපාරක්ෂණ හා

ස්වස්ථතා මුල පිරීමේ (SHIFT) ව්‍යාපෘතියට ඇතුලත් වෙයි.

ඊට වැඩිමනත් වශයෙන් ව්‍යාපෘතිය විසින් ජල හා සනීපාරක්ෂණ අංශයේ ආයතනික රාමුව නංවා ලීම පිණිස නිර්දේශ සැපයීම සඳහා තාක්ෂණික සහාය ලබා දීම ද, ඒ සඳහා තිරසාර ලෙස මූල්‍ය පහසුකම් ලැබීම සහතික කිරීම හා මල අපවහන කළමනාකරණ කුසලතා සංවර්ධනය කිරීමේ සැලැසුමක් ක්‍රියාත්මක කිරීම ද ව්‍යාපෘතිය විසින් සිදු කරනු ලබයි.

යුරෝ මිලියන 76 ක් සඳහා වූ ණය ගිවිසුම ප්‍රංශ සංවර්ධන ඒජන්සිය සමග 2016 ජුනි මාසයේදී අත්සන් කරන ලදි. ඒ අතර තාක්ෂණික සහාය අංගය සඳහා වූ යුරෝ මිලියන 5.7 ක් සඳහා වූ ප්‍රදාන ගිවිසුම 2016 මාර්තු මාසය තුළදී අත්සන් තබන ලද අතර ඒ සඳහා ප්‍රංශ සංවර්ධන ඒජන්සිය හරහා යුරෝපීය සංගමය විසින් අරමුදල් දායකත්වය සපයනු ලබයි. ශ්‍රී ලංකා රජයේ අරමුදල් දායකත්වය වූ යුරෝ මිලියන 26 ත් සමග ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා වැය වන මුළු පිරිවැය යුරෝ මිලියන 107.7 ක් වනු ඇත.

සැලැසුම් සහ අධීක්ෂණ කටයුතු පිළිබඳ උපදේශකත්වය හා ප්‍රතිපත්ති හා ආයතන නංවා ලීමේ උපදේශකත්වය සඳහා උපදේශක වරුන් තෝරා ගැනීම සඳහා උපදේශක කොන්ත්‍රාත්තු ප්‍රසම්පාදනය කිරීමේ කටයුතු 2017 වර්ෂය තුළදී සම්පූර්ණයෙන්ම මෙන් නිම කරනු ලැබ ඇති අතර 2018 මාර්තු මාසය තුළදී උපදේශකවරුන් ඒ ඒ වැඩ බිම් තුළ සිය රාජකාරී කටයුතු ආරම්භ කරනු ඇතැයි අපේක්ෂා කරනු ලැබේ. තාක්ෂණික සහාය යටතේ වූ කළමනාකරණ සහාය උපදේශක කොන්ත්‍රාත්තුව ප්‍රදානය කරනු ලැබ ඇති අතර තෝරාගත් උපදේශක වරයා විසින් 2017 නොවැම්බර් මාසයේදී සිය රාජකාරී කටයුතු ආරම්භ කරන ලදි.

මීගමුව නගරය වෙනුවෙන් වූ සැලැසුම නිම කිරීම හා ලංසු තැබීමේ ලිපි ලේඛන පිළියෙල කිරීම 2018 වර්ෂය තුළදී නිම කරනු ලැබීමට හා ඉදි කිරීම් කටයුතු 2022 වර්ෂය වන විට සම්පූර්ණයෙන් නිම කිරීමට ද සැලැසුම් කරනු ලැබ ඇත.

කැළණිය - පෑලියගොඩ හා ගාල්ල - උනවටුන ප්‍රදේශයන් සඳහා වූ සවිස්තරාත්මක සැලැසුම හා ප්‍රලේඛන පිළියෙල කිරීම ද 2018 මාර්තු මාසය තුළදී ආරම්භ කිරීමට නියමිත අතර ඊට අදාල ඉදි කිරීම් කටයුතු ද 2022 වර්ෂය තුළදී නිම කරනු ලබනවා ඇත.

7). කතරගම අපජල බැහැර කිරීමේ ව්‍යාපෘතිය.

කතරගම අපජල බැහැර කිරීමේ ව්‍යාපෘතිය විසින් මැණික් ගඟ හා ඒ අවට පරිසරය තව දුරටත් දූෂණය වීම වැලැක්වීමේ පරමාර්ථයෙන් නගර සීමාව වටා පිහිටි වන්දනා කරුවන්ගේ නවාතැන් පොලවල්, හෝටල්, සාප්පු, ගෘහස්ත ඒකක හා කාර්යාල ආදිය වෙත පල් දෝරු නල මාර්ග පහසුකම් සම්පාදනය කර දීම කෙරෙහි අවධානය යොමු කරනු ලැබ ඇත. පල් දෝරු නල මාර්ග ජාලය විස්තාරණය කිරීම මගින් දැනට ක්‍රියාත්මක වන පද්ධතිය ඉහල ශ්‍රේණිගත කිරීම හා මල අපවහන ප්‍රතිකාරක යන්ත්‍රාගාරය වැඩි දියුණු කිරීම ව්‍යාපෘතියේ ප්‍රධාන විෂය පථය තුළ අන්තර්ගත වේ. යාන්ත්‍රික වාතකයන් ස්ථාපනය කිරීම මගින් දැනට ක්‍රියාත්මක වන ප්‍රතිකාරක යන්ත්‍රාගාරයේ ධාරිතාවය දිනකට ඝණ මීටර 750 ධාරිතාවයේ සිට දිනකට ඝණ මීටර 3000 ක ධාරිතාවයකට ඉහල නැංවෙනු ලබන අතර ඒ හරහා කතරගම වෙත වන්දනාව සඳහා පැමිණෙන අති විශාල ජන ගහණයක් වෙත සේවය සැලැසීමේ හැකියාව උදා වනු ඇත. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අරමුදල් සපයනු ලබන්නේ යුනි ක්‍රෙඩිට් බෑන්ක් ඕස්ට්‍රියා ඒජ් ආයතනය විසිනි. ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තු කරනු ලැබ ඇති මුළු පිරිවැය රුපියල් මිලියන 2,040 ක් වේ.

ව්‍යාපෘතියේ වැඩ කටයුතු 2014 අගෝස්තු මාසය තුළ ආරම්භ කරනු ලැබිණ. විදේශ කොටස යටතේ වූ විෂය පථය යටතේ වන වැඩ කටයුතු සියල්ල 2017 දෙසැම්බර් මාසය වන විට සම්පූර්ණයෙන් නිම කරන ලදි. ප්‍රතිලාභීන්ගේ සංඛ්‍යාව 15,000 ක් වනු ඇත. ව්‍යාපෘතියේ අංගයන් තුළට ඇතුලත් වන්නේ පොම්පාගාරයන් 7 ක සංඛ්‍යාවක් ඉදි කිරීම ද, පොම්ප හා අවශ්‍ය විදුලි අයිතමයන් සවි කිරීම ද, කිලෝ මීටර 16.5 ක දිගින් යුත් පල්දෝරු නල ජාලය ඉදි කිරීම ද, වාතනය කළ කලපු හා යටි ගං පරිණත පොකුණ සමග දිනකට ඝණ මීටර 3,000 ක ධාරිතාවයකින් යුත් අපජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය ඉදි කිරීම හා ගොහොදු ප්‍රතිකාරක පද්ධතිය ඉදි කිරීම ද වේ. ගොහොදු ප්‍රතිකාරක පද්ධතිය හැර අනිකුත් සියළුම අංගයන්ගේ ඉදි කිරීම් සම්පූර්ණයෙන්ම නිම කරනු ලැබ ඇත.

ව්‍යාපෘති කළමනාකරණ ඒකකය 2014 වර්ෂයේදී ස්ථාපිත කරන ලදි. ඉඩම් අත් පත් කර ගැනීමේ කටයුතු වලින් 80% ක ප්‍රමාණයක් සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇත. ව්‍යාපෘතිය වෙනුවෙන් වූ පාරිසරික බලපෑම් තක්සේරු කිරීමේ වැඩ කටයුතු සම්පූර්ණයෙන් නිම කරනු ලැබ ඇති අතර ඒ සඳහා අනුමැතිය ලබා ගැනීමට ඇත. කොන්ත්‍රාත් කරු විසින් ව්‍යාපෘතියේ ප්‍රධාන විෂය පථය යටතේ වූ වැඩ කටයුතු නිම කරනු ලැබ ඇති අතර ගොහොදු ප්‍රතිකාරක පද්ධතිය හැර අනිකුත් අංගයන් දැනට මෙහෙයුම් කරනු ලැබීමේ තත්ත්වයට පත්ව ඇත. ගොහොදු ප්‍රතිකාරක පද්ධතිය දේශීය අරමුදල් සම්පාදනය යටතේ සම්පූර්ණයෙන් නිම කරනු ලබන අතර ඒ සඳහා වූ ටෙන්ඩර් ලිපි ලේඛන දැනටමත් පිළියෙල කරනු ලැබ ඇත. ටෙන්ඩර් කැඳවනු ලැබීමට කටයුතු කරනු ලබනවා ඇත.

වැඩ නිම කරන ලද වාතනය කළ කළපුව

ශ්‍රී ලංකා රජය විසින් අරමුදල් සපයනු ලැබ ඇති කුඩා හා මධ්‍ය පරිමාණ මලාපවහන ව්‍යාපෘතීන්

බස්නාහිර පලාත

මොරටුව - රත්මලාන ප්‍රදේශය තුළ පල්දෝරු නල ආවරණය පුළුල් කිරීම - රත්මලානේ රජ මාවත දක්වා නල මාර්ගය ව්‍යාප්ත කිරීම

2016 වර්ෂයේ කඩිනම් ජල සම්පාදන හා මල අපවහන සඳහා වූ වෙන් කිරීම යටතේ නගර සැලැසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය විසින් රත්මලාන රජ මාවත දක්වා පල්දෝරු නල මාර්ගය දීර්ඝ කිරීම සඳහා රුපියල් මිලියන 48.7 ක මුදලක් වෙන් කර දෙනු ලැබ ඇත.

රත්මලාන - මොරටුව මල අපවහන ව්‍යාපෘතියේ අදියර 11 යටතට ගැනෙන ප්‍රදේශය තුළ පිහිටි ගෘහස්තයන් 250 ක් මෙම ව්‍යාපෘතියට ඇතුලත් වේ. මීට අදාල කොන්ත්‍රාත්තුව 2017 ජුනි මාසයේදී ප්‍රදානය කරන ලද අතර ඉදි කිරීම් වැඩ කටයුතු වලින් 60% ක ප්‍රමාණයක් නිම කරනු ලැබ ඇත.

ක්‍රියාත්මක කිරීම සඳහා පෙල ගස්වනු ලැබ ඇති ව්‍යාපෘතීන් (මලාපවහන)

බස්නාහිර පලාත

1. ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ අපජල රැස් කිරීමේ හා බැහැර කිරීමේ යෝජනා ක්‍රමය.

පසු ගිය දශක දෙක මුළුල්ලේ ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ සිදු වූ වේගවත් සංවර්ධනයත් සමග නිවාස සෑදීම සඳහා පැන නැගි ඇති ඉල්ලුම සපුරා ලීම සඳහා දැනට පවතින්නා වූ සංවර්ධිත ඉඩම් බොහෝ සංඛ්‍යාවක් අනු බෙදුම් වලට භාජනය වී ඇති අතර ප්‍රධාන මාර්ගයන් දිගට ඇති ඉඩම් වාණිජ සංවර්ධනය සඳහා අනු බෙදුම්

වලට භාජනය වී ඇත. ගොඩනැගිලි ඉදි කිරීමේ ඉඩම් කොටස් වල ප්‍රමාණය අඩු වී ඇති හෙයින් හා අවට ඇති ඉඩම් වල තිබෙන නොගැඹුරු ළිං හේතු කොට ගෙන ඕනෑම ගොඩනැගිලි ඉදි කෙරෙන බිම් කොටසක පූතික ටැංකියක් ස්ථාපිත කිරීම බෙහෙවින් දුෂ්කර කටයුත්තක් බවට පත් වී ඇත.

ඉඩම් වලට ඇති ඉල්ලුම සපුරා ලිම සඳහා පහත් බිම් ප්‍රදේශයන් ද ගොඩ කරනු ලැබ ඇත. මෙම තත්ත්වය වගුරු බිම් වල හා ජල මාර්ගයන්හි ඇති ජලය පැතිර යාම වැඩි වීමේ ප්‍රවණතාවයකට තුඩු දී ඇති අතර මේ නිසා ගං වතුර අවදානමක් ද උද්ගත වී තිබේ. භූ ගත ජල තලයේ වර්ධනය සමග හා පසෙහි අඩු පාරගම්‍යතාව හේතු කොට ගෙන නිසියාකාරව ක්‍රියාත්මක නොවන පූතික ටැංකි වලින් හා පෙඟවුම් වලවල් වලින් පිට වන අපජලය දෙපස ඇති කාණු වල වැකතු වන අතර අවසානයේදී එම අපජලය ඒ ආසන්නයේ පිහිටි මතු පිට ජල මාර්ගයන් හා වැක් වී එහි අවසන් ප්‍රතිඵලය වශයෙන් භූ ගත ජල ප්‍රභවයන් දූෂිත වීම සිදු වේ. ඒ බැවින්, වැලිකඩ - රාජගිරිය ප්‍රදේශයේ මෙන්ම ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ නගර සභා ප්‍රදේශයේ ද, ඊට යා බදව ඇති කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ හා මහරගම නගර සභා ප්‍රදේශයේ කොටස් තුළ ද සිදු වී ඇති වේගවත් සංවර්ධනය නිසා අදාල ප්‍රදේශයන් වෙත යෝග්‍ය අපජල බැහැර කිරීමේ ක්‍රමයක් සම්පාදනය කර දීම සඳහා මධ්‍යගත මලාපවහන පද්ධතියක් නිර්මාණය කිරීම අත්‍යවශ්‍ය කටයුත්තක් වී තිබේ. ජනනය වනු ලබන අපජලය ගුරුත්ව හා පොම්ප කිරීමේ ප්‍රධාන නල මාර්ග යන් මගින් වැක් රැස් කොට බත්තරමුල්ල, කොස්වත්ත පාරේ පිහිටුවනු ලැබ ඇති ප්‍රතිකාරක යන්ත්‍රාගාරයේදී ප්‍රතිකාරිත කොට ප්‍රතිකාරිත අපවාහය දියවන්නා ඔය වෙත මුදා හරිනු ලබනවා ඇත. ජපාන ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සිය විසින් සිදු කරනු ලබන සාධ්‍යතා අධ්‍යයනයක් මේ වන විට ක්‍රියාත්මක වෙමින් පවතින අතර ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ අපජල බැහැර කිරීමේ ව්‍යාපෘතිය පිළිබඳ පාරිසරික බලපෑම් තක්සේරුව ද මේ වන විට සිදු කරනු ලබමින් පවතී.

2. මහරගම හා බොරලැස්ගමුව අපජල බැහැර කිරීමේ පද්ධතිය

ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය, ජාතික අධ්‍යාපන ආයතනය හා ජාතික පිළිකා මධ්‍යස්ථානය වැනි වැදගත් ජාතික ආයතනයන් කිහිපයක් මහරගම ප්‍රදේශය තුළ පිහිටා තිබේ. මහරගම හා බොරලැස්ගමුව නාගරික ප්‍රදේශයන්හි ඇති වී තිබෙන වේගවත් සංවර්ධනයට සරිලන පරිදි හා පරිසරය තව දුරටත් පිරිහී යාම වැලැක්වීම සඳහා මේ ප්‍රදේශයට මධ්‍යගත මලාපවහන පද්ධතියක් අත්‍යවශ්‍ය වී තිබේ.

මහරගම හා බොරලැස්ගමුව අපජල වහනය රත්මලාන - මොරටුව අපජල බැහැර කිරීමේ ව්‍යාපෘතිය යටතේ ඉදි කරන ලද රත්මලාන / මොරටුව ප්‍රතිකාරක යන්ත්‍රාගාරය වෙත ගෙන එනු ලබනවා ඇත. ආසන්න වශයෙන් මල අපවහන සම්බන්ධතාවයන් 5000 ක් සැපයීමට අපේක්ෂා කරනු ලබන අතර ඒ සඳහා ඇස්තමේන්තු කරනු ලැබ ඇති මුළු පිරිවැය රුපියල් මිලියන 5,125 ක් වනු ඇත.

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා වූ කොන්ත්‍රාත්තුව 2014 නොවැම්බර් 05 වැනි දින M/s CCOEC – JSE JV (විදේශීය ආර්ථික සහයෝගිතාවය සඳහා වූ චීන ජාතික සංස්ථාව හා ගෝල්ඩන් ස්ටේට් පාරිසරික සංස්ථාව අතර බද්ධ ව්‍යාපාරය) වෙත ප්‍රදානය කරන ලද අතර අරමුදල් සම්පාදනය කිරීමට යෝජිත බැංකුව මහජන චීනයේ අපනයන ආනයන බැංකුවයි. මහජන චීනයේ අපනයන ආනයන බැංකුව හා ශ්‍රී ලංකා ජන රජය අතර ණය ගිවිසුම අත්සන් කිරීමට නියමිතව ඇත.

මූලික පාරිසරික පරීක්ෂණ අධ්‍යයනය යුනි කොන්සල්ටන්සි ආයතනය විසින් දැනට සිදු කරගෙන යමින් පවතී. අවසාන වාර්තාවේ කෙටුම් පත සම්බන්ධයෙන් මධ්‍යම පාරිසරික අධිකාරිය විසින් මූලික පාරිසරික පරීක්ෂණ මණ්ඩලයේ තාක්ෂණික අගැයීම් කමිටුවේ රැස්වීමක් මෙහෙයවන ලදී. පොම්පාගාර ඉදි කිරීම සඳහා ඉඩම් අත් පත් කර ගැනීමේ කටයුතු දැනට සිදු කරනු ලබමින් පවතී.

3. දෙහිවල/ගල්කිස්ස අපජල බැහැර කිරීමේ ව්‍යාපෘතිය.

පිළිවෙලින් ශ්‍රී ලංකාවේ වාණිජ හා පරිපාලන අග නගරයන් වන කොළඹට හා ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේට යා බදව පිහිටා ඇති බැවින් දෙහිවල ගල්කිස්ස බොහෝ සෙයින් නාගරීකරණය වූ පදිංචියට යෝග්‍ය හා වාණිජ මහා නගරයක් බවට පත් වී තිබේ. එය පිහිටා ඇත්තේ කොළඹ දිස්ත්‍රික්කය තුළ වන අතර දෙහිවල සහ රත්මලාන යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයන්ගෙන් එය සමන්විත වේ.

සේවා සපයනු නොලබන ප්‍රදේශය තුළ යෝග්‍ය අපජල බැහැර කිරීමේ ක්‍රමයක් නොමැති හෙයින් නල මඟින් මල අපවහන බැහැර කිරීමේ පද්ධතියක් සඳහා දැනට විශාල ඉල්ලුමක් පවතී. එම නිසා දෙහිවල ගල්කිස්ස සේවා නොලබන සෙසු ප්‍රදේශයන් හා කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් යා බද ග්‍රාම නිලධාරී වසම් 3 ක් ද යෝජිත ව්‍යාපෘති ප්‍රදේශය තුළට ඇතුළු කර ගෙන තිබේ. මෙම යෝජිත ව්‍යාපෘතිය යටතේ ආවරණය කිරීමට අපේක්ෂා කරනු ලබන ඇස්තමේන්තු ගත මුළු භූමි ප්‍රමාණය ආසන්න වශයෙන් හෙක්ටෙයාර 919 ක් වන අතර 2040 වර්ෂය වන විට සේවා සපයා දෙනු ලැබීමට අපේක්ෂිත ජන ගහණය 138,230 ක් වේ. යෝජිත ව්‍යාපෘතිය ගුරුත්ව මල අපවහන ප්‍රධාන නල මාර්ග කිලෝ මීටර් 41.2 කින් ද, ගැඹුරු උමං මාර්ග ගුරුත්ව ප්‍රධාන නල මාර්ග කිලෝ මීටර 4.1 කින් ද, අතුරු හා ශාඛා මල අපවහන නල මාර්ග කිලෝ මීටර 39 කින් ද, තෙත් ළිං පොම්ප කිරීමේ ස්ථානයන් 12 කින් ද, පොම්ප කිරීමේ ප්‍රධාන නල මාර්ග කිලෝ මීටර 6.5 කින් හා මිලි මීටර 1500 ක විෂ්කම්භයකින් හා කිලෝ මීටර 1.7 ක දිග ප්‍රමාණයකින් යුත් මුහුදු කරා දිවෙන නල මාර්ගයකින් ආදී අංගයන්ගෙන් සමන්විත වේ. ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තු ගත කරනු ලැබ ඇති මුළු පිරිවැය රුපියල් මිලියන 28,523 ක් වේ.

මේ අවස්ථාව වන විට M/s Vinci Cnstruction Grands Projects / LUDWIG PFEIFFER Hoch – u Tiefabau GmBH සහ සමාගම වෙත කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය දෙනු ලැබ ඇත. ව්‍යාපෘතියේ පාරිසරික බලපෑම් තක්සේරු අධ්‍යයනය යුනි උපදේශක සේවා සමාගම විසින් සිදු කරගෙන යනු ලබන අතර පාරිසරික බලපෑම් තක්සේරුවේ අවසන් වාර්තාව පාරිසරික අනුමැතිය ලබා ගැනීම සඳහා මධ්‍යම පරිසර අධිකාරිය වෙත ඉදිරිපත් කළ යුතුව තිබේ. පොම්ප කිරීමේ ස්ථාන සඳහා අවශ්‍ය ඉඩම් ක්‍රම සම්පාදන හා සැලැසුම් (මලාපවහන) අංශය විසින් හඳුනාගනු ලැබ ඇති අතර ඉඩම් අත් පත් කර ගැනීමේ ක්‍රියාවලිය දැනට ක්‍රියාත්මක කරනු ලබමින් පවතී.

4. ගම්පහ අපජල රැස් කිරීමේ හා බැහැර කිරීමේ ව්‍යාපෘතිය

කොළඹ - මහනුවර 'A' පන්තියේ මහා මාර්ග ජාලය හා කොළඹ - මහනුවර දුම්රිය මාර්ගය ඔස්සේ ශ්‍රී ලංකාවේ පරිපාලන අග නගරය වූ ශ්‍රී ජයවර්ධනපුර හා වාණිජ අග නගරය වූ කොළඹ සමග සම්බන්ධ වී තිබෙන හෙයින් ගම්පහ ඉහල ප්‍රවේශ වීමේ හැකියාවක් ඇති නගරයක් බවට පත් වී ඇත. ගම්පහ නගරය සතුව ඇති ප්‍රවේශ වීමේ ඉහල හැකියාව හේතුකොට ගෙන හා ගම්පහ දිස්ත්‍රික්කය තුළ පිහිටි ප්‍රධාන පරිපාලන මධ්‍යස්ථානය හෙයින් ද ගම්පහ වෙත දින පතා ආසන්න වශයෙන් වැක් ලක්ෂයක පමණ පාවෙන ජන ගහණයක් ඇදී වන අතර යක්කල හා මිරිස්වත්ත ප්‍රදේශයන් වෙත ද දිනකට ආසන්න වශයෙන් විසි දහසක පමණ පාවෙන ජන ගහණයක් ඇදී වන බවට ඇස්තමේන්තු කරනු ලැබ තිබේ. ඊට අමතරව ගම්පහ නගරය බස්නාහිර පලාතේ පිහිටා ඇති නිසාත්, ශ්‍රී ලංකාවේ වාණිජ අග නගරය වූ කොළඹට යාබදව පිහිටා ඇති නිසාත් බෙහෙවින්ම නාගරීකරණය වූ හා වාණිජකරණය වූ නගරයක් බවට පත්ව ඇත්තේය.

යෝජිත ව්‍යාපෘතිය මගින් ගම්පහ මහ නගර සභා බල ප්‍රදේශයේ ඇති ග්‍රාම නිලධාරී වසම් 21 ක් ආවරණය කිරීමට අපේක්ෂා කරනු ලබන අතර ඊට ගම්පහ නගරය, මිරිස්වත්ත හා යක්කල යන ප්‍රදේශයන්

ඇතුලත් වේ. නව ව්‍යාපෘති යෝජනාව සම්බන්ධයෙන් ගත් කල 2045 වර්ෂයේදී සෘජු ලෙස සේවාවන් සපයා දීමට අපේක්ෂා කරනු ලබන ගෘහස්ත ජන ගහනය ග්‍රාම නිලධාරී වසම් 21 ක් තුළ ජීවත් වන 33,601 ක ජනතාවක් වේ. ස්ථිර පදිංචි කරුවන්ට අමතර ලෙස 172,175 ක පා වෙන ජන ගහණයක් වෙත ද යෝජිත ව්‍යාපෘතිය මගින් සෙත සලසනු ලබනවා ඇත. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා වැය වනු ඇතැයි ඇස්තමේන්තු කරනු ලැබ ඇති මුළු පිරිවැය රුපියල් මිලියන 20,751 ක් වේ.

යෝජිත අපජල බැහැර කිරීමේ පද්ධතිය කිලෝ මීටර් 30.4 ක දිගින් යුත් ගුරුත්ව ප්‍රධාන නල මාර්ග පද්ධතියකින් ද, කිලෝ මීටර 61 ක දිගින් යුත් අතුරු හා ශාඛා මලාපවහන නල මාර්ග පද්ධතියකින් ද, පොම්ප කිරීමේ ප්‍රධාන නල මාර්ග කිලෝ මීටර 6.4 කින් ද, පොම්ප කිරීමේ ප්‍රධාන නල මාර්ග කිලෝ මීටර 6.4 කින් ද, පොම්ප කිරීමේ ස්ථාන 17 කින් හා දිනකට ජලය ඝණ මීටර 15,000 ක ධාරිතාවයකින් යුක්ත වූ අපජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයකින් ද සැදුම් ලත් අපජල ජාලිත කිරීමේ ජාලයකින් (wastewater reticulation network) ද සමන්විත වන අතර ප්‍රතිකාර කරන ලද අපජලය කිලෝ මීටර 3.1 ක දිගින් යුත් නල මාර්ගයක් තුළින් අත්තනගළු ඔය වෙත මුදා හැරීමට යෝජිතය.

මේ වන විට ව්‍යාපෘතිය සඳහා ව්‍යාපෘති සමාලෝචන කමිටුව විසින් අනුමැතිය දෙනු ලැබ ඇත.

වයඹ පලාත

1. හලාවත අපජල බැහැර කිරීමේ පද්ධතිය

හලාවත කිලෝ මීටර 75 ක් කොළඹට උතුරින් පිහිටා ඇති අතර පොල්, ඉස්සන් හා ධීවර කර්මාන්තය සඳහා ප්‍රසිද්ධියක් උසුලන අධික ජන ගහණයකින් යුත් නගරයකි. හලාවත භූ ලක්ෂණ අනුව පැතැලි ප්‍රදේශයක් වන හෙයින් ක්ෂණික ලෙස හඳුනා ගත හැකි ජලාපවහන රටාවක් නොමැති වුවද, සෘජුවම මුහුදට ජලය ගලා යන වැසි ජල අපවහන ඇලවල් සතරක් තිබේ. ඇලවල් වල ඇති මට්ටම් හා සම්බන්ධ දෝෂයන් හේතු කොට ගෙන ජල අපවහනය විශේෂ අභියෝගයන්ට මුහුණ දෙයි. කලපුවේ ජලය නාගරික ප්‍රදේශයේ ඇති ප්‍රධාන අපවහන මාර්ගයන් දිගේ ඉහලට ගලා එයි. වලවල් වලින් හා ටැංකි වලින් එකතු කර ගන්නා අපජලය හලාවත සුළු නගර සභාව විසින් කෙලින්ම භූමියේ මතු පිටට හිස් කරනු ලබයි. මූලික රෝ හලේ අපජලය පොම්ප කිරීමේ ප්‍රධාන නල මාර්ගයක් මගින් දුම්රිය මාර්ගය හා මුහුදු අතර ඇති පොකුණක් වෙත කෙලින්ම යවනු ලබයි.

යෝජිත යෝජනා ක්‍රමය යටතේ මුහුදු කරා දිවෙන මීටර 500 ක කෙටි නලයක් සහිත දිනකට ඝණ මීටර 1000 ක ධාරිතාවයකින් යුත් ප්‍රතිකාරක යන්ත්‍රාගාරයක් ඉදි කරනු ඇත. ව්‍යාපෘතියේ මුළු පිරිවැය රුපියල් මිලියන 3,776 ක් වන අතර නිවාස 1050 ක් යෝජනා ක්‍රමය හා සම්බන්ධ කරනු ලබනවා ඇත.

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා වූ කොන්ත්‍රාත්තුව M/s CCOEC – JSE JV (විදේශීය ආර්ථික සහයෝගිතාවය සඳහා වූ චීන ජාතික සංස්ථාව හා ගෝල්ඩන් ස්ටේට් පාරිසරික සංස්ථාව අතර බද්ධ ව්‍යාපාරය) වෙත 2014 නොවැම්බර් 05 වැනි දින ප්‍රදානය කරන ලද අතර අරමුදල් සැපැයීමට යෝජිත බැංකුව වන්නේ මහජන චීනයේ අපනයන ආනයන බැංකුවයි. මහජන චීනයේ අපනයන ආනයන බැංකුව හා ශ්‍රී ලංකා ජන රජය අතර ණය ගිවිසුම අත්සන් කරනු ලැබීමට නියමිතව තිබේ. පාරිසරික බලපෑම් තක්සේරුව පිළිබඳ අවසාන වාර්තාවේ කෙටුම් පත නිරීක්ෂණ සඳහා නාගරික සංවර්ධන අධිකාරිය වෙත යොමු කරනු ලැබ ඇත. පරදු ධාරීන්ගේ රැස්වීම පවත්වන ලද අතර අදාල බලධාරීන්ගෙන් ලැබෙන නිරීක්ෂණ ඉදිරිපත් කරනු ලැබීමට නියමිතව තිබේ.

2. පුත්තලම අපජල බැහැර කිරීමේ පද්ධතිය.

පුත්තලම කොළඹට කිලෝ මීටර 125 ක් උතුරින් පිහිටා ඇති අතර එය කුඩා නගරයක් වුව ද ඉතාම ජනාකීර්ණ නගරයකි. එය ලුනු හා ධීවර කර්මාන්තය සම්බන්ධයෙන් ප්‍රසිද්ධියක් උසුලයි. පුත්තලම කලපුව ශ්‍රී ලංකාවේ කලපු අතුරින් විශාලතම කලපුවකි. නොරොච්චෝලෙයි ගල් අඟුරු බලාගාරය පිහිටා ඇත්තේ පුත්තලමට කිලෝ මීටර 12 ක් දුරින් කල්පිටිය අර්ධ ද්වීපයේය.

යෝජිත යෝජනා ක්‍රමය යටතේ මුහුදු කරා දිවෙන මීටර් 500 ක දිගින් යුත් නල මාර්ගයක් සහිතව දිනකට ඝණ මීටර 1000 ක ධාරිතාවයකින් යුත් ප්‍රතිකාරක යන්ත්‍රාගාරයක් ඉදි කිරීම යෝජිතව තිබේ. ව්‍යාපෘතියේ මුළු පිරිවැය රුපියල් මිලියන 4,025 ක් වන අතර නිවාස 1250 ක් යෝජනා ක්‍රමය සමග සම්බන්ධ කරනු ලබනවා ඇත.

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා වූ කොන්ත්‍රාත්තුව M/s CCOEC – JSE JV (විදේශීය ආර්ථික සහයෝගිතාවය සඳහා වූ චීන ජාතික සංස්ථාව හා ගෝල්ඩන් ස්ටේට් පාරිසරික සංස්ථාව අතර බද්ධ ව්‍යාපාරය) වෙත 2014 නොවැම්බර් 05 වැනි දින ප්‍රදානය කරන ලද අතර අරමුදල් සැපැයීමට යෝජිත බැංකුව වන්නේ මහජන චීනයේ අපනයන ආනයන බැංකුවයි. මහජන චීනයේ අපනයන ආනයන බැංකුව හා ශ්‍රී ලංකා ජන රජය අතර ණය ගිවිසුම අත්සන් කරනු ලැබීමට නියමිතව තිබේ. පාරිසරික බලපෑම් තක්සේරුව පිළිබඳ අවසාන වාර්තාවේ කෙටුම් පත නිරීක්ෂණ සඳහා නාගරික සංවර්ධන අධිකාරිය වෙත යොමු කරනු ලැබ ඇත. පරදු ධාරීන්ගේ රැස්වීම පවත්වන ලද අතර අදාල බලධාරීන්ගෙන් ලැබෙන නිරීක්ෂණ ඉදිරිපත් කරනු ලැබීමට නියමිතව තිබේ.

දකුණු පලාත

1. හම්බන්තොට අපජල බැහැර කිරීමේ ව්‍යාපෘතිය.

ප්‍රධාන වශයෙන්ම ජාත්‍යන්තර මුහුදු තොටක් වශයෙන් සංවර්ධනය වීමේ අති විශාල විභව හැකියාවක් ඇති ස්වාභාවික වරාය සමග අන්තර් සම්බන්ධතාවය ඇති කරමින් හම්බන්තොට ආර්ථික කේන්ද්‍රයක් වශයෙන් සංවර්ධනය කරනු ලැබීමට නියමිතව ඇත. යෝජිත යටිතල පහසුකම් සංවර්ධන සැලැසුම් වලට තෙල් පිරිපහදුව, කර්මාන්ත කලාපය හා පරිපාලන කේන්ද්‍රය, ජාත්‍යන්තර සම්මේලන මධ්‍යස්ථානය, උද්භිද උද්‍යානය, ජාත්‍යන්තර ක්‍රීඩා සංකීර්ණය හා ජාත්‍යන්තර ගුවන් තොටුපොල ඇතුලත් වේ. මල අපවහන සම්බන්ධතාවයන් ආසන්න වශයෙන් 9,034 ක් සම්පාදනය කර දීමට අපේක්ෂා කරනු ලැබේ. වරාය පරිශ්‍රය තුළ ස්ථානගත කරනු ලැබ ඇති කර්මාන්තයන් වෙත සේවා සැපැයීම සඳහා වරාය සංවර්ධන ප්‍රදේශය තුළ ජල සම්පාදන හා මලාපවහන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලැබීමට කටයුතු කරනු ලබනවා ඇත. ඇස්තමේන්තු කරනු ලැබ ඇති මුළු පිරිවැය රුපියල් මිලියන 11,519 ක් වේ.

හම්බන්තොට අපජල බැහැර කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා වූ කොන්ත්‍රාත්තුව විදේශීය ආර්ථික හා තාක්ෂණික සහයෝගිතාවය සඳහා වූ චීන රෙදිපිළි කර්මාන්ත සංස්ථාව වෙත ප්‍රදානය කරනු ලැබ ඇති අතර පාර්ශව දෙක අතර ගිවිසුම ද අත්සන් කරනු ලැබ ඇත. පොම්පාගාරයන් හා අපජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය ඉදි කිරීම සඳහා අවශ්‍ය ඉඩම් දැනටමත් අත් පත් කරගනු ලැබ ඇත. ව්‍යාපෘතියේ පාරිසරික බල පෑම් තක්සේරු වාර්තාව ඉදිරිපත් කරනු ලැබූ අතර ඒ අනුව ව්‍යාපෘතිය සඳහා පාරිසරික අවසරය ද ලබාගෙන ඇත.

යෝජිත අපජල බැහැර කිරීමේ පද්ධතිය කිලෝ මීටර 42 ක දිගින් යුත් ප්‍රධාන ගුරුත්ව නල මාර්ගය, කිලෝ මීටර 72 ක දිගින් යුත් ආරෝහක හා ශාඛා පල්දෝරු නල මාර්ග, කිලෝ මීටර 14 ක දිගින් යුත් පොම්ප කිරීමේ නල මාර්ග, පොම්ප කිරීමේ ස්ථානයන් 12 ක් හා දිනකට ජලය ඝණ මීටර 12,000 ක ධාරිතාවයකින් යුත් ප්‍රතිකාරක යන්ත්‍රාගාරය ද යන අංගයන්ගෙන් සැදුම් ලත් අපජල ජාලිත කිරීමේ ජාලයකින් (wastewater reticulation network) සමන්විත වේ. ප්‍රතිකාරිත අපවාහය වාරි මාර්ග පරමාර්ථයන් සඳහා නැවත භාවිතා කරනු ලැබීමට සැලැසුම් කරනු ලැබ ඇත.

2. මාතර අපජලය රැස් කිරීමේ, ප්‍රතිකාරිත කිරීමේ හා බැහැර කිරීමේ පද්ධතිය

මාතර යනු ශ්‍රී ලංකාවේ දකුණු පලාතේ මාතර දිස්ත්‍රික්කය තුළ පිහිටා ඇති කැපී පෙනෙන නගරයක් වේ. මෙම නගරය ජාතික භෞතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කරනු ලැබ ඇති කලාපීය ව්‍යුහාත්මක සැලැසුම යටතේ ප්‍රථම වර්ගයට අයත් නාගරික මධ්‍යස්ථානයක් වශයෙන් දියුණු කරනු ලැබිය යුතු නගරයක් ලෙස හඳුනාගනු ලැබ ඇත. මෙම නගරය ප්‍රථම වර්ගයට අයත් නගරයක් වශයෙන් සංවර්ධනය කරනු ලැබීම නිසා නගරයේ අපජල ජනනය වීම පිළිබඳව කටයුතු කිරීම වැදගත් කර්තව්‍යයක් වේ. මාතර කඩවත් සතර තුළ ආසන්න වශයෙන් 74,193 ක පමණ ජන ගහණයක් ජීවත් වන අතර මාතර මහ නගර සභා බල ප්‍රදේශය තුල පිහිටා ඇති ග්‍රාම නිලධාරී වසම් සංඛ්‍යාව 38 ක් වේ. තවද, යෝජිත ව්‍යාපෘතිය මගින් ග්‍රාම නිලධාරී වසම් 37 ක් තුළ ජීවත් වන ජනතාව ප්‍රතිලාභ ලබනු ඇත. ආසන්න වශයෙන් 69,471 ක ජනතාවක් ව්‍යාපෘතිය මගින් ආවරණය කරනු ලැබීමට යෝජිතව ඇති අතර මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සැලැසුම් කරනු ලැබ ඇති තෙත් කාලගුණික ප්‍රවාහය දිනකට ජලය ඝණ මීටර 11,00 ක් වේ. යෝජිත මලාපවහන පද්ධතිය මගින් මුළු ජන ගහණයෙන් ආසන්න වශයෙන් 80% ක් පමණ ආවරණය කරනු ලබන අතර මේ යටතේ පල්දෝරු සම්බන්ධතා 15,312 ක් සම්පාදනය කර දීමට යෝජිත වේ.

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ඇස්තමේන්තු කරනු ලැබ ඇති මුළු පිරිවැය රුපියල් මිලියන 21,362 ක් වනු ඇත. මාතර අපජල ව්‍යාපෘතිය වෙනුවෙන් ව්‍යාපෘති සමාලෝචන කමිටුවේ හා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතීන් ලබාගෙන ඇති අතර ව්‍යාපෘති සංකල්ප පත්‍රිකාව අනුමැතිය සඳහා ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබ ඇත. තවද මුළු පිරිවැය ඇස්තමේන්තුව 2017 වර්ෂය තුළදී සංශෝධනය කරන ලද අතර සංශෝධිත ඇස්තමේන්තුව සඳහා ව්‍යාපෘති සමාලෝචන කමිටුවේ හා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන ඇත. ආර්ථික කළමනාකරණය පිළිබඳ අමාත්‍ය මණ්ඩල කමිටුව සමග පවත්වන්නට යෙදුන සාකච්ඡාවකින් අනතුරුව ඉහත සඳහන් ව්‍යාපෘතිය පිළිබඳව සවිස්තරාත්මක සාධ්‍යතා අධ්‍යයනයක් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය සමග එක් වී පැවැත්වීම සඳහා කොරියාවේ ISAN සංස්ථාව වෙත අනුමැතිය ලබා දෙන ලද අතර ඒ සඳහා අරමුදල් සම්පාදනය කරනු ලබන්නේ කොරියාවේ පාරිසරික කර්මාන්ත හා තාක්ෂණවේද ආයතනය (KEITI) සහ කොරියාවේ ISAN සංස්ථාව විසින් වේ.

නැගෙනහිර පලාත

1. කාත්තන්කුඩි අපජල බැහැර කිරීමේ ව්‍යාපෘතිය

කාත්තන්කුඩි යනු නැගෙනහිර පලාතේ මඩකලපුව දිස්ත්‍රික්කය තුළ මඩකලපුව නගරයට කිලෝ මීටර 7.0 ක් දකුණු දෙසින් පිහිටා ඇති වෙරළබඳ නගරයක් වන අතර එය ග්‍රාම නිලධාරී වසම් 18 කින් සමන්විත වේ. එය වර්ග කිලෝ මීටර 3.89 ක ප්‍රදේශයක් පුරා පැතිර පවතී. ප්‍රතිකාරක යන්ත්‍රාගාරය ස්ථානගත කරනු ලැබීමට යෝජිතව ඇත්තේ කාත්තන්කුඩි නගරය තුළ වන අතර ඒ සඳහා ඉඩම් හිමියන්ගේ විකඟත්වය මේ වසර තුළදී ලබා ගෙන ඇත. මල අපවහන සම්බන්ධතාවයන් ආසන්න වශයෙන් 13,308 ක් සම්පාදනය කර දීමට අපේක්ෂා කරනු ලැබේ. ඇස්තමේන්තුගත කරන ලද මුළු පිරිවැය රුපියල් මිලියන 11,407 ක් වේ.

කාත්තන්කුඩි අපජල බැහැර කිරීමේ ව්‍යාපෘතිය සම්බන්ධ කොන්ත්‍රාත්තුව දැනටමත් හුනාන් ඉදි කිරීම් ඉංජිනේරු සමූහ සංස්ථාව වෙත ප්‍රදානය කරනු ලැබ ඇති අතර කොන්ත්‍රාත්කරු හා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය අතර ගිවිසුම ද අත්සන් කරනු ලැබ ඇත. ණය ගිවිසුම අත්සන් කිරීම ද නොබෝ කලකින් සිදු කරනු ලැබීමට නියමිත අතර ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම ආරම්භ කිරීම 2018 වර්ෂයේදී සිදු කරනු ලැබීමට අපේක්ෂිතය. ආරම්භක පාරිසරික පිරික්සුම් අධ්‍යයනය පේරාදෙණිය විශ්ව විද්‍යාලය විසින් නිම කරනු ලැබ ඇති අතර අධ්‍යයනය සඳහා පාරිසරික අවසරය ලබා ගත යුතුව ඇත. පොම්පාගාර හා ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය ඉදි කිරීම සඳහා අවශ්‍ය ඉඩම් අත් පත් කර ගැනීමේ කටයුතු මේ වන විට සිදු කරනු ලබමින් පවතී.

2. මඩකලපුව අපජලය රැස් කිරීමේ, ප්‍රතිකාරිත කිරීමේ හා බැහැර කිරීමේ ව්‍යාපෘතිය.

සංචාරක කර්මාන්තය දියුණු කිරීම සඳහා සහ ධීවර කර්මාන්තය ව්‍යාප්ත කිරීම සඳහා එය සතුව ඇති ඉහල විභව හැකියාව හේතු කොට ගෙන මඩකලපුව නගරය ධීවර කටයුතු හා සංචාරක කර්මාන්තය හා සම්බන්ධ නාගරික අභිපිණ්ඩයක් (urban agglomeration) වශයෙන් සංවර්ධනය කරනු ලැබීමට අපේක්ෂිත වේ. 2030 වර්ෂය වන විට මෙම නගරය යෝජිත නාගරික මධ්‍යස්ථාන ථෙරාවලිය (hierarchy) තුළ දෙවැනි මට්ටමේ සේවා මධ්‍යස්ථානයක් වශයෙන් සංවර්ධනය කරනු ලැබීමට නියමිතව ඇත. මෙම ප්‍රදේශය පිහිටා ඇත්තේ මුහුදු හා කලපු අතර ඇති පටු බිම් තීරුවක වේ. භූගත ජල ස්ථරය ඉතා නොගැඹුරු වන අතර ජන ගහණයේ ඝණත්වය ඉහල මට්ටමක පවත්නා හෙයින් මේ ප්‍රදේශය සඳහා ස්ථානගත සනීපාරක්ෂණය තිරසාර විසඳුමක් වන්නේ නැත. එසේ හෙයින් මඩකලපුවේ වාසය කරන ජනතාවගේ සෞඛ්‍යය හා යහපැවැත්ම සම්බන්ධ ගැටළු ආමන්ත්‍රණය කිරීම සඳහා සහ ධීවර කර්මාන්තය හා බද්ධ වූ කලපුව වෙත දූෂිත වූ ජලය සෘජුවම ගලා යාම අවම කිරීම සඳහා ඉවහල් වන සුදුසු මල අපවහන යෝජනා ක්‍රමයක් හඳුන්වා දීම විශාලතම හා ඉතා කඩිනමින් සිදු කළ යුතුව ඇති කාර්යයක් වශයෙන් හඳුනාගනු ලැබ ඇත. ඉහතින් සඳහන් කරනු ලැබ ඇති ව්‍යාපෘතිය ඉදි කිරීම සඳහා තාවකාලික වශයෙන් ඇස්තමේන්තු කරනු ලැබ ඇති මුළු පිරිවැය රුපියල් මිලියන 14,915 ක් වන්නේය.

මඩකලපුව අපජල ව්‍යාපෘතිය සඳහා ව්‍යාපෘති සමාලෝචන කමිටුවේ හා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන ඇති අතර ව්‍යාපෘති සංකල්ප පත්‍රිකාව ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කරනු ලැබ ඇත. අපජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය ඉදි කිරීමේ කටයුතු සඳහා ප්‍රාදේශීය ලේකම් වරයා වෙතින් අක්කර 50 ක ඉඩමක් ලබාගෙන ඇති අතර පොම්පාගාරයන් ඉදි කිරීම සඳහා අවශ්‍ය ඉඩම් අත් පත් කර ගැනීමේ වැඩ කටයුතු දැනට ක්‍රියාත්මක කරනු ලබමින් පවතී. ව්‍යාපෘතිය වෙනුවන් වූ ජාරිසරික බල පෑම් තක්සේරු අධ්‍යයනය 2018 වර්ෂය තුළදී සිදු කරනු ලැබීමට නියමිතව ඇත.

3. එරාවුර් සඳහා වන අපජල රැස් කිරීමේ, ප්‍රතිකාරිත කිරීමේ හා බැහැර කිරීමේ පද්ධතිය

ආර්ථික සංවර්ධනය සඳහා එහි ඇති ඉහල විභව හැකියාව හේතුකොට ගෙන එරාවුර් නගරය නාගරික අභිපිණ්ඩයක් (urban agglomeration) වශයෙන් සංවර්ධනය කරනු ලැබීමට අපේක්ෂිත වේ. කෘෂි කර්ම ආයෝජනයන් හා යටිතල පහසුකම් සංවර්ධන කටයුතු මාර්ගයෙන් මෙම නගරය ආර්ථික වර්ධනය සාක්ෂාත් කර ගනු ලබනු ඇතැයි අපේක්ෂා කරනු ලැබේ. එරාවුර්හි පිහිටා ඇති කලපුව සංරක්ෂණය කිරීම හා එය නීති විරෝධී ක්‍රියාකාරකම් වලට එරෙහිව ආරක්ෂා කර ගැනීම ප්‍රමුඛත්ව ක්‍රියාකාරකමක් වනු ඇත. මෙම මැදිහත් වීම් තුළින් ආර්ථික හා ධීවර කර්මාන්තය හා අදාල කටයුතු ප්‍රවර්ධනය කරනු ලබනවා ඇත.

භූගත ජල ස්ථරය ඉතා නොගැඹුරු වන අතර ජන ගහණයේ ඝණත්වය ඉහල මට්ටමක පවත්නා හෙයින් මේ ප්‍රදේශය සඳහා ස්ථානගත සනීපාරක්ෂණය තිරසාර විසඳුමක් වන්නේ නැත. එසේ හෙයින් එරාවුර්හි වාසය කරන ජනතාවගේ සෞඛ්‍යය හා යහපැවැත්ම සම්බන්ධ ගැටළු ආමන්ත්‍රණය කිරීම සඳහා සහ දූෂිත වූ ජලය කලපුව දූෂණය වීමට තුඩු දෙන පරිදි සෘජුවම පොලව මත ගලා යාම අවම කිරීම සඳහා ඉවහල් වන සුදුසු මල අපවහන යෝජනා ක්‍රමයක් හඳුන්වා දීම විශාලතම හා ඉතා කඩිනමින් සිදු කළ යුතුව ඇති කාර්යයක් වශයෙන් හඳුනාගනු ලැබ ඇත.

ග්‍රාම නිලධාරී වසම් 17ක පවුල් ඒකක 8,073 ක් තුළ ජීවත් වන ආසන්න වශයෙන් 40,364 ක් පමණ වූ ජන ගහණයක් මෙම ව්‍යාපෘතිය හරහා සෘජුවම ප්‍රතිලාභ ලබනු ඇත. ඉහතින් සඳහන් කරනු ලැබ ඇති

ව්‍යාපෘතිය ඉදි කිරීම සඳහා යාවත්කාල ලෙස ඇස්තමේන්තු කරනු ලැබ ඇති මුළු පිරිවැය රුපියල් මිලියන 12,127 ක් වේ.

ව්‍යාපෘතිය වෙනුවෙන් වූ ව්‍යාපෘති සමාලෝචන කමිටු අනුමැතිය හා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන ඇති අතර ව්‍යාපෘති සංකල්ප පත්‍රිකාව අනුමැතිය සඳහා ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබ ඇත. අපජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය ඉදි කිරීම සඳහා අවශ්‍ය ඉඩම ලබා දෙන ලෙස ප්‍රාදේශීය ලේකම් වරයා වෙත ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබ ඇති අතර පොම්පාගාර ඉදි කිරීම සඳහා සුදුසු ඉඩම් හඳුනා ගැනීමේ කටයුත්ත සිදු කරනු ලැබිය යුතුව ඇත.

4. කල්මුනෙයි සඳහා වන අපජල රැස් කිරීමේ, ප්‍රතිකාරිත කිරීමේ හා බැහැර කිරීමේ පද්ධතිය

කල්මුනෙයි නගරය ධීවර කර්මාන්ත හා කෘෂි කාර්මික ආයෝජනයන් සහ යටිතල පහසුකම් සංවර්ධනය පදනම් කර ගනිමින් ආර්ථික වර්ධනය සාක්ෂාත් කර ගනු ලබනු ඇතැයි අපේක්ෂා කරනු ලැබේ. මෙම මැදිහත් වීම් මගින් ආර්ථික හා ධීවර කර්මාන්තයට අදාල ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය වීම හා පහසුකරණය වීම සිදු වනු ඇත. කල්මුනෙයි මහ නගර සභා ප්‍රදේශය යනු අම්පාර දිස්ත්‍රික්කයේ නැගෙනහිර වෙරළ තීරයේ පිහිටා ඇති පහල මට්ටමේ වෙරළබඩ නගරයක් වේ. මෙම ප්‍රදේශය මුහුදු වෙරළ ඔස්සේ පිහිටා ඇති පටු බිම් තීරුවක් වන අතර එහි පළල සාමාන්‍යය කිලෝ මීටර 1 ක් වන අතර දිග කිලෝ මීටර 10 ක් වේ.

යෝජිත ප්‍රදේශය කල්මුනෙයි ද්‍රවිඩ කොට්ඨාශය, කල්මුනෙයි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය හා සයින්තමරුදු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය යන නම් වලින් හැඳින්වෙන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තුනකින් සමන්විත වේ. ග්‍රාම නිලධාරී වසම් 75 ක පවුල් ඒකක 34,307 ක් තුළ ජීවත් වන ආසන්න වශයෙන් 137,230 ක පමණ ජන ගහණයක් මෙම ව්‍යාපෘතිය හරහා සෘජු ලෙස ප්‍රතිලාභ ලබනු ඇත. මෙම යෝජිත ව්‍යාපෘතිය සඳහා වූ සැලැසුම් තෙත් කාලගුණික ප්‍රවාහය දිනකට ජලය ඝණ මීටර 21,731 ක් වේ.

අපජලය ආසන්න වශයෙන් කිලෝ මීටර 200 ක පමණ වූ සමපීඩන නල පද්ධතියක් ඔස්සේ රැස් කොට කල්මුනෙයි සී වීථි මාර්ගයේ ඉදි කරනු ලැබ ඇති අපජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය වෙත පොම්ප කරනු ලබනවා ඇත. ජල ප්‍රතිකාරක ක්‍රියාවලිය විසින් අපජලය තුළ අන්තර්ගත අපවිත්‍ර කාරකයන් අවශ්‍ය අපවාහ බැහැර කිරීම් තත්ත්වය දක්වා අඩු කරනු ලබනවා ඇත. ඉහතින් සඳහන් කරනු ලැබ ඇති ව්‍යාපෘතිය ඉදි කිරීම සඳහා යාවත්කාල ලෙස ඇස්තමේන්තු කරනු ලැබ ඇති මුළු පිරිවැය රුපියල් මිලියන 34,667 ක් වේ.

ව්‍යාපෘතිය සඳහා ව්‍යාපෘති සමාලෝචන කමිටුවේ අනුමැතිය ලබාගෙන ඇති අතර අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය 2018 වර්ෂය තුළදී ලබා ගැනීමට නියමිත වේ. ඒ අතර ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුවේ අනුමැතිය සඳහා ව්‍යාපෘති සංකල්ප පත්‍රය ඉදිරිපත් කළ යුතුව ඇත. තවද පොම්පාගාරයන් හා අපජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය ඉදි කිරීම සඳහා අවශ්‍ය සුදුසු ඉඩම් හඳුනා ගැනීමේ කාර්යය සිදු කළ යුතුව ඇත.

උඟව පලාත

1. බදුල්ල අපජල රැස් කිරීමේ හා බැහැර කිරීමේ ව්‍යාපෘතිය

බදුල්ල මහ නගර සභා ප්‍රදේශය වූ කලී අධික ලෙස නාගරීකරණය වූ, නේවාසික හා වාණිජ ප්‍රදේශයක් වන අතර එය සැලැකිය යුතු තරම් ඉහල මට්ටමක අපජල ජනන පරිමාවක් අත් විඳිමින් තිබෙන ප්‍රදේශයකි. බදුල්ල නගරය තුළ අපජලය රැස් කිරීමේ හා බැහැර කිරීමේ යෝග්‍ය ක්‍රමයක් නොමැති වීමේ හේතුව සැලැකිය යුතු මට්ටමක පරිසර දූෂණයකට තුඩු දී ඇති අතර මෙම තත්ත්වය විශේෂයෙන්ම බදුල්ල නගරය වටා ගලා බසින බදුළු ඔය දූෂණය වීමට දැඩි ලෙස බල පා ඇත. නගරයෙන් පහත යටි ගං ප්‍රදේශයේ පදිංචි වී සිටින ජනතාවගේ ප්‍රධාන ජල ප්‍රභවය වන බදුළු ඔයේ ජලයේ ගුණාත්මය උග්‍ර ලෙස පහත වැටී ඇති අතර මේ තත්ත්වය නිසා බදුල්ල මහ නගර සභා සීමාව තුළ නල මලාපවහන පද්ධතියක් ස්ථාපිත කිරීමේ අවශ්‍යතාවය පැහැ නැගී ඇත.

යෝජිත ව්‍යාපෘතිය මගින් බදුල්ල නාගරික ප්‍රදේශය හා ඉහල නේවාසික ප්‍රදේශයන් වන බදුළුපිටිය, බදුල්ල නැගෙනහිර හා බදුල්ල මධ්‍යම ඇතුළු අර්ධ නාගරික ග්‍රාම නිලධාරී වසම් ආවරණය කරනු ලැබීමට අපේක්ෂිතය. 2044 වර්ෂය වන විට සෘජු ලෙස සේවය සපයනු ලැබීමට ප්‍රක්ෂේපිත ජන ගහණය ග්‍රාම නිලධාරී වසම් 3 ක් තුළ ගෘහස්තයන් 3,732 ක ජීවත් වන 16,798 ක සංඛ්‍යාවකි. ස්ථිර පදිංචි කරුවන්ට අමතරව 27,000 ක අනියම් ජන ගහණයක් ද යෝජිත ව්‍යාපෘතියේ ප්‍රතිලාභ ලබනු ඇත. ව්‍යාපෘතිය වෙනුවෙන් ඇස්තමේන්තු කරනු ලැබ ඇති මුළු පිරිවැය රුපියල් මිලියන 7,473 ක් වේ.

යෝජිත අපජල බැහැර කිරීමේ පද්ධතිය අපජල ජාලිත පද්ධතියකින් ද, කිලෝ මීටර 16.9 ක දිගින් යුත් ගුරුත්ව කසල කාණු පද්ධතියක් ඇතුලත් අපජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයකින් ද, කිලෝ මීටර 10 ක ආරෝහක ප්‍රධාන නල මාර්ගයන්ගෙන් ද, 5.3 ක දිගින් යුත් පොම්පකිරීමේ ප්‍රධාන නල මාර්ගය පොම්පාගාරයන් 11 කින් ද, දිනකට ජලය ඝණ මීටර 4,000 ක ධාරිතාවයකින් යුත් අපජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයකින් ද සමන්විත වන අතර ප්‍රතිකාර කරන ලද අපජලය අවසානයේදී බදුළු ඔය වෙත මුදා හරිනු ලබනවා ඇත.

දැනට මෙම ව්‍යාපෘති යෝජනාව ව්‍යාපෘති අනුමැතිය සඳහා ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබ ඇත.

ක්‍රම සම්පාදනය හා සැලැසුම්කරණය - (මලාපවහන)

2017 වර්ෂය තුළදී සිදු කරන ලද ක්‍රම සම්පාදන කටයුතු

ක්‍රම සම්පාදන හා සැලැසුම් (මලාපවහන) අංශය ක්‍රියාත්මක වන්නේ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ අතිරේක සාමාන්‍යාධිකාරී (මලාපවහන) කාර්යාලය යටතේ වන අතර එය වෙත පවරනු ලැබ ඇති මූලික ක්‍රියාකාරකම් වන්නේ යෝජිත මලාපවහන යෝජනා ක්‍රමයන් හා සම්බන්ධ සාධ්‍යතා අධ්‍යයනයන් සිදු කිරීම ද, දැනට ක්‍රියාත්මක තත්ත්වයේ පවතින අපජල බැහැර කිරීම් ව්‍යාපෘති වලට අදාල සැලැසුම් සමාලෝචන කටයුතු සිදු කිරීම ද, විවිධ රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනයන් වෙනුවෙන් ප්‍රතිආරෝපනය කළ හැකි ව්‍යාපෘතීන් සඳහා සවිස්තරාත්මක සැලැසුම් කටයුතු සිදු කිරීම හා යෝජිත මලාපවහන ව්‍යාපෘතීන්ට අදාල පාරිසරික අධ්‍යයනයන් (පාරිසරික බලපෑම් තක්සේරු) සිදු කිරීම ආදී කර්තව්‍යයන් වේ.

2017 වර්ෂය තුළදී කල්මුනෙයි, චිරාවුර් හා පොලොන්නරුව නාගරික ප්‍රදේශයන් වෙනුවෙන් නල අපජල බැහැර කිරීම් යටිතල පහසුකම් සැපැයීම හා අදාල සාධ්‍යතා අධ්‍යයනයන් සිදු කරන ලද අතර දැනට එම අධ්‍යයනයන් සියල්ල සම්පූර්ණ කොට අදාල සියළුම සාධ්‍යතා වාර්තාවන් අනුමැතිය සඳහා ව්‍යාපෘති සමාලෝචන කමිටුව වෙත ඉදිරිපත් කරනු ලැබ ඇත. වෙරළ තීරයද ඇතුලත් කළුතර හා අළුත්ගම නාගරික ප්‍රදේශයන් වෙත නල අපජල බැහැර කිරීම් යටිතල පහසුකම් සම්පාදනය කර දීමට අදාල නව සාධ්‍යතා වාර්තාවන් පිළියෙල කිරීම දැනට ආරම්භ කරනු ලැබ ඇත.

මීට අමතර වශයෙන් ලෝක බැංකුව විසින් අරමුදල් සම්පාදනය කරනු ලබන ජල හා සනීපාරක්ෂණ වැඩි දියුණු කිරීම් ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක වන මොනරාගල පූතික ප්‍රතිකාරක යන්ත්‍රාගාරය වෙනුවෙන් අපද්‍රව්‍ය ස්ථායිකරණ පොකුණු පද්ධතියක් ද සැලැසුම් කරන ලදි.

මීට වැඩිමනත් වශයෙන් නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ උපදෙස් යටතේ රත්මලානේ රජ මාවත සඳහා කසල කාණු ජාලිත කිරීම හා මල අපවහන පොම්පාගාරයක් ඉදි කිරීම හා සම්බන්ධ සවිස්තරාත්මක සැලැසුම් සකස් කිරීම හා මිළ ගණන් කැඳවීම සිදු කරන ලදි. තවද දැනට ක්‍රියාත්මක කරනු ලබමින් පවතින කතරගම ශුද්ධ නගර ප්‍රදේශය

සඳහා වූ මල අපවහන යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් ක්‍රම සම්පාදන හා සැලැසුම් (මලාපවහන) අංශය විසින් යෝජිත ගොහොදු වියලීම් තට්ටු හා ස්ථානය භාර නිලධාරියාගේ නිල නිවාසය ඉදි කිරීමට හා කසල දෝරු නල සපයා වීලීමට ද අදාල සැලැසුම් සකස් කිරීම ද, රූප සටහන්, ප්‍රමාණ පත්‍ර හා ඇස්තමේන්තු පිළියෙල කිරීම ද සිදු කරන ලදි.

ක්‍රියාත්මක කිරීම සඳහා පෙළ ගස්වනු ලැබ ඇති ප්‍රධාන මලාපවහන ව්‍යාපෘතීන්ට අදාල ප්‍රලේඛන කටයුතු, මිළ ගණන් කැඳවීම් හා පාරිසරික බලපෑම් තක්සේරු අධ්‍යයනයන් හා මූලික පාරිසරික පරීක්ෂණ අධ්‍යයනයන් ක්‍රියාත්මක කරනු ලබන්නේ ක්‍රම සම්පාදන හා සැලැසුම් (මලාපවහන) අංශය විසින් වේ. මෙම කටයුතු යටතේ 2017 වර්ෂය තුළදී කතරගම හා හම්බන්තොට අපජල බැහැර කිරීම් ව්‍යාපෘති වලට අදාල මූලික පාරිසරික පරීක්ෂණ අධ්‍යයනයන් නිම කරන ලද අතර එම ව්‍යාපෘතීන් වෙනුවෙන් මධ්‍යම පරිසර අධිකාරියේ අවසරය ලබා ගන්නා ලදි. මීට වැඩිමනත් වශයෙන් කාත්තන්කුඩි, මහරගම - බොරලැස්ගමුව හා හලාවත - පුත්තලම අපජල බැහැර කිරීමේ ව්‍යාපෘතීන් සඳහා වන මූලික පාරිසරික පරීක්ෂණ අධ්‍යයනයන් ද, දෙහිවල - ගල්කිස්ස හා ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ අපජල බැහැර කිරීමේ ව්‍යාපෘතීන් සඳහා වන පාරිසරික බලපෑම් තක්සේරු අධ්‍යයනයන් ද දැනට ක්‍රියාත්මක කරනු ලබමින් පවතී.

හම්බන්තොට අපජල බැහැර කිරීමේ ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය ඉඩම් අත් පත් කර ගැනීමේ කටයුතු සම්පූර්ණ කරනු ලැබ ඇත. තවද දෙහිවල - ගල්කිස්ස, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ, මහරගම - බොරලැස්ගමුව, මාතර, හලාවත - පුත්තලම, බදුල්ල, ගම්පහ, පොලොන්නරුව, කාත්තන්කුඩි, මඩකලපුව හා කල්මුනෙයි යන අපජල බැහැර කිරීම් ව්‍යාපෘතීන් වෙනුවෙන් අපජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරයන් හා පොම්පාගාරයන් ඉදි කිරීම සඳහා අවශ්‍ය ඉඩම් ලබා ගැනීම හා සම්බන්ධ ඉඩම් අත් පත් කර ගැනීමේ කටයුතු දැනට සිදු කරනු ලබමින් පවතී.

වාර්ෂික වාර්තාව - 2017

විගණන හා කළමනාකරණ කමිටුවේ වාර්තාව

"සමාලෝචනයට භාජනය කරනු ලබන වර්ෂය තුළදී විගණන හා කළමනාකරණ කමිටුව 5 වතාවක් රැස් වන ලදී."



විගණන හා කළමනාකරණ කමිටුව පිහිටුවන ලද්දේ 1999 නොවැම්බර් 19 වැනි දාතමින් හා PF/PE/3 අංකයෙන් යුත් චක්‍රලේඛය ප්‍රකාරව හා අංක 590 දරණ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ගන්නා ලද අංක 2965 (b) දරණ අධ්‍යක්ෂ මණ්ඩල තීරණය හරහා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලයෙන් ලබාගන්නා ලද එකඟතාවය අනුව ද වේ.

විගණන හා කළමනාකරණ කමිටුවේ පරමාර්ථය වන්නේ 2010 දෙසැම්බර් 14 දාතමින් හා අංක 55 දරණ PED මඟ පෙන්වීම් අනුව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සිය සහාය ලබා දීමයි.

කමිටුව සඳහා නියමිත භූමිකාවන් හා වගකීම් මෙහි පහත සඳහන් කර ඇති පරිදි දක්වනු ලැබ ඇත :

- අභ්‍යන්තර විගණකවරුන්ගේ අබන්ධ අපක්ෂපාතී භාවය කාර්ය සාධකත්වය සමාලෝචනයට භාජනය කිරීම විගණන හා කළමනාකරණ කමිටුව වෙතින් අපේක්ෂා කරනු ලැබේ.
- මූල්‍ය වාර්තාකරණය ශ්‍රී ලංකා ගිණුම් තැබීමේ ප්‍රමිතීන්ට හා වෙනත් අදාල කර ගත හැකි නෛතික අවශ්‍යතාවයන්ට අනුකූල ලෙස සිදු කරනු ලබන බවට වග බලා ගැනීම සඳහා අවශ්‍ය අභිප්‍රේක්ෂණ කර්තව්‍යයන් කිරීම පිණිස විගණන හා කළමනාකරණ කමිටුව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සහාය ලබා දිය යුතු වේ.
- රජය විසින් පණවනු ලැබ ඇති හා නිකුත් කරනු ලැබ ඇති සියළුම අදාල රීති, රෙගුලාසි හා චක්‍රලේඛ උපදෙස් වලට අනුකූල ලෙස කටයුතු සිදු කරනු ලබන බවට වග බලා ගැනීම සඳහා විගණන හා කළමනාකරණ කමිටුව විසින් අබන්ධ ලෙස සමාලෝචනයෙහි හා පසුවිපරමෙහි යෙදෙමින් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සිය සහාය ලබා දිය යුතු අතර ඊට අමතරව අනනුකූලතාවයන් පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත නිර්දේශ ඉදිරිපත් කළ යුතුය.
- විගණන හා කළමනාකරණ කමිටුව විසින් අභ්‍යන්තර/බාහිර විගණන වාර්තාවන්, කළමනාකරණ පත්‍රිකා හා පොදු ව්‍යවසායයන් පිළිබඳ කමිටුවේ (COPE) නිර්දේශයන් සමාලෝචනයට භාජනය කොට ප්‍රතිකාර්මික ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සහාය ලබා දිය යුතු වන්නේය.
- විගණන හා කළමනාකරණ කමිටුව ප්‍රමාණවත් අභ්‍යන්තර පාලන පද්ධතියක් හඳුන්වා දී ක්‍රියාත්මක කිරීම පිණිස සිය සහාය අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ලබා දිය යුත්තේය.

2017 වර්ෂය තුළදී කමිටුව පහත නම් සඳහන් සාමාජිකයින්ගෙන් සමන්විත විය :

1.	ජේ. එම්. යූ. පී. ජයමහ මහතා	-	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික - කමිටුවේ සභාපති
2.	ශාන්ත රත්නායක මහතා	-	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
3.	කේ. ඒ. සුබද්‍රා වල්පොල මහත්මිය	-	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
4.	ජී. ඒ. කුමාරරත්න මහතා	-	සාමාන්‍යාධිකාරී
	ඩී. යූ. සුමනසේකර මහතා	-	සාමාන්‍යාධිකාරී
5.	ඩී. තොටවත්ත මහතා	-	අතිරේක සාමාන්‍යාධිකාරී (මූල්‍ය)
6.	ජී. කේ. ඉද්දමල්ගොඩ මහතා	-	අතිරේක සාමාන්‍යාධිකාරී (මානව සම්පත් කළමනාකරණ)
7.	ඩබ්ලිව්. බී.ජී. ප්‍රනාන්දු මහතා	-	අතිරේක සාමාන්‍යාධිකාරී (සංස්ථානික සේවා)
8.	ආර්. එම්. ඒ. එස්. වීරසේන මහතා	-	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අභ්‍යන්තර විගණන)
9.	එම්. ෂෆීක් රාජබ්ඩීන් මහතා	-	උප සභාපති
10.	ඩී. එන්. පීරිස් මෙනෙවිය	-	විගණන අධිකාරී - රජයේ විගණන ඒකකය
	ඊ. ඒ. ජී. ආනන්ද මහතා	-	නියෝජ්‍ය විගණකාධිපති - රජයේ විගණන ඒකකය
11.	එස්. ඩබ්ලිව් . ගුණවර්ධන මෙනෙවිය	-	ප්‍රධාන අභ්‍යන්තර විගණක - නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය.
12.	ඩබ්ලිව්. පී. සඳමාලි ද සිල්වා මහත්මිය	-	අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම් - කමිටුවේ ලේකම්

සමාලෝචනයට භාජනය කරනු ලබන වර්ෂය තුළදී විගණන හා කළමනාකරණ කමිටුව 5 වතාවක් රැස්වූ අතර එම රැස්වීම් වලදී නිරන්තර සාකච්ඡාවට භාජනය කරන ලද වැදගත් නඩයපත්‍ර මාතෘකාවන් පහත සඳහන් පරිදි විය :

i. ක්‍රියාත්මක සැලැසුම, අධිකාරී බලය පැවැරීම, 2018 වර්ෂය සඳහා ප්‍රතිසම්පාදන සැලැසුම

ii. 2017 හා 2018 යන වර්ෂයන් සඳහා වූ අභ්‍යන්තර විගණන සැලැසුම

iii. 2018 වර්ෂය සඳහා වූ අය වැය ලේඛනය

iv. 2016 වර්ෂයේ 3 වැනි හා 4 වැනි කාර්තු වලට අදාල විගණන සාරාංශයන් හා 2017 වර්ෂයේ 1 වැනි, 2 වැනි හා 3 වැනි කාර්තු වලට අදාල විගණන සාරාංශයන්.

v. රජයේ විගණන විමසුම් සඳහා ප්‍රතිචාර

vi. 2016.12. 31 දිනෙන් අවසන් වූ වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන.

vii. ආදායම් රහිත ජලය

viii. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ මුදල් ප්‍රවාහ සටහන

ix. 2014/2015 හා 2016 වර්ෂයන්හි වාර්ෂික වාර්තා.

x. ව්‍යවස්ථාපිත ගෙවීම්

xi. බඳවාගැනීමේ ක්‍රමය

xii. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ අත් පොත්

විගණන හා කළමනාකරණ කමිටුවේ සෑම නිර්දේශයක්ම අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද අතර ඇතැම් කරුණු අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලදී වැඩි දුරටත් සාකච්ඡාවට භාජනය කරන ලදි.

මූල්‍ය ප්‍රකාශය

104 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

105 - 106 විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

107 ස්කන්ධ වෙනස් වීමේ ප්‍රකාශය

108 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

109 - 132 මූල්‍ය ප්‍රකාශවලට සටහන්

133 - 168 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විගණකාධිපති වාර්තාව.




Rs

ජාත්ක ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය

2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශය

		2017	2016
වත්කම්		රු.	රු.
ජංගම නොවන වත්කම්	සටහන්		(යළිප්‍රකාශිත)
දේපල පිරියත හා උපකරණ	15	**172,574,439,103**	162,321,652,152
අස්පෘශ්‍ය වත්කම්	16	**6,485,383**	7,310,270
කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ	17	**194,543,873,679**	158,512,035,894
වෙනත් මූල්‍ය වත්කම්	18	**8,230,469**	11,023,063
මුළු ජංගම නොවන වත්කම්		**367,133,028,633**	320,852,021,379
ජංගම වත්කම්			
තොග	19	**7,374,367,615**	6,643,472,555
වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ	20	**8,588,182,099**	6,512,154,920
තැන්පතු සහ අත්තිකාරම්	21	**42,124,651,650**	26,830,599,011
ආයෝජන	22	**12,240,208,742**	10,265,721,944
මුදල් හා මුදල් සමාන දෑ	23	**3,777,448,306**	12,092,709,720
මුළු ජංගම වත්කම්		**74,104,858,412**	62,344,658,150
මුළු වත්කම්		**441,237,887,046**	383,196,679,531
ස්කන්ධ හා බැරකම්			
ස්කන්ධය			
රජයේ දෙපාර්තමේන්තු වලින් පවරාගත් වත්කම්	24	**185,480,387**	185,480,387
රාජ්‍ය ප්‍රාග්ධනය	25	**77,512,499,566**	69,470,969,610
කාර්ය මණ්ඩල සුභ සාධන අරමුදල	26	**22,527,125**	17,228,139
රඳවාගත් ඉපයුම්		**(8,053,512,615)**	(9,785,684,856)
රජයේ ප්‍රදාන	27	**94,838,588,669**	92,742,583,734
ප්‍රාග්ධන ප්‍රදාන	28	**190,373,819,444**	181,542,682,665
මුළු ස්කන්ධය		**354,879,402,575**	334,173,259,679
ජංගම නොවන වගකීම්			
ගෙවිය යුතු ණය	29	**64,327,755,750**	34,441,527,519
වෙනත් විලම්බිත වගකීම්	30	**4,110,746,151**	4,125,023,486
මුළු ජංගම නොවන වගකීම්		**68,438,501,901**	38,566,551,005
ජංගම වගකීම්			
වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ	31	**13,925,103,379**	9,831,046,543
ගෙවිය යුතු ණය ප්‍රාග්ධනය (සටහන් අංක 29)		**2,833,921,592**	625,822,304
ගෙවිය යුතු ණය පොලිය		**1,160,957,598**	-
මුළු ජංගම වගකීම්		**17,919,982,569**	10,456,868,847
මුළු ස්කන්ධ හා බැරකම්		**441,237,887,046**	383,196,679,531

ඩී.තොටවත්ත
අතිරේක සාමාන්‍යාධිකාරී (මුදල්)

ඩී.යූ. සුමනසේකර
සාමාන්‍යාධිකාරී

පිටු අංක 08 සිට 15 දක්වා පිටුවල දැක්වෙන ගිණුම්කරන ප්‍රතිපත්ති හා පිටු අංක 16 සිට 30 දක්වා පිටුවල දැක්වෙන ගිණුම්කරන සටහන් මූල්‍ය ප්‍රකාශන වල අත්‍යාවශ්‍ය අංගයකි. මූල්‍ය ප්‍රකාශන පිලියල කිරීම හා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වගකියනු ලබයි. මෙම මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කර ඇති අතර ඒ වෙනුවෙන් අත්සන් කරනු ලැබේ.

කේ.ඒ.අන්සාර්
සභාපති
කොළඹ
2018 පෙබරවාරි 28 දින.

එම්. එච්. එම්. සල්මන්
උප සභාපති

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීරණ ආදායම් ප්‍රකාශය

	සටහන්	අයවැය 2017 රු.	සත්‍ය 2017 රු.	සත්‍ය 2016 රු. (යලිප්‍රකාශිත)
අයභාරය	7	29,523,486,200	**23,859,760,119**	23,584,727,487
විකුණුම් පිරිවැය	8	(15,807,092,652)	**(14,196,350,460)**	(13,485,727,343)
දල ලාභය		13,716,393,548	**9,663,409,658**	10,099,000,145
වෙනත් මෙහෙයුම් ආදායම් හා ලාභ	9	1,126,924,800	**1,724,463,148**	1,477,546,705
පරිපාලන වියදම්	10	(10,712,479,348)	**(9,935,315,824)**	(9,136,910,599)
වෙනත් මෙහෙයුම් වියදම්	11	(550,000,000)	**(714,465,635)**	(680,664,041)
මෙහෙයුම් ලාභය / (අලාභය)		3,580,839,000	**738,091,347**	1,758,972,209
මූල්‍ය ආදායම්	12	600,000,000	**1,157,359,094**	1,236,278,724
මූල්‍ය පිරිවැය	13	(8,198,000)	**(12,994,621)**	(3,281,535)
බදු පෙර ලාභය / (අලාභය)		4,172,641,000	**1,882,455,821**	2,991,969,398
බදු සඳහා වෙන් කිරීම	14	(100,000,000)	**(65,683,426)**	(63,287,387)
වර්ෂය සඳහා ලාභය/ අලාභය		4,072,641,000	**1,816,772,395**	2,928,682,011

පිටු අංක 08 සිට 30 දක්වා පිටුවල දැක්වෙන ගිණුම් ප්‍රතිපත්ති හා සටහන් මූල්‍ය ප්‍රකාශනවල අත්‍යාවශ්‍ය කොටසක් වේ.

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීරණ ආදායම් ප්‍රකාශය

	අයවැය 2017 රු.	සත්‍ය 2017 රු.	සත්‍ය 2016 රු. (යලිප්‍රකාශිත)
වර්ෂය සඳහා ලාභය/ අලාභය	4,072,641,000	**1,816,772,395**	2,928,682,011
වෙනත් විස්තීරණ ආදායම්			
භාන්ඩාගාර බැඳුම්කර මත හානිකරණ අලාභ	-	**(79,301,168)**	(541,135,514)
	4,072,641,000	**1,737,471,227**	(541,135,514)
වර්ෂය සඳහා මුළු විස්තීරන ආදායම්	4,072,641,000	**1,737,471,227**	2,387,546,497

පිටු අංක 08 සිට 30 දක්වා පිටුවල දැක්වෙන ගිණුම් ප්‍රතිපත්ති හා සටහන් මූල්‍ය ප්‍රකාශනවල අත්‍යාවශ්‍ය කොටසක් වේ.

ස්කන්ධ වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

	සටහන්	රජයේ දෙපාර්තමේන්තු වලින් ලද වත්කම්	රජයේ ප්‍රදාන	රාජ්‍ය ප්‍රාග්ධනය	ප්‍රාග්ධන ප්‍රදාන	කාර්ය මණ්ඩල සුභ සාධන අරමුදල	සමුච්චිත ලාභය / පාඩුව	එකතුව
		රු.	රු.		රු.	රු.	රු.	රු.
2016 ජනවාරි 01 දිනට ශේෂය		185,480,387	91,517,718,832	63,736,423,921	164,846,710,175	16,506,484	**(11,847,217,278)**	**308,455,622,521**
පූර්ව වර්ෂ නිවැරදි කිරීම් -								-
වත්කම් හඳුනාගැනීම හා ඉවත් කිරීම	35.1.1	-	-	-	-	-	**22,447,765**	**22,447,765**
වත්කම් හඳුනාගැනීම හා ඉවත් කිරීම සඳහා ක්ෂය ගැලපීම	35.1.2	-	-	-	-	-	**19,932,321**	**19,932,321**
දිගුකල් පරිශේෂ අත්තිකාරම් ඉවත්කිරීම	35.2	-	-	-	-	-	**(18,150,388)**	**(18,150,388)**
පුනරුජ්ජීවන හා නිර්මාන වැඩ	35.2	-	-	-	-	-	**(185,399,524)**	**(185,399,524)**
තොග හඳුනාගැනීම හා ඉවත් කිරීම	35.2	-	-	-	-	-	**(27,921,254)**	**(27,921,254)**
වෙලඳ හා අනෙකුත් ණය ගැනියන් හඳුනාගැනීම හා ඉවත් කිරීම	35.2	-	-	-	-	-	**(137,739,576)**	**(137,739,576)**
බැංකු ශේෂයන් නිවැරදි කිරීම	35.2	-	-	-	-	-	**(1,532,647)**	**(1,532,647)**
වෙලඳ හා අනෙකුත් ණය හිමියන් නිවැරදි කිරීම	35.2	-	-	-	-	-	**3,378,627**	**3,378,627**
2016.01.01 දිනට යලි ප්‍රකාශිත ශේෂය		185,480,387	91,517,718,832	63,736,423,921	164,846,710,175	16,506,484	**(12,172,201,953)**	**308,130,637,846**
වර්ෂය සඳහා ශුද්ධ ලාභය		-	-	-	-	-	**2,387,546,497**	**2,387,546,497**
තොග හඳුනාගැනීම හා ඉවත් කිරීම		-	-	-	-	-	**(14,984,026)**	**(14,984,026)**
වත්කම් හඳුනාගැනීම හා ඉවත් කිරීම සඳහා ක්ෂය ගැලපීම	35.1.2	-	-	-	-	-	**(2,377,620)**	**(2,377,620)**
වෙලඳ හා අනෙකුත් ණය ගැනියන් හඳුනාගැනීම හා ඉවත් කිරීම		-	-	-	-	-	**(2,716,099)**	**(2,716,099)**
වෙලඳ හා අනෙකුත් ණය හිමියන් නිවැරදි කිරීම		-	-	-	-	-	**19,770,000**	**19,770,000**
වර්ෂය තුල ලැබීම් / මාරු කිරීම්		-	2,216,825,457	-	-	-	-	**2,216,825,457**
වැරදි නිවැරදි කිරීම් ඇතුළුව ණය, ස්කනධ ප්‍රාග්ධනය ලෙස පරිවර්ර	35.2	-	-	5,734,545,689	15,962,447,745	-	-	**21,696,993,434**
ණය, ප්‍රාග්ධනය ලෙස පරිවර්ථනය			(991,960,556)		733,524,745			**(258,435,811)**
කාර්ය මණ්ඩල සුභසාධන අරමුදලට මාරුකිරීම්		-	-	-	-	721,655	**(721,655)**	-
2016.12.31 දිනට යලි ප්‍රකාශිත ශේෂය		185,480,387	92,742,583,734	69,470,969,610	181,542,682,665	17,228,139	**(9,785,684,856)**	**334,173,259,679**
වර්ෂය සඳහා ශුද්ධ ලාභය		-	-	-	-	-	**1,737,471,227**	**1,737,471,227**
ලැබීම් හා මාරුකිරීම්		-	2,096,004,935	-	8,831,136,779	-	-	**10,927,141,714**
ණය, ප්‍රාග්ධනය ලෙස පරිවර්ථනය		-	-	8,041,529,956	-	-	-	**8,041,529,956**
ප්‍රාග්ධන ප්‍රධාන සඳහා මාරුකිරීම්		-	-	-	-	-	-	-
කාර්ය මණ්ඩල සුභසාධන අරමුදලට මාරුකිරීම්		-	-	-	-	5,298,986	**(5,298,986)**	-
2017 දෙසැම්බර් 31 දිනට ශේෂය		**185,480,387**	**94,838,588,669**	**77,512,499,566**	**190,373,819,444**	**22,527,125**	**(8,053,512,615)**	**354,879,402,576**

පිටු අංක 08 සිට 30 දක්වා පිටුවල දැක්වෙන ගිණුම් ප්‍රතිපත්ති හා සටහන් මුල්‍ය ප්‍රකාශනවල අත්‍යාවශ්‍ය කොටසක් වේ.

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

අවසන් වර්ෂය සඳහා	සටහන්	2017 රු.	2016 රු.
මෙහෙයුම් කටයුතු වලින් ජනනය වූ / (යෙදවූ) මුදල්			
බදු වලට පෙර ශුද්ධ ලාභය / (අලාභය)		**1,882,455,821**	2,989,591,779
ගැලපීම්			
පොලී ආදායම්	12	**(1,157,359,094)**	(1,236,278,724)
ස්ථාවර වත්කම් ඉවත් කිරීමේ ලාභය / අලාභය		**4,495,307**	(13,600,051)
ක්ෂයවීම්	10.2	**3,339,845,190**	2,724,963,394
විශ්‍රාම පාරිතෝෂික ප්‍රතිපාදන	30.1	**488,661,467**	394,618,174
පොලී වියදම්	13	**12,994,621**	3,281,535
කාරක ප්‍රාග්ධන වෙනසට පෙර මෙහෙයුම් ලාභය		**4,571,093,311**	4,862,576,106
තොග (වැඩිවීම්) / අඩුවීම්		**(730,895,060)**	(280,100,515)
ණයගැතියන් , ලැබිය යුතු සහ තැන්පතුවල (වැඩිවීම) / අඩුවීම		**(17,491,801,822)**	(14,799,143,670)
ණය හිමියෝ සහ වෙන්කිරීම් වල වැඩිවීම් / (අඩුවීම)		**4,094,056,836**	423,509,912
මෙහෙයුම් වලින් ජනනය වූ මුදල්		**(9,557,546,735)**	(9,793,158,167)
ගෙවූ බදු		**(65,683,426)**	(63,287,387)
පාරිතෝෂික ගෙවීම්	11	**(488,661,467)**	(394,618,174)
මෙහෙයුම් කටයුතු වලින් වූ ශුද්ධ මුදල්		**(10,111,891,628)**	(10,251,063,729)
ආයෝජන කටයුතු වලින් ජනනය වූ / (යෙදවූ) මුදල්			
ස්ථාවර වත්කම් වල හා කෙරීගෙන යන වැඩ වල ආයෝජනය		**(44,539,798,926)**	(33,718,679,086)
මූල්‍ය වත්කම්		**2,792,594**	5,464,174
අපහරණය කළ වත්කම් විකුණුම් වලින් ලැබීම්		**2,001,798**	27,083,204
ආයෝජන ආදායම් ලැබීම්		**1,157,359,094**	1,236,278,724
(ආයෝජන) / ආයෝජනය ඉවත් කිරීම්		**(8,783,171,959)**	2,037,971,571
ආයෝජන කටයුතුවල යෙදවූ ශුද්ධ මුදල් ප්‍රවාහය		**(52,160,817,399)**	(30,411,881,414)
මූල්‍ය කටයුතු වලින් ජනනය වූ / (යෙදවූ) මුදල්			
කාල පරිච්ඡේදය තුළ රජයේ ප්‍රදාන		**2,096,004,935**	2,123,327,889
කාල පරිච්ඡේදය තුළ ලද ප්‍රාග්ධන ප්‍රදාන		**10,019,103,285**	17,040,060,639
අළුත් ණය මුදල්		**40,795,834,610**	31,391,418,876
ණය ආපසු ගෙවීම්		**(659,977,136)**	(896,230)
පොලී ගෙවීම්		**(5,130,346,746)**	(1,670,213,515)
භාණ්ඩාගාර බැඳුම්කර විකුණුම්		**6,836,828,662**	-
		53,957,447,610	48,883,697,659
මුදල් හා මුදල් සමාන දෑ වල ශුද්ධ වැඩිවීම		**(8,315,261,416)**	8,220,752,516
වර්ෂය ආරම්භයේ මුදල් හා මුදල් සමාන දෑ		**12,092,709,720**	3,876,918,395
කාල පරිච්ඡේදය අවසානයේ මුදල් හා මුදල් සමාන දෑ		**3,777,448,306**	12,092,709,720

පිටු අංක 08 සිට 30 දක්වා පිටුවල දැක්වෙන ගිණුම් ප්‍රතිපත්ති හා සටහන් මූල්‍ය ප්‍රකාශනවල අත්‍යාවශ්‍ය කොටසක් වේ

මූල්‍ය ප්‍රකාශනවල සටහන්

2017 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය
මූල්‍ය ප්‍රකාශන වලට සටහන්

2017 දෙසැම්බර් 31

මූල්‍ය ප්‍රකාශනවල සටහන්

2017 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා

සංස්ථාගත තොරතුරු

1.1 පොදු කරුණු

පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද 1974 අංක 2 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත යටතේ පිහිටුවන ලද ජාතික ජල සම්පාදන හා ජලා පවහන මණ්ඩය සංස්ථාපිත මණ්ඩලයකි. මණ්ඩලයේ ලියාපදිංචි කාර්යාලය ගාලු පාර, රත්මලාන යන ස්ථානයේ පිහිටුවා ඇති අතර ප්‍රධාන ව්‍යාපාරික ස්ථානයද එම පරිශ්‍රයේ පිහිටුවා ඇත.

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය (ජා.ජ.ජ.ප.ම) නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ආයතනයකි.

1.2 ප්‍රධාන කාර්යයන්

වර්ෂය තුළ මණ්ඩලයේ ප්‍රධාන කාර්යය වන්නේ පිරිපහදු කරන ලද පානීය ජලය නිෂ්පාදනය කර හා ප්‍රජාවට විකිණීම වේ.

රටේ සෑම ප්‍රදේශයකම පිරිපහදු කරන ලද පානීය ජලය සංවර්ධනය කිරීම හා වඩා හොඳ රටක් ගොඩනැංවීම ජාතික ජලසම්පාදන හා ජලා පවහන මණ්ඩලයේ අරමුණු වේ.

2. පිළියෙල කිරීමේ පදනම

2.1 අනුකූලවීමේ ප්‍රකාශය

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිත (SLFRS/LKAS) වලට අනුකූල වන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇත.

2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයද ඇතුළත්ව හා අදාල සෑම කාල පරිච්ඡේදයක් වෙනුවෙන්ම, ජා.ජ.ජ.ප.ම. එහි මූල්‍ය වාර්තා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට (ශ්‍රී.ලං.ගි.ප්‍ර.) අනුකූලව පිළියෙල කර ඇත. 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මෙම වාර්තා ජා.ජ.ජ.ප.ම. ප්‍රථම වරට ශ්‍රී ලංකා නව ගණකාධිකරණ ප්‍රමිතවලට (LKAS) අනුකූල වන පරිදි පිළියෙල කරන ලදි.

2.2 අගය කිරීමේ පදනම

මූල්‍ය උපකරණ හා සාධාරන වටිනාකමට අගය කරන ලද විකිනීම් සඳහා පවතින අනෙකුත් මූල්‍ය වත්කම් හා වගකීම් හැර මූල්‍ය වාර්තා ඓතිහාසික පිරිවැය පදනම මත පිළියෙල කර ඇත. විශ්‍රාම පාරිතෝෂිතය සඳහා බැඳීම් වර්ථමාන අගයට හඳුනාගෙන ඇත.

3. ප්‍රධාන ගිණුම්කරණ ප්‍රතිපත්ති සාරාංශය

3.1 දේපල, පිරියත හා උපකරණ

දේපල , පිරියත හා උපකරණවල පිරිවැයෙන් සමුච්චිත ක්ෂය සහ යම් සමුච්චිත හානි කරන අලාභයන් නිබේ නම් ඒවා අඩු කොට ශුද්ධ අගයට පෙන්නුම් කරනු ලැබේ. මෙම පිරිවැයෙහි දේපල හා උපකරණ ප්‍රතිසම්පාදන පිරිවැය සහ ණය ගැනුම් පිරිවැය ප්‍රාග්ධනිත කළ හැකි නිර්නායකයන් සම්පූර්ණ කරනු ලබන , දීර්ඝ කාලීන ව්‍යාපෘති වල ණය ගැනුම් පිරිවැයද අන්තර්ගත වේ. දේපල පිරියත හා උපකරණ වල ප්‍රධාන කොටස් කාලීනව නැවත ප්‍රසම්පාදනය කළ යුතු නම්, ජා.ජ.ජ.ප.ම. එම කොටස් වෙන් වෙන් වශයෙන් වූ වත්කම් වශයෙන් හඳුනාගෙන එම වත්කම් වල නිශ්චිත ඵලදායී ජීවිත කාලය තුළ ක්ෂය කරනු ලැබේ. එසේම, පුළුල් පරීක්ෂාවක් සිදුකළ විට, හඳුනා ගැනීම් නිර්ණායකයන් සම්පූර්ණ කරන්නේ නම්, එහි පිරිවැය පිරියත හා උපකරණ ඉදිරියට ගෙන යන ලබන මුදලක් ලෙස හඳුනා ගනු ලැබේ. අනෙකුත් සියළුම අළුත්වැඩියා හා නඩත්තු වියදම් ලාභ හෝ අලාභ සඳහා දරන ලද වියදම් ලෙස හඳුනා ගනු ලැබේ.

ප්‍රයෝජනයට ගැනීමෙන් පසුව, යලි වත්කම් භාවිතයෙන් ඉවත් කිරීම සඳහා දැරීමට සිදුවේ යැයි අපේක්ෂිත පිරිවැයෙහි වර්තමාන අගය, වෙන් කිරීම් සිදුකිරීමට අදාල නිර්ණාකයන්ට අනුකූල වන්නේ නම්, අදාල වත්කම් පිරිවැයට ඇතුළත් කරනු ලැබේ.

3.1.1 ක්ෂය

වත්කම්වල ඇස්තමේන්තු කරන ලද ඵලදායි ජීවිත කාලය පදනම් කර ගෙන අදාල වත්කම් පහත සඳහන් පරිදි සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරනු ලැබේ.

දේපල පිරියත හා උපකරණ	අනුපාතය
ගොඩනැඟිලි හා ව්‍යුහයන්	1.67% - 2%
පිරියත හා පොම්ප උපකරණ	5%
සේවා හා තොග ජල මනු	10%
සම්ප්‍රේෂණ හා බෙදාහැරීම්	1.67%
උපකරණ	10%
ලී බඩු සහ සවිකිරීම්	10%
පරිගණක උපාංග හා ජංගම දුරකථන	20% - 33.3%
මෝටර් රථ	10% - 20%
කල් බදු මෝටර් රථ	14.3%

3.1.2 ආයෝජන දේපල

දේපලක පරිහරණය අයිනිකරුගෙන් වෙනත් පාර්ශවයක් වෙත මාරුවන අවස්ථාවේදී ආයෝජන දේපල ලෙස වර්ගීකරණය කරනු ලබන අතර එහි පිරිවැයෙන් සමුච්චිත ක්ෂය අඩුකර අගය කරනු ලැබේ. මණ්ඩලය මෙම කටයුතු සඳහා දායක වීම ඉතා විරල වන අතර එබැවින් උක්ත දෑ ඇත්නම් හෙලිදරව් කරනු ලබයි.

3.1.3 කෙරිගෙන යන ප්‍රාග්ධන වැඩ

ශේෂ පත්‍ර දිනට ප්‍රාග්ධනිත නොකරන ලද හා වර්ෂය තුළ දරන ලද ප්‍රාග්ධන වියදම් කෙරිගෙන යන ප්‍රාග්ධන වැඩ ලෙස පෙන්නුම් කරනු ලබන අතර වර්ෂය තුළ ප්‍රාග්ධනිත කරන ලද හා භාවිතයට ගනු ලබන වත්කම් දේපල, පිරියත හා උපකරණ වලට මාරු කරනු ලැබේ.

3.1.4 කල්බදු

කල්බද්ද ආරම්භයේදී නිශ්චිත වත්කමක් හෝ වත්කම් භාවිතා කිරීමේ අයිතිය ප්‍රමාණවත් ලෙස පැවරීම සම්බන්ධව ඇනිකරගනු ලබන එකඟතාවය හෝ නිශ්චිතව දක්වා නොමැති අවස්ථාවකදි පවා වත්කම් භාවිතා කිරීමට එකඟවීම මගින් කල් බද්දක් පවතිද නැද්ද යන්න තීරනය වේ

3.1.5 අස්පෘශ්‍ය වත්කම්

අත්පත් කරගනු ලබන අස්පෘශ්‍ය වත්කම්වල අගය මූලිකව පිරිවැයට හඳුනාගනු ලැබේ. මූලික හඳුනා ගැනීමෙන් පසුව, අස්පෘශ්‍ය වත්කම් වල අගය, සමුච්චිත ක්ෂය සහ හානිකරන අලාභයන් ඇත්නම් එම අගයන් අඩු කර ඉදිරියට ගෙන යනු ලැබේ. අභ්‍යන්තරව ජනනය කරනු ලබන අස්පෘශ්‍ය වත්කම්, ප්‍රාග්ධනගත කරන ලද සංවර්ධන වියදම් හැර, ප්‍රාග්ධනිත නොකරන අතර, එම වියදම්, වියදම් දරන ලද වර්ෂයේ වියදමක් ලෙස ආදායම් ප්‍රකාශයෙහි පෙන්නුම් කරනු ලැබේ. පරිගනක මෘදුකාංග වසර 7ක් දක්වා හායනය කරනු ලබයි.

3.1.6 පර්යේෂණ හා සංවර්ධන පිරිවැය.

පර්යේෂණ පිරිවැය වියදමක් ලෙස සලකනු ලබයි. ජා.ජ.ජ.ප.මණ්ඩ. විසින් පහත දෑ සම්පූර්ණ වන්නේ නම් පමනක්, තනි ව්‍යාපෘති වෙනුවෙන් දරන ලද සංවර්ධන පිරිවැය අස්පෘශ්‍ය වත්කමක් ලෙස හඳුනා ගනු ලබයි එසේ හඳුනා ගනුයේ,

- වත්කමක් විකිණීමට හෝ භාවිතයට ගත හැකි වන පරිදි තාක්ෂණික ශක්‍යතා මට්ටමක් සම්පූර්ණ කර ඇති අස්පෘශ්‍ය වත්කම්.
- විකිණීමට හෝ භාවිතයට ගත හැකි බව පෙන්නුම් කර ඇති සහ සම්පූර්ණ කිරීමට අදහස් කර ඇති වත්කම්,
- අනාගත ආර්ථික ප්‍රතිලාභ ජනනය කරනු ලබන්නේ කෙසේද යන බව පැහැදිලි වීම,
- වත්කම සම්පූර්ණ කිරීමට අවශ්‍ය සම්පත් පවතින බව,

- වත්කම් සංවර්ධනය කිරීමේදී දරන ලද වියදම් විශ්වාසවන්තව ගණනය කිරීමේ හැකියාව.

සංවර්ධන කටයුතු සඳහා දරන ලද මූලික වියදම් වත්කමක් ලෙස හඳුනාගත් පසුව, සමුච්චිත ක්‍රමක්ෂය සහ සමුච්චිත හානිකරණ අලාභ අඩුකර ඉදිරියට ගෙන යනු ලබයි. සංවර්ධන කටයුතු අවසන් කර අදාල වත්කම භාවිතයට ගන්නා අවස්ථාවේ සිට ක්‍රමක්ෂය කිරීම ආරම්භ කරන අතර වත්කමේ ඵලදායී ජීවිත කාලය තුළ ක්‍රමක්ෂය කරනු ලැබේ. ක්‍රමක්ෂය විකුණුමේ පිරිවැය තුළ දක්වනු ලබන අතර වත්කම සංවර්ධනය කරනු ලබන කාලය තුළ අගය අඩුවීම් පිළිබඳ පරීක්ෂාවන්ට වාර්ෂිකව භාජනය කරනු ලබයි.

3.1.7 මූල්‍ය නොවන වත්කම්වල අගය අඩුවීම

ජා.ජ.ජ.ප.ම. වත්කම්වල අගය හානිවීමක් පෙන්නුම් කරන්නේ දැයි හඳුනා ගැනීම සඳහා සෑම ගිණුම් කාල පරිච්ඡේදයක් අවසානයේදීම තක්සේරුවක් කරනු ලබයි. අගය අඩුවීමක් පෙන්නුම් කරනවිට හෝ වත්කම් සඳහා වාර්ෂික අගය අඩුවීම් පරීක්ෂාවක් අවශ්‍යවිට ජා.ජ.ජ.ප.ම විසින් අදාල වත්කම් අයකර ගත හැකි වටිනාකමට තක්සේරු කරනු ලැබේ. වත්කමකින් මුදල් ජනනය කිරීමක් සිදු නොවන්නේ නම්, එම වත්කම් අනෙකුත් වත්කම් හෝ වත්කම් වර්ගයකින් බොහෝ දුරට ස්වාධීනව පවතින අවස්ථා වලදී හැර වත්කමක හෝ මුදල් ජනනය කිරීමේ ඒකකයක (cash generating unit) අයකර ගත හැකි වටිනාකම අනිරික්ත වන විට එහි සාධාරණ අගයෙන් බැහැර කිරීමේ පිරිවැය අඩුකර එක් එක් වත්කමේ භාවිතා කිරීමේ අගය තීරණය කරනු ලබයි. වත්කමක හෝ මුදල් ජනනය කිරීමේ ඒකකයක ඉදිරියට ගෙන එන ලද වටිනාකම එහි අයකර ගත හැකි අගයට වඩා වැඩි වන විට, එය අගය අඩුවීමක් ලෙස සලකා අයකර ගත හැකි වටිනාකම දක්වා ලියා හරිනු ලැබේ. භාවිතා කිරීමේ වටිනාකම තීරණය කිරීමේදී වත්කමක ඇස්තමේන්තු කරන ලද අනාගත මුල්‍ය ප්‍රවාහයෙහි වර්තමාන අගය , වර්තමාන වෙළඳපළ වටිනාකම තක්සේරු කළ හැකි මුදලේ කාල වටිනාකම සහ වත්කමට ආවේනික වූ අවදානම් තත්ත්වය පිළිබිඹු කරණ බදු පෙර වට්ටම් අනුපාතයන් මත වට්ටම් කර තීරණය කරනු ලබයි. සාධාරණ අගය ගණනය කිරීමේදී විකිණීම සඳහා දැරිය යුතු පිරිවැය අඩුකරනු ලබන අතර, විස්තර ඇත්නම් ඒ සඳහා මෑතකදී කරනලද ගනුදෙනු වල විස්තර පදනම් කර ගනු ලැබේ. එවැනි ගනුදෙනු වල විස්තර නොමැතිනම්, සුදුසු තක්සේරු කිරීමේ පදනමක් යොදා ගනු ලැබේ.

3.2.1 තොග

පළමු ලැබීම් පළමු නිකුත් කිරීමේ ක්‍රමය මත සහ හානිවූ හා සෙමින් වලනය වන තොග සඳහා සාධාරණ වෙන්කිරීම් කළ පසු, තොග භාණ්ඩ පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි වටිනාකම යන දෙකින් වඩා අඩු අගයට තක්සේරු කරනු ලබයි. සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු වලදී භාණ්ඩ විකුණූ ලබන මිලෙන්, එම භාණ්ඩ නිම කිරීමට ඇස්තමේන්තු කරන ලද පිරිවැය සහ විකිණීම් සිදුකිරීම සඳහා දැරීමට සිදුවෙයැයි ඇස්තමේන්තු කරන ලද පිරිවැය අඩුකර ශුද්ධ උපලබ්ධි අගය තීරණය කරනු ලැබේ.

තොග මැනීම

3.2.2 තොග පිරිවැය

අමු ද්‍රව්‍ය

ගැණුම් පිරිවැය හා යම්කිසි දැරීමට සිදුවිය හැකි පිරිවැය ඇතුළුව.

අනෙකුත් තොග

හරිත කළ සාමාන්‍ය මිල මත

3.3. මුදල් හා මුදලට සමාන වත්කම්

අතැති මුදල් , බැංකු ශේෂ සහ කෙටි කාලීන ආයෝජන වලින් ගෙවීමට ඇති බැංකු අයිරාවක් අඩුකළ පසු වටිනාකමින් මුදල් හා මුදලට සමාන වත්කම් සමන්විත වේ.

4. වගකීම්, වෙන්කිරීම් සහ ස්කන්ධය

4.1. විශ්‍රාම පාරිතෝෂික සඳහා බැඳීම්

4.1.1 විශ්‍රාම පාරිතෝෂික සඳහා බැඳීම් (ශ්‍රීලංගිප්‍ර 19)

අ) ප්‍රතිලාභ සැලසුම් - පාරිතෝෂික

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 19 (LKAS-19) අනුකූල වන පරිදි සෑම සේවකයෙකුගේම සේවා කාලයෙහි ආරම්භක වර්ෂයේ සිට පාරිතෝෂික සඳහා වෙන්කිරීම් කරනු ලැබේ.

ආ) විශ්‍රාම ප්‍රතිලාභ පිරිවැය

ජා.ජ.ජ.ප.මණ්ඩලය. නම් කරන ලද ප්‍රතිලාභ සැලසුමක් ක්‍රියාත්මක කරනු ලැබේ. නම් කරන ලද සැලසුම යටතේ කරනු ලබන වෙන්කිරීම් ඇස්තමේන්තුගත ඒකක බැර ක්‍රමය (Projected Unit Credit Method) භාවිතා කරමින් නිරණය කරනු ලබයි. ප්‍රතිලාභ සැලසුමෙහි ආයුගණක (Actuarial) ලාභ සහ පාඩු එය ඇතිවූ කාල පරිච්ඡේදයේදී අනෙකුත් විස්තීරණ ආදායම් යටතේ සම්පූර්ණයෙන් හඳුනා ගනු ලැබේ. මෙම ආයුගණක ලාභ සහ පාඩු වහාම රදවාගත් ඉපයීම් වලින් හඳුනාගන්නා අතර පසු වර්ෂයේ ලාභ හෝ පාඩු ලෙස වර්ගීකරණය කරනු නොලැබේ.

ප්‍රතිලාභ සඳහා හිමිකම් ලබන කාල පරිච්ඡේදය වෙනුවෙන් හිමිකම් නොලබන කාල පරිච්ඡේදයේදී දරන ලද ඉකුත් සේවා වියදම්, වියදම් ලෙස හඳුනාගෙන සරල මාර්ග ක්‍රමයකයට සාමාන්‍ය කාලය තුළ ලියා හරිනු ලැබේ. ප්‍රතිලාභ සඳහා දැනටමත් හිමිකම් ලබන්නේ නම්, ඉකුත් සේවා වියදම්, විශ්‍රාම සැලසුමේ සඳහන් පරිදි හෝ සැලසුමට කරන වෙනස් කිරීමක් ලෙස වහාම හඳුනාගත යුතුය.

නම් කරන ලද ප්‍රතිලාභ බැඳීම්වල වර්තමාන අගයෙන් (උසස් තත්ත්වයේ සංස්ථා බැඳුම්කර පදනම් කර ගත් මට්ටම් අනුපාතයක් යොදා ගණනය කරන ලද) හඳුනා නොගත් ඉකුත් සේවා වියදම් හා සැලසුම්කරණය කරන ලද වත්කම් වල සාධාරණ අගයෙන් නිරවුල් කළ යුතු බැඳීම් අඩු කළ පසු වටිනාකම් වලින්, නම් කරන ලද ප්‍රතිලාභ වත්කම් හා වගකීම් සමන්විත වේ.

උක්ත වගකීම් ආයුගණකයකු මගින් වර්ෂ 3 කට වරක් වැටුප් වර්ධනයට සමානුපාතිකව ආගණනය කරනු ලබයි. එලෙස හඳුනාගත් වගකීම් එම වර්ෂයේ හඳුනාගන්නා අතර ඉන් අනතුරුව එලබෙන වසර 2 සඳහා වන වගකීම් වියදම් ලෙස හඳුනාගනු ලබයි.

ඇ) නම් කරන ලද දායකත්වමේ සැලසුම් -සේ.අ.සා හා සේ.නි.භා.අ

සේවක අර්ථ සාධක සේවක භාරකාර අරමුදල දක්වා ඇති නියමයන්ට හා රෙගුලාසි වලට අනුකූලව සේවක අර්ථ සාධක අරමුදලට හා සේවක භාරකාර අරමුදලට දායකත්ව සඳහා සේවකයන් සුදුසුකම් ලබයි. දළ සේවක ඉපයීම් වලින් 12 % ක් හා 3% ක් මණ්ඩලය විසින් පිළිවෙලින් සේවක අර්ථසාධක අරමුදලට හා සේවක භාරකාර අරමුදලට ගෙවනු ලබයි.

4.2 වෙන්කිරීම්

පොදු කරුණු

අනිත සිද්ධීන් වල ප්‍රතිඵලයක් ලෙස ජා.ජ.ජ.ම. වර්තමානයේදී මුහුණුදීමට ඇති බැඳීම් (නීතිමය හෝ වටහාගත හැකි ආකාරයට) සඳහා වෙන්කිරීම් කරනු ලබන අතර වෙන්කිරීම් සඳහා බැඳුණු ආර්ථික ප්‍රතිලාභ හා වගකීම් ප්‍රමාණය පිළිබඳ අවිනිශ්චිත තත්ත්වයක් පවතී. ජා.ජ.ජ.ප.ම. වෙන් කිරීම් වලින් කොටසක් හෝ සම්පූර්ණ ප්‍රමාණයම ප්‍රතිපූරණය කිරීමට අදහස් කරන්නේ නම් (උදා:- රක්ෂණ ඔප්පුවක් මත) ප්‍රතිපූර්ණය කරනු ලබන ප්‍රමාණය සත්‍ය වශයෙන්ම තහවුරු කර ගත හැකි නම්, වෙන්කිරීම් වලින් ප්‍රතිපූර්ණයන් අඩුකළ පසු අගය ආදායම් ප්‍රකාශයෙහි පෙන්නුම් කරනු ලැබේ.

4.3 රජයේ ආධාර

රාජ්‍ය ආධාර ලැබෙන බවට සාධාරණ තහවුරුවක් ඇතිවීම සහ ආධාර ලැබීමට අවශ්‍ය කොන්දේසි සපුරා ඇති විට අදාල රජයේ ආධාර හඳුනා ගනු ලැබේ. රජයේ ආධාර වියදම් අයිතම හා සම්බන්ධවීම එම වියදම් දරනු ලබන කාලපරිච්ඡේදයට අදාලව ක්‍රමානුකූල පදනමක් මත වියදමට විලම්බිත වන පරිදි ආදායමක් ලෙස හඳුනාගනු ලැබේ. රජයේ ආධාර වත්කමක් හා සම්බන්ධ වන විට, අදාල වත්කමේ ඵලදායී ජීවිත කාලය තුළ ගණනය කරනු ලබන අගයකින් ආදායමක් ලෙස හඳුනා ගනු ලැබේ.

ජා.ජ.ජ.ප.ම. මූල්‍ය නොවන ආධාර ලැබුණු විට, අදාල වත්කම හා ආධාර නාමික අගය මත සටහන් කර, එම වත්කම උපයෝජනයෙන් ලැබෙන ප්‍රතිලාභ වත්කමේ අපේක්ෂිත ඵලදායී ජීවිත කාලය තුළදී සමාන වාරික වශයෙන් ලාභයට හෝ අලාභයට ගලපනු ලබයි. රජය විසින් හෝ රජයට සම්බන්ධ ආයතන විසින් ණය හෝ සමාන ආධාර ප්‍රදානය කළ විට ගෙවිය යුතු පොලී අනුපාතය වෙළඳපළ පොලී අනුපාතයට වඩා අඩුනම් වෙනස රජයේ ආධාරයක් ලෙස සලකනු ලැබේ.

5. ආදායම් ප්‍රකාශය

ජා.ජ.ජ.ප.මි. කාර්ය සාධනයේ මූලිකාංග ප්‍රමාණවත් ලෙස ඉදිරිපත් කරන බැවින් කාර්යගත වියදම් ක්‍රමය (Function of Expenses) ආදායම් ප්‍රකාශය ඉදිරිපත් කිරීම සඳහා යොදා ගන්නා ලදි.

5.1.1 ආදායම් හඳුනාගැනීම

ගෙවීම් කරනු ලබන කාල පරිච්ඡේදය නොසලකා ජා.ජ.ජ.ප.ම වෙත ආර්ථික ප්‍රතිලාභ ගලාඒමේ හැකියාව සහ ආදායම් ලැබීම් විශ්වාසවන්තව මැනිය හැකි බව පදනම් කර ගෙන ආදායම් හඳුනාගනු ලැබේ. ගිවිසුම් මගින් නිරූපය කර ඇති ගෙවීම් කොන්දේසි සැලකිල්ලට ගනිමින් ලැබුණු හෝ ලැබිය යුතු ප්‍රතිඵලයන් වල සාධාරණ අගය මත ආදායම් හඳුනාගනු ලැබේ. ආදායම් හඳුනා ගැනීමට පෙර පහත සඳහන් නිශ්චිත ආදායම් හඳුනා ගැනීමේ නිර්ණායකයන් සැලකිල්ලට ගනු ලැබේ.

භාණ්ඩ විකිණීම

භාණ්ඩ වල අයිතියට අදාල අවදානම් හා ප්‍රතිලාභ වලින් සැලකිය යුතු ප්‍රමාණයක් ගැණුම්කරුවට පවරා ඇති විට, සාමාන්‍යයෙන් භාණ්ඩ භාරදී ඇති විට භාණ්ඩ විකිණීමේ ආදායම් හඳුනා ගනු ලැබේ.

ජලය විකිණීම

ජල මනු කියවා දින 30 ක කාලසීමාවක් තුල පාරිභෝගිකයකු විසින් පාරිභෝජනය කරනලද ජල ඒකක ප්‍රමානය පරිගනක පද්ධතියේ යාවත්කාලීනවූ පසු ජලය විකිණීම ආදායමක් ලෙස හඳුනා ගැනේ.

අනෙකුත් ආදායම්

අනෙකුත් ආදායම් උපචිත පදනම් මත හඳුනාගනු ලැබේ.

පොලී ආදායම්

සෑම මූල්‍ය වත්කමක්ම ක්‍රමක්ෂය කළ වටිනාකම් මත අගය කරන අතර පොලී ආදායම් නිමි මූල්‍ය වත්කම් විකිණීම සඳහා ඇති වත්කම් ලෙස වර්ග කෙරේ. පොළී ආදායම් හෝ වියදම් සඵල පොලී අනුපාතය (EIR) යොදා ගනිමින් සටහන් කරන අතර මූල්‍ය වත්කමේ ඵලදායි ජීවිත කාලය තුළ හෝ උචිත වන පරිදි ඊට කෙටි කාලයක් තුළ වත්කමෙන් ඉපයීමට අපේක්ෂිත අනාගත මුදල් ප්‍රමානයන් මත ගෙවීමට හෝ ලැබීමට අපේක්ෂිත ඇස්තමේන්තු කරන ලද අනාගත මුදල් ප්‍රමානයන් නිශ්චය මට්ටම් කරනු ලබන අනුපාතය EIR ලෙස හැදින්වේ. පොලී ආදායම් මූල්‍ය ආදායම් ලෙස ආදායම් ප්‍රකාශයෙහි දක්වනු ලැබේ.

නැවත අයකළ හැකි වැඩ

ස්ථාවර මිල කොන්ත්‍රාත් මඟින් ලැබෙන ආදායම්, ප්‍රතිශත නිම කිරීම් ක්‍රමය පදනම් කර ගෙන කරන ලද වැඩ ප්‍රමාණය අනුව ගණනය කරනු ලැබේ.

5.1.2 වියදම්

වර්ෂයේ ලාභය හෝ අලාභය තීරණය කිරීම සඳහා ව්‍යාපාරය පවත්වාගෙන යාමට දරනු ලබන වියදම් ආදායමට ලියාහරිනු ලබයි. අළුත්වැඩියා හා අළුත් කිරීමේ ගාස්තු වියදම් දරන ලද වර්ෂයේ ලාභයට හෝ අලාභයට ලියාහරනු ලබයි.

5.2 විලම්බිත බදු

මූල්‍ය වාර්තා පිළියෙල කිරීමේ පරමාර්ථයෙන් වාර්තා කරන දිනට වත්කම් හා වගකීම් වල ඉදිරියට ගෙන වටිනාකම් හා එම වත්කම් හා වගකීම්වල බදු පදනම් අතර ඇති වන තාවකාලික වෙනස්කම් වල බදු බලපෑම් සඳහා වන වෙන්කිරීම්, වගකීම් ක්‍රමය (Liability Method) අනුව සිදුකරනු ලබයි. පහත අවස්ථා වලදී හැර බදු අයකළ හැකි තාවකාලික වෙනස්කම් සඳහා වන විලම්බිත බදු වගකීම් හඳුනා ගනු ලබයි. ව්‍යාපාර ඒකාබද්ධ කිරීමක් නොවන අවස්ථාවලදී කිර්තිනාමය හෝ වත්කමක් හෝ වගකීමක් මත පැන නගින විලම්බිත බදු වගකීම් එම ගනුදෙනු සිදුවන අවස්ථාවේදී ගිණුම්කරණ ලාභයට හෝ බදු අය කළ හැකි ලාභයට බලපෑමක් නොවන විට,

විලම්භිත බදු වත්කම් සෑම අඩුකළ හැකි තාවකාලික වෙනස්කමක් මතම හඳුනා ගන්නා ආකාර භාවිතා නොකළ බදු බැර සහ භාවිතා නොකළ බදු අලාභ ඒවා ගැලපීමට අවශ්‍ය බදු අයකළ හැකි ආදායම් ඇති වන තුරු ඉදිරියට ගෙන යනු ලබයි. එසේ වුවත් පහත කරුණු අදාල නොවේ.

අඩු කළ හැකි තාවකාලික වෙනස්කම් පැනනගී ඇත්තේ ව්‍යාපාර ඒකාබද්ධ කිරීමේ ප්‍රතිඵලයක් ලෙස ඇතිවුණු වත්කමක් හෝ වගකීමක් මත සහ අදාල ගනුදෙනුව සිදුවන විට එය ගිණුම්කරණ ලාභයට හෝ බදු අය කළ හැකි ලාභයට බලපෑමක් නොවන විට.

පරිපාලන හා ආශ්‍රිත සමාගම්වල ආයෝජන සහ බද්ධ ව්‍යාපාර වල පොලී යන විෂයන් මත ඇති වන අඩුකළ හැකි තාවකාලික වෙනස්කම් හා සම්බන්ධ විලම්භිත බදු එම තාවකාලික වෙනස්කම් පුරෝකථනය කළ හැකි අනාගත කාල පරිච්ඡේදයක් දක්වා ඉදිරියට ගෙන යා හැකි විට සහ එම තාවකාලික වෙනස්කම් හිලව් කිරීම සඳහා බදු අයකළහැකි ලාභයක් ලැබේ නම් පමණක් විලම්භිත බදු ලෙස හඳුනා ගනු ලැබේ.

එක් එක් වාර්තාකරණ දිනයේදී ඉදිරියට ගෙන එනලද විලම්බිත බදු වලින් කොටසක් හෝ සම්පූර්ණයෙන් අයකර ගැනීමට ප්‍රමාණවත් බදු අයකළ හැකි ආදායමක් ආදායම් ලැබිය හැකි ප්‍රමාණය දක්වා විලම්භිත බදු වත්කම් අඩු කරනු ලැබේ. එක් එක් වාර්තා කරන දිනයේදී එළඹෙන හඳුනානොගත් බදු වත්කම් පිළිබඳ නැවත තක්සේරු කරන අතර, අනාගතයේදී ඉපයිය හැකි බදු අයකළ හැකි ආදායමෙන් අදාල විලම්බිත බදු වත්කම් හිලව් කළ හැකි ප්‍රමාණය අනුව විලම්භිත බදු වත්කම් අගය කරනු ලැබේ. විලම්බිත බදු වත්කම් වර්ෂය තුළදී උපලබ්ධි වන විට හෝ වගකීම් නිරවුල් කරන විට අදාල කර ගැනීමට අපේක්ෂිත පනවා ඇති හෝ ප්‍රමාණවත්ව පනවා ඇති බදු අනුපාතයන් (බදු නීතිය) අනුව විලම්බිත බදු වත්කම් හා වගකීම් හඳුනා ගනු ලැබේ.

බාහිර ලාභ හෝ අලාභ මත හඳුනාගත් විලම්බිත බදු, බාහිර ලාභ හෝ අලාභ ලෙස හඳුනාගනු ලබයි. අදාල වන ගනුදෙනුවලට ඇති සම්බන්ධතාවය මත විලම්බිත බදු අයිතමයන් විස්තිරණ ආදායම් ප්‍රකාශය තුළ හෝ සෘණ ස්කන්ධය යටතේ දක්වනු ලැබේ.
විලම්බිත බදු එකම ආයතනයට අදාල වන විට එකම බදු අධිකාරියක් යටතේ පවතින විට සහ වර්තමාන බදු වත්කම් වර්තමාන ආදායම් බදු වගකීම් සමඟ එකිනෙකට හිලව් කිරීමට නීතිමය බලයක් ඇති නම් එකිනෙකට හිලව් කළ හැක.

ජා.ජ.ජ.ප. මණ්ඩලය ආදායම් බදු ගෙවීම් ඉතා අවිනිශ්චිත වන අතර එහි ප්‍රතිඵලයක් ලෙස ගිණුම්වල විලම්භිත බදු වත්කම්/වගකීම් හඳුනා නොගනී.

6. මූල්‍ය උපකරණ - මූලික හඳුනා ගැනීම හා පසුව අගය කිරීම

6.1 මූල්‍ය වත්කම්

6.1.1 මූලික හඳුනාගැනීම හා අගය කිරීම

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 39 (LKAS-39) සඳහන් විෂය පථයට අදාලව ලාභ හෝ අලාභ මඟින් ඇතිවන, සාධාරණ අගයට දක්වා ඇති මූල්‍ය වත්කම් ණය හා ලැබිය යුතුදෑ, පරිනතවීම දක්වා තබාගෙන ඇති ආයෝජන, විකිණීම සඳහා ඇති මූල්‍ය වත්කම් උචිත වන පරිදි සාධාරණ අගය මත මූලිකව මූල්‍ය වත්කම් ලෙස වර්ගී කරණය කරනු ලබයි. වත්කම් ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගයට නොදැක්වෙන විට වත්කම්වල සාධාරණ අගයට වත්කම් හුවමාරු පිරිවැය ඇතුළත් කොට මූලික අවස්ථාවේදී හඳුනාගනු ලැබේ.

ජා.ජ.ජ.ප.ම. මූල්‍ය වත්කම් වලට, මුදල් හා කෙටි කාලීන ආයෝජන, වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දේ, සේවක ණය සහ අනෙකුත් ලැබිය යුතු දේ ඇතුළත් වේ.

6.1.2 පසුව අගය කිරීම

මූල්‍ය වත්කම් වල අගය පසුව හඳුනා ගැනීම පහත සඳහන් පරිදි එම වත්කම් වල වර්ගීකරණය මත තීරණය වේ.

6.1.2.1 ලාභ හෝ අලාභ මඟින් ඇතිවන සාධාරණ අගයට දක්වා ඇති මූල්‍ය වත්කම්

ලාභ හෝ අලාභ මඟින් ඇතිවන සාධාරණ අගයට දක්වා ඇති මූල්‍ය වත්කම් වලට, විකිණීමට ඇති මූල්‍ය වත්කම්, ලාභ හෝ අලාභ මඟින් ඇති වන සාධාරණ අගයට මූලිකව හඳුනාගත් සහ නම් කරනු ලද මූල්‍ය වත්කම් ඇතුළත් වේ. විකිණීමේ පරමාර්ථයෙන් හෝ අත්පත් කර ගත් සහ නුදුරු අනාගතයේදී නැවත මිලට ගනු ලබන මූල්‍ය වත්කම් විකිණීම සඳහා ඇති වත්කම් ලෙස වර්ගීකරණය කෙරේ. 2017 හා 2016 දෙසැම්බර් 31 දිනට ජා.ජ.ජ.ප.ම. සතුව ලාභ හෝ අලාභ මඟින් ඇතිවන සාධාරණ අගයට දක්වා ඇති මූල්‍ය වත්කම් නොතිබුණි.

6.1.2.2 ණය හා ලැබිය යුතු දෑ

සක්‍රීය වෙළඳපලකදී ස්ථාවර හෝ තීරණය කළ හැකි ගෙවීම් කිරීම සඳහා මිල ගණන් ඉදිරිපත් නොකරනු ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් ගණයට ණය හා ලැබිය යුතු දේ අයත් වේ. මෙවැනි වත්කම් මූලිකව අගයකළ පසු, සඵල පොලී අනුපාත ක්‍රමය (EIR) භාවිතා කරමින් අගය අඩුවීම් සඳහා ගැලපීම් කර, අයකරනු ලබන වටිනාකම තීරණය කරනු ලැබේ. අත්පත් කර ගැනීමෙදී දරන ලද වියදම් ලැබුණු වටිටම් හෝ ගෙවූ අධිමිල සහ පිරිවැය හා ගාස්තු EIR හි මූලිකාංග වේ. EIR අගය මූල්‍ය

ප්‍රකාශන වල මූල්‍ය ආදායම් යටතේ පෙන්නුම් කරනු ලබන අතර අගය අඩුවීමේ අලාභ මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය වියදමක් ලෙස පෙන්නුම් කරනු ලබයි.

6.1.2.3 කල්පිරෙනතුරු තබා ගන්නා ආයෝජන

ජා.ජ.ජ.ප.ම. කල්පිරෙන තුරු තබා ගැනීමට ධනාත්මක ඇල්මක් හා හැකියාවක් තිබෙන විට, වහුන්පන්න නොවන ස්ථාවර හෝ තීරණය කළ හැකි ගෙවීම් කරන මූල්‍ය වත්කම් කල්පිරෙන තුරු තබාගන්නා ආයෝජන ලෙස වර්ග කෙරේ.මූලික අගය කිරීමෙන් පසුව, කල්පිරීම් දක්වා තබා ගන්නා ආයෝජන , එහි අගය අඩුවීම් ගලපා සඵල පොලිය පදනම් කර ගෙන ක්‍රමක්ෂය වටිනාකමට අගය කරනු ලැබේ. අත්පත් කර ගැනීම සඳහා දරන ලද වියදම්, ලැබුණු වට්ටම් හෝ ගෙවූ අයි මිල සහ පිරිවැය හා ගාස්තු සඵල පොලී අනුපාතයෙහි මූලිකාංග වේ. EIR මූල්‍ය ප්‍රකාශන වල මූල්‍ය ආදායමක් ලෙස පෙන්නුම් කරන අතර අගය අඩුවීමේ අලාභ මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය වියදමක් ලෙස පෙන්නුම් කරනු ලබයි.

6.1.2.4 විකිණීම් සඳහා ඇති මූල්‍ය ආයෝජන

ස්කන්ධය හා ණය සුරකුම් විකිණීම් සඳහා ඇති මූල්‍ය ආයෝජන වලට ඇතුළත් වේ. විකිණීම් සඳහා නොවන සහ ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගයට දන්වා නොමැති අයිතම ස්කන්ධ ආයෝජන ලෙස වර්ගීකරණය කරනු ලබයි. ද්‍රවශීල අවශ්‍යතා සහ වෙළඳපොළ නත්ත්වයෙන් වෙනස්වීම් වලට අනුගතවීම් සඳහා අවිනිශ්චිත කාලයක් තබා ගැනීමට අපේක්ෂා කරන ආයෝජන ණය සුරකුම් පත් ලෙස වර්ග කෙරේ. මූලික අගය කිරීමෙන් පසුව, විකිණීම් සඳහා ඇති මූල්‍ය ආයෝජන නැවත අගය කිරීම් එම වත්කම් වල දක්වා සාධාරණ වටිනාකම් මත සිදුකරයි. උපලබ්ධි නොවූ ලාභ හෝ පාඩු විස්තිර්ණ ආදායම් ලෙස හඳුනා ගැනේ.

6.1.2.5 හඳුනාගැනීම් ඉවත් කිරීම (Derecognition)

මූල්‍ය වත්කමක් (මූල්‍ය වත්කමක අදාල වන කොටස හෝ සමාන මූල්‍ය වත්කම් සමූහයක අදාල වන කොටස්) පහත අවස්ථාවලදී හඳුනා ගැනීම් ඉවත් කරනු ලබයි. එනම්

(i) වත්කමක කාලය ඉකුත් වී මුදල් ප්‍රවාහයන් ලැබීම් අයිතිය නිබෙන විට

(ii) ජා.ජ.ජ.ප.ම. වත්කම් වලින් මුදල් ප්‍රවාහ ලැබීමට ඇති අයිතිය හෝ ලැබෙන මුදල් ප්‍රමාණයන් ප්‍රමාණාත්මක කාල පමාවකින් තොරව තුන්වන පාර්ශ්වයන් වෙත ප්‍රේෂණය කිරීම. (Pass Through) ගිවිසුම් යටතේ කළ යුතු බවට උපකල්පනය කරන විට එසේත් නැත්නම්,

(අ) ජා.ජ.ජ.ප.ම. වත්කම් වල සියළුම අවදානම් හා ප්‍රතිලාභ ප්‍රමාණාත්මක ලෙස පවරා ඇති විට, හෝ
(ආ) ජා.ජ.ජ.ප.ම. විසින් වත්කම් වල සියළුම අවදානම් හා ප්‍රතිලාභ ප්‍රමාණාත්මක ලෙස පවරා නැති අවස්ථාවල අදාල වත්කම් වල පාලනය පවරා ඇතිවිට.

6.1.2.6 මූල්‍ය වත්කම් වල හානිකරණය

එක් එක් වාර්තාකරණ දිනට ඇති මූල්‍ය වත්කම් හෝ මූල්‍ය වත්කම් කාණ්ඩ වල අගය අඩුවීම් පිළිබඳ අරමුණු ගත සාක්ෂි නිබේ දැයි ජා.ජ.ජ.ප.ම. විසින් තක්සේරු කරනු ලබයි. මූල්‍ය වත්කමක හෝ මූල්‍ය වත්කම් කාණ්ඩයක අගය මූලික හඳුනාගැනීමෙන් පසුව, මූල්‍ය වත්කමක හෝ මූල්‍ය වත්කම් කාණ්ඩයක අගය හෝ අනාගත මුදල් ප්‍රවාහයක අඩුවීම් කෙරෙහි බලපාන එක් සිද්ධියක් හෝ සිද්ධීන් කීපයක් ඇති විය හැකි බව විශ්වාසදායි ලෙස ඇස්තමේන්තු කළ හැකි නම් එම වත්කම් වල අගය අඩුවන බව හා එසේ ඇතිවන බව නිගමනය කරනු ලබයි.

ණයගැතියන් හෝ ණයගැති කණ්ඩායම් වල ප්‍රමාණාත්මක මූල්‍ය දුෂ්කරතාවයන්, ණය ගෙවීම් පැහැර හැරීම් හෝ යුතුකම් ඉටු නොකිරීම්, වෙන්වීමට හෝ වෙනත් මූල්‍ය ප්‍රතිසංවිධානයන් සිදුකිරීමට නියමිතව තිබීම්, සහ ගෙවීම් පැහැර හැරීම් හා සම්බන්ධතාවයක් ඇති ආර්ථික නත්ත්වයන් හා තිහ ණය වාරික වැඩිවීම් යනාදී සම්බන්ධිත කරනු මඟින් පෙන්නුම් කරන අනාගත ඇස්තමේන්තු කළ හැකි මූල්‍ය ප්‍රවාහයන් වල ගණනය කළ හැකි අඩුවීම් හානිකරණයට අයත් අගය අඩුවීම් හා සාක්ෂි වලට ඇතුළත් විය හැකිය.

6.1.2.7 ක්‍රමක්ෂය වටිනාකමට පෙන්නුම් කරනු ලබන මූල්‍ය වත්කම්

හානිකරණ අගය මත ඉදිරියට ගෙන ආ මූල්‍ය වත්කම් සම්බන්ධව, පවතින අගය අඩුවීමේ සාක්ෂි තනි තනි මූල්‍ය වත්කම් සම්බන්ධව සලකා ලබන විට ප්‍රමාණවත්ද යන බව හෝ තනි තනි මූල්‍ය වත්කම් සම්බන්ධව ප්‍රමාණවත් නොවන විට මූල්‍ය වත්කම් කාණ්ඩයක් හා සම්බන්ධව ප්‍රමාණාත්මක වේද යන බව ජා.ජ.ජ.ප.ම. තක්සේරු කරනු ලබයි. ජා.ජ.ජ.ප.ම. නිශ්චය කරන ලද තනිව අගය කරන ලද මූල්‍ය වත්කම් වල අගය අඩුවීම් පිළිබඳ අරමුණුගත් සාක්ෂි නොමැති නම්, ඒවා ප්‍රමාණාත්මක වුවද ප්‍රමාණාත්මක නොවුවද , එම වත්කම් එක හා සමාන ණය අවදානම් සහිත මූල්‍ය වත්කම් කාණ්ඩයක් යටතේ වර්ගීකරණය කර සාමූහිකව අගය අඩුවීම් තක්සේරු කරනු ලබයි. අගය අඩුවීම් පිළිබඳ තනිතනිව අගය කරන ලද වත්කම්වල අගය අඩුවීමේ අලාභයන් ඇතිවීම් හෝ දිගින් දිගටම පවතී යයි. නිශ්චය කරන විට වත්කම් සාමූහිකව වර්ගීකරණය කර අගය අඩුවීමේ අලාභයක් ඇති විට හෝ දිගින් දිගටම පවතී යයි නිශ්චය කරන විට වත්කම් සාමූහිකව වර්ගීකරණය කර අගය අඩුවීම් තක්සේරු නොකරයි .

මූල්‍ය ප්‍රකාශනවල සටහන්
2017 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා

අගය අඩුවීමේ අලාභයක් දරා ඇති බවට අරමුණුගත සාක්ෂි නිබේ නම්, වත්කමේ ඉදිරියට ගෙන ආ ශේෂය සහ වත්කමෙන් ඉපයීම අපේක්ෂිත අනාගත මුල්‍ය ප්‍රවාහනයන්ගේ ශුද්ධ වර්තමාන අගය දැනටමත් දරා නොමැති අපේක්ෂිත බැර අලාභයන් ඇතුළත් නොකරන ලද අතර වෙනසක් පවතී නම් අගය අඩුවීම් අලාභයක් ලෙස හඳුනාගනු ලැබේ. අපේක්ෂිත අනාගත මුදල් ප්‍රවාහයන්ගේ ශුද්ධ වර්තමාන අගය මුල්යල වත්කමට අදාලව මුලින් තිබුණු සළුල පොලී අනුපාතය මත වට්ටම් කරනු ලැබේ.

ජා.ජ.ජ.ප.ම. එක් එක් ණය කණ්ඩයක් සඳහා නිශ්චිත අගය අඩුවීම් 2016 වර්ෂය තුළදී සාධනය කර ඇත.

6.2 මූල්‍ය වගකීම්

මූලික හඳුනාගැනීම් හා අගය කිරීම

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 39 හි සඳහන් විෂය පථයට අනුව, මූල්‍ය වගකීම්, සාධාරණ අගය, ක්‍රමක්ෂය පිරිවැය හෝ ඵලදායී ලෙස සැලසුම් කරන ලද ව්‍යුත්පන්න මෙවලම් අනුව සුදුසු පරිදි අගය කරනු ලබයි. ජා.ජ.ජ.ප .ම. මූල්‍ය වගකීම් එහි මූලික හඳුනා ගැනීම මත වර්ගීකරණය කරනු ලබයි.

සියලුම මූල්‍ය වගකීම් මුලිකව සාධාරණ අගය මත හඳුනාගනු ලබන අතර ණය හා ණය ගැනීම් ඒවායේ ක්‍රමක්ෂය පිරිවැයට හඳුනාගනු ලබන අතර මෙයට ගනුදෙනු සඳහා සෘජුවම අදාල වන පිරිවැය ඇතුළත් කරනු ලබයි. ජා.ජ.ජ.ප.මණ්ඩලයෙහි මූල්‍ය වගකීම් වලට වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු වියදම් ඇතුළත් වේ.

පසුව අගය කිරීම :

මූල්‍ය වගකීම් ක්‍රමක්ෂය අගයට පසුව අගයට කරනු ලබයි.

හඳුනාගැනීම් ඉවත් කිරීම :

මූල්‍ය වගකීම් ඒවායෙහි වගකීම් නිදහස් කල විට හෝ අවලංගු කල විට හෝ කල් ඉකුත් වූ විට හඳුනාගැනීම ඉවත් කරනු ලබයි.

මූල්‍ය ප්‍රකාශන වලට සටහන

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

		2017	2016
		රු.	රු.
7. අයභාරය			
මනුගත විකුණුම්		**21,348,160,939**	20,991,185,049
තොග විකුණුම්		**258,804,307**	238,030,488
බවුසර් සැපයුම්		**85,469,891**	88,515,542
ප්‍රධාන මෙහෙයුමෙන් වූ ආදායම්	7.1	**2,167,324,981**	2,266,996,408
		23,859,760,119	23,584,727,487
7.1 ප්‍රධාන මෙහෙයුම් ආදායම්			
ජල සම්බන්ධන හා අනෙකුත් මෙහෙයුම් ආදායම්		**2,477,538,710**	2,628,868,117
ප්‍රාග්ධන ආවරණ ආදායම්		**650,943,128**	766,302,051
නව ජලසම්බන්ධන සඳහාවූ වියදම්		**(961,156,857)**	(1,128,173,760)
		2,167,324,981	2,266,996,408
8. විකුණුම් පිරිවැය			
සේවක පිරිස් පිරිවැය		**6,352,852,297**	6,215,488,662
පොම්ප කිරීමේ පිරිවැය		**4,064,774,139**	3,833,788,962
රසායනික ද්‍රව්‍ය		**818,014,323**	692,354,529
අළුත් වැඩියා සහ නඩත්තු		**1,358,047,056**	1,270,587,139
ආයතනික වියදම්		**510,408,988**	473,717,459
ගෙවල් කුලී , වරිපනම් බදු, ආරක්ෂක හා අනෙකුත් වියදම්		**991,127,078**	908,910,549
සහනාධාර		**101,126,579**	90,880,043
		14,196,350,460	13,485,727,343
9. වෙනත් මෙහෙයුම් ආදායම්			
වෙනත් ආදායම්	9.1	**1,709,234,921**	1,428,167,676
කාර්ය මණ්ඩල ණය ප්‍රතිලාභ		**15,228,227**	49,379,029
		1,724,463,148	1,477,546,705
9.1 වෙනත් ආදායම්			
මලාපවහන හා භූගත ජල ආදායම්		**272,787,008**	280,748,461
අධිඅය හා දන්ඩන ආදායම් ඇතුළු අනෙකුත්		**1,436,447,913**	1,147,419,215
		1,709,234,921	1,428,167,676

මූල්‍ය ප්‍රකාශන වලට සටහන

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

		2017	2016
		රු.	රු.
10. පරිපාලන වියදම්			
අළුත් වැඩියා සහ නඩත්තු		**221,799,539**	218,910,020
ආයතනික වියදම්		**698,631,095**	635,852,111
ගෙවල් කුලී , වරිපනම් බදු , ආරක්ෂක හා වෙනත් වියදම්		**449,593,829**	359,067,735
කාර්ය මණ්ඩල පිරිවැය	10.1	**5,222,246,171**	5,197,383,263
ක්ෂය	10.2	**3,339,845,190**	2,722,585,774
විගණන ගාස්තු		**3,200,000**	3,111,696
		9,935,315,824	9,136,910,599
10.1 කාර්ය මණ්ඩල පිරිවැය			
ලබාදුන් සේවක ණය මත සේවක පිරිවැය		**15,228,227**	49,379,029
පිරිස් පිරිවැය		**5,207,017,944**	5,148,004,234
		5,222,246,171	5,197,383,263
10.2 ක්ෂය			
ගොඩනැඟිලි හා ව්‍යුහයන්		**1,079,834,033**	948,013,836
පිරියත හා යන්ත්‍ර		**2,804,805,713**	1,193,277,323
උපකරණ		**322,100,055**	1,333,925,122
ලී බඩු සහ සවිකිරීම්		**47,597,987**	39,508,591
පරිගනක හා ආශ්‍රිත උපකරණ		**62,692,861**	53,487,044
මොටර්වාහන		**209,956,160**	144,901,475
මුළු ක්ෂය		**4,526,986,809**	3,713,113,391
අඩු කලා - ප්‍රදාන මගින් මූල්‍යනය වූ වත්කම් වල ක්ෂයවීම්		**(1,195,058,205)**	(999,478,284)
අඩු කලා - නැවත අයකරනු ලබන වත්කම් වල ක්ෂයවීම්		**(8,326,397)**	(7,292,317)
එකතු කලා: කල්බදු වත්කම් ක්‍රමක්ෂය (යලි ප්‍රකාශිත)		**15,949,142**	15,949,142
එකතු කලා - අස්පෘශ්‍ය වත්කම් වල ක්‍රමක්ෂය		**293,841**	293,841
ක්ෂය පිරිවැය		**3,339,845,190**	2,722,585,774
11. වෙනත් මෙහෙයුම් වියදම්			
බොල් හා අඩමාන ණය		**28,571,639**	125,257,676
අයකළ නොහැකි සේවක ණය සඳහා වෙන්කිරීම		**2,440,340**	2,472,380
කල් ඉකුත් වූ තොග සඳහා අධි වෙන්කිරීම		**63,131,636**	22,459,422
විශ්‍රාම පාරිතෝෂික		**488,661,467**	394,618,174
අයභාර ප්‍රදාන		**131,660,553**	135,856,389
		714,465,635	680,664,041
12. මූල්‍ය ආදායම්			
ආයෝජන ආදායම්		**1,157,359,094**	1,236,278,724
		1,157,359,094	1,236,278,724
13. මූල්‍ය වියදම්			
ණය මත පොලිය		**6,291,304,344**	1,670,213,515
අඩු කලා - නිර්මාන ව්‍යාපෘතිවල ප්‍රාග්ධනිත කළ පොලිය		**(6,278,309,723)**	(1,666,931,980)
		12,994,621	3,281,535
14. බදු			
ආර්ථික සේවා ගාස්තු		**65,683,426**	63,287,387
		65,683,426	63,287,387

මූල්‍ය ප්‍රකාශන වලට සටහන

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

15. දේපල පිරියත හා උපකරණ

15.1 දල ධාරණ අගය

පිරිවැය	2017.01.01 දිනට යලි ප්‍රකාශිත ශේෂය	ගැලපීම් වලට පසු එකතු කිරීම්	මාරු කිරීම්	ඉවත්කිරීම්	2017.12.31 දිනට ශේෂය
	රු.	රු.	රු.	රු.	රු.
සින්නක්කර ඉඩම්	8,358,310,005	39,209,590	(35,444,775)		**8,362,074,820**
කල්බදු ඉඩම්	589,540,351	37,526,206	(736,566)		**626,329,991**
යටිතල පහසුකම්	5,713,979,507	163,218,526	(555,209)		**5,876,642,824**
සින්නක්කර ගොඩනැගිලි	11,106,565,457	1,059,485,479	(47,971,473)		**12,118,079,463**
ව්‍යුහයන්	43,206,451,374	1,677,371,129	(203,202,552)	(6,657,415)	**44,673,962,536**
පිරියත හා පොම්ප උපකරණ	28,246,961,522	2,931,966,223	99,884,626		**31,278,812,371**
සේවා මනු	19,439,577	-	-		**19,439,577**
තොග ජල මනු	519,178,126	17,939,284	2,158,318		**539,275,728**
සම්ප්‍රේෂණ හා බෙදාහැරීම්	76,709,107,252	8,028,388,128	242,305,722		**84,979,801,103**
ජංගම උපකරණ	450,670,409	110,849,200	10,510,861		**572,030,469**
මැනුම් උපකරණ	32,735,831	8,967,750	130,000		**41,833,582**
රසායනාගාර උපකරණ	585,697,600	51,794,443	7,007,579		**644,499,621**
වෙනත් උපකරණ	2,060,775,152	122,090,504	(10,299,339)		**2,172,566,317**
ලී බඩු සහ සවි කිරීම් - පරිගණක	473,476,783	65,883,736	(6,380,747)		**532,979,772**
පරිගණක හා පර්යන්ත උපකරන	432,827,580	72,055,563	(11,307,114)		**493,576,029**
මෝටර් වාහන - කාර් රථ	156,485,434	6,153,750	1,469,942	(500,000)	**163,609,127**
වෑන්, බස් හා ජීප් රථ	541,966,481	24,903,939	(23,075,723)	(600,000)	**543,194,697**
ලොරි හා ට්‍රක් රථ	2,008,337,825	176,077,837	(61,126,909)	-	**2,123,288,754**
ට්‍රැක්ටර් සහ ට්‍රේලර්	89,076,211	1,679,000	(15,125,000)	-	**75,630,211**
ජල බවුසර් හා බර වාහන	1,111,523,133	381,564,571	(134,533,632)	(1,050,000)	**1,357,504,072**
මෝටර් සයිකල්	23,992,152	1,256,980	(1,775,000)	-	**23,474,132**
ත්‍රී රෝද රථ	4,787,620	700,000	1,619,256	-	**7,106,876**
කල් බදු වාහන	28,975,000	-	(5,795,000)	-	**23,180,000**
මුළු ක්ෂය කළ හැකි වත්කම් වල වටිනාකම	182,470,860,382	14,979,081,838	(192,242,736)	(8,807,415)	**197,248,892,069**

15.2 ක්ෂය

	2017.01.01 දිනට යලි ප්‍රකාශිත ශේෂය	වර්ෂය සඳහා ක්ෂය	ගැලපීම්	ඉවත්කිරීම්	2017.12.31 දිනට ශේෂය
	රු.	රු.	රු.	රු.	රු.
ක්ෂය					
සින්නක්කර වත්කම්					
සින්නක්කර ඉඩම්					-
කල්බදු ඉඩම්					-
යටිතල පහසුකම්	575,941,027	115,537,536	51,371		**691,529,934**
සින්නක්කර ගොඩනැඟිලි	1,155,403,606	232,391,381	(41,066)		**1,387,753,922**
ව්‍යුහයන්	3,686,898,046	731,905,116	(42,732)	(1,028,404)	**4,417,732,025**
පිරියත හා පොම්ප උපකරණ	5,670,610,943	1,393,011,703	-		**7,063,622,646**
සේවා මනු	14,309,417	1,924,518	-		**16,233,935**
නොග ජල මනු	143,038,676	52,105,545	-		**195,144,221**
සම්ප්‍රේෂණ හා බෙදාහැරීම්	6,053,191,059	1,357,763,947	(128,075)		**7,410,826,931**
ජංගම උපකරණ	174,437,893	47,151,084	261,250		**221,850,227**
මැනුම් උපකරණ	7,357,504	3,479,854	-		**10,837,358**
රසායනාගාර	265,594,813	60,425,520	(71,850)		**325,948,484**
වෙනත් උපකරණ	684,675,572	211,043,597	-		**895,719,169**
ලී බඩු සහ සවි කිරීම් - පරිගණ	221,613,246	47,597,987	132,939		**269,344,172**
පරිගණක හා පර්යන්ත උපක	334,753,554	62,692,861	-		**397,446,415**
මෝටර් වාහන - කාර් රථ	140,950,003	11,659,952	(9,700)	(475,000)	**152,125,255**
වෑන්, බස් හා ජීප් රථ	342,013,023	30,851,817	570,000	(570,000)	**372,864,840**
ලොරි හා ට්‍රක් රථ	401,042,903	96,013,974	(148,042)		**496,908,836**
ට්‍රැක්ටර් සහ ට්ලර්	57,894,593	7,550,304	-		**65,444,897**
ජල බවුසර් හා බර වාහන	204,495,606	57,448,872	-	(236,906)	**261,707,572**
මෝටර් සයිකල්	9,150,388	2,233,174	(5,858)		**11,377,704**
ත්‍රී රෝද රථ	784,833	589,834	-	-	**1,374,667**
කල් බදු වාහන	5,051,526	3,608,233	-	-	**8,659,758**
	20,149,208,230	4,526,986,809	568,238	(2,310,310)	**24,674,452,967**

මූල්‍ය ප්‍රකාශන වලට සටහන

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

15. දේපල පිරියත හා උපකරණ

15.3 ශුද්ධ පොත් අගය	2017 රු.	2016 රු.
පිරිවැය		
සින්නක්කර ඉඩම්	**8,362,074,820**	8,358,310,005
කල්බදු ඉඩම්	**626,329,991**	589,540,351
යටිතල පහසුකම්	**5,185,112,890**	5,138,038,479
සින්නක්කර ගොඩනැඟිලි	**10,730,325,542**	9,951,161,851
ව්‍යුහයන්	**40,256,230,511**	39,519,553,329
පිරියත හා පොම්ප උපකරණ	**24,215,189,724**	22,576,350,580
සේවා මනු	**3,205,642**	5,130,160
තොග ජල මනු	**344,131,507**	376,139,450
සම්ප්‍රේෂණ හා බෙදාහැරීම්	**77,568,974,172**	70,655,916,194
ජංගම උපකරණ	**350,180,242**	276,232,515
මැනුම් උපකරණ	**30,996,224**	25,378,327
රසායනාගාර	**318,551,138**	320,102,787
වෙනත් උපකරණ	**1,276,847,149**	1,376,099,581
ලී බඩු සහ සවි කිරීම් - පරිගණක	**263,635,600**	251,863,537
පරිගණක හා පර්යන්ත උපකරන	**96,129,613**	98,074,025
මෝටර් වාහන - කාර් රථ	**11,483,872**	15,535,432
වෑන්, බස් හා ජීප් රථ	**170,329,857**	199,953,458
ලොරි හා ට්‍රක් රථ	**1,626,379,916**	1,607,294,922
ට්‍රැක්ටර් සහ ට්ලර්	**10,185,314**	31,181,618
ජල බවුසර් හා බර වාහන	**1,095,796,500**	907,027,526
මෝටර් සයිකල්	**12,096,428**	14,841,764
ත්‍රී රෝද රථ	**5,732,209**	4,002,787
කල් බදු වාහන	**14,520,242**	23,923,474
දේපල පිරියත හා උපකරණ වල මුළු ධාරන අගය.	**172,574,439,103**	162,321,652,152

මූල්‍ය ප්‍රකාශන වලට සටහන

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

15. දේපල පිරියත හා උපකරණ

15.4 ආයෝජන දේපල

ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය විසින් දැනට ප්‍රයෝජනයට ගෙන ඇති බත්තරමුල්ල සුනිල් මාවතේ ගොඩනැගිල්ල මණ්ඩලය විසින් ඉදිකර ඇති අතර එය ශ්‍රී.ල.ගි.ප්‍ර 40 අනුව ආයෝජන දේපලක් වශයෙන් හඳුනාගෙන ඇත.

මෙම ආයෝජන දේපල දේපල පිරියත හා උපකරණ යටතේ දක්වා ඇත.

	ඉඩම්	ගොඩනැඟිලි	එකතුව
පිරිවැය			
2017.12.31 දිනට ශේෂය	138,500,000	238,053,034	376,553,034
ක්ෂය			
2017.01.01 දිනට ශේෂය	-	24,488,110	24,488,110
කාලපරිච්ඡේදය සඳහා ක්ෂය	-	4,761,061	4,761,061
2017.12.31 දිනට ශේෂය	-	29,249,171	29,249,171
ශුද්ධ පොත් අගය	**138,500,000**	**208,803,863**	**347,303,863**

මූල්‍ය ප්‍රකාශන වලට සටහන

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

		2017	2016
		රු.	රු.
16. අස්පෘශ්‍ය වත්කම්			
පරිගණක මෘදුකාංග		**6,485,383**	7,310,270
		6,485,383	7,310,270

වර්ෂය තුලදී ඉහත සඳහන් මෘදුකාංග සඳහා රු.1,335,128 ක් ක්‍රමක්ෂය ලෙස වෙන් කර ඇත.

17. කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ			
ඉදිකිරීම් වැඩ	35.2	**190,486,254,966**	155,053,048,707
පුනරුත්ථාපන	35.2	**4,057,618,713**	3,458,987,188
		194,543,873,679	158,512,035,894

18. මූල්‍ය වත්කම්			
සේවක නිවාස ණය සඳහා HDFC හි ආයෝජනය.		**6,968,542**	9,810,535
ලංකා බැංකුව ඉතුරුම් - II		**1,261,927**	1,212,528
		8,230,469	11,023,063

19. තොග			
පිවිසි වානේ පයිප්ප		**3,596,506,695**	3,793,823,910
ජලමනු හා පිත්තල අයිතම	35.2	**1,010,013,091**	535,700,413
රසායනික ද්‍රව්‍ය		**132,869,718**	122,602,755
විදුලි උපකරණ	35.2	**562,303,793**	478,551,324
ගොඩනැගිලි ද්‍රව්‍ය		**34,335,045**	31,037,997
පයිප්ප හා අමතර උපාංග		**1,145,954,807**	934,006,921
වාහන අමතර කොටස්		**139,120,998**	108,321,976
ලිපිද්‍රව්‍ය හා කාර්යාල උපකරණ		**49,246,438**	44,572,040
වෙනත් අයිතම	35.2	**786,994,194**	496,747,679
මාර්ගස්ථ තොග		**352,151,303**	443,569,646
තොග ගැලපුම්		**2,505,677**	2,555,749
		7,812,001,758	6,991,490,409
අඩුකලා- ප්‍රධාන අමතර කොටස්			
ගබඩාවල තිබෙන දේපල පිරියත හා උපකරණ		**(319,639,473)**	(293,154,819)
කල් ඉකුත් වූ තොග සඳහා වෙන්කිරීම		**(117,994,671)**	(54,863,035)
		7,374,367,615	6,643,472,555

මූල්‍ය ප්‍රකාශන වලට සටහන

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

		2017	2016
		රු.	රු.
20. වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ			
වෙළඳ ණයගැතියෝ		**4,816,900,998**	4,607,789,723
වෙනත් ණයගැතියෝ	**35.2**	**300,715,065**	314,319,532
අඩුකළා : ණයගැති හානිකරණ		**(1,197,444,350)**	(1,322,209,166)
ණයගැති පාලන ගිණුම		**735,476,738**	591,158,421
ලැබිය යුතු ඒ.අ.බදු		**1,239,703,052**	331,450,527
ලැබිය යුතු රඳවා ගැනීම් බදු		**114,867,966**	46,931,199
සේවක අත්තිකාරම්	**35.2**	**12,818,410**	14,391,333
සේවක ණය	**35.2**	**2,468,034,087**	1,696,045,045
ලැබිය යුතු පොලී හා වෙනත්	**35.2**	**97,110,133**	232,278,306
		8,588,182,099	6,512,154,920

වර්ෂය තුලදී ණය ගැනියන් හායනය රු 153,336,455 කින් අධි ගණනයවී ඇති බව හඳුනාගෙන උක්ත ගැලපීම ශ්‍රී.ල.ගි.ප්‍ර අංක 8 අනුව ආදායම් ප්‍රකාශයට මාරු කර ඇත.

21. තැන්පතු සහ අත්තිකාරම්			
අයකරගත හැකි ව්‍යාපෘති වැඩ		-	114,010
කලින් ගෙවීම්		**585,500**	4,539,500
අත්තිකාරම් (යෙදවූ දෑ ඇතුලත්ව)	**35.2**	**41,900,934,928**	26,604,485,106
තැන්පතු	**35.2**	**223,131,222**	221,460,394
		42,124,651,650	26,830,599,011
22. ආයෝජන			
විකිනීම සඳහා පවතින භාන්ඩාගාර බැඳුම්කර		-	6,808,685,161
පරිණත දිනය දක්වා තබා ගන්නා මූල්‍ය සාධන පත්‍ර		**12,240,208,742**	3,457,036,783
(නැවත අයකරගන්නා වැඩ හා අනෙකුත් ආයෝජන මුදල් ඇතුලත්ව)		**12,240,208,742**	10,265,721,944
23. මුදල් හා මුදල් සමාන දෑ			
බැංකුවේ මුදල්	**35.2**	**994,458,651**	1,864,867,005
ප්‍රාග්ධන ව්‍යාපෘති සඳහා මුදල් ලැබීම			6,529,848,750
ප්‍රධාන කාර්යාලයේ මුදල් අග්‍රිමය		**1,337,464**	2,363,785
ප්‍රාදේශීය මුදල් අග්‍රිමය	**35.2**	**8,955,594**	3,844,753
මාර්ගස්ථ මුදල්		**316,176,266**	344,259,084
නිවේදනිය තැන්පතු		**2,379,251,307**	3,108,519,601
ඉතිරි කිරීමේ ගිණුම්		**77,269,025**	239,006,742
		3,777,448,306	12,092,709,720
24. රජයෙන් අත්පත් කරගත් වත්කම්			
රජයේ දෙපාර්තමේන්තු වලින් අත්පත් කර ගත් වත්කම්		**185,480,387**	185,480,387
		185,480,387	185,480,387
25. රාජ්‍ය ස්කන්ධය			
ණය, ප්‍රාග්ධනය ලෙස පරිවර්ථනය	**35.2**	**63,612,515,640**	55,570,985,685
රාජ්‍ය දායකත්වය (බැඳුම්කර)		**13,899,983,925**	13,899,983,925
		77,512,499,566	69,470,969,610

ප්‍රවර්ථන වර්ෂයට අදාල විදේශ ණය රාජ්‍ය ස්කන්ධයට මාරු කිරීම සඳහා ප්‍රතිපත්තිමය තීරනයනක් රජය ගන්නා ලදී.

මූල්‍ය ප්‍රකාශන වලට සටහන

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

		2017 රු.	2016 රු.
26. සේවක සුභසාධන අරමුදල			
ආරම්භක ශේෂය		**17,228,139**	16,506,484
වර්ෂය තුළ ලැබීම්		**5,298,986**	721,655
		22,527,125	17,228,139
27. රජයේ ප්‍රදාන			
භාණ්ඩාගාර ප්‍රදාන	**35.2**	**94,838,588,669**	92,742,583,734
		94,838,588,669	92,742,583,734
28. ප්‍රාග්ධන ප්‍රදාන			
විදේශීය ප්‍රදාන	**35.2**	**189,307,749,625**	180,564,263,033
දේශීය ප්‍රදාන	**35.2**	**1,066,069,820**	978,419,632
		190,373,819,444	181,542,682,665
29. ගෙවිය යුතු ණය			
විදේශ ණය	**35.2**	**40,512,242,399**	14,674,458,231
දේශීය ණය		**23,815,513,351**	19,767,069,288
දිගුකාලීන ණය වල කෙටිකාලීන කොටස		**64,327,755,750**	34,441,527,519
දිගුකාලීන ණය වල දිගුකාලීන කොටස		**2,833,921,592**	625,822,304
ගෙවිය යුතු ණය		**67,161,677,342**	35,067,349,823

පෙර වර්ෂ වල දක්වා ඇති රු 20,392,891,592 වූ දේශීය ණය සන්සන්දනය සඳහා එම ණය වල කෙටිකාලීන කොටස වෙනම දක්වා ඇත.

30. වෙනත් අසම්භාව්‍යය වගකීම්			
විශ්‍රම ප්‍රතිලාභ සැලැස්ම සඳහා වෙන් කිරීම	**30.1**	**4,076,428,515**	4,076,428,515
ගනුදෙනුකරු හා සේවක ආරක්ෂිත තැම්පතු		**34,317,636**	48,594,971
		4,110,746,151	4,125,023,486
30.1 විශ්‍රාම ප්‍රතිලාභ සැලැස්මේ වෙනස්වීම්			
කාලපරිච්ඡේදය ආරම්භක ශේෂය		**4,076,428,515**	4,076,428,515
එකතු කළා - කාල පරිච්ඡේදය සඳහා වෙන්කිරීම්		**488,661,467**	394,618,174
අඩුකලා - කාල පරිච්ඡේදය තුළ පාරිනෝෂික ගෙවීම		**(488,661,467)**	(394,618,174)
		4,076,428,515	4,076,428,515
31. වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ			
නැවත අයකර ගත හැකි වැඩ සඳහා ගනුදෙනුකරුවන්ගේ අත්තිකාරම්		**6,634,430,544**	4,039,297,939
කොන්ත්‍රාත්කරුවන්ගේ රඳවා ගැනීම්	**35.2**	**5,042,274,861**	3,669,249,055
කල් බදු ණය හිමියෝ		**18,506,495**	26,164,355
අඩුකලා - අවිනිශ්චිත පොලිය		**(2,214,055)**	(4,382,302)
ණයහිමි පාලන ගිණුම්	**35.2**	**833,652,597**	1,221,394,974
වෙනත් ණයහිමියෝ		**97,725,057**	101,480,705
උපචිත වියදම්		**1,031,675,560**	504,823,198
තැන්පතු		**74,663,873**	72,954,077
ගෙවිය යුතු එකතු කළ අගය මත බදු		**65,265**	-
රඳවා ගැනීම් බදු		**54,667**	54,667
වැටුප් හා වෙනත් ගෙවිය යුතු දෑ	**35.2**	**191,068,515**	182,844,259
විගණන ගාස්තු		**3,200,000**	17,165,616
		13,925,103,379	9,831,046,543

මූල්‍ය ප්‍රකාශන වලට සටහන

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

32. විලම්බිත බදු

පහත සඳහන් දෑ වලට අදාල විලම්බිත බදු වත්කම්, වගකීම් හා ආදායම්.

	ශේෂ පත්‍රය		ආදායම් ප්‍රකාශය	
	2017	2016	**2017**	2016
	රු.	රු.	රු.	රු.
විලම්බිත බදු වගකීම				
ප්‍රාග්ධන දීමනා	**4,493,724,551**	10,232,612,468	**3,339,845,190**	2,103,018,287
අප්සෘශ්‍යය වත්කම්	**293,841**	453,497	**(1,335,127)**	(14,376,428)
	4,494,018,392	10,233,065,965	**3,338,510,063**	2,088,641,859
විලම්බිත බදු වත්කම්				
ණයගැනි හානිකරණය	**(124,764,816)**	298,860,427	**(34,934,148)**	19,948,692
	(124,764,816)	298,860,427		
විලම්බිත බදු වියදම /(මාරුකිරීම්)			**3,303,575,915**	2,108,590,551
ශුද්ධ විලම්බිත බදු වගකීම්/ (වත්කම්)	**4,618,783,208**	9,934,205,538		

භාවිතා නොකරන ලද බදු අලාභ පැවතීම අනාගතයේදී බදු අය හැකි ආදායම් නොතිබීම තහවුරු කරන ප්‍රභල සාක්ෂියක් වේ. ජා.ජ.ජ.ප. මණ්ඩලයේ 2017 දෙසැම්බර් 31 දිනට පැවති සමුච්චිත බදු අලාභය රු.81,082,402,414 ක් විය. ජා.ජ.ජ.ප. මණ්ඩලය ආදායම් බදු ගෙවීම ඉතා අවිනිශ්චිත වන අතර එහි ප්‍රතිඵලයක් ලෙස ගිණුම්වල විලම්භිත බදු වත්කම්/වගකීම් හඳුනා නොගනී.

33. සම්බන්ධිත පාර්ශවයන් සමඟ ගනුදෙනු

රජයේ සහ රජය විසින් පාලනය කරනු ලබන ආයතන සමඟ ගනුදෙනු.

මණ්ඩලය විසින් සිදුකරනු ලබන සාමාන්‍ය ගනුදෙනු සමඟ සම්බන්ධිත පාර්ශවයන් සමඟ ද ගනුදෙනු කරනු ලැබේ. ශ්‍රී ලංකා රජය (මණ්ඩලයේ අවසන් බලධාරිකාරිය ලෙස දැන්වෙනු ලබන) විවිධ වූ රාජ්‍ය දෙපාර්තමේන්තු සහ රජය විසින් පාලනය කරනු ලබන ආයතන සම්බන්ධිත පාර්ශව වලට අයත් වේ. රජයේ සහ රජය විසින් පාලනය කරනු ලබන ආයතන වලට අදාළ තනි තනි වශයෙන් වැදගත් වන සහ තනි තනි වශයෙන් වැදගත් නොවූවද සාමූහික වශයෙන් ගත්කළ වැදගත් වන, මණ්ඩලය විසින් සිදු කරන ලද ගනුදෙනු සහ විධිවිධානයන් පිළිබඳ විස්තර පහත දැක්වේ.

34. ශේෂ පත්‍ර දිනට පසු සිදුවීම්

සියලුම ප්‍රමාණාත්මක ශේෂපත්‍ර දිනට පසු සිදුවීම් සැලකිල්ලට ගෙන ඇති අතර සුදුසු ගැලපීම් අවශ්‍ය වන පරිදි මූල්‍ය වාර්තා වල සිදුකර ඒවා අනාවරණය කරනු ලබයි.

35. පූර්ව වර්ෂ ගැලපීම

35.1 2007.12.31 දිනට පැවති මණ්ඩලය සතු වත්කම් තක්සේරු දෙපාර්තමේන්තුවේ සහය ඇතිව ප්‍රත්‍යාගණනය කරන ලදී. මෙම ප්‍රත්‍යාගනිත අගයන් 2010 වර්ෂයේදී පොත් වලට ගන්නා ලද අතර මෙම අගයන් මේවන තෙක් ධාරණ අගය ලෙස පොත් වල පවතී. වත්කම් ප්‍රමානය අතිවිශාල වීම නිසා 2010 වර්ෂයේ සිදුවූ යම් අත්හැරීම් හා ද්විගණනය වීම් පූර්ව වර්ෂ ගැලපීම් යටතේ පෙර වර්ෂ වලට බලපාන පරිදි නිවැරදි කර ඇත. මේ අනුව දේපල පිරියත හා උපකරණ වල ධාරණ අගයට වන ශුද්ධ බලපෑම වන රු.මිලියන 22.4 ගලපන ලද අතර 2016.12.31 දිනට ක්ෂය වීම් ලෙස රු.මිලියන 19.9 ක් ගලපන ලදී. මෙයට අමතරව රු.මිලියන 2.3 ක්ෂයවීම් 2016 වර්ෂයට අදාල ක්ෂයවීම් ලෙස ගලපන ලදී.

35.1.1 දල ධාරණ අගය

පිරිවැය සින්නක්කර වත්කම්	2016.12.31 දිනට ශේෂය Rs.	පූර්ව වර්ෂ ගැලපීම් Rs.	2016.12.31 දිනට යලි ප්‍රකාශිත ශේෂය Rs.
සින්නක්කර ඉඩම්	8,358,310,005	-	8,358,310,005
කල්බදු ඉඩම්	589,540,351		589,540,351
යටිතල පහසුකම්	5,713,979,507	-	5,713,979,507
සින්නක්කර ගොඩනැඟිලි	11,106,565,457	-	11,106,565,457
ව්‍යුහයන්	43,206,451,374	-	43,206,451,374
පිරියත හා පොම්ප උපකරණ	28,246,961,522	-	28,246,961,522
සේවා මනු	19,439,577	-	19,439,577
තොග ජල මනු	519,178,126	-	519,178,126
සම්ප්‍රේෂණ හා බෙදාහැරීම්	76,709,107,252	-	76,709,107,252
ජංගම උපකරණ	450,670,409	-	450,670,409
මැනුම් උපකරණ	32,735,831	-	32,735,831
රසායනාගාර	585,697,600	-	585,697,600
වෙනත් උපකරණ	2,060,775,152	-	2,060,775,152
ලී බඩු සහ සවි කිරීම් - පරිගණක	473,602,383	(125,600)	473,476,783
පරිගණක හා පර්යන්ත උපකරන	432,920,480	(92,900)	432,827,580
මෝටර් වාහන - කාර් රථ	156,844,184	(358,750)	156,485,434
වෑන්, බස් හා ජීප් රථ	534,156,481	7,810,000	541,966,481
ලොරි හා ට්‍රක් රථ	1,979,047,810	29,290,015	2,008,337,825
ට්‍රැක්ටර් සහ ට්ලර්	89,076,211	-	89,076,211
ජල බවුසර් හා බර වාහන	1,126,163,133	(14,640,000)	1,111,523,133
මෝටර් සයිකල්	23,427,152	565,000	23,992,152
ත්‍රී රෝද රථ	4,787,620	-	4,787,620
කල් බදු වාහන	28,975,000	-	28,975,000
මුළු ක්ෂය කළ හැකි වත්කම් වල වටි	182,448,412,617	22,447,765	182,470,860,382

මූල්‍ය ප්‍රකාශන වලට සටහන

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

35.1.2 ක්ෂය සින්නක්කර වත්කම්	2016.12.31 දිනට ශේෂය රු.	පූර්ව වර්ෂ ගැලපීම් රු.	2016.12.31 දිනට යලි ප්‍රකාශිත ශේෂය රු.
සින්නක්කර ඉඩම්	-		-
කල්බදු ඉඩම්	-		-
යටිතල පහසුකම්	575,941,027	-	575,941,027
සින්නක්කර ගොඩනැඟිලි	1,155,403,606	-	1,155,403,606
ව්‍යුහයන්	3,686,898,046	-	3,686,898,046
පිරියත හා පොම්ප උපකරණ	5,670,610,943	-	5,670,610,943
සේවා මනු	14,309,417	-	14,309,417
තොග ජල මනු	143,038,676	-	143,038,676
සම්ප්‍රේෂණ හා බෙදාහැරීම්	6,053,440,346	(249,287)	6,053,191,059
ජංගම උපකරණ	174,437,893	-	174,437,893
මැනුම් උපකරණ	7,357,504	-	7,357,504
රසායනාගාර	265,594,813	-	265,594,813
වෙනත් උපකරණ	684,675,572	-	684,675,572
ලී බඩු සහ සවි කිරීම් - පරිගණක	221,466,931	146,315	221,613,246
පරිගණක හා පර්යන්ත උපකරන	334,753,554		334,753,554
මෝටර් වාහන - කාර් රථ	141,037,303	(87,300)	140,950,003
වෑන්, බස් හා ජීප් රථ	342,763,523	(750,500)	342,013,023
ලොරි හා ට්‍රක් රථ	402,690,607	(1,647,704)	401,042,903
ට්‍රැක්ටර් සහ ට්ලර්	57,851,386	43,207	57,894,593
ජල බවුසර් හා බර වාහන	221,781,839	(17,286,233)	204,495,606
මෝටර් සයිකල්	9,251,206	(100,819)	9,150,388
ත්‍රි රෝද රථ	784,833	-	784,833
කල් බදු වාහන	5,051,526	-	5,051,526
මුළු ක්ෂය වල වටිනාකම	20,169,140,551	(19,932,321)	20,149,208,230

මූල්‍ය ප්‍රකාශන වලට සටහන

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

35.2 දේපල පිරියක උපකරණ වලට අදාල පෙර වර්ෂ ගැලපීම් වලට අමතරව පහත සඳහන් අයිතමද පූර්ව වර්ෂ සඳහා බලපාන ලෙස ගලපා ඇත.

	2016.12.31 දිනට ශේෂය	පූර්ව වර්ෂ ගැලපීම්	2016 වර්ෂයට අදාල ගැලපීම්	TSAP වැඩ සටහන යටතේ මාරු කිරීම්	2016.12.31 දිනට යලි ප්‍රකාශිත ශේෂය
	රු.	රු.	රු.	රු.	රු.
කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ (සටහන් 17)					
නිර්මාන වැඩ	155,229,972,659	(136,967,188)		(39,956,765)	155,053,048,707
පුනරුත්තාපන	3,666,192,550	(48,432,336)		(158,773,026)	3,458,987,188
තොග (සටහන් 19)					
මාර්ගස්ථ තොග					
විදුලි උපකරණ	477,733,511	-	817,813		478,551,324
ජලමනු හා පිත්තල අයිතම	568,961,667	(27,921,254)	(5,340,000)		535,700,413
වෙනත් අයිතම	507,209,517	(10,461,839)			496,747,679
වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ (සටහන් 20)					
සේවක අත්තිකාරම්	1,713,412,289	-		(17,367,244)	1,696,045,045
ලැබිය යුතු පොලී හා වෙනත්	372,733,981	(137,739,576)	(2,716,099)		232,278,306
වෙනත් ණයගැතියෝ	302,907,898			11,411,634	314,319,532
සේවක අත්තිකාරම්	15,624,539			(1,233,206)	14,391,333
තැන්පතු සහ අත්තිකාරම් (සටහන් 21)					
අත්තිකාරම් (යෙදවූ දෑ ඇතුලත්ව)	26,659,765,475	(18,150,388)		(37,129,981)	26,604,485,106
තැන්පතු	234,531,755			(13,071,361)	221,460,394
මුදල් හා මුදල් සමාන දෑ (සටහන් 23)					
බැංකුවේ ඇති මුදල්	1,869,822,259	(1,532,647)		(3,422,607)	1,864,867,005
ප්‍රාදේශික වල මූල්‍ය අග්‍රිම	3,850,690			(5,937)	3,844,753
ප්‍රාග්ධන ප්‍රදාන (සටහන් 27 හා 28)					
විදේශීය ප්‍රදාන	180,809,157,920			(244,894,887)	180,564,263,033
දේශීය ප්‍රදාන	983,667,752			(5,248,120)	978,419,632
භාණ්ඩාගාර ප්‍රදාන	92,750,876,538			(8,292,804)	92,742,583,734
වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ (සටහන් 31)					
කොන්ත්‍රාත්කරුවන්ගේ රඳවා ගැනීම්	3,666,057,746	-		3,191,309	3,669,249,055
ණයහිමි පාලන ගිණුම	1,247,126,354	(3,378,627)	(19,770,000)	(2,582,753)	1,221,394,974
වැටුප් හා වෙනත් ගෙවිය යුතු දෑ	184,565,497			(1,721,237)	182,844,259
					-
වෙනත්					
විදේශ ණය (සටහන් 29)	15,335,301,002		(660,842,771)		14,674,458,231
රාජ්‍ය ප්‍රාග්ධනය (සටහන් 25)	54,910,142,914		660,842,771		55,570,985,685

ගිණුම්කරන ක්‍රියාවලිය විධිමත් කිරීමේ වැඩ සටහන (TSAP) දිගුකල් පරිශේෂ වන ශේෂ (LOBs)

දිගුකල් පරිශේෂ වන ශේෂ සැසඳීමේ වැඩසටහන, TSAP යන තේමාව යටතේ දීර්ග කර ඇති අතර හඳුනාගත් දිගුකල් පරිශේෂ වන ශේෂ වැඩිදුර විමර්ෂණය සඳහා වෙනම ගිණුමකට මාරු ඇත. උක්ත බලපෑම වෙනත් ණය ගැනියන් සඳහා ගලපා ඇති අතර ඊට අදාල වන පරිදි පූර්ව වර්ෂ ශේෂ සංශෝධනය කර ඇත.

මූල්‍ය ප්‍රකාශන වලට සටහන

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

36. ජා.ජ.ස.ජ.ප.ම මුළු ණය බැදීම්

	2017 රු.	2016 රු.
36.1 ජා.ජ.ස.ජ.ප.ම පහත පරිදි ණය සඳහා බැදී ඇත.		
දේශීය බැංකු මූල්‍යනය කරන ලද ණය	54,434,291,379	50,436,605,168
විදේශීය බැංකු මූල්‍යනය කරන ලද ණය	123,202,731,614	52,304,746,571
එකතුව	177,637,022,993	102,741,351,739

36.2 මුළු ණය ලැබීම්	විදේශ ණය	දේශීය ණය
2017.01.01 දිනට ශේෂය	15,335,301,002	20,392,891,592
ලැබීම්	25,176,941,397	6,916,520,488
ගෙවීම්	-	(659,977,137)
2017.12.31 දිනට ශේෂය	40,512,242,399	26,649,434,943

36.3 පොළී වියදම්	2017 රු.	2016 රු.
පොළී වියදම්	6,291,304,344	1,670,213,515

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } ඩබ්එස්එස්/ඒ/එන්ඩබ්ලිව්එස්ඩී/01/2017 } මෙම අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date } 2019 ජනවාරි 22 දින

සභාපති,
ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ (ජාජසජම) 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක්

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව | இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. | No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළවන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශකිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (ශ්‍රීලංගිප්‍ර) අනුකූලවීම

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ශ්‍රීලංගිප්‍ර 01 - මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

ප්‍රමිතයෙහි ඡේද අංක 32ට පටහැනි ලෙස එකතුව රු.5,347,682 ක් වූ වර්ෂ තුනකට වඩා වැඩි කාලයක සිට පැවත එන වෙනත් ණය හිමි ශේෂයන් අනාගතයේදී ඇති විය හැකි වගකීම් පිළිබඳව හඳුනාගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂයේදී වෙනත් ආදායමට මාරු කර තිබුණි.

(ආ) ශ්‍රීලංගිප්‍ර 16 - දේපල, පිරියත හා උපකරණ

පිරිවැය ආසන්න ලෙස රු.526,264,886 ක් වූ සම්පූර්ණයෙන්ම ක්ෂය කරන ලද වත්කම් ඒවායේ ඵලදායී ආර්ථික ජීවිත කාලය පිළිබඳව නැවත තක්සේරු කිරීමකින් තොරව හා ප්‍රමිතයෙහි විධිවිධාන අනුව ගිණුම්ගත කිරීමකින් තොරව මණ්ඩලය විසින් අඛණ්ඩව භාවිතා කරනු ලබයි.

(ඇ) ශ්‍රීලංගිප්‍ර 19 - සේවක ප්‍රතිලාභ

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුල ප්‍රමිතයෙහි ඡේද අංක 58 හා 59 ප්‍රකාරව විශ්‍රාම ප්‍රතිලාභ බැදීම් (පාරිතෝෂික ප්‍රතිපාදන) සඳහා වෙන්කිරීම් සිදුකර නොතිබුණි.

(ඈ) ශ්‍රීලංගිප්‍ර 20 - රජයේ ප්‍රදාන ගිණුම් ගත කිරීම හා රජයේ ආධාර හෙළිදරව් කිරීම

වර්ෂ 07 සිට වර්ෂ 11 කට වැඩි කාලයක් නොවෙනස්ව පැවති ව්‍යාපෘති 33 කට අදාල එකතුව රු. මිලියන 14,498 ක් වූ විදේශ ප්‍රදාන ශේෂයන් ක්‍රමක්ෂය කිරීමෙන් තොරව අඛණ්ඩව මූල්‍ය ප්‍රකාශන වලට ගෙන තිබුණි. එම විදේශ ප්‍රදාන සම්බන්ධයෙන් අවශ්‍ය තොරතුරු කිසිවක් නොමැති වීම හේතුවෙන් ක්‍රමක්ෂය නොකිරීම මත මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම විගණනයේදී තහවුරු කළ නොහැකිවිය.

(ඉ) ශ්‍රීලංගිප්‍ර 23 - ණය ගැනුම් පිරිවැය

ප්‍රමිතයෙහි ඇතුළත් ප්‍රතිපාදනයන්ට පටහැනි ලෙස රු. බිලියන 3.5 ක දේශීය ණය යටතේ දියත් කරන ලද ව්‍යාපෘතීන්ට අදාළව සම්පූර්ණයෙන්ම වැඩ අවසන් කරන ලද

කොන්ත්‍රාත් හතරක (4) ක රු. 3,922,080 ක් වූ ණය ගැනුම් පිරිවැය 2016 හා 2017 වර්ෂයන්හිදී ප්‍රාග්ධනිත ගත කොට තිබුණි.

(ඊ) **ශ්‍රීලංගිප්‍ර 38 - අස්පෘශ්‍ය වත්කම්**

ප්‍රමිතයෙහි 104 වැනි ඡේදයෙහි නියමකර ඇති පරිදි අස්පෘශ්‍ය වත්කම්හි ක්‍රමක්ෂය කාල පරිච්ඡේදය හා ක්‍රමක්ෂය ක්‍රමය ඒ ඒ මූල්‍ය වර්ෂය තුළදී හෝ සමාලෝචනය කිරීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණි.

(උ) **ශ්‍රීලංගිප්‍ර 40 - ආයෝජන දේපල**

(අ) ධාරණ අගය රු. මිලියන 347.30 ක් වූ ආයෝජන දේපල 2017 දෙසැම්බර් 31 දිනට වූ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ වෙනම දක්වා නොතිබුණි.

(ආ) ප්‍රමිතයෙහි ඡේද අංක 79 ප්‍රකාරව ක්ෂය ක්‍රමය, ඵලදායී ජීවිත කාලය හෝ ක්ෂය අනුපාතය දළ ධාරණ වටිනාකම සහ කාලවිච්ඡේදයේ ආරම්භක හා අවසාන දිනට සමුච්චිත ක්ෂය සහ අපහායන වටිනාකම ආදිය සම්බන්ධයෙන් මණ්ඩලය විසින් නිසි හෙලිදරව් කිරීම් සිදු කර නොතිබුණි.

(ඇ) ප්‍රමිතයෙහි ඡේද අංක 75 (ඊ) සහ (ඒ) ප්‍රකාරව ආයෝජන දේපලවලින් ලද ආදායම හෙලිදරව් කර නොතිබුණි.

2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ව්‍යාපෘති 28 ක් සම්බන්ධයෙන් කෙරීගෙන යන වැඩ යටතේ දැක්වෙන එකතු වටිනාකම රු. 167,679,950 ක් වන ශේෂයන්, විමර්ශනය කොට මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය ගැලපීම් සිදු කිරීමකින් තොරව තොරව වර්ෂ තුනේ සිට නවයකට වඩා වැඩි කාල පරිච්ඡේදයක් නොවෙනස්ව පැවතුණි.

(ආ) රු.8,189,319,298 ක් වූ නිමකර ජනතා අයිතියට පත් කරන ලද ජල සම්පාදන ව්‍යාපෘති 40 ක පිරිවැය ප්‍රාග්ධනිත කිරීමෙන් තොරව 2017 දෙසැම්බර් 31 දිනට කෙරීගෙන යන වැඩතුළ පැවතුණි.

(ඇ) කැලණිය ප්‍රාදේශිකයේ පොත්වල දක්වා තිබූ රු.2,421,893 ක් වටිනා තොග ශේෂයක් වර්ෂ තුනකට අධික කාලයක් අපේක්ෂා කොට තිබූ අරමුණු සඳහා භාවිත කිරීමකින් තොරව පැවතුණි. තවද, මෙම තොගය භෞතිකව සත්‍යාක්ෂණය කර ගත නොහැකිව තිබුණි.

(ඈ) ත්‍රිකුණාමල ප්‍රාදේශිකයේ භෞතිකව සත්‍යාක්ෂණය කර තිබූ ප්‍රධාන අමතර කොටස් වටිනාකම රු.11,821,641 ක් වුවද රු.472,760 ක් වටිනා තොගයක් පමණක් ගිණුම් ගත කර තිබුණි.

(ඉ) යාපනය ප්‍රාදේශීය කාර්යාලයේ තොග සමීක්ෂණ වාර්තා අනුව ප්‍රාග්ධනිත කරන ලද වටිනාකම රු. 5,202,608 ක් වූ කල්බදු ගොඩනැගිලි, පිරිවැය රු.7,000,000 ක් වූ ජල කුළුණක් (යටිතල පහසුකම්) සහ රු. 11,853 ක් වූ අනෙකුත් වත්කම් භයක් භෞතිකව නොපැවතුණු බව නිරීක්ෂණය විය. කෙසේ වෙතත් කිසිදු ක්‍රියාමාර්ගයක් ගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂය තුළ රු.780,532ක ක්ෂය වෙන්කිරීමක් සිදු කර තිබුණි. තවද, රු.3,000,000 ක පිරිවැයකින් යුතු භාවිතයට ගත නොහැකි මට්ටමේ පැවති වෙනත් ජල කුළුණක් ගිණුම්වලට ගෙන තිබූ අතර එය ඉවත්කිරීමට කිසිදු පියවරක් ගැනීමකින් තොරව රු.140,000 ක ක්ෂය වෙන්කිරීම් සිදු කොට තිබුණි.

(ඊ) ප්‍රතිපත්තියක් ලෙස මණ්ඩලය විසින් අඛණ්ඩව සෑම වර්ෂයකම පෙර වර්ෂයේ ගැලපීම් වශයෙන් සමුච්චිත ලාභය / අලාභයට සැලකිය යුතු ගැලපීම් සිදු කරන බව විගණනයට නිරීක්ෂණය විය. ඒ හේතුවෙන් ඒ ඒ වර්ෂයේ ලාභය සැලකිය යුතු ලෙස විකෘති වී තිබුණි. 2013 සිට 2016 කාලපරිච්ඡේදය සඳහා එවැනි පෙර වර්ෂයට අදාළ ගැලපුම් හේතුවෙන් සමුච්චිත ලාභයට වූ බලපෑමෙහි එකතු වටිනාකම රු.මිලියන 631.70 ක් විය. මෙවැනි පසුබිමක් තුළ ඉදිරි වර්ෂය තුළ සමාලෝචිත වර්ෂයේ ලාභයට ගැලපීම් කිරීමේ හැකියාව විගණනයේදී බැහැර කළ නොහැක. ඒ හේතුවෙන් වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයයෙහි විශ්වාසවන්ත බව සහ නිවැරදිභාවය පිළිබඳව සතුටුදායක ලෙස පිළිගත නොහැකිය. සමාලෝචිත වර්ෂය හා පෙර වර්ෂ දෙක තුළ සිදු කරන ලද එවැනි ගැලපීම් පිළිබඳ විස්තර පහත දැක් වේ.

වර්ෂය	හරකළ වටිනාකම	බැරකල වටිනාකම	සමුච්චිත ලාභයට වූ ශුද්ධ බලපෑම
	රු.	රු.	රු.
2017	388,443,514	62,528,713	322,914,801
2016	454,847,390	336,150,543	118,696,847
2015	184,251,720	192,301,771	8,050,051
2014	88,633,609	269,544,864	180,911,255

(උ) සමාලෝචිත වර්ෂය තුළ වාහන දහයක් ඉවත්කර තිබුණද වත්කම් ඉවත්කිරීමේ ලාභය හෝ අලාභය ගණනය කිරීමේදී වාහන තුනක පමණක් පිරිවැය හා සමුච්චිත ක්ෂය වටිනාකම ගිණුම්ගත කොට තිබුණි. එම වත්කම් වලට අදාළව තොරතුරු නොමැති වීම හේතුවෙන් පිරිවැය හා සමුච්චිත ක්ෂය වටිනාකම සැලකිල්ලට නොගැනීම නිසා මූල්‍ය ප්‍රකාශවලට වූ බලපෑම විගණනයේදී තහවුරු කරගත නොහැකි විය.

(ඌ) එකතු වටිනාකම රු. 77,011,565 ක් වූ ණයගැතියන් වෙනුවෙන් අපහායනය සඳහා වෙන්කිරීම් සිදු කර නොතිබූ බව නිරීක්ෂණය විය.

(එ) සමාලෝචිත වර්ෂය තුළ ගෙවන ලද රු.65,683,426 ක් වූ ආර්ථික සේවා ගාස්තු ලැබිය යුතු දෑ ලෙස හඳුනා නොගෙන වැරදි සහගත ලෙස සමාලෝචිත වර්ෂයේ ආදායම් බදු වියදම ලෙස හඳුනාගෙන තිබුණි. ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ලාභය සහ 2017 දෙසැම්බර් 31 දිනට ජංගම වත්කම් ඒ හා සමාන අගයකින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඒ) විගණනයේ ගණනය කිරීම් අනුව ස්ථාවර තැන්පතු දෙකක් සඳහා වූ ආයෝජන ආදායම රු.5,328,915 ක් විය. කෙසේවෙතත් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව එම ස්ථාවර තැන්පතුවලට අදාළව රු. 4,774,759 ක් පමණක් ආයෝජන ආදායම් ලෙස හඳුනාගෙන තිබුණි. ඒ හේතුවෙන් ස්ථාවර තැන්පත් ආයෝජනය මත වූ පොලී ආදායම රු. 554,156 ක් අඩුවෙන් දක්වා තිබුණි.

2.2.3 අවිනිශ්චිත ගිණුම

ශුද්ධ එකතු වටිනාකම රු. 793,285,170 ක් වූ මණ්ඩලයේ වත්කම්, වගකීම් හා ස්කන්ධ ශේෂයන් එවැනි ශේෂයන් විමර්ශනය කිරීමට පියවර ගැනීමකින් තොරව 2016 හා 2017 වර්ෂයන්වලදී අවිනිශ්චිත ගිණුමකට මාරුකර තිබූ අතර එම ශේෂයන් තුළ වටිනාකම රු.

18,600,450 ක් වූ දීර්ඝ කාලයක සිට හිඟව පවතින සේවකයන්ට ලබාදුන් ණය හා අත්තිකාරම් ද, වටිනාකම රු.37,129,982 ක් වූ කොන්ත්‍රාත්කරුවන්ට ලබා දුන් අත්තිකාරම්ද, වටිනාකම රු.13,071,361 ක් වූ තැන්පත් සහ වටිනාකම රු. 3,428,544 ක මුදල් පොත් ශේෂයක්ද ඇතුළත්ව තිබුණි. ඒ අනුව 2017 වර්ෂය අවසානයට අවිනිශ්චිත ගිණුමේ ශේෂය රු.116,455 ක් වූ අතර 2018 පෙබරවාරි මාසය අවසානය වන විටත් මෙම ගිණුම නිරවුල් කිරීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

2.2.4 පැහැදිලි නොකරන ලද වෙනස්කම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ගිණුම් පොත් අනුව සමාලෝචිත වර්ෂය තුළ රු. 9,161,858 ක මුදලක් වත්කම් ඉවත් කිරීමෙන් ලැබී තිබුණි. කෙසේ වෙතත් මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි ආයෝජන ක්‍රියාකාකරකම් වලින් ලද මුදල් ප්‍රවාහ යටතේ රු.2,001,798 ක වටිනාකමක් පමණක් දක්වා තිබුණි. රු.7,160,060 ක් වූ වෙනසට හේතූන් විගණනයට පැහැදිලි කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනයන්හි දක්වා තිබූ ණයගැති ශේෂ හා මණ්ඩලයේ වාණිජ අංශය විසින් ඉදිරිපත් කරන ලද ණයගැති කාල විශ්ලේෂණ උපලේඛනයන් අතර රු.20,470,232 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඇ) ප්‍රාදේශීය කාර්යාල විසින් ඉදිරිපත් කරන ලද ශේෂ පිරික්සුමෙහි දක්වා තිබූ විකුණුම් ආදායම් වටිනාකම සහ මණ්ඩලයේ වාණිජ අංශයේ දක්වා තිබූ සැසඳුම් කරන ලද ශේෂ අතර එකතුව රු.12,423,545 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඈ) නිමවුම් පාදක සඳහා වන ගෝලීය හවුල් ව්‍යාපෘති විසින් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 වන දිනට විදේශ ප්‍රදාන වටිනාකම රු.312,791,129 ක් විය. කෙසේ වෙතත් මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන අනුව එය රු.289,218,261 ක් ලෙස දක්වා තිබුණි. ඒ හේතුවෙන් එම වටිනාකම් දෙක අතර රු.23,572,868 ක පැහැදිලි නොකළ වෙනස්කමක් නිරීක්ෂණය විය.

(ඉ) අඹතලේ, පානදුර, කළුතර සහ ගම්පහ යන ප්‍රාදේශික හතරෙන් ලද ස්ථාවර වත්කම් ලේඛන වල දක්වා තිබූ දේපල, පිරියත හා උපකරණ වටිනාකම හා ඊට අනුරූපව විගණනය වෙත ඉදිරිපත් කරන ලද සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනයන්හි

දක්වා තිබූ එම වත්කම්හි අනුරූප වටිනාකම් සන්සන්දනය කිරීමේදී රු.45,327,376 ක හා රු.3,480,567 ක වෙනස්කම් නිරීක්ෂණය විය.

(ඊ) මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ ලෙජර් ගිණුම් හතරක යලි ප්‍රකාශිත ආරම්භක ශේෂ වටිනාකම සම්බන්ධයෙන් සහ විගණනය විසින් සිදු කරන ලද ගණනය කිරීම් අනුව රු. මිලියන 54.22 ක සමස්ත වෙනසක් නිරීක්ෂණය විය. විස්තර පහත පරිදි වේ.

විස්තරය	මූල්‍ය ප්‍රකාශන අනුව යලි ප්‍රකාශිත ශේෂය	විගණනයේ ගණනය කිරීම් අනුව ශේෂය	වෙනස
	රු.	රු.	රු.
වෙනත් ණය ගැතියන්	314,319,532	287,223,783	27,095,749
කොන්ත්‍රාත්කරුවන් රඳවා ගැනීම්	3,669,249,055	3,662,866,437	6,382,618
ණය හිමි පාලන	1,221,394,974	1,221,425,775	30,801
දේශීය ණය	19,767,069,288	19,746,356,156	20,713,132

(උ) වාණිජ අංශ වාර්තාවන්හි හා මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ මනුගත විකුණුම් සහ තොග විකුණුම් වටිනාකම් අතර රු. මිලියන 76.8 ක සැසඳුම් නොකරන ලද වෙනසක් නිරීක්ෂණය විය.

(ඌ) සමාලෝචිත වර්ෂය සඳහා වූ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ දක්වා තිබූ පහත අයිතමයන් සහ විගණනයේ ගණනය කිරීම් අතර එකතුව රු. රු.130,712,618 ක වෙනසක් නිරීක්ෂණය විය. විස්තර පහත පරිදි වේ.

අයිතමය	විගණනයේ ගණනය කිරීම් අනුව	මූල්‍ය ප්‍රකාශන අනුව	වෙනස
	රු.	රු.	රු.
ණයගැතියන්, ලැබිය යුතු දෑ හා තැන්පතුවන්හි අඩුවීම	17,370,079,818	17,491,801,822	121,722,004
ස්ථාවර වත්කම් ඉවත් කිරීම් අලාභය	2,664,753	4,495,307	1,830,554
ඉවත්කළ වත්කම් සඳහා ලැබීම්	2,001,798	9,161,858	7,160,060

(ඒ) මහ කොළඹ ජල හා අපජල කළමනාරණ ආයෝජන ප්‍රවර්ධන වැඩසටහන - ව්‍යාපෘතිය 2 හි කොන්ත්‍රාත්කරුවන්ට ලබා දුන් අත්තිකාරම් වටිනාකමෙහි ලෙජර සහ විගණනයට ඉදිරිපත් කරන ලද උපලේඛන අතර රු. 13,856,197 ක වෙනසක් නිරීක්ෂණය විය.

2.2.5 හඳුනා නොගත් ශේෂ

කළුතර ප්‍රාදේශීය සහය සේවා මධ්‍යස්ථානයේ ලෙජරයෙහි එකතු වටිනාකම රු.655,561,757 ක හඳුනා නොගත් කෙරිගෙන යන වැඩ ශේෂයක් හඳුනාගෙන ප්‍රාග්ධනිත කිරීමකින් තොරව 2004 වර්ෂයේ සිට පැවතුණි.

2.2.6 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත දක්වා ඇති ඒ ඒ අයිතමයන්ට එරෙහිව දක්වා ඇති සාක්ෂීන් විගණනයට ඉදිරිපත් නොවීය.

	අයිතමය	වටිනාකම	ඉදිරිපත් නොවූ සාක්ෂි
		රු.	
(i)	කෙරිගෙන යන වැඩ	92,429,112	ප්‍රාදේශීය සහය සේවා මධ්‍යස්ථානයන්හි විස්තරාත්මක උප ලේඛන
(ii)	වලනය නොවන සහ සෙමින් වලනය වන තොග	1,006,678,141	වයස් විශ්ලේෂණය
(iii)	වෙනත් ණය ගැතියන්	294,984,707	විස්තරාත්මක උපලේඛන
(iv)	වෙළඳ ණය හිමියන්	833,652,596	
(v)	වෙනත් ණය හිමියන්	97,725,057	
(vi)	ඉඩම් අත්පත් කර ගැනීමේ අත්තිකාරම්	161,712,636	
(vii)	සේවක විශේෂ ප්‍රසාද දීමනා අත්තිකාරම්	9,608,060	

2.2.7 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) එකතුව රු. මිලියන 1,111 ක් වූ වෙළඳ ණයගැතියන්, මලාපවහන ණයගැතියන් හා වෙනත් ණය ගැති ශේෂයන් අයකර ගැනීමෙන් තොරව වර්ෂ දෙකකට වැඩි කාලයක් පැවතුණි.

(ආ) එකතුව රු.268,846 ක් වූ සැපයුම්කරුවන්ට දුන් අත්තිකාරම් වර්ෂයක කාලයක් ගතවී ඇතත් නිරවුල් කර නොතිබුණි.

(ඇ) ඉඩම් අත්පත් කරගෙන තිබුණද එම ඉඩම් අත්පත් කර ගැනීමට 2009 සිට 2014 දක්වා කාලපරිච්ඡේදය තුළ ලබා දෙන ලද 77,889,359 ක අත්තිකාරම් අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඈ) ණය හිමි පාලන ගිණුමෙහි ඇතුළත් මුළු ණය හිමි ශේෂයන් සියයට විසිහයක ප්‍රතිශතයක් වන ණය හිමියන් වර්ෂයකට වැඩි කාලයක් නියෝජනය කරනු ලබයි.

(ඉ) වටිනාකම රු.39,877,391 ක් වූ වෙනත් ණයගැති ශේෂයන් වර්ෂ තුනකට වඩා වැඩි කාලයක සිට නිරවුල් නොකර පැවතුණි. මණ්ඩලය විසින් එම ණයගැතියන්ගේ දත්ත පද්ධතියක් පවත්වාගෙන ගොස් නොතිබූ නිසා තහවුරු ලිපි මගින් ඔවුන්ගේ ශේෂයන් විගණනයට සත්‍යාක්ෂණය කර ගත නොහැකි විය.

(උ) ගාල්ල ප්‍රදේශයේ අපජල අපහරණ ව්‍යාපෘතිය යටතේ අපජලය පිරිපහදු කිරීමේ පිරියත ඉදිකිරීම වෙනුවෙන් ඉඩමක් මිලදී ගෙන තිබුණි. මිනුම් දෙපාර්තමේන්තුව විසින් මෙම ඉඩම රු. මිලියන 71.5 කට ආගණනය කොට තිබුණු අතර වටිනාකමින් සියයට 30 කට සමාන වන රු. මිලියන 21.25 ක් අත්තිකාරම් ලෙස 2014 අප්‍රේල් මාසයේදී ඉඩමේ අයිතිකරු වෙත ඉඩමේ අයිතිය ලබා ගැනීමකින් තොරව ගෙවා තිබුණි. මෙම ඉඩමෙහි දැනටමත් පවුල් කිහිපයක් විසින් පදිංචිව සිටින අතර අත්තිකාරම් ලබා ගැනීමෙන් පසුවද අයිතිකරු විසින් ඉඩමෙන් පස් ඉවත් කර ගෙන තිබුණි. එලෙස ගෙවූ අත්තිකාරම් හා ඒ මත වූ දඩ මුදල 2018 ජුනි 30 වන විටත් අය කරගෙන නොතිබුණි.

(ඊ) රු.6,020,554 ක් වටිනාකම වූ කෑගල්ල ප්‍රාදේශිකයේ නිරවුල් නොකළ ණය හිමි පාලන ගිණුම් ශේෂය 2017 දෙසැම්බර් 31 දිනට වර්ෂ දෙකක් තිස්සේ පැවතුණි.

2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

	නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම
අ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 770.	වටිනාකම රු.13,082,076 ක් වූ යල්පැනගිය තොගය 2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත් කොට තිබුණි.
ආ)	2006 සැප්තැම්බර් 22 දිනැති අංක 30 දරණ කළමණාකරන සේවා චක්‍රලේඛය	මණ්ඩලයේ බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටිය සඳහා කළමණාකරන සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.
ඇ)	2017 අංක 07 දරන ආර්ථික සේවා ගාස්තු (ආ.සේ.ගා.) (සංශෝධිත) පනත	සමාලෝචිත වර්ෂය තුළ ගෙවූ ආර්ථික සේවා ගාස්තුව ඉදිරියට ගෙන යාමෙන් තොරව වර්ෂයේ ලාභයට අයකර ගෙන තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මණ්ඩලයේ මෙහෙයුම් කටයුතු පසුගිය වර්ෂය හා සසඳන විට රු.2,991,969,398 (යලි ප්‍රකාශිත) බදු පූර්ව ශුද්ධ ලාභයට අනුරූපිව රු.1,882,455,821 ක බදු පූර්ව ශුද්ධ ලාභයක් ලැබීමට හේතු වී තිබූ අතර, එයින් මූල්‍ය ප්‍රතිඵලයේ රු. 1,109,513,577 ක පිරිහීමක් දැක්විය. විකුණුම් පිරිවැය, පරිපාලන වියදම් හා මූල්‍ය වියදමෙහි වූ ප්‍රමාණාත්මක ඉහළ යාම මෙම මූල්‍ය ප්‍රතිඵලයෙහි පිරිහීම සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

කෙසේ වෙතත් එකතු වටිනාකම රු. මිලියන 17,972 ක් සේවක චේතන පිරිවැය, බදු වියදම හා ක්ෂය ගිණුම්ගත කිරීමෙන් අනතුරුව සමාලෝචිත වර්ෂය වෙනුවෙන් මණ්ඩලයේ එකතු කළ අගය රු. මිලියන 19,789 ක් වූ අතර ඉකුත් වර්ෂයේදී එය රු. මිලියන 18,808 ක් විය. එබැවින් ඉකුත් වර්ෂය සමඟ සන්සන්දනය කිරීමේදී මණ්ඩලයේ එකතු කළ අගය රු. මිලියන 981 කින් හෙවත් සියයට 5.2 කින් ඉහළ ගොස් තිබුණි.

3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

3.2.1 ලාභදායීත්වය

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දළ ලාභය සියයට 4.3 කින් පහල ගියද ඉකුත් වර්ෂයට සාපේක්ෂව පරිපාලන වියදම් සියයට 8.74 කින් ඉහල ගොස් තිබුණි. ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුල වාර්තා කර තිබූ රු. 738,091,347 ක් වූ මෙහෙයුම් ලාභය ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 58.04 කින් පහල ගොස් තිබුණි.

(ආ) 2016 වර්ෂයේදී වාර්තා වූ රු. 975,560 ක හා 289,023 ක ඒක පුද්ගල දායකය හා ශුද්ධ ලාභය 2017 වර්ෂයේදී පිළිවෙලින් සියයට 4 කින් හා 37 කින් හෙවත් රු.936,538 ක් හා රු.182,084 ක් දක්වා පහල ගොස් තිබුණි.

(ඇ) 2016 වර්ෂයේදී පාරිභෝජනය කරන ලද ජල ඒකකයකින් වූ රු. 43.93 ක ආදායම 2017 වර්ෂයේදී සියයට 3 කින් අඩු වී තිබුණු අතර 2016 වර්ෂයේදී රු. 46.53 ක් වූ පරිභෝජනය කරන ලද ජල ඒකකයක නිෂ්පාදන පිරිවැය 2017 වර්ෂයේදී සියයට 1.2 කින් ඉහල ගොස් තිබුණි.

3.2.2 වැදගත් ගිණුම්කරණ අනුපාත

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ හතර සඳහා වැදගත් ගිණුම්කරණ අනුපාත කිහිපයක් පහත දැක්වේ.

වර්ෂය	2017	2016	2015	2014	2013
දළ ලාභ ආන්තිකය	40.50	42.82	39.19	39.47	41.35
ශුද්ධ ලාභ ආන්තිකය	7.61	12.68	5.53	7.62	5.87
ජංගම අනුපාතය	4.14	5.97	4.48	1.76	1.29
ක්ෂණික අනුපාතය	3.72	5.33	3.80	1.35	0.98
මුළු වත්කම් පිරිවැටුම (වාර ගණන)	0.05	0.06	0.06	0.07	0.07

ඉහත තොරතුරු අනුව ඉකුත් වර්ෂ හතර සමඟ සැසඳීමේදී මණ්ඩලයේ ප්‍රධාන මූල්‍ය අනුපාතයන්හි අයහපත් තත්ත්වයක් පෙන්නුම් කර තිබුණි. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂය සඳහා වූ ශුද්ධ ලාභ ආන්තිකය විශාල ලෙස සියයට 5.07 කින් පහල ගොස් තිබූ අතර ඉදිරි මූල්‍ය වර්ෂ තුළදී ගෙවිය යුතු විදේශ ණය ඉහළ යාම හේතුවෙන් ජංගම හා ක්ෂණික අනුපාතය පිළිවෙලින් සියයට 1.83 කින් හා සියයට 1.61 කින් පහල ගොස් තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්ය සාධනය

4.1.1 සැලසුම්කරණය හා සමාලෝචනය

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් සිදු කරනු ලැබේ.

(අ) 2016 – 2020 කාලපරිච්ඡේදය සඳහා වූ සංයුක්ත සැලසුම පිළියෙල කිරීමට පෙර ව්‍යාපාරය තුළ පවතින දුර්වලතා සහ බාහිර පරිසරය තුළ ඇති අවස්ථා හා තර්ජන පිළිබඳව විධිමත් ලෙස ඇගයීමකට ලක් කොට නොතිබුණි.

(ආ) 2014 පෙබරවාරි 17 දිනැති හා අංක 01/2014 දරණ රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික අයවැය ඇස්තමේන්තු, වාර්ෂික ප්‍රසම්පාදන සැලස්ම, මානව සම්පත් සංවර්ධන සැලස්ම, ණය ආපසු ගෙවීමේ සැලස්ම හා අභ්‍යන්තර විගණන සැලස්ම ක්‍රියාකාරී සැලැස්ම තුළ ඇතුළත් කොට නොතිබුණි.

(ඇ) ක්‍රියාකාරී සැලැස්මට අනුව 2017 වර්ෂය තුළදී ආරම්භ කිරීමට නියමිතව තිබූ මහා පරිමාණ ජල සම්පාදන ව්‍යාපෘති හතක් හා මහා පරිමාණ අපවහන ව්‍යාපෘති තුනක් 2018 ජූලි මස 31 දින වන විටත් ආරම්භ කර නොතිබුණි.

(ඈ) ක්‍රියාකාරී සැලැස්මට අනුව සමාලෝචිත වර්ෂය අවසානය වන විට සිටින මුළු ජනගහනයෙන් ජල නල සැපයුම් ආවරණය හා අපවහන ආවරණය පිළිවෙලින් සියයට 52.3 ක් හා සියයට 2.4 ක් දක්වා ඉහළ නැංවීමට අපේක්ෂා කොට තිබුණි. කෙසේ වෙතත් 2017 වර්ෂයේ අවසානයට වූ සත්‍ය ආවරණය පිළිවෙලින් සියයට 49.2 ක් හා 2.07 ක් විය.

4.1.2 පිරිසිදු ජලය නිෂ්පාදනය හා බෙදාහැරීම

පිරිපහදු ජල නිෂ්පාදනය සහ එහි පිරිවැය සහ පසුගිය වසර කිහිපය සඳහා ලබා දුන් නව සම්බන්ධතා ප්‍රමාණය සම්බන්ධයෙන් වූ තොරතුරු පහත පරිදි වේ.

වර්ෂය	2017	2016	2015	2014
නිෂ්පාදනය (ඝන මීටර) මිලියන	678	649	600	575
ඒකක පිරිවැය (රු.)	35.49	34.61	34.41	31.79
නව සම්බන්ධතා ගණන	2,219,172	2,092,471	1,947,473	1,825,837

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2016 වර්ෂයේදී මණ්ඩලය විසින් නිෂ්පාදනය කරන ඝන මීටර මිලියන 649 ට සාපේක්ෂව 2017 වර්ෂයේදී පිරිපහදු ජලය ඝන මීටර මිලියන 678 ක් නිෂ්පාදනය කර තිබූ අතර එහි සියයට 4.5 ක වැඩිවීමක් දැක්වුණි. ඒ හා සමානව 2016 වර්ෂය සමඟ සන්සන්දනය කිරීමේදී සමාලෝචිත වර්ෂයේදී ඒකක නිෂ්පාදන පිරිවැය සියයට 2.5 කින් ඉහළ ගොස් තිබුණි. 2012 සිට 2017 කාලපරිච්ඡේදය තුළ කාර්ය මණ්ඩල පිරිවැය, බලශක්ති පිරිවැය, රසායන ද්‍රව්‍ය පිරිවැය හා නඩත්තු පිරිවැයෙහි වූ ප්‍රමාණාත්මක වර්ධනය මෙම වැඩිවීම් සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා සකස් කර තිබූ ඉක්කය අනුව, සමාලෝචිත වර්ෂය තුල නව සම්බන්ධතා 231,198 සපයමින් (2014 සිට 2017 දක්වා වූ සමුච්ඡිත ඔහ සම්බන්ධතා ඇතුළුව) වර්ෂය අවසානය වන විට සම්බන්ධතා 2,323,669 ක් ලබාදීමට

අපේක්ෂා කර තිබුණි. කෙසේ වෙතත් සමාලෝචිත වර්ෂය තුළදී නව සම්බන්ධතා 126,701 ක් පමණක් සපයා තිබූ අතර පසුගිය වර්ෂය සමඟ සැසඳීමේදී එහි සියයට 8.71 ක අඩුවීමක් දක්වේ.

4.1.3 ආදායම් නොලබන ජලය (NRW)

සමාලෝචිත වර්ෂය හා පසුගිය වසර හයක ආදායම් නොලබන ජලය පිළිබඳ විස්තර පහත දැක්වේ.

විස්තරය	2017	2016	2015	2014	2013	2012
ජලය නිෂ්පාදනය (ඝන මීටර්)	678.9	649	600.14	575.00	547.0	525.6
ජලය පරිභෝජනය (ඝන මීටර්)	507.5	483	436.27	410.92	381.6	368.5
ආදායම් නොලබන ජලය (ඝන මීටර්)	171.3	166	163.87	137.07	165.4	157.1
ආදායම් නොලබන ජලය ජලය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස	**25.23**	**25.58**	**27.30**	**28.53**	**30.24**	**29.89**

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් ද කරනු ලැබේ.

(i) ආදායම් නොලබන ජල වටිනාකම වෙනම ගිණුම් ගත කිරීමකින් තොරව සාමාන්‍ය පිරිවැයක් ලෙස ගිණුම්වලට ගෙන තිබුණි. තවද 2012 සිට 2014 කාල පරිච්ඡේදය තුළ ආදායම් නොලබන ජලය මුළු ජල නිෂ්පාදනයෙන් ආසන්න ලෙස 1/3 ක් වූ අතර සමාලෝචිත වර්ෂය තුළ එය 1/4 ක් දක්වා අඩු කර ගෙන තිබුණි. කෙසේ වෙතත්, කාන්දු වීම්, නිත්‍යානුකූල නොවන ජල සම්බන්ධතා, නොමිලයේ සැපයීම හා පරිපාලන දුර්වලතා ආදිය හේතුවෙන් මේ වන තුරු ආදායම් නොලබන ජලය මණ්ඩලයට ප්‍රමාණාත්මක අලාභ ඇති කරනු ලැබේ. 2017 දී කොළඹ නගරයේ ආදායම් නොලබන ජලය කොටස සියයට 43.14 ක් වූ අතර කොළඹ නගරයේ ආදායම් නොලබන ජලය අවම කිරීම සඳහා කැපී පෙනෙන උත්සහයක් ගෙන නොතිබුණි.

(ii) වර්ෂ 75 කට වඩා පැරණි වූ කොළඹ නගරයේ ප්‍රධාන ජලය බෙදාහැරීම් පද්ධති නවීකරණය කිරීම සඳහා අවශ්‍යතාවයන් තිබීම හේතුවෙන් එම කාර්යය සඳහා සැලසුම් පිළියෙල කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කඩිනම් අවශ්‍යතාවය කෙරෙහි මණ්ඩලයේ විශේෂ අවධානය යොමු කර තිබුණි. දැනට මේ සම්බන්ධයෙන් පිරිවැය රු. මිලියන 30,124 ක් වූ විදේශ මූල්‍යයන ව්‍යාපෘති දෙකක් ක්‍රියාත්මක කරමින් පැවතියද, ප්‍රධාන ජල සැපයීම් නල පිළිබඳ ප්‍රතිසංස්කරණය එයින් ප්‍රමාණවත්ව ඉටුකර ගෙන නොතිබුණි.

(iii) කොළඹ නගරයේ ආදායම් නොලබන ජලය සියයට 49 සිට සියයට 20 දක්වා අවම කර ගැනීම ප්‍රධාන වශයෙන් අවධානයට යොමු කරගත් මහ කොළඹ ජල හා අපජල කළමනාකරණ ආයෝජන ප්‍රවර්ධන වැඩසටහන - ව්‍යාපෘතිය (01) 2016 දෙසැම්බර් 31 දින අවසන් කිරීමට සැලසුම් කොට තිබුණි. කෙසේ වෙතත් එය 2018 සැප්තැම්බර් 30 වන විටත් අවසන් කොට නොතිබුණි. තවද 2018 ජූලි 31 දිනට භෞතික ප්‍රගතිය සියයට 46.18 ක් පමණක් විය.

(iv) මහ කොළඹ ජල සහ අප ජල කළමනාකරණ ආයෝජන ප්‍රවර්ධන වැඩසටහන - ව්‍යාපෘතිය (02) 2014 සැප්තැම්බර් 03 දින ආරම්භ කොට 2019 ජූනි 30 දින අවසන් කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ වෙතත් 2016 දෙසැම්බර් 31 දින වන විටත් ප්‍රධාන කොන්ත්‍රාත් කාර්යයන් ආරම්භ කර නොතිබූ අතර 2017 දෙසැම්බර් 31 දිනට සියයට 5.61 ක භෞතික ප්‍රගතියක් පමණක් ලගා කර ගෙන තිබුණි.

(v) ජල කාන්දු වීම් අවම කර ගැනීම සඳහා ප්‍රතිස්ථාපනය කළ යුතුව ඇති ප්‍රධාන ජලය බෙදා හැරීමේ පද්ධති මෙදින දක්වා විශේෂිතව හඳුනාගෙන නොතිබුණි. ප්‍රධාන ව්‍යාපෘති කිහිපයක් ක්‍රියාත්මක කිරීම සඳහා යෝජනා කිහිපයක් කර තිබුණද ඒවායේ ක්‍රියාත්මක වීම ඉතා මන්දගාමී තත්වයක් විය.

(vi) කොළඹ නගරය හැර අනිකුත් ප්‍රදේශවල විශේෂයෙන් නැගෙනහිර කොළඹ නගරය, ගම්පහ, රත්නපුර, හම්බන්තොට සහ බණ්ඩාරවෙල හි ආදායම් නොලබන ජලය අඩු කිරීම කෙරෙහි මණ්ඩලයේ අවධානය ප්‍රමාණවත් නොවූ අතර ඒ හේතුවෙන් සංයුක්ත සැලැස්මේ දක්වා ඇති ඉලක්කයන් තාත්වික නොවන බව නිරීක්ෂණය විය.

(vii) ආදායම් නොලබන ජලය සියයට 1 කින් අඩු කර ගැනීමට මණ්ඩලයට හැකියාව පවතී නම් මුළු නිෂ්පාදන පිරිවැය රු. මිලියන 240.46 කින් අඩු කර ගැනීමට හැකි බව තවදුරටත් නිරීක්ෂණය විය.

(viii) ප්‍රාදේශීය සහය සේවා මධ්‍යස්ථානයන්හි (ප්‍රා.සේ.ම.) සත්‍ය සහ ඉලක්කගත ආදායම් නොලබන ජල ප්‍රතිශතයන් අතර සැලකිය යුතු විචලනයක් නිරීක්ෂණය විය. විස්තර පහත පරිදි වේ.

	ආදායම් නොලබන ජලය 2017 (ප්‍රතිශතයක් ලෙස)		
ප්‍රාදේශීය සහය සේවා මධ්‍යස්ථානයේ නම	ඉලක්කය	සත්‍ය	විචලතාවය [හිතකර (අහිතකර)]
බස්නාහිර - මධ්‍යම	34.5	33.8	0.7
බස්නාහිර - දකුණ	26.4	20.6	5.8
බස්නාහිර - උතුර	23.0	19.3	3.7
දකුණ	26.0	22.7	3.3
ඌව	20.3	25.9	5.6
මධ්‍යම	22.0	22.6	(0.6)
සබරගමුව	23.8	30.3	(6.5)
උතුර - බටහිර	10.0	13.0	(3.0)
නැගෙනහිර	13.3	22.8	(9.5)
උතුරු මැද	15.2	16.9	(1.7)
උතුර	21.0	26.6	(5.6)
සමස්ත	27.3	25.2	(2.1)

4.1.4 මලාපවහන පද්ධතිය

රටේ ආර්ථික සංවර්ධනයත් සමඟ ඇතිවූ නාගරිකරණය හේතුවෙන් නගරවල මලාපවහන අපහරණය සඳහා යටිතල පහසුකම් වෙනුවෙන් වැඩිදියුණු කිරීම් සිදුකිරීමේ අවශ්‍යතාවය පැන නැගුණි. එම පහසුකම් සැපයීම මණ්ඩලයේ වගකීමක් වුවද, මෑත වර්ෂවලදී මෙම ක්ෂේත්‍රය පිළිබඳ ප්‍රමාණවත් ප්‍රගතියක් දක්වා නොතිබුණි.

4.2 විදේශ මූල්‍යයන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

සමාලෝචිත හා ඉකුත් වර්ෂයන්හිදී දේශීය හා විදේශීය මූල්‍යයන් භාවිතා කරමින් ජල සම්පාදන හා සනීපාරක්ෂක (අපවහන) ව්‍යාපෘතීන් විශාල ප්‍රමාණයක් ක්‍රියාත්මක කරනු ලැබීය. එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් වූ නිරීක්ෂණයන් පහත ඡේදයන්හි විස්තර කොට ඇත.

4.2.1 අඹතලේ බලශක්ති ඉතුරුම් ව්‍යාපෘතිය

පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කරනු ලැබේ.

(i) මෙම ව්‍යාපෘතියේ මුළු ක්‍රියාත්මක කිරීම් කාල පරිච්ඡේදය මාස 63 ක් වූ අතර 2017 දෙසැම්බර් 31 දින වන විට මාස 39 ක් ගෙවී ගොස් තිබුණි. කෙසේ වෙතත් කොන්ත්‍රාත්කරුගේ දුර්වල කාර්යය සාධනය හේතුවෙන් එදිනට වූ සමස්ත භෞතික ප්‍රගතිය සියයට 7.7 ක් පමණක් විය.

(ii) කිලෝමීටර 9ක් සඳහා පැරණි නල වෙනුවට මිලිමීටර 1200 විශ්කම්භයෙන් හා ධාරිතාවයකින් යුතු නව නල යෙදීම සඳහා වූ ප්‍රධාන කොන්ත්‍රාත්තුව 2018 මැයි 04 වන දින අවසන් කිරීමට සැලසුම් කොට තිබුණි. කෙසේ වෙතත් 2018 මැයි 04 වන දිනට මීටර 500ක පමණක් නල එලීම සිදු කොට තිබුණි.

4.2.2 මහ කොළඹ ජල හා අපජල කළමනාකරණ ආයෝජන වැඩසටහන - ව්‍යාපෘතිය 01

පහත නිරීක්ෂණ සිදු කරනු ලැබේ.

(i) වැඩසටහනෙහි ප්‍රගති වාර්තා අනුව, සමාලෝචිත වර්ෂය අවසානයට සමස්ත භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් සියයට 37.41 සහ සියයට 47.39 ක්ව පැවතුණි. කොළඹ නගරයේ උතුරු සහ නැගෙනහිර ප්‍රදේශයන්හි ආදායම් නොලබන ජලය අවම කිරීම සඳහා පද්ධති පුනරුත්ථාපන ප්‍රධාන කොන්ත්‍රාත්තුව යටතේ වූ කෙරීගෙන යන වැඩවල 2017 දෙසැම්බර් 31 දිනට පිළිවෙලින් සියයට 45ක සහ සියයට 27 ක මන්දගාමී ප්‍රගතියක් දක්වා තිබුණි. ප්‍රසම්පාදන ක්‍රියාවලියට අනුගත වීමේ ප්‍රමාදයන්, නල එලීමේ වැඩ සඳහා කාණු රහිත ක්‍රමයේ සිට විවෘත කාණු ක්‍රමය දක්වා වෙනස් කිරීම සහ කොන්ත්‍රාත්කරුගේ දුර්වල කාර්යසාධනය යානාදිය වැඩසටහනෙහි ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමේ මන්දගාමී ප්‍රගතිය සඳහා ඉවහල් වී තිබුණි.

(ii) කොළඹ නගරයේ උතුරු කොටසෙහි ආදායම් නොලබන ජලය අවම කිරීම සඳහා වූ පද්ධති පුනරුත්ථාපනය ලංසු ලේඛන අනුව නල එලීම සඳහා කාණු රහිත ක්‍රමය වෙනුවට විවෘත කාණු ක්‍රමය මගින් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කොට තිබුණි. කෙසේ වෙතත් මෙම කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමෙන් පසුව කොන්ත්‍රාත්කරු විසින් කාණු රහිත ක්‍රමය වෙනස් කිරීමට යෝජනා ඉදිරිපත් කර තිබූ අතර ලංසු

ලේඛනයවන්හි 3.1 සහ 13.2 ඡේදයන් ප්‍රකාරව අධ්‍යක්ෂ මණ්ඩලයේ පූර්ව අනුමැතිය ලබා ගැනීමෙන් තොරව විවලතා කමිටුව විසින් අනුමැතිය ලබා දී තිබුණි. ජල සම්පාදන ජාලයෙහි වර්තමාන තත්වය සහ වැඩබිමහි පවතින සත්‍ය තත්වය සැලකිල්ලට ගෙන විධිමත්ව සැලසුම් කර නොතිබූ බව නිරීක්ෂණය විය. කොන්ත්‍රාත්තුවේ මූලික විෂය පථය වෙනස් කිරීම හේතුවෙන් කාණු රහිත තාක්ෂණය යටතේ ලංසු ඉදිරිපත් නොකළ කොන්ත්‍රාත්කරුවන් සඳහා අවස්ථාව සලසා දී තිබුණි.

4.2.3 මහකොළඹ ජල සහ අපජල කළමනාකරණ ආයෝජන ප්‍රවර්ධන වැඩසටහන -ව්‍යාපෘතිය 2

පහත නිරීක්ෂණයන් සිදු කරනු ලැබේ.

(i) මෙම ව්‍යාපෘතිය සංරචක 13 කින් සමන්විත වූ අතර කොන්ත්‍රාත්තු ප්‍රදානය කිරීමේ ප්‍රමාදය, කොන්ත්‍රාත්කරුවන්ගේ දුර්වල කාර්ය සාධනය, කොළඹ මහ නගර සභාවෙන් අනුමැතිය ලබා ගැනීමේ ප්‍රමාදය සහ දුර්වල ව්‍යාපෘති කළමනාකරණය යනාදිය හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට ව්‍යාපෘති සංරචකයන්හි සමස්ත භෞතික ප්‍රගතිය සියයට 5.61 ක් විය. තවද පාමංකඩ ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම, රජය සතු මහල් නිවාසයන්හි ජල නල පද්ධති පුනරුත්ථාපනය සහ බටහිර මධ්‍යම ප්‍රාදේශීය සහය සේවා මධ්‍යස්ථානය සඳහා මෙහෙයුම් උපකරණ තොග 2ක් ප්‍රසම්පාදනය යන කොන්ත්‍රාත්තුවන් 2017 දෙසැම්බර් 31 දින වන විටත් ප්‍රදානය කර නොතිබුණි.

(ii) තවද ව්‍යාපෘතිය විසින් ප්‍රදානය කරන ලද කොළඹ නගරයේ බටහිර සහ දකුණ යන ප්‍රදේශ සඳහා ආදායම් නොලන ජල සඳහා වූ පද්ධති පුනරුත්ථාපන සංරචකය යටතේ සහ ජංගම ප්‍රජා දැනුවත් කිරීම් සහ චර්යා වෙනස් කිරීම සඳහා වූ උපදේශන සේවා කොන්ත්‍රාත්තුවන්හි අවසන් කිරීමේ දිනයන් ව්‍යාපෘති අවසන් කිරීමේ දිනය වූ 2019 ජුනි 30 දිනෙන් ඔබ්බට නියම කර තිබුණි.

(iii) ණය නියෝජ්‍යායතනය විසින් හදිසි ප්‍රසම්පාදනයන් ලෙස අනුමත කොට තිබුණද, කොළඹ නගරයේ ආදායම් නොලබන ජලය අවම කිරීම සඳහා වූ කොන්ත්‍රාත්තුවේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය සම්පූර්ණ කිරීම සඳහා දින 504 ක් ගත කොට තිබූ බව තව දුරටත් නිරීක්ෂණය විය. තවද, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් මූලික අදියරයන්හි දී විධිමත් කල් පවත්නා සමීක්ෂණයන් මත පදනම්ව තාත්වික ඇස්තමේන්තු පිළියෙල කොට නොතිබූ අතර ඒ හේතුවෙන් මෙම සංරචකය යටතේ

ඇස්තමේන්තුගත කිලෝමීටර 99 ක් වූ නල එලීම් කාර්යයන්හි දිග කිලෝමීටර 194.5 ක් දක්වා සැලකිය යුතු ලෙස ඉහළ ගොස් තිබුණි.

(iv) කොන්ත්‍රාත්තුවේ ලංසු ලේඛන අනුව තෝරාගත් ලංසුකරු විසින් අමුද්‍රව්‍ය භාවිතය මත වූ නිෂ්පාදන අනුකූලතා සහතිකය සහ ඇගයීම ක්‍රියාවලිය සඳහා සම්බන්ධ වන ප්‍රධාන නිලධාරීන් පිළිබඳ විස්තර ලංසු ඉදිරිපත් කිරීමේ අවසාන දිනට ඉදිරිපත් කළ යුතුය. කෙසේ වෙතත් කොළඹ නගරයේ බටහිර ප්‍රදේශයේ ආදායම් නොලබන ජලය අවම කිරීම සඳහා වූ පද්ධති පුනරුත්ථාපන සංරචකය යටතේ වූ කොන්ත්‍රාත්තුව කොන්ත්‍රාත් ගිවිසුම අත්සන් කළ දිනය වූ 2016 දෙසැම්බර් 01 වන දින වන විටත් නියමිත සහතික ඉදිරිපත් නොකළ ලංසුකරුවකු වෙත ප්‍රදානය කොට තිබුණි. තවද 2017 දෙසැම්බර් 31 දිනට කොන්ත්‍රාත්තුව යටතේ වූ ක්‍රියාකාරකම්හි සියයට 9.57 ක මන්දගාමී ප්‍රගතියක් දක්වා තිබුණි. ඊට අමතරව ඉහතකී කොන්ත්‍රාත්තුව යටතේ දිස්ත්‍රික් මනු කියවීම් ප්‍රදේශ 18 ක සහ ප්‍රධාන බෙදාහැරීම් පද්ධති 2 ක ජල පීඩනය පදනම් කරගෙන නල මාර්ග සැලසුම් කිරීම 2018 මාර්තු 30 වන විටත් අවසන් කර නොතිබුණි.

(v) 2017 ජනවාරි 10 වන දිනට ප්‍රදානය කොට තිබූ කොළඹ නගරයේ දකුණු ප්‍රදේශයේ ආදායම් නොලබන ජලය සඳහා වූ පද්ධති පුනරුත්ථාපන කොන්ත්‍රාත්තුව යටතේ දිස්ත්‍රික් මනු කියවීම් ප්‍රදේශ 9 ක ජල පීඩනය පදනම් කරගෙන නල මාර්ග සැලසුම් කිරීම 2018 මාර්තු 30 වන විටත් සම්පූර්ණ කොට නොතිබුණි. තවද සමීක්ෂණය කළ යුතුව තිබූ නිවාස 35,000 ක ඉලක්කයෙන් විෂය ගත නිවාස 15,894 ක් 2017 දෙසැම්බර් 31 දිනට සමීක්ෂණය කොට තිබුණි. ඒ හේතුවෙන් 2019 දෙසැම්බර් 31 දිනට පෙර නිමකිරීමට අපේක්ෂා කොට තිබූ කිලෝමීටර 155 ක වැඩවලින්, කිලෝමීටර 02ක පමණක් නල එලීම් වැඩ අවසන් කොට තිබුණි.

(vi) ජල පරිභෝගිකයන් සඳහා වූ මහජන දැනුවත් කිරීම් වැඩසටහන් වෙනුවෙන් පිළියෙල කරන ලද ප්‍රගති වාර්තාවන් සමාලෝචිත වර්ෂය තුළ පවත්වන ලද එම වැඩසටහන් සංඛ්‍යාවෙන් පමණක් සමන්විතව තිබූ බව නිරීක්ෂණය විය. එකිනෙක පැකේජයන් යටතේ 2017 දෙසැම්බර් 31 දිනට පවත්වන ලද එම වැඩසටහන්හි විස්තර, හදුනාගත් ගැටළු සඳහා වූ නිර්දේශ සහ විසඳුම් යනාදිය ඒ තුළ අන්තර්ගතව නොතිබුණි. ඒ නිසාවෙන් දැනුවත් කිරීම් වැඩසටහන්වලට සහභාගී වීමෙන් පසු පරිභෝජන රටාවෙහි වූ වෙනස්කම් ඇගයීම සඳහා විධිමත් යාන්ත්‍රණයක් නොතිබුණි.

(vii) පාමංකඩ ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලයේ භාවිතය සඳහා නාගරික සංවර්ධන අධිකාරියට අයත් 2015 සැප්තැම්බර් 02 වන දින කල්බදු පදනම මත ව්‍යාපෘතිය විසින් අත්පත් කරගත් ඉඩම, ඒ සඳහා ගෙවන ලද රු. මිලියන 10 ක අත්තිකාම් මුදල අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමෙන් තොරව 2017 අගෝස්තු කාලපරිච්ඡේදය තුළ කොළඹ මහ නගර සභාව වෙත පවරා තිබුණි. ඊට අමතරව කාර්යාල ගොඩනැගිල්ලේ ගෘහ නිර්මාණ සැලසුම් සඳහා සමාලෝචිත වර්ෂය තුළ ගෙවන ලද රු. මිලියන 2.11 ක අනෙක් අත්තිකාරම ඊට අයත් ඉඩම පවරා තිබීම හේතුවෙන් ඵලදායී නොවී තිබුණි.

(viii) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් 2016 මාර්තු 24 දින නිකුත් කරන ලද අංක 01/2016 චක්‍රලේඛයේ ඡේද අංක 2.3.2 හි සඳහන් අවශ්‍යතාවයන්ට පටහැනි ලෙස ව්‍යාපෘතියේ ක්‍රියාත්මක නියෝජ්‍ය ආයතනය විසින් ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ වැඩබැලීමේ පදනම මත නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (නැගෙනහිර පළාත්) තනතුරට පත් කර තිබුණි.

4.2.4 නිමවුම් පාදක ආධාර මත වන ගෝලීය හවුල් ව්‍යාපෘතිය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ඇමෙරිකානු ඩොලර් මිලියන 5.08 කට සමාන රු. මිලියන 583.66 කට එකඟව තිබූ මුළු ප්‍රදාන වටිනාකමින් ව්‍යාපෘති ක්‍රියාකාරකම් ආරම්භ කොට වසර 6ක් ගතවී 2017 දෙසැම්බර් 31 දිනට ඇමෙරිකානු ඩොලර් මිලියන 2.31 ට සමාන වන ශ්‍රී ලංකා රු. මිලියන 340.76 ක් හෙවත් සියයට 45.47 ක් පමණක් උපයෝජනය කොට තිබුණි. එම නිසා කොන්ත්‍රාත්කරුගේ දුර්වල කාර්යසාධනය මත ව්‍යාපෘතියේ ඉතිරි කාල පරිච්ඡේදය තුළ වෙන්කිරීම්වලින් ඉතිරිය උපයෝජනය කිරීමේ හැකියාව පිළිබඳ නිශ්චිත නොවේ.

(ii) ව්‍යාපෘති ලේඛනය අනුව ව්‍යාපෘතිය සංරචක 7 කින් සමන්විතව තිබූ අතර කොන්ත්‍රාත් ප්‍රදානයේදී සිදුවූ ප්‍රමාදය සහ කොන්ත්‍රාත්කරුගේ දුර්වල කාර්ය සාධනය මත ඒ අතරින් ස්ථානීය සනීපාරක්ෂාව වැඩිදියුණු කිරීම සංරචකයෙහි 2017 දෙසැම්බර් 31 දිනට සියයට 26.52 ක මන්දගාමී ප්‍රගතියක් දක්වා තිබුණි. තවද 2017 දෙසැම්බර් 31 දිනට සියයට 100 ක භෞතික ප්‍රගතියක් අපේක්ෂා කර තිබුණද ව්‍යාපෘතියේ ප්‍රගති වාර්තාවන් අනුව සමාලෝචිත වර්ෂය අවසානයට ව්‍යාපෘති සංරචකයන්හි සමස්ත භෞතික ප්‍රගතිය සියයට 91.6 ක්ව පැවතුණි.

(iii) ස්ථානීය සනීපාරක්ෂාව වැඩිදියුණු කිරීම සංරචකයෙහි කොන්ත්‍රාත්තුව 2016 මැයි 16 වන දින ප්‍රදානය කොට තිබූ අතර පිරිපහදු ඒකක 3,785 ක් සැපයුම් කිරීම සහ සවිකිරීමටත් 2017 අගෝස්තු 31 වන විට දෙහිවල, මොරටුව, කොලොන්නාව සහ ජා-ඇල ප්‍රදේශයන්හි වැසිකිළි 1,135 ක් ඉදිකිරීමටත් සැලසුම් කොට තිබුණි. කෙසේ වෙතත් කොන්ත්‍රාත් ප්‍රදානයේ ප්‍රමාදය, කොල්ලුපිටියේ ස්ථාපිත කොට ඇති නිෂ්පාදන වැඩබිමෙහි ප්‍රමාණවත් පරිදි ශ්‍රම බලකා හිඟය සහ පිරිපහදු ඒකකයන්හි හස්ත පරිසැකසුම් කාර්යයන්හි දුර්වල කාර්යසාධනය යනාදී හේතුවෙන් 2017 දෙසැම්බර් 31 වන විට සැලසුම් කර තිබූවන්ගෙන් පිළිවෙළින් පිරිපහදු ඒකක සවිකිරීම් 556 ක් පමණක් හෙවත් සියයට 15 ක් ද වැසිකිළි 205 ක් හෙවත් සියයට 18 ක් පමණක්ද නිමකොට තිබුණි. ඉන් අනතුරුව කොන්ත්‍රාත් කාර්යයන් කඩිනම් කිරීම සඳහා එම කොන්ත්‍රාත්තුව වෙනත් කොන්ත්‍රාත්කරුවන් 4 දෙනෙකුට ප්‍රදානය කිරීමට 2018 මැයි 15 වන දින තීරණය කොට තිබුණි. කෙසේ වෙතත් සවිකිරීම්වලින් කොටසක් අත්පත් කර ගැනීමෙන් පසුවද 2018 ජූලි 17 වන විටත් නව කොන්ත්‍රාත්කරුවන්ගේ පිරිපහදු ඒකකවල දෛනික අවශ්‍යතාවය සැපයුම් කිරීමට ප්‍රධාන කොන්ත්‍රාත්කරු අපොහොසත්ව තිබුණි.

(iv) කොලොන්නාව දිස්ත්‍රික් ලේකම් බල ප්‍රදේශය තුළ ස්ථානීය සනීපාරක්ෂක පහසුකම් 950 ක් සැපයීමටත්, වැසිකිළි 285 ක් ඉදිකිරීමටත් ව්‍යාපෘතිය සැලසුම් කොට තිබුණි. ඒ අනුව 2017 දෙසැම්බර් 31 දිනට ඇප සුරකුම්, රක්ෂණය, ලීබඩු නඩත්තු කිරීම් යනාදිය වෙනුවෙන් රු.2,135,939 ක මුදලක් ව්‍යාපෘතිය වැය කොට තිබුණි. කෙසේ වෙතත් ප්‍රතිලාභීන් වෙත කිසිදු ප්‍රතිලාභයක් ලබාදීමට ව්‍යාපෘතිය අපොහොසත්ව තිබූ බව අනාවරණය විය.

(v) ඉහත (iii) හි හාරගන්නා ලද සවිකිරීම් කොටස කොන්ත්‍රාත්කරුවන් හතර දෙනෙකුට (4) රු. මිලියන 153.30 ක මුළු කොන්ත්‍රාත් වටිනාකමට ප්‍රදානය කොට තිබුණි. කෙසේ වෙතත් ඉහත සවිකිරීම්වල ඉංජිනේරු ඇස්තමේන්තුව රු. මිලියන 117.92 ක් විය. ඒ හේතුවෙන් රු. මිලියන 35.38 කින් මූලික ඉංජිනේරු ඇස්තමේන්තුව ඉක්මවා වැය දැරීමෙන් කොන්ත්‍රාත්තුව ප්‍රදානය කොට තිබුණි. තවද අමතර වියදම් පරිත්‍යාග නියෝජිතායතන මගින් ප්‍රතිපූර්ණ කර ගැනීමට නොහැකිවීම හේතුවෙන් රජයට සහ ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් දරා ගැනීමට සිදු විය හැකි බව නිරීක්ෂණය විය.

4.2.5 උතුරු නුවර පාතදුම්බර ඒකාබද්ධ ජල සම්පාදන යෝජනා ක්‍රමය

පහත නිරීක්ෂණයන් සිදු කරනු ලැබේ.

(i) 2015 ජුනි 16 වන දින කොන්ත්‍රාත්තුව ප්‍රදානය කොට තිබුණි. කෙසේ වෙතත් වසර 2 1/2 ක ප්‍රමාදයකින් පසුව 2017 දෙසැම්බර් 22 වන දින ණය ගිවිසුම අත්සන් කොට තිබුණි.

(ii) විෂය පථය අඩු කිරීමෙන් පසු (වෙන්කිරීම් සහ මිල විචලතාවයන් හැර) මෙම ව්‍යාපෘති කොන්ත්‍රාත්තුවේ වටිනාකම රු. මිලියන 24,790.24 ක් වූ අතර එය රු. මිලියන 16,169.35 ක් වූ (විෂය පථය අඩු කිරීමට පෙර) මණ්ඩලයේ ඉංජිනේරු ඇස්තමේන්තුවට වඩා සියයට 53 ක් ඉක්මවා තිබුණි.

(iii) මණ්ඩලයේ ඉංජිනේරු ඇස්තමේන්තුව අනුව විදේශ ව්‍යවහාර මුදලින් වැය කළ යුතු ඇස්තමේන්තුගත මුදල එක්සත් ජනපද ඩොලර් 26,388,500 ක් විය. කෙසේ වෙතත් විදේශ කොන්ත්‍රාත්කරුගේ කොන්ත්‍රාත් වටිනාකම තුළ ඇතුළත්ව තිබූ වටිනාකම එක්සත් ජනපද ඩොලර් 192,336,418 ක් විය. ඒ හේතුවෙන් විදේශ ව්‍යවහාරයෙන් වැය කිරීමට සැලසුම් කළ වටිනාකම සියයට 629 කින් ඉක්මවා තිබුණි.

(iv) ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ (5.3.9) (ආ) ඡේදය ප්‍රකාරව, විදේශ ව්‍යවහාර මුදලින් ගෙවීම් කිරීමට සුදුසුකම් ලැබීම සඳහා ලංසුකරුවන් විසින් එ සම්බන්ධයෙන් සාධාරණීකරණය කිරීමේ කරුණු ඉදිරිපත් කළ යුතු වේ. කෙසේ වෙතත් මණ්ඩලය විසින් පිළියෙල කරන ලද විදේශ ව්‍යවහාර ඇස්තමේන්තු තුළ එවැනි සාධාරණීකරණය කිරීමේ හේතු ලබාගැනීමෙන් තොරව පහත අයිතමයන් ඇතුළත් කොට තිබුණි.

අයිතමය	ඇස්තමේන්තුව තුළ වෙන් කළ වටිනාකම	රේගු ගාස්තු ලෙස වෙන් කළ වටිනාකම
	එ.ජ.ඩො	රු.
කළුගල් කඩා ඉවත් කිරීම	1,470,033	12,905,856
ගස් 27 ක් කැපීම	229,608	2,003,499
ගස් 135 ක මුල් ගැලවීම	73,080	637,425

(v) තවද, පවුල් නැවත පදිංචි කිරීමේදී භාවිතා කිරීම සඳහා එක් නිවසක වපසරිය වර්ග මීටර් 483 ක් වන ගෙවල් දෙකක් ඉදිකිරීමට රු. මිලියන 31.92 වටිනාකමක් ඇස්තමේන්තුව තුළ ඇතුළත් කොට තිබුණි.

4.2.6 විසල් මහනුවර ජල සම්පාදන ව්‍යාපෘතිය

පහත නිරීක්ෂණයන් සිදු කරනු ලැබේ.

(i) ව්‍යාපෘති අරමුණුවලට පටහැනි ලෙස මණ්ඩලයේ සභාපතිගේ ප්‍රයෝජනය සඳහා ජීප් රථයක් මිලදී ගැනීම පිණිස මණ්ඩලය විසින් සිදු කරනු ලැබූ ඉල්ලීම මත 2016 මාර්තු 18 වන දින කොන්ත්‍රාත්කරු විසින් රු.18,600,000 ක මුදලක් ප්‍රධාන කාර්යාලය වෙත ප්‍රේෂණය කොට තිබුණි. කෙසේ වෙතත් මෙම අරමුදල වාහනය මිලදී ගැනීම සඳහා භාවිතා කර නොතිබුණි. ඒ හේතුවෙන් කොන්ත්‍රාත්කරු විසින් රු. 980,000 ක මුදලක් සහභාගීත්ව ගාස්තු ලෙස අයකරගෙන තිබුණි.

(ii) ආදායම් නොලබන ජලය අඩු කිරීම සඳහා ජල උපාංග පරීක්ෂා කිරීමේ රසායනාගාරයක්, ජලමනු පරීක්ෂා කිරීමේ රසායනාගාරයක් සහ ජල උපකරණ පරීක්ෂාව සඳහා වූ ජල ටැංකි හා උපකරණ පරීක්ෂා කිරීමේ ඒකකයක් ඉදිකොට 2016 පෙබරවාරි 29 වන දින මණ්ඩලය වෙත භාරදී තිබුණි. කෙසේ වෙතත් මෙම ඒකකයන් 2018 ජූලි 31 වන විටත් අපේක්ෂිත අරමුණු සඳහා උපයෝජනය කර නොතිබුණි.

4.2.7 යාපනය කිලිනොච්චි ජල සම්පාදන සහ සනීපාරක්ෂක ව්‍යාපෘතිය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) නාවත්කුලිය ජල කුළුණ හා කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා ඉඩම් අත්පත් කර ගැනීමට රු. මිලියන 3.45 ක මුදලක් 2014 ජුනි 11 වන දින ජාතික නිවාස සංවර්ධන අධිකාරියට ගෙවා තිබුණි. කෙසේ වෙතත් 2017 දෙසැම්බර් 31 දින වන විටත් අත්පත් කරගත් ඉඩම්වල අයිතිය ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට පවරා නොතිබුණි.

4.2.8 වියළි කලාපීය නාගරික ජල හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ණය ගිවිසුමේ උපලේඛන 05 හි, 18 වන ඡේදය ප්‍රකාරව නගර සභා විසින් පිරියම් කළ අපද්‍රව්‍යවල ප්‍රමාණය හා ගුණාත්මය, අපද්‍රව්‍ය මුදාහරින ජලයේ ගුණාත්මය සහ වියළි මලාපවහන අප්‍රද්‍රව්‍යවල අඩංගු බැක්ටීරියාවල ගුණාත්මය නිරන්තරව අධීක්ෂණය කළ යුතු ය. කෙසේ වෙතත් කාර්යක්ෂම අපද්‍රව්‍ය කළමනාකරණයක් යටතේ ව්‍යාපෘති කටයුතු ක්‍රියාත්මක වන ප්‍රදේශයන් තුළ නගර සභා විසින් කාර්යක්ෂම අපද්‍රව්‍ය කළමනාකරණයක් සඳහා වන අධීක්ෂණ යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කරන බවට සනාථ කරන කිසිදු සාක්ෂියක් දක්නට නොලැබුණි.

(ii) නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය සහ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ව්‍යාපෘතියේ කටයුතු සමීපව අධීක්ෂණය කිරීම සඳහා සුදුසු යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කළ යුතු බවට 2005 අප්‍රේල් 05 පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමකදී තීරණය කර තිබුණි. කෙසේ වුවත් 2017 දෙසැම්බර් 31 දින දක්වාත් සුදුසු යාන්ත්‍රණයක් දෙපාර්ශවය විසින්ම ක්‍රියාත්මක කර නොතිබුණි.

(iii) ජලාශ 03 ක් නවීකරණය හා වී වගාව සඳහා පතියාකුලම් හා කට්ටකුලම්හි ඉඩම් වැඩිදියුණු කිරීම සඳහා අවබෝධතා ගිවිසුමක් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ එකඟතාව ලබා ගැනීමකින් තොරව වවුනියාවේ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තු සහකාර කොමසාරිස් සමඟ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය 2014 දී අත්සන් කර තිබුණි. කෙසේ වෙතත් සහකාර කොමසාරිස් ඒ අනුව කටයුතු නොකිරීම නිසා කටයුතු ප්‍රමාද වී තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස පෙර වර්ෂවල වන්දි හා යටිතල පහසුකම් ලෙස රු. මිලියන 21.8 ක් ශ්‍රී ලංකා රජයේ ලැබුණු දායකයෙන් ව්‍යාපෘතියට ගෙවීමට සිදු වී තිබුණි.

(iv) ණය නියෝජිතායතනයේ අනුමැතිය යටතේ ව්‍යාපෘතිය විසින් 2017 මැයි 19 දින උතුරු හා වයඹ පළාතේ ප්‍රාදේශීය සහය සේවා මධ්‍යස්ථානයේ ප්‍රයෝජනය සඳහා රු. මිලියන 16.95 ක පිරිවැයකට මෝටර් රථ 02 ක් මිලට ගැනීමට කටයුතු කර තිබුණි. කෙසේ වුවද, අදාළ වාහන ව්‍යාපෘතියේ කටයුතු ක්‍රියාත්මක කිරීමට දායක නොවන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ දකුණු ප්‍රාදේශීකයේ කාර්යාලයේ සේවයේ නියුතු නිලධාරීන්ට වෙන්කර දී තිබුණි.

4.2.9 මොණරාගල, බුත්තල ජල සම්පාදන ව්‍යාපෘතිය

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය සහ කොන්ත්‍රාත්කරු අතර 2015 නොවැම්බර් 30 දින ඇතිකරගත් අවබෝධතා ගිවිසුම අනුකූලව යූරෝ 500,000 ක් වටිනා වැඩ උපකොන්ත්‍රාත්තුවක් වශයෙන් කරගෙන යාම සඳහා මණ්ඩලය විසින් භාරගෙන තිබූ අතර එම වෙන්කිරීම්වලින් යූරෝ 400,000 (රු. මිලියන 62.81) ක් පමණක් මණ්ඩලයට ප්‍රේෂණය කොට තිබූ අතර ඉතිරි යූරෝ 100,000 (රු. මිලියන 15.70) ක්‍රියාකාරකම් සඳහා ක්‍රියාකාරීව සහභාගී වීමෙන් තොරව ලාභාන්තිකය සහ පොදු කාර්ය පිරිවැය ලෙස කොන්ත්‍රාත්කරු විසින් සලකා තිබුණි.

4.2.10 විසල් දඹුල්ල ජල සම්පාදන ව්‍යාපෘතිය

පහත නිරීක්ෂණයන් සිදු කරනු ලැබේ.

(i) මෙම ව්‍යාපෘතිය 2012 මාර්තු මස 06 දිනෙන් ආරම්භ කොට මාස 30 කින් එනම් 2014 සැප්තැම්බර් 05 දින අවසන් කිරීමට මුලදී සැලසුම් කොට තිබුණද එදිනට ව්‍යාපෘතිය අවසන් කිරීමට කොන්ත්‍රාත්කරු අපොහොසත්ව තිබුණි. ඒ හේතුවෙන් 2014 සැප්තැම්බර් 06 වන දින සිට 2018 මාර්තු 31 දින දක්වා අවස්ථා 05ක දී මාස 43 ක අතිරේක කාලපරිච්ඡේදයක් සඳහා කාල දිගුවක් ලබා දී තිබුණි. කෙසේ වෙතත් කොන්ත්‍රාත්කරුගේ දුර්වල කාර්ය සාධනය හේතුවෙන් 2018 ජූනි 30 දින වන විටත් කොන්ත්‍රාත්තුව සම්පූර්ණ නොකොට පැවතුණි. කෙසේ වෙතත් එක්සත් ජනපද ඩොලර් මිලියන 199.36 ක් වටිනා පොල්ගහවෙල, පොතුහැර සහ අලව්ව ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතියේ සහ පන්නල, මාකඳුර සහ කුලියාපිටිය ජල සම්පාදන ව්‍යාපෘතියේ වෙනත් කොන්ත්‍රාත්තු දෙකක් පිළිවෙලින් 2015 නොවැම්බර් 26 දින සහ 2016 දෙසැම්බර් 02 වන දින එම කොන්ත්‍රාත්කරුටම පිරිනමා තිබුණි.

(ii) තවද, මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් රජය විසින් ලබා ගත් ණය වෙනුවෙන් 2017 දෙසැම්බර් 31 දිනට ණය වාරික සහ පොලිය වශයෙන් රු. මිලියන 1,964.32 ක් සහ රු. මිලියන 677 ක් දරා තිබූ අතර ප්‍රමාද කාලය තුළ ව්‍යාපෘති කාර්යාලය නඩත්තු කිරීම වෙනුවෙන් කාර්ය මණ්ඩල සහ පොදු කාර්ය පිරිවැය ලෙස රු. මිලියන 151 ක වියදමක් 2017 දෙසැම්බර් 31 දිනට අතිරේක ලෙස දරාගැනීමට සිදුව තිබුණි.

4.3 ප්‍රමාද ව්‍යාපෘති

ඉඩම් නිරවුල් කර ගැනීමේ ප්‍රමාදය, පාරිසරික හා නැවත පදිංචි කිරීමේ ගැටළු, ව්‍යාපෘති පිරිනැමීමේ ප්‍රමාදයක්, කොන්ත්‍රාත්කරුන් විසින් සැපයුම්කරන ලද පී.ඊ් පයිප්පයන්හි බාල ගුණත්වය යනාදිය හේතුවෙන් විදේශ මූල්‍යන ව්‍යාපෘති හතක සැලකිය යුතු කාල ප්‍රමාදයක් නිරීක්ෂණය විය. විස්තර පහත පරිදි වේ.

ව්‍යාපෘතිය	ඇස්තමේන්තු වටිනාකම	ආරම්භක දිනය	නිම කළ යුතු දිනය	කාල දිගුව	ප්‍රමාද වූ දින ගණන
	රු. මිලියන				
නිමවුම් පාදක මත වන ගෝලීය හවුල් ව්‍යාපෘතිය	1,559	27/12/2011	31/12/2015	31/12/2017-31/12/2018	1095
විසල් දඹුල්ල ජල සම්පාදන යෝජනා ක්‍රමය - අදියර 01	9,593	06/03/2012	05/09/2014	06/09/2014-31//03/2018	1302
විසල් රත්නපුර ජල සම්පාදන ව්‍යාපෘතිය	4,493.66	24/07/2013	24/07/2015	24/07/2015-29/02/2016	220
විසල් මහනුවර ජලසම්පාදන ව්‍යාපෘතිය	7,148	30/03/2007	30/09/2012	30/09/2007-20/07/2017	1753
මහ කොළඹ අප ජල කළමනාකරණ ව්‍යාපෘතිය	13,410	18/12/2009	31/12/2014	31/12/2014-31/12/2017	1095
වියළි කලාපීය ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය	19,165	13/11/2009	30/06/2013	30/06/2013-31/12/2018	2009
මහ කොළඹ ජල පුනරුත්ථාපන ව්‍යාපෘතිය	4,785	27/11/2007	31/01/2012	31/01/2012-20/06/2017	1965
නැගෙනහිර පළාත් ජල සම්පාදන හා සංවර්ධන ව්‍යාපෘතිය	7,702.25	20/03/2010	20/12/2013	20/12/2013-31/12/2015	741
මහනුවර නගර අපජල කළමනාකරණ ව්‍යාපෘතිය	17,278	03/02/2010	10/10/2017	දිගුවක් ලබා දී නොමැත.	385

4.4 දේශීය බැංකු ණය ජල සම්පාදන ව්‍යාපෘති

4.4.1 මාතර දිස්ත්‍රික් ජල සම්පාදන සම්බන්ධතා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මාතර දිස්ත්‍රික්කයේ ජල සම්පාදන සම්බන්ධතා 1300 ක් ලබාදීම සඳහා ව්‍යාපෘතිය ආරම්භ කොට තිබුණි.

(ආ) යූ.පී.වී.සි පයිප්ප, සවිකිරීම් හා උපාංග සැපයුම් කොන්ත්‍රාත්තුව 2015 මාර්තු 14 වන දින සම්පූර්ණ කොට තිබූ අතර එමගින් රු. 70,766,819 ක් වටිනා පයිප්ප සහ සවිකිරීම් සපයා තිබුණි. කෙසේ වෙතත් 2014 දෙසැම්බර් 19 වන දින සිට 2015 ජූලි 01 දින දක්වා වූ කාලපරිච්ඡේදය සඳහා ප්‍රදානය කර තිබූ යූ.පී.වී.සි සවිකිරීම් හා උපාංග එලිම් කොන්ත්‍රාත්තුව 2018 අගෝස්තු 31 දින වන විටත් ආරම්භ කොට නොතිබුණි.

(ඇ) මිලදී ගත් පයිප්ප සහ සවිකිරීම් ව්‍යාපෘතියේ අරමුණුවලට සම්බන්ධ නොවූ කාර්යයන් සඳහා උපයෝජනය කොට තිබුණි.

4.4.2 මහනුවර උතුර ජල සම්පාදන ව්‍යාපෘතිය - අදියර 01 යටතේ නල එලීම

රු.77,705,705 ක් සහ 94,032,235 ක් වටිනා නල එලීම් සඳහා වන කොන්ත්‍රාත් දෙකක් පිළිවෙලින් 2014 සැප්තැම්බර් සහ 2014 දෙසැම්බර් යන මාස වලදී කොන්ත්‍රාත්කරුවකුට ප්‍රදානය කොට තිබූ අතර පිළිවෙලින් 2015 අගෝස්තු සහ 2015 ජූලි මාසවලදී නිම කළ යුතු ලෙස සැලසුම් කොට තිබුණි. කෙසේ වෙතත් 2015 සැප්තැම්බර් 15 වන දින එකතුව රු. 33,677,822 ක් වටිනා අත්තිකාරම් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබූ නමුදු වසර 2 ක් ඉක්මවා තිබීමෙන් පසුවද මෙම ව්‍යාපෘතීන් සම්පූර්ණ කොට නොතිබුණි.

4.5 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මාතර හා බණ්ඩාරවෙල යන දිස්ත්‍රික්කයන්හි සුළු හා මධ්‍ය පරිමාණ ජල සම්පාදන සහ අපවහන ව්‍යාපෘතීන් සඳහා රු. මිලියන 235 ක වෙන් කිරීමක් සිදු කර තිබුණි. 2017

දෙසැම්බර් 31 දිනට එයින් රු මිලියන 15.8 ක් හෙවත් සියයට 7 ක් පමණක් උපයෝජනය කර තිබුණි.

(ආ) නැගී එන කුඩා නගර (සුළු හා මධ්‍ය පරිමාණ) ජල සම්පාදන ව්‍යාපෘතීන් සඳහා රු. මිලියන 500 ක් වෙන් කර තිබුණද, 2017 දෙසැම්බර් 31 දිනට රු මිලියන 271.40 ක් හෙවත් සියයට 54.3 ක් පමණක් උපයෝජනය කර තිබුණි.

(ඇ) තවද, ත්‍රිකුණාමල පද්ධති වැඩිදියුණු කිරීම සඳහා සමාලෝචිත වර්ෂය තුළ රු. මිලියන 250 ක් වෙන් කර තිබුණි. කෙසේ වෙතත් එයින් කිසිදු වියදමක් දරා නොතිබුණි.

(ඈ) මාවනැල්ල තොග ගබඩාවේ ප්‍රමාණවත් ඉඩ පහසුකම් නොතිබීම හේතුවෙන්, ගබඩා පරිශ්‍රය ඇතුලත හා ඉන් පිටත කිසිදු ආරක්ෂාවකින් තොරව තොග ගබඩා කොට තිබුණි. තවද ගබඩාවේ තිබූ ජල මීටර වෙයන් විසින් විනාශ කොට තිබුණි.

(ඉ) කැගල්ල සහ කළුතර ප්‍රදේශයන්හි සිදු කරන ලද නියැදි විගණන පරීක්ෂාවට අනුව පාරිභෝගික පැමිණිලි විසඳීමේ මන්දගාමී ප්‍රගතියක් නිරීක්ෂණය විය.

4.6 මෙහෙයුම් අකාර්යක්ෂමතා

මණ්ඩලයේ දුර්වල ණය සේවා කරන ධාරිතාව හේතුවෙන්, 2014 වර්ෂයට පසුව ආරම්භ කරන ලද ව්‍යාපෘති වෙනුවෙන් ලබාගත් රු. 63,612,471,380 ක් වටිනා හිඟ ණය ශේෂය 2015 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා රජයේ ස්කන්ධ ගිණුමට මාරු කොට තිබුණි.

4.7 නිශ්කාර්ය හා ඌන උපයෝජිත වත්කම්

පහත නිරීක්ෂණයන් සිදු කරනු ලැබේ.

(අ) නියැදි විගණන පරීක්ෂාවට අනුව එකතු වටිනාකම රු. 304,192,322 ක් වූ ගබඩා 26 කට අදාළ සෙමින් වලනය වන තොග ශේෂය දීර්ඝ කාලයක් තිස්සේ පැවතුණු අතර එය එම ගබඩා තොග ශේෂයන් සියයට 40 ක් නියෝජනය කරනු ලබයි.

(ආ) 2017 දෙසැම්බර් 31 දිනට තොගවල රු.539,183,367 ක් වටිනා වලන නොවන තොග හා රු. 467,494,774 ක් වටිනා සෙමින් වලනය වන තොග පැවති අතර එය මණ්ඩලයේ මුළු තොග වටිනාකමින් සියයට 7 ක් හා සියයට 6 නියෝජනය කරනු ලබයි.

(ඇ) විසල් මහනුවර ජල සම්පාදන ව්‍යාපෘතිය සඳහා රසායනාගාර ඉදිකිරීම වෙනුවෙන් රු. 166,993,899 ක් වැය කිරීමෙන් පසුව බදවා ගැනීමේ පැවති දුර්වලතා හේතුවෙන් ව්‍යාපෘතිය අතහැර දමා තිබුණි.

(ඉ) හපුගල ජල පිරිපහදු පිරියත ඉදිකිරීම සඳහා 2012 වර්ෂයේදී රු. මිලියන 16 ක් වැය කොට විසල් ගාල්ල ජල සම්පාදන ව්‍යාපෘතිය විසින් ඉඩමක් අත්පත් කරගෙන තිබූ අතර ඉඩම අත්පත් කර ගැනීමෙන් පසුව විශාල ගලක් මතුවීම හේතුවෙන් එම ඉඩම අපේක්ෂා කරන ලද අරමුණ සඳහා යොදවා නොතිබුණි.

4.8 මතභේදයට තුඩුදෙන කරුණු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2017 දෙසැම්බර් 31 දිනට වූ රු. 352,151,303 ක් වටිනා මාර්ගස්ථ තොගයෙන් රු.35,713,013 ක් වටිනාකමැති තොගයක් වසර දෙකකට වඩා වැඩි කාලයක් විමර්ශනය කිරීමකින් තොරව මාර්ගස්ථ තොග වශයෙන් පැවතුණි.

(ආ) තොග සමීක්ෂණයට පෙර තොග ලැබීම් හා නිකුත් කිරීම් තොග ශේෂයට ගැලපිය යුතු වුවද, එකතුව රු.521,015,622 ක් වූ ශුද්ධ හර ශේෂයක් හා එකතුව රු.284,249,255 ක් වූ ශුද්ධ බැර ශේෂයක් තොග සමීක්ෂණයෙන් පසුව තොග ශේෂයට ගලපා තිබුණි.

(ඇ) මණ්ඩලය විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂය අවසානයට වාහන 11 ක් නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය වෙත මුදාහැර තිබුණි. කෙසේ වෙතත් PA-8942, PE-5461, හා PC-5865 අංක දරණ වාහන 3ක් පමණක් අමාත්‍යාංශය වෙත ලැබුණු බව නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ ලේකම් මා වෙත දැනුම් දී තිබුණි.

(ඈ) ණයගැති රැස් කිරීම් පාලන ගිණුමෙහි 2017 දෙසැම්බර් 31 දිනට එකතු වටිනාකම රු.1,244,968,958 ක හර ශේෂයක් නිරීක්ෂණය විය.

4.9 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබා දුන් ආයතනයේ සම්පත්

පහත නිරීක්ෂණයන් සිදු කරනු ලැබේ.

(අ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/ 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍ර ලේඛයේ ඡේද අංක 8.3.9 හි විධිවිධානයට පටහැනිව 2017 දෙසැම්බර් 31 දිනට සේවකයින් 71 දෙනෙකු රේඛීය අමාත්‍යාංශය වෙත මුදාහැර තිබුණු අතර 2015 දෙසැම්බර් සිට 2017 දෙසැම්බර් 31 දක්වා එම සේවකයන්ගේ වැටුප් ලෙස රු.87,840,261 ක් මණ්ඩලය විසින් ගෙවා තිබුණි. කෙසේ වෙතත් ඉහත සේවකයින්ගෙන් 28 දෙනෙකු පමණක් අමාත්‍යාංශයේ රාජකාරි සඳහා ක්‍රියාකාරී ලෙස දායක වී තිබුණි. තවද මණ්ඩලය විසින් එම සේවකයන් සඳහා ගෙවූ වැටුප් අමාත්‍යාංශය විසින් ප්‍රතිපූර්ණය කර නොතිබුණි.

(ආ) ඉහත සඳහන් සේවකයින් අතරින්, සේවකයින් 40 දෙනෙකු සම්බන්ධීකාරකවරුන් වශයෙන් කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන තිබුණි. කෙසේ වෙතත් සම්බන්ධීකාරක තනතුර මණ්ඩලයේ අනුමත කාර්යමණ්ඩලය තුළ නොවීය.

(ඇ) තවද, 2017 ජනවාරි සිට දෙසැම්බර් දක්වා වූ කාල පරිච්ඡේදය තුළ මොටර් රථ 11 ක් රේඛීය අමාත්‍යාංශය වෙත මුදාහැර තිබුණු අතර එම වාහනවල අලුත්වැඩියා හා බලපත්‍ර ගාස්තුව ලෙස රු. 1,093,567 ක මුදලක් දරා තිබුණි.

4.10 සේවක මණ්ඩල කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කළමනාකරුවන් / ඉංජිනේරු (යාන්ත්‍රික) , ඉංජිනේරු (විදුලි) , ඉංජිනේරු (සිවිල්) , මධ්‍යම මට්ටමේ තාක්ෂණික (එම් එල් - ටී) , ලිපිකරුවන් හා සමාන්තර ශ්‍රේණි වර්ගයන් සහ වෙනත් පුහුණු ශ්‍රේණි ආදි ප්‍රධාන මෙහෙයුම් මට්ටමේ තනතුරු වල පැවති පුරප්පාඩු 817 ක් පිරවීම සඳහා සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම මණ්ඩලය විසින් පියවර ගෙන නොතිබුණි.

(ආ) 2006 සැප්තැම්බර් 22 දිනැති අංක 30 දරන කලමණාකරන සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ දක්වා ඇති පරිදි බඳවා ගැනීම් හා උසස්වීම් පටිපාටිය සඳහා කලමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමට පියවර ගෙන නොතිබුණි.

(ඇ) මණ්ඩලය විසින් ඉදිරිපත් කරන ලද තොරතුරුවලට අනුව 2000 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා විවිධ කාර්ය මණ්ඩල වර්ගීකරණයන්ට අයත් සේවකයින් 140 දෙනෙකු විදේශ මූල්‍යන ජල සම්පාදන හා අපවහන ව්‍යාපෘති සඳහා නිදහස් කොට තිබුණි. මණ්ඩලය විසින් ගෙවන ලද වේතන හා අනෙකුත් දීමනා එම ව්‍යාපෘතීන් විසින් මණ්ඩලය වෙත ප්‍රතිපූර්ණය කොට තිබුණි. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරුන් 02 ක්, සහකාර සාමාන්‍යාධිකාරීන් 18 ක්, ප්‍රධාන ඉංජිනේරුවන් 28 ක්, ඉංජිනේරුවරුන් 41 ක්, සහකාර ඉංජිනේරුවරුන් 40 ක්, සමාජ විද්‍යාඥයින් 03 දෙනෙකු ඒ අතර විය.

(ඈ) සමාලෝචිත වර්ෂය අවසානයට සේවකයින් 223 දෙනෙකු කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන තිබුණු අතර සිවිල් ඉංජිනේරුවරයෙකු සහ ප්‍රමාණ සමීක්ෂකවරයෙකු ද ඒ තුළ විය.

(ඉ) 2015 වර්ෂයේදී බහුවිධ කාර්යස්ථ පුහුණුව සඳහා සේවකයින් 508 දෙනෙකු භාණ්ඩාගාර ලේකම්ගේ හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව බඳවාගෙන තිබුණු අතර 2016 වර්ෂය තුළදී ඔවුන්ගෙන් සේවකයින් 491 දෙනෙකු සේවයෙහි ස්ථිර කොට තිබුණි. තවද 2016 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා ඔවුන්ගේ වැටුප් ලෙස රු.මිලියන 563.5 ක් ගෙවා තිබුණි.

(ඊ) ඉහත සඳහන් පරිදි බඳවා ගන්නා ලද සේවක සංඛ්‍යාවට අමතරව සේවා කොන්ත්‍රාත් ගිවිසුම් මත සේවකයින් 1,628 දෙනෙකු මණ්ඩලය තුළ සේවයෙහි යොදවා තිබුණු අතර 2017 වර්ෂය සඳහා ඔවුන් වෙනුවෙන් රු. මිලියන 449 ක් ගෙවා තිබුණි.

4.8 දෘශ්‍ය අක්‍රමිකතා

පහත නිරීක්ෂණයන් සිදු කරනු ලබයි.

(අ) ත්‍රිකුණාමලය, කැලණිය, අම්පාර ප්‍රදේශයන්හි 1999 සිට 2006 දක්වා කාල පරිච්ඡේදය තුළ සිදු කරන ලද රු.මිලියන 246.66 ක මුදල් වංචාවන් වගකිව යුතු පුද්ගලයන්ගෙන් අයකර ගැනීම සඳහා 2017 දෙසැම්බර් 31 වන විටත් කටයුතු කර නොතිබුණි.

(ආ) කළුතර ප්‍රාදේශිකයේ මනුසටහන්කරුවෙකු විසින් 2017 වර්ෂය තුළ සිදු කරන ලද රු.1,145,235 ක් වටිනා වංචාව, වගකිව යුතු පුද්ගලයන්ගෙන් අයකර ගැනීමට 2018 අගෝස්තු 31 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

5. තිරසාර සංවර්ධන අරමුණු කරා ලඟා වීම

එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන අරමුණු න්‍යාය පත්‍රය, 2030 පිළිබඳව දැනුවත් වීමෙන් අනතුරුව, 2030 වර්ෂයේදී විශ්වීය හා සාධාරණ ලෙස සැම දෙනාටම ආරක්ෂිත හා දැරිය හැකි ලෙස පානීය ජලය සඳහා ප්‍රවිෂ්ඨය සහ ප්‍රමාණවත් සහ සාධාරණ ලෙස සනීපාරක්ෂක පහසුකම් සඳහා ප්‍රවිශ්ඨය ලබා දීම සහ විශේෂ අවශ්‍යතා ඇති කාන්තා හා ගැහැණු ළමුන්ගේ අවශ්‍යතා සඳහා විශේෂ අවධානය යොමු කිරීම යනාදිය තිරසාර සංවර්ධන අරමුණු ලෙස මණ්ඩලය හඳුනාගෙන තිබුණි. කෙසේ වෙතත් මණ්ඩලයේ විෂය පථයට යටත්වන වෙනත් අරමුණු, ඉලක්ක සහ සන්ධිස්ථානයන් හඳුනා ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. තවද, තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීම සඳහා මණ්ඩලය විසින් අභ්‍යන්තර වක්‍රලේඛ හෝ මග පෙන්වීම් නිකුත් කර නොතිබුණි.

6. ගිණුම්කටයුතු භාවය හා යහපාලනය

6.1 අභ්‍යන්තර විගණනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සහකාර සාමාන්‍යාධිකාරීවරයෙකු, ප්‍රධාන අභ්‍යන්තර විගණකවරු 05 දෙනෙකු, අභ්‍යන්තර විගණකවරු තුන්දෙනෙකු සහ ඉංජිනේරුවරයෙකු ඇතුළුව අභ්‍යන්තර විගණන අංශයේ පුරප්පාඩු 16 ක් පවතී.

(ආ) දේශීය සහ විදේශීය අරමුදල් භාවිතා කරන ජල සම්පාදන හා සනීපාරක්ෂක සේවා ව්‍යාපෘතීන් විශාල ප්‍රමාණයක් මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරමින් පැවතියද, මණ්ඩලයේ තාක්ෂණික විගණන අංශය සඳහා ප්‍රමාණවත් සේවක මණ්ඩලයක් අනුයුක්ත කොට නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළ ව්‍යාපෘති ක්‍රියාකාරකම් කිහිපයක් සම්බන්ධයෙන් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කොට නොතිබුණි.

6.2 ප්‍රසම්පාදන සහ කොන්ත්‍රාත් ක්‍රියාවලිය

6.2.1. ප්‍රසම්පාදනයන්

පහත නිරීක්ෂණයන් සිදු කරනු ලැබේ.

(අ) රාජ්‍ය ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්හි ඡේද අංක 4.2.1 (අ) ප්‍රකාරව මණ්ඩලය විසින් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කොට නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ මිලදීගත් රු. මිලියන 39 ක් වටිනා පරිගණක 370 ක් 2017 වර්ෂය සඳහා පිළියෙල කරන ලද ප්‍රසම්පාදන සැලැස්ම තුළ ඇතුළත් කොට නොතිබුණි.

(ඇ) 2017 වර්ෂය වෙනුවෙන් පිළියෙල කරන ලද විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්ම සඳහා අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය ලබා ගෙන නොතිබුණි.

(ඈ) ප්‍රසම්පාදන සැලැස්ම කාලීනව සමාලෝචනය කොට යාවත්කාලීන කර නොතිබුණි.

(ඉ) විගණනය විසින් සිදුකරන ලද නියැදි විගණන පරීක්ෂාව අනුව ප්‍රදාන ලිපිවල ඇතුළත් විධිවිධානයන්ට අනුකූලව ඇතැම් අවස්ථාවන්හිදී ඇවර කිරීමේ අලාභ සැපයුම්කරුවන්ගේ අය කරගෙන නොතිබුණි.

7. අයවැය පාලනය

අයවැය ඵලදායී කළමනාකරණ පාලන උපකරණයක් ලෙස යොදාගෙන නොතිබූ බව පෙන්වාදෙමින් අයවැය ගත හා සත්‍ය ආදායම් හා වියදම් අතර සියයට 11 සිට සියයට 57 දක්වා වූ සැලකිය යුතු විචලතාවයන් නිරීක්ෂණය විය.

8. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතා මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට වරින්වර යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතු වේ.

	පාලන ක්ෂේත්‍රය	නිරීක්ෂණය
(අ)	ගිණුම්කරණය	පාලන ගිණුම්, කෙරීගෙන යන වැඩ හා අන්තර් දෙපාර්තමේන්තු දත්ත ගිණුම්කරණ දත්ත සමඟ සැසඳීමට අපොහොසත් වීම.
(ආ)	වත්කම් කළමනාකරණය	(i) විවිධ ප්‍රාදේශිකයන්හි එකම ස්ථාවර වත්කම් දෙවරක් සටහන් කිරීම. (ii) ස්ථාවර සහ අස්පෘශ්‍ය වත්කම් වටිනාකම් සමාලෝචනය හා නැවත නොදැක්වීම. (iii) ව්‍යාපෘති නිමකර තිබුණද, ස්ථාවර වත්කම් ප්‍රාග්ධනිත කර නොතිබීම. (iv) දිගු කාලයක් සඳහා නොවෙනස්ව පැවති කෙරීගෙන යන වැඩ ශේෂ විමර්ශනය කිරීමට අපොහොසත් වීම. (v) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ නියමිත කාලය තුළ සම්පූර්ණ කිරීමට අපොහොසත් වීම. (vi) වෙනත් ආයතන වෙත වාහන නිදහස් කිරීම. (vii) ව්‍යාපෘති ක්‍රියාකාරකම් ආරම්භයට පෙර ඉඩම් අත්පත් කර ගැනීමට අපොහොසත් වීම.
(ඇ)	තොග පාලනය	(i) භෞතිකව සත්‍යාපනය කරන ලද ශේෂ ලෙජර ශේෂයන් සමඟ සන්සන්දනය නොකිරීම. (ii) මාර්ගස්ථ තොග ශේෂයන් සහ වලනය නොවන සහ සෙමින් වලනය වන තොග ගබඩාවන්හි දීර්ඝ කාලීනව පැවතීම. (iii) ඒකාබද්ධ තොග පාලන පද්ධතියක් නඩත්තු කිරීමට අපොහොසත් වීම.

(iv) අධික ලෙස අමුද්‍රව්‍ය ප්‍රසම්පාදනය කිරීම.

(v) කිසිදු ආරක්ෂාවකින් සහ ප්‍රමාණවත් ඉඩපහසුකම් නොමැතිව ගබඩා තුළ ද්‍රව්‍ය ගබඩා කිරීම.

(ඇ) ව්‍යාපෘති පරිපාලනය හා කාර්යසාධන සමාලෝචනය

(i) අපේක්ෂිත කාල පරිච්ඡේදය තුළ ව්‍යාපෘති නිමකිරීමට අපොහොසත්වීම සහ වලංගු හේතූන් නොමැතිව ව්‍යාපෘති කාලය දීර්ඝ කර ගැනීම.

(ii) ශක්‍යතා අධ්‍යයනයන් ක්‍රමවත්ව සිදුකිරීමේ නොහැකියාව.

(iii) රාජ්‍ය ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුකූල නොවීම.

(iv) කාලය දීර්ඝ කිරීම හා අරමුදල් උපයෝජනයේ දුර්වලතා හේතුවෙන් පිරිවැය අධික ලෙස ඉහල යාම.

(v) ඉංජිනේරු ඇස්තමේන්තුව, කොන්ත්‍රාත් වටිනාකම සමඟ විශාල ලෙස විචලනයන් සහිතව කොන්ත්‍රාත් ප්‍රදානය කිරීම.

(ඉ) නැවත අයකළ හැකි යෝජනාක්‍රම ගිණුම්කරණය

නැවත අයකළ හැකි යෝජනා ක්‍රම සඳහා ලද අත්තිකාරම් අදාළ වියදමට එරෙහිව කපා දැමීමෙන් තොරව දීර්ඝ කාලයක භාරයේ තබාගැනීම.

(ඊ) කාර්ය මණ්ඩල කළමනාකරණය

(i) අවශ්‍ය කරන අධිකාරීන් නොමැතිව මානව සම්පත් වෙනත් ආයතන වෙත නිදහස් කිරීම.

(ii) මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගැනීමෙන් තොරව සේවකයින් බඳවා ගැනීම.

(iii) ව්‍යාජ සහතික පත්‍ර මත පදනම්ව සේවක උසස්වීම් ලබා දීම.

(iv) සේවකයන් එරෙහිව විනය ක්‍රියාමාර්ග ගැනීමේ ප්‍රමාදය.

එච්. එම්. ගාමිණී විජේසිංහ
විගණකාධිපති

කෙටි යෙදුම්

AAT	ගිණුම් තාක්ෂණ ශිල්පීන්ගේ සංගමය
AAS	පරමාණුක අවශෝෂණ වර්ණාවලී මානය
ADB	ආසියානු සංවර්ධන බැංකුව
AE	ප්‍රාදේශීය ඉංජිනේරු
AFD	ප්‍රංශ සංවර්ධන ඒජන්සිය
AGM	සහකාර සාමාන්‍යාධිකාරී
AIT	තාක්ෂණවේදය පිළිබඳ ආසියානු ආයතනය
AT	උචිත තාක්ෂණවේදය
BMICH	බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව
BOD	ජෛවරසායනික අම්ලකර ඉල්ලුම
BOQ	ප්‍රමාණ පත්‍රය
BOI	ආයෝජන මණ්ඩලය
CAS	චීන විද්‍යා ශාස්ත්‍රාලය
CBO	ප්‍රජා මූල සංවිධානය
CCN	කොළඹ නගරය උතුර
CCOEC	විදේශීය ආර්ථික සහයෝගිතාවය සඳහා වූ චීන ජාතික සංස්ථාව
CCS	කොළඹ නගරය දකුණ
CCTV	සංවෘත පරිපථ රූපවාහිනිය
CD	සංගත තැටිය
CEA	මධ්‍යම පරිසර අධිකාරිය
CEB	ලංකා විදුලිබල මණ්ඩලය
CFL	සංගත ප්‍රතිදීප්ත පහන්
CI	වාත්තු යකඩ
CKDu	හඳුනා නොගත් හේතූන් නිසා ඇති වන නිදන්ගත වකුගඩු රෝගය
CMC	කොළඹ මහනගර සභාව
COD	රසායනික අම්ලකර ඉල්ලුම
CP	සංයුක්ත ක්‍රම සම්පාදනය
CSI	ගණුදෙනුකාර තෘප්ති දර්ශකය
Cu.m	ඝණ මීටර
CWSSIP	කොළඹ ජල සම්පාදන සේවා වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය
DEWATS	විමධ්‍යගත අපජල ප්‍රතිකාරක හා බැහැර කිරීමේ ක්‍රමය
DFCC	ලංකාවේ සංවර්ධන මූල්‍ය සංස්ථාව
DGM	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
DI	මෘදු යකඩ
DIG	නියෝජ්‍ය පොලිස්පති
DS	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
DSD	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය
EA	ඉංජිනේරු සහකාර
EBARA	ඉබාරා සංස්ථාව
EDC	කැනේඩියානු නිර්යාත සංවර්ධනය
EDCF	ආර්ථික සංවර්ධන සහයෝගිතා අරමුදල
EIA	පාරිසරික බලපෑම් තක්සේරුව
FIDIC	උපදේශක ඉංජිනේරු වරුන්ගේ ජාත්‍යන්තර සන්ධානය
GCWWMIIP	මහ කොළඹ ජල හා අපජල කළමනාකරණය වැඩි දියුණු කිරීමේ ආයෝජන වැඩ සටහන
GCWRP	මහ කොළඹ ජල පුනරුත්ථාපන ව්‍යාපෘතිය
GI	ආරක්ෂිත තුත්තනාගම් ආවරණය සහිත යකඩ
GIS	භූගෝලීය තොරතුරු පද්ධතිය
GM	සාමාන්‍යාධිකාරී
GN	ග්‍රාම නිලධාරී
GND	ග්‍රාම නිලධාරී වසම
GOSL	ශ්‍රී ලංකා රජය
GPOBA	නිමැවුම පදනම් වූ ආධාර පිළිබඳ ගෝලීය හවුල
GS	ග්‍රාම සේවා
GW	භූගත ජලය
HDPE	ඉහල ඝණත්වයේ පොලි එතිලින්
HNDE	තාක්ෂණවේදය පිළිබඳ ඉහල ජාතික ඩිප්ලෝමාව
HRM	මානව සම්පත් කළමනාකරණය
ICP	උද්ගාමී ලෙස ජෝඩු කළ ප්ලාස්මාව
ICT	තොරතුරු හා සංනිවේදන තාක්ෂණවේදය
ICTA	තොරතුරු හා සංනිවේදන තාක්ෂණවේදී ඒජන්සිය
ICTAD	ඉදි කිරීම් පුහුණු හා සංවර්ධන ආයතනය
ICWG	අන්තර් දේශීය කාර්ය කණ්ඩායම
IDU	නීති විරෝධී භාවිතය සොයා ගැනීමේ ඒකකය
IWSP	අභ්‍යන්තර ජල සම්පාදන ව්‍යාපෘතිය
IEE	මූලික පාරිසරික පරීක්ෂණය
IESL	ශ්‍රී ලංකා ඉංජිනේරුවන්ගේ ආයතනය
IMS	ඉන්වෙන්ටරි කළමනාකරණ ක්‍රමය
IoT	දේවල් වල අන්තර්ජාලය
ISAN	ජාත්‍යන්තර ප්‍රමිති ශ්‍රව්‍ය දෘෂ්‍ය අංකය
ISO	ජාත්‍යන්තර ප්‍රමිති සංවිධානය
ISMM	සැපයුම් හා ද්‍රව්‍ය කළමනාකරණ ආයතනය
IT	තොරතුරු තාක්ෂණය
ITEC	ඉන්දියානු තාක්ෂණික හා ආර්ථික සහයෝගිතාවය
JICA	ජපන් ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සිය
JPY	ජපන් යෙන්
JKWSSP	යාපනය කිලිනොච්චි ජල සම්පාදන හා සනීපාරක්ෂණ ව්‍යාපෘතිය
KEITI	කොරියානු පාරිසරික කර්මාන්ත හා තාක්ෂණවේදී ආයතනය
km	කිලෝ මීටර
KOICA	කොරියානු ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සිය

KGC	කලෝන් ගෝලීය සංස්ථාව
KVA	කිලෝ වෝල්ට් ඇම්පියර
LA	පලාත් පාලන අධිකාරීන්
LED	ආලෝක විමෝචන ඩයෝඩය
LKR	ශ්‍රී ලංකා රුපියල්
MASL	ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය
M&E	යාන්ත්‍රික හා විද්‍යුත්
MC	මහනගර සභාව
MCB	මහවැලි උපදේශක කාර්යාංශය
MCM	ඝණ මීටර මිලියනය
MCPWS	නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය
MD & T	මිනිස් බල සංවර්ධනය හා පුහුණු කිරීම
MIS	කළමනාකරණ තොරතුරු ක්‍රමය
MOU	අවබෝධතා ගිවිසුම
MOH	සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී
MSD	කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව
MS	මයික්‍රෝ සොෆ්ට්
NAITA	ජාතික ආධුනිකත්ව හා කර්මාන්ත පුහුණු කිරීමේ අධිකාරිය
NC	උතුරු මැද
NDB	ජාතික සංවර්ධන බැංකුව
NDT	ජාතික තාක්ෂණවේදී ඩිප්ලෝමාව
NHDA	ජාතික නිවාස සංවර්ධන අධිකාරිය
NIBM	ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ ජාතික ආයතනය
NPD	ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව
NRW	ආදායම් රහිත ජලය
NWSDB	ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය
NTU	ආවිලතාමිතික බොර තත්ත්ව ඒකකය
O & M	මෙහෙයුම් හා නඩත්තු
OIC	ස්ථානය භාර නිලධාරී
P & D	ක්‍රම සම්පාදන හා සැලසුම්
PAC	ව්‍යාපෘති සමාලෝචන කමිටුව
PD	ව්‍යාපෘති අධ්‍යක්ෂ
PDMRC	ක්‍රම සම්පාදන හා සැලසුම් අත් පොත් සමාලෝචන කමිටුව
PR	මහජන සම්බන්ධතා
PRDA	පලාත් මාර්ග සංවර්ධන අධිකාරිය
PWD	මහජන වැඩ දෙපාර්තමේන්තුව
PWTP	පැකේජ ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය
R & D	පර්යේෂණ හා සංවර්ධන
RDA	මාර්ග සංවර්ධන අධිකාරිය
RFP	යෝජනා කැඳවීම
RM	කලාපීය කළමනාකරු
RO	විලෝම ආශ්‍රැති
RSC	කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය
RSC (WN)	කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය (බටහිර උතුර)
RSC (WS)	කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය (බටහිර දකුණ)
RSC (NC)	කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය (උතුරු මධ්‍යම)
RSC (S)	කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය (දකුණ)
RSC (E)	කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය (නැගෙනහිර)
RSC (WC)	කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය (බටහිර මධ්‍යම)
RSC (N)	කලාපීය සහාය සේවා මධ්‍යස්ථානය (උතුර)
RWS	ග්‍රාමීය ජල සම්පාදනය
SCADA	අධීක්ෂණාත්මක පාලනය හා දත්ත ප්‍රතිග්‍රහණය
SACOSAN	සනීපාරක්ෂණය පිළිබඳ දකුණු ආසියානු සමුළුව
SCAPC	අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ස්ථාවර ප්‍රතිසම්පාදන කමිටුව
SHIFT	නගර සඳහා වූ සනීපාරක්ෂණ හා ස්වස්ථතා ආරම්භක ක්‍රියා
SIA	සමාජ බලපෑම් තක්සේරුව
SIDA	ස්වීඩන් ජාත්‍යන්තර සංවර්ධන ඒජන්සිය
SLSI	ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය
SMS	කෙටි පණිවුඩ සේවාව
SSR	සමාජ පරීක්ෂණ වාර්තා
TCE	මුළු පිරිවැය ඇස්තමේන්තුව
TEC	මුළු ඇස්තමේන්තුගත පිරිවැය / තාක්ෂණික අගැයීම් කමිටුව
TSS	මුළු අවලම්බිත ඝණ ද්‍රව්‍ය
UNICEF	එක්සත් ජාතීන්ගේ ජාත්‍යන්තර ළමා අධ්‍යාපන අරමුදල
UoP	පේරාදෙණිය විශ්ව විද්‍යාලය
UPVC	මෙළෙක් නොකරන ලද පොලි විනිල් ක්ලෝරයිඩ්
USD	එක්සත් ජනපද ඩොලර
VAT	අගය එකතු කළ බද්ද
VPN	අතථ්‍ය පෞද්ගලික ජාලය
VSD	විචල්‍ය වේග ධාවකය
WASSIP	ජල සම්පාදන හා සනීපාරක්ෂණ වැඩි දියුණු කිරීම් ව්‍යාපෘතිය
WHO	ලෝක සෞඛ්‍ය සංවිධානය
WS	ජල සම්පාදනය
WSP	ජල සම්පාදන ව්‍යාපෘතිය / ජල සුරක්ෂිතතා සැලැස්ම.
WSDP	ජල සම්පාදන සංවර්ධන ව්‍යාපෘතිය
WTP	ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය
WWDS	අපජලය බැහැර කිරීමේ ක්‍රමය / පද්ධතිය
WWTP	අපජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය

සංස්ථානික තොරතුරු.

සංවිධානයේ නාමය :
ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය

නෛතික ආඥාතිය :
රජයට අයත් ව්‍යවස්ථාපිත මණ්ඩලය

ස්ථාපිත කළ දිනය :
1974 අංක 2 දරණ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල නීතිය නම් පාර්ලිමේන්තු පණත මගින් 1974. 03. 01 වැනි දින ස්ථාපිත කරන ලදි. 1992 අංක 13 දරණ ජාතික ජල සම්පාදන හා ජලාපවහන (සංශෝධිත) පණත මගින් 1992. 03. 11 වැනි දින පණත සංශෝධනය කරන ලදි.

බදු හඳුනාගැනීමේ අංකය :
4090 31820

අගය එකතු කළ බදු ලියාපදිංචි අංකය :
4090 31820 7000

සම්බන්ධතා - ප්‍රධාන කාර්යාලය :
ගාලු පාර, රත්මලාන, ශ්‍රී ලංකාව
දුරකථන අංක : +94 11 2638999 (නිසැරැම්)
+94 11 2637194, +94 11 2611589
ෆැක්ස් : +94 11 2636449 විද්‍යුත් තැපෑල : gm@waterboard.lk
වෙබ් අඩවිය : www.waterboard.lk

රේඛීය අමාත්‍යාංශය
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය

ඇමතුම් මධ්‍යස්ථානය
1939 (පැය 24 පුරා)

ගණුදෙනුකාර සේවා ඒකකය - ප්‍රධාන කාර්යාලය
+94 11 2623623 (කාර්යාල වේලාවන් තුළ)
බැංකුකරු
ලංකා බැංකුව

විගණකවරුන්
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අභ්‍යන්තර විගණන)
රජයේ විගණන ඒකකය.

අධ්‍යක්ෂ මණ්ඩලය
ඉංජිනේරු කේ. ඒ. අන්සාර් - සභාපති,
ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය (2015. 02. 05 දින සිට)

එම්. ෂෆීක් රාජබ්ඩීන් මහතා - උප සභාපති,
ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය (2015. 03. 10 දින සිට)

පී. අයි. ටී. මහිලාල් සිල්වා මහතා - ක්‍රියාකාරී අධ්‍යක්ෂ,
ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය (2015 .02. 05 සිට)

වෛද්‍ය පී. ජී. මහීපාල - සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්,
සෞඛ්‍ය අමාත්‍යාංශය (2017. 01. 02 දින දක්වා)

වෛද්‍ය ටී. බී. ආනන්ද ජයලාල් -
අධ්‍යක්ෂ, යොවුන්, වයස්ගත හා ආබාධිත පුද්ගලයින්, සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය - අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය (2017 .01. 20 සිට)

ජේ. එම්. යූ. පී. ජයමහ මහතා -
අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, පොදු ව්‍යවසාය දෙපාර්තමේන්තුව- අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය (2015 .04. 02 සිට)

ශාන්ත රත්නායක මහතා - අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික,
ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය (2015 .02. 12 සිට)

කේ. ඒ. සුබද්‍රා වල්පොල මහත්මිය -
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්, පලාත් පාලන හා පලාත් සභා අමාත්‍යාංශය - අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය (2015 .02. 13 සිට)

අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්
ඩබ්ලිව්. පී. සඳමාලි ද සිල්වා මහත්මිය

ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය
ඉංජිනේරු ඩී. යූ. සුමනසේකර
සාමාන්‍යාධිකාරී

ඉංජිනේරු ඩබ්ලිව්. බී.ජී. ප්‍රනාන්දු
අතිරේක සාමාන්‍යාධිකාරී (සංස්ථානික සේවා)

ඉංජිනේරු ජේ. ආර්. බී. නැදුරන
අතිරේක සාමාන්‍යාධිකාරී (මලාපවහන)

ඉංජිනේරු ආර්. එච්. රුවිහිස්
අතිරේක සාමාන්‍යාධිකාරී (ජල සම්පාදන ව්‍යාපෘති)

ඉංජිනේරු එස්. ජී. ජේ. රාජ්කුමාර්
අතිරේක සාමාන්‍යාධිකාරී (උතුර /මධ්‍යම)

ඉංජිනේරු බී. එස්. විජේමාන්න
අතිරේක සාමාන්‍යාධිකාරී (බටහිර)

ඉංජිනේරු එන්. එච්. ආර්. කුලනාථ
අතිරේක සාමාන්‍යාධිකාරී (දකුණ/ නැගෙනහිර)

ඉංජිනේරු විජේතුංග
අතිරේක සාමාන්‍යාධිකාරී (ප්‍රතිපත්ති හා ක්‍රම සම්පාදන)

ඩී. තොටවත්ත මහතා
අතිරේක සාමාන්‍යාධිකාරී (මූල්‍ය)

ජී. කේ. ඉද්දමල්ගොඩ මහතා
අතිරේක සාමාන්‍යාධිකාරී (මානව සම්පත් කළමනාකරණය)

අංශ භාර නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරුන්
ඉංජිනේරු යූ. රත්නපාල (ව්‍යාපෘති සමායෝජනය)
ඉංජිනේරු එස්. ජී. ජයවර්ධන (මලාපවහන)
ඉංජිනේරු කේ. ඩබ්ලිව්. ප්‍රේමසිරි (ක්‍රම සම්පාදන හා සැලසුම්)
ඉංජිනේරු කේ. පී. ආර්. එස්. සමරසිංහ (සංවර්ධන)
ඉංජිනේරු එස්. සුමනවීර (නිෂ්පාදන - බටහිර)
ඉංජිනේරු කේ. ඩී. පී. එෆ්. සිරිවර්ධන (සංස්ථානික ක්‍රම සම්පාදනය)
ඉංජිනේරු එස්. ජී. ජී. රාජ්කුමාර් (වාණිජ)
ඉංජිනේරු දුලිප් ගුණවර්ධන (ග්‍රාමීය ජල සම්පාදන සේවා)
ඉංජිනේරු ජාලිය ලලිත් සීක්කුගේ (ආසියානු සංවර්ධන බැංකු ව්‍යාපෘති)
ඉංජිනේරු බී. එල්. ගුණරත්න (යාන්ත්‍රික හා විද්‍යුත්)
ඉංජිනේරු ජේ. චන්ද්‍රදාස (තොරතුරු තාක්ෂණය)
එම්. එම්. එස්. පීරිස් මහත්මිය (මූල්‍ය)
ඒ. පී. එස් ද සිල්වා මහත්මිය (පිරිවැයකරණය)
ආර්. එම්. ඒ. එස්. වීරසේන මහතා (අභ්‍යන්තර විගණන)
එන්. වයි. එස්. අබේගුණවර්ධන මහත්මිය (කාර්මික සම්බන්ධතා)
ආර්. එම්. ඒ. බණ්ඩාර මහතා (සැපයුම්)

පලාත්/කලාපීය සහාය සේවා මධ්‍යස්ථාන භාර නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී වරුන්
ඉංජිනේරු ටී. ඩබ්ලිව්. එස්. පෙරේරා (බටහිර - මධ්‍යම)
ඉංජිනේරු සී සී එච් එස් ප්‍රනාන්දු (බටහිර - දකුණ)
ඉංජිනේරු එස් ඒ රෂීඩ් (නැගෙනහිර)
ඉංජිනේරු ආර් ඒ බී එස් මෙන්ඩිස් (බටහිර - උතුර)
ඉංජිනේරු එම් කේ ඩී ජේ එච් මීගොඩ (මධ්‍යම)
ඉංජිනේරු ආර් එස් ලියනගේ (ඌව)
ඉංජිනේරු ජී වී විජේරත්න (උතුරු මැද)
ඉංජිනේරු අයි එම් ඩබ්ලිව් කේ ඉලංගසිංහ මහත්මිය (වයඹ)
ඉංජිනේරු එම් එම් උමා ලෙබ්බේ (උතුර)
ඉංජිනේරු ඩබ්ලිව් ඩබ්ලිව් ලියනගේ (සබරගමුව)
ඉංජිනේරු ජේ කේ එස් පතිරණ (දකුණ)

ව්‍යාපෘති අධ්‍යක්ෂවරුන් වශයෙන් කටයුතු කරන අතිරේක සාමාන්‍යාධිකාරිවරුන් හා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරුන්
ඉංජිනේරු ආර් කුලනාථ -
රත්මලාන, මොරටුව හා ජා ඇල ඒකල ප්‍රදේශයන් සඳහා
අපජල බැහැර කිරීම්

ඉංජිනේරු බී එස් විජේමාන්න
මහ කොළඹ පුනරුත්ථාපන ව්‍යාපෘතිය

ඉංජිනේරු කේ ජේ වී ඒ පෙරේරා
ගම්පහ අත්තනගල්ල ජල සම්පාදන ව්‍යාපෘතිය

ඉංජිනේරු ආර් ඒ බී එස් මෙන්ඩිස්
ආසියානු සංවර්ධන බැංකු 5 වැනි ව්‍යාපෘතිය

ඉංජිනේරු කේ පී ආර් එස් සමරසිංහ
ලබුගම කලටුවාව ජල සම්පාදන ව්‍යාපෘතිය හා කොලොන්න බලංගොඩ ජල සම්පාදන ව්‍යාපෘතිය

ඉංජිනේරු එස් ඒ රෂීඩ්
කොළඹ ජල සම්පාදන සේවා වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය

ඉංජිනේරු පී පී කහදුව
රුහුණුපුර ජල සම්පාදන ව්‍යාපෘතිය

ඉංජිනේරු ආර් එස් ලියනගේ
මහියංගන ජල සම්පාදන ව්‍යාපෘතිය හා බදුල්ල හාලිඇල ජල සම්පාදන ව්‍යාපෘතිය

ඉංජිනේරු ආර් ඒ ඒ රණවක
නගර ආශ්‍රිත සෞඛ්‍ය හා සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීමේ ජල සම්පාදන ව්‍යාපෘතිය

ඉංජිනේරු අයි වී ඩබ්ලිව් වීදුරවීර
අඹතලේ ඔරුගොඩවත්ත නල වැලිමේ ව්‍යාපෘතිය